

# ඛුද්දසික විවරණය.

# කුදුසික විවරණය

සම්පාදක

බම්බලපිටියේ වජිරාරාමවාසී

පණ්ඩිත වැලිගම ඤාණරතන ස්ථවිර

අතිගරු පැළෑණේ ශ්‍රී වජිරඤාණ මහානායක මාහිමියන් වහන්සේගේ
සංඥාපනයෙකින් හා
බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ
ප්‍රස්තාවනාවකින් ද යුක්ත යි.

ප්‍රකාශක

කොළඹ තිඹිරිගස්යාය පාරේ
"මිගදය" මැදුරෙහි
සී. ඕ. මුදලිගේ මහතා

මුද්‍රණය

කොළඹ යූ. පී. ඒකනායක සහ සමාගම

2498
1954

මිල 2–75

# ඛුද්දසික්ඛා විවරණය

අභිධර්ම පිටකයට **අභිධර්මාර්ථ සංග්‍රහය** මෙන් විනය පිටකයට මේ **ඛුද්දසික්ඛා** ද අතිසංක්ෂිප්ත වූ ද සර්වාඞ්ග සම්පූර්ණ වූ ද භික්ෂූන් විසින් වාචෝද්ගත කොට දරා ගත යුතු වූ ද ග්‍රන්ථ රත්නයෙකි. අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙන් මුළු විජම්පෙළෙහි සප්තප්‍රකරණයෙහි ම ඇති තාක් අභිධර්මාර්ථයන් ඉගැන්වියැ හැක්කා සේ, මේ කුදුසිකෙනු ත් පඤ්චවිනය පාළීන්හි ම ඇති තාක් විනයාර්ථයන් සම්පූර්ණයෙන් උගන්වා ලියැ හැකි බව **කල්‍යාණි ශිලාලිපියෙන්** හෙළි වේ. ලක්දිවින් බුරුමරට බලා ගිය "**රාහුල**" නම් වූ විනයවිශාරද වූ එක් තෙරනමක් එසේ කළ බව එහි සඳහන් වේ. මේ සඞ්ග්‍රහ වයය ම ලක්දිවැ දී ම සැපැයුණු දහස්වසක් පමණ පැරැණි වූ මුළු බෞද්ධ ලොකයෙහි චිරප්‍රසිද්ධ වූ රුවන් පුවළෙකි.

එයින්, මේ **ඛුද්දසික්ඛාට** ඉපැරැණි සන්නයක් තිබී අපවත් වූ බව දූන් පවත්නා පදගත සන්නයෙන් ම හෙළි වේ. එය ද දෙවරක්, උගත් මහ තෙර දෙනමකගේ සංස්කරණයෙන් මුද්‍රණාධාරයෙන් ප්‍රචලිත වුව ත් දූන් ඉන් පිටපතක් වත් ලබා ගැනීම උගහට ය. මේ **විවරණය** එසේ පදගත සන්නයක් නො වැ, විවෘත කොට දක්වියැ යුතු සර්වාර්ථයන් හෙළි පෙහෙළි කොට සුගම සරල බසින් ගෙනැ හැර පෑමෙකි.

ජරාජීර්ණ වැ රොගග්‍රස්ත වැ මඤ්චපරායණ වැ වෙසෙනුයෙන් මෙය මුලැ සිටැ අග දක්වා සපුරා කියවන්නට අපට භාග්‍යයක් නො ලැබුණ ත්, මේ විවරණ සම්පාදක පණ්ඩිත ස්ථවිරයන් ලවා ම තැනින් තැන කියවා අසා සිටීමෙන් ලත් හැඟීමෙන් මෙය හෙළි කොටැ කියන්නට සිතුවෙමු. මේ **පණ්ඩිත වැලිගම ඥාණරතන ස්ථවිරනමගේ** උත්සාහය සාලොචිත ය. "**විනයො නාම සාසනස්ස ආයු**" (-විනය නම් බුද්ධශාසනයාගේ ආයුෂය වේ. -විනය පවත්නා තෙක් ම බුදුසස්න පැවැතේ යැ යි) වදාළ ලෙස මේ **පණ්ඩිත** ස්ථවිරයන් විසින් කරනලද්දේ පිරිහී ගෙනැ යන බුදුසස්නට රුකුල් දීමෙකි. එබැවින් මේ **පණ්ඩිත** ස්ථවිරයනට තෙරුවන් බෙලෙන් සෙත් පතමින් පින් පිරුවම්හ.

මේබවට-හිතවත් වූ,

**පැලෑණෙ වජිරඤාණ**

මහානායක ස්ථවිරයෝ වම්හ.

1954 සැප්තැම්බර 5 වන දින
වජිරාරාමයේ දී ය.

# ප්‍රස්තාවනා

## “විනයො සාසනස්ස ආයු”

**තුන් පිටකය.** ආඥාදේශනා වෝහාරදේශනා පරමත්ථදේශනා යි බුද්ධවචනය තෙවැදෑරුම් වේ. එහි **අණපණත්** බහුල වශයෙන් ඇති විනය පිටකය **ආඥාදේශනා** නම්. ලෝකසම්මතියෙහි බෙහෙවින් පිහිටා දෙසූ දහම් ඇති සූත්‍රාන්තපිටකය **වෝහාරදේශනා** නම්. පරමාර්ථසත්‍යය ම බහුලකොට වදාළ අභිධර්ම පිටකය **පරමත්ථදේශනා** නම්. තව ද මොහු තිදෙන පිළිවෙළින් **යථාපරාධශාසන** (වරදේ හැටි හැටියට කළඅනුශාසන), **යථානුලෝම ශාසන** (රාගචරිතාදීනට සුදුසු වන සේ කළ අනුශාසන), **යථාධම්ම ශාසන** ඒ ඒ දෑයෙහි ඒකාන්ත සත්‍යස්වභාවය (ඇති තියම සැටිය) හෙළි කැරුම් විසින් කළ අනුශාසන) යැ යි ද හඳුන්වනු ලැබෙත්.

මෙයින් **විනය පිටකය** නම් පාරාජිකපාළි පාචිත්තියපාළි මහාවග්ග චුල්ලවග්ග පරිවාරපාඨ යන පොත් පස ය. **සූත්‍රාන්තපිටකය** යනු දීඝාගම මජ්ඣිමාගම සංයුත්තාගම අංගුත්තරාගම ඛුද්දකාගම නමින් වැහැරුවෙන ධර්ම කාණ්ඩ පස ය. **අභිධර්මපිටක** යනු ධම්මසංගණී විභංග ධාතුකථා පුග්ගලපඤ්ඤත්ති කථාවත්ථු යමක පට්ඨාන යන ප්‍රකරණ සත ය.

**විනය පිටකය.** විනය පිටකයෙහි දැක්වුණු අණපණත් රැස වනාහි විවිධ විශේෂ නයක්‍රම ඇති බැවිනුත් කාවිසි දෙදොර හික්මවන බැවිනුත් **විනය** යන නමින් බැවහර විණැ යි පූර්වාචාර්‍යයන් විසින් කියන ලදී.*

උඩ දැක්වුණු පරිදි පොත් විසින් පසකට බෙදුණු ඒ විනය පිටකයෙහි පළමුවැන්න වූ **පාරාජිකපාළියෙහි** සතර පරිජී ද, තෙළෙස් සඟවෙසෙස් ද, අනියතාපත්තිවිකය ද, තිස් නිසැගි පචිති ද නිදාන වස්තු පුද්ගලාදි විස්තරය සහිත වැ දැක්වේ.

**පාචිත්තිය පාළියෙහි** වනාහි භික්ෂූන් සඳහා පැණැවුණු ශුද්ධ පචිති (ඛුද්දක) පාටිදේසනීය සෙඛියා අධිකරණසමථ යන මොවුන්ගේ ද මෙහෙණින් සඳහා පැණැවුණු පාරාජික සත්තරසක නිස්සග්ගිය ඛුද්දක පාටිදේසනීය සෙඛියා අධිකරණසමථ යන මොවුන් ගේ නිදානාදි විස්තර ද ඇතුළත් වේ.

---

* විවිධවිසෙසනයත්තා විනයනතො ච කායවාචානං
විනයත්ථවිදූහි අයං විනයො විනයො’ති අක්ඛාතො.

**මහාවග්ගයෙහි** මහාඛන්ධක උපොසථක්ඛන්ධක වස්සූපනායිකක්ඛන්ධක පවාරණක්ඛන්ධක භෙසජ්ජක්ඛන්ධක කඨිනක්ඛන්ධක චීවරක්ඛන්ධක චම්පෙය්‍යක්ඛන්ධක කෝසම්බක්ඛන්ධක යැ යි දස කඳු කෙනෙක් ඇතුළත්හ.

**චුල්ලවග්ග පාළියෙහි** කම්මක්ඛන්ධක පාරිවාසිකක්ඛන්ධක සමුච්චයක්ඛන්ධක සමථක්ඛන්ධක ඛුද්දකවත්ථුක්ඛන්ධක සෙනාසනක්ඛන්ධක සංඝභෙදක්ඛන්ධක වත්තක්ඛන්ධක පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධක භික්ඛුනික්ඛන්ධක පංචසතිකක්ඛන්ධක සත්තසතිකක්ඛන්ධක යන දොළොස් කඳු කෙනෙක් වෙති.

**පරිවාරපාඨයෙහි** උඩ දැක්වුණු පාරාජිකපාළි ආදියෙහි මනා පරිච්ඡිනිය ඇති කරුණුවට නානා නයින් ශික්ෂාප්‍රඥප්තීන්ගේ විභාග දැක්වේ. එය භික්ඛුවිභංගය පිළිබඳ වාර සොළොසෙකින් ද භික්ඛුනීවිභංගය පිළිබඳ වාර සොළොසෙකින් ද සමුට්ඨානසීස ඛන්ධකපුච්ඡාදි විසින් පරිච්ඡේද අටවිස්සෙකින් ද සමුල්ලසිත ය.

**අටුවා ටීකාදිය.** මේ විනය පිටකය පුහුණු කරන්නවුන් ගේ පහසුව තකා සංගීතිකාරක මහරහතුන් විසින් තැබූ අර්ථවාචනා මාර්ගය මිහිඳු මහරහතුන් විසින් ලක්දිවට ගෙනෙන ලදුව විනයාචාර්‍ය්‍ය පරම්පරායෙහි ආයේ ය. කලකට පසු ගැටලු තැන් ලිහීම් විසින් කැරුණු වර්ණනා සහිත ව ඒ අර්ථකථා ග්‍රන්ථ රූඪ විය. එයින් මැත බුදුගොස් තෙරණුවන් විසින් ඒ පැරණි හෙළ අටුවා ඇසුරුකොට පාළියෙන් සමන්තපාසාදිකා විනයට්ඨවණ්ණනාව ද, තවත් ඇදුරන් විසින් එයට සාරත්ථදීපනී, විමතිවිනෝදනී වජිරබුද්ධි යන තුන් ටීකා ද උභයපාතිමොක්ඛයට බුදුගොස් තෙරුන් විසින් කංඛාවිතරණිය ද එයට අන් තෙරකෙනකුන් කළ විනයත්ථමංජූසා ටීකාව ද විනය පිටකයෙහි අා ද විස්තර කැරුම් විසින් කරන ලදහ. එයින් පසු තවත් ඇදුරෝ විනය විනිච්ඡය, පාළිමුත්තක විනය විනිච්ඡය, විනයසංගහ, මූලසික්ඛා, ඛුද්දසික්ඛාදි තවත් ග්‍රන්ථ රචනා කළහ.

**ඛුද්දසික්ඛා** ගැඹුරු වූ නයක්‍රම වලින් විස්තෘත වූ පරිවාර ග්‍රන්ථ සහිත මූළ විනය පිටකය ඉගැන්මෙහි හැම කෙනෙක් සමත් නො වෙති. එය ක්‍රමයෙන් උගත යුතු ය. එහි සාමාන්‍ය ඥාන මාත්‍රයක් වුව ද ලබන්නට කල් බොහෝ ගත වෙයි. එ බැවින් විනය උගන්නවුනට පහසු සැලැසුම් විසින් විනය ප්‍රවේශෝපාය ග්‍රන්ථ ද කිහිප යෙක් රචිත වූහ. එහෙත් ඒ හැම අතුරෙන්, අභිධර්මයට අභිධම්මත්ථ සංගහය සේ, විනයයට ඛුද්දසික්ඛාව පහසු ම ප්‍රවේශෝපායයැ යි ගත යුතුය. පාමොක් සහිත වැ මෙය පුහුණු කෙළේ විනය පිටකය අතේ ප්‍රමාණවත් දැන්මක් ලබයි. එයින් පසු පහසුයෙන් මූල විනය ග්‍රන්ථ අටුවා ටීකා සහිත ව උගත හැක්ක. එ බැවින් පෙර පටන් ම ථෙර වාදී භික්ෂූන් විසින් මේ ග්‍රන්ථය විශෙෂයෙන් සම්භාවිත විය. "නිඃශ්‍රය මුක්තක බාහුශ්‍රත්‍යයට සුදුසු බණ සටීක කොට අසා නිමවා කල් පිරුණ හොත් ගුරුන් විසින් උන්ගේ ධූතාංගධරත්වාදී බොහෝ ගුණ කියා නායක

නෙතට පාවා දුන් කලැ උභය ප්‍රාතිමෝක්ෂ කුද්‍රසික්‍ෂා අර්ථසංග්‍රහය........" යන ආදීන් මෙය පුරාතන ආචාර්‍ය්‍යයන් මහදදරයෙන් සිය සිසුනට පුහුණු කැරැ වූ බව දඹදෙණිකතිකාවතෙහි එයි. පොළොන්නරු කතිකාවතෙහි ත් මෙ වග ම සඳහන් වැ පෙනේ. කල්‍යාණිපාෂාණලේඛයෙහි "තතො පරං පුබ්බෙ කත කතිකා නියාමෙනෙව ඤතචතුපාරිසුද්ධිසීලානං සික්ඛිත- පාතිමොක්ඛ- බුද්ධසික්ඛා- පකරණානං වාචුග්ගත...... ....." යන පාඨයෙන් ද මෙය පෙර පටන් ම සම්භාවිත බව පෙනේ.

**කර්තෘ කාලාදිය.**

ග්‍රන්ථාවසානයෙහි "ථෙනධම්මසිරිකෙන. .. ...ථෙරෙන රචිතා"යි දක්වුණ බැවින් ධර්‍මසිරි නම් තෙර කෙනකුන් විසින් මෙය රචිත බව දක්වේ. මේ ධම්මසිරි තෙරණුවෝ වනාහි නිකාය සංග්‍රහයෙහි "යටැ මහානාම රජු දවසැ බුද්ධඝෝෂ නම් අටුවාචාරී මහාස්ථවිරපාදයන් වහන්සේ පටන්,මේ අතුරෙහි බුද්ධදත්ත ය, ධර්‍මපාලය, ජෝතිපාලය, ඛේමය, ධර්‍මශ්‍රීය, නන්දය, ආනන්දය, අනුරුද්ධය, උපතිෂ්‍යය, බුද්ධරක්ෂිතය, මෞද්ගල්‍යායනය අනවමදර්ශිය යනාදි මහාස්ථවිරයෝ නොයෙක් ටීකාර්ථකථා හා තත්ප්‍රවේශොපාය වූ අනෙකප්‍රකාර ධර්‍මප්‍රබන්ධ හා සන්න ගැටපද පිටපත් ආදිය උපදවා බුදුන්ගේ පර්‍ය්‍යාප්තිශාසනය බැබැළෑවූහ." යනුවෙන් දක්වෙන මහාවිහාරනිකායාගත ධර්‍මග්‍රන්ථකාරක වූ ස්ථවිරාවලියෙහි ඇතුළත් ධර්‍මශ්‍රී තෙරණුවෝ ම මේ බුද්ධසික්ඛායෙහි කර්තෘ යැ යි පෙනේ. බුදුගොස් තෙරුනට නොදුරු මෑතභාගයෙහි ශතවර්‍ෂයක් ඇතුළත මේ තෙරුන් ගේ ධරමාණ සමයය වීයැ යි සැලැකිය හැක්ක. එවිට ග්‍රන්ථරචනා කාලය බුදුගොස් තෙරුනට පසු වැ ද මූලටීකාකාර ආනන්ද තෙරුනට පූර්‍ව ද මේ දතුර විය යුතු ය.

**නාමාදිය.**

මෙයට දුන් නම බුද්ධසික්ඛා යැ. 'බුද්ද අප්පිකා සික්ඛා' යනුයෙන් ටීකාචාර්‍ය්‍යයන් කිහෙයින් සැකෙවින් දක්වූ බැවින් අල්ප (සංක්‍ෂිප්ත) වූ ශික්‍ෂා යනු මෙහි අර්ථ යි. නිතර විසෙසින් පරිශීලනය කටයුතු සිඟි කටයුතු විනයප්‍රඥප්තීන් උද්දේස පද සම්පර්ණසෙක ඇතුළත් කොට බණවර දෙකෙකින් ගාථා 500 කින් පමණ යුක්තකොට මෙය රචිත ය.

මෙයට පරිවාර විසින් ටීකා දෙකක් ද සන්න දෙකක් ද ඇති බව පෙනේ. එයින් දනට සුලභ වැ ඇත්තේ පසුව ලියැවුණු පදහත සන්නය හා සංඝරක්ඛිත සඟරජුන් රැසැයූ සුමංගල පසාදනී නම් ටීකාවත් පමණෙකි.

ලංකා බුරුම සියම් කාම්බෝජ යන රටවල මහතෙරවරු උපසපුව ලත් පසු සිය ඇතැවැස්සනට පාමොක් සහිත වැ මෙය සවිස්තර වැ උගන්නති. මෙසේ විනයයෙහි ප්‍රමාණවත් දැනුමක් ලද්දවුනට ඉන්පසු විනයපාළිය සවිස්තර කොට උගන්වති. එබැවින් විනයයට මහාර්ඝ ප්‍රවේශෝපායය වූ මේ ග්‍රන්ථය සවිස්තර සිංහල ව්‍යාඛ්‍යානයෙකින් යුක්ත වැ පළ වීම විනය ඥානාභිලාෂී ශික්‍ෂාකාමීන්ගේ භාග්‍යය උදා වීමෙකි. මේ ව්‍යාඛ්‍යානකර්තෘ තුමා හැම දෙනා ගේ ප්‍රශංසනියට පාත්‍ර ය.

“විනයපටිපත්තියෙහි දක්‍ෂ පුද්ගල තෙමේ සස්නැ ලත් සැදැහැති කුල දරුවනට මවුපියනට බඳු තැනැ සිටි යේ වේ. ඔවුන් ගේ මහණ උපසපු ව ද කුදුමහත් වත්පිළිවෙත් පිරුම ද, ආචාරගෝචර කෞශල්‍යය ද ඒ විනයධරයා අයත් මැ” යැ යි යමක් කියන ලද ද, එ සේ ම “විනය පටිපත්තිය උගත්තහුගේ සිල්කඳ මැනැවින් රැකුණේ වේ යැ යි ද, ‘කැප නොකැප බව් ආදියෙහි කුකුසින් මැඩුණවුනට විනයධර තෙමේ පිළිසරණ වේ යැ’ යි ද, ‘ගත් සඟ මැද නොබා කථා කෙරේ යැ’ යි ද, ‘වැරැදි පස ගත් විරුඬයන් කරුණු දක්වා නිගණී යැ’ යි ද, ‘සස්න බොහෝ කල් පැවැත්ම පිණිස පිළිපන්නේ වේ යැ’ යි ද, “සංවරමූලක වූ සංවර අවිප්පටිසාර පාමොජ්ජාදී අනුපාදපරිනිබ්බානය තෙක් යම් කුශල ධර්‍මාවලියක් ඇත් නම් විනයධර තෙම එයට දායාද (උරුමකරු) යැ යි” දැයි මේ ආදි විසින් විනය පටිපත්තිය ඉගැන්මෙහි යම් තාක් අනුසස් වදාරන ලද ද ඒ හැම ලබනුවට රිසි ශික්‍ෂාකාමීනට විනය ප්‍රවේශෝපාය වූ කුඳුසිකට කළ මේ සවිස්තර නව්‍ය ව්‍යාඛ්‍යානය මහෝපයෝගී වේ වා.

බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර.
ධර්‍මගිරි ආශ්‍රමය, බළන්ගොඩ.

2498 නිකිනි 4.

# හැඳින්වීම

ලක්දිවැ පමණක් නො වැ ථෙරවාදී සෙසු රටවලැ ද කුදුසික මහත් සැලැකිල්ලට භාජන වැ පවත්න , පොතකි. උපසපන් භික්‍ෂූන් විසින් කුදුසික සවිස්තර වැ උගත් කලැ ඒ අනුවැ පිළිපැදැ සුපිරිසුදු සිල්වතුන් වියැ හැකි ය. පැවිද්දන් විසින් බලාපොරොත්තු වියැහැකි හැමෙකක් ම ලැබිය හැකි වනුයේ පළමුකොටැ සිල් සපුරාලීමෙන් මැ බව ආකඞ්ඛෙය්‍ය සූත්‍රාදියෙහි දී වදාළසේක. කුදුසිකට විවරණයක් ලිවීමට මා පෙලැඹුණේ ඒ කරුණ සැලැකීමෙනි. මෙහි සදොස් තැන් වෙතොත් ඒ හැමෙකක් ම මගේ නො දැනුම මිස අනෙකක් නොවේ. එබඳු තැන් වෙතොත් සුධීහු නිදොස් කැරැ ගනිත්වා!

මේ පොතෙහි ශුද්ධිපත්‍ර බලද්දී ඇතැම් තැන් වජිරාරාමාධිපති පණ්ඩිත ශිරෝමණී අතිගරු පැලැණේ ශ්‍රී වජ්‍රඥාන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඉදිරියෙහි කියැවීමි. උන්වහන්සේ සවන් දුන් ඒ තැන් මැනැවැයි අනුමත කළහ. එපමණක් නො වැ සංක්‍ෂිප්ත වුව ත් සියල්ල ගැබ් කොටැ මහාර්ඝ සංඥාපනයක් ලියාදීමෙන් උන්වහන්සේ අපට අනුග්‍රහ කොටැ අප දිරිගන්වා ග්‍රන්ථ තත්‍වය පහදා ලූහ. අතිගරු බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මහඟු පෙරවදනක් ලියාදීමෙන් මේ පොත සැරසූහ.

මෙය මෙතරම් ඉක්මනට ප්‍රසිද්ධ කරන්නට හැකිවූයේ කොළඹ තිඹිරිගස්යාය පාරේ “මිගදය” මැදුරෙහි සී. ඕ. මුදලිගේ මහතාණන් මෙය මුද්‍රණය කරවීමට සිය කැමැත්තෙන් ම ඉදිරිපත් වූ බැවිනි. ඒ හැම සුධීහු පින් ලබත් වා! මෙහි පිට කවරයේ චිත්‍රයෙන් මිහිඳු මාහිමියන් දවසැ ථූපාරාමයේ දී කළ විනය සංගායනාව ප්‍රකාශ කරයි. බුද්ධශාසනයාගේ ආයුෂය යි සැලැකෙන විනය පිළිබඳ පොතක් වන කුදුසිකට විවරණයක් ලිවීමෙන් මා ලත් කුශල රාශිය මගේ ගුරුවර- මාපියාදීන් ඇතුළු සැමටත් අත්වේවා!

මීට-සසුන් වැඩකැමැති,

**වැලිගම ඤාණරතන.**

2498
—— සැප්තැම්බර් මස 6 වැනි දින
1954 බඹලපිටියේ වජිරාරාමයේ දී ය.

# ප්‍රකාශකයන්ගෙන්

---

මා මේ කුදුසික විවරණය මුද්‍රණය කරවීමට අදහස් කෙළේ මෙයින් උසස් ශාසනොපකාරයක් සැලැසෙන හෙයිනි. මෙහි මිළ නියම කොට තිබෙන්නේ යම්තම් වියදම පමණක් ලැබෙන ලෙස යි. මෙහි මුද්‍රණ කටයුතු ලක්‍ෂණට ත් නො පමාව ත් කරදුන් කොළඹ ශ්‍රී. පී. ඒකනායක සහ සමාගමේ මුද්‍රණාලයයේ මහතුන්හට තියු පෙරටු ව පින් පවරම්හ.

මීට-සසුන් දියුණුව පතන,

සි. ඕ. මුදලිගේ.

2498
—— සැප්තැම්බර් මස 6 වැනිද
1954 කොළඹ තිඹිරිගස්යාය පාරේ
මිගදය මැදුරේ දීය.

# මාතිකා පටුන


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| චත්තාරො පාරාජිකා | 2-19 | අසංවාසිකො | 93 |
| නව ගරුකා | 19-28 | කම්මං | 93-96 |
| චීවරං | 28-38 | මිච්ඡාජීව විවජ්ජනා | 96-99 |
| රජනානි | 38 | වත්තං | 100-102 |
| පත්තො | 38-45 | විකප්පනා | 102-105 |
| ථාලකා | 45 | නිස්සයො | 105-108 |
| පවාරණා | 45-51 | කායබන්ධනං | 108-110 |
| කාලිකා | 51-58 | පථවි | 110-112 |
| පටිග්ගාහො | 58-61 | පරික්ඛාරො | 113-116 |
| මංසෙසු ච අකප්පියං | 61-63 | භෙසජ්ජං | 116-119 |
| නිස්සග්ගියානි | 63-61 | උග්ගහො | 119-122 |
| පාචිත්ති | 64-70 | දූසනං | 122-126 |
| සමණකප්පා | 70-72 | වස්සූපනායිකා | 126-131 |
| භූමියො | 72-73 | අවෙභඞ්ගියං | 131-139 |
| උපජ්ඣාචෙරවත්තානි | 74-79 | පකිණ්ණකං | 139-163 |
| වච්චපස්සාවට්ඨානිකං | 79-80 | දෙසනා | 163-173 |
| ආපුච්ඡකරණං | 80-81 | ඡන්දදානාදීනි | 173-175 |
| නග්ගො | 81 | උපොසථො | 175-184 |
| න්හානකප්පො | 81-82 | පවාරණා | 184-189 |
| අවන්දියා | 83 | සංවරො | 189-190 |
| චම්මං | 83-84 | සුද්ධි | 190-192 |
| උපාහනා | 84-87 | සන්තොසො | 192-193 |
| අනොලොකියං | 87- | චතුරාරක්ඛා | 193-198 |
| අඤ්ජනී | 87-88 | විපස්සනා | 198-200 |
| අකප්පියානි සයනානි | 88-92 | නිගමනං | 201 |
| සමානාසනිකො | 92-93 | | |

# ශුද්ධි පත්‍රය

(ගාථාවන්හි)

| | අශුද්ධ | පිටුව | ශුද්ධ |
|---|---|---|---|
| 52 | (ගාථාව) ගතාගතකප්පාතං | (33) | අගතා'ගතකප්පාතං |
| 70 | (ගාථාව) මජ්ඣිමො තස්සුපටෙඨා තතො ච පඩෙඪා ච ඔමකො | (39) | මජ්ඣිමො තස්සුපඩෙඪා'ව තතො'පඩෙඪාව ඔමකො. |
| 228 | (ගාථාව) කාටාහො ච | (131) | කාටාහො ච |
| 358 | (ගාථාව) කායං උඝරං | (148) | කායං උඝරුං |
| 392 | (ගාථාව) සෙසෙහි | | සෙසෙහි |
| 394 | (ගාථාව) ජෙඩෙඪහි | (168) | ජෙඩෙඩහි |

| පිටුව | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 20 | 32 | අභිලාෂයෙන් | අභිලාෂායෙන් |
| 21 | 4 | හගති | හගිති |
| 30 | 19 | කම්මං කාතබබ | කම්මං කාතබ්බං |
| 41 | 11 | ඒ වස්තූන් | ඒ වසතු |
| 57 | 12 | වජෙතබ්බා, | වජ්ජෙතබ්බා, |
| 74 | 9 | පත්‍රයෙහි | පාත්‍රයෙහි |
| 84 | 1 | මිලාරුදීන් ගේ | බිලාරුදීන්ගේ |
| 89 | 34 | තෙවගින් | තෙවගින් |
| 99 | 20 | ලහෙන | ලාහෙන |
| 127 | 28 | එස් එළැඹෙන | වස්එළැඹෙන |
| 135 | 20 | ඉත | ඉත් |
| 138 | 19 | අඤ්ඤතිසාලකො | අඤ්ඤතිසලාකො |
| 146 | 27 | තව භික්ඛවෙ | ත ච භික්ඛවෙ |
| 170 | 14 | ගිලත | ගිලාත |
| [illegible] | [illegible] | පා[illegible] | පාරිසුද්ධිං |
| 178 | [illegible] | [illegible]රිය | බ්‍රහ්මචරිය |
| 190 | [illegible] | [illegible]රුගෙන | චිත්තදමනය ඇතිකැරගෙන |

# කුදුසික විවරණය

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

1 **ආදිතො උපසම්පන්නෙන[1]–සික්ඛිතබ්බං සමාසිකං**
**ඛුද්දසික්ඛං පවක්ඛාමි–වන්දිත්වා රතනත්තයං.**

අර්:

බුද්ධාදි රතනත්‍රය කා විසි මුනි තුන්දෙරින් සකාසා වැඳ උපසම්පන්න යකු විසින් මුල පටන් හික්මියයුතු (ඉගෙනීම්- දැරීම්- පිළිපැදීම්- විසින් නිතොර පුරුදු කළයුතු) වූ මාතෘකා සහිත කුදුසික නම් ප්‍රකරණයක් කියමි.

1 **ඛුද්දසික්ඛං**

විනය පිටකයෙහි ඇතුළත් කරුණු හකුළා කුඩා කොට ප්‍රකාශ කරන ලද හෙයින් ද බෙහෙවින් කුඩා සිකපද ඇතුළත් කළ හෙයින් ද මේ ප්‍රකරණය මෙනම් වී.

**තත්‍රා'යං මාතිකා**

2 **පාරාජිකා ච චත්තාරො–ගරුකා නව චීවරං**
**රජනානි ච පත්තො ච–ථාලකා ච පවාරණා,**

සතර පරිජි ද, විකුම් කෙණෙහි ඇවැද්දයුතු නව සඟවෙසෙස් ද, කැප අකැප සිවුරුද, කැප අකැප පඬු ද, කැප අකැප පාත්‍ර ද, කැප අකැප තලි ද, අහර පිළිකෙව් පවුරුණු ද,

3 **කාලිකා ච පටිග්ගාහො–මංසෙසු ච අකප්පියං**
**නිස්සග්ගියානි පාචිත්ති–[2]සමණකප්පා ච භූමියො**

යාවකාලිකාදි සිවුකැලි ද, පිළිගැනීම් ද, මස්හි අකැප මස් ද, නිසගි පචිති ද, සුඩ පචිති ද, ශ්‍රමණ ව්‍යවහාරයෝ ද කැප කිළි ද,

4 **[3]උපජ්ඣාචරියවත්තානි–වච්චපස්සාවථානිකං**
**ආපුච්ඡකරණං නග්ගො–[4]නහාණකප්පො අවන්දියා**

උපාධ්‍යාය වත් හා ආචාර්‍ය්‍ය වත් ද, වැසිකිළි කෙසකිළි තන්හි කළ මනා වත් ද, මහලු සඟුන් පිළිවිස කිරීම් ද, නග්න වත් ද, නහන විදි ද, පකතත්තයා විසින් නො වැන්ද යුත්තෝ ද,

5 **චම්මං උපාහනාචෙව–අනොලොකිය මඤ්ජනි**
**අකප්පියානි සයනානි–සමානාසනිකො'පි ච**

---

[1] උපසම්පන්න–බුරුම, ඉංගිලිසි. [2] සමණාකප්පා- බුරුම- ඉංගිලිසි. [3] උපජ්ඣා වෙර, බුරුම, ඉංගිලිසි, සිංහල සන්න. [4] නහාණකප්පො. බුරුම, ඉංගිලිසි සිං: සන්නය.

කැප අකැප සම් ද, කැප අකැප මගන් ද, මහණුන් විසින් නො බැලිය යුතු දෑ ද, කැප අකැප අඳුන් නළ ද, උස'සුන් මහසුන් විසින් අකැප වූ හෝනා හිඳිනා අසුන් ද, එක අසුන්හි හින්ද යුත්තෝ ද,

6 අසංවාසිකෙකා ච කම්මං-මිච්ඡාජීව විවජ්ජනා
වත්තං විඤ්ඤාපනා චෙව-නිස්සයො කායබන්ධනං

එක් වැ පොහෝ පවුරුණු කිරීම් ඈ සංවාසයට නො තිස්සෝ ද, චතුර් විධ කර්ම ද, මිථ්‍යා ජීවයෙන් දුරුවීම ද, ආගන්තුක වත්තාදි වත් ද, විඤ පුත් ද, නිස ද, කැප අකැප පටි ද,

7 පඨවි ච පරික්ඛාරො-භෙසජ්ජුග්ගහ දූසනං
වස්සූපනායිකාචෙවා'-වහඩ්ඪියං පකිණ්ණකං

කැප අකැප පොළෝ ද, කැප අකැප පිරිකර ද, බෙහෙත් ද, අකැප වත් පිළිගැනුම් ද, කුල දූෂණය ද, වස් එළඹීම් ද, ගරු බඩු ද, (නොයෙක් ලෙසින්) ප්‍රකාශ කළයුතු කැප අකැප දෑ ද,

8 දෙසනා ඡන්දදානාදි-උපොසථ පවාරණා
සංවරො සුද්ධි සන්තොසො-[1] චතුරාරක්ඛා විපස්සනා'ති

ඇවැත් දෙසීම් ද, සැඳ- පිරිසුදු- පවුරුණු දීම් ද, පොහෝ පවුරුණුද, ඉන්ද්‍රිය සංවරය ද, දෙසනා සුඬි ආදී සුඬි ද, ප්‍රත්‍යය සන්තෝෂය ද, සිවු අරක් ද, විදර්ශනාව ද, (යන මෙතෙක් ධර්මයෝ පිළිවෙළින් මෙහිලා විස්තර කරනු ලැබෙත්.)

---

## 1 පාරාජිකා ච වත්තාරො'ති

9 මග්ගත්තයෙ අනික්ඛිත්ත-සික්ඛො සන්ථත'සන්ථතෙ
අල්ලොකාසෙ නිමිත්තං සං-තිලමත්තම්පි සන්ථතං

10 අසන්ථතමුපාදින්නං-පවෙසන්තො චුතො'ථවා
පවෙසනඨිතුද්ධාර-පවිට්ඨක්ඛණෙ සාදකො.

ප්‍රත්‍යාඛ්‍යානය නො කරන ලද ශික්ෂා ඇති භික්ෂුතෙමේ (සම් ඈ කිසිව කින්) වසන ලද හෝ නොවසන ලද හෝ තුන්මඟින් යම්කිසි මඟෙක්හි; එහිදු පියවි සුලඟ නො පහරණ තෙත් පියසෙක්හි, වසන ලද හෝ නො වසනලද හෝ අනෂ්ටකාය ප්‍රසාදය ඇති සවකිය අඞ්ගජාතය තලැ'ටක් පමණකුදු ප්‍රවේශ කරන්නේ ශාසනයෙන් චුතවූයේ වෙයි. නොහොත් (තමා නිමිත්හි මෙරමාගේ උපක්‍රමයක් ඇති කල්හි) ප්‍රවේශ ක්ෂණය- ස්ථිති ක්ෂණය- උද්ධාරක්ෂණය- ප්‍රවිෂ්ටක්ෂණය යන මොවුන් අතුරෙන් යම්කිසි ක්ෂණයෙක්හි ඉවසන්නේද (එකෙණෙහි ම) ශාසනයෙන් චුතවේ.

---

[1] චතුරක්ඛා- සන්තය.

## 2 මග්ගන්තරෙ

මෙහි වච්ච– පස්සාව– මුඛ– වශයෙන් මාර්ගත්‍රයයකි. එද විස්තර වශයෙන් සමතිසෙක් වේ. මනුස්සා'මනුස්ස තිරච්ඡාන වශයෙන් ස්ත්‍රීහු තිදෙනෙක් වෙති. ඔවුන් ගේ වච්ච–පස්සාව–මුඛ යි මාර්ගත්‍රය බැගින් නවයෙකි. මනුෂ්‍ය–තිරශ්චීන–යක්ෂ–යන උභතො ව්‍යඤ්ජනකයන් ගේත් එකිනෙකා ගේ තුන බැගින් නවයෙකි. ඒ උභය නවකය එක් වූ විට අටළොසෙකි. මනුෂ්‍ය–යක්ෂ–තිරශ්චීන යන නපුංසක පණ්ඩකයන් ගේ **වච්ච**, මුඛ විසින් එකිනෙකාට දෙ මහ බැගින් මාර්ග සයෙකි. මනුෂ්‍ය– යක්ෂ– තිරශ්චීන– යන පුරුෂයන් ගේ ත් **වච්ච**– මුඛ වශයෙන් මාර්ග දෙක බැගින් සයකි. එක් වූ විට සමතිස් මහෙකි.

## 3 අනික්ඛිත්තසික්ඛා

ශික්ෂා සඞ්ඛ්‍යාත උපසම්පදාව සිය සිතින් බහා නො තැබූ යනු යි. ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයෙහි "චිත්තක්ඛෙත්තකාලප්පයොග පුග්ගල විජානන" වශයෙන් අඞ්ග සයෙකැයි "**කංඛාවිතරණී**" ආදි ග්‍රන්ථයන්හි දක්වේ.

### චිත්ත

ක්‍රීඩාදිය පිණිස නොව උපසපන් බැවින් චුත වන අදහසින් ම ප්‍රකාශ කිරීම චිත්ත වශයෙන් ප්‍රත්‍යාඛ්‍යානය යි.

### ඛෙත්ත

උපසපන් බැවින් චුත වනු පිණිස ප්‍රකාශ කළ යුතු ක්‍රම දෙවිස්ස ඛෙත්ත (පද) නම්.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | බුද්ධං | **පච්ච**ක්ඛාමි | 8 | උපජ්ඣායං | **පච්ච**ක්ඛාමි |
| 2 | ධම්මං | ,, | 9 | ආචරියං | ,, |
| 3 | සඞ්ඝං | ,, | 10 | සද්ධිවිහාරිකං | ,, |
| 4 | සික්ඛං | ,, | 11 | අන්තෙවාසිකං | ,, |
| 5 | විනයං | ,, | 12 | සමානුපජ්ඣායකං | ,, |
| 6 | පාතිමොක්ඛං | ,, | 13 | සමානාචරියකං | ,, |
| 7 | උද්දෙසං | ,, | 14 | සබ්‍රහ්මචාරිං | ,, යි |

මේ තුදුස් අයුරින් හා

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | ගිහී'ති මං | ධාරෙහි | 5 | තිත්ථියො'ති මං | ධාරෙහි |
| 2 | උපාසකො'ති මං | ,, | 6 | තිත්ථිය සාවකො'ති මං | ,, |
| 3 | ආරාමිකො'ති'මං | ,, | 7 | අස්සමණො'ති මං | ,, |
| 4 | සාමණෙරො'ති මං | ,, | 8 | අසක්‍යපුත්තියො'ති මං | ,, |

යන අට අයුරින්ද යි ඛෙත්තපද දෙ විස්සෙකි. මේ දෙ විස්සෙන් එකකින් හෝ, පර්යාය නාම වශයෙන් හෝ, අසනු ලබන්නාහට පහසුවෙන් වැටහෙන හෙළ බස් ඈ අන් බසකින් හෝ ප්‍රකාශ කළයුතු.

**කාල**

පච්චක්ඛාමි, ධාරෙහි යනාදීන් වර්තමාන කාල වශයෙන් ද අලමෙව බුද්ධෙන, කින්නු මෙ බුද්ධෙන, න මමත්ථො බුද්ධෙන, සුමුත්තොහං බුද්ධෙන, යනාදීන් කාලාපෙක්ෂාවක් නොමැති ව හෝ ප්‍රකාශ කිරීමෙන් ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය වේ.

පච්චක්ඛාසිං, පච්චක්ඛිස්සං, ධාරෙසි, ධාරෙස්සසි, යන්නූනාහං පච්චක්ඛෙය්‍යං, යනාදි වශයෙන් අතීත අනාගත කාල වශයෙන් හෝ, පරිකල්ප වශයෙන් හෝ ප්‍රකාශ කරන්නහු ගේ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය නොවේ.

**පයොග**

ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයෙහි වාග් ප්‍රයොගය ම වේ. ලියා පෙන්වීමෙන් හෝ හස්තමුද්‍රාදි සෙසු කාය ප්‍රයෝගයකින් හෝ හඟවන්නහු ගේ ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය නොවේ.

**පුග්ගල**

ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කරන්නා ද කරනු ලබන්නා ද උම්මත්තක ඛිත්ත චිත්ත වෙදනාට්ටාදි වශයෙන් විකෘත සමෘති ඇත්තවුන් නොවිය යුතු සි. ප්‍රකෘති සිහිය ඇති මනුෂ්‍යයකු විය යුතු සි.

**විජානන**

"මොහු උපසපන් බැවින් චුත වීමේ අදහසින් ම ප්‍රකාශ කරතැ"යි අසනු ලබන්නා ඒ මොහොතේ ම දැන ගැනීම යි. මෙසේ චිත්තාදි අඞ්ග සයකින් සම්පූර්ණ වූ කල්හි ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය වන්නේ ය.

**4 අපලොකාසෙ**

පියවි වාතයෙන් නො පහළ තෙත් පෙදෙස්හි යනු සි.

**5 උපාදින්නං**

අනෂ්ටකාය ප්‍රසාද ඇති යනු සි. "සං අඞ්ගජාතං" යන්නට විශෙෂණයි. කාය ප්‍රසාදය නට කල්හි සුඛාදි වෙදනා නො දැනෙන හෙයින් "උපාදින්නං" සී යෙදූහ.

**6 චුතො**

පරිජි අවත් තැනැත්තේ කෙලෙසුන් ගෙන් පැරදුණු හෙයින් ශාසන යෙන් චුත වූයේ නම් වෙයි.

11 ආදියෙය්‍ය හරෙය්‍ය'ව-හරෙය්‍ය ඉරියාපථං
කොපෙය්‍ය ඨානා චාවෙය්‍ය-සංකෙතං වීතිනාමයෙ

12 ඇදින්නං ථෙය්‍ය චිත්තෙන-භවෙ පාරාජිකො'ථ වා
ථෙය්‍ය බල කුසච්ඡන්න-පරිකප්පා'ව හාරකො
භණ්ඩ කාලග්ඝ දෙසෙහි-පරිභොගෙනෙත්ථ නිච්ඡයො

වසතු හිමියන් නො දුන් වසතුව සොරසිතින් සටන් බැණ ගනී නම් හෝ, ගෙන යමින් සිට ගනී නම් හෝ, තමා ළඟ තැබූ වසතුව "මම නො ගත්මැ"යි බොරු කියා ගනී නම් හෝ, බඩු ගෙන යන්නහු ගේ ඉරියව් කොපනය කොට ගනී නම් හෝ, තුබූ තැනින් පහකොට ගනී නම් හෝ, සුන්වත් ගන්නා තැන වේවයි තමා විසින් පිරිකැපූ තැන වේවයි ඉක්මවා ගනී නම් හෝ, කෙලෙස් සතුරන් විසින් පරදවන ලද්දේ ය. නොහොත් සඞ්කෙතදී වශයෙන් හොරකමින් හෝ, බලාත්කාරයෙන් හෝ, කුසපත් පෙරළීමෙන් හෝ, තෘණ පණ්ාදියෙන් සැඟවීමෙන් හෝ, භාණ්ඩාවකාශ පරිකල්පනායෙන් හෝ ගනීද පරිජි වන්නේ ය. සොරාගත් වසතුවය, අවහාර කාලය, භාණ්ඩයෙහි අගය, අවහාර දෙශය යන මොවුන් විසින් ද භාණ්ඩයෙහි සවාමිපරිභොග විසින් ද මේ අදත්තාදානයෙහි විනිශචය කටයුතු.

**විසතර**

1 මේ දෙගයින් අදත්තා'දානයෙහි දී විසතර කළ යුතු වූ පස්විසි අවහාරය ම සංක්ෂෙපයෙන් ප්‍රකාශ කරන ලදි. මුල් ගයෙහි සපදයෙන් නානාභණ්ඩ, එකභණ්ඩ, සාහත්‍ථික, පුබ්බපයොග, යන පඤ්චක සතර ම ප්‍රකාශ වේ. එහි "සංකෙතං වීතිනාමයෙ" යන සවැනි පදයෙන් තෙ වැනි පස් වැනි පඤ්චකයන්හි නිස්සග්ගිය, පරිකප්පාවහාර ගැනේ. අතික් ගාථා යෙන් ථෙය්‍යාවහාර පඤ්චකය සහ විනිශචය කිරීමේ දී අවශ්‍යයෙන් සලකා බැලිය යුතු කාරුණු ද ප්‍රකාශ වේ.

7 **අදින්නං**

වත් හිමි මිනිසුන් විසින් කයින් හෝ වචනයෙන් හෝ නුදුන් වසතුවය යනුයි.

## පස් විසි අවහාරය

**නානාභණ්ඩ පඤ්චකය**

8 (1) **ආදියෙය්‍ය**

මෙරමා සතු ආරාමාදිය බොරු කියා තමා අයත්කර ගැනීම යි. මෙහි දී වාග් ප්‍රයොගයෙන් දුකුළා ද හිමියා හට විමති ඇතිකිරීමෙන් තුලසි ද, "මොහු මට මෙය නොදෙ යි, එනිසා බලාපොරොත්තු වීමෙන් කම්නැතැ"යි හිමියා ධුරනික්ෂෙප කිරීමෙන් පරිජි ද වේ.

9 (2) **හරෙය්‍ය**

අනුන් ගේ බඩුවක් ගෙන යමින් සිට පැහැර ගැනීම යි. සොර සිතින් පරාමර්ශනය කිරීමෙන් දුකුළා ද සොල්වා ලීමෙන් තුලසි ද, ඨානාචාවන යෙන් පරිජි ද වේ.

10 (3) **අවහරෙය්‍ය**

තමා වෙත අනුන් විසින් තබන ලද බඩු නොදී ගැනීම යි. වසතු හිමියන් ඉල්ලූ කලැ "මම නො ගත්තෙමැ" යි කීමෙන් දුකුළා ද විමති ඉපද වීමෙන් තුලසි ද, ධුරනික්ෂෙපයෙන් පරිජි ද වේ.

11 (4) ඉරියාපථං විකොපෙය්‍ය

බඩු ගෙන යන්නහු ගේ ගමනාදි ඉරියව් සිඳ ගැනීම යි. ගනු කැමැති ව ඉරියව් කොපනයෙන් දුකුළා ද මුල්පියවර ඉක්මවා ලීමෙන් තුලසි ද, දෙවන පියවර නැගීමෙන් පරිජි ද වේ.

12 (5) ඨානා චාවෙය්‍ය

අනුන් ගේ පිරිකර ආදියක් තුබූ තැනින් ගැනීම යි. සොර සිතින් අතගැමෙන් දුකුළා ද, සෙලවීමෙන් තුලසි ද, ඨානා චාවනයෙන් පරිජි ද වේ.

එකභණ්ඩ පඤ්චකය

නානාභණ්ඩ පඤ්චකයට අයත් "ආදියෙය්‍ය" ඈ පස ම එකභණ්ඩ පඤ්චකයෙහි ද අන්තර්ගත වේ. නානාභණ්ඩ පඤ්චකය සවිඤ්ඤාණක අවිඤ්ඤාණක යි ද්විවිධ වන අතර එකභණ්ඩ පඤ්චකය සවිඤ්ඤාණක වස්තුව සොරසිතින් ගැනිමෙන් ම වේ.

## සාහත්ථික පඤ්චකය

(1) සාහත්ථිකො

මෙරමා ගේ බඩු සිය'තින් පැහැර ගැනීම යි.

(2) ආණත්තිකො

"අසුවලා ගේ බඩු ගනුව" යි අනෙකකු හට නියම කොට ගැන්වීමයි.

(3) නිස්සග්ගියො

සුංවත් ගන්නා තැන ඇතුළෙහි සිට බඩු පිටට විසි කොට සුංවත් නො දීම යි.

(4) අත්ථසාධකො

"අසුවලා ගේ බඩු හැකි විටක ගනුව"යි යමකුහට අණ කෙළේ නම්; ඒ අණ කළ උපසපන් භික්ෂුවට අණ කළ කෙණෙහි ම පරිජි ඇවැත් සිදු වේ. ඉදින් ඒ අණ ලබන්නා ත් භික්ෂුවක් නම්; ඔහු ඒ බඩුව ගත් කෙණෙහි පරිජි වේ. නැතහොත් අනුන් ගේ තෙල් සැළ ආදියෙක්හි වහන් ඈ යමක් පාදයක් අගනා තෙල් බොන ලෙස බහා නම්, එය අතින් මුත් කෙණෙහි පරිදි ඇවැත් වේ. කායිකිය සම්පූර්ණවීමට පළමුවෙන් ම පාරාජිකා සඞ්ඛ්‍යාත අර්ථය සිදුවන හෙයින් මෙය අත්ථසාධක නම්.

(5) ධුරනික්ඛෙපො

ආරාමාදි අභියොගයෙහි ද, තමා ළඟ තැබූ භාණ්ඩයෙහි ද, තාවකාලික වශයෙන් දියයුතු භාණ්ඩයෙහි ද අයිතිකරුගේ සහ බඩු ළඟ තබාගත්තහු ගේ ත් ධුරනික්ඛෙපයෙන් ගත්තහුට පරිජි ඇවැත් වේ.

## පුබ්බපයොග පඤ්චකය

(1) **පුබ්බපයොගො**

"අසුවලා ගේ බඩු සොරා ගනුව"යි අණකළ විට අණ ලැබූවහු එකාන්ත යෙන් ම ගතිත් නම් අණ කළ කෙණෙහි ම පරිජි වේ. ගත්තහුට ගත් කෙණෙහි පරිජි වේ. අත්ථසාධක පුබ්බපයොග දෙක්හි වෙනස මෙපමණි. අත්ථසාධකයේ දී "හැකි වේලාවක ගන්නටය" යි කියතත් පුබ්බපයොග යෙහි දී එබන්දක් නැත.

"අත්ථසාධක පුබ්බපයොගයෙහි නනස මෙකියන සෙයින් දත්තෙ:- අණවන ලද්දහු ගන්නා පෙරට ව මෙ ඇණෑ වූවා හට පරිජි ඇවී සිඩ වන බැවින් අත්ථසාධක නම්. ඇණවන ලද්දහු ගන්නා පෙරට වැ මෙ ඇණෑ වූවාහට පරිජි වන බැවින් පුබ්බපයොග නම් වේ." මේ වනාහි **සිඩවළඳ විනිශ්චයෙහි** අත්ථසාධක පුබ්බපයොග දෙකෙහි වෙනස කියූ සැටි යි.

(2) **සහපයොගො**

අනුන් ගේ ආරාමාදි වස්තුව තමා සතු කර ගැනීමට කරන අවසාන ප්‍රයොගය සමග ම පරිජි වන හෙයින් මේ නම්.

(3) **සංවිදාවහාරො**

"අසුවලා ගේ බඩු සොරා ගනිමු"යි මන්ත්‍රණය කොට ගොස් එක් කෙනකුන් විසින් හෝ බඩු තුබූ තැනින් පැහැර ගැනීමට සෙල වූ කල්හි හැමදෙනා හට ම පරිජි ඇවැත් සිදු වේ.

(4) **සඬකෙතකම්මං**

පෙරවරු පස්වරු ඈ කාලයන්හි අසුවල් වේලාවට ගනුව යි කාල නිය මය කොට කී කල්හි නියමිත වේලාවට පෙර පසු නොවී ගතහොත් නියම කළ නිසාවූ නියමිත කෙණෙහි ම පරිජි වේ.

(5) **නිමිත්තකම්මං**

"මා අසුවල් නිමිත්ත කළ කල්හි අසුවලා ගේ බඩු ගනුව"යි කී විට ඒ නිමිත්තෙන් පෙර පසු නොවී ගනී නම් නිමිත්ත කළහුට එකෙණෙහි ම පරිජි ඇවැත් වේ.

## ථෙය්‍යාවහාර පඤ්චකය

13 (1) **ථෙය්‍යාවහාරො**

උමං බිඳුම් මං පැහැරුම් ආදියෙන් ගනී නම් හෝ, හොර කිරුම් හොර මැනුම් ආදියෙන් වඤ්චා කොට ගනී නම් හෝ, හොර කාසි ආදිය මාරු කොට ගනී නම් හෝ ථෙය්‍යාවහාරය වශයෙන් පරිජි වේ.

මෙහි දී "හදය හෙද,- සිඛා හෙද,- රජ්ජු හෙද විසින් ගැනෙන ත්‍රිවිධ මානකූටය ද, "කහාපණ කූටාදීහි" යන තන්හි ආදි ශබ්දයෙන් තුලාකූට- කංස කූටාදියෙන් කරන වඤ්චනික ක්‍රියා" ද ගත යුතුයයි **විනයත්ථ මංජුසාවෙහි** (76) සඳහන් වේ.

14 (2) බලාවහාරෙ

ගාමඝාතකාදීන් මෙන් අනුන් ගේ බඩු බලාත්කාරයෙන් ගැනීම හෝ තමහට අයත් කොටසට ත් වඩා ගැනීම යි. "පසය්හාවහාර" යනු ද මීට ම නමි.

15 (3) කූටාවහාරෙ

කුසපත් ආදිය පෙරළා වඤ්චා කොට ගැනීම යි. කුසපත් දමා සිවුරු පිරිකර බෙදන විට, යමෙක් සිය කොටසට වඩා අධිකව අගනා වූ හෝ, අගනාකමින් සමාන වූ හෝ, ඌණ වූ හෝ අනුන් ගේ කොටස සොරාගනු කැමැත්තෙන් සිය කොටසෙහි වූ කුසපත අනුන් ගේ කොටසෙහි හෙළා ද එපමණකින් පරිජි නොවේ. අනුන් කොටසෙහි වූ කුසපත තම කොට සෙහි හෙලූ කෙණෙහි ම පරිජි වේ. අනුන් ගේ කොටසට අයත් පිරිකර වටිනකමින් අඩුවුව ද ඔහු නොදන්වා ගත් විට පරිජි වේ.

16 (4) පටිච්ඡන්නාවහාරෙ

කලින් පරිකල්පනය කොට එපරිද්දෙන් පැහැර ගැනීම යි. පරිකප්ප යෝ දෙකෙක් වෙති. භණ්ඩපරිකප්ප, ඔකාසපරිකප්ප වශයෙන්. වස්ත්‍රය කින් ප්‍රයොජන ඇත්තෙක් ගෙයකට වැද "ඉදින් වස්ත්‍රයක් වුව ගනිමැ"යි සිතා අඳුරේ පසුම්බියක් තගා ගත් කල්හි එහි වස්ත්‍රයක් වී නම් එකෙ ණෙහි ම පරිජි වේ. එහි වස්ත්‍රයක් නොවී නම් පරිජි නොවේ. නො දැන අනෙකක් හෝ පැහැර ගෙන එය වුවත් කමක් නැතැ යි සිතා ගෙනැයේ නම්, පරිජි වේ. මේ භණ්ඩ පරිකප්පය යි. අනුන් ගේ බඩුවක් ගෙන අසු වල් හරියේ දී බඩු හිමියන් දුටුවොත් තබන බවත් නුදුටුවොත් ගෙන යන බවත් සිතා, එය ගෙන පරිකල්පිත සීමාව ඉක්ම වූ කෙණෙහි පරිජි වේ. මේ ඔකාස පරිකප්පය යි.

17 නිච්ඡයො

විනිශ්චය යි. මේ අදත්තාදාන විනිශ්චයේ දී 1 සොරා ගත් බඩුව පිළිබඳ සස්වාමිකා'ස්වාමික භාවය ද සැලකිය යුතු යි. අයිති කරුවෙක් සිටී නම් ඔහු ඒ ගැන බලාපොරොත්තු වේද, නො වේද, කියා පිරික්සූ කල්හි ඔහු බලාපොරොත්තු වේ නම්, එහි වටිනාකම තක්සේරු කරවා විනිශ්චය කළ යුතු යි. මේ වනාහි භාණ්ඩයේ වශයෙන් විනිශ්චය කරන සැටියි. බඩු හිමියා සොරා ගත්තා බඩුව කෙරෙහි නිරාලය ව සිටී නම් ගත්තා තැනැත්තේ පරිජි නොවේ. එහෙත් බඩු හිමියා බඩු ඉල්ලා නම් දිය යුතුයි. එසේ ඉල්ලන කල්හි නොදේ නම් පරිජි වේ.

(2) කාල වශයෙන් විනිශ්චය කිරීම වනාහි යම්කිසි කාලයෙක්හි දී බඩුව සොරා ගනී නම් එකල පවත්නා වටිනාකම සලකා ඒ අනුව විනිශ්චය කිරීම යි.

(3) අග්ඝ වශයෙන් විනිශ්චය කිරීම නම් බඩුව සොරා ගත්තා විට බඩුවේ පැවැති යථාතත්ත්වය සලකා විනිශ්චය කිරීම යි. නව භාණ්ඩයත් පුරාණ භාණ්ඩය ත් එක සමාන වටිනා කම් නැති හෙයිනි.

4 දෙශ වශයෙන් විනිශ්චය කිරීම නම් බඩුව පැහැර ගත් දෙශය-පළාත අනුව විනිශ්චය කිරීම යි. එක ම බඩුව වුවත් පළාත් අනුව වටිනා කමින් නානාවිධ විය හැකි හෙයිනි, මෙසේ සලකන්නේ.

මේ අදත්තාදානයෙන් පරිජි වීමට නම් පාදයක් හෝ පාදයක් වටිනා වස්තුව හෝ පස්විසි අවහාරයෙන් යම්කිසි අවහාරයකින් ගත යුතු ය.

“තෑ නො තෑ පරමිතිසක්හු අයත් පල්පොහොනා වතක් සොරසිත් ඇතියා ව පස්විසි අවහාරයන් අතුරෙන් එක්තරා අවහාරයෙකින් ගනිනම් පරිජි වේ.” (**සිඛවළඳවිනිස 18 පිටුව**)

මෙහි පල් පොහොනා වතක් යන්නෙන් පාදයක් අගනා වස්තුව ගැනේ. පාදය යනු කොපමණ දැ යි නොයෙක් තන්හි මෙසේ සඳහන් වේ.

“තෙන ඛො පන සමයෙන රාජගහෙ පඤ්චමාසකො පාදො හොති” (**පාරාජිකාපාළි 44 පිටුව**)

“තදා රාජගහෙ වීසති මාසකො කහාපණො හොති; තස්මා පඤ්චමාසකො පාදො. එතෙන ලක්ඛණෙන සබ්බජනපදෙසු කහාපණස්ස චතුත්ථො භාගො පාදො’ති වෙදිතබ්බො. සො ච ඛො පොරාණස්ස නීලකහාපණස්ස වසෙන” (**සමන්තපාසාදිකා 213 පිටුව**)

“පොරාණක සත්ථානුරූපං උප්පාදිතො වීසතිමාසප්පමාණො උත්තම සුවණ්ණග්ඝනකො ලක්ඛණසම්පන්නො නීලකහාපණො’ති වෙදිතබ්බො. (රුද්‍රදාමෙන නාම කෙනචි උප්පාදිතො රුද්‍රදාමකො සො කිර නීලකහාපණස්ස තිභාගං අග්ඝති.) යස්මිං පන දෙසෙ නීලකහාපණා න සන්ති; තත්ථා’පි කාළක විරහිතස්ස නිද්ධන්ත සුවණ්ණස්ස පඤ්ච මාසග්ඝනකෙන භණ්ඩෙන පාදපරිච්ඡෙදො කාතබ්බො.” (**විමතිවිනොදනී 143-144**)

“එත්ථ පාදො නාම කහාපණස්ස චතුත්ථො භාගො”

(**විනයත්ථමඤ්ජූසා 72**)

“පොරාණස්ස කහාපණස්ස චතුත්ථො භාගො පාදො”

(**විනයත්ථමඤ්ජූසා 77 පිටුව**)

“තත්ථ පාදෙන කහාපණස්ස චතුත්ථභාගං අකප්පිය භණ්ඩමෙව දස්සෙති. පාදාරහෙන පාදග්ඝනකං කප්පියභණ්ඩං අතිරෙක පාදෙන උභයම්පි. එත්තාවතා සබ්බාකාරෙන දුතියපාරාජිකප්පහොනක වත්ථුං දස්සිතං හොති (**සමන්තපාසාදිකා 222 පිටුව**)

“තාදිසං භික්ඛු පොරාණකස්ස කහාපණස්ස පාදං වා පාදාරහං වා භණ්ඩං අදින්නං භූමි ආදිසු යත්ථ කත්ථචි ඨිතං යං කිඤ්චි සජීවනිජ්ජීවං වුත්තප්පකාරානං අවහාරානං යෙන කෙනචි අවහාරෙන අවහරන්තො පාරාජිකො හොති; කො පන වාදො තතො අතිරෙකතරස්මිං.”

(**මාතිකාට්ඨකථා 28 පිටුව**)

මෙහි සඳහන් හැම විස්තරයකින් ම ප්‍රකාශ වූයේ පාදය නම් පුරාණ කහවණුවෙන් සතරෙන් පංගුව බව යි නැතහොත් මාසක පසක් බව යි. "මාසකො නාම පොරාණකස්ස කහාපණස්ස වීසතිමො භාගො; යා ලොකෙ මඤ්ජෙටී'තිපි වුච්චති" (විනයත්ථමංජුසා 77 පිටුව)

"මෙහි පලෙක් නම් පස්මදටක් අමුරති" (සිඛවළඳවිනිස)

මේ ප්‍රකාශ වලින් මාසකය වනාහි පුරාණ කහවණුවෙන් විස්සෙන් පංගුවෙකැයි කියැවේ මේ මාසකයට ලෙව්හි මඤ්ජෙටී– මදට යී ද ව්‍යව හෘත යි. පුරාණ කහවණුව මදටිය විස්සක වටිනාකම තිබෙන බව මෙයින් හොඳින් පෙනේ.

අභිධානප්පදීපිකාවෙහි "චත්තාරො වීහයො ගුඤ්ජා–ද්වෙ ගුඤ්ජා මාසකො භවෙ" යී ද,

"යවොෂ්ට සඞ්පෛඃ ප්‍රොක්තා ගුඤ්ජාස්‍යාත්තච්චතුෂ්ටයං
ෂඞ්භිස්තු රක්තිකාභිඃ ස්‍යාන්මාශකොහෙමධාත්‍යකෞ" යී

ශාර්ඞ්ගධරයෙහි ද මාසකය ප්‍රමාණ කොට තිබෙන සැටි යි. එය මීට මදක් වෙනසි. මෙහි පුරාණ කර්ෂාපණයෙන් විංශතිම භාගය යි ගැනීම සුදුසු ය.

**වර්තමාන ව්‍යවහාරයෙන් පාදයක වටිනාකම**

මේ ගැන තීරණාත්මක අදහසෙක් නැත. වර්තමානයේ ව්‍යවහාර කරන කාසිවලින් රුපියල් දෙකකුත් සත පණසකැයි ඇතැමෙක් කියති. ඇතැමෙක් ශත 75 ය යි කියති. කෙසේ හෝ ශත 75 ය යි ගැනීම සිය පරෙස්සමට යහපති.

"වරාටකානාං දශකද්වයං යත්
සා කාකිණී තාශ්ච පණශ්චතස්‍රඃ
තෙ ෂොඩශ ද්‍රම්‍ය ඉහාවගම්‍යො
ද්‍රම්මෛඃස්තථා ෂොඩශභිශ්චනිෂ්කඃ"

යී **ලීලාවතියෙහි** දක්වෙන පරිදි කවඩි විස්සක් තුට්ටුවකි. තුට්ටු සතරක් පණයකි. පණ දහසයක් ද්‍රම්‍යයකි. හෙවත් රුපියලකි. රුපියල් දහසයක් කහවණුවකි. මේ අනුව කහවණුවෙන් සතරෙන් කොටසක් රු: 4 කි. පාදයක් වනුයේ රුපියල් සතරක් බව මෙයින් පැහැදිළිය. බුරුම රට ඇතැම් මහතෙරුන්ගේ මතය ද මෙය ම බව අසන්නට ලැබිණ.

**විමතිවිනොදනී** (143–144) විස්තරයේ සැටියට මාසක පසක් බරැති ඉතා පිරිසුදු රන්කැල්ලක වටිනාකම යම් පමණ නම් පාදයක වටිනාකමත් එපමණය යි ගැනීම හැම කාලයට ම යොග්‍ය ය.

"අදින්නාදානෙ තිණසලාකමත්තෙනාපි වජ්ජනා"යී කි හෙයින් හෙරණු නට ඉතා ම සුළු දෙයක් ගැනීමෙහි ද පරිජි දතවයි.

13 **මනුස්ස විග්ගහං ච්ච ජීවිතා වා වියොජයෙ**
**[1]මරණ චෙතනො සත්‍ථ හාරකං උපනික්ඛිපෙ**

වධක චෙතනා ඇති මහණ තෙමේ "මොහු මරමි" යි දැන මිනිස් සතක්හු රූපාරූප ජීවිතයෙන් තොර කෙරේ නම්, ශස්ත්‍රයක් හෝ (මියනු කැමැත්තහු) සමීපයෙහි ගත හැකි සේ එළවා තබා නම්;

14 **ගාහෙය්‍ය මරණූපායං වදෙය්‍ය මරණෙ ගුණං**
**චුතො පඤ්ඤාගා සාහත්‍ථි නිස්සග්ගාණත්ති ථාවරා**

15 **ඉද්ධි විජ්ජාමයා කාල වත්‍ථායුධිරියාපථා**
**ක්‍රියාවිසෙසො ඔකාසො ඡ ආණත්ති නියාමකා.**

මරණය පිණිස උපාය හෝ උගන්වා නම්, මරණයෙහි අනුසස් හෝ කියා නම්, චුත වූයේ වෙයි. ස්වහස්තයෙන් පහරදීමය, ඊ ආදීන් ගේ නිස්සජනය, ඇණවීමය, ඔපාත බණතාදි ථාවරය යන මොහු ද රජුන් ගේ රාජඍද්ධි ඈ කර්ම විපාකජ ඍද්ධිය ගේ යෙදීම හා මන්ත්‍ර සංඛ්‍යාත විද්‍යාව ගේ ජපකිරීම ද, යන මේ සදෙනා වධ ප්‍රයොගයෝ යි; කාලය, සත්ත්ව සංඛ්‍යාත වස්තුවය, මරණ ආයුධය, ඊර්‍ය්‍යාපථය, (යන මොහුද) ක්‍රියා විශෙෂය ද, අවකාශය ද, යන සදෙන ආණත්ති නියාමකයෝ යි.

**විස්තර**

මේ ගාථාත්‍රයයෙන් මිනිස් ඝාතා පරිජියෙහි සියලු අවයවයෝ ම සංක්ෂෙපයෙන් ප්‍රකාශ කරන ලදහ. මනුෂ්‍යයකු බව දැන "මොහු මරමි" යන වධක චෙතනා ඇති ව සියතින් දිවි තොර කිරීම ය, දිවි තොරකර ගනු කැමැත්තකුට ගත හැකි සේ කඩු ඈ අවි ළඟ තැබීම ය, මැරෙන උපාය හෝ කියා දීම ය, මරණයෙහි අනුසස් කියා දී ම ය, යන සතරාකාරය සහ සාහත්‍ථිකාදි ෂඩ්විධ ප්‍රයෝගයෝ ද, කාලාදි ෂඩ්විධ ආණත්ති නියාමකයෝ ද, මෙහි ලා වර්ණිතයහ.

18 **මනුස්සවිග්ගහං**

මිනිස් සිරුරක් යනු යි. කලලාවස්ථායෙහි පටන් ජීවිතාන්තය තෙක් පවත්නා මිනිස් සිරුර "මනුස්සවිග්ගහං" යන්නෙන් අභිමත යි. ප්‍රතිසන්ධි විඥානය සමග පහළ වන ඉතා ම ත් ම සියුම් වූ රූපය කලල රූපය නම්. එය හඳුන්වනු ලබන අටුවා ඇජරන් විසින්:

"තිල තෙලස්ස යථා බින්දු සප්පි මණ්ඩො අනාවිලො
එවං වණ්ණ පටිභාගං කලලන්ති පවුච්චති"

යි ප්‍රකාශ කරන ලදි. තල තෙල් බින්දුවක් වැනි හෝ, පිරිසුදු ගිතෙල් යොදයක් වැනි හෝ, පැහැය ඇති ඉතා ම කුඩා වූ ධාතු බින්දුව කලල නම්. මේ ලක්ෂණ ඇති කලල රූපය කොතරම්ද! යත්: "හිමාලය පියෙස් වැසි සියුම් ලොම් ඇති හෙයින් "ජාතිඋණ්ණා" නම් වූ එළුවකු ගේ යටිබඩෙහි පවත්නා ලොම් කොනකින් ගත් තලතෙල් බින්දුවක් පමණ වන්නේය" යි

---

[1] සත්‍ථං වා අස්ස මරණ චෙතනො උපනික්ඛිපෙ. බු. ඉං.

පූර්වාචාර්‍යයවරයෝ ප්‍රකාශ කළහ. ස්ත්‍රී- පුරුෂ කලල රූපයෙක්හි කාය දසක වස්තුදසක භාවදසක යන දසක තුන ම තිබෙතත් නපුංසකයහට භාවදසකය නොමැති බැවින් සෙසු විවිධ දශකය පමණකි ඇත්තේ.

**19 ජීවිතා වා වියොජයෙ**

කලල කාලයෙහි තැවීම් මැඩීම් ආදියෙන් සහ බෙහෙත් බලයෙන් ද, කලල කාලය ඉක්ම ගියායින් පසු ඒ ඒ කාලයට අනුරූප වූ උපක්‍රම කොට රූපාරූප ජීවිතෙන්ද්‍රියය විනාශ කිරීමද යි යම් ඒ කවරකාරයකින් හෝ රූපාරූප ජීවිතෙන්ද්‍රියය විනාශ කිරීම මෙයින් කියැ වේ. රූප ජීවිතෙන්ද්‍රියය විනාශ කළ කල්හි අරූප ජීවිතෙන්ද්‍රියයා ගේ විනාශය ස්වයං සිඩයි. මෙහි වා ශබ්දය විකල්පාර්ථයෙහි ය.

**20 ගාහෙය්‍යමරණූපායං**

මරණයට උපාය හෝ ගන්වා නම් යනු අර්ථ යි. "සත්ථං වා ආහර, විසං වා ඛාද- ශස්ත්‍රයක් හෝ ගනුව, විෂ හෝ කාව" යනාදි වශයෙන් මරණූපායය උගැන්වීම යි. මෙයින් ආණත්තිප්‍රයොගය දක්වී.

**21 වදෙය්‍ය මරණෙ ගුණං**

මරණයෙහි ගුණ හෝ කියා නම් යනු අර්ථ යි. මරණයෙහි ගුණ කීම නම් "මේ ලාමක ජීවිතයෙන් ඔබට ඇති ප්‍රයෝජනය කිම? දිවි පැවැත්වීම පවා කළ නො හැකි නො වේද?" යනාදි වශයෙන් ජීවිතයෙහි ආදීනව කීම හා "උපාසකය, නුඹ වනාහි කළ කුසල් ඇත්තෙක් වෙහි, නො කළ පව් ඇත්තෙක, ඒ නිසා මළායින් පසු නුඹට ශ්‍රේෂ්ඨ ජීවිතයක් ලැබීම නො අනුමානය. නුඹ මේ අත්බැවින් චුතව දහස්ගණන් දෙවඟනන් විසින් පරිවාරිත වූ මහානුභාවසම්පන්න දෙවියෙක් වන්නෙහි ය. යනාදි වශයෙන් හා යමෙක් මැරේ නම් ඔහු ධනය හෝ ලබන්නේ ය" ඈ විසින් ගුණ කීමද මරණයෙහි ගුණ කීම යැ යි පැවැසේ.

**22 පයොගා**

මැරීම පිණිස උපයොගි වන්නා වූ ප්‍රයොගයෝ වෙති. ඔව්හු "සාහත්ථි" ආදීන් සයෙකි.

**23 සාහත්ථි**

කයින් (අත් පා ආදියෙන්) හෝ කය පිළිබඳ සැත් මුගුරු ආදියෙන් හෝ ගසා මැරීම සාහත්ථි නමි. සාහත්ථික යන්නෙහි කකාර ලොපයෙන් මෙසේ වී.

**24 නිස්සග්ගි**

දුර සිටියකු මරණු කැමැති කල්හි කයින් හෝ කය පිළිබඳ යමකින් ඊ ආදිය විදීමෙන් ද, ගල් මුල් සැත් ආදිය දමා ගැසීමෙන් ද, දිවි තොර කිරීම යි. මෙහි දී උද්දිස්ස- අනුද්දිස්ස යී භෙද ද්වයයකි. යමකු

උදෙසා "අසුවලා ම මරමි" යි ඊ ආදිය නිසැජනය කොට මැරීම උද්දිස්ස නම්. "කවරකු හෝ මෙයින් මරමි" යි සිතා ඊ ආදිය යැවීම අනුද්දිස්ස නම්.

25 **ආණත්ති**

"අසුවලා මරව" යි ඇණැවීම යි.

26 **ථාවර**

ගමනාගමනය කරන මාර්ගයන්හි බොරු වල් සාරා තැබීම, පරිභොග කරන අසුන්හි තුවාළ වී මැරෙණ ලෙස ආයුධ තැබීම, විෂයෙන් හෝ ආලෙප කිරීම, වැටී මැරෙණ ලෙස ඒ අසුන් හෝ තැබීම, මෙයින් දිවි තොරකර ගත්තොත් යහපතැයි සිතා කඩු සැත් ආදිය හෝ ගත හැකි ලෙස එළවා තැබීම, බියවී මැරෙණු පිණිස බියජනක අරමුණු හෝ එළවා තැබීම, බියජනක ශබ්ද හෝ කිරීම, අහරෙහි හෝ ළිං පොකුණු ආදියේ හෝ විෂදැම, යන මේ ආදිය සථාවර ප්‍රයෝගයෝ යි. මෙය ද උද්දිස්ස අනුද්දිස්ස වශයෙන් දෙපරිදි ය.

27 **ඉඩි**

කම් විපාකජ සෘඩියෙන් නොයෙක් දේ කොට මැරීම සෘඩි ප්‍රයොග ය යි. මෙහි කම්විපාකජ සෘඩිය නම් රජුන් ගේ රාජර්ඩි ආදිය යි.

28 **විජ්ජාමය**

මන්ත්‍රාදියෙන් මැරීම යි.

## ආණත්ති නියාමකයෝ

29 **කාල**

පෙරවරු පස්වරු ඈ කාලය යි. අද ය හෙට ය ඈ දින නියමයක් නැතිව "පෙර වරුවෙහි මරව" යි ඇණ වූ විට කවදා හෝ පෙරවරුවෙක්හි මැරුවේ නම් ඇණ වූ මහණ තෙමේ පරිජි වේ. ඉදින් ඇණැවූම් ලද නැනැත්තා ද පැවිද්දෙක් නම්, ඇණැවීම කෙබඳු වූව ද කවර අවසථා යෙක්හි දී දිවි තොර කළ ත් ඔහු පරිජීවීම එකාන්තය. "පෙර වරුවෙහි මරව"යි අණ කොට තිබිය දී ඉදින් පස් වරුවෙහි මැරුවේ නම් අණ කළ නැනැත්තා පරිජි නොවේ.

30 **වත්‍ථු**

මරණු ලබන සත්‍ත්වයා යි. "අසුවලා මරව"යි ඇණ වූ විට අන් කෙනකුන් මැරීමේ දී ද, "අසුවල් පසට ගසා මරව" යි කී විට එකී පසට නො ව අන් පසකට ගසා මැරීමේ දී ද යනාදි භෙදයන්හි කම් බන්‍ධය (පරිජි) නොවේ. ඇණැවූම නො ඉක්මවා මැරීමේ දී කම්බන්‍ධය වේ.

31 **ආවුධ**

"කඩු ඊ ආදියෙන් උපක්‍රම කොට මරව" යි යනාදි වශයෙන් ආවුධ නියමයක් නො කොට මැරීමට අණ කළ විට කවරායුධයකින් මැරුව ත්

කම් බන්ධය වේ. "අසුවල් අවියෙන් ගසා මරව"යි නියම කළ කල්හි අන් අවියකින් දිවි තොර කළ විට කම්බන්ධය නොවේ.

32 **ඉරියාපථ**

"යන්නහු මරව"යි අණ කළ විට අන් ඉරියව්වකින් සිටින්නහු මරු නම් කම්බන්ධය නොවේ. මෙසේ නියම කළ ඉරියව්ව හැර වෙන ඉරියව්වක් පවත්වන්නහු ගේ දිවි තොර කිරීම කම් බන්ධය නො වීමට හේතු වේ.

33 **ක්‍රියා විසෙසො**

"විද මරව"යි කී කල්හි විද මැරීමේ දී විසඞ්කෙතයක් නැති. "විද මරව"යි කී කල්හි සිඳ මැරීමේ දි විසඞ්කෙතය වේ.

34 **ඔකාසො**

"අසුවල් තැනැ දී මරව"යි අණ කළ විට එතැන හැර අන් තැනක දී මැරීමේ දී විසඞ්කෙතය වේ. නියමිත තන්හි දී ම මැරීමේ දී විසඞ්කෙතය නොවේ.

ඇතැම් ආචාර්‍ය්‍ය කෙනෙක් ආණත්ති නියාමක ධර්‍මයන් පඤ්චවිධ කොට ප්‍රකාශ කරති.

"වත්ථුං කාලඤ්ච ඔකාසං ආවුධං ඉරියාපථං
තුලයිත්වා පඤ්ච ඨානානි ධාරෙය්‍යත්ථං විචක්ඛණො"සී.

මෙසේ පඤ්චවිධ කොට සලකන්නෝ "ක්‍රියා විසෙසය" ආවුධ යන වචනයෙහි ම ලා ගනිති.

**16 ඣානාදි [1] භෙදං නො සන්ත-මත්තන'ත්තූපනායිකං**
**කත්වා කොට්ඨාසමෙකෙකං-පච්චුප්පන්න භවස්සිතං**

**17 අඤ්ඤාපදෙස රහිතං-දීපෙන්තො' [2] නධිමානිකො**
**කායෙන වාචා විඤ්ඤත්ති-පථෙ ඤාතෙ චුතො භවෙ.**

අන්වය: අනධිමානිකො අත්තනි නො සන්තං පච්චුප්පන්න භවස්සිතඤ්ච අඤ්ඤාපදෙස රහිතඤ්ච ඣානාදි භෙදං කොට්ඨාසං කත්වා වා එකෙකං කත්වා වා අත්තූපනායිකං කායෙන වා වාචාය වා විඤ්ඤත්තිපථෙ දීපෙන්තො ඤාතෙ චුතො භවෙ.

අර්ථ: අධිමාන රහිත මහණ තෙමේ තමා සතන්හි නොමැති වූ ද, වර්තමාන භවය ඇසුරු කොට ඇත්තා වූ ද ("යම් මහණෙක් තොප ගේ වෙහෙර වෙසේ ද, හේ ප්‍රථම ධ්‍යානාදි උතුරු මිනිස් දම් ලද්දෙකැ" යි යනාදි) ව්‍යාජ කථා රහිත වූ ද ධ්‍යානාදි භෙද ඇති උතුරු මිනිස් දම්, (පළමු වැනි දෙ වැනි ධ්‍යානයට සමවැදුනෙමි; පළමු වැනි තුන් වැනි ධ්‍යානයට සමවැදුනෙමි. ඈ විසින්) කොටස් කොට හෝ (පළමු වැනි ධ්‍යානයට සම වැදුනෙමි; දෙ වැනි ධ්‍යානයට සමවැදුනෙමි. ඈ විසින්) එකක් එකක් කොට හෝ, තමා කෙරෙහි එළවා හස්තමුද්‍රාදි කාය විකාරයකින් හෝ,

---

[1] ඣානාදිභෙද- බු. ඉං. 2 නාධිමානිකො.

දන්නා යම්කිසි බයෙකින් හෝ, කායවචී විඥප්තීන් ගෙන් ප්‍රකාශිත අද හස දත ගත හැකි පෙදෙස්හි සිට පහළ කරන්නේ හැඟැවීම ලබන්නා ද ඒ අදහස දත් කෙණෙහි ම ශාසනයෙන් චුතවූයේ වේ.

35 ඣානාදිභෙදං

මෙයින් ධ්‍යානාදී භෙද ඇති උතුරු මිනිස්දම් සියල්ල ම සඞ්ග්‍රහ වේ. ඔව්හු "ඣානං විමොක්ඛං සමාධි සමාපත්ති ඤාණදස්සනං මග්ගභාවනා ඵල සච්ඡිකිරියා කිලෙසප්පහානං විනීවරණතා චිත්තස්ස සුඤ්ඤාගාරෙ අභිරති" යි පාරාජිකාපාලියෙහි 92 පිටුවෙහි සඳහන් වේ. මේ හැම වචනයකින් ම සාමාන්‍ය මනුෂ්‍ය ධර්මයන් ඉක්ම වූ උත්තම මනුෂ්‍යයන් පිළිබඳ ගුණ ප්‍රකාශිත යි. මනුෂ්‍ය ධර්මයෝ නම් දශ කුසලයෝ ය. දශ කුසලයෙන් උසස් වූ සියලු ධර්මයෝ ම උත්තරි මනුෂ්‍යධර්මයෝ වෙති.

36 අත්තූපනායිකං

"මේ මේ උතුරු මිනිස්දම මා ළඟ තිබේ" යනාදි වශයෙන් උතුරු මිනිස්දම් තමා කෙරෙහි ආරෝපනය කොට හෝ, තමා උතුරු මිනිස්දම්හි ආරෝපනය කොට හෝ කීම යි.

37 අඤ්ඤාපදෙසරහිතං

"යම් මහණෙක් ඔබ ගේ වෙහෙර වෙසේ ද?, හේ ප්‍රථම ධ්‍යානයට සමවැදුණේ ය;" යනාදි වශයෙන් උතුරුමිනිස්දම් විද්‍යමාන භාවය අනිකකු හට ප්‍රකාශ කිරීම අඤ්ඤාපදෙසය යි. අඤ්ඤාපදෙසයක් නැත්තේ "අඤ්ඤාපදෙස රහිත" නම්.

38 අනධිමානිකො

අධිමානයෙන් තොර වූ යන අර්ථ යි. අධිමානය නම්; "නො පත් ධ්‍යාන මාර්ග ඵලාදියට පැමිණියෙමු" යි මුළාවෙන් ඇති වූ මානය යි. මේ අධිමානය මාර්ගඵලාදීන් හා ප්‍රහීණ වූ කෙලෙස් ද අප්‍රහීණ කෙලෙස් ද ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙන් හටගත් සොම්නස් ඇති ආර්‍ය්‍ය ශ්‍රාවකයාට ද, ආර්‍ය්‍ය ගුණාධිගමයෙහි බලාපොරොත්තු රහිත වූ දුශ්ශීලයා හට ද, හරණ ලද කර්මස්ථාන ඇති සිල්වතාට ද නූපදී. අතිපරිශුද්ධ වූ සිල් ඇති කමටහන්හි නො පමා වූ සංස්කාරයන් තිලකුණට නගා මෙනෙහි කරන්නා වූ ආරබ්ධ විදර්ශකයා හට මේ අධිමානය උපදී. ඇතැම් ශුද්ධ සමථලාභීහු සහ ශුද්ධ විදර්ශනා ලාභීහු ද ඇතැම් විට විසි තිස් වසක් ම කෙලෙස් බල පැමක් නො දක්නාහු "සෝවාන් ආදි මාර්ගඵල ලදිමු" යි සිතති. සමාධි බලයෙන් කෙලෙස් විෂ්කම්භිත වූ ද විදර්ශනා බලයෙන් සුපරිගෘහිත සංස්කාර ඇත්තා වූ ඒ යොගාවචරයා ගේ කෙලශයෝ සැට වසක් හෝ අසූවසක් හෝ සියක් වසක් හෝ ගත වැ ගිය ද උද්ගත නො වෙති. එහෙයින් "මම රහත්මි" යි අධිමානය උපදී.

39 ඤායෙන

කයින් හැඟවීම යි. මීට හස්තමුද්‍රාදියෙන් කරන සංඥ සියල්ල ම ත් ගැනේ.

**40 වාචාය**

වචනයෙන් හැඟවීම යි. අසනු ලබන්නා දන්නා යම් කවර වූ හෝ භාෂාවකින් මෙය කට හැකි ය. මෙසේ කායින් හා වචනයෙන් හා ප්‍රකාශ කිරීමේ දී ඒ ප්‍රකාශය අවසන් වෙත් ම, ප්‍රකාශිත අදහස දැන ගනී නම් ප්‍රකාශ කළ තැනැත්තේ පරිජි වේ.

**41 විඤ්ඤත්තිපථෙ**

කාය වචී විඥප්තීන් ගෙන් ප්‍රකාශිත අදහස දැන ගැනීමට හැකි වන දෙළොස් රියන් පමණ ඇතුළත්හි වූ පෙදෙසෙහි යනු යි.

**42 ඤාතෙ**

දත් කල්හි යනු අර්ථ යි. ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයෙහි මෙන් හඟවනු ලබන්නහු හැඟවීම් අවසන්හි දී ම "මොහු ධ්‍යානයට සමවදිත්ල" ආ විසින් දැන ගැනීම මෙහි ලා ගැනේ. පසුව කල්පනා කිරීමෙන් අදහස දැන ගත ද පරිජි නොවේ.

**18 පාරාජිකො'තෙ චත්තාරො-අසංවාසා යථා පුරෙ**
**අභබ්බා භික්ඛුභාවාය-සීසච්ඡින්නො'ව ජීවිතුං**

පරිජි අවත් මේ සතර පුඟුලෝ තුමූ ගෘහස්ථානුපසම්පන්න කාලයේ දී මෙන් භික්ෂූන් සමග සංවාසයට නො නිස්සෝ ය, හිස්සුන් පුරුෂයක්හු එම ශරීර බන්ධනයෙන් ජීවත් වන්නට අභව්‍ය වන්නාක් සෙයින් ඔව්හු භික්ෂු භාවයට අභව්‍යයෝ ය.

**43 අසංවාසා**

සියලු ලජ්ජී පුද්ගලයෝ ම එක කර්මාදියෙහි එක් ව වෙසෙත්නු යි සංවාස නම්. ඒ සංවාසයෙන් බැහැර වූයේ අසංවාස නම්. එකකර්මාදිය නම්: එකකම්ම, එකුද්දෙස, සමසික්ඛතා යන තුනයි. එහි අපලොකනාදි සිවු වැදෑරුම් විනයකර්ම සීමාභ්‍යන්තරයෙහි වූ පකතත්ත භික්ෂූන් විසින් එක් ව- සමගි ව කළයුතු හෙයින් "එකකර්ම" නම්. පඤ්චවිධ වූ පාමොක් උදෙසීම එක්ව ම උදෙසිය යුතු හෙයින් "එකුද්දෙස" නම්. තථාගතයන් වහන්සේ විසින් පණවා වදාළ ශික්ෂාපද කා විසිනු ත් සම ව හික්මිය යුතු හෙයින් "සමසික්ඛතා" නම්.

**19 පරියායො ච ආණත්ති-තතියෙ දුතියෙ පන**
**ආණත්තියෙව සෙසෙසු-ද්වයමෙතන්නලබ්භති.**

පරියාය කථා ද, අණවීම ද, තුන්වන පරිජියෙහි ලැබේ. දෙ වන පරිජියෙහි ආණත්තිය ම ලැබේ. සෙසු පළමු වැනි සිවු වැනි පරිජිවලැ පරියාය ආණත්ති දෙක නො ලැබේ.

**20 සෙවෙතුකාමතා චිත්තං-මග්ගෙ මග්ගප්පවෙසනං**
**ඉදමෙමපුන ධම්මස්ස-ආහු අඞ්ගද්වයං බුධා.**

මෙවුන්දම් සෙවියටි සිත ය, තුන් මඟින් එක්තරා මඟෙක්හි තමා නිමිත්ත මෙහෙයීම ය, යන මේ අඞ්ගද්වයය මෛථුනධර්ම පාරාජිකාවට අඞ්ගායයි විනයධරයෝ කියත්.

21 මනුස්සසං තථාසඤ්ඤී-ථෙය්‍ය චිත්තඤ්ච වත්ථුනො
[1]ගරුතා අවහාරො ච-අදින්නාදාන හෙතුයො.

මිනිස් සතක් හට අයත් බව ද, එසේ මිනිස් සතක් හට අයත් ය යන දැනීම ද, සොර සිත ද, වස්තුහු ගේ ගුරු බව ද, ගැනීම ද (යන පස) අදත්තාදාන පාරාජිකාවට අඞ්ගයෝ යි.

22 පාණො[2] මානුස්සකො පාණ-සඤ්ඤිතා ඝාත චෙතනා
පයොගො තෙන මරණං-පඤ්චෙ'තෙ වධ හෙතුයො.

මිනිස් සතක් බව ය, මිනිස් සතෙකැයි හැඟීම් ඇති බව ය, වධක චෙතනා ය, සපියොවින් එක් පියෝවෙක, ඒ පියොවින් මරණය යන මොහු පස් දෙන මනුෂ්‍ය විග්‍රහ පාරාජිකාවට අඞ්ගයෝ යි.

23 අසන්තතා අත්තනි පාපමිච්ඡතා
යා රොචනා තස්ස මනුස්ස ජානිතා
[3]නාඤ්ඤාපදෙසො ච තදෙව ජානනං
පඤ්චෙ'ත්ථ අඞ්ගානි අසන්තදිපනෙ.

තමා සතන්හි උතුරු මිනිස් දම් නැති බව ද, ලාමක වූ ඉච්ඡායෙන් කීම ද, ඇරෙජනු ලබන්නා මිනිස් ජාති ඇත්තකු බව ද, පයර්‍යාය කථා මුක්ත බව ද, කී විට වහා එය දැන්ම ද, යන පස් දෙන මේ උත්තරිමනුෂ්‍ය ධර්මාරොචන පාරාජිකායෙහි අඞ්ගයෝ යි.

24 අසාධාරණා ච චත්තාරො-භික්ඛුණීන[4]මභබ්බකා
එකාදස ච විබ්භන්තා-භික්ඛුණී මුදුපිට්ඨිකො,

25 ලම්බිමුඛෙන ගණ්හන්තො-අඞ්ගජාතං පරස්ස ච
තස්සෙවා'භි නිසීදන්තො-චත්තාරො අනුලොමිකා

26 මග්ගෙ[5]මග්ගපවෙසෙන-මෙථුනස්ස ඉධා'ගතා
චත්තාරො'ති [6]චතුබ්බීස සමොධානා පරාජිකා'ති.

භික්ෂූන් හා සාධාරණ නො වූ භික්ෂුණීන්ගේ සතර පරිජි ද, පණ්ඩකාදි අභව්‍යයන් එකොළොස් දෙන ද, ගිහි වූ මෙහෙණ ද, (රාග වශයෙන් සමාන වූ ද්වයං ද්වය සමාපත්තියක් නැත ද) මාර්ගයෙහි මාර්ග ප්‍රවෙශ කිරීමෙන් මෛථුන ධර්ම පාරාජිකාවට අනු'ලොම් වූ මෘදු වූ පිටු ඇත්තේ ය, දික් වූ අඞ්ගජාත ඇත්තේ ය, මෙරමා ගේ නිමිත්ත මුඛයෙන් ගන්නේ ය, මෙරමා නිමිත්තෙහි ම තමා වසමඟින් ප්‍රවෙශ වන සේ සිටින්නේ ය, යන සතර දෙනා ද, මෙහි ස්වරූපයෙන් ආ සතර දෙනාද යි සංග්‍රහ කොට ගිනීමේ දී පාරාජිකාවෝ සුවිස්සෙක් වෙති.

---

[1] ගරුකා. ඉං. [2] මනුස්සකො. ඉං. [3] නාඤ්ඤාපපදෙසො. ඉං. [4] මහබ්බතා. ඉං. [5] මග්ගපපවෙසනා. බු. ඉං. ටීකා. [6] චතුබ්බීස බු. ඉං.

## 44 අසාධාරණා ච වත්තාරො

මෙයින් භික්ෂූන් හා සාධාරණ නැති භික්ෂුණීන් හට පමණක් පණවා වදළා වූ උබ්භජාණුමණ්ඩලිකාදි සතර පාරාජිකාවෝ ප්‍රකාශවෙත්.

### (1) උබ්භජාණුමණ්ඩලිකා

කාය සංසග්ගයෙන් යුත් භික්ෂුණියක එබඳු ම කායසංසග්ගරාගතිඃශ්‍රිත මිනිස් පිරිමියකුගේ අකු ඇටයෙන් යටැ දණමඩලින් මතු පෙදෙස්හි හා වැලමිටින් උඩ පෙදෙස්හි ද කායසංසග්ගය ඉවසීම "උබ්භජාණුමණ්ඩලිකා" නම්.

### (2) වජ්ජපටිච්ඡාදිකා

අන්‍ය භික්ෂුණියක ගේ පරිජි ඇවතක් සැඟවීම ''වජ්ජපටිච්ඡාදිකා'' නම්.

### 3 උක්ඛිත්තා'නුවත්තිකා

උක්ඛෙපනිකම් ලද භික්ෂුවක ගේ පක්ෂය දෘෂ්ටි වශයෙන් ගැනීම "උක්ඛිත්තානුවත්තිකා" නම්.

### 4 අට්ඨවත්ථුකා

කායසංසග්ග රාගයෙන් යුක්ත ව මිනිස් පිරිමියකුගේ අත ගැන්ම, සඟල සිවුරු කොන ගැන්ම, කායසංසග්ගය පිණිස අත්පස්හි සිටීම, අත් පස්හි සිට බිණීම, පුරුෂයා කී තැනට යෑම, පුරුෂයා ගේ ආගමනය ඉවසීම, මුවා තැනකට පිවිසීම, කායසංසග්ගය සඳහා කය එළවීම, යන අට ''අට්ඨවත්ථුකා'' නම්.

## 45 අභබ්බා ඒකාදස

| | | | |
|---|---|---|---|
| 1 | පණ්ඩකො | 6 | පිතුඝාතකො |
| 2 | ථෙය්‍ය සංවාසකො | 7 | අරහන්තඝාතකො |
| 3 | තිත්ථිය පක්කන්තකො | 8 | භික්ඛුණී දූසකො |
| 4 | තිරච්ඡානගතො | 9 | සඞ්ඝභෙදකො |
| 5 | මාතුඝාතකො | 10 | ලොහිතුප්පාදකො |
| | | 11 | උභතො බ්‍යඤ්ජනකො |

යන මොව්හු ඒකාදශ අභව්‍ය පුද්ගලයෝ යි. මොවුනතුරින් 1-4-11 තිදෙන වත්ථුවිපන්න වූ අහේතුක ප්‍රතිසන්ධිකයෝ වෙති. ඔවුනට ස්වර්ගය අවාරිත වුව ද මාර්ගය වාරිත ය, වත්ථු විපන්න බැවින් පැවිද්ද ද ප්‍රතික්ෂිප්ත යි. එහෙයින් ඔවුහු ද පරිජි අවත් බඳු හෙයින් පාරාජිකාවන්හි ම ලා සැලකූහ. සෙසු අටදෙනා තමා ගේ ක්‍රියා විපන්නත්වයෙන් අභව්‍ය ස්ථාන යට පත්වූවාහු පරිජි අවත් බඳු හෙයින් පාරාජිකාවන්හි ම ලා ගණිනු ලැබූහ.

පණ්ඩකයන් අතුරෙන් ඔපක්කමික පණ්ඩක නපුංසක පණ්ඩක පක්ඛ පණ්ඩක යන තිදෙනා මෙහි අභිප්‍රෙත යි. ආසිත්ත- උසූය පණ්ඩකයන් හට පැවිදි උපසපන් බව් නො වළක්වන ලදි.

ථෙය්‍ය සංවාසකයා වනාහි ලිඞ්ගස්තේනක- සංවාසස්තේනක- උභයස්තේනක වශයෙන් තිදෙනෙකි.

46 **විබ්භන්තා භික්ඛුණී**

මෙයින් භික්ෂුණිය ගිහි ඇඳුම් ඇඳගත් පමණින් ම පරිජි වන බව ප්‍රකාශිත සි. මෙසේ හෙයින් භික්ෂුණිය හට ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයක් අනවශ්‍යය.

47 **මුදුපිට්ඨිකො**

මෘදු වූ පිට ඇති තැනැත්තේ සි. මෙතෙමේ අනභිරතවූයේ ස්වකීය අඞ්ගජාතය වච්චමුඛ මාර්ගයන්හි ප්‍රවේශ කරයි.

48 **ලම්බී**

"ලම්බමානමඞ්ගජාත මෙතස්සාති ලම්බී" සී ටීකාවෙහි ප්‍රකාශිත හෙයින් දික් වූ අඞ්ගජාතය ඇති තැනැත්තා ගැනේ. මොහු ද මුදුපිට්ඨිකයා මෙන් සිය අඞ්ගජාතය වච්ච මුඛ මාර්ගයන්හි ප්‍රවේශ කරයි.

49 **පරස්ස අඞ්ගජාතං මුඛෙන ගණ්හනෙනා**

අනුන් ගේ අඞ්ගජාතය කටින් ගැනීම මෙයින් කිය වේ.

50 **තස්සෙවා'භි නිසීදනෙනා**

මෙයින් මෙරමා ගේ අඞ්ගජාතයෙහි වච්ස් මාර්ගයෙන් සිටීම ගැනේ.

51 **මග්ගෙන මග්ගපසවෙසෙන**

මගින් මඟ පිවිසීමෙන් පරිජි වෙතැයි මෙයින් කියැ වේ. අවයං අවය සමාපත්තියක් නැත ද මගින් මඟ පිවිසීම් පමණින් ම පරිජි වන බැවින් මේ සතර පරිජි මෛථුනධර්ම පාරාජිකාවට අනුලොම් පරිජි බව මින් පැවසේ.

52 **චතුබ්බීස**

මෙසේ සියලු පරිජි ම එක් කොට ගිණූ කල්හි සූවිසි පරිජි කෙනෙක් වෙති. ඒ මෙසේ ය.

| | |
|---|---|
| භික්ෂු භික්ෂුණී දෙපක්ෂයට ම සාධාරණ | 4 සි |
| භික්ෂූන් හා අසාධාරණ වූ භික්ෂුණීනට පමණක් සාධාරණ | 4 සි |
| එකාදශ අභව්‍ය සංඛ්‍යාත | 11 සි |
| භික්ෂුණිය ගේ විබ්භන්ත සංඛ්‍යාත පරිජි | 1 සි |
| මෛථුනධර්ම පාරාජිකාවට අනුලොම් පරිජි | 4 සි |
| එකතුව | 24 සි |

---

## 2 ගරුකා නව

27 **මොචෙතුකාමතා සුක්කස්සුපක්කම්ම විමොචයං**
**අඤ්ඤත්‍ර සුපිනනෙතන-සමණො ගරුකං ඵුසෙ**

සුක්කරූ මිදියව් සිතින් (අත් ඈ යමකින් තමා නිමිත්හි) උපක්‍රමකොට සුක්කරූ මූදන මහණ තෙමේ සවප්නයෙන් වන සුක්කරූ මිදීම් විනා ගරුකා පත්ති සංඛ්‍යාත සඝාදිසෙස් අවදනේ ය.

**53 මොචෙතුකාමතා**

"මොචෙතුකාමතාය"යි කිය යුත්ත "මොචෙතුකාමතා" යී ඡන්දස් පිණිස යකාරය ලොප් වූ හෙයින් සිඩයි. මේ වචනයෙන් මොචනස්සාද- මුඤ්චනස්සාද- මුත්තස්සාද- මෙථුනස්සාද- ඵස්සස්සාද- කණ්ඩුවනස්සාද- දස්සනස්සාද- නිස්සජ්ජනස්සාද- වාචකස්සාද- ගෙහසිත පෙම- වනභඞ්ගිය යී ටීකායෙහි එන එකාදශාස්වාදයන් අතුරින් මොචනස්සාදය ගැනේ.

**54 සුක්කස්ස**

මෙසින් ශුක්‍රධාතුව ගේ මිදීම කියැ වේ. ශුක්‍රධාතුහු ගේ භෙදයෝ දශදෙනෙක් **පාරාජිකාපාලියේ (119 පිටේ) එති.** නීල වණ්ණ, පීත වණ්ණ, ලොහිත වණ්ණ, අවදාත වණ්ණ, තක්‍ර වණ්ණ, දක වණ්ණ, තෛල වණ්ණ, ක්ෂීර වණ්ණ, දධිවණ්ණ, සප්පි වණ්ණ කියා යි.

**55 අඤ්ඤත්‍ර සුපිනන්තෙන**

සවප්න වනාහි ධාතුක්ෂොභ, අනුභූත පූර්වාරම්මණ, දෙවතොපසංහාර, පූර්වනිමිත්ත යන සතර කරුණින් එක් කරුණක් නිසා දක්නා බව් **විනයත්ථමංජුසා**'හි පෙනේ. එකි කරුණකින් දුටුවා වූ සවප්නයෙන් වන ශුක්‍රමොචනය හැර යි.

**56 ගරුකං**

ඇවතින් නැගිටීම් වශයෙන් ගුරු හෙයින් සංඝාදිසෙසයට 'ගරුක' යනු නම්. පිරිවෙස් සමාදන් වීම් සංඛ්‍යාත ආදියෙහි ද, සෙසු මානත් අබ්භාන දෙක්හි ද, ගරු ඇවැත් අවන්තනු විසින් සංඝයා කැමැති විය යුතු හෙයින් "සඞ්ඝාදිසෙස" යී ද නම්.

**28 ඉත්ථී සඤ්ඤී මනුස්සිත්ථිං-කායසංසග්ගරාගවා**
**සම්මසන්තො උපක්කම්ම-සමණො ගරුකං ඵුසෙ**

කාසසග රා ඇති මහණ තෙමේ මිනිස් මාගමක යන හැඟීම ඇති ව එ දවසැ උපන් දිවමන් මිනිස් මාගමක කාපියෝ කොට (කාය ප්‍රයෝග කොට) ස්පර්ශ කරන්නේ නම් සඝාදිසෙස් අවදී.

**57 කායසංසග්ගරාගවා**

ස්ත්‍රී කායස්පර්ශ කිරීම් රාග ඇත්තේ යනු යි. කායස්පර්ශ කිරීමේ අභිලාෂයෙන් එ දවසැ උපන් මාගමක හෝ කෙස'ගින් කෙස'ග වුව පහරී නම්; සඝ වෙසෙස් වේ. කායපටිබද්ධවූවකින් පහරී නම් ථුල්ලැසි වේ. මිනිස් මාගම කෙරේ නො මිනිස් මාගම යන හැඟීමෙන් හෝ පණ්ඩක- තිරශ්චීන- පුරුෂ යන හැඟීම්වලින් හෝ විමතියෙන් හෝ කායින් කාය පහරී නම් ථුල්ලැසි වේ. කායින් කායප්‍රතිබද්ධයෙහි හෝ, කායප්‍රතිබද්ධයෙන්

කායෙහි හෝ පහරි නම් දුකුළා වේ. කාය ප්‍රතිබද්ධයෙන් කායප්‍රතිබද්ධයෙහි හෝ, නිස්සග්ගිය වස්තුවෙකින් කායෙහි හෝ, කායප්‍රතිබද්ධයෙහි හෝ, නිස්සජ්ජිත ද්‍රව්‍යයෙකැ හෝ, පහරි නම් දුකුළා වේ. (**මාතිකාට්ඨකථා 35**)

යටත් පිරිසෙන් මාතු පිතු භගිනීන් ද ගෙහසිත ප්‍රේම නිඃශ්‍රිත වැ ආමර්ශනය කිරීමෙන් පවා දුකුළා වේ. ඒ බව: ඉත්ථි නාම සබ්බාපි බ්‍රහ්ම චරියස්ස පාරිපන්ථිකා 'ව; තස්මා, "අයං මෙ මාතා, අයං ධීතා, අයං භගිනීති ගෙහසිත පෙමෙන ආමසතො'පි දුක්කටමෙව වුත්තං"යි **සමන්තපාසාදිකා විනය අටුවායෙහි (386) සඳහන් වේ.** එපමණෙක් ද නොව ගැහැණු සටහනින් කළ රූපයකු දු අනාමාස යි.

### 29 තථා [1]සුණන්තිං විඤ්ඤූ ඤුව-මග්ගං වා ර ඬ්ඪ'මෙථුනං දුට්ඨුල්ලවාචාරගෙන-[2] ඔභාසි ඝා ගරුමජ්ඣෙ

එසේ (මිනිස් මාගමක යන සංඥා ඇතිව) ඇසෙන්නා වූ සභ්‍යාසභ්‍ය තෙපුල් දන්නා මිනිස් මාගමකට වස්මග පස්මග හෝ, මෙවුන්දම් හෝ අරබයා දුළුල් තෙපුල් කියැටි රාගයෙන් බැණ සඟවෙසෙස් අවදනේ යි.

### 58 දුට්ඨුල්ලවාචාරගෙන

මෙහි "දුට්ඨුල්ල වචන" නම් **වච්චමග්ග, පස්සාවමග්ග,** මෙථුනධම්ම, යන මේවා පිළිබඳ කථා යි. වච්ච, පස්සාව මාර්ගයන් ගේ ගුණාගුණ කිම හෝ, මෛථුන යාචනය හෝ, "සිඛරණීසි", "සම්භින්නාසි" "උභතො බ්‍යඤ්ජනාසි" යන ත්‍රිවිධ ආක්‍රොෂ වචන කිම හෝ මෙහි දී දුට්ඨුල්ලවචන නමි.

විමතියෙන් කී කල්හි එවිගස දහ ගොත් ථුලසි වේ. අකු ඇටින් යටැ ද දණින් උඩ ද අරමුණු නොට දුළුල් තෙපුල් බිණීමෙන් ථුලැසි දා, සෙසු පෙදෙස් අරමුණු කොට බිණීමෙන් දුකුළා ද වේ.

### 30 වණ්ණා'ත්තකාමුපට්ඨාන-වණ්ණං මෙථුන රාගිනො වාචා මෙථුන යුත්තෙන-ගරුං මෙථුන යාචනෙ

තමනට මෙවුන්දමින් මෙහෙකිරීමෙහි අනුසස් කියා මෙවුන්දම් ප්‍රති සංයුක්ත වූ වචනයෙන් මෙවුන්දම් ඉල්ලන්නාහට මෙවුන්දම් ඉල්ලීම් නිමිත්තෙන් සඟවෙසෙස් වේ.

### 59 අත්තකාමුපට්ඨාන වණ්ණං

"එතදග්ගං භගිනි, පාරිචරියානං යා මාදිසං සීලවන්තං කල්‍යාණධම්මං බ්‍රහ්මචාරිං එතෙන ධම්මෙන පරිචරෙය්‍ය" යනාදි වශයෙන් මෙවුන්දමෙන් උවැටැන් කිරීමෙහි ගුණ සුබැසි දුබැසි තෙපුල් දන්නා මාගමක සමීපයෙහි වචනයෙන් හෝ හස්තමුද්‍රාදියෙන් හෝ ප්‍රකාශ කිරීම යි.

---

[1] සුණන්ති. බු. ඉං. [2] ඔභාසෙන්තො. ඉං.

60 මෙථුන සුත්තන

"අරහයි ත්වං මයාහං මෙථුනං ධම්මං දාතුං" යනාදි මෛථුන ප්‍රතිසංයුක්ත වචනයෙන් මෛථුන යාචනය යි.

31 පටිගණ්හෙත්වා සඤ්චරිත්තං-ඉත්ථියා පුරිසස්ස වා
වීමංසිත්වා හරාපෙත්වා-සමණො ගරුකං ඵුසෙ

ස්ත්‍රිය ගේ හෝ පුරුෂයා ගේ හෝ කෙලෙස් පිළිබඳ හස්ත කයින් හෝ වචනයෙන් හෝ පිළිගෙන (යම් කෙනකුන් වෙත යැවූයේ නම්; ඔහු ගේ අදහස) පරීක්‍ෂා කොට හෝ අනෙකකු ලවා පරීක්‍ෂා කරවා හෝ, නැවත ගෙනහැර ඇරෙජන්නා වූ මහණ තෙමේ සඟ වෙසෙස් අවදනේ ය.

61 සඤ්චරිත්තං

ආවාහ විවාහ වනු කැමැත්තන් ගේ හෝ, එවෙලාවෙහි අභිරමණය වනු කැමැත්තන් ගේ හෝ ඒ පිළිබඳ ලියුම්– පණිවුඩ ආදිය යි.

62 ඉත්ථියා

මෙහි දශ ස්ත්‍රිහු හා දශ භාර්‍ය්‍යාවෝ ගැනෙත්.

දශ ස්ත්‍රිහු නම්

මාතුරක්ඛිතා, පිතුරක්ඛිතා, මාතාපිතුරක්ඛිතා, භාතුරක්ඛිතා, භගිනිරක්ඛිතා, ඤාතිරක්ඛිතා, ගොත්තරක්ඛිතා, ධම්මරක්ඛිතා, සාරක්ඛා, සපරිදණ්ඩා, යන දශ දෙනා යි.

දශ භාර්‍ය්‍යාවරු නම්

ධනක්කීතා, ඡන්දවාසිනී, භොගවාසිනී, පටවාසිනී, ඔදපත්තකිනී, ඔභතචුම්බටා, දාසී ච භරියා, කම්මකාරී ච භරියා, ධජාහටා, මුහුත්තිකා යන දශ දෙනා යි.

32 සඤ්ඤාචිත පරික්ඛාරං-කත්වා 'දෙසිත වත්ථුකං
කුටිං පමාණාතික්කන්තං-අත්තුද්දෙසං ගරුං ඵුසෙ

තමා විසින් ඉල්ලා ගන්නා ලද (වෑ පොරෝ ඈ) උපකරණ ඇති, නොදෙසන ලද කුටි වස්තු ඇති, පමණ ඉක්මුණා වූ, තමා පිණිස කරවන බැවින් ආත්මොද්දෙස ඇති කුටිය කොට සඟවෙසෙස් අවදනේ ය.

63 සඤ්ඤාචිත පරික්ඛාරං

තමා විසින් ඉල්ලා ගන්නා ලද වෑ–පොරෝ ඈ උපකරණ ඇති යනු යි. අනුන් ගේ වෑ පොරෝ ආදි උපකරණ තමා අයත් කර ගැනීමට ඉල්ලීම නො වටී. කැපකරුවන් ගෙන් හෝ ඤාතීන් ගෙන් හෝ තාවකාලික වශයෙන් අවශ්‍ය උපකරණයක් ඉල්ලා ගත ද වරද නැත.

64 අදෙසිතවත්ථුකං

නො දෙසන ලද කුටිවස්තු ඇති යනු යි. කුටියක් කළමනා කල්හි ඒ භික්‍ෂුව විසින් ඒ භූමිය ශුද්ධ කොට සඞ්ඝයා වෙත එළඹ උත්තරාසඞ්ගය

එකස් කොට පොරවා, වැඩිමහලු භික්ෂූන් ගේ පා;වැඳ, උළුලුයෙන්[1] හිඳ, ඇඳිලි බැඳ, පදභාජනයෙහි කී නයින් ''අහං භන්තෙ සඤ්ඤාචිකාය කුටිං කත්තුකාමො අසාමිකං, අත්තුද්දෙසං, සොහං භන්තෙ සඞ්ඝං කුටිවත්ථු ඔලොකනං යාචාමි''යි තෙ විටක් කියා යැදිය යුත්තේ ය. එවිට එහි සිටි සියලු භික්ෂූන් ම හෝ, ඒ භික්ෂූන් ගෙන් සාරම්භාදිය දැනීමෙහි ප්‍රතිබල දෙතුන් නමක් හෝ එහි පමුණුවා ගත යුතු යි. ඒ භික්ෂූන් විසින් අනාරම්භ (කිපිල්ලිකාදි ෂොඩෂ උපද්‍රව රහිත) වූ සපරික්කමණ (ගොනුන් දෙදෙනකු හෝ සිවුදෙනකු බැඳි ගැලක් කුටිය සිසාරා යා හැකි හෙයින් උපචාර සහිත නිසා සපරික්කමණ) වූ කුටිවත්ථුව, එතැනැ සඞ්ඝයා පමණට සිටී නම් කුටිකාරක භික්ෂුව විසින් අයදනා ලදුව ''ඤත්ති දුතිය කම්මවාචා භණනයෙන් දෙසිය යුතු යි. ඉදින් එහි සඞ්ඝයා නො පොහොණේ නම්; නැවත සඞ්ඝයා පොහෝණා පමණ පමුණුවා ගෙන කුටිවත්ථුව දෙසවිය යුතු යි. එසේ නො දෙසූ කුටිය ''අදෙසිත වත්ථුකා''යි.

65 කුටිං

උල්ලිත්ත- අවලිත්ත- උල්ලිත්තාවලිත්ත යි කුටි තුනකි. ඇතුළත සුණු ඈ යම්කිසිවකින් ආලෙප කළ කුටිය උල්ලිත්ත ද පිටතැ ආලෙප කළ කුටිය අවලිත්ත ද අතුළ පිට දෙක්හි ම ආලෙප කළ කුටිය උල්ලිත්තාවලිත්ත ද වේ.

66 පමාණාතික්කන්තං

පමණ ඉක්ම වූ යනු යි. මෙහි දැක්වෙන කුටියෙහි නියමිත ප්‍රමාණයෙක් ඇත. ''දීඝසො ද්වාදස විදත්ථියො සුගත විදත්ථියා, තිරියං සත්තන්තරා'' යි **පද භාජනයෙහි** පමණ දෙශනා කොට තිබේ. දිගින් සුගත් වියතින් දොළොස් වියතක් හා පුළුලින් භිකති ඇතුළත සත් වියතෙකි. සුගත් වියත නම්: වඩු රියන් 1½ කි. මැදුම් පිරිමියක්හු ගේ අතින් තෙවියතෙකි. ඒ තෙවියත ද මැදුම් පිරිමියක්හු ගේ රියනින් රියන් 1½ කි. මෙහි නියමිත පමණ ඉක්මවා කොසගක් පමණකුදු වැඩිකිරීම නො වටී. යම් ලෙසකින් මේ ගණනින් ඌණවූයේ නම් මේ කුටි සඞ්ඛ්‍යාවට නොයේ.

> 33 **මහල්ලකං විහාරං වා-කාරවා'දෙසිත වත්ථුකං**
> **අත්තනො වාසනත්ථාය-සමණො ගරුකං ඵුසෙ**

නො දෙසූ විහාර වස්තු ඇති මහත් වූ විහාරයක් තමා වසනු පිණිස කොට ඒ මහණ තෙමේ සඟ වෙසෙස් අවදනේ ය.

67 මහල්ලකං විහාරං

මෙය සංයාචිත කුටියට වඩා මහත් හෙයින් ද, කරවා දෙන්නකු විද්‍යමාන බැවින් ද, මහල්ලක නම්. මේ ශික්ෂායෙහි සෙසු සියල්ල ම පෙර සේ මැ යි.

> 34 **අමූලකෙන චොදෙන්තො-චොදාපෙන්තො'ව වත්ථුනා**
> **අන්තිමෙන ච චාවෙතුං-සුණමානං ගරුං ඵුසෙ**

---

1 එළිල්ලෙන්

දශීත ශ්‍රවණ පරිසංකා සංඛ්‍යාත මූල් තැත්තා වූ, භික්ෂුහට සාධාරණ එකුන් විසි පරිජී අතුරින් එක්තරා පරිජී වතෙකින් විඥප්ති පථයෙහි සිට අසන්තා වූ භික්ෂුහු සසුනෙන් චුත කරනු පිණිස චොදනා කරන්නේ හෝ අනුන් ලවා චොදනා කරවන්නේ හෝ වේ ද ඒ මහණ සඟවෙසෙස් අව දනේ ය.

68 චොදෙය්‍යනා

"පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි, අස්සමණොසි, අසක්‍යපුත්තියොසි, යනාදින් චොදනා කරන්නේ යනුයි. එය වත්ථුසන්දස්සනා, ආපත්තිසන්දස්සනා, සංවාසපටික්ඛෙපො, සාමීචිපටික්ඛෙපො යි සිවුවැදෑරුම්. මේ සතරින් එකකින් චොදනා කිරීම මෙහි ලා ගැනේ.

69 අනන්තිමෙන වත්ථුනා

"පබ්බජ්ජාය පාතිමොක්ඛ සංවරසීලස්ස වා අනෙත විනාසෙ භවං අන්තිමං; පාරාජිකාපත්ති"යි කී හෙයින් අන්තිම වත්ථු යන්නෙන් පාරාජිකාපත් තිහු ගැනෙත්.

35 අඤ්ඤස්ස කිරියං දිස්වා-තෙන ලෙසෙන චොදයං
වත්ථුනා අනන්තිමෙනා'ඤ්ඤං-චාවෙතුං ගරුකං ඵුසෙ

(ක්ෂත්‍රියාදි) අනෙකක්හු ගේ (මෛථුන සෙවාදි) ක්‍රියාවක් දැක, ඒ (ජාත්‍යාදි) ලෙසයෙන්, ක්ෂත්‍රියාදි අතික් මහණක්හු ශාසනයෙන් නෙරපනු පිණිස, පරිජී වතෙකින් චොදනා කරන මහණ තෙමේ සඟවෙසෙස් අව දනේය

70 තෙන ලෙසෙන

ජාත්‍යාදි ලෙශයකින් යනු යි. යම් කිසි ක්ෂත්‍රියයකු මෙවුන්දම්හි යෙදෙනු දැක "ඛත්තියො මයා දිට්ඨො පාරාජිකං ධම්මං අජ්ඣාපන්නො; ත්වං ඛත්තියො; පාරාජිකං ධම්මං අජ්ඣාපන්නොසි" යනාදීන් ජාත්‍යාදි කරුණක් පමණක් ගෙන චොදනා කිරීම ගැනේ. ජාත්‍යාදි ලෙශයෝ දශ දෙනෙකි;

"ලෙසා ජාති නාමගොත්ත-ලිඞ්ගාපත්තිවසාපි ච
පත්තචීවරු පජ්ඣායා-චරියා වාවාසා දස" යි.

(විනයත්ථමංජුසා)

36 ඡාදෙති ජානමාපන්නං-පරිවාසො යාව තාවතා
චරෙය්‍ය සඞ්ඝෙ මානත්තං-[1]පරිවුත්ථො ඡරත්තියො
චිණ්ණමානත්ත මබ්භෙය්‍ය-සඞ්ඝො තං වීසති ගණො

අවත් සහ වෙසෙස් ඇවැත් දැන යම්තාක් දවස් සඟවාද ඒතාක් දවස් පිරිවෙස් විසිය යුතු යි. පිරිවෙස් වුසූ මහණ සඞ්ඝයක් සහුන් කොරෙහි මානත් පුරන්නේ ය. පිරූ මානත් ඇති ඒ භික්ෂුව විංශති වර්ගිකා සඞ්ඝ තෙමේ අබ්භාන කම් වශයෙන් ඇතුළත් කරන්නේ ය.

---

[1] පරිවුට්ඨො. බු. ඉං.

## 71 පරිවාසො

පරිවාසය ත්‍රිවිධය: පටිච්ඡන්න පරිවාසය, සුද්ධන්ත පරිවාසය, සමෝධාන පරිවාසය, කියා යි.

**පටිච්ඡන්න පරිවාසය** නම්: ඇවැත් ප්‍රතිච්ඡන්න වූ දින ගණන (අරුණු ගණන) සලකා දියයුතු පරිවාසය යි. ඉදින් එක් දිනක් ප්‍රතිච්ඡන්න වූ සුක්විසැටි සඟ වෙසෙසෙක් නම්; ඒ ඇවැත් අවන් භික්ෂුව විසින් "**අහං භන්තෙ එකං ආපත්තිං ආපජ්ජිං සඤ්චෙතනිකං සුක්කවිස්සට්ඨිං එකාහපටිච්ඡන්නං, සොහං භන්තෙ සඞ්ඝං එකිස්සා ආපත්තියා සඤ්චෙතනිකාය සුක්කවිස්සට්ඨියා එකාහපටිච්ඡන්නාය එකාහපරිවාසං යාචාමි. දුතියම්පි භන්තෙ -පෙ- යාචාමි. තතියම්පි භන්තෙ -පෙ- යාචාමි**" යි තෙ විටක් සඞ්ඝයා යාචනය කටයුතු යි. මේ ක්‍රමයෙන් ම පටිච්ඡන්න වූ දෙ දිනක් තෙ දිනක් ඈ විසින් තුදුස් දවස තෙක් "**ද්වීහ පටිච්ඡන්නං, තීහ පටිච්ඡන්නං -පෙ- චුද්දසාහ පටිච්ඡන්නං**" කියා ද පසළොස් දිනක් ප්‍රතිච්ඡන්න නම්. "**පක්ඛ පටිච්ඡන්නං**" යි ද, එතැන් සිට එකුන් තිස් දවස තෙක් "**අතිරෙකපක්ඛ පටිච්ඡන්නං**" යි ද, පුරා තිස් දිනක් ගිය කල්හි "**මාසපටිච්ඡන්නං**" යි ද, එතැන සිට තවත් එකුන් තිස් දිනක් ගත වන තෙක් "**අතිරෙකමාස පටිච්ඡන්නං**" කියා ද, ඉන් පසුද ත් ප්‍රතිච්ඡන්න කල්හි "**ද්වෙමාස පටිච්ඡන්නං**" යි ද, මේ ක්‍රමයෙන් ම "**අතිරෙකද්වෙමාසපටිච්ඡන්නං, තෙමාසපටිච්ඡන්නං -පෙ- අතිරෙකඑකාදසමාස පටිච්ඡන්නං**" යි යෙදිය යුතු යි. හවුරුද්දක් පිරුණු කල්හි "**සංවච්ඡර පටිච්ඡන්නං**" යි ද, ඉන් ඔබ්බට "**අතිරෙක සංවච්ඡර පටිච්ඡන්නං-ද්වෙ සංවච්ඡර පටිච්ඡන්නං**" ආදි වශයෙන් යොදා පිරිවෙස් යාචනය කටයුතු යි.

දෙ තුන් ඇවැත් කෙනෙක් ප්‍රතිච්ඡන්න වූහු නම් '**ද්වෙආපත්තියො-තිස්සො ආපත්තියො**" යි යෙදිය යුතු යි. තුනෙන් අධික කොපමණ වුවත් "**සම්බහුලා ආපත්තියො**" යි යෙදිය යුතු. නානාවත්ථුක වශයෙන් අවන් දවසක් ප්‍රතිච්ඡන්න වූ බොහෝ ඇවැත් (ත්‍රිසංඛ්‍යාව ඉක්ම වූ ඇවැත්) ඇති කල්හි "**අහං භන්තෙ සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං නානාවත්ථුකායො එකාහපටිච්ඡන්නායො; සොහං භන්තෙ සඞ්ඝං සම්බහුලානං ආපත්තීනං එකාහපටිච්ඡන්නානං එකාහපරිවාසං යාචාමි, දුතියම්පි යාචාමි- තතියම්පි යාචාමි**" යි යාචනය කළ යුතු ය. නානාවත්ථුක වශයෙන් බොහෝ ඇවැත් අවන් කල්හි ප්‍රතිච්ඡන්න වූ කාල ප්‍රමාණය සලකා මත්තෙහි දු පෙර කී නයින් යොදා ගත යුතුයි. වෙනස කාලප්‍රමාණය යොදා ගැනීම පමණි. මෙසේ යාචනය කළ විට සඞ්ඝයා ඔහට ඤත්ති චතුත්ථ කම්මවාචා භණනයෙන් පිරිවෙස් දෙන්නේය. කම්මවාචාවසානයෙහි "**පරිවාසං සමාදියාමි, වත්තං සමාදියාමි**" යනු යෙන් කියා පිරිවෙස් සමාදන් විය යුතු යි. පසුව එහි සඞ්ඝයාහට ඒ බව කියා, එහි පැමිණෙන තාක් හැම භික්ෂූන් හට ම ත් දැන්විය යුතු යි. යම් ලෙසකින් ආරොචනය දුෂ්කර වුව හොත් "**පරිවාසං නික්ඛිපාමි, වත්තං නික්ඛි**

**පාමි**" සි සහ මැද හෝ එක භික්ෂුවක් වෙතැ හෝ වත්තනික්ෂේපය කට යුතු යි. **නික්ෂිප්ත** මොහොතේ සිට "**පක්ඛිත්තක**" වේ. පසුව අරුණු නැගී මට පළමු ව නැවත සමාදන් ව, ඒ භික්ෂුවට ත් එහි වෙසෙන උපසපන් භික්ෂූනට ත් ආරෝචනය කොට, අරුණු නැගි කල්හි වත්තනික්ෂේපය කට යුතු යි. මේ ක්‍රමයෙන් ප්‍රතිච්ඡන්න කාල සීමාව අවසන් වන තෙක් පුරන් නා වූ පරිවාසය **පටිච්ඡන්න පරිවාස** නමි.

**සුද්ධන්ත පරිවාසය** චූලසුද්ධන්ත- මහාසුද්ධන්ත වශයෙන් දෙ පරිදි වේ. උපසම්පදයෙන් පසු මෙතෙක් කල් තමා ශුද්ධ බව දනී නම්, ඒ කාලය අත හැර අවසෙස රාත්‍රි පරිච්ඡේදය එක්කොට දෙන පරිවාසය චූලසුද්ධන්ත පරිවාසය යි. මෙය වනාහි දික්කිරීමට පිළිවන් වේ. යමකු වනාහි තමාගේ 'ඇවැත් ප්‍රතිච්ඡන්නාව ඇත්තේ දෙමසකැ'යි සිතා දෙමසකට පිරිවෙස් ලැබ පුරණ අතර "තවත් මසක් ප්‍රතිච්ඡන්නය" යි සිහි වූවහොත් ඒ මස ද එක් කොට ගෙන තෙ මසක් පිරිවෙස් පිරිය යුතු යි. එක්කළ මාසයට නැවත සමාදන්වීමක් අනවශ්‍ය ය.

යමෙක් ප්‍රතිච්ඡන්න වූ ආපත්ති සංඛ්‍යාව හෝ දින ගණන හෝ නො දනී නම්, ඔහුට දියයුතු පිරිවෙස **මහාසුද්ධන්ත** නමි. මහාසුද්ධන්තය රකින්නන් විසින් උපසපන් දා සිට පිරිවෙස් සමාදන් වන දිනය දක්වා රාත්‍රි සංඛ්‍යාව ගැන ඒ ගණනට රැකිය යුතුයි. මෙය චූලසුද්ධන්තය මෙන් දීර්ඝ නො වතු දු ආපත්ති ආරෝචනය කිරීමාදි ශුද්ධත්වයක් මතක් වූව හොත් අඩු කළ හැකි ය.

මේ විවිධ වූ සුද්ධන්ත පරිවාසය ආපත්ති ප්‍රමාණයක් නො දන්නහුට ත් රාත්‍රි ප්‍රමාණයක් නො දන්නහුට ත් වෙමතිකයාහට ත් අනුඥාත යි.

සමෝධාන පරිවාසය, ඔධාන සමෝධාන, අග්ඝසමෝධාන, මිස්සකසමෝධාන වශයෙන් ත්‍රිවිධ යි.

යමෙක් පිරිවෙස් පුරා ගෙන යන අතර සඟවෙසෙසකට පැමිණ පුරිම ආපත්තීන් පමණ කාලයක් හෝ ඊට අඩු කාලයක් හෝ ප්‍රතිච්ඡාදනය කෙරේ නම් එවිට ඔහු පිරිවෙස් වුසූ කාලය මකා- **මූලායපටිකස්සනය** කොට හෙවත් පෙර වුසූ කාලය ඉවත් කොට- මූලට ඇද (මූලසිට) දිය යුතු පරිවාසය "**ඔධාන සමෝධාන**" නමි.

වැඩිපුර කල් ප්‍රතිච්ඡන්න වූ ඇවත සලකා සෙසු ආපත්තීනටත් සමග ඒ ප්‍රතිච්ඡන්න කාලය යම්තාක් නම් ඒ තාක් කල් පිරීමට දෙනු ලබන පරිවාසය **අග්ඝසමෝධාන** නමි.

නානාවත්ථුක ආපත්තීන් එක්කොට දිය යුතු පරිවාසය **මිස්සක සමෝධාන** නමි.

පිරිවෙස් සමාදන් වන්නහු විසින් සංඝයාගේ **අත්පසින්** බැහැර සිට පිරිවෙස් යැද, අත්පසට වන් කල්හි ඤත්තිචතුත්ථ කම්මවාචා භණනයෙන් සංඝයා පිරිවෙස් දෙන්නේය. ඉන්පසු අත්පසින් ඈත්වැ උක්කුටිකයෙන්

හිඳ පිරිවෙස් සමාදන් වැ එහිදී ම සංඝයාට ආරෙචනය කටයුතු ය. ඉන්පසු කැමැති නම් පිරිවෙස නික්ෂෙප කොට, පසුව එහි වෙසෙන භික්ෂූන් ඉදිරියේ පිරිවෙස් සමාදන්ව ආරෙචනය කොට හුදකලාව කිළියක විසිය යුතු. පාන් වූ කල පළමුවෙන් හමුවන මහණහට ආරෙචනය කොට පිරිවෙසින් මිදීම වත්මන්හි සිරිත ය.

පාරිවාසිකයන්ගේ රත්තිච්ඡෙදයට සහවාස (පකතත්ත භික්ෂූන් සමග එකච්ඡන්නයෙහි අරුණු නැගීම) විප්පවාස (භික්ෂූන්ගෙන් වෙන් ව හුදකලා වාසය) අනාරෙචන (ආගන්තුකාදීනට නො දැන්වීම) යන කරුණු තුන හේතු වේ.

72 මානත්තං

සංඝයාට මානත්තය– බුහුමන් කිරීම පිණිස– ආරාධනය පිණිස පිළිපැදීම මානත්ත නම්. මානත්ත වනාහි පටිච්ඡන්න අපටිච්ඡන්න වශයෙන් ද්විවිධ ය ප්‍රතිච්ඡන්න වූ ඇවැත් නො මැති හෙයින් පිරිවෙස් නො පිරූ භික්ෂූනට දියයුතු මානත්ත **අපටිච්ඡන්නමානත්තය යි.** ප්‍රතිච්ඡන්න වූ ඇවැත් ඇති හෙයින් පිරිවෙස් පුරණ ලද්දවුනට දියයුතු මානත්ත **පටිච්ඡන්න මානත්තය** යි. පිරිවෙස් පිරූ මහණහු විසින් සඞ්ඝයා ගෙන් මානත්ත සමාදන් වන කාලයේ දී පිරිවෙස බහා තබා තිබේ නම්, පළමුකොට අත් පසින් ඇත් ව පිරිවෙස් සමාදන් ව සඞ්ඝයාට ආරෙචනය කොට මානත්ත ඉල්විය යුතු. ඉන්පසු පිරිවෙස්හි දී මෙන් සඞ්ඝයා මානත්ත දෙන්නේ ය. එවිට අත්පසින් ඇත් ව මානත්ත සමාදන් ව ආරෙචනය කොට කැමැති නම් බහා තබා, පසුව සඞ්ඝයා ඉදිරියේ දී සමාදන් විය යුතු ය. සෙස්ස පිරිවෙස්හි මෙනි. භික්ෂූන් බොහෝ වෙසෙන ප්‍රාකාරාදියකින් පරික්ෂිප්ත විහාරයෙක්හි නම් ඒ පරික්ෂිප්ත සීමාවේ සිට හෝ අපරික්ෂිප්ත විහාරයෙක් හි නම් පරික්ෂෙපාරහස්ථානයෙහි සිට හෝ ලෙඩ්ඩුපාතවයයක් ඉක්මවා මාවතක් තිබේ නම් එයින් ඉවත් ව යම්කිසිවකින් ආවරණය වූ තැනකට යටත්පිරිසෙන් උපසපන් සිවු නමක් වත් කැටුව ගොස් **"මානත්තං සමාදියාමි, වත්තං සමාදියාමි"** යි තෙ විටක් කියා අරුණට පළමුව සමාදන් විය යුතුයි. ඉන්පසු ඒ භික්ෂූනට ආරෙචනය කටයුතු යි. අරුණ නැගි කල්හි එක් භික්ෂුවක් වෙතැ හෝ වත්තනික්ෂෙපය කටහැකි ය. ඉන්පසු පකතත්ත සංඛ්‍යාවට යේ. මෙසේ ස රැයක් මානත්ත රැකිය යුතුයි.

73 අබ්භානය

අබ්භානය කරන්නේය යනු අව් සි. අබ්භානය නම් ආහවානය සි. කැඳවීම යි. සම්පටිච්ඡනය යි. ඇතුළත් කර ගැනීම යි එය සංක්ෂෙපයෙන් මෙසේ යः අබ්භානකර්මයට පළමුවෙන් අබ්භාන කළ යුත්තා වත් නික්ෂෙප කොට තිබේ නම් එවිට ඔහු පකතත්ත බැව්හි සිටි හෙයින් අබ්භානය කරන්නවුන් විසින් මානත්ත සමාදන් කරවිය යුතු යි. එසේ මානත්ත සමාදන් වූ අබ්භානාභීයා ආරෙචනය කොට අබ්භාන කර්මය පිණිස ආරාධනා කළ යුතුයි. එවිට වීසති ගණ සඞ්ඝයා ඤත්ති චතුත්ථ කම්මවාචා භණනයෙන් ඔහු අබ්භාන කරන්නේ ය.

පරිවාස– මානත්ත– අබ්භානයන් ගැන මෙහි දක්වූයේ සංක්ෂෙපයෙනි. විස්තර කැමැත්තවුන් විසින් **මාතිකාට්ඨකථායෙන්** (47–51) **සහ පාලිමුත්තක විනය විනිශ්චයෙන්** (301–352) ද බලා දත යුතු සි.

37 ආපත්තානුක්ඛිත්ත මනනනරාය-
පහුත්තනතායො තථාසඤ්ඤිතා ච
ඡාදෙතුකාමො අථ ඡාදනා'ති
ජනතා [1] දසඞ්ග'හරුණුගමමති'ති

සඟවෙසෙස් ඇවතක් බව ය, උක්කෙවිනීකම් නොලද බවය, රජාදි අන්තරායක් නැති බවය, සබ්‍රම්සරුන් වෙත ගොස් ආරොචනයට පොහොසත් බවය, පෙරළුකි සතර සංඥ ඇති බව ය, සඟවනු කැමැති බව ය, සැඟවීම ය යන දස'ඟින් අරුණ නැඟි සඳ ඇවත සඟවන ලද වේ.

මෙයින් ආපත්ති පටිච්ඡාදනයෙහි ලා ගැනෙන දසාඞ්ගය ප්‍රකාශිත යි. 1 ආපත්ති ච හොති, 2 ආපත්ති සඤ්ඤි ච, 3 අනුක්ඛිත්තො ච හොති, 4 අනුක්ඛිත්ත සඤ්ඤි ච, 5 අනන්තරායො ච හොති, 6 අනන්තරාය සඤ්ඤි ච, 7 පහු ච හොති, 8 පහු සඤ්ඤි ච, 9 ඡාදෙතු කාමො ච හොති, 10 ඡාදෙති ච, යන දසයෙන් ආපත්ති පටිච්ඡාදනය කෙළේ වේ.

---

### 3 විවරණ

38 ඛොම කොසෙය්‍ය කප්පාස-සාණ භඞ්ගානි කම්බලං
කප්පියානි ඡළෙතානි-සානුලොමානි ජාතිතො

කොමු පිළීය, තිහිරි පිළිය, කපු පිළීය, හණවැහැරි පිළීය, ලූසු පිළීය, පලසය යන මොහු සදෙන අනුලොම් සිවුරු සහිතවූවාහු ජාති වශයෙන් කැප සිවුරු වෙති.

74 විවරං

භික්ෂුවක්හට හැඳීම් පෙරවීම් දෙකට පොහෝනා වස්ත්‍රය යි. "යං නිවාසිතුං වා පාරුපිතුං වා සක්කා" යනු **සමන්තපාසාදිකා** යි.

75 ඛොම

"ඛොම" නම් ගස් වැහැරින් වියන ලද සිවුරු මෙයින් ගැනේ.

76 කොසෙය්‍ය

කෘමි (පණු) කොෂ සූත්‍රයෙන් කළ සිවුරු ගැනේ. "කොස" නම් තිහිරි පකා යන කෘමි කොෂය; මිහි හුයින් කළ සිවුරු. "කොසෙන නිබ්බත්තං කොසෙය්‍යං" යන තද්ධිත ව්‍යවහාර විසින් උක්තයි" යනු පුරාණ සන්න යි.

77 කප්පාස

කපු නූලින් කළ සිවුරු යි.

78 සාණ

හණ වැහැරි හුයින් වියා කළ සිවුරු යි.

---

[1] දසඞ්ගහ්‍යරුණුගගමමති බු- ඉං.

79 භඞ්ග

කොමු ආදී සියලු නූල් හෝ සමහරක් හෝ මිශ්‍ර කොට වියන ලද සිවුරු "භඞ්ග" නම්. ඛොමඤ්ච කොසෙය්‍යඤ්ච කප්පාසඤ්ච සාණඤ්ච භඞ්ගඤ්ච යන ද්වන්ද සමාසයෙහි ඛොමකොසෙය්‍ය කප්පාස සාණභඞ්ගානි"යි සිද්ධ වේ.

80 කම්බලං

මිනිස් ලොම් සහ ව්‍යාල සතුන් ගේ ලොම් හැර සෙසු සතුන් ගේ ලොමින් වියන ලද සිවුරු යි.

39 **දුකූලඤ්චෙව පත්තුණ්ණ–පට්ටං සොමාර චීනජං**
**ඉද්ධිජං දෙවදින්නඤ්ච–තස්ස තස්සා'නු ලොමකං**

දුහුල් පිළී ද, පත්තුණ්ණ දෙශයෙහි පට ද, සොමාරදෙශ චීනදෙශයන්හි උපන් පට ද, සෘද්ධියෙන් ලද සිවුරු ද, දෙවියන් දුන් සිවුරු ද, ඛොමාදී වූ ඒ ඒ සිවුරට අනුලොම් සිවුරු යි. (පත්තුණ්ණ– සොමාර චීන යන දෙශයන්හි උපන් වස්ත්‍ර තුන ම කොසෙය්‍ය චීවරයට අනුලොම් වේ. කෘමිකොෂයෙන් ගත් නූලින් වියූ බැවිනි.)

81 දුකූලං

දුකූල නම් කිසියම් ගස් වෙසෙසකින් ගත් වැහැරින් කළ සිවුර යි. මෙය සාණ චීවරයට අනුලොම් වේ. දෙක ම වාකමය බැවිනි.

82 ඉද්ධිජං

ඒහි භික්ෂූන්හට මෙන් සෘද්ධි වශයෙන් ලැබෙන සිවුරු යි. ඛොමාදියට අනුලොම් ය.

83 දෙවදින්නං

අනුරුද්ධ මහතෙරුනට මෙන් දෙවියන් දුන් සිවුරු යි. මෙය ද ඛොමාදියට අනුලොම් ය.

40 **තිචීවරං පරික්ඛාර–චොළං වස්සික සාටිකං**
**අධිට්ඨෙ න විකප්පෙය්‍ය–මුඛපුඤ්ඡ නිසීදනං**

41 **පච්චත්ථරණකං කණ්ඩු–ච්ඡාදිමෙත්ථ තිචීවරං**
**න වසෙය්‍ය විනෙ'කාහං–චාතුමාසං නිසීදනං**

තුන් සිවුරු ද, පිරිකර සොළු ද, වැසිසළුව ද, මුව පුස්නය ද, නිසීදනය ද, පසතුරුණ ද, කස්පිළිසනය ද, යන මේ නව සිවුරු ඉටන්නේ ය. (ඒ ඒ සිවුරෙහි නම් ගෙන) නො විකපන්නේ ය. මේ නව සිවුරු අතුරෙහි තුන් සිවුරෙන් වෙන් ව (අත් පසින් දුරු වැ) එක දවසකුදු නො වසන්නේ ය. (නමින් ඉටූ) නිසීදන චීවරයෙන් වෙන් ව සාරමසක් නො වසන්නේය.

84 පරික්ඛාරචොලං

සඞ්ඝාටි ආදි නාමයෙන් නො ඉටූ යම් කිසි සිවුරකට නමි. තුන් සිවුර පටන් වියතට වඩා පුළුල් වූ ත් රියනට වඩා දික් වූ ත් පරිභොගයට කැප වූ හැම වස්ත්‍රයක් ම සුඛ පරිභොගය පිණිස "පරික්ඛාර චොල" නාමයෙන් ඉටන් කළ හැකි ය. "පරික්ඛාරචොලෙ ගණනා නාම නත්ථි"සී යූ බැවින් කැමැති තාක් "ඉමානි චීවරානි පරික්ඛාර චොලානි අධිට්ඨාමි" සී තුන්වරක් කියා අධිෂ්ඨාන කළ යුතු සි. කයින් අධිෂ්ඨාන කරන්නහු විසින් නම් ඒ සිවුරු අතින් ගෙන සිතින් සලකා ඉටිය යුතු. තෙචීවරික භික්ෂූන් හට තුන් සිවුරු සම්පූර්ණ වුවත් පරිස්සාවන පත්තත්ථවිකාදියෙන් ප්‍රයෝජන ඇති කල්හි ලැබෙන වස්ත්‍ර පරිෂ්කාර චොල නාමයෙන් ඉටා තබා වුවමනා විට ගැනිම පිණිස මේ පරික්ඛාර චෝලයෝ අනුඥතයහ.

85 වස්සිකසාටිකං

වැසි සාරමසැ එක් කොනක් හැඳ අනෙක් කොන පොරවා එළිමහනේ නහන්නට අනුදත් සිවුර යි. වස්සානකාලයාගේ ඉක්මීමෙන් අධිෂ්ඨානය අත්හැරේ. මෙය අනුදත වදාළේ චීවරක්ඛන්ධකයෙහි විසාඛ වස්තුවෙහි දී ය. වස්සික සාටකය දිගින් සුගත් වියත් නවයක් හා පුළුලින් හයක් ද වේ. උදකසාටිකාව අනෙකකි. එය භික්ෂුණීන් උදෙසා විසාඛා වස්තුවේදී පැනවූවකි. එහෙත් භික්ෂූන් ද පරිහරනය කළ බව "උදකසාටිකං භික්ඛූනං සෙත්වාපි අනෙනා තදියං යෙව කම්මං කාතබ්බ" යන සමන්තපාසාදිකා 786 වන පිටෙහි එන වැකියෙන් පෙනේ. එය නෑම පිණිස පාවිච්චිකරන "නානකඩය" සි සිතිය හැකිය.

86 අධිෂ්ඨ

අධිෂ්ඨානය කයින් හෝ වචනයෙන් හෝ කිරීම් වශයෙන් දෙ පරිදිය. එසේ ම සම්මුඛ පරම්මුඛ විසින් ද දෙ පරිදි ය. සම්මුඛයෙහි දී නම් "ඉමං" කියා ද පරම්මුඛයේ දී නම් "එතං" කියා ද යෙදිය යුතු සි. මෙසේ ඉටූ සිවුරු අනෙකකුට දීමෙන් ද, සොරුන් පැහැර ගැනීමෙන් ද, විශ්වාසිකයන් ගැනීමෙන් ද, ගිහි බවට පෙරළීමෙන් ද, ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයෙන් ද, කාලක්‍රියායෙන්ද, ලිඞ්ගපරිවර්තනයෙන්ද පචවුඛරණයෙන් ද, සිදුරුවීමෙන් ද යන නවාකාරයෙන් අධිෂ්ඨානය නැති වේ.

87 න විකප්පෙය්‍ය

මෙතන්හි දී "තිචීවරුදිය නො විකපන්නේය"සි සඳහන් වන්නේ තුන් සිවුරු තුන් සිවුරු නාමයෙන් පරිහරණය කරන කල්හි අධිෂ්ඨාන යෙන් යුක්ත ව පරිහරණය කිරීමට ත්, තිචීවර සංඛෙපයෙන් වෙන් වනු කැමැති කල්හි විකප්පනය කිරීමට ත් අනුදත් හෙයිනි. "තිචීවරං තිචීවර සඞ්ඛෙපෙන පරිහරතො අධිට්ඨාතුමෙව අනුජානාමි, න විකප්පෙතුං" සී දෙශනා කළ සේක. එය තවත් විස්තර වශයෙන් ප්‍රකාශ කරන බුද්ධඝොෂ මාහිමියෝ "වස්සික සාටිකං පන චාතුමාසතො පරං විකප්පෙතු මෙව, න අධිට්ඨාතුං, එවඤ්ච සති යො තිචීවරෙ එකෙන චීවරෙන විප්පවසිතුකාමො

හොති, තස්ස චීවරාධිට්ඨානං පච්චුද්ධරිත්වා විප්පවාසසුඛත්ථං විකප්පනාය ඔකාසො දින්නො හොති" යි සමන්තපාසාදිකාවෙහි (468) දෙසූහ. මේ ගැන හැම විස්තරයක් ම එහි ඇත.

"අනුජානාමි භික්ඛවෙ ආයාමතො අට්ඨඞ්ගුලං සුගතඞ්ගුලෙන චතුරඞ්ගුල විත්ථතං පච්ඡිමං චීවරං විකප්පෙතුං" යි විකල්පයිතව්‍ය පශ්චිම චීවරය දක්වූහ.

**විකප්පනය** සම්මුඛ පරම්මුඛ වශයෙන් දෙයාකාර ය. සම්මුඛ විකප්පනය නම් හමුවෙහි හුන් විකපුන් දන්නා පැවිජි කෙනකුන් හට නො ඉටු එක් සිවුරක් නම් "ඉමං චීවරං තුය්හං විකප්පෙමි" යි ද බොහෝ වුව 'ඉමානි චීවරානි තුය්හං විකප්පෙමි" කියා ද විකපන්නේය. මෙසේ විකෑපූ සිවුරු නො ඉටා තබතො ත් ඇවැත් නැති, එහෙත් පරිභොග කිරීම්, දීම්, ඉටීම් නො වටී. විකපනලද පැවිජ්ජන් විසින් ද එකක් වුව "මය්හං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහි"යි ද; බොහෝ වුව "මය්හං සන්තකානි -පෙ-" යි කියා පච්චුද්ධරණය කළ කල්හි පරිභොගාදිය වටී. අපච්චුද්ධාරිතයක් පරිභොග කරත් පචිති වේ.

පරම්මුඛ විකප්පනය නම්: 'ඉමං චීවරං තුය්හං විකප්පනත්ථාය දම්මි'යි බැණ දුන්විට එය ලැබූ භික්ෂු තෙමේද "ඉත්ථන්නාමස්ස සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහි" යි බැණ පච්චුද්ධරණය කරන්නේ ය.

සම්මුඛ විකප්පනයෙන් තමා විකප්පනය කොට අන්‍යයා ලවා පච්චුද්ධරණය කරවීම ද, පරම්මුඛ විකප්පනයෙන් අන්‍යයා ලවා විකප්පනය කරවා අන්‍යයා ලවා පච්චුද්ධරණය කරවීම ද මෙහි වෙනසි. මේ පිළිබඳ විස්තර දනු කැමැත්තන් විසින් සමන්තපාසාදිකායෙහි **461 පිටුවේ සිට 469 දක්වාත්, විමතිවිනොදනියෙහි 259 පිටුවේ සිට 263 දක්වා ද** කියවිය යුතු යි.

88 **මුඛපුඤ්ඡනං**

කෙළ වැගිරෙන්නවුන් ගේ කෙළ පිසදමා ගැනීම පිණිස අනුඥාත වූ සිවුරු වෙසෙසකි. වත්මන්හි ඉඳුල්කඩය යි ව්‍යවහාර වේ.

89 **නිසීදනං**

භික්ෂූන් ගේ හිඳගැනීමට ගන්නා වූ පිරිකරකි. මෙය දවලු සහිතවූයේ හෝ (රහිත වූයේ හෝ) යොග්‍ය ය. (**විමතිවිනොදනී 483**)

90 **පච්චත්ථරණකං**

සඟසතු හැඳ පුටු ආදියෙහි වෙර පැහැරීමෙන් කිලිටි වීම වළක්වනු පිණිස අනුඥාත වූ ඇතිරිළි යි.

91 **කණ්ඩු (පටි) ච්ඡාදිං**

කණ්ඩු ආදිය වසා ගැනීම පිණිස අනුදත් සිවුරකි. මෙය අනුදන්නා ලද්දේ "යස්ස අධොනාභි උබ්භජානුමණ්ඩලං කණ්ඩු වා පිළකා වා අස්සාවො වා

ථුල්ලකච්ඡු වා ආබාධො තස්ස පටිච්ඡාදනත්ථාය''සි පාචිත්තියපාලියෙහි (168) ප්‍රකාශවන හෙයින් නාභියෙන් යටත් දණමඩලින් උඩත් යන පෙදෙසෙහි හටගන්නා පිතවජිකා නම් කුෂ්ඨය ද, ලොහිත පිළකා නම් පොළ ද, අශීස්, භගන්දරාදීන් ගේ සැරවාදි අශුචි වැගිරෙන රොග ද, මහාපිළිකාබාධය ද යන රොග වැළඳුණු භික්ෂූන් උදෙසා ය.

42 ඉමං සඞ්ඝාටිම'ධිට්ඨාමි–සඞ්ඝාටිම්වච'ධිට්ඨයෙ
අහත්ථපාසමෙතන්ති–සෙසෙසු'පි අයංනයො

රදා කප්බිඳු තබා අත්පස තිබෙන සඟල සිවුර "ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි" කියා ඉටන්නේ ය. අත්පසින් ඈත්ව තුබූ සඟල සිවුර "එතං" කියා ඉටන්නේ ය; සෙස්සෙහි දූ මේ ක්‍රමය යි.

92 අහත්ථපාසං

අත්පසැ නො වූ සිවුර මෙයින් ගැනේ. අත්පස රියන් දෙක හමාරක් ඇතළතය'' සි ඇතැම් ආචාර්‍ය්‍ය කෙනෙක් ද "දෙළොස් රියනක් ඇතුළතය" සි නවත් ආචාර්‍ය්‍ය කෙනෙක් ද කියත්. රියන් දෙකහමාර වඩා සුදුසු සි.

43 අධිට්ඨහන්තෙනා සඞ්ඝාටි–පපහුතිං පුබ්බචීවරං
පච්චුද්ධරිත්වා'ධිට්ඨෙය්‍ය–පත්තා[1]'ධිට්ඨානෙ තථා

ඉටන්නේ සඟල සිවුර ආදි වූ (ඉටා වැළඳ ගත්) පරණ සිවුරු පසුදුරු ඉටන්නේ ය; පාත්‍රාධිෂ්ඨානයෙහි ද එසේම යි.

44 එතං ඉමං'වා සඞ්ඝාටිං–සංසෙ පච්චුද්ධරාමි'ති
එවං සබ්බානි නාමෙන–වත්වා පච්චුද්ධරෙ විදූ.

විනය දන්නා මහණ තෙමේ (අත්පසින් දුරු වුව) "එතං සඞ්ඝාටිං පච්ච්ද්ධරාමි" කියා ද අත්පසැ වුව 'ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමි" කියා ද කියන්නේ ය. මෙසේ සියල්ල ම නමින් කියා පසුදුරන්නේ ය.

45 සඞ්ඝාටි පච්ඡිමන්තෙන–දීඝසො [2]මුට්ඨිපඤ්චකා
උත්තමන්තෙන සුගත–චීවරූනාපි වට්ටති,
මුට්ඨිත්තිකපඤ්ච තිරියං–තථා එකංසිකස්ස'පි

සඞ්ඝාටිය යටත්පිරිසෙත් දිගින් මිටි පස්රියන් වූවා උඩත් පිරිසෙත් (වැඩිම ගණනින්) සුගත් සිවුරට උණුවූවා වටී. පුළුලින් මිටි තුන්රියන් පමණ ද සුගත් සිවුරට උණු පමණ ද වටී. උත්තරාසඞ්ග චීවරයා ගේ දිගු පුළුල් පමණ ද එසේම ය.

46 අන්තරවාසකො චාපි–දීඝසො මුට්ඨිපඤ්චකො
අඩ්ඪතෙය්‍යො විහත්ථො වා–තිරියන්තෙන වට්ටති.

අන්තරවාසකය ද යටත්පිරිසෙත් දිගින් මිටි පස්රියන් ඇත්තේ සරසින් දෙරියන් හමාරක් ඇත්තේ හෝ දෙරියනක් ඇත්තේ හෝ වටී.

---

[1] අධිට්ඨකෙ– ඉං. [2] මුට්ඨිපඤ්චකො. බු. ඉං. ටීකා.

47 **නිසීදනස්ස දීඝෙන-විදත්ථි මෙ විසාලතො**
**දියඩ්ඪං දසා විදත්ථි-සුගතස්ස විදත්ථියා**

නිසීදන චීවරයා ගේ දිගින් සුගත් වියතින් දෙවියතකි. පුළුලින් වියත් එකහමාරකි. දවල්ල වියතකි.

48 **කණ්ඩුපටිච්ඡාදිකස්ස-තිරියං මෙ විදත්ථියො**
**දීඝ නනතො චතස්සො'ව-සුගතස්ස විදත්ථියා.**

සුගත් වියතින් ම කණ්ඩුපටිච්ඡාදි චීවරයා ගේ සරස දෙ වියතෙකි. දිගින් සතර වියතෙකි.

49 **වස්සික සාටිකායාපි-දීඝසො ඡ විදත්ථියො**
**තිරියං අඩ්ඪතෙය්‍යා'ව-සුගතස්ස විදත්ථියා.**

වස්සික සාටික චීවරයා ගේ ද සුගත් වියතින් ම දිගින් සවියතෙකි, සරස අඩුතුන් වියතෙකි.

50 **එත්ථ ඡෙදන පාචිත්ති-කරෙණනස්ස තදුත්තරිං**
**පච්චත්ථරණ මුඛචොලා-ආකංඛිතපපමාණිකා.**

මේ සඞ්ඝාටි ආදි සිවුරෙහි ඒ ඒ සිවුර පිණිස කී පමණට වඩා කරන් නා හට අධික තැන් කපා දෙසිය යුතු හෙයින් ඡේදන පාචිත්තිහු වෙති. පච්චත්ථරණය මුඛපුඤ්ඡන චොලය යන මොහු කැමැති වන ලද පමණ ඇත්තාහු යි.

93 ඡේදනපාචිත්ති

නිසීදනය, කණ්ඩුපටිච්ඡාදනය, වස්සික සාටකය, සඞ්ඝාටි ආදි සිවුරැය යන මේ චීවරයන්හි නියමිත පමණ ඉක්මවා කළ කල්හි අධික කොටස සිඳ දමා පචිති දෙසිය යුතු හෙයින් "ඡේදනක පාචිත්ති" නම්. තව ඇඳ පුටු කරවීමේ දී ද සුගත් අඟලින් අටඟුල් පා තබා කරවිය යුතු. එය ඉක්ම වූ කල්හි ඒ නිමිත්තෙන් ද "ඡේදනක පාචිත්ති" වන්නේ ය.

51 **පරික්ඛාරචොලෙ ගණනං-පමාණං වා න දීපිතං**
**තථා වත්වා අධිට්ඨෙය්‍ය-එවිකාදිං විකප්පියං**

පරික්ඛාර චොල චීවරයෙහි ගණනක් හෝ පමණක් හෝ නො දක්වන ලදී. පාත්‍ර පසුම්බි ආදි විකපුන් පොහෝනා සිවුරු "ඉමං චීවරං පරික්ඛාර චොලං අධිට්ඨාමි" යනාදි ප්‍රකාරයෙන් කියා ඉටන්නේය.

52 **හතාහතකපපානං-සඞ්ඝාටි ද්විගුණා සියා**
**එකච්චි සුත්ත රාසඞ්ගා-තථා අන්තරවාසකො.**

අළුත් අළුත් වූ වස්ත්‍රයෙන් කළ සඞ්ඝාටි පොමෝ දෙ පට වන්නී ය. උත්තරා සඞ්ගය එකපට වන්නේ ය, අන්තර වාසකය ද එසේ ම එකපට වන්නේ ය.

53 **උතුඬ්ඪවාතං දුස්සානං-සඞ්ඝාටි ච චතුග්ගුණා**
**හවෙය්‍යුං ඞිගුණා සෙසා-පංසුකූලෙ යථාරුචි.**

බොහෝ කල් හැඳ හරණලද වස්ත්‍රයන් සම්බන්ධි වූ සඞ්ඝාටි තොමෝ සතරපට වන්නී ය; සෙසු උත්තරාසඞ්ග අන්තර වාසකයෝ දෙපට වන්නාහ. සුසානාදියෙහි පතිත පිලොතික චීවරයෙහි කැමැති පමණකි.

94 **පංසුකූලෙ**

වීදියෙහි ය, සොහොනෙහි ය, කසළ ගොඩෙහි ය, යනාදී තන්හි පස් මතුයෙහි වැටී තිබී ගත් වස්ත්‍ර පංසුකූල නම්. සොසානික, පාපණික, රථිය චොල, සඞ්කාර චොල, සොත්‍ථිය, නහාන චොල, තිත්‍ථ චොල, ගතපච්චාගත අග්ගිදඩ්ඪ, ගොඛායිත, උපචිකා ඛායිත, උන්දූර ඛායිත, අන්තච්ඡින්න, දසාච්ඡින්න, ධජාහට, ථූපචීවර, සමණ චීවර, ආභිසෙකික, ඉද්ධිමය, පන්‍ථික, වාතාහට, දෙවදත්තිය, සාමුද්දිය, යන මේ වස්ත්‍රයන් ගෙන් කවරක් වුවත් "පංසුකූල" නම්. විස්තරාර්ථීහු විශුද්ධිමාර්ගයෙහි ධුතඞ්ග නිර්දේශයෙන් බලත්වා.

54 **තිණ්ණං මෙ වා'පි එකං වා-ඡින්දිතබ්බං පහොති යං**
**සබ්බෙසු අප්පහොනෙනසු-අන්වාධිං ආදියෙය්‍ය වා**
**අච්ඡින්නකඤ්ච අනාදින්නං-න ධාරෙය්‍ය තිචීවරං.**

තුන් සිවුරු අතුරෙන් දෙ සිවුරෙක් හෝ කපා කටයුත්තේ ය; එක් සිවුරෙක් හෝ කපා කටයුත්තේ ය; කපා කරන ලද යම් සිවුරක් පශ්චිම ප්‍රමාණයට සෑහේ නම්; එය කපා කටයුත්තේ ය; සියලු තුන් සිවුර ම කපා කරන්නට නො පොහොනා කල්හි ආගන්තුක පත්‍ර ද අලවන්නේය; යටැ කී ක්‍රමයෙන් නො කැපූ ද ආගන්තුක පත්‍ර නො ඇල වූ ද තුන් සිවුර සඞ්ඝාටි ආදි නමින් ඉටා නො දරන්නේ ය.

95 **අන්වාධිං**

යනු ආගන්තුක පත්‍රය යි. පස් අතු සත් අතු ආදි වශයෙන් කපා සිවුරු කිරීමට රෙදි නො පොහොනා කල්හි මේ ආගන්තුක පත්‍ර ඇලවීමට නියම කළ සේක.

"තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො තිචීවරෙ කයිරමානෙ සබ්බං ඡින්නකං නප්පහොති. භගවතො එතමත්‍ථං ආරොචෙසුං. අනුජානාමි භික්ඛවෙ ද්වෙ ඡින්නකානි එකං අච්ඡින්නකන්ති." ද්වෙ ඡින්නකානි එකං අච්ඡින්නකං නප්පහොති. භගවතො එතමත්‍ථං ආරොචෙසුං. "අනුජානාමි භික්ඛවෙ ද්වෙ අච්ඡින්නකානි එකං ඡින්නකන්ති" ද්වෙ අච්ඡින්නකානි එකං ඡින්නකං නප්පහොති. භගවතො එතමත්‍ථං ආරොචෙසුං අනුජානාමි භික්ඛවෙ අන්වාධිකම්පි ආරොපෙතුං. න ච භික්ඛවෙ සබ්බං අච්ඡින්නකං ධාරෙතබ්බං. යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්සාති. (**මහාවග්ගපාලි 333**) යනු ආගන්තුක පත්‍රය අනුදත වදාළ සැටියි. නො කැපූ සිවුරු වැ ආගන්තුක පත්‍ර ත් නො අල්ලා පරිභොගයෙන් දුකුළා වේ. ඒවා

පරිෂ්කාර චොල නාමයෙන් ඉටා තැබීම නිවරද ය. කඩ වශයෙන් කැපීමේ දී යටත් පිරිසෙයින් පස්කඩකට හෝ ඉන් වැඩි සත්කඩ නවකඩ ආදියට හෝ කපා පරිභොග කළ යුතුයි.

55 **ගාමෙ නිවෙසනෙ උද්දො-සිතපාසාද හම්මියෙ**
**නාවට්ටමාල ආරාමෙ-සත්ථෙ ඛෙත්ත ඛලෙ දුමෙ**

56 **අජ්ඣොකාසෙ විහාරෙ වා-නික්ඛිපිත්වා තිචීවරං**
**භික්ඛු සම්මුතියාඤ්ඤත්‍ර-විප්පවත්ථුං න වට්ටති.**

ඇතුළු ගමෙහි හෝ, ගමින් පිට ගෙහි හෝ, බඩුහලැ හෝ, දික් පහයෙහි හෝ, සඳලු මඬුලුයෙහි හෝ, නැවෙහි හෝ, දෙරටු හලැ හෝ, කැණිමඩල එකක් ඇති සිවුරුස් කුඩා පහයෙක්හි හෝ, පුෂ්පාරාම ඵලාරාමයෙක්හි හෝ ජඞ්ගසත්ථ සකට සත්ථ විසින් දෙ වැදෑරුම් වූ වෙළඳ මුළෙක්හි හෝ, ඛුඹුරෙහි හෝ, ඛලවිටැ හෝ, රුක් මුලැ හෝ, අබවසැ හෝ, වෙහෙරැ හෝ, තුන් සිවුරු තබා භික්ෂු සම්මතියෙන් විනා එක රැයකුදු වියෝව විසීම නො වටී.

96 **උද්දොසිත**

බඩු තැන්පත් කොට තබන ශාලාව යි. මෙහි දී "ගමින් පිටත ධනපතීන් ගේ බඩු තැන්පත් කොට තැබීම පිණිස සමුද්‍රතීරාදියෙහි කරණ ලද බඩු ගබඩා ගත යුතු" බව **විමතිවිනොදනියේ (263)** සඳහන් වේ. "ගාම" යන වචනයට ගමැ ඇති භණ්ඩසාලාදියත් ගැනෙන හෙයිනි.

97 **හම්මියෙ**

මෙයින් මුණ්ඩච්ඡදන ප්‍රාසාදය ගැනේ. ඉතා උස් නැති චන්ද්‍රිකාසථලය ම පියසි කොට ඇති මුදුන් විරහිත පහය "හම්මිය" නම්. මෙය ටීකායෙහි හා **සමන්තපාසාදිකාවෙහි** 472 වැනි පිටුවෙහි එන පරිදියි. එහෙත් **සමන්තපාසාදිකා 898 වන පිටුවෙහි** "උපරි ආකාසතලෙ පතිට්ඨිත කූටාගාරො පාසාදො එව" සී එයි.

98 **අට්ට**

විරුද්ධ රජවරුන් ප්‍රතිබාහණය පිණිස ගඩොළයෙන් කළ සන භිත්ති ඇති සතර පස් මහලින් යුත් පතිස්සය විශෙෂයෙකි.

99 **මාල**

එක් මුදුනක් ඇති සිවුරුස් පහය යි.

100 **භික්ඛුසම්මුතියාඤ්ඤත්‍ර**

සඞ්ඝයා විසින් ගිලන් භික්ෂූනට දෙනු ලබන චීවර විප්පවාසසම්මුතියෙන් විනා යනු යි. අවිප්පවාස සීමාවන්හි ද තුන් සිවුරින් වෙන්ව අරුණු නැගුම වරද නැති.

57 [1]රොගවස්සා පරියන්තා-කණ්ඩුච්ඡාදිකා සාටිකා
තථා පරං විකප්පෙය්‍ය-සෙසා අපරියන්තිකා

කස් පිළිසත් සිවුර හා උදක සාටිකාව ද යන දෙක රොගය හා වස්සා න කාලය කෙළවර කොට ඇත්තාහ. ඉන්පසු විකපත්තේ ය. සෙසු චීවර වැළඳ ගැන්මෙහි කාලපරියන්තයක් නැත.

58 [2]පච්චත්ථර පරික්ඛාර-මුඛපුඤ්ඡන චොළකං
සදසමප්පරනතනාදිත්ත–කප්පං ලද්ධං නිසීදනං.

පච්චත්ථරණය පරික්ඛාර චොළය මුඛපුඤ්ජනය නිසීදනය යන මේ සිවුරු දවලු ඇති ව හෝ නැති ව හෝ පඬු පොවා හෝ නො පොවා හෝ කප්බිඳු තැබූයේ හෝ නො තැබූයේ හෝ පරිභොගයට සුදුසු යි.

මෙහි නිසීදනය සදස වත් අදස වත් වටනේ ලු. එහෙත් **සමන්ත පාසාදිකා ප්‍රාතිමොක්ෂ** යන දෙකෙහි ත් මෙහි ම 41 වන ගාථායෙහි හා 59 වන ගාථායෙහි හා සදසව ම වටනේයයි කියයි. **විමතිවිනොදනි 483** වන පිටුවෙහි "දසාය පන විදත්ථි පමාණං කතං අදසකම්පි නිසීදනං වට්ට ති" යී සඳහන් වේ.

59 අදසං රජිතං යෙව-සෙස චීවර පඤ්චකං
කප්පතාදිත්ත කප්පං ච-සදසං ච නිසීදනං.

අනික් සිවුරු පස දහ නැත්තේ ම රඳු කප්බිඳු එබූයේ ම වරී. නිසී දනය දහ සහිත වූයේ ම වරී.

101 **සෙසචීවර පඤ්චකං**

තුන් සිවුර හා කණ්ඩුපටිච්ඡාදනය ත් වස්සික සාටකය ත් යන පස යි.

60 අනධිට්ඨිතං නිස්සට්ඨං–විකප්පෙත්වා පරිභුඤ්ජයෙ
හත්ථදීඝං තතොපඩ්ඪ-විත්ථාරඤ්ච විකප්පියං.

චීවරාදි වශයෙන් නො ඉටූ අන් හට නො දෙන ලද සිවුර විකපා වැළඳ ගන්නේ ය. වඩු රියනක් දිග ඇති ඒ රියනින් අඩක් පුළුලැ'ති පශ්චිම චීවරය විකපිය යුත්තේ ය.

61 තිචීවරස්ස භික්ඛුස්ස–සබ්බමෙතං පකාසිතං
පරික්ඛාර චොළියො සබ්බං–තථා වත්වා අධිට්ඨති.

(අධිට්ඨානය ප්‍රමාණය පරිහරණය යන) ඒ හැම ම (විනය) තෙචීවරික භික්ෂුවට ප්‍රකාශ කරනලදී. පිරිකර සොළු ඇති මහණ තෙමේ සියලු සිවුරු "ඉමං පරික්ඛාර චොළං අධිට්ඨාමි" යන ක්‍රමයෙන් කියා ඉටයි.

62 අච්ඡෙද විස්සජ්ජන ගාහ විබ්භමා
පච්චුද්ධරෙ [3]මරණං ලිඞ්ග සික්ඛා
සබ්බෙස්වධිට්ඨාන වියොගකාරකා
විනිවිද්ධ ඡිද්දඤ්ච තිචීවරස්ස.

---

[1] රොගවස්සාන- ටීකා. [2] පච්චත්ථරණ- ටීකා. [3] මාරණං. බු. ඉං.

පැහැර ගැනීම ය, අනිකකක් හට දීම ය, විශ්වාසයෙන් ගැනීම ය, ගිහි වීම ය, (යන මොහු ද) පසු දීරීම ය, කාල ක්‍රියා ය, ලිඞ්ග පරිවර්තන ය, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන ය, (යන මොහු ද) සියලු චීවරයෙහි අධිට්ඨාන වියෝග කරන්නාහ. තිචීවරයා ගේ විනිවිද ගිය සිදුර වනාහි අධිට්ඨාන වියොගය කරන්නේ ය.

මෙසේ තුන් සිවුරෙහි අධිට්ඨානය බිඳ යෑමට හේතු වන කරුණු නව යක් මේ ගාථායෙන් ප්‍රකාශිත යි. මේ නවයෙන් මුල් අට පහසුවෙන් වැට හේ. නව වැන්න පමණක් මඳක් විස්තර කටයුතුය යි හඟිම්.

102 **විනිවිද්ධ ඡිද්දකථා**

විනිවිද ගිය සිදුරු ඇතිවීම ද අධිට්ඨානය නැතිවීමට එක් හේතුවකි. තුන් සිවුරෙන් දෙපොට සිවුරෙහි හා තනිපොට සිවුරෙහි ත් දිග පැත් තෙන් වියතක සිට ත් පුළුල් පැත්තෙන් අටඟුලක සිට ත් අතර එක නූල්පටක් පමණ වත් නොමැති ව සුලැඟිල්ල දැමිය හැකි තරමට වත් සිදු රක් වේ නම් එවිට අධිෂ්ඨානය කැඩෙන්නේ ය. අඳනයෙහි දී දිග පැත් තෙන් වියතක් හා පුළුල් පැත්තෙන් සතරඟුලක් තැන් සිට එබඳු සිදුරක් වේනම් අධිෂ්ඨානය කැඩෙන්නේ ය. මෙසේ වූ කල්හි මැසීම් කොට නැවත අධිෂ්ඨාන කළ යුත්තේ ය.

(මාතිකාට්ඨකථා 55)

**අකැප සිවුරු දක්වත්.**

63 **කුසවාකා [1]ඵල වීරණි-කම්බලං කෙසවාලජං**
**ථුල්ලච්චයං ධාරයතො-ලූකපක්ඛා 'ජිනක්ඛිපෙ**
**කදලෙරකක්කා දුස්සෙසු-පොත්ථකෙ වා'පි දුක්කටං**

තීතණ-වැහැරි-පුවරු-යන මේවා (වෙන් වෙන් ව) ගොතා කළ සිවුරු ද, මිනිස් ලොම් හෝ, සෙමර වලිගයෙහි ලොමින් හෝ කළ කම්බිලිය ද, බකමූහුණු පියා ගොතා කළ සිවුරු හා අඳුන් දිවි සම් ද, හඳනා පොරෝනා හට ථුලසි වේ. කෙහෙල් වැහැරින් කළ පිළියෙහි එරුහුයෙන් කළ පිළි යෙහි හා වරාහුයෙන් කළ පිළියෙහි ද "කැතිරිකඩය" යි කියන ලද නියඳින් කළ කඩෙහි ද දුකුළා වේ.

චීවරක්ඛන්ධකයෙහි කුස චීවර, වාක චීවර, ඵලක චීවර, කෙසකම්බල, වාලකම්බල, උලූකපක්ඛ, අජිනක්ඛිප, අක්කනාල යන අට වස්තුවෙහි ම ථුලසි වන බව කී හෙයින් මෙහි නො කී **අක්කනාලයෙහි** ද ථුලසි වේ.

64 **සබ්බ නීලක මඤ්ජෙට්ඨ-පීත ලොහිත කණ්හකෙ**
**මහාරඞ්ග මහානාම-රඞ්ග රත්තෙ තිරීටකෙ**

65 **අච්ඡින්න දීඝ දසකෙ-ඵලපුප්ඵ දසෙ තථා**
**කඤ්චුකෙ වෙඨනෙ සබ්බා-ලභතිච්ඡින්න චීවරෙ'ති.**

හැම නිල් වූ, හැම මදට වන් වූ, හැම රන්වන් වූ, හැම ලේවන් වූ, හැම කළු වූ පිළියෙහි ද, පත්තෑයන් පිට පැහැය සේ, හෝ මුසු පැහැය සේ

[1] ඵලකානි. බු- ඉං.

රුඳු සිවුරෙහි ද, රත් වූ පිළියෙහි ද, රිටිසුඹුළුයෙහි ද, නො සුන්දඟ ඇත් තෙහි ද, මැදින් කැපූ දික් දඟ ඇත්තෙහි ද, එකිනෙක ගොහා එලමෙන් කළ දඟ ඇත්තෙහි ද, කෙතකාදි පුෂ්පයන් මෙන් කළ දඟ ඇති වස්ත්‍ර යෙහි ද, සැට්ටයෙහි ද, හිස්වෙළුමෙහි ද, එසේ ම (දුකුළා) වේ. (නග්න කොට) සොරුන් විසින් පැහැර ගත් සිවුරු ඇති මහණ තෙමේ මේ කුස චීරාදි සියල්ල ම හඳනට පොරොනට ලබයි.

යම් මහණක්හු ගේ සිවුරු සියල්ල ම සොරුන් පැහැරගත් විට හෝ වෙන ආපදවකින් නෂ්ටප්‍රාය වූ කල්හි හෝ මෙකී අකැප වූ කුසචීරාදිය හැඳ පොරොවා හෝ විළි වසා ගතහැකිය. පසුව කැප වස්ත්‍ර ලත් විට එවා හැඳ පොරොවා ගත යුතු යි.

---

## 4 රජනානිචා'ති

66 **මූලක්ඛන්ධ තචපත්ත-ඵලපුප්ඵප්පභෙදතො**
**රජනානි ඡප්පකාරානි-අනුඤ්ඤාතානි සත්ථුනා.**

මුල් ය, කඳ ය, සුඹුලු ය, කොළ ය, ගෙඩි ය; මල් ය කියා ප්‍රභෙද වශ යෙන් සවැදෑරුම් වූ රජන්හු ශාස්තෘන් වහන්සේ විසින් අනුදන්නා ලදහ.

67 **මූලෙ හලිද්දිං ඛන්ධෙ ච-මඤ්ජිට්ඨං තුඞ්ගහාරකෙ**
**අල්ලිං නීලිඤ්ච පත්තෙසු-තචෙ ලොද්දඤ්ච කණ්ඩුලං**
**කුසුම්භං කිංසුකං පුප්ඵෙ-සබ්බං ලබ්භා විවජ්ජියා ති.**

මුල් රජන්හි වදකහ ද, කඳ රජන්හි මදට හෙවත් පතගි හා පිහොල් හර ද, පත් රජන්හි සිහින් කසා කොළ හා බේරු කොළ ද, තව රජන්හි ලොත් සුඹුලු සහ කාෂ්ඩාල් සුඹුලු ද, මල්රජන්හි වණක්මල් හා කැලමල් ද, හැර සෙසු (මුල්, කඳ, පත්, තව, මල් යන) රජන්හු කැපවෙති. ඵල රජන්හි සියල්ල කැප වේ.

**විස්තර**

7 මේ දෙ ගයෙන් භික්ෂූන් වහන්සේ ගේ පරිභොගයට ගන්නා සිවුරු රජන් කළ යුතු කැප පඬුවර්ගී ප්‍රකාශිත යි. "තුඞ්ගහාර" යනු කටු සහිත ගස්කැයි සමන්තපාසාදිකායෙහි කියා තිබේ. සෙසු වර්ගී එතරම් අප්‍රකට නැත.

---

## 5 පත්තොචා'ති

68 **අයො පත්තො මත්තිකා පත්තො-ජාතියා කප්පියා දුවෙ**
**උක්කට්ඨො මජ්ඣිමො චෙව-ඔමකො ච පමාණතො.**

යකඩ පාත්‍රය මැටි පාත්‍රය කියා ජාති වශයෙන් කැප වූ පාත්‍රයෝ දෙදෙ නෙක් වෙති. උත්කෘෂ්ඨ පාත්‍රය ද මධ්‍යම පාත්‍රය ද ඔමක පාත්‍රය ද කියා ප්‍රමාණ භෙයින් ද තුන් පාත්‍ර කෙනෙකි.

**69 උක්කට්ඨො මගධෙ නාළි-වය තණ්ඩුල සාධිතං**
**ගණ්හාති ඔදනං සූපං-බ්‍යඤ්ජනඤ්ච තදූපියං.**

උත්කෘෂ්ට පාත්‍රය මගධ නැළියෙන් දෙ නැළියක් සාලින් පිසන ලද බත ද, (ඒ බතින් හතරෙන් කොටසක් පමණ වූ අතින් ගත හැකි) මුද්ග සූපය ද-තියඹලාව ද පශ්චිම පිණ්ඩය තෙක් සුදුසු වූ මත්ස්‍යමාංශාදි ව්‍යඤ්ජන ද ගනී.

**70 මජ්ඣිමො තස්ස පථෙඨා-තතො'ව පකො'ච ඔමකො**
**උක්කට්ඨතො ච උක්කට්ඨො-දපතනා [1]ඔමකොමකො.**

මධ්‍යම පාත්‍රය ඒ උත්කෘෂ්ට පාත්‍රයා ගේ භාගයෙකි. ඔමක පාත්‍රය ඒ මධ්‍යම පාත්‍රයෙන් භාගයෙකි. උත්කෘෂ්ට පාත්‍රයට වඩා උත්කෘෂ්ට පාත්‍රය හෙවත් උක්කට්ඨුක්කට්ඨ පාත්‍රය ද, ඔමක පාත්‍රයට වඩා ඔමක පාත්‍රය ද හෙවත් ඔමකොමක පාත්‍රය ද අපත්තය-

**විස්තර**

8 මේ ගාථාත්‍රයෙන් කැප අකැප පාත්‍ර සියල්ල ම සංක්ෂෙපයෙන් ප්‍රකාශ කර තිබේ. මේ ප්‍රකාශයේ පරිදි පාත්‍ර පසකි. මෙහි දක්වූ පස නම්: උක්කට්ඨ, මජ්ඣිම, ඔමක, උක්කට්ඨුක්කට්ඨ, ඔමකොමක වශයෙනි. උක්කට්ඨොමක, මජ්ඣිමොමක මජ්ඣිමුක්කට්ඨ, ඔමකුක්කට්ඨ යන පාත්‍ර සතර ත් සමග පාත්‍ර නවයෙක් අට්ඨකථාවන්හි දක්වේ. මෙහි නම් වශයෙන් ඒ සතර නො දක් වුව ද උක්කට්ඨුක්කට්ඨ- ඔමකොමක යන පමණින් වැඩි වූ ත් පමණින් අඩු වූ ත් දෙ පත සඳහන් කොට ඇති හෙයින් නවය ම ප්‍රකාශ කළා වන්නේ ය. **පාරාජිකා පාළියෙහි** ද වදාළේ මේ පස පමණකි.

**ප්‍රමාණ විනිශ්චය**

කුඩු ඉවත් කිරීමෙන් ඉතා පිරිසුදු කරන ලද නො කැඩුණු හැල් හාල් මගධ නැළියෙන් දෙකකින් පිසූ බත් සහ ඒ බතින් සතරෙන් කොටසක් වූ අතින් ගත හැකි මුද්ග සූපය ද, ඒ බතට සෑහෙන පමණ මත්ස්‍ය මාංශාදි ව්‍යඤ්ජන ද පාත්‍රයෙහි බැහූ කල්හි ඒ පාත්‍ර මුඛවට්ටියෙහි (පාත්‍ර කටෙහි) යටැ ඉරට සම ව සිටී නම් ඒ පාත්‍රය "උක්කට්ඨ පාත්‍රය" යි. මුව විටේ යට ඉර ඉක්මවා සඳුපයක් සේ මතු වී සිටි නම් ඒ "උක්කට්ඨොමක පාත්‍රය" යි. මුවවිට දක්වා නො පිරී සිටි නම් ඒ "උක්කට්ඨුක්කට්ඨ පාත්‍රය" යි.

උක්කට්ඨ පාත්‍රයෙන් අඩක් වූ පාත්‍රය "මජ්ඣිම" පාත්‍රය යි. උක්කට්ඨ පාත්‍රයා ගේ ප්‍රමාණය දැනැ ගැනුමට කී හැල් හාල් බතින් අඩක් ගෙන ඉන් සතරෙන් කොටසක් වූ මුද්ග සූපය ද, සෑහෙන පමණ මත්ස්‍ය මාංශාදිය ද බහා මුවවිටැ යට ඉර දක්වා සපයී ව තිබේ නම් ඒ "මජ්ඣිම පාත්‍රය" යි. එය ඉක්මවා පවතී නම් මජ්ඣිම ඔමක පාත්‍රය යි. මුවවිටට සපයී නොවේ නම් "මජ්ඣිමුක්කට්ඨ පාත්‍රය" යි.

---

1 ඔමකොමතො. බු. ඉං. ටීකා.

මජ්ඣිම පාත්‍රයෙන් අඩක් වූ පාත්‍රය ''ඔමක පාත්‍රය'' යි. එයින් මඳක් ලොකු පාත්‍රය ''ඔමකුක්කට්ඨය'' යි. ඔමක පාත්‍රයෙන් කුඩා පාත්‍රය ඔමකොමක පාත්‍රය යි. මෙකී පාත්‍ර නවයෙන් උක්කට්ඨුක්කට්ඨ පාත්‍රය සහ ඔමකොමක පාත්‍රය ද ඇකැප හෙයින් අනධිට්ඨිත ය. අවිකප්පිතය. සෙසු පාත්‍ර සත ම කැප හෙයින් අධිට්ඨාතව්‍ය ය, විකල්පයිතව්‍ය ය, යම් කිසිවකු හට මෙකී පමණින් යුත් යකඩ හෝ මැටි පාත්‍ර කිපයක් තිබේ නම්; ඒ සියල්ල ම පරිභොග කිරීමට ත් කැමති නම් එකක් අධිෂ්ඨාන කොට පරිභොග කිරීමෙන් පසුද නැවෙකක් අධිෂ්ඨාන කට හැකි ය. මේ ක්‍රමයෙන් සියවසක් වුවත් පරිහරණය කට හැක්කේ ය. (**මාතිකාට්ඨකථා 73**)

**මගධ නැළිය**

''මගධ නැළිය පළම් දෙළහමාරකැයි **අන්ධකට්ඨකථායෙහි** කියන ලදි. හෙළදිවැ නැළිය මහත් ය. දෙමළ නැළිය කුඩා ය. මගධ නැළිය පමණින් සරිය. ඒ මගධ නැළියෙන් එකහමාරක් සිංහල නැළියකි.'' (**විනයත්ථමංජුසා 174 පිටුව**) සහ (**සමන්තපාසාදිකා 509 පිටුව**) පළම් 16 ක් එක මගධ නැළියකැ යි වෛද්‍ය පොත්වල සඳහනි. ''මෙහි මගධ නැළි නම් මැදුම් පිරිමියක්හු අතින් අට පතක් ගන්නා නැළිය යි. ''**සිඛ වළඳවිනිස 37**.

**71 අතිරෙකපත්තො ධාරෙය්‍යො – දසාහ පරමං සකො**
**කප්පො නිස්සග්ගියො හොති – තස්මිං කාලෙති නාමිතෙ**

සවකිය වූ ද, කැප වූ ද අනධිට්ඨිත අවිකප්පිත පාත්‍රය උඩත් පිරිසෙයින් දශ දවසක් කල් දැරිය යුත්තේ ය. ඒ දසාහපරම කාලය ඉක්මූ කල්හි නිසජිය යුතු වේ.

**103 අතිරෙක පත්තො**

අතිරෙක පාත්‍රය නම් ''ඉමං පත්තං අධිට්ඨාමි'' යනාදි වශයෙන් අධිෂ්ඨාන නො කළා වූ ද, ''ඉමං පත්තං විකප්පෙමි'' යනාදි වශයෙන් විකප්පනය නො කළා වූ ද ප්‍රමාණ යුක්ත පාත්‍රය යි.

**104 සකො**

පාත්‍රයෙහි වටිනා කම්න් ඉතා සවල්පයක් වත් ඉතිරි නොකොට ගෙවූ හෙයින් සවකීය වූ පාත්‍රය යි.

**105 කප්පො**

පාක වශයෙන් කැප වූ යන අර් යි. යකඩ පාත්‍රයක් නම් පිසීම් පසකින් හා මැටි පාත්‍රයක් නම් පිසීම් දෙකකින් ද හොඳින් පිසන ලද්දේ කැප වේ.

**106 නිස්සග්ගියො**

නිසගි වේ යනු යි. නිස්සජිතං– නිස්සග්ගියං යී යූ බැවින් පූර්භාගයේ කටයුතු විනය කර්මයට නම්. අතිකකුහට පැවැරීම යනු යි. මෙසේ සවකීය

වූ ත් කැප වූ ත් අතිරේක පාත්‍රයක් දශ දවසක් පරම කොට ඇති කාලයක් දැරිය හැකි ය. ඉදින් ඒ දශ දිනය ඉක්ම ගියේ නම්, ඒ පාත්‍රය නිසඟි වේ. යම් පාත්‍රයක් හෝ කිපයක් නිසඟි වූ කල්හි ද චීවරාදියක් නිසඟි වූ කල්හිද ඒ නිසඟි වූ වස්තුව සඞ්ඝයා වෙත හෝ ගණයා වෙත හෝ පුද්ගලයකු වෙත හෝ ගෙන ගොස් නිස්සජ්ජනය (පැවරීම) කළ යුතු යි. ඒ මෙසේ යි: මෙසේ නිසඟි වූ පාත්‍රය "ඉදං මෙ භන්තෙ පත්තං දසාහාතික්කන්තං නිස්සග්ගියං; ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමි"යි (සංඝයා නො මැති නම් ගණස්ස– පුග්ගලස්ස යී සුදුසු පරිදි යොදා) නිස්සජ්ජනය කොට එයින් අවත් පවිතිය "අහං එකං නිස්සග්ගියං පාචිත්තියං ආපන්නො; තං පටිදෙසෙමී"ති"යි ඇවැත් දෙසා ගත යුත්තේ ය. නිසඟි වස්තු වැඩි ගණනක් නම් බහු වචනය යොදා කිය යුතු යි. මෙසේ නිස්සජ්ජනය කළ ඒ වස්තූන් ඒ සඞ්ඝ– ගණ– පුද්ගලයන් විසින් ආපසු දිය යුතු යි. නො දුන් කල්හි ඒ සඞ්ඝ–ගණ– පුද්ගලයනට දුකුළා වේ.

72 අචෙජද දාන ගාහෙ ගි–විබ්භමා මරණුද්ධටා
ලිඞ්ග සික්ඛාහි ඡිද්දෙන–පත්තෙනා'ධිට්ඨාන මුඤ්ඣති.

සොරු පැහැර ගැනීමෙන් ද, අනුනට දීමෙන් ද, විශ්වාස ඇත්තන් ගැනීමෙන් ද, ගිහි වීමෙන් ද, කාලක්‍රියායෙන් ද, පසු දිරීමෙන් ද, ලිඟු පෙරළීමෙන් ද, සිකපස් විකීමෙන් ද, සිදුරු වීමෙන් ද, පාත්‍රය තෙමේ අධිෂ්ඨානය අත්හරී.

**විස්තර**

9 මෙයින් පාත්‍රාධිෂ්ඨානය නැති වෙන්නා වූ තවාකාරය ප්‍රකාශිත යි. අධිෂ්ඨාන විකල්පනයෝ යටැ දක්වූහ. මෙහි දක් වූ අධිෂ්ඨාන විජහන කාරණ අතර "ඡිද්දෙන" යන්නෙන් ප්‍රකාශ කෙළේ සිදුරු වීමෙන් අධිෂ්ඨානය අත්හැරෙන සැටි යි. ඉටු පාත්‍රය මුව විටෙන් යටැ දෙ අඟුලක් පම ණැති වැ සිදුරු වී තණ සුලක් නික්මෙන තරමට වත් සැදුණි නම් අධිෂ්ඨානය අත්හැරේ. එහෙත් එපමණකින් ඒ පාත්‍රය පරිභොගයෙන් අත්හැරිය යුතු නොවේ. බිඳුන පසක් පිරුණු කල්හි අලුත් පාත්‍රයක් ලබා ගන්නවා මිස ඉන් මොබැ නො වටී.

යම්කිසි පාත්‍රයක මුවවිටේ සිට දෑඟුලක් පමණ හෝ සිදුරක් සැදුණේ නම් පාත්‍ර විද්දනා කටුවකින් විදූ හූ ආදියකින් බැඳ එහි ආමිෂ නො රැඳීම පිණිස ඉටි ආදියකින් වසා දැමිය යුතු යි. මේ ක්‍රමයෙන් අටඟුලක් පමණ ඉරි වැටුණු පාත්‍රයක් වුවත් බැමි සතරක් ගසා පරිභොග කට හැකිය. දසඟුලක් පමණ දිගට බැඳුණ හොත් එය බැන්දත් පරිභොගයට දුෂ්කර හෙයින් එසේ පරිභොග නො කට යුතු යි. මේ මැටි පාත්‍රය ගැන යි.

යකඩ පාත්‍රය සිදුරු පසකට වැඩි වුව ද පිළියම් කොට පරිභොග කළ හැකි නම් එසේ කළ යුතු යි. (මාතිකාට්ඨකථා 74)

# මෙතැන් සිට පාත්‍ර වත් පැවැසේ.

73 **පත්තං න පටිසාමෙය්‍ය-සොදකං න ච ඔතපෙ**
**උණ්හෙ න නිදහෙ භූම්‍යා-න ඨපෙ නො ච ලග්ගයෙ.**

දිය සහිත පාත්‍රය නො තබන්නේ ය. අව්වෙහි තබා දිය සහිත පාත්‍රය නො වියලන්නේ ය, උෂ්ණයෙහි තබා වැඩියක් නො දවන්නේ ය, බිමැ නො තබන්නේ ය, හිකති බිලාදියෙක්හි නො එල්වන්නේ ය.

107 **න ච ඔතපෙ**

මේ ගාථායෙහි "න ච ඔතපෙ" යන්න වෙනුවෙන් පැරණි සන්නයෙහි අර්ථ කියා තිබෙන්නේ "අව්වෙහි ගිනියෙහි නො ද වියලන්නේ ය" කියා යි. එහෙත් එහි අඩුවක් පෙනේ. "තෙන ඛො පන සමයෙන භික්ඛූ ස උදකං පත්තං ඔතාපෙන්ති, පත්තො දුග්ගන්ධො හොති. භගවතො එතමත්ථං ආරොචෙසුං "න භික්ඛවෙ ස උදකො පත්තො ඔතාපෙතබ්බො යො ඔතාපෙය්‍ය ආපත්ති දුක්කටස්ස, අනුජානාමි භික්ඛවෙ වොදකං කත්වා ඔතාපෙත්වා පත්තං පටිසාමෙතුං" (**චුල්ලවග්ගපාලි 206 පිටුව**) යී වදාළ ශික්ෂාවට අනුව නම් මෙය විය යුත්තේ "දිය සහිත පාත්‍රය නො ද වියලන්නේය කියා යි. භික්ඛුනො සොදකං පත්තං ඔතාපෙතුං න වට්ටති" යනු **විනය විනිශ්චයයේ (755)** එන සැටි යි.

108 **භූම්‍යා න ඨපෙ**

යම් බිමක තැබීමෙන් පාත්‍රයෙහි වර්ණය නැසේ නම් එබඳු බිමෙක්හි නො තබන්නේය යනු යි. මැටියෙන් හෝ සුදුසු වෙන යම්කිසි දෙයකින් පිරිබඩ කළ බිමෙක්හි නම් මැනවි. එසේ නම් කලාලාදියක් අතුරා හෝ දූෂ්‍ය නො වන වාලුකාස්ථලයකැ හෝ තැබිය යුතුය යි **විනය අටුවාවේ (890)** පැවසේ.

109 **නො ච ලග්ගයෙ**

හිකති බිලාදියෙහි එල්ලා නො තබන්නේ ය යනු යි. යම් කිසිවකින් බැඳ නො වැටෙන පරිදි සකස් කොට නම් එබන්දක එල්ලා තැබිය හැකි ය.

74 **මිඪන්තෙ පරිභණ්ඩන්තෙ-අඩ්ඪකෙ වා ආතපත්තකෙ**
**පාදෙසු මඤ්ච පීඨෙ වා-ඨපෙතුං න ච කප්පති.**

පිල කෙළවර හෝ, නිසවතු කෙළවර හෝ, ඇකෙහි හෝ, සත් මත් තෙහි හෝ, පතුල් පිටැ හෝ, හැඳ පුටු මත්තෙහි හෝ, තබන්නට නොවටී.

110 **මිඪන්තෙ**

පිල් කෙළවර යි:- "කසිරුව" යී මෙකලැ ව්‍යවහාර කරන්නේ මේ මීඪ ය ගැන යි. "සචෙ පන පරිවත්තිත්වා තත්ථෙව පතිට්ඨාති, එවරූපාය විත්ථිණ්ණාය මීඪාය ඨපෙතුං වට්ටති" (**සමන්තපාසාදිකා 890**) දක් වූ හෙයින් පුළුල් කසිරු ආදියෙක්හි නම් මැනවි.

111 **පටිභණ්ඩගන්ත**

මෙය ගෙහි පිටිපසැ කළ පිල් කොළවර යි. සෙස්ස පෙර සේ යි.

112 **අඩෙක**

සිහි මූලාවෙන් නැගී සිටින විට පාත්‍රය පෙරළී කැඩී යන හෙයින් ඇක යෙහි තබා ගැනීම තහනම් කළහ.

75 **න නීහරෙය්‍ය උච්චිටෙඨා-දකඤච වලකටඨිකං පතෙතාන පතත හඤඤා වා-කචාටං න පණාමයෙ.**

ඉඳුල් දිය ද, රස උරා බොන ලද රෙබු (හප) ද, මස් මාංසාදි ඇට හෝ කොස් ඇට දඹ ඇට ඇ ඇට ද, පාත්‍රයෙන් නො ගෙනියන්නේ ය. පාත්‍රය ගත් අත් ඇත්තේ දෙර කවුළු නො හරින්නේ ය. නො ද පියන්නේ ය.

113 **උච්චිටෙඨාදකං**

මූඛ ධොවනාදිය කළ ඉඳුල් දිය යි.

114 **වලකටඨිකං**

මෙයින් රස උරා බොන ලද රෙබු (හප) සහ මස් මාළු ඇට හෝ කොස් ඇට දඹු ඇට ඇ ඇට හෝ ගැනේ. ''වලක'' යනු රෙබු යි. නොහොත් සප යි. මෙයින් යම් කිසිවක් පාත්‍රයෙන් ගෙනැ යේ නම් දුකුලා වේ.

''එතෙසු යං කිඤචි පතෙතන නීහරනතසස දුකකටං. පතතං පටිගගහං කතවා හත්ථං ධොවිතුමපි න ලභති. හත්ථධොත පාදධොත උදකමපි පතෙතන ආකිරිතවා නීහරිතුං න වටටති. වාමහතෙථන පතෙත උදකං ආසිඤචිතවා එකං උදකගණ්ඩූසං ගහෙතවා උච්චිටඨ හතෙථන ගණ්හිතුං වටටති. එතතා වතා'පි හි සො උච්චිටඨපතෙතා හොති. හත්ථං පන බහි උදකෙන විකඛා ලෙතවා ගහෙතුං වටටති. මචඡමංසඵලා ඵලාදීනි ඛාදනෙතා යං තත්ථ අටඨිං වා ඵලකං වා ඡඩෙඩතුකාමො හොති, තං පතෙත ඨපෙතුං න ලබහති. යමපන පටිඛාදිතුකාමො හොති, තං පතෙත ඨපෙතුං ලබහති. අටඨික කණ්ටකාදීනි තතෙථව කතවා හතෙථන ලුංචිතවා ඛාදිතුං වටටති. මුඛනො නීහටං පන යංකිංචි පුන න ඛාදිතුකාමො, තං පතෙත ඨපෙතුං න ලබහ ති. සිඞගිවෙර නාළිකෙර ඛණ්ඩානී ඩසිතවා ඩසිතවා පුන ඨපෙතුං ලබහති. **(සමනතපාසාදිකා 891)**

රෙබු- සප ආදිය සහ බැහැර දමන යම්කිසි ඇට වර්ගයක් හෝ පාත්‍ර යෙන් ගෙන යන්නහුට දුකුලා වේ. පඞික්කමට අත සෝදන්නාක් මෙන් පාත්‍රයට අත සේදීම ද නො කටයුතු ය. අත් පා සේදූ දිය ද පාත්‍රයෙහි බහා බැහැර කරන්නට නො වටී. නො ඉඳුල් පිරිසුදු පාත්‍රය ඉඳුල් අතින් ගන්නට ද නොවටී. වමතින් දිය වත් කොට එක් වතුර පතක් ගෙන (ගණ්ඩූෂ යන වචනය සකු බසින් 'ගණ්ඩූෂ' නම්. a mouthful- handful යන දෙ අරුතම ශබ්ද කොෂයන්හි එන හෙයින් ''දියපතක්'' යි ගැනීම වටී.) බහා ඉඳුල් අතින් ගන්නට වටිනත් එපමණකිනිදු ඒ පාත්‍රය තෙමේ

ඉඳුල් පාත්‍රයක් වන්නේ ය. අත බැහැරි දියෙන් සෝද ගන්නට වටී. මස් මාළු හා කුදු මහත් පල බුදිමින් එහි ඇති ඇට බැහැර ලනු කැමැත්තේ නම් එබඳු ඇට හෝ පාත්‍රයෙහි තබන්නට නො වටී. යමක් නැවත වළඳනු කැමැත්තේ නම් එය පයැ තැබුව ද වරද නැති. ඇට– කටු ආදිය එහි ම තබා අතින් ගලවා ගෙන කන්නට වටී. කටින් බැහැර කරන ලද්දක් නැවත නො බුදිය යුතු සි. එය පාත්‍රයෙහි තබන්නට ද නො වටී. ඉඟුරු හෝ පොල් කැබලි ඩැහැ ඩැහැ පාත්‍රයෙහි තබන්නට වටී.

යම් කිසිවකු පාත්‍රයෙක්හි නො වැ පලංගම් ආදියකැ හෝ බුදින විට ද ඒ භාජනයෙහි ද රෙඩු– සප ආදිය තැබීම් එහි ම අත සේදීම් ඈ මෙකී සියල්ල නො කැප බව සැලකුව මනා ය. (මේ ගැන **විමතිවිනොදනී ටීකායෙහි 459 වන පිටුව** ද බැලිය යුතු.)

**115 පත්තහත්ථො කවාටං න පණාමයෙ**

මෙහි පාත්‍රය ගත් අත් ඇති ව දොරවල් හෝ ජනෙල් නො හැරිය යුතුය සි ප්‍රකාශිත සි. පාත්‍රය යම් කිසි ශරීරාවයවයෙක්හි තබා ගෙන අත්–පා–හිස– කය යන යම් කවර හෝ ශරීරාවයවයකින් දොරක් හෝ ජනේලයක් හෝ ඇරීම්– වැසීම් කරන්නට ත් සටිකාවක්– දොර පොල්ලක් ඔස වන්නට ත් ඉද්දක් පන්නා දැමීමට ත් යනාදි කිසිවක් නො කට යුත්තේ ය සි මෙයින් ප්‍රකාශිත සි. පාත්‍රය නො වැටෙන සේ අංශකූටයෙහි එල්ලා ගෙන නම් මෙකී යමක් කළාට වරද නැත. "පත්තහත්ථස්ස කවාට පණාම තෙ පන එකං දුස්සසාණිද්වාරමෙව අනාපත්ති කරං, අවසෙසානි පණාමෙන්තස්ස ආපත්ති" (**සමන්තපාසාදිකා 202**) පාත්‍රය අත්හි තබාගෙන රෙදි දොර (තිරය) පමණක් විවෘත කළ හැකි ය. සෙසු කවර දොරක් ඇරිය ද ඇවැත් වේ.

**76 භූමි ආධාරකෙ දරු–දණ්ඩාධාරෙසු සජ්ජිතෙ**
**ද්වෙ පත්තෙ ඨපයෙය්‍යෙකං–නිකුජ්ජිත්වාන භූමියං.**

හොඳින් සවිය ඇතිව සැදූ බිම්වළල්ලෙහි ද එක් දණ්ඩකින් කළ දැව දරණුවෙහි ද බොහෝ දණ්ඩෙන් කළ දරණුවෙහි ද පයක් මතැ පයක් තබන්නේ ය. කළාල අතුළ බිමැ යටිකුරු කොට හෝ උඩුකුරු කොට හෝ එක පාත්‍රයක් තබන්නේ ය.

**116 භූමි ආධාරකෙ**

ඇත්දත් ඈ දත්වලින් හෝ වේවැල් ඈ වැල්වලින් හෝ කළ දරණුව මෙයින් ගැනේ.

**අකැප පා දක්වත් දරුරූපියාදීන්.**

**77 දරු රූපිය සොවණ්ණ–මණිවෙළුරියාමයා**
**කංස කාච තිපු සීස–ඵලිකා තම්බලොහජා.**

දැවමුවා රිදීමුවා රන්මුවා ඉඳුනිල් ඈ මිණිමුවා වෙරළුමිණිමුවා පා ද කස්ලෝ වීදුරු කළුඊයන් සුදුඊයන් පළිඟු තඹ ලොහො යන මේවායින් කළ පාත්‍ර ද

78 **ඡවසීසමයොවාපි-සබ්බතුම්බ කටාහජා**
**පත්තා අකප්පියා සබ්බෙ-වුත්තා දුක්කට වත්ථුකා'ති.**

මිනිස් කබල් මුවා පාත්‍ර ද කළ කබල් ලබුකබල් මය පාත්‍ර ද යන සියලු පාත්‍රයෝ ම අකැපයහ. දුකුළා වත්හුය සි කියන ලද්දහ.

**විස්තර**

10 මේ දෙගාථායෙන් අකැප පාත්‍රයෝ ප්‍රකාශිතයහ. යම්කිසි ගිහි කෙනෙක් රන්තැටි ආදියකැ ව්‍යඤ්ජන බහා එළවත් නම් එය ආමසනය කිරීමට ද නො හැකි ය. එළිකමය කාචමය කංසමය තැටි ආදි බඳුන් පෞද්ගලික පරිභොගයෙන් පරිභොග කිරීමට ඉඩක් නැත. සංඝික පරි භොගයෙන් පරිභොග කළ වරද නැති. ගිහි විකට (ගිහියන් අයත්) වූ එළිකාදිය වටීය සි **කුරුන්දිඅට්ඨකථායෙහි** ප්‍රකාශ වේ. තඹ ලොහොමය පාත්‍රය නොවටිතුදු තඹලොහො තළිය වටී.

---

## 6 ථාලකාවා'ති

79 **කප්පියා ථාලකා තිස්සො-තම්බායො මත්තිකාමයා**
**දාරු සොවණ්ණ රජත-මණි වෙළුරියාමයා**

80 **අකප්පා ඵලිකා කාච-කංසජා ගිහි සන්තකා**
**සංඝිකා කප්පියා තුම්බ-සවිජා තාවකාලිකා'ති**

තඹමුවාය ලොහොමුවාය මැටිමුවාය කියා කැප තළි තුනකි. දැවමුවා රන්මුවා රිදීමුවා ඉඳුනිල් ඈ මිණිමුවා වෙරළුමිණිමුවා තළි අකැපයහ. පළිඟු යෙන් ද කාදයෙන් ද කස්ලොහොයෙන් ද කළ තළි ගිහින් සතු වූවාහු ද සඟසතු වූවාහු ද කැපයෝ සි. ලබුයෙන් කලයෙන් කළ තළි තාවකාලිකව පරිභොගයට කැපයහ.

---

## 7 පවාරණා'ති

81 **යෙනිරියා පථෙනා'යං-භුඤ්ජමානො පවාරිතො**
**තතො අඤ්ඤෙන භුඤ්ජෙය්‍ය-පාචිත්‍ය'නතිරිත්තකං.**

මේ මහණතෙමේ යම් ඉරියව්වකින් වළඳන්නේ ළඟට ගෙනා භොජ නය පවාරණය කෙළේ ද ඒ ඉරියව්ව හැර අන් ඉරියව්වකින් අයිරිත් නො කළ භොජනයක් වළඳූ නම් පචිති ඇවැත් වේ.

**විස්තර**

11 ඔදන කුම්මාස, සත්තු, මච්ඡ, මංස, යන පඤ්ච භොජනයෙන් එක් භොජනයක් කුස තණ'ගින් ගත හැකි පමණකුදු වළඳූ ප්‍රතික්ෂෙප කොට නැවත ‘කප්පියං කතං’’ ආදි සප්තවිධ විනය කර්මාකාරයෙන් කැප කළ භොජනයක් හෝ ගිලානාතිරික්ත භොජනයක් හෝ හැර වෙන භොජ

නයක් වළඳ නම් මෙහි ප්‍රකාශිත පචිත්තිය වේ. මේ ශික්ෂාපදයාගේ නිදානය දැනගත් විට ශික්ෂාපදයෙන් පැවැසෙන කාරණය පහසුවෙන් දැනැගත හැකි ය.

එක්තරා බමුණෙක් භික්ෂූන් ඇරියුම් කොට වැළඳ වීය. එහි බත් කිස කළ භික්ෂූහු ඤාතිකුලයනට ගොස් නැවත වැළඳූහ. ඇතැම් කෙනෙක් පිණ්ඩපාතය ගෙන ගියහ. ඒ බ්‍රාහ්මණ තෙමේ අසල් වැසියනට ත් ආහාර සඬග්‍රහ කරන්නට අඩ ගැසුවේ ය. එවිට අසල්වැස්සෝ "නුඹ අපට කෙසේ නම් ආහාර දෙන්නට හැක්කෙහි ද? නුඹේ ගෙහි වැළඳූ භික්ෂූහු ත් නැවැත අපේ ගෙවලැ වැළැඳූහ"යි කීහ. ඒ ඇසූ බ්‍රාහ්මණ තෙමේ භික්ෂූන්හට දොෂාරොපණය කෙළේ ය. එයැසූ තථාගතයන් වහන්සේ "යො පන භික්ඛු භුත්තාවි පවාරිතො ඛාදනියං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තිය න්ති" යි පණවා වදාළ සේක.

නැවත භික්ෂූහු ගිලන් භික්ෂූනට පිණ්ඩපාතය ගෙන යති. ගිලන්නු ඒවා සියල්ල නො වළඳන හෙයින් ඉතුරු බොජුන් අහක දමති. ගිලානාතිරිත්තයෙහි ලොල් වූ කවුඩන් ආදීන් ගේ ශබ්දය ඇසූ තථාගතයන් වහන්සේ "කිමදැ"යි විචාරා වදාළෙන් "ගිලානාතිරිත්තය භික්ෂූහු නො වළඳත් ය"යි අසා "අනතිරිත්තං" යන අනුප්‍රඥප්තියක් පණවා වදාළ සේක.

## 117 භුඤ්ජමානො

ඔදනාදි පඤ්ච භොජනයන් අතුරෙන් යම්කිසි භොජනයක් කුස තණ'ගින් ගතහැකි පමණ හෝ වැළඳුවේ නම් භුඤ්ජමානො (වළඳන්නේ) නම්.

## 118 පවාරිතො

ප්‍රතික්ෂෙප කරන ලද්දේ යනු යි. යම්කිසි භික්ෂුවක් වළඳන කල්හි වළඳවන්නා විසින් ගෙනෙන ලද භොජනයක් වළඳන්නට නො කැමැත්තෙන් කයින් හෝ වචනයෙන් හෝ ප්‍රතික්ෂෙප කෙරේ නම් ඒ භොජනය ඔහු විසින් පවාරිත යි. එසේ පවාරිත කළ පමණින් ම මෙහි දැක්වෙන ප්‍රතික්ෂෙපය නො වන්නේ ය. "අසනං පඤ්ඤායති" ආදි අඞ්ග පසින් සමන්විත ප්‍රතික්ෂෙපය ම මෙතැන්හි පවාරිත සංඛ්‍යාවට වැටේ. ඒ අඞ්ග පස අනතුරු ගාථායෙන් පැවැසේ.

## 119 අනතිරිත්තකං

යනු වැඩි– ඉතුරු නො වූ ආහාරය යි. "කප්පියං කතං පටිග්ගහිතං කතං, උච්චාරිතං කතං, හත්ථපාසෙ ඨිතං කතං, භුත්තාවිනා කතං, භුත්තාවිනා පවාරිතෙන ආසනා අවුට්ඨිතෙන කතං, අලමෙතං සබ්බන්ති වුත්තන්ති කතං" යන සප්තප්‍රකාර විනයකර්මාකාර වලින් කැප කරන ලද යම් භොජනයක් වේ නම්, එයත් ගිලනකු විසින් ඉතුරු කළ යම් භොජනයක් වේ නම, එයත්; යන විප්‍රකාර භොජනය ම "අතිරිත්ත" නම් වේ. අතිරිත්ත නො වූ භොජනය "අනතිරිත්ත" නම්.

ගිලානාතිරිත්තය නම්: ගිලන් භික්ෂුව වළඳා ඉතුරු කළ ආහාරය සහ ගිලන් භික්ෂුව වෙනුවෙන් ගෙනැත් තැබූ ආහාරය යි.

82 **අසනං භොජනඤ්චෙව-අභිහාරො සමීපතා**
**කායවාචා පටික්ඛෙපො-පඤ්ච අඞ්ගා පවාරණා.**

පවාරණා තොමෝ වැළඳීම ද පවාරණ ජනක වූ භොජනයක් ඇති බව ද, කයින් එළවීම ද, අත්පස බව ද, කයින් හෝ වචනයෙන් හෝ ප්‍රතික්ෂෙපය ද කියා පඤ්චාඞ්ගයෙන් යුක්තීය.

119 (1) **අසනං**

මෙයින් වළඳා අවසන් නො වූ පුද්ගලයෙක් කියැවෙන්නේ ය.

120 (2) **භොජනං**

ඔදනාදි පඤ්චවිධ භොජනයන් අතුරෙන් එකක් හෝ වැඩි ගණනක් පාත්‍රයෙහි හෝ මුඛයෙහි හෝ තිබේ නම් එසේ වූ භොජනයක් ද ඇති බව යි.

ඔදන, කුම්මාස, සත්තු, මච්ඡ, මංස, යන මේ භොජන අතුරෙන් එකක් හෝ වැඩියක් වැළඳීම "අසනං" යන්නට ත්, ඒ පඤ්ච භොජනයෙන් එකක් හෝ වැඩියක් සෙස වැ තිබීම "භොජනං" යන්නට ත් ගැනේ.

121 (3) **අභිහාරො**

පෙර කී භොජන අතුරෙන් එකක් හෝ වැඩියක් භික්ෂුවට පිළිගැන්වීම පිණිස කයින් එළවීම ම ගැනේ.

122 (4) **සමීපතා**

දෙරියන් හමාරක අත් පස ඇති බව යි. භික්ෂුව හුන්නේ නම් ආසනයේ පශ්චිමාන්තයේ සිට ත්, සිටියේ නම් විළුඹේ කෙළවර සිට ත්, හොත්තේ නම් පාරිමන්තයේ සිට ත් දායකයා ගේ ප්‍රසාරිත හස්තය හැර ආසන්නතර වූ යම් අඞ්ගයක් වේ නම් ඒ අඞ්ගයා ගේ ඔරිමාන්තයෙන් පිරිසිඳ දායක ප්‍රතිග්‍රාහක දෙපක්ෂය අතර යටත් පිරිසෙයින් දෙරියන් හමාරක් වත් තිබේ නම් එවිට අත්පස ඇත්තේ ය.

123 (5) **පටික්ඛෙපො**

ප්‍රතිග්‍රාහක භික්ෂුතෙමේ ළඟට ගෙනා භොජනය කයින් හෝ වචනයෙන් කරන ප්‍රතික්ෂෙපය යි. මේ පස සම්පූර්ණවූයේ පැවැරි දතවයි.

වත්මන්හි මේ ශික්ෂාපදය ව්‍යතික්‍රම කිරීමෙන් ඇවැත් අවදින්නෝ බොහෝ වෙති. හිල්දනය වළඳද්දී පවාරණය විණි නම්, ඉන්පසු එම අසුනෙන් නැගිට ගොස් අනතිරිකත ආහාරයක් වැළැඳිය නොහැක. දවල් දනයේ දී පවාරණය වූවද අසුනෙන් නැගිට නැවැත වැළැඳීමක් නැති නිසා ඇවැත් නොවේ. පූර්වෝක්ත පඤ්ච භොජනයෙන් එකක් වළඳමින් සිටින විට අත්පසට ගෙනෙන ලද භොජනය ප්‍රතික්ෂෙප කිරීම මීට හේතුවයි.

තමහට වුවමනා තැත් තම් ඊළඟ භික්ෂුවට බෙදන ලෙස සංඥ කිරීමෙන් මේ ඇවතෙන් මිදිය හැකිය යි කියතුදු එය නො යෙදේ. බෙදීමට බත් ගෙනා කල්හි පවුරුණු විසින් "දමව දමව, කොට කොටා පුරවව"යි කියන් නාට පවාරණය නොවන බව මහා පදුම තෙරණුවෝ කියති.

83 ඔදනො සත්තු කුම්මාසො-මච්ඡො මංසඤ්ච භොජනං
සාලි විහි ච යවො කඞ්ගු-කුද්‍රූසවරකා ගොධූමො

84 සත්තන්නමෙසං ධඤ්ඤානං-ඔදනො භොජ්ජයාගු ච
සාමාකාදි තිණං කුද්‍රූ-සකො වරකා චොරකො
වරකො සාලියඤ්චව-නීවාරො සඞ්ගහඞ්ගතො.

බත් ද බඩාබඩ සත්තු ද (අග්ගලා සහ අක්සුණු ද) කොමුදු දියමස් ද ගොඩ මස් ද යන මේ පස භොජන නම් වේ. හැල් ය, සෙසු වී ය, යවය, තණ ය, හමු ය, හෙළවරු ය, ගොධූම ය, යන මෙ සප්තවිධ ධාන්‍යයන් සම්බන්ධ වූ බත් ද, බොල් හඹු ද ඕදන නමි. ගෝඩහඹු ආදි තෘණ ධාන්‍යය හමුයෙහි අන්තර්ගත වූයේ, සිහිත්වරු හෙළවරුයෙහි අන්තර්ගත වූයේ, හුරුහැල් හැල්හි ම අන්තර්ගත වූයේ යි.

124 ඔදනො

සප්තවිධ ධාන්‍යයෙන් හා හුරු හැල්, ගොඩහඹු, වරුදෙරිය යන අනුලොම ධාන්‍යයෙනුදු කැඳ වශයෙන් හෝ බත් වශයෙන් හෝ යම් කිසිවක් පිසූවිට එය ගත් ගත් තැනින් අඩු වැ පෙනේ නම්, එය "ඔදන" නමි. මෙ බඳු ඔදනය පවාරණය වෙයි. ගත් තැනින් අඩුව නො පෙනේ නම් එය පවාරණය සිදු නො කර යි

අයාගුක නිමන්ත්‍රණයෙහි ' කැඳ දෙමැ'' යි කියා බතෙහි දිය කැඳ කිරි ආදිය වත්කොට "කැඳ ගනු මැනවැ" යි දෙත් ද එය තුනී (දියාරු) වූයේ නමුත් පවාරණය සිදු කිරීමේ සමත් ය. ඒ බත ම පැසුණු දියෙහි බහා කකාරවා දෙයි නම් එය පවාරණය වීමට අපොහොසත් වන්නේ ය. කැඳ සංඛ්‍යාවෙහි ඇතුළත් හෙයිනි. කැඳෙහි ද අබැටක් පමණ වත් මාළු මස් බහා දේ නම් පවාරණය වීමෙහි පොහොසත් වේ.

අල හෝ ගෙඩි වශීයෙන් කළ ආහාරය පවාරණය වීමට නො පොහොසති.

125 සත්තු

අනුලොම් ධාන්‍ය සහිත සප්තවිධ ධාන්‍යයන් බැද ගන්නා ලද පිටි (අබඩසත්තු) ද බඩසත්තු (අග්ගලා) ද කියා සත්තු පද පරිදි ය.

126 කුම්මාසො

යවයෙන් කළ කොමු යි. මීට තලප විශෙෂයෙකැයි ද රොටිය පිට්ටුව යන අරුත් ද කියත්.

127 භොජ්ජයාගු

ඝන කැඳ යි. බොන්නට නො පිළිවන් වූ හෙයින් අතින් හෝ සැඳි ආදියකින් ගෙන බුදීමට යොග්‍ය හෙයින් මේ නම්.

85 **භට්ඨධඤ්ඤමයො සත්තු-කුම්මාසො යවසම්භවො**
**මංසො ච කප්පියො වුත්තො-මච්ඡො උදකසම්භවො.**

කරකොට බැදි ධාන්‍යයන් ගේ තණ්ඩුලයෙන් කරන ලද්දේ සත්තු නම්. යවයෙන් වූයේ කුම්මාස නම්. මස් වනාහි "කැප මසැ"යි කියන ලද මස් ය. දියෙහි උපන්නේ මච්ඡ නම්.

86 **භුඤ්ජන්තො භොජනං කප්ප-මකප්පං වා නිසෙධයං**
**[1]පවාරෙය්‍යා'භිහටං කප්පං-තන්නාමෙන ඉමන්ති වා**

කැප හෝ අකැප හෝ පවාරණ ජනක භොජනයක් වළඳන මහණ ඒ ඔදනාදීන් ගේ නමින් හෝ මේ ගන්ව යි සාමාන්‍ය කොට හෝ කියා කයින් එළවන ලද්දේ, කැප භොජනයක් ම කයින් හෝ වචනයෙන් හෝ වළකන්නේ පැවැරි අවදනේ ය.

**විස්තර**

12 මෙයින් කැප භොජනයක් ප්‍රතික්ෂේප කිරීමෙන් ම පැවැරි අවදනා බව ප්‍රකාශිත යි. "කැප මසක් බුදිමින් සිටියේ අකැප මසක් ප්‍රතික්ෂේප කෙරේ නම් පවාරණය නොවෙයි. කුමක් නිසාද?, වස්තු නොවන හෙයිනි. අකැප මසක් බුදිමින් සිටියේ කැප මසක් පිළිකෙව් කෙරේ නම් පවාරණය වන්නේ ය. කුමක් නිසාද?, වස්තු හෙයිනි." යනු **සමන්ත පාසාදිකා යි.** (606)

### පවාරණය නොවන ආහාර

87 **ලාජතස්සත්තු භත්තාදි-ගොරසො සුද්ධ ඛජ්ජකො**
**තණ්ඩුලා භට්ඨ පිට්ඨඛජ්ජ-පුථුකා වෙළු ආදිනං**

88 **භත්තං භුත්තාවසෙසානං-රසයාගු රසො'පිච**
**සුධයාගු ඵලාදීනි-න ජනෙති පවාරණං.**

විළඳ ද, ඒ විළඳින් කළ හත් හා බත් ද, පස්ගෝරස ද, බොජුන් හා නුමුසු වූ කන දෑ ද, බැදි නො බැදි (සම්පාක) සාල් ද, බැදි පිටි ද, පුළුද (හබලපෙති ද) කියන ලද ධාන්‍යයෙන් අවශෙෂ වූ හුණ තල් ආදීන් ගේ තණ්ඩුලාදියෙන් කළ බත් ද, මස් නැති රසයෙන් පිසූ කැඳ ද, මස් නැති හුදු රස ද, මංසාදිය හා නොමුසු වූ කැඳ ද, පලාදිය ද, පවාරණය නූපදවයි.

128 **ලාජ**

සාලි ආදියෙන් කළ පොරි යි.

129 **තස්සත්තුභත්තාදි**

සාලි ආදි ලාජයෙන් කළ හත්- අක්සුණු, අඟලා සහ බත් ද, මෙයින් ගැනේ.

130 **ගොරසො**

ඝනු කිරි දී මෝරු ගිතෙල් වෙඬරු යන පස්ගෝරසය යි.

---

1 වාරිතොභිහටං ඉං:- බු

131 **වෙළුආදිනං**

මෙහි ආදි ශබ්දයෙන් අල මූල් ආදිය ගන්නේ ය.

89 **පවාරිතෙන වුට්ඨාය-අභුත්තෙන ච භොජනං**
**අතිරිත්තං න කාතබ්බං-යෙන යං වා පුරෙ කතං.**

පැවැරි අවන්හු විසින් ද, බොජුන් නො වැළඳූ මහණ විසින් ද පළමු කැප කළහු විසින් ද අසුනෙන් නැඟිට අයිරිත් නො කළ යුතු යි.

**විස්තර**

13 පවාරණය වී නැවත කැප කරවා ගෙන වළඳනවිට පැවැරි අවන්හු විසින් හෝ මඳක් වත් නො වැළඳුවහු විසින් හෝ පළමු කැප කළහු විසින් හෝ අයිරිත් නො කළයුතු බව මෙයින් ප්‍රකාශිත යි.

90 **කප්පියං ගහිතඤ්චෙව-වුච්චාරිතං හත්ථපාසගං**
**අතිරිත්තං කරොන්තෙනවං-"අලමෙතන්ති" භාසතු.**

කැප වූ ද, තමා විසින් පිළිගත්තා වූ ද, මඳකුදු ඔසවා හෝ බහා හෝ පාතාලද්දා වූ ද, දෙරියන් වියත් අත්පසට එළවන ලද්දා වූ ද; යාවකාලිකය කැපකරන මහණ "**අලමෙතං සබ්බං**" යී කියා වා.

**විස්තර**

14 මෙයින් අයිරිත් කිරීමෙහි අඞ්ග සතරක් ප්‍රකාශ කරන ලදි. කැප වූ ආහාරයක් වීම, තමා පිළිගන්නා ලද්දක් වීම, ඔසවා හෝ බහා හෝ පෙන්වීම, අත්පසට එළවීම යන සිවුඅඟ පිරීමෙන් කැපකරනු ලබන්නා "අලමෙතං සබ්බං"යී කීමෙන් අයිරිත් කළා වන්නේ ය. එයින් එක බත් ඇටයක් ගත ද අයිරිත් කළා වේ.

132 **කප්පියං**

ඉඟුරු ලූණු ආදිය කැප කළ හෙයින් ද, අකැප මස් නොමැති හෙයින් ද, කුල දූෂණාදියෙන් නූපන් බැවිනුදු පවාරණය වූ ආහාරය හැම අතින්ම කැප හෙයින් "කප්පියං"යී යෙදූහ.

91 **න කරෙනුපසම්පන්න-හත්ථගං පෙසයිත්ව'පි**
**කාරෙතුං ලබ්භතෙ සබ්බො-භුඤ්ජිතුං තමකාරකොති.**

අනුප සපනක්හු ගේ අතැ තුබුවා කැප නො කරන්නේය. අතිකක්හු අත යවා ද කැප කරවන්නට වටි. ඒ කැප කළ භොජනය පැවැරි අවන් නො අවන් සියලු දෙනා ම වළඳන්නට ලබයි.

මේ අනතිරිත්ත සිකපදයෙහි තවත් විස්තර දනු කැමැත්තන් විසින් **සමන්තපාසාදිකාවෙහි 604 පිටුවේ සිට 612 දක්වාද, මාතිකාට්ඨකථායෙහි 105 සිට 109 දක්වාද, විනය විනිශ්චයෙහි 1240 වන ගාථාවේ සිට 1313 තෙක්ද කියවා දතයුතු යි.**

දන් බෙදන දායක පින්වතා පළමුවෙන් බෙදන දෙය භික්ෂුවට පෙන්නා බෙදූ නම්, එය ඒ භික්ෂුව නො කැමැති කල්හි ප්‍රතික්ෂේප කළ හැකි ය. එවිට මේ ඇවැතින් මිදිය හැකිය. එකවරට ම පාත්‍රයට බහන්නට සූදනම් වීම නිසා තමනට අනවශ්‍ය දෙයක් ද? නැද්ද? යනු තීරණය කැර ගන්නට ත් බැරි ය. මෙබඳු විනය ශික්ෂාපද දායකයනට ඉගැන්වීම වටී.

---

## 8 කාලිකාවා'ති

92 **පටිග්ගහිතා චත්තාරො-කාලිකා යාවකාලිකං**
**යාමකාලිකා සත්තාහ-කාලිකං යාවජීවිකං.**

පිළිගත්තාලද කාලිකයෝ යාවකාලිකය යාමකාලිකය සත්තාහ කාලිකය යාවජීවිකය යි සතර දෙනෙක් වෙත්.

**විස්තර**

15 ඒ ඒ කාලාභ්‍යන්තරයෙහි වැළඳිය යුතු හෙයින් ඛජ්ජ භොජ්ජ ලෙය්‍ය පෙය්‍යයෝ කාලිකයෝ වෙති. ප්‍රධාන වශයෙන් ඒ කාලිකයෝ සිව් දෙනෙක් වෙති. පිළිගැනීමෙන් ම කාලික ව්‍යවහාරයට අන්තර්ගත වන හෙයින් "**පටිග්ගහිතා**" යී කීහු.

93 **පිට්ඨං මූලං ඵලං ඛජ්ජං-ගොරසො ධඤ්ඤ භොජනං**
**යාගු සූපප්පභූතයො-හොනෙන්'තෙ යාවකාලිකා.**

පිටි- මුල්- පල යන මෙයින් කළ කෑ දෑ ද, ගෝරස ද සප්තවිධ ධාන්‍ය හා පඤ්චවිධ භොජනය ද, කැඳ ද, සූපාදීහු ද යන (ඒ ඒ දෙශයෙහි පියවින් අහරකිස සපයන) මොහු යාවකාලික නම් වෙත්. (විකාලයෙහි නො බුදිය යුතු යම්තාක් ආහාර ඇත්නම් ඒ සියල්ල ම යාවකාලික යි.)

94 **මධු මුද්දික සාලූක-චොච මොච'ම්බ ජම්බුජං**
**ඵාරුසං නාගයි සන්තානං-පානකං යාමකාලිකං.**

මිදිරසයෙහි දියවත්කොට කළ පැන් ය, මිදි දියෙන් මැඩ කළ පැන් ය, රතොනුප්පලාදි ගෙඩි මිරිකා කළ පැන් ය, ඇට කෙසෙල් මිරිකා කළ පැන් ය, මස් කෙසෙල් මිරිකා කළ පැන් ය, අඹ මිරිකා කළ පැන් ය, දඹ මිරිකා කළ ජම්බුජ පැන් ය, උගුරැස්ස පැන් ය යන මෙයින් වූ අෂ්ටවිධ පානය ගින්නෙන් හුණු නො කරන ලද්දේ යාමකාලික වේ.

**විස්තර**

16 මේ අෂ්ටපානයෙන් කවරක් හෝ තමා විසින් ම කරන ලද නම් පෙරවරුවෙහි ම සාමිෂව ත් නිරාමිෂව ත් වටී. අනුපසපනුන් විසින් කරන ලද පානයක් නම් පෙරවරුවෙහි පිළිගෙන පෙරවරුවෙහි සාමිෂවත් වටී. පශ්චරුවෙහි වනාහි නිරාමිසව ම වටී.

"මධුපානං නාම මධුකානං ජාතිරසෙන කතපානං, තං පන උදකසම්භින්නං වට්ටති; සුද්ධං න වට්ටති (**සමන්තපාසාදිකා 817**) යී ප්‍රකාශිත හෙයින් මධු පානය නම් පැන් මුසු කළ මීපැනි බව පෙනේ. එය වඩා යොග්‍යය යි හැගේ. **බුද්ධසික්ඛා ටීකායෙහි** පෙනෙන්නේ මිදි බව යි.

95 **සානුලොමානි ධඤ්ඤානි-ඨපෙත්වා ඵලජො රසො**
**මධූකපුප්ඵා අඤ්ඤත්‍ර-සබ්බො පුප්ඵරසො'පි ච**

96 **සබ්බ පත්ත රසො චෙව-ඨපෙත්වා පක්කඩාකජං**
**සීතොදමද්දිතො'දිච්ච-පාකො වා යාමකාලිකො.**

අනුලෝම් සහිත වූ ධාන්‍යයන් තබා සෙසු ඵලජ රසය ද, මීපුප් හැර සියලු මල් රස ද, ඉදූ පළා රස හැර සියලු පත්‍රයන් ගේ රස ද, සිහිල් දියෙන් මඩනා ලද්දේ අව්වෙහි තබා උණු කරන ලද්දේ හෝ නො කරන ලද්දේ හෝ යාමකාලික යි.

133 **සානුලොමානි**

අනුලෝම් සහිත යනු යි. "තාල- නාළිකෙර- පනස- ලබුජ- අලාපු- කුම්භණ්ඩ- පුස්සඵල- තිපුස- එළාලුකානි"යි දක් වූ නවමහා ඵල ද; උඳු, මුං, තල, කලත්, ඈ අපරණ්ණ ද, සප්තවිධ ධාන්‍යයට අනුලෝම් හෙයින් "**සානුලොමානි**" යි වෙසෙසූහ.

අනුලෝම් සහිත වූ ධාන්‍යයන් හැර අවශෙෂ වූ සිනිඹලා- ලප්නාරං- ජුල්- කොසඹ ආදි කුඩා ඵලයෙන් කරන ලද පැන් පස්වරුවෙහි වටී.

97 **සප්පිනොනීත තෙලානි-මධුඵාණිත මෙව ච**
**සත්තාහකාලිකා සප්පි-යෙසං මංසමවාරිතං.**

ගිතෙල්- වෙඬරු- තලතෙල් ඈ තෙල්-, මී- උක්සකුරු යන මේ පස සත්තාහකාලිකයෝ යි. එහි කී ගිතෙල් නම් යම් සත්ත්වයකු ගේ මස් කෑම නො වළක්වන ලද නම් ඔවුන්ගේ ගිතෙල් ය.

98 **තෙලං තිලවසෙරණ්ඩ-මධුසාසප සම්භවං**
**ඛුද්ද භමර මධුකාරි-මක්ඛිකාහි කතම්මධු**
**රසාදි උච්ඡු විකති-පක්කා පක්කා ච ඵාණිතං.**

තලයෙන් ද, වසායෙන් ද, එරඬු ඇටින් ද, මීකියෙලින් ද, අබයෙන්ද ලබාගත්තේ තෙල් නමි. කනමීමැසි හමරමැසි දඬුවැල්බැමැසි යන මොවුන් කරන ලද්දේ මී නමි. නකාරණ ලද හෝ නො නකාරණ ලද හෝ උක් පැන් ආදි වූ ඉක්ෂු විකෘති තෙමෝ ඵාණිත- සකුරු නමි.

99 **සවත්ථු පක්කා සාමං වා-වසා කාලෙ අමානුසා**
**අඤ්ඤෙසං න පචෙ වත්ථුං-යාවකාලික වත්ථුතං.**

මනුෂ්‍ය වසායෙන් අන්‍ය වූ ගොමහිෂාදීන් ගේ වසා තොමෝ පෙරවරුවෙහි තමා විසින් වස්තුව හා එක් කොට පිසහරණ ලද්දේ සත් දින කට වටී. යාවකාලික වස්තු කොට ඇති, වසා තෛලයෙන් අන්‍ය වූ, ගිතෙල් ආදීන් ගේ ක්ෂීරාදි වස්තුව නො පිසන්නේ ය.

(මෙයින් ඒ ඒ වසා තෙල් සාදන්නට බලාපොරොත්තු වන විට ඒ මස් ආදිය පිස එයින් පෙරා ගත් වසා තෛලය ගැනේ.)

134 වසා

යනු වුරුණු තෙලයි. 'අනුජානාමි භික්ඛවෙ පඤ්ච වසානි: අච්ඡවසං මච්ඡවසං සුසුකාවසං සූකරවසං ගද්‍රභවසන්ති'' (මහාවග්ගපාළි 235) යී මෙසේ අනුදත් වසාතෙල් ගැනේ. ''එත්ථ ච අච්ඡවසන්ති වචනෙන ඨපෙත්වා මනුස්සවසං සබ්බෙසං අකප්පිය මංසානං වසා අනුඤ්ඤාතා'' යී සමන්තපාසාදිකා 518 වන පිටුවේ දැක්වූයෙන් වසා තෙලින් අකැප වනුයේ මිනිස් වසා පමණි.

100 හලිද්දිං සිඞ්ගි වෙරඤ්ච-වචත්ථං ලසුනං වචා
උසීරං හද්දමුත්තඤ්ච-තිවිසා කටුකරොහිණී
පඤ්චමූලාදි කඤ්චාපි-මූලන්තං යාවජීවිකං.

කහ ද, ඉඟුරු ද, හෙළවදකහ ද, සුදුලූණු ද, වදකහ ද, සුවඳ හොට ද, කලාඳුරු ද, අතිවිඩයං ද, කටුකරොසන ද, සුලුපස්මුල්-මහපස්මුල් ආදිය ද යන ඒ සියලු මුල් යාවජීවික යි.

විස්තර

17 මේ ගාථායෙන් මූල් බෙහෙත් ප්‍රකාශිත යි. මෙහි නො දැක් වූ ආහාර කෘත්‍යයට නො පිරිමැසෙන්නා වූ තවත් ඇතිනාක් මූල් බෙහෙත් යාවජීවික යි. ''අනුජානාමි භික්ඛවෙ මූලානි භෙසජ්ජානි හලිද්දිං සිඞ්ගි වෙරං වචං වචත්ථං අතිවිසං කටුකරොහිණිං උසීරං හද්දමුත්තකං, යානි වා පනඤ්ඤානිපි අත්ථි මූලානි භෙසජ්ජානි නෙව ඛාදනීයෙ ඛාදනීයත්ථං ඵරන්ති න භොජනීයෙ භොජනීයත්ථං ඵරන්ති, තානි පටිග්ගහෙත්වා යාවජීවං පරිභුඤ්ජිතුං'' (මහාවග්ගපාළියී 235.)

101 බිලඞ්ගං මරිචං ගොට්ඨ-ඵලං පිප්ඵලිරාජිකා
තිඵලෙරණ්ඩකාදීනං-ඵලන්තං යාවජීවිකං

වලඟසාල් ද, මිරිස් ද, කුකුරුමුවන් ද, වගපුල් ද, දුරු තොහොත් අබ ද, අරළු, බුළු, නෙල්ලි යන තෙවග ද, එරඬු ආදීන්ගේ පල ද යන සියල්ල යාවජීවික යි.

විස්තර

18 මෙයින් පල බෙහෙත් ප්‍රකාශිත යි. මෙහි නො දැක් වූවා වූ ආහාර කෘත්‍යය පිණිස උපයෝගී නො වන්නා වූ වෙන ත් ඵල වගී ඇත් නම් ඒ සියල්ල ම ත් පල බෙහෙත් වශයෙන් යාවජීවික ව පරිභොගයට සුදුසු වේ.

102 කප්පාස නිම්බකුටජ-පටොල සුලසාදිනං
සූපෙය්‍ය පණ්ණං වජ්ජෙත්වා-පණ්ණන්තං යාවජීවිකං.

සූපයට යොග්‍ය වූ පලා හැර, කපු ය, කොසඹ ය, කෙළිඳ ය, දුම්මැල්ල ය, තලා ය, යනාදීන් ගේ ඒ සියලු කොළ යාවජීවික යි.

**විස්තර**

19 මෙයින් කොළ බෙහෙත් පැවසේ. සෙසු බෙහෙත් මෙන් ම ආහාරාර්ථය සිදු නො කරන්නා වූ වෙන ත් කොළ වර්ග යාවජ්ජීවිකා ය.

103 [1]**එපෙත්වා උච්ඡුං නියෲාසං-සරසං උච්ඡුජං තවං**
**නියෲාසො ච තචො සබ්බා-ලොණං ලොහං සිලා තථා.**

උක් ලහටු ද, රස සහිත වූ උක් පොතු ද හැර සියලු ලහටු ද, සුඹුළු ද, ලුණු ද, ලොහො ද, ගල් ද, එසේ ම යාවජ්ජීවිකා යි.

**විස්තර**

20 මෙයින් යාවජ්ජීවික වශයෙන් පරිභොග කටයුතු වූ සෙසු ත් බෙහෙත් ප්‍රකාශිත යි. ඉක්ෂු නියර්‍යාසය යාවජ්ජීවික ගණයෙන් වෙන්කොට දක්වූයේ සත්තාහ කාලික ද්‍රව්‍යයක් හෙයිනි. "අනුජානාමි භික්ඛවෙ ජතූනි භෙසජ්ජානි හිඞ්ගු හිඞ්ගුජතු හිඞ්ගුසිපාටිකං තකං තක්කපත්තිං තක්කපණ්ණිං සජ්ජුලසං යානි වා පනඤ්ඤානිපි අත්ථි ජතූනි භෙසජ්ජානි නෙව ඛාදනියෙ ඛාදනියත්ථං ඵරන්ති -පෙ- "යාවජීවං පරිහරිතුං" (**මහාවග්ග පාලි 236** පිටුව) යී වදාළ පාඨයෙන් විස්තර වන්නා වූ නියර්‍යාස වර්ග සියල්ල ම මීට ගත යුතු යි.

තව (සුඹුළු) අතුරෙන් රස (පැනි) සහිත උක් සුඹුල් පමණක් යාවකාලික ය. සෙසු සියලු සුඹුළු ම යාවජ්ජීවිකා යි. මේ ගොඩෙතිලා ම කසට බෙහෙත් ද ගතයුතු ය. "අනුජානාමි භික්ඛවෙ කසාවානි භෙසජ්ජානි නිම්බකසාවං කුටජකසාවං පටොලකසාවං පග්ගවකසාවං නත්තමාලකසාවං යානි වා පනඤ්ඤානිපි අත්ථි කසාවානි භෙසජ්ජානි නෙව ඛාදනියෙ -පෙ- යාවජීවං පරිහරිතුං" (**මහාවග්ගපාලි 235.**)

ලුණු බෙහෙත් වශයෙන් "අනුජානාමි භික්ඛවෙ ලොණානි භෙසජ්ජානි සාමුද්දං කාළලොණං සින්ධවං උබ්භිදං බිලාලං යානි වා පනඤ්ඤානිපි අත්ථි ලොණානි භෙසජ්ජානි නෙව -පෙ- යාවජීවං පරිහරිතුං" (**මහාවග්ග පාලි 236** පිටුව) දෙශනා කළ ලුණු වර්ග ගතයුතු. ලොහ වර්ගයේ දී යකඩ තඹ ආදිය ගැනේ. සියලු ලොහවර්ග ම සුදුසු හෙයින් අකැප ලොහ වර්ගයක් නොමැත.

කාළ සිලා ආදි ශිලාවර්ග සියල්ල ම "සිලා" ශබ්දයෙන් ගැනේ.

104 **සුඛ සිපාටිකාච සෙවාලො-යඤ්ච කිඤ්චි සුඛාපිතං**
**විකටාදිප්ප භෙදඤ්ච-ඤත්තබ්බං යාවජීවිකං.**

මී නැති ඉටි ද, සෙවෙල් ද, මනාකොට දවනලද මත්ස්‍යමාංශාදි යම් කිසිවක් ද, මහාවිකටාදි ප්‍රභෙදය ද යාවජ්ජීවිකය යි දත යුතු යි.

135 **සුඛාපිතං**

හොඳින් දවන ලද යනු යි. හොඳින් දවන ලද මහාභූතයන් ගෙන් අකැප වූවක් නම් නැත්තේ ය. හොඳින් දා වූ මිනී ඇට දු ලොහ යෙහි බහා මිශ්‍ර කිරීම මැනවි.

---

[1] **103–104** ගාථාදෙක ඉංග්ලිසි පොත්හි නො පෙනේ.

136 විකටාදිප්පභෙදක්ඛව

මෙයින් මළ- මූ- අළු- මැටි යන මහාවිකට සතර සහ ආදි ශබ්දයෙන් යාවජීවික වූ කන්ද- මූල- මත්ථක- ඛන්ධ- පුප්ඵ- අට්ඨි- පිට්ඨ යන වර්ගයෝ සංගෘහිතය හ. මොවුන් ගේ විස්තර විභාග දනු කැමැත්තන් විසින් **පාළි මුත්තක විනය විනිශ්චය යේ 91 වන** පිටුවේ සිට කියවා දතගත යුතු යි.

105 **මූලං සාරං තචො ඵෙග්ගු-පණ්ණං පුප්ඵං ඵලං ලතා**
**ආහාරත්ථමසාධෙන්තං-සබ්බන්තං යාවජීවිකං.**

අහර කිස සිදු නො කරන්නා වූ මුල ය, හර ය, පොත්ත ය, එළය ය, කොළ ය, මල් ය, ගෙඩි ය, වැල ය යන ඒ සියල්ල ම යාවජීවික යි.

**විස්තර**

21 යාවජීවික වර්ග සියල්ල ම ප්‍රකාශ කිරීම දුෂ්කර හෙයින් ආහාර කෘත්‍යය පිණිස කවර පෙදෙසක වත් නො ගන්නා වූ මූලාදිය යාවජීවික වශයෙන් පරිභොග කිරීමට සුදුසු ය යි සංක්ෂෙපයෙන් ප්‍රකාශ කළහ. මෙකී දෑ එක් දිනක පිළිගත් කල්හි දිවි කෙළවර තෙක් තබා ගෙන වැළඳු ව ද ''වරද'' නොවේ.

106 **සබ්බකාලිකා සම්භොගෙ-කාලෙ සබ්බස්ස කප්පති**
**සති පච්චයෙ විකාලෙ'පි-කප්පතෙ කාලිකත්තයං.**

එ දවසැ පිළිගත් සියලු කාලිකයන් ගේ වැළඳීම එ දවසැ පෙරවරු වෙහි ගිලන් නො ගිලන් කාට ත් කැප ය. සෙසු කාලිකත්‍රය ය පිපාසාදි කාරුණක් ඇති කල්හි විකාලයෙහි ද වටනේ ය.

137 **සතිපච්චයෙ**

කාරුණක් ඇති කල්හි යනු යි. යාමකාලික සත්තාහකාලික යාවජීවික යන තුන පරිභොගයට නිසි කාරුණු තිබිය යුතු යි. පිපාසාදියක් ඇති කල්හි යාමකාලිකය ද ගිලන් බැව් ආදියක් ඇති කල්හි සත්තාහකලික යාවජීවික දෙක ද පරිභොගයට වටනේ ය.

107 **කාල යාම මතික්කන්තා-පාචිත්තිං ජනයන්ත්‍යුභො**
**ජනයන්ති උභොපෙ'තෙ-අනෙනා වුත්ථක්ඛව සන්නිධිං**

යාවකාලික යාමකාලික දෙදෙන පෙරවරු කාලය හා පසුයම ඉක්ම ගොස් වළඳන ලද්දහු පචිති ඇවැත් උපදවත්. මොහු දෙදෙන ම අනෙනා වුත්ථද සන්නිධි ද වන්නේ ය.

**විස්තර**

22 මෙයින් යාවකාලික සංඛ්‍යාවට ගැනෙන ආහාර පෙරවරු කාලය ඉක්ම යෑමෙන් පසුව වළඳන්නහුට වන විකාලභොජන පාචිත්තිය ද, යාම කාලික සංඛ්‍යායෙහි ලා ගැනෙන ගිලන්පස පිළිගත් දවසෙහි පශ්චිම යාම ය ඉක්ම ගිය කල්හි වැළඳීමෙන් වන සන්නිධි පාචිත්තිය ද අකැප කිළි යෙහි එකරැයකු දු තැබීමෙන් වන අනෙනාවුත්ථ දුක්කටය ද සාමාන්‍ය සන්නිධි පාචිත්තිය දෑ යි යන මේ සියල්ල ම ප්‍රකාශිත යි.

යටැ දැක් වූ යාවකාලික දෙයක් විකාලයෙහි කා නම් හෝ බුදී නම් හෝ පචිති වේ. මෙහි "විකාලය" නම් කාලය යි සලකන අරුණෝද්ගමනෙහි සිට මධ්‍යාහ්නය (ඉර හැරීම) දක්වා ඇති පෙරවරු කාලයෙන් පසු කාලය යි. හෙවත් මධ්‍යාහ්නයෙන් පසු අරුණෝද්ගමනය දක්වා ඇති කාලය විකාලය යි විකාලයෙහි බුදිම පිණිස මොනයම් ආමිසයක් වුවත් පිළිගත්තො ත් දුකුළා ද අනුභවයෙන් පිඩක් පාසා පචිති ද වන්නේ ය.

සන්නිධි වූ යාවකාලිකයක් හෝ යාමකාලිකයක් හෝ අනුභව කරන්නෙමැ යි ගත් කල්හි දුකුළාවක් වේ. වළඳත් හොත් පිඩක් පාසා පචිති වේ.

යථාපත් සේ නො සේදූ පාත්‍රයෙහි පසුද අනුභව කරන්නහුට ද මේ සන්නිධි පාචිත්තිය වේ. යම් පාත්‍රයෙකැ ඇඟිල්ලෙන් ඇඳි කල්හි ඇඟිලි පාර පෙනේ නම්, ඒ පාත්‍රය දුර්ධෝතය. හෙවත් හොඳින් නො සේදූ පාත්‍රය යි. කිදීමෙන් බැම් ගැසූ පාත්‍රයක් හිරු රැසින් රත් කරත් ම තෙල් වැගිරීමක් හෝ උණු කැඳ ආදියක් බහා ලූ කල්හි එහි තෙල් මතු වීමක් හෝ සිදු වේ නම් එබඳු පාත්‍රයකැ හෝ පසුද වැළඳු ව පචිති වේ.

යමෙක් වනාහි වළඳ ශ්‍රාමණේරාදීනට පාත්‍රය නිරපේක්ෂ ව දුන් කල්හි එහි වූ යමක් ඒ ශ්‍රාමණේරාදීන් පසු ද පිළිගැන්නූ කල්හි වැළඳුව ඇවැත් නො වේ. "යං පන භොජනං භික්ඛු නිරපෙක්ඛො සාමණේරානං පරිච්චජති, තං දින්නං තෙහි සන්නිහිතං ලභිත්වා භුඤ්ජති, තං වට්ටති" (**මාතිකාට්ඨකථා 110 පිටුව**) යි එය ප්‍රකාශ කොට ඇත්තේ ය. සන්නිධි වූ මිනීමස්හි තුලසි සහිත පචිතියකි. සෙසු අකැප මස්හි දුකුළා සහිත පචිති වේ.

භික්ෂුව හට සන්නිධි වූවක් භික්ෂුණියට ත් භික්ෂුණියට සන්නිධි වූවක් භික්ෂුවට ත් වටී.

"යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස"යි සන්නිධිකාර සික්ඛාපදයෙහි ප්‍රකාශ වන හෙයින් සන්නිහිත වූ සෙසු තුන් කැලිවත් ම ආහාර පිණිස ගැනීමෙන් දුකුළා වන්නේ ය.

## 138 අන්තොවුත්ථං

අකැප කිළියෙහි තබා අරුණු ඉක්ම වීමෙන් අන්තොවුත්ථ සංඛ්‍යාවට යේ. යමක් අන්තොවුත්ථ වේ නම් එයින් දුකුළාවක් වන්නේ ය. "යං ඉමාසු චතූසු කප්පියභූමීසු වුත්ථං ආමිසං තං සබ්බං අන්තොවුත්ථ සඞ්ඛං න ගච්ඡති"යි **විනයට්ඨකථා 815** වන පිටුවේ සඳහන් කළ හෙයින් උස්සාවනන්තිකා- ගොනිසාදිකා- ගහපති- සම්මුති යන කැප කිළිවලැ තැබීමෙන් අන්තොවුත්ථ නොවේ. ඒ තන්හි තැබුවේ දුකුළා ද නොවේ. මෙහි අකැප කිළිය නම් සඞ්ඝයාට හෝ උපසපන් පුහුලකුට හෝ විසීමට කළ ගෙය යි. එහි සහසෙය්‍යයට පොහෝනා පෙදෙසෙහි සඞ්ඝයාට හෝ උපසපන් පුහුලකුට හෝ අයත් යාවකාලික හෝ යාමකාලික හෝ වස්තුවකි.

## 139 සන්නිධිං

යනු උපසපනක්හු විසින් පිළිගෙන රැයක් ඉක්ම ගිය කිසියම් ආමිස යකාව කියන්නකි. සන්නිධි වන්නේ යාවකාලික යාමකාලික දෙක පමණි. සත්තාහකාලික යාවජීවික දෙකෙහි සන්නිධියක් නැත. එහෙයින් කීහ, **විනය විනිච්ඡයෙහි**:-

“කාලිකත්තය මාදිම්හි-අනෙනා වුත්තොව සන්නිධිං
උභයම්පි න හොතෙව-පච්ඡිමං කාලිකද්වයං” (1388) යි.

108 **සත්තාහකාලිකො සත්ත-අහානි අතිනාමිතෙ**
**පාචිත්ති පාළිනාරූළ්හෙ-සප්පි ආදිම්හි දුක්කටං.**

සත්තාහකාලිකය සත්දවසක් ඉක්මවනලද කල්හි නිසඟි පචිති වේ. පාළියෙහි නො කී මනුෂ්‍ය සප්පි ආදියෙහි සතිය ඉකුත් කල්හි දුකුළා වේ.

“සබ්බා කප්පිය මංසානං-වජ්ජෙත්වා මංස මෙව ච
ඛීරං දධි ච සප්පී ච-නවනීතං ච වට්ටති.”යි

සඳහන් හෙයින් මස් ඇකැප සතුන්ගේ ත් සප්පි ආදිය කැපය.

109 **නිස්සට්ඨං ලද්ධං මක්ඛෙය්‍ය-නඞ්ගං නජ්ඣොහරෙය්‍ය ච**
**විකප්පෙන්තස්ස සත්තාහෙ-සාමණෙරස්සධිට්ඨතො**
**මක්ඛනාදිඤ්ච නාපත්ති-අඤ්ඤස්ස දදතො'පි ච**

නිසජා ලද ගිතෙල් ආදිය ශරීරයෙහි නො ගාන්නේ ය; නො ද වළඳන්නේ ය; සත් දවස තුළ දී සාමණේරයකු හට විකප්පනය කරන්නහුට ත් සිරුරේ ගෑම් ආදිය පිණිස සිතින් සලකන්නහුට ත් අනෙක් උපසපනකු හට දෙන්නාට ත් ඇවැත් නො වේ.

110 **යාවකාලික ආදීනි-සංසට්ඨානි සහත්තනා**
**ගාහාපයන්ති සබ්භාවං-තස්මා එවමුදීරිතං.**

යාවකාලිකාදිය තමා හා සමග මිශ්‍රවූවත් තම තමන්ගේ යාවකාලිකාදි භාවය ගන්වති. ඒ නිසා පෙළ අටුවාවන්හි මෙසේ කියන ලදී.

**විස්තර**

23 යාවකාලිකය සමග මිශ්‍ර වූ සෙසු තුන් කැල්ල ත් යාවකාලික සඞ්ඛ්‍යාවට වැටෙන හෙයින් එදා පෙරවරුවෙහි වළඳත් වටී. යාමකාලිකය හා මුසු වූ සත්තාහකාලික යාවජීවික යන දෙ කැල්ල ද යාමකාලික ගණයට වැටෙන හෙයින් පසුදා අරුණොද්ගමනය දක්වා වටී. සත්තාහකාලිකය හා මුසු වූ යාවජීවිකය සත්තාහකාලික ගණයට වැටෙන හෙයින් සත්දිනක් තුළැ පරිභොග කටයුතු යි. එය පිළිගෙන දවසක් ඉක්ම, ගියා වූ සත්තාහ කාලිකයක් නම් ස දවසක් තුළැ පරිභොගයට සුදුසු වේ.

“යාවකාලිකමපන අත්තනා සඞ්ගං සංසට්ඨානි සම්භින්නරසානි තීනිපි යාමකාලිකාදීනි අත්තනො සභාවං උපනෙති, යාමකාලිකම්පි සත්තාහ

කාලිකාදීනි අත්තනො සභාවං උපනෙති, සත්තාහකාලිකම්පි අත්තනා සඞ්ං සංසට්ඨං යාවජීවිකං අත්තනො සභාවඤ්ඤෙව උපනෙති; තස්මා යාව කාලිකෙන තදහු පටිග්ගහිතෙන සඞ්ං සංසට්ඨං සම්භින්න රසං සෙසකාලි කත්තයං තදහු පුරෙ භත්තමෙව වට්ටති, යාමකාලිකෙන සංසට්ඨං පන ඉතරද්වයං තදහු පටිග්ගහිතං යාව අරුණුග්ගමනා වට්ටති, සත්තාහකාලි කෙන පන තදහු පටිග්ගහිතෙන සඞ්ං සංසට්ඨං තදහු පටිග්ගහිතං වා පුරෙ පටිග්ගහිතං වා යාවජීවිකං සත්තාහං කප්පති'' යි **පාලිමුත්තක විනය විනිශ්චයයේ (103 වන පිටුවේ)** පහද ප්‍රකාශ කර තිබේ. **මහාවග්ගපාලි 285 වන පිටුවේ ද** මෙහි සඳහන් දෙශනා පාලිය අන්තර්ගත වේ. එයම කුදුසිකෙහි මෙසේ ප්‍රකාශ කරයි.

**111 පුරෙ පටිග්ගහිතඤ්ච–සත්තාහං යාවජීවිකං**
**සෙසකාලික සම්මිස්සං–පාචිත්ති පරිභුඤ්ජතො.**

පෙරවරු පිළිගත් සත්තාහකාලිකය ද යාවජීවිකය ද සෙසු යාවකාලික යාමකාලිකයන් හා මිශ්‍ර කොට වළඳන්නහුට පචිති වේ.

**112 යාවකාලික සම්මිස්ස–මිතරං කාලිකත්තයං**
**පටිග්ගහිතං තදහු–තදහෙව පරිභුඤ්ජයෙ.**

යාවකාලිකය හා මුසු වූ අනික් තුන්කැල්ල එ දවසැ පෙරවරු පිළි ගන්නා ලද ද, එ දවස් පෙරවරුවෙහි ම වළඳන්නේ ය.

**113 යාමකාලික සම්මිස්සං–සෙසමෙවං විජානියං**
**සත්තාහ කාලික මිස්සඤ්ච–සත්තාහං කප්පති'තරත්ති.**

යාමකාලිකය හා මුසු වූ සෙසු සත්තාහකාලික යාවජීවික දෙක මෙසේ ම යම්කැලි කොට වැළඳිය යුතු යි. සත්තාහකාලිකය හා මුසු වූ යාවජීවි කය වනාහි සත් දවසක් පරිභොගයට වටී.

---

## 9 පටිග්ගාහො'ති

**114 දාතුකාමාභිහාරො ච–හත්ථ පාසෙරණක්ඛමං**
**තිධා දෙනෙන ච්ධා ගාහො–පඤ්චඞ්ගෙවං පටිග්ගහො.**

දෙනු කැමැත්තහු ගේ කයින් එළවීම ද, අත්පස ද, ථාමමජ්ඣිම පුරු ෂයකු විසින් එසවිය හැකි බව ද, තෙ පරිද්දෙන් දෙන කල්හි දෙ පරිද් දෙන් ගැනීම ද කියා මෙසේ පිළිගැනීම පඤ්චාඞ්ගයක් ඇත්තේ ය.

**විස්තර**

24 මේ ගාථායෙන් පිළිගැන්වීම සහ පිළිගැනීම යන දෙක ම අනා වරණය කරන ලදි. දෙනු කැමැත්තහු විසින් දෙරියන් හමාරක් ඇතුළත සිට හස්තාදි ශරීරාවයවයකින් හෝ, කය පිළිබඳ හැඳි ආදියකින් හෝ, ප්‍රති ග්‍රාහකයා ගේ අතෙහි හෝ පාත්‍රයෙහි හෝ වැටෙන සේ දැමීමෙන් නිස්සග්ගි ය වශයෙන් හෝ, අත්පසැ සිට දීම හෝ, පිළිගැන්වීම යි. දෙනු ලබන දෙය බල මැදුම් පිරිමියක්හු විසින් ඔසවා ලියහැකි දෙයක් විය යුතු යි.

මෙසේ දුන් භොජනයක් හස්තාදි ශරීරාවයවයකින් වත් ශරීර ප්‍රතිබද්ධ පාත්‍රාදියකින් වත් ස්පර්ශ කොට ඉවැසීම පිළිගැනීම යි.

140 හත්ථපාසො

මෙහි ද අත්පස දෙරියන් හමාරකි. විස්තරාර්ථීන් විසින් 82 වන ගාථා යෙහි "සමීපතා" යන්නට ලියූ ටිප්පණිය හා **කඞ්ඛාවිතරණී 113 වන පිටුවේ "අත්පස"** විස්තරය ද බලා දතයුතු.

141 එරණක්ඛමං

පිළිගන්වනු ලබන වස්තුව ථාම මජ්ඣිම පුරිසයකු විසින් ඔසවාලිය හැක්කක් විය යුතු බව මෙයින් කියැ වේ. ශ්‍රාමණේරයන් දෙතුන් දෙනකුන් විසින් හෝ ඔසවා පූර්වෝක්ත ප්‍රමාණයෙන් යුක්ත දෙයක් පිළිගන්වා ලිය හැකි නම් තිවරද ය.

142 තිධාදෙනෙන

කාය- කායපටිබද්ධ- නිස්සග්ගිය- යන තුන් ආකාරයෙන් දීම යි.

143 ද්විධා ගාහො

කාය- කායපටිබද්ධ- යන දෙ අයුරින් ගැනීම යි.

144 පඤ්චධඞ්ගා

තිධා දුන ද්විධා ගාහ යන පඤ්චාඞ්ගය යි.

**ප්‍රතිග්‍රහණය රූහනය නොවන කාරුණු කියත්.**

115 **අසංහාරියෙ තලට්ඨිතෙ-සුඛුමෙ විඤ්ඤ ආදිනං**
**පණ්ණෙ වා සයහාරෙ ච-පටිග්ගාහො න රූහති.**

තුබු තැනින් පහ තො කටහැකි එලක පාෂාණාදියෙහි ද, රුක්හි ම හටගෙන තුබූ නෙළුම්පත් කෑල පත් ආදි පත්හි ද, සිනිඹලා ආදි වෘක්ෂ යන් ගේ සියුම් පත්හි ද, බල මැදුම් පුරුෂයකු නො නැගිය හැකි භාරයෙ හි ද, පිළිගැනීම සිදු නො වේ.

**පිළිගැනීම බිඳෙන කාරුණු කියත්.**

116 **සික්ඛාමරණ ලිඞ්ගහි-අනපෙක්ඛ විසග්ගතො**
**අවෙජ්ජදානුපසම්පන්න-දානාගාහොපසම්මති.**

ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයෙන් ද, කාලක්‍රියායෙන් ද, ලිඞ්ග පරිවර්තනයෙන් ද, නිරාලය ව හැරපීමෙන් ද, පැහැර ගැනීමෙන් ද, අනුපසපනක් හට දීමෙන් ද, පිළිගැනීම බිඳේ.

117 **අපටිග්ගහිතං සබ්බං-පාචිත්ති පරිභුඤ්ජතො**
**සුඛුඤ්ච නාති බහලං-කප්පතෙ උදකං තථා**

118 අඞ්ගලගගමව්චයිතතං-දගානකකි භාණණාගුළකං
ලොණසසු බෙල සිඬොනි-සෙමහමුතත කාරීසකං.

නො පිළිගන්නා ලද සඒ කාලිකයන් ම වළඳන්නාහට පචිති වේ. රජස්- (රෙහෙණු) නැති හෙයින් පිරිසුදු වූ ඉතා බොල් නො වූ හිමොදකා සමුද්‍රොදකාදිය වනාති කැප වේ. ශරීරයෙහි ඇළුණා වූ සිය තැනින් පහ නො වූ, දනතමල- අක්ෂිමල- කණ්මල ද, සිරිරින් නැගි ලුණු ද, කඳුළු ද, කෙළ ද, මුකුණු ද, සෙම ද, මූත්‍ර ද, මළ ද, එසේම කැප යි. (දැහැටි දඬු ද එසේම කැපයි.)

දූන් ගුළාදිය පරිභොග කිරීමට කාලය පවසත්.

119 ගුළමනතිකාමුතතානි-ජාරිකාකුව තණ්ඩාවිරෙඩ
කාමං ගහෙත්වා සෙවෙය්‍ය-අසනෙත කාපපකාරකෙ.

අහර මළ ද, මැටි ද, මූත්‍ර ද, අළු ද, එබඳු සම්දණ්ට කාලයෙහි පිළිගන් වන කැපකරුවක්හු නැති කල්හි තෙමේ ම ගෙන වළඳන්නේ ය.

පිළිගැනීමෙහි දුකුළා වන පරිදි

120 දූරූපචිණෙණ රජොකිණෙණ-අථුගගහ පටිගගහෙ
අනෙනාවුනෙකෘ සයං පනොක-අනෙනා පනොත ච දුකකටං.

නො පිළිගත් ආමිස හරිත භාජනාදිය (ක්‍රීඩාදි වශයෙන්) අතින් පිරිමැදීමෙහි ද, රජස් වගුළ පා නො පිළිගත්වා ම ආහාර ගැනීමෙහි ද, නැවත නො පිළිගත් බව දූන දූන ගත්තා ලද්ද නැවත පිළිගැනීමෙහි ද අකැප කිළියෙහි තබා අරුණු ඉක්ම වූ දෙයෙහි ද, තමා පිසූ දූයෙහි ද, අකැප කිළියෙහි පිසූ දූයෙහි ද, දුකුළා වේ.

145 දූරූපචිණෙණ

නො පිළිගත්වන ලද බත් බඳුන් ආදිය ක්‍රීඩා පිණ්ස අත ගැම හෝ තුබූ තැනින් අන් තැනකට පමුණුවාලීම හෝ එහි වූ රොඩු ආදි යමක් ඉවත් කිරීම හෝ "දූරූපචිණණ" නම්. පලගත් වෘක්ෂ ලතාදිය සොලවාලීම හෝ නොවටී. එයින් දුකුළා වේ.

146 රජොකිණෙණ

රජසින් ගැවසී ගත් පාත්‍රයෙක්හි යනු යි. දූවිල්ලෙන් යුත් පාත්‍රාදියෙක්හි යම් කිසිවක් පිළිගන්නහුට විනය දුකකටයක් (විනයෙහි පැණ වූ දුකුළාවක්) වන්නේ ය. පිඬු සිඟන්නහු ගේ පාත්‍රයෙහි රජස් වැටේ නම් නැවත පිළිගත්වා ගෙන භික්ෂාව ගත යුතු යි. "මේ පාත්‍රය අතට ගෙන දෙව"යි කියද්දී ත් නො ඇසූනාක් මෙන් භික්ෂාව දෙත් නම්, පාත්‍රය අතින් නුමුඳ ම පිළිගන්වන්නක්හු වෙත ගෙන ගොස් පිළිගන්වාගත යුතු යි. ඉදින් මහාවාතයෙක් නැග රජස් හෙළා නම්, එවිට "අනුපසපනක්හු හට දෙමැ"යි යන ශුබ චිත්තයෙන් භික්ෂාව ගන්නට වටී. එසේ භික්ෂාව ගෙන අනුපසප නක්හට දිය යුතු යි. පසු ව ඔහු විසින් පිළිගන්වන ලද්දක් හෝ, අන්‍යයකුට පිළිගැන්නුවක් විශ්වාස කමින් හෝ වැළඳීමෙන් ඇවැත් නො වේ.

147 **උග්ගහපටිග්ගහෙ**

නො පිළිගත් දූයක් තමා විසින් ගෙන නැවත එය පිළිගන්වා ගැනීම “උග්ගහපටිග්ගහ” නම්. මෙයට ම “උග්ගහිත පටිග්ගහිත” යනු ද එයි. එබඳු උග්ගහ පටිග්ගහයේ දී දුකුළා වේ. මා පියාදීන් උදෙසා තෙල් ඈ යමක් ගෙන යමින් සිටිය දී එය වළඳනු කැමැති වූ විට පිළිගන්වා ගෙන වළඳ කළ වටීම ය. කලින් පිළිගන්වා ලූ දූයක් නම් නැවත පිළිගැන්වීම් කිස නැති. තමා පිළිගන්නට බලාපොරොත්තු වන දූයක් ඊට කලින් ස්පර්ශ කිරීමාදිය නුසුදුසු බව මෙයින් ප්‍රකාශිත යි. තමා කලින් උග්ගහිත (ගන්නා ලද) දූයක් අනෙකකු පිළිගත් කල්හි වැළඳුව ඇවැත් නො වේ.

148 **අන්තොවුට්ඨෙ**

අකැප කිළියෙහි තබා අරුණු ඉක්ම වූ වස්තුව “අන්තොවුට්ඨ” නම්. එබඳු අන්තොවුට්ඨ වස්තුවෙහි ද දුකුළා වේ.

149 **සයං පක්කෙ**

තමා පිසූ වස්තුවෙහි යනු යි. මොන ම ආමිශයක් වත් පිසීම භික්ෂූනට නො වටී.

150 **අන්තො පක්කෙ**

අකැප කිළියෙහි තබා පිසූ වස්තුවෙහි ද දුකුළා වේ.

---

## 10 මංසෙසු ච අකප්පියං

“මංසෙසු ච අකප්පියං” යන්නෙහි අකැප මස් නම්:-

121 **මනුස්ස හත්ථි අස්සානං-මංසං සුනඛ දීපිනං**
**සීහ ව්‍යග්ඝ තරච්ඡානං-අච්ඡස්ස උරගස්ස ච**

122 **උද්දිස්සකතමංසඤ්ච-යඤ්ච අප්පටිවෙක්ඛිතං**
**ථුල්ලච්චයං මනුස්සානං-මංසෙ සෙසෙසු දුක්කටං**

123 **අට්ඨි පි ලොහිතං චම්මං-ලොමමෙතෙසං න කප්පති**
**සචිත්තකං'ව උද්දිස්ස-කතං සෙසා අචිත්තකා.**

(121) මනුෂ්‍ය ය, හස්ති ය, අශ්ව ය, බලු ය, දිවි ය, සිංහ ය, ව්‍යාඝ්‍ර ය, කරබාතා වලස් ය, දීඝජාතීහු ය යන මේ සතුන් ගේ මස් ද,

(122) උදෙසා මැරූ මස් ද, නො විචාරණ ලද මස් ද, (න කප්පති) නො වටී. මිනී මසෙහි ථුලසි වේ. සෙසු මස්හි දුකුළා වෙයි.

(123) මේ දශ දෙනා ගේ ඇට–ලේ– සම්– ලොම් ද නො වටී. උදෙසා කළ මත්ස්‍ය මාංශය ම සචිත්තක වේ. සෙසු මත්ස්‍ය– මාංශයෝ අචිත්තක යහ.

**විස්තර**

25 මෙයින් අකැප මස් සියල්ල ම වෙන් කොට ප්‍රකාශිත යි. අකැප මස් වෙන් කොට දත ගත් කල්හි කැප මස් ද මේ මේ වර්ගීය යි වටහා ගත හැකි ය. මෙහි කී මස් දශය අකැපය යි තහනම් කොළේ යටැ දැක්වෙන කරුණු නිසා ය. සවජාතික බැවින් මිනීමස් ද, හස්ති- අශ්ව මාංස රාජාඞ්ග හෙයින් ද, සුනඛ- අහි මාංස පිළිකුල් නිසා ද, සිංහ- ව්‍යාඝ්‍ර- දීපි- අච්ඡ- තරච්ඡ මාංස ඒ සතුන් ගෙන් විය හැකි උපද්‍රව නිසා ද, තථාගතයන් වහන්සේ තහනම් කළ සේක. මෙකී සතුන් ගේ ඇට- ලේ- සම්- ලොම් යන වර්ගී ද සම්පූර්ණයෙන් ම අකැප යි. මෙසේ "අකැපය"යි දශවර්ගීයක් වෙන් කොට වදාළ හෙයින් කැප මසක් ද තිබිය යුතු බව පෙනේ. එවිට "කැප මසැ"යි ගැනෙන්නේ පූර්වෝක්ත දශ මාංසයෙන් වෙන් වූ සෙසු සතුන් ගේ "ත්‍රිකෝටි පාරිසුද්ධ මාංසය"යි. ඉදින් යම් භික්ෂු කෙනකුන්හට ත්‍රිකෝටි පාරිශුද්ධ මාංසයක් ලැබේ නම්, එය වළඳත් මැනවි. **මහාවග්ග පාලියෙහි භෙසජ්ජක්ඛන්ධකයට අයත්** ලිච්ඡවි භාණවාරයෙහි **දැක්වෙන** "තරුණප්පසන්න මහාමාත්‍යයා විසින් බුද්ධප්‍රමුඛ එක්දහස් දෙසිය පණසක් භික්ෂූන් වහන්සේට පූජාකළ මාංසාහාරය ද, **භෙසජ්ජක්ඛන්ධකයෙහි ම දැක්වෙන** සීහසෙනාපතියා විසින් හා **සුප්පියා භාණවාරයෙහි** සුප්පියාව ද ගෙනේතට නියම කළ "ගච්ඡ භණෙ පවත්ත මංසං ජානාහි" යී ප්‍රකාශ වන පවත්ත මංසය ද, භික්ෂූනට කැප ය. එහි "පවත්තමංසං" යන වචනය "පවත්ත මංසන්ති" "ආපණාදිසු පවත්තං වික්කායිකං මතමංසං"යී **විමතිවිනොදනී 246 පිටුවෙහි** දක් වූ පරිදි පවත්ත මාංසය නම් සල්පිල් ආදියෙහි විකුණන්නට තබා තිබෙන මෘත මාංසය යි තථාගතයන් වහන්සේ විරේක කළ කල්හි ජීවක වෙදැදුරන් විසින් ('අහමපි පටිච්ඡාදනීයෙන') මම ද මස් සුප් එකකින් පුදමැ යි ගෙනැත් පිදූ මාංසය බඳු මස් ද භික්ෂූනට කැප වන්නේ ය. කැප මාංසය වුවත් වචීවිඤ්ඤත්තියෙන් ඉල්ලා වැළඳුව පචිති වේ.

151 **"තරච්ඡ"**

යනු කරබානා වලස්සු යි. "සීසගීවාතරඩෙගත වරනානා අච්ඡ විසෙසා තරච්ඡා" යනු ටීකා යි.

152 **උද්දිස්සකතමංසඤ්ච**

භික්ෂු-භික්ෂුණී- ශ්‍රාමණේර- ශ්‍රාමණේරී- ශික්‍ෂමානා යන පඤ්ච සහධම්මිකයන් අතුරෙන් යම් කිසිවකු උදෙසා මැරූ ගොඩ- දිය මස් මෙයින් ගැනේ. ච ශබ්දයෙන් ජලජ සත්ත්වයන් ගේ මස් අන්තර්ගත වන්නේ ය.

"න භික්ඛවෙ ජානං උද්දිස්සකතං මංසං පරිභුඤ්ජිතබ්බං, යො පරිභුඤ්ජෙය්‍ය, ආපත්ති දුක්කටස්ස; අනුජානාමි භික්ඛවෙ තිකොටිපරිසුද්ධං මච්ඡමංසං අදිට්ඨං අසුතං අපරිසඞ්කිතන්ති" (**මහාවග්ග 272**)

මෙයින් උදෙසා කළ මාංසය අකැප බව හා ත්‍රිකෝටි පාරිශුද්ධ මාංශයක් ලැබේ නම්, එය කැප බව ත් දෙශනා කළ සේක. ත්‍රිකෝටිපාරිශුද්ධ මාංසය යනු කවරක් දැ යි සවිස්තර ව දනු කැමැත්තන් විසින් **සමන්තපාසාදිකාවේ 435 වන** පිටුවේ අග සිට කියවා දත යුතු යි.

යම් ගිහියෙක් ආපණයෙන් මස් මාලු ගෙනැත් සකස් කොට පිළිගන් වා නම් එය භික්ෂූනට සම්පූර්ණයෙන් ම කැප ය. සුප්පියා කතාවෙහි දී ම සඳහන් වන පරිදි බැලුව ද ආපණයෙහි තිබෙන මස් මාලු කැප ය. පවත්ත මාංශය සොයා ගෙනෙන් ය. වය යි අණකළ අතැවැසියා එදා සතුන් නො ම රණ දිනයක් හෙයින් මස් නොමැති බව් ප්‍රකාශ කරගෙන ආවේ මෙසේ ය. "අථ ඛො සො පුරිසො යෙන සුප්පියා උපාසිකා තෙනුපසංකමි, උපසංකමිත්වා සුප්පියං උපාසිකං එතදවොච. නත්ථය්‍ය පවත්තමංසං, මාඝාතො අජ්ජාති'' යි. **මහාවග්ගපාලි 250 පිටුව.**

**153 අප්පටිවෙක්ඛිතං**

නො විචාරණ ලද යනු යි. යම් මසක් ගැන සැක තිබේ නම් එය කවරක්දැ යි අසා සැක පිරිසිඳ ගෙන වැළඳිය යුතු ය. මෙය සුප්පියා උපාසිකාව ගේ කලව මාංසයෙන් සකස් කළ මස් රසය (මස් හොද්ද) වැළඳීම නිසා පණවා වදාළසේක. "න ච භික්ඛවෙ අප්පටිවෙක්ඛිත්වා මංසං පරිභුඤ්ජිතබ්බං; යො පරිභුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස" **(මහාවග්ග 252)**

**154 ථුල්ලච්චයං**

පාරාජිකා- සංඝාදිසෙස යන ආපත්තිද්වය හැරෙන විට බර වූ ඇවත ථුල්ලච්චය නම්.

---

## 11 නිස්සග්ගියානි'ති

**124 අරූපියං රූපියෙන–රූපියං ඉතරෙන ච**
**රූපියං පරිවත්තෙන්තස්ස–නිස්සග්ගි ඉධ රූපියං**

**125 කහාපණො සජ්ජු සිඞ්ගි–වොහාරූපගමාසකං**
**වත්ථමුත්තාදි ඉතරං–කප්පං දුක්කටවත්ථු ච**

රූපිය සංඛ්‍යාත නිසඟිවතින් අරූපිය සංඛ්‍යාත කැප වත් හා දුකුළා වත් ද, අරූපියයෙන් රූපිය සංඛ්‍යාත නිසඟි වත් ද, පෙරළි (හුවමාරු) කෙරේ නම් නිසඟි පචිති වේ; මෙහි සවර්ණාදියෙන් කළ කහවණු ද රිදී ද රත්රන් ද (ඒ ඒ දෙශයෙහි) ව්‍යවහාර ප්‍රාප්ත (ලොහාදියෙන් කළ) මාසක ද රූපිය නම්. රෙදි ඈ කැපවත් හා මුං ඈ දුකුළා වත් ද අරූපිය නම්.

**155 වත්ථමුත්තාදි**

වස්ත්‍රාදිය සහ මුතු ආදිය ගැනේ. කප්පාසාදිය වස්ත්‍රාදියට අයත් ය. ඒවා කැප වත් ය, මුත්තාදියට මණි- සංඛ- සිලා- පවාළ- ලොහිතඞ්ක- මසාරගල්ල- සත්තධඤ්ඤ- දාසි- දාස- ඛෙත්ත-වත්ථු- පුප්ඵාරාම- ඵලාරාමාදිය සංග්‍රහ වේ.

**126 ඉමං ගහෙත්වා භුත්වා වා–ඉමං දෙහි කර'ත්තය**
**දෙමි වාති සමාපන්නෙ–නිස්සග්ගි කය වික්කයෙ**

මෙය ගෙන හෝ (මෙය) වළඳා හෝ (මේ බඩුව හෝ බඩු) මට දෙව, මේ වැඩ කරව, මෙය මෙහි ගෙනෙව, මෙය තට දෙමි. (එවිට තුඹ මෙය මට දෙව) යි මෙසේ ගනුදෙනු කළ කල්හි නිසඟි පචිති වේ.

156 කයවික්කයෙ

මෙයින් ගනු දෙනු කිරීම ගැනේ. භික්ෂු භික්ෂුණී සික්ඛමානා සාමණේර සාමණේරී යන පස්සහදම්මියන් සමග හැර සෙසු කාට වුවත් සිය කැප බඩුවක් දී කැප බඩුවක් ගත ද වරදය. "ඨපෙත්වා පඤ්ච සහධම්මිකෙ යං එවං අත්තනො කප්පියභණ්ඩං දත්වා මාතුසන්තකම්පි කප්පියභණ්ඩං ගණ්හාති, තං නිස්සග්ගියං හොති" යි එය (මාතිකාට්ඨකථායෙහි 72) විස්තර කළ සැටි යි.

127 අත්තනො අඤ්ඤතො ලාභං-සඞ්ඝස්සාඤ්ඤස්ස වා නතං
පරිනාමෙය්‍ය නිස්සග්ගි-පාචිත්තිවා'පි දුක්කටං

සඞ්ඝයාට හෝ අනිකකුට හෝ දුන් ප්‍රත්‍යය තමාට හෝ අනෙකකුට හෝ පරිනමා නම්, නිසගි පචිති ද ශුඞ පචිති ද දුකුළා ද වේ.

විස්තර

26 මෙහි සඞ්ඝයාට අයත් දෙය තමා ගැන්මෙහි නිසගි පචිති වන බව ත් අන් කෙනකුන්හට දීමෙහි ශුද්ධ පචිති වන බව ත්, අනිකකුට අයත් ප්‍රත්‍යය තමාට හෝ වෙන අන්‍යයකුට හෝ සඞ්ඝයාට හෝ පිරිනැමීමෙන් දුකුළා වන බව ත් ප්‍රකාශිත යි.

128 අනිස්සජිත්වා නිස්සග්ගිං-පරිභුඤ්ජෙ න දෙය්‍ය වා
නිස්සට්ඨං සකසඤ්ඤාය-දුක්කටං අඤ්ඤථෙ'තරන්ති.

නිස්සජනය කටයුතු චීවරාදි වස්තුව නිස්සජනය නො කොට පාවිච්චි කෙරේ නම් හෝ, තමහට නිස්සජනය කළ චීවරාදිය තමාගේ ය යන සිතින් ආපසු නො දේ නම් හෝ දුකුළා වේ. (අඤ්ඤථා) ඔහු සතු බව දැන දැන සොරසිතින් නො දේ නම් "ඉතරං" ඒ භාණ්ඩයෙහි වටනා පමණින් පාරාජිකාදි ඇවැත් වේ.

---

## 12 පාචිත්ති

129 මුසාවාදොමසවාදෙ-පෙසුඤ්ඤෙ හරණෙ තථා
පදසො ධම්ම සාගාර-උජ්ඣාපනක ඛීයනෙ

130 තලසත්ති අනාදර-කුක්කුච්චුප්පාදනෙසු ච
ගාමප්පවෙසනා'පුච්ඡා-භොජනෙ ච පරම්පර

131 අනුධරිත්වා ගමනෙ-සෙය්‍යං සෙනාසනානි ච
ඉත්ථියද්ධාන ගමනෙ-එකෙකාය නිසීදනෙ

132 හිංසාපනාවකාසාවන අඤ්ඤවාද
විහෙස දුට්ඨුල්ලපකාස ඡාන්ද
භාසෙසාදනක නිච්ඡුභනෙ විහාරා
පාචිත්ති වුත්තා'නුපඛජ්ජ සාසෙ'ති.

දෑත දෑත බොරුකීමෙහි ද, උපසපනක්හට ජත්‍යාදියෙන් ගටා කිණි මෙහි ද, කේලාම් කීමෙහි ද, එසේ ම අනුපසපනක්හු හා එක් වැ බණ හැදැරි මෙහි ද, (සාගාර) අනුපසපනුන් හා මාගමුන් ද සමග එක ගෙහි රෑ ගෙවී මෙහි ද, සමමුති ලද මහණා පහත් කොට සිතීමෙහි ද, ඔහු ගේ අගුණ කීමෙහි ද,

ක්‍රොධ සිතින් උපසපනක් හට අත් එසවීමෙහි ද, ධර්මය කෙරෙහි හෝ පුද්ගලයා කෙරෙහි හෝ අනදර කිරීමෙහි ද, උපසපනක් හට නිකරුණේ සැක ඇති කිරීමෙහි ද, නො කියා ගම් වැදීමෙහි ද, පිළිගත් පිළිවෙළ ඉක් මවා වළඳන භොජනයෙහි ද,

හිසි ආදි දශවිධ සෙය්‍යා සහ මංච පීඨාදි සයනාසන නො උදුරා යැමෙ හි ද, මාගමක හා බැණ ගෙන ගමින් ගමකට හෝ අඩ යොදුනක් හෝ යැමෙහි ද, (එකො) හුදකලාවූයේ මාගමක සමග රහස් තන්හි හිඳීමෙහි ද,

උපසපන් මහණක්හු බිය ගැන්වීමෙහි ද, උපසපනක්හු හට කොප සිතින් ගැසීමෙහි ද, සඟමැද ඇසූ දෙය මිස අනෙකක් කීමෙහි ද, විචාළ දේ නො කියා වෙහෙස කිරීමෙහි ද, උපසපනක්හු ගේ සඟ වෙසෙස් ඇවැතක් සඞ්ඝ සම්මුති නැතියාව අනුපසපනක්හට කීමෙහි ද, උපසපනක්හට සැඟවීමෙහිද, (හාසොදකෙ) අඞ්ගුලිපතොදකයෙහි- කිති කැවීමෙහි හා දියෙහි ක්‍රීඩා කිරීමෙහි ද, උපසපන් මහණක්හු සඟසතු වෙහෙරින් එළවා දැමීමෙහි ද, උපසපනක්හු වෙතට ගොස් ඔහුට කරදර වන සේ හොවීම් හිඳීම්හි ද, පාචිත්තීහු කියන ලද්දුහ.

157 මුසාවාද

සිදු නොවූවක් සිදු වූවක් සේ හැඟැවීම යි. එය වචනයෙන් පමණක් නොව කයින් ද කටහැකිය. මුසාවාදයෙන් පංචාපත්තියක් ම වියැහැකි බව පෙනේ. 1 උත්තරි මනුස්සධම්මාරොචන වශයෙන් මුසා කිණීමෙන් පරිජි ද, අමූලක පාරාජිකාවකින් අනුධංසනය කිරීමෙන් සංඝාදිසෙස ද, අමූලක සංඝාදිසෙසයෙන් අනුධංසනය කිරීමෙන් හෝ මෙහි දැක් වෙන මුසාවාදයෙන් පචිති ද, ආචාර විපත්තියෙන් අනුධංසනයෙන් දුකුළා ද, පයඝියයෙන් උතුරු මිනිස්දම් හැඟැවීමෙන් ථුල්ලච්චය ද යි ඇවැත් පසක් වියැ හැකි ය. (මාතිකාටඨකථා 82) පිටුව හෝ සාරත්ථදීපනී 783 වන පිටුව හෝ බලන්නේ මැනැවි.)

158 ඔමසවාද

අසනු ලබන්නහු ගේ කන්හි උල් ගසන්නාක් වැනි ආක්‍රොෂ වචනයි. එය ජාති- නාම- ගොත්ත- කම්ම- සිප්ප- ආබාධ- ලිඞ්ග- කිලෙස-ආපත්ති යන මේවා ගෙන ආක්‍රොෂ කිරීමට කිණීම යි. පරුෂ වචනය ද මීට ඇතු ලති. පරම්මුඛයෙහි ආක්‍රොෂ කරන්නහුට දුකුළා වන බව ත් අනුසාසනා පූර්කව කියන්නහුට අනාපත්ති බව ත් සාරත්ථදීපනී 785 පිටුවේ දැක්වේ. "අනාපත්ති අත්ථපුරෙක්ඛාරස්ස ධම්මපුරෙක්ඛාරස්ස අනුසාසනී පුරෙක්ඛා රස්ස උම්මත්තකස්ස ඛිත්තචිත්තස්ස වෙදනාට්ටස්ස ආදිකම්මිකස්සාති'' (පාචිත්තිය පාලි 17

159 **පෙසුඤ්ඤහරණෙ**

දශ ආක්‍රොෂ වස්තුයෙන් කවරකින් හෝ ආක්‍රොෂ කරනු අසා ආක්‍රොෂ කරනු ලබන්නා තමා හා මිත්‍ර කරගනු කැමැත්තෙන් හෝ, ඒ දෙ දෙන බිඳවනු කැමැත්තෙන් හෝ බිණීම මෙහි ලා ගැනේ. අනුපසපන්නක්හු කියූවක් උපසපන්නක් හට කීමේ ත් උපසපන්නක්හු කියූවක් අනුපසප න්නක්හට කීමෙහි හෝ අනුපසපන්නක්හු කියූවක් අනුපසපන්නක්හට කීමෙහි හෝ දුකුළා වේ. (**පාචිත්තියපාලි 21.**)

160 **පදසොධම්ම**

ධර්මය පද වශයෙන් හෝ අනුපද වශයෙන් හෝ අන්වක්ෂර වශයෙන් හෝ අනුබ්‍යඤ්ජන වශයෙන් හෝ කීම මෙහි ලා ගැනේ. ගාථා විෂයයෙහි දී පදය නම්:- එක් ගාථා පදයකි. පෙළෙහි නම් විභක්ත්‍යන්ත එක් වචන යෙකි. අනුපද නම්: දෙවැනි පදය යි. අන්වක්‍ෂර නම් එක් එක් අකුරකි. අනුබ්‍යඤ්ජන නම් එක් එක් ව්‍යඤ්ජනයෙකි. මේ සියල්ල ම "පදසො" යන්නට ගැනේ. උගන්වන අදහසින් අනුපසපන්නක්හු හා කීමෙහි ඇවැත් නැති. මේ ගැන **පාචිත්තියපාලි 22** පිටුව- **මාතිකාට්ඨකථා 84**- **සමන්ත පාසාදිකා 540**- **සාරත්ථදීපනී 786**- යන පොත් බලා දතයුතු යි.

161 **සාගාර**

මෙයින් අනුපසපන්නුන් සමග ත් මාගමුන් සමග ත් එක ගෙහි අරුණු නැගීම් පිළිබඳ ශික්ෂාපද කියැ වේ. අගාර යනු සෙනසුන යි. සත් මහල් පහයෙක්හි වුව ද එක් දොරකඩකින් යැම් ඊම් කරයි නම්, එය මෙහි ලා ගැනෙන අගාරය යි. බැහැරට යා හැකි සේ දොරකඩ වෙන් වෙන් වැ තිබෙන කාමර පෙළක් වේ නම්, උපසපන්නක්හු වසන කාමරයෙන් අන්‍ය වූ කාමරයෙක්හි හෝ කාමරවල අනුපසපන්නුන් සිටිය ද වරද නැති. අනුප සපන්නක්හු හා එක ම කාමරයෙක්හි වුවත් දෙතුන් රැයකට වඩා ගතකළ විට ආපත්ති ගෙන දෙයි. මාගමුන් හා නම් එක් රැයකුදු අරුණ නගාලිය නො හැකි ය. යටත් පිරිසෙයින් ගො මූගටි පරෙවි ඈ තිරිසන් සතුන් සමග හෝ දෙතුන් රැයක් ගත කිරීම ආපත්ති ජනක බව **සිඛවළඳවිනිස** 43 පිටේ එයි.

162 **උජ්ඣාපනක**

සෙනසුන් පැණවීමාදියට සඞ්ඝසම්මතයෙන් තෝරා පත්කළ උප සපන් භික්‍ෂුවට පක්‍ෂභජනයෙන් ක්‍රියා කරතැ යි අපකීර්තිය ඇති වන පරිදි සෙස්සන් ලවා අවමන් කරවීම යි.

163 **ඛීයනක**

සම්මති ලත් භික්‍ෂුවට අපකීර්තිය ඇති කරන අදහසින් අගතියෙන් ක්‍රියා කරතැ යි තමා නුගුණ කීම යි.

164 **තලසත්තික**

ගැසීමට අත් සත් එසවීම ය යි කියහත් "තලසත්තිකං උග්ගිරෙය්‍යාති: කායං වා කායපටිබද්ධං වා අන්තමසො උප්පලපත්තම්පි උච්චං

ඡෙහි ආපත්ති පාචිත්තියස්ස"යි පාචිත්තිය පාලියෙහි වදළ බැවින් ශරීරාව යව පමණක් නොව කෝප වැ ගැසීමට උපුල් පතක් එසවුව ද පචිති වේ. යමකු ගැලවීමට අත් එසවීම- උරුක්කිරීම ආපත්ති නො වෙයි. අනුපසප තක් හට අත් උරුක්කැරුමෙහි දුකුළා යි.

165 අනාදර

මෙයින් අනාදරිය සිකපදය කියැ වේ පුග්ගලා'නාදරිය- ධම්මා'නාදරි ය යි අනා'දරියයෝ දෙකකි. වරදක් සඳහා යම් භික්‍ෂුවක් අවවාද කරන කල්හි ඒ භික්‍ෂුවට "මෙතෙම උක්ඛිත්තයෙක" යනාදි වශයෙන් ගණා කිරීම- අනදර කිරීම පුද්ගල අනාදරිය නම්. ධර්ම විනය පෙන්නා අවවාද කරන කල්හි ඔය බණ- විනය මෙකලට පිළිපැදිය නො හැක, යනාදීන් ධර්ම විනය යට අවමන් කැරැ කතා කිරීම ධම්මා'නාදරිය යි.

166 කුකකුච්චුප්පාදනෙසු

උපසපන් භික්‍ෂුවක් හට කුකුස්- සැක ඇති කිරීම යි. "ඌනවීසො‍සා ත්‍වං මඤ්ඤෙ" තොප විසි වයස් අසම්පූර්ණ වූ වෙකැයි හඟිමි. තෝ විකාල යේ කෑවෙහි යි හඟිමි- තෝ මද්‍යපානය කෙළෙහි යි හඟිමි" යනාදි වශ යෙන් කියා ඒ භික්‍ෂුවට ඒ ඒ කරුණු ගැන සැක උපදවා නම් මෙයින් පචිති වේ. අනුපසපතක් හට කුකුස් ඇතිකිරීමෙහි දුකුළා වේ.

167 ගාමප්පවෙසනාපුච්ඡා

භික්‍ෂූන් නො විචාරා විකාලයෙහි ගම් වැදීම යි. "යො පන භික්ඛු සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසෙය්‍ය, අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයා පාචිත්තියං" යනු ඒ පිණිස ප්‍රඥප්ත ශික්‍ෂාව යි. මෙහි විකාල නම් මධ්‍යාහ්නයේ සිට අරුණෝදය තෙක් ඇති කාලය යි. ආරාම යෙහි භික්‍ෂුවට කියා විකාලයෙහි ගම් වැද ඒ කටයුත්ත එ ගමින් සම්පූර්ණ නො වූ කල්හි ඉක්බිති අන් ගමකට යෑම සඳහා පිළිවිසීමක් අනවශ්‍ය ය. "තස්මිං ගාමෙ තං කම්මං න සම්පජ්ජතී ති අඤ්ඤං ගාමං ගච්ඡන්තෙන පුන ආපුච්ඡන කිච්චං නත්‍ථි" යි **මාතිකාට්ඨකථා 143 වන පිටුවෙහි එයි.** යම්කිසි උත්සන්න රෝගාදි ආපදාවෙක්හි දී හෝ සිංහාදි බියෙක්හි දී හෝ නො කියා යෑම ඇවැත් නූපදව යි.

168 භොජනෙ ච පරම්පරා

මෙයින් පරම්පර භොජන ශික්‍ෂාව ප්‍රකාශිත යි. ආරාධනා ලද පිළි වෙළින් නො වළඳා උත්පටිපාටියෙන් වැළැඳීම "පරම්පර භොජන" නම්. ගිලාන සමය- චීවරදාන සමය- චීවරකාර සමය යන කාලයන්හි දී උපිළි වෙළින් වැළඳුව ද අනාපත්ති යි.

169 සෙය්‍යං සෙනාසනානි ච අනුද්ධරිත්‍වා ගමනෙ

සඟසතු භිසි ආදි දශවිධ ශය්‍යා හා මඤ්චපීඨාදි සෙනාසන ද මීට අයත් වේ- මී- ආදි සතුන් ගෙන් විනාශ නොවන පරිදි සකස් කොට නො තබා එසේ කිරීමට අන්‍යයකුට නො පවරා හෝ යෑම නිසා පචිති සිදු වන බව

මෙයින් ප්‍රකාශිත යි. 1 භිසි, 2 චිලිමිකා, 3 උත්තරත්ථරණ, 4 භුම්මත්ථරණ, 5 තට්ටිකා, 6 චම්මඛණ්ඩො, 7 නිසීදනං, 8 පච්චත්ථරණං, 9 තිණසන්ථාරො, 10 පණ්ණසන්ථාරො යි දශවිධ ශය්‍යා සහ මඤ්ච පීඨ භිසි කොච්ඡ සංඛ්‍යාත ශයනාසන ද මෙහි ලා අන්තර්ගත ය. ප්‍රාතිමෝක්ෂයෙහි මේ ශික්ෂාපදය ගැන "අජ්ඣොකාසෙ" යන පදය ද පෙනේ. එළිමහනේ දමා යෑමෙන් වැස්සෙන් හෝ අව්වෙන් විනාශ විය හැකි ය. එය ටික වේලාවකට බැහැරට යන ත් කළයුත්තකි. එළි මහනේ නොව අන් කිසි තැනෙක හෝ තිබී විනාශ විය හැකි නම්, ඒ සකස් කොට තබා යා යුතු. තමනට නො පිළිවන් වූ කල්හි සාමණේරාදි අනෙකකුට හෝ කියා යා යුතු. "ඉති යත්ථ ච යඤ්ච සන්ථරිතුං න වට්ටති, තං සබ්බම්පි අජ්ඣොකාසසඞ්ඛමෙව ගච්ඡතීති වෙදිතබ්බං" (**මාතිකාට්ඨකථා 91**)

## 170 ඉත්ථියා අද්ධාන ගමනෙ

ස්ත්‍රියක සමග කථාකැරැ ගෙනැ දීර්ඝ ගමනක් යෑම යි. මෙහි **අද්ධාන** ගමන යන්නට යටත්පිරිසෙයින් අඩ යොදුන් පමණ ගමනක් යෑම හෝ ගැනේ. භික්ෂුණියක සමග බැණ ගෙන මෙතරම් ගමනක් ගිය ද පචිති වේ. උවදුරු සහිත මඟෙක්හි නම් නිවරද ය. ගමකින් ගමකට යෑම හෝ අද්ධාන ගමන්හි ම ලා ගැනෙන බව "අන්තමසො ගාමන්තරම්පි" යි **ප්‍රාතිමොක්ෂයේ භික්ෂුණොවාද වර්ගයෙහි 7 වන** ශික්ෂාපදයේ පෙනෙයි.

## 171 එකොකාශ නිසීදනෙ

හුදකලා වූයේ හුදකලා මාගමක සමග ඇසට නො පෙනෙන (මුවහ) තැනෙක සිටීමෙහි පචිති වන බව මෙයින් ප්‍රකාශිත ය. **ප්‍රාතිමොක්ෂයේ** පචිති කොටසෙහි පස්වන වර්ගයෙහි 4–5 ශික්ෂාපද දෙක ම මීට ඇතුළත්ය. 4 වැනි ශික්ෂාපදයෙහි "ආසනෙ" යන්නක් තිබේ. වෙනස එපමණි. කොතැනක හෝ මාගමක සමග සයනය කිරීමෙහි පචිති වේ. පචිති කොට සෙහි 3 වන වර්ගයෙහි 10 වන ශික්ෂාපදය ද මීට සමානය. "භික්ඛුණියා සද්ධිං" යන්න පමණක් වෙනසි.

## 172 භිංසාපනෙ

අන් උපසපන් භික්ෂුවක් බිය ගැන්වීමෙහි පචිති වන බව මෙයින් ප්‍රකාශිත යි. බිය ගැන්වීම පිණිස රූපාදිය හෝ එළවා ද, බිය ඇති වන කතා හෝ කියා ද පචිති වේ. බිය කරනු ලබන්නා බිය වුවත් නො වුවත් බිය කරන භික්ෂුව පචිති අවදී. අනුපසම්පන්නකු බිය කිරීමෙහි ලා දුකුළා වේ.

## 173 ආකොටනෙ

උපසපන් භික්ෂුවකට ගැසීමෙහි පචිති වේ. මෙය **ප්‍රාතිමොක්ෂයෙහි** "යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො පහාරං දදෙය්‍ය පාචිත්තියං" කියා එයි. යටත් පිරිසෙයින් කෝපයෙන් උපුල් පතකින් ගැසුව ද පචිති වේ. අනුපසපනකුට හෝ තිරිසනකුට හෝ ගැසීමෙහි දුකුළා වේ. විපතකින් මුදවන අදහසින් ගැසුව වරද නැති.

### 174 අඤ්ඤවාද විහෙස

සඟ මැද දී ඇසූ දෙය තබා අනෙකක් කීමෙහි සහ අසන දෙයට පිළිතුරු නො දී සඟ පිරිස වෙහෙසට පමුණුවාලීමෙහි ද පචිති වේ. මේ දෙකට පචිති දෙකකි. "අඤ්ඤවාදකෙ විහෙසකෙ පාචිත්තියං" යනු ප්‍රාතිමොක්ෂ ශික්ෂාපදය යි. විචාළ දෙය තබා අනෙකක් කියන්නහුට හා නිශ්ශබ්ද වන්නහුට ත් ඤත්ති දුතියකර්මවාක්‍යයෙන් අඤ්ඤවාදක විහෙසක කර්මය කළ කල්හි මෙකී පචිති වේ. එය නො කළේ නම් දුකුළා වන්නේය යි ටීකායෙහි කිය යි.

### 175 දුට්ඨුල්ලපකාස ඡාදනෙ

දුට්ඨුල්ල යන වචනයට පාරාජිකා– සංඝාදිසෙස දෙක ම ගැනෙන ත් මෙහි දී සඞ්ඝාදිසෙසය පමණක් ගැනේ. "දුට්ඨුල්ලං නාම පාරාජිකා සඞ්ඝාදිසෙසා. ඉධ පන සඞ්ඝාදිසෙසො'ව" යනු ටීකා යි. සඞ්ඝ සම්මතයක් නැති ව අනුපසපනකුට කීමෙන් වන පචිතිය මෙයින් නිර්දිෂ්ට යි. එසේ ම උපසපන් භික්ෂුවට සැඟවීම ද පචිති සිදුවන්නකි.

### 176 හාසොදකෙ

මෙයින් අඞ්ගුලිපතොදකය සහ දියෙහි ක්‍රීඩා කිරීම ද යන දෙ කරුණින් සිදු වන පචිති දෙක ප්‍රකාශිත යි. "අංගුලි පතොදකෙ පාචිත්තියං" ක්‍රීඩා පිණිස ඇඟිලි වලින් කිසිලි ආදියෙහි කිති කැවීම මෙයින් කියැ වේ. ක්‍රීඩා පිණිස කවර ශරීරාවයවයකින් උපසපනකු සපශී කළ ත් මේ පචිතියට අසුවන බව ත්, ක්‍රීඩා පිණිස භික්ෂුණියක සපශී කිරීමේ දී ත් එසේ ම ක්‍රීඩා පිණිස භික්ෂුණියක විසින් භික්ෂුවක් සපශී කිරීමේ දී ත්, අනුපසපනකු සපශී කිරීමේ දී ත් දුකුළා වන බව ත් **මාතිකාට්ඨකථා 120** වන පිටුවේ එයි. මෙහි දී භික්ෂුණිය භික්ෂුවට ත් භික්ෂුව භික්ෂුණියට ත් සාමාන්‍ය අනුපසම්පන්නයකු මෙනි.

මේ "හාසොදකෙ" යන්නෙන් "උදකෙ හසසධම්මෙ පාචිත්තියං"යනු ද ඇතුළත්. යම් මහණෙක් ක්‍රීඩා පිණිස ගොප්මසින් උඩ තිබෙන දියෙහි කිමිදීම්– මතුවීම්– පීනීම් කරයි ද, ඔහුට ඒ සඳහා දියට බැසීමේ දී පදවාර ගණනින් දුකුළා වේ. කිමිදීම්, මතුවීම් ආදි ප්‍රයෝග ගණනින් පචිති වේ. දිය යටින් යන්නහුට හස්තවාර පදවාර ගණනින් ද දියමතුපිට පීනන්නාට ප්‍රයෝගයක් පාසා ද පචිති වේ. එසේ ම ඔරු ආදියකින් ක්‍රීඩා කිරීමෙහි ද ඒවා රිටි හබල් ආදියෙන් පදින්නාට ද; අතින් හෝ කැට කැබලිති ආදියකින් දියට ගැසීමෙහි ද, යටත් පිරිසෙයින් භාජනගත දිය හෝ කැඳ ආදියක් හෝ ක්‍රීඩා පිණිස සෙලවීම් ආදිය කරන්නාහට දුකුළා වේ. **මාතිකාට්ඨකථා 121** වන පිටුවේ සහ **බුද්දසික්ඛා ටීකායෙහි** ද මේ විස්තරය එකසේ ම යි.

### 177 නිච්ඡුභනෙ විහාරා

කෝප වී සඟසතු වෙහෙරකින් උපසපන් භික්ෂුවක් ඇද දැමීම (යැවීම) හෝ ඇද දැමීම වීම පචිති සිදුවන්නක් බව මෙයින් ප්‍රකාශිත යි. ප්‍රයෝග

ගන්නා ඇවැත් ද වේ. පරිෂ්කාර බැහැර කිරීම හෝ අනුපසම්පන්නයා ඇද දැමීම දුකුළා යි. මනා පිළිවෙත් නැත්තහු ඇද දැමීම අනාපත්ති යි. "යො පන භික්ඛු භික්ඛුං කුපිතො අනත්තමනො සංඝිකා විහාරා නික්කඩ්ඩෙය්‍ය වා නික්කඩ්ඩාපෙය්‍ය වා පාචිත්තියං" (**ප්‍රාතිමෝක්ෂ 2 වග්ගයේ 7 වන ශික්ෂාපදය**)

---

## 13 සමණකප්පාවාරා‍ති

133 **භූතගාම සමාරම්භෙ-පාචිත්ති සාත කප්පියං**
**නඛෙන වා'ග්ගි සත්ථග්ගි-භවෙ සමණ කප්පියං.**

රුක්ඛලතාදි භූත සමූහයා සිඳීම් බිඳීම් කිරීමෙහි පචිති වේ. නියෙන් හෝ ගින්නෙන් හෝ ශස්ත්‍රයෙන් හෝ කැප කරණ ලද්දේ ශ්‍රමණයනට කැප වන්නේ ය.

178 **සාතකප්පියං**

මෙයින් භූත ගාමයක් උපසපන් භික්ෂුවට කැප කොට දෙන සැටි ප්‍රකාශ වන්නේ ය. නියෙන් හෝ ගින්නෙන් හෝ ආයුධයෙකින් හෝ මේ කැප කිරීම කළ හැක. වෘක්ෂ ලතාදිය ත් ඒ වෘක්ෂ ලතාදිය ඇති වන බීජ ත් භූතගාම යන්නට ඇතුළත් ය. ඒවා සිඳීම් බිඳීම් කිරීම උපසපන් පැවිද්දනට අකැප ය. අනුපසම්පන්නකු විසින් ගොමහිෂාදි බුර හැර සෙසු මනුෂ්‍යාදි සත්වයන් ගේ පිරිසිදු නියෙන් "කප්පියං (භන්තෙ)"යි භූත ගාම යාගේ එක දෙශයක් සපශී කිරීම් වශයෙන් කටයුතු යි. උක් ආදි රාශියක් එක මිටියට බැඳ මෙසේ කැප කළ විට සියල්ල කැප කෙළේ වේ. දියෙන් මිරිකා ගත් ජුල් යුෂාදිය එක එක ඇටයක් පාසා කැප කළ යුතු ය. ඔද තය සමග මිශ්‍ර කොට එක් වරක් කැප කළ ද වරදින් මිදේ. නො එසේ නම් එබඳු ජුල් ආදි ගෙඩි කටුව බිඳ කැප කටයුතු යි. ගින්නෙන් හා ආයුධ යෙන් කැප කිරීමෙහි ද මේ ක්‍රමය යි. කප්පියං– කැපය යන වචනය කවර බසකින් කියුව ද නිවරද ය. විස්තරාර්ථිත් විසින් **මාතිකාට්ඨකථා 88-89 පිටු හා සමන්තපාසාදිකා 554- 561** පිටු ද **සාරත්ථදීපනී 797** සිට **804** දක්වා ත් කියවන්නෝ මැනැවි.

134 **සමූල ඛන්ධ බීජග්ග-ඵලු බීජප්ප භාවිතො**
**ආරම්භෙ දුක්කටං බීජං-භූතගාම වියොජිතං**

(සො) ඒ භූතගාමය තෙම හලිද්දි-සිඞ්ගිවෙරාදි මූල බීජය (කහ ඉඟුරු) ඇසතු නුග, ආදි ඛන්ධ බීජය- හිරිවේරාදි අග්ගබීජය- උක් ආදි ඵලු බීජය- මැ ආදි බීජ බීජය- කියා පස් ආකාරය. භූතගාමයෙන් වෙන් කරණ ලද බීජ ගාමය ඡේදන භෙදනාදියෙහි දුකුළා යි.

**විස්තර**

**27** මෙයින් පඤ්චවිධ බීජය සහ බීජගාම සමාරම්භයෙහි දුකුළා වන බව ත් ප්‍රකාශිත යි. රොපණය කළ හෝ නො කළ හෝ යම් බීජයක් විය හක් පමණ අංකුරයක් හටගන්නා තුරු බීජ සංඛ්‍යායෙහි ඇතුළත් ය. එය සිඳීමෙන් දුකුළා යි.

## කැප කරන සැටි

135 **නිබ්බට්ටබීජං නො බීජ-මකතඤ්චාපි කප්පති**
**කටාහ බද්ධ බීජානි-බහිද්ධා වා'පි කාරයෙ.**

(නිබ්බට්ට බීජං) ඇට හැර කෑ හැකි විලිකුන් අඹ කොස් ආදිය ද, (නො බීජං) ළා අඹ ආදිය ද, කැප නො කරන ලද්දේ ද වටී. කබල (කටුව) හා බැඳි බිජු ඇති ජුල් ආදිය කබල පිට ද කැප කරවන්නේ ය.

136 **එකාබද්ධෙසු බීජෙසු-භාජනෙ වා'පි භූමියං**
**කතෙ ච කප්පියෙ'කස්මිං-සබ්බෙස්වෙව කතං භවෙ**

බඳුනක හෝ බිම හෝ එකට බැඳි තිලාදි බීජයන් අතුරෙන් එක් බීජයක් කැප කළ කල්හි ත් සියල්ල ම කැප කෙළේ වේ.

137 **නික්ඛිත්තෙ කප්පියං කත්වා-මූලපණ්ණානි ජායරුං**
**කප්පියං පුන කාරෙය්‍ය-භූතගාමො හි සො සියා**

කැප කොට තැබූ බීජ ගාමයෙහි මුල් හෝ කොළ ඇති වේ නම්, නැවත කැප කරවන්නේ ය. එය මුල් පත් හටගත් කල්හි භූතගාම් සංඛ්‍යාවට යේ ද, එහෙයිනි.

**විස්තර**

28 මුල් පත් දෙක ම හටගත් කල්හි භූතගාම සංඛ්‍යාවට වැටෙන බව මෙයින් පැහැදිලි ය. මුල් පත් යන දෙකින් එකක් රියනක් පමණ වැඩුණ ද බීජ ගාම සංඛ්‍යාවෙහි මිස භූත ගාම සංඛ්‍යාවෙහි ඇතුළත් නොවේ. "සචෙ මූලමත්තං සඤ්ජායති උපරිභාගෙ සචෙ අඞ්කුරො ජායති හෙට්ඨාභාගෙ ඡින්දිතුං වට්ටති, මූලමත්තෙසු වා පත්ත පණ්ණමත්තෙසු වා නිග්ගතෙසු සචෙ පි රතනප්පමාණාපි සාඛා නික්ඛමන්ති බීජ ගාමසංගහිතා හොන්ති" යනු ටීකා යි.

138 **සපණ්ණො වා අපණ්ණො වා-සෙවාලො දක සම්භවො**
**චෙතියාදිසු සෙවාලො-නික්ඛන්තද්වත්ති පත්තකො**
**භූතගාමො'ව බීජම්පි-මූලපණ්ණෙ විනිග්ගතෙ**

පත් ඇති හෝ පත් නැති හෝ දියෙහි හටගත් සෙවෙල් ද, දෙතුන් පතක් නිකුත් වී තිබෙන චෛත්‍යාදියෙහි සෙවෙල් ද, මූල් හා පත් නිකුත් කල්හි බීජගාමය ද භූතගාම නම් වේ.

139 **ඝටාදි පිට්ඨසෙවාලො-මකුලං අහිඡත්තකං**
**දුක්කටස්සෙව වත්ථූනි-ඵුල්ලමව්‍යවහාරිකං**

කල කොතලාදියෙහි පිටැ සෙවෙල් ද, හියසතු කැකුල ද, (බිම්හතු මොට්ටුව ද) යන මේවා දුකුළාවට ම වස්තුහු යි. පිපී ගිය සත්ත අව්‍යවහාරිකයි. ආපත්ති ජනක නො වේ.

140 **ලාබානීයාස ජාතානි-අල්ලරුක්ඛෙ විකොපිය**
**ගණ්හතො තත්ථ පාචිත්ති-ඡින්දතො වා'පි අක්ඛරං**

නො මල ගස්හි ලා- ලඟට- හතු- ගන්නහුට ද, ඒ නොමලරුක්හි අකුරු කොටන්නහුට ද පවිති වේ.

141 පිළෙතුං නාළිකෙරාදිං-දරුමක්‍කටකාදිනා
ඡින්දිතුං ගණ්ඨිකං කාතුං-තිණාදිං න ච කප්පති

දරුමක්‍කටකාදියෙන් පොල්ගස් ආදිය පෙළන්නට ද, තෘණ ලතාදිය සිඳීම පිණිස ගැටලන්නට ද නො ම වටී. (තියුණු කොට ඇණ කාවා අතු රෙහි කටු ඔබ්ත්ල, ගේ දරුමක්‍කටක නම්. යනු පැරණි සත්‍යයි.)

142 භූතගාමං වා බීජං වා-ඡින්ද භින්දෙ'විණාහි වා
එාලෙහි විජ්ඣ පච වා-නියමෙත්‍වා න භාසයෙ

භූත ගාමය හෝ බීජගාමය හෝ සිඳ, බිඳ, පසිඳ, පලව, විදුව, පිසව යන විසින් හෝ නියම කොට නො කියන්නේ ය.

143 ඉමං කරොහි කප්පියං-ඉමං ගණ්හ ද'මාහර
ඉමං දෙහි ඉමං සොධෙ-හෙවං වට්ටති භාසිතුං

මෙය කැප කරව, මෙය ගනුව, මෙය ගෙනෙව, මෙය දෙව, මෙය ශුඩ කරව යී මෙසේ කියන්නට වටී.

---

## 14 භූමියො

144 සම්මුතුස්සාවනන්තා ච-ගොනිසාදි ගහපති
කප්පියා භූමියො යාසු-වුත්‍ථං පක්කං ච කප්පති

යම් කුටියෙක්හි තබනලද දෙය කැප වේ ද, යම් කුටියෙක්හි පිසන ලද දෙය කැප වේ ද, ඒ කැපකිළි සම්මුති ය, උස්සාවනන්තික ය, ගොනි සාදි ය, ගහපති ය, කියා වෙත්.

විස්තර

29 උස්සාවනන්තිකාදි සතර කුටි ගැන සංක්‍ෂෙප හැඳින්වීමක් මෙහි පෙළේ ම එයි. එ බැවින් විස්තර අනවශ්‍ය ය. තවත් විස්තර දනු කැමැත්තන් විසින් මහාවග්ගපාලි භෙසජ්ජක්ඛන්ධකයෙහි සීහ භාණවාරයෙන් හා එම අටුවාවේ **814-816** පිටුවලින් ද, පාළිමුත්තක විනය විනිශ්චයෙහි **104** වන පිටුවේ සිට **107** දක්වා තිබෙන විස්තරයෙන් ද දතමනාය.

155 වාසත්‍ථාය කතෙ ගෙහෙ-සංඝිකෙ වෙ'ක සන්තකෙ
කප්පියා කුටිලද්ධබ්බා-සහසෙය්‍යප්පහොනකෙ

විසීමට කළ සඟසතු හෝ එක උපසපනක්හු අයත් හෝ සහසෙය්‍ය යෙන් ඇවැත් සිදු විය හැකි ගෙහි කැපකිළි නොමෝ ලැබිය යුතු යි.

179 සහසෙය්‍යප්පහොනකෙ

අංක 161 දරණ ටිප්පණියෙන් සහසෙය්‍යප්පහොනක ගෙය හඳුන්වා ඇත. එයින් බලන්නේ මැනැවි.

146 **ගෙහෙ සංඝස්ස වෙ'කස්ස-කරමානෙ'ව චීරයං**
**පඨමිට්ඨක ථම්භාදිං-ඨපෙය්‍යුස්සාවනන්තිකා**
**"කප්පියකුටිං කරොම-කප්පියකුටිං කරොමා'ති"**

සඞ්ඝයාට හෝ එක උපසපතක්හට් හෝ ගෙයක් කරනු ලබන කල්හි පළමුකොට පිහිටුවන ගඩොළු- කණු ආදිය "කප්පියකුටිං කරෙම, කප්පිය කුටිං කරෙම" යී මෙසේ කියමින් පිහිටුවන්නේ ය. මෝ තොමෝ උස්සාවනන්තිකා නමු.

147 **යෙභුය්‍යෙනා'පරික්ඛිත්තො-ආරාමො සකලො'පි වා**
**වුච්චතෙ ගොනිසාදීති-සම්මුති සංඝ සම්මතා**

බොහෝ සෙයින් (වැඩිහරියක්) හෝ සම්පූර්ණයෙන් හෝ වැට ආදියෙන් පරික්ෂෙප නො කළ විහාරය ගොනිසාදි නමැයි කියන ලදි. සඞ්ඝයා විසින් ඤත්ති දුතියකම්ම වාක්‍යයෙන් සම්මත කරන ලද කප්පියකුටිය සම්මුති නමි.

148 **භික්ඛුං ඨපෙත්වා අඤ්ඤෙහි-දින්නො තෙසං වසන්තකො**
**අත්ථාය කප්පකුටියා-ගෙහො ගහපති මතො.**

උපසපතක්හු හැර සාමණෙරාදි සෙස්සන් විසින් කප්පියකුටියක් පිණිස දෙන ලද්ද හෝ ඔවුන් ම සතු ගෙය හෝ ගහපති කුටිය යි දත්තා ලදි.

149 **අකප්පකුටියා වුත්ථං-සප්පිආදීහි මිස්සිතං**
**වජ්ජෙය්‍ය අනෙනා වුත්ථනං-පුරිමං කාලිකද්වයං**

අකැප කිළිය ඇතුළෙහි ලැගි (තිබුණු) ගිතෙල් ඈ සත්තාහකාලිකයන් හා යාවජීවිකයන් සමග මුසු වූ පළමු කාලිකද්වය අකැප කිළියෙහි ලැගි බවට යන්නේ ය.

150 **තෙහෙව භික්ඛුනා පක්කං-කප්පතෙ යාවජීවිකං**
**නිරාමිසං ච සත්තාහං-සාමිසෙ සාමපාකතා**

ඒ අකැප කිළියෙහි තුබුණු සප්පි ආදි සත්තාහකාලිකයන් හා එක් කොට ම භික්ෂුව විසින් පිසන ලද යාවජීවිකය ආමිෂ රහිතව ම සත්දවස කට වටී. ආමිෂ හා මුසු කල්හි තමා පිසූ බව වේ.

151 **උස්සාවනන්තිකා යෙහි-ථම්භාදීහි අධිට්ඨිතා**
**තෙසුයෙවා 'පනීතෙසු-තදඤ්ඤෙසු'පි තිට්ඨති.**

යම් ටැම් ආදියකින් උස්සාවනන්තිකා කුටිය පිහිටුවන ලද නම් ඒවා ඉවත් කළ කල්හි ද අන්‍යවස්තූන් කෙරෙහි ඒ කුටිය පවතී.

152 **සබ්බෙසු අපනීතෙසු-භවෙ ජහිත වත්ථුකා**
**ගොනිසාදි පරික්ඛිත්තෙ-සෙසා ඡදනවිබ්භමා'ති**

සියල්ල හළ කල්හි හරණලද කුටි වස්තු ඇති වේ. (සමූහතය වේ.) ගොනිසාදි කුටි තොමෝ වැට ආදියෙන් වට කළ කල්හි සමූහතය වේ. සෙසු සම්මුති- ගහපති යන කිළි පියසි විනාශයෙන් සමූහතය වේ.

## 15 උපජ්ඣා'චරියවත්තානි

153 නිස්සායුපජ්ඣාචරියෙ-වසමානො සුපෙසලො
දන්තකට්ඨා'සනං තොයං-යාගුං කාලෙ දදෙ සදා

උපාධ්‍යාය ආචාර්ය දෙදෙනා ඇසුරු කොට වසන ශික්ෂාකාමී භික්ෂු තෙමේ සුදුසු කල්හි දැහැටි දඬු ද, හිඳිනා අසුන් ද, හුණු දිය ඇල් දිය දෙකින් සුදුසු දිය ද, කැඳ ද, හැම කල්හි ම දෙන්නේ ය.

154 පත්තෙ වත්තං චරෙගාම-ප්පවෙසෙ ගමනා'ගමෙ
ආසනෙ පාදපීඨෙ ච-කථලො'පාහන චීවරෙ

පාත්‍රයෙහි ද, ආචාර්ය උපාධ්‍යායයන් ගම්වදනා කල්හි ද, තෙමේ පච්ඡා සමණ වැ ගම්වදනා කල්හි ද, නැවත ඊමෙහි ද, ඔවුන් හුන් ආසන යෙහි ද, දෙවි පා තබන පුවරුයෙහි ද, නො දෙවි පා තබන පුවරුයෙහි ද, වහන්හි ද, සිවුරෙහි ද වත් පුරන්නේ ය.

155 පරිභොජිය පානීයෙ-වච්ච පස්සාව ඨානිසු
විහාරසොධනෙ වත්ත-පුන පඤ්ඤපනෙ තථා

පරිභොග ජලයෙහි හා පැන්හි ද, වැසිකිළි කෙසකිළි (කරන) තන්හි ද ඔවුන් වසන සෙනසුන් හැමදීමෙහි ද, නැවත ඒ හැඳපුටු ඈ සෙනසුන් පැණවීමෙහි ද, කළමනා වත් පුරන්නේය.

156 න පප්ඵොටෙය්‍ය සොධෙන්තො-පටිවාතෙ ච පඞ්ගණෙ
විහාරං භික්ඛු පානීයං-සාමන්තා සයනාසනං

ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලා වසන සෙනසුන් හමදනා මහණ තෙමේ උඩුසුලඟෙහි ද, බොහෝ දෙන රැස්වෙන මිදුලෙහි ද, පැන් අවට ද බුමුතුරුණු ඈ සෙනසුන් ගසා නො දමන්නේ ය.

157 නහානෙ ච නහාතස්ස-රඞ්ගපාකෙ'ථ ධොවනෙ
සිබ්බනෙ චීවරෙ ථෙවෙ-රජන්තො න වජෙ ඨිතෙ

නාන කල්හි ද, නා අවසන්වූවහුට කළමනා දෙයෙහි ද, පඬු පිසීමෙහි ද සිවුරු සේදීමෙහි ද, සිවුරු ගෙත්තම් කිරීමෙහි ද, එසේ ම වත් පුරන් නේ ය. සිවුරු පඬුපොවන්නේ සිවුරෙහි පඬු බින්දු නො සිටි කල්හි නො යන්නේ ය.

158 එකච්චස්ස අනාපුච්ඡා-පත්තං වා චීවරානි වා
න දදෙය්‍ය න ගණ්හෙය්‍ය-පරික්ඛාරං ච කිඤ්චි යං

ආචාර්ය උපාධ්‍යායයන්ට විපක්ෂ පුද්ගලයකුට පාත්‍රයක් හෝ සිවුරු හෝ වෙන යම්කිසි පිරිකරක් හෝ ආචාර්ය උපාධ්‍යායයන් නො විචාරා නො දෙන්නේ ය. ඔවුන් අතින් තෙමේ ද නො ගන්නේ ය.

159 එකච්චං පච්ඡතො කාතුං-ගන්තුං වා තස්ස පච්ඡතො
පිණ්ඩපාතං ච නීහාතුං-නීහරාපෙතු මත්තනො

ගුරුනට විපක්‍ෂයා තමාගේ පච්ඡාසමණයා කරගන්නට ද, ඔහුගේ පච්ඡාසමණයා වන්නට ද, පිණ්ඩපාතය ගෙන යන්නට ද, තමහට ගෙන්වා ගන්නට ද-

160 කිච්චං වා පරිකම්මං වා-කෙසච්ඡෙදං'ව අත්තනො කාරපෙතුං'ව කාතුං වා-අනාපුච්ඡා න වට්ටති

කුදු මහත් කර්මයක් හෝ හස්තකර්මාදි පරිකර්මයක් හෝ හිස කෙස් බෑවීමක් හෝ තමාට ඔහු ලවා කරවන්නට ද, කරන්නට හෝ ආචාර්ය්‍ය උපාධ්‍යායයන් නො විචරා නො වටී.

161 ගාමං සුසානං නිස්සීමං-දිසං වා ගන්තුමිච්ඡතො අත්තනො කිච්චයංවා'පි-අනාපුච්ඡා න වට්ටති

ගම්ය, සොහොනය, විහාර සීමායෙන් පිටත ය, දිසාව ය යන යම් තැනකට යනු කැමැත්තහුට හෝ ඇතුළු වෙහෙර පාත්‍ර පචනාදි ස්වකීය කෘත්‍යයක් හෝ ආචාර්ය්‍ය උපාධ්‍යායයන් නො විචාරා නො වටී.

162 උප්පන්නං අරතිං දිට්ඨිං-කුක්කුච්චං වා විනොදයෙ කාරෙය්‍යවා'පි උස්සුක්කං-සඞ්ඝායත්තෙසු කම්මසු

ආචාර්ය්‍ය උපාධ්‍යායනට ඇති වූ කලකිරීම් ද, මිථ්‍යාදෘෂ්ටි ද, විනය පිළිබඳ කුකුස් ද, දුරු කරන්නේ ය. සඟහු අයත් වූ පරිවාසාදි කර්මයන්හි උත්සුක කරන්නේ ය.

163 ගිලානෙ [1]ච උපට්ඨෙය්‍ය-වුට්ඨානං තෙස'මාගමෙ වත්තභෙදෙන සබ්බත්ථ-අනාදරෙන දුක්කටං.

ගිලන් වූ ආචාර්ය්‍ය උපාධ්‍යායයන් උපස්ථාන කරන්නේ ය, ඔවුන් වහන්සේලා ගේ රොගයෙන් නැඟීම බලාපොරොත්තු වන්නේ ය. මෙකී හැම වත්හි ම අනදර කිරීම් වශයෙන් වත් බිඳීමෙන් දුකුළා වේ.

**විස්තර**

30 මෙතෙක් ගාථා එකොළසකින් අන්තෙවාසික- සද්ධිවිහාරිකයන් විසින් ආචාර්ය්‍ය උපාධ්‍යායයන් කෙරෙහි කළමනා වත් ප්‍රකාශ කරන ලදි. මෙහි සඳහන් නො කරණ ලද තවත් නොයෙක් වත් තිබේ. ඒවා අතර ආචාර්ය්‍ය උපාධ්‍යායයන් තමා සමග හෝ අනෙකකු සමග හෝ කථා කරන කලැ ඒ අතරෙහි කථා නො කටයුතු බව, ආදිය ඇතුළත්. විස්තර දැනගනු කැමැත්තන් විසින් මහාවග්ගපාලියේ මහාඛන්ධකයෙහි (41-51 පිටු අතර) එන ආචාර්ය්‍ය උපාධ්‍යාය වත් බලා දතයුතු යි. **පාළිමුත්තකවිනය විනිශ්චයයේ** 204 සිට දැක්වෙන විස්තරය තවත් කරුණින් යුක්තය. අන්තෙවාසික සද්ධිවිහාරිකයන් අසනීප වූ කල්හි ආචාර්ය්‍ය උපාධ්‍යායයන් විසින් ද මේ වත් අතර හැමෙකක් ම පාහේ කටයුතු ය. අන්තෙවාසික සද්ධිවිහාරිකයන් ගම්වදනා කල්හි පච්ඡාසමණයකු නොවීම බඳු වත් පමණකි ඇතුළත් නොවෙනුයේ. එසේ වුවත් ආචාර්ය්‍ය උපාධ්‍යායයන් විසින්

[1] සුපට්ඨෙය්‍ය බු. ඉං.

අන්තෙවාසික සද්ධිවිහාරිකයන් කෙරෙහි කළමනා වෙසෙසි වත් ද තිබේ. “උපජ්ඣායෙන භික්ඛවෙ සද්ධිවිහාරිකම්හි සම්මාවත්තිතබ්බං, තත්‍රායං සම්මාවත්තනා: උපජ්ඣායෙන භික්ඛවෙ සද්ධිවිහාරිකො සඞ්ගහෙතබ්බො අනුග්ගහෙතබ්බො උද්දෙසෙන පරිපුච්ඡාය- ඔවාදෙන- අනුසාසනියා. සචෙ උපජ්ඣායස්ස පත්තො හොති, සද්ධිවිහාරිකස්ස පත්තො න හොති උපජ්ඣායෙන සද්ධිවිහාරිකස්ස පත්තො දාතබ්බො, උස්සුක්කං වා කාතබ්බං කින්ති නු ඛො සද්ධිවිහාරිකස්ස පත්තො උප්පජ්ජෙය්‍යා''ති. (**මහාවග්ගපාළි 47**) මෙයින් උපාධ්‍යායයා විසින් අන්තෙවාසිකයාට උදෙසීම්-පිළිවිසීම්- අවවාද කිරීම්- අනුශාසනා කිරීම් වශයෙන් සංග්‍රහ කටයුතුවාක් මෙන් ම අන්තෙවාසිකයාට පාත්‍රයක් නැතිව තිබිය දී උපාධ්‍යායයන් වහන්සේට අතිරේක පාත්‍රයක් තිබේ නම් එය දිය යුතු බව ත් ප්‍රකාශිත යි. එපමණක් ද නොව චීවරාදිය නැති කල්හි ද මෙසේ ම දිය යුතු ය. ආචාර්‍ය්‍ය සද්ධිවිහාරික දෙ පක්‍ෂය අතර ද මෙසේම යි. උපජ්ඣාය සද්ධිවිහාරික දෙපක්‍ෂය ත්, ආචරිය අන්තෙවාසික දෙපක්‍ෂය අතර ත් පිය- පුත් සිත් පහළ කර ගතයුතු බව නියම කළ සේක.

“අනුජානාමි භික්ඛවෙ උපජ්ඣායං'' උපජ්ඣායො භික්ඛවෙ සද්ධිවිහාරිකම්හි පුත්තචිත්තං උපට්ඨපෙස්සති, සද්ධිවිහාරිකො උපජ්ඣායම්හි පිතුචිත්තං උපට්ඨපෙස්සති, එවං තෙ අඤ්ඤමඤ්ඤං සගාරවා සප්පතිස්සා සභාගවුත්තිනො විහරන්තා ඉමස්මිං ධම්මවිනයෙ වුඩ්ඪිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජිස්සන්ති'' (**මහාවග්ග 42**)

“අනුජානාමි භික්ඛවෙ ආචරියං, ආචරියො භික්ඛවෙ අන්තෙවාසිකම්හි පුත්තචිත්තං උපට්ඨාපෙස්සති අන්තෙවාසිකො ආචරියම්හි පිතුචිත්තං උපට්ඨාපෙස්සති, එවං -පෙ- (**මහාවග්ග 58**)

ගිලන් කමින් ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් ගේ වත් නො කිරීම ආපත්ති ජනක නොවේ. සැටවස් ගිය ද නො ගිලන් කෙනකු න් විසින් මේ වත් නො කිරීමෙන් වත්තභෙදයෙහි දුකුළා වේ. **සාරත්ථදීපනියේ** උපජ්ඣාය වත්හි එය එන්නේ මෙසේ ය. “අගිලානෙන හි සද්ධිවිහාරිකෙන සට්ඨිවස්සෙනාපි සබ්බං උපජ්ඣායවත්තං කාතබ්බං අනාදරෙන අකරොන්තස්ස වත්තභෙදෙ දුක්කටං'' (**පුස්කොළ පිටපත**)

## 180 උපජ්ඣාචරියෙ

උපජ්ඣාය යන්නෙන් “වජ්ජාවජ්ජං උපනිජ්ඣායතීති උපජ්ඣායො'යි **සාරත්ථදීපනී විනයටීකායෙහි** (පුස්කොළ පිටපත්හි) දක්වෙන පරිදි කුදු මහත් වැරදි සොයා අවවාද අනුශාසනා කරන උතුමා උපාධ්‍යායයන් වහන්සේ ය. “වජ්ජා වජ්ජං'' යනු “ඛුද්දකං මහන්තං ච වජ්ජං'' යනු **සාරත්ථදීපනියෙහි ත් විමතිවිනොදනී 367** වන පිටුවෙහිත් දක්වේ. “අයමකාරෙ එලා එලන්ති ආදිසු විය'' යි **සාරත්ථදීපනියෙහි** වෙසෙසින් දක්වෙන හෙයින් 'අවජ්ජ' යනු කුඩා වැරදි යි. “ඉදං තයා දුක්කටං දුබ්භාසිතං'' යනාදීන් කියා ඇවැත් සිහිකරවා දීමට ඒ ශිෂ්‍යයන් කෙරෙහි සිත

යොමුකරවා විසීම උපාධ්‍යායයාගේ සිරිත යි. උපාධ්‍යායයකු අනුදත වද රන්නට කාරණ වූයේ ද අනුපජ්ඣායක වැ විසූ භික්ෂූන් ශ්‍රමණ ආකල්ප යෙන් තොර ව හැසිරුණු හෙයිනි. "තෙන ඛො පන සමයෙන භික්ඛූ අනුපජ්ඣායකා අනොවදියමානා අනනුසාසියමානා දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්ප සම්පන්නා පිණ්ඩාය චරන්ති" (මහාවග්ග)

## 181 ආචරිය

ආචරිය යනු ආචාරයෙහි හා උද්දෙසාදියෙහි ත් හික්මවන්නා යි. "එවං තයා බුඩවචනං සජ්ඣායිතබ්බං, එවං අභික්කමිතබ්බං එවං පටික්කමි තබ්බන්ති ආදිසු ආචාරසික්ඛාපනෙ ආචරති පවත්තතීති ආචරියො" යි ටීකායෙහි එන පරිදි මෙසේ කළ යුතුය, යනාදි විසින් ආචාරයෙහි හා මෙසේ සජ්ඣායනා කළ යුතු ය යනාදීන් අධ්‍යාපනයෙහි ද හික්මවාලන උතුමා ආචාර්‍ය්‍ය නම්. ආචාර්‍ය්‍යවරු සිවුදෙනෙක් වෙත්. "නිස්සය-පබ්බජ්ජා- උපසම්පදා- ධම්මාචරිය" යි. ඔවුනතුරින් "නිස්සයාචරියයා" නම්. "ආචරි යො මෙ භන්තෙ හොහි, ආයස්මතො නිස්සාය වච්ඡාමි" යි තෙවිටක් කියා යම් ගුරුවරයකු වෙතැ නිස සමාදන් වැ වෙසේ නම්, ඒ ගුරුවරයා යි. යම් තාක් කාලයක් ඔහු යටතේ වෙසේ ද, ඒ තාක් කල් වත් සපුරමින් විසිය යුතු ය. නැණවතකු විසින් වුව ද අඩුගණනේ පස් වසක් වත් මෙසේ නිස ගෙන විසිය යුතු ය. ගුරුවරුන් ගේ ඇස්බැල්මෙන් තොර ව තම තට ම වරදින් මිදී විසිය නො හැක්කකු විසින් තම ජීවිතාන්තය තෙක් ම ගුරුවරයකු යටතේ විසුව මනා ය. පබ්බජ්ජාචරිය නම්; පැවිදි කළ ගුරු වරයා යි. උපසම්පදා චරිය නම්; උපසම්පදායෙහි දී කර්මවාක්‍යාචාර්‍ය්‍යයෝ යි. ධම්මාචරියයෝ නම්: විනය බණ දහම් උගන්වන්නෝ යි.

## 182 දන්තකට්ඨ

දන්තකට්ඨ යනු දැහැටි යි. දැහැටිවක් අඟල් සතරකට අඩු නොවිය යුතු. අඟල් අටකට වඩා දික් නොවිය යුතු යි. (චූලවග්ග 232 පිටුව) ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් උදෙසා දැහැටි දෙන විට මුලදී මහන්තමජ්ඣිම ඛුද්දක යි දැහැටි තුනක් දිය යුතු යි. එයින් තෙදිනක් යමක් ගනී නම් සිවු වැනිදා සිට එපමණ දැහැටිවක් දිය යුතු ය. (විනයට්ඨකථා 730)

## 183 තොයං

දිය දෙන්නහු විසින් ද උණු දිය ඇල්දිය දෙක ම තෙදිනක් දී එයින් යමක් ගනී නම් සිවුවැනිදා සිට එය දියයුතු බව විනයට්ඨකථායෙහි 730 පිටුවේ එයි.

## 184 පත්තෙ වත්තං

මෙයින් පාත්‍රයෙහි කළමනා වත් කිරීම ගැනේ. පාත්‍රයෙහි ඉඳුල් අහර හිස් කොට හොඳින් සෝදා පිසදමා මඳක් උණුසුම්හි තවා සම් ආදි යමක් අතුරා ඇති තැන ග තැබීම පාත්‍රයෙහි වත් ය. අඞ්ක 73 වන ගාථා වේ සිට 76 වන ගාථාවසානය තෙක් ඇති විපස්සී ආදිය මීට අයත් වන හෙයින් එය බලා විස්තර දත්තේ ය.

185 **ගාමපවෙසෙ**

ආචාර්‍යෝපාධ්‍යායයන් (පිඬු පිණිස) ගම්වදනා කල්හි නිවාසනය (අඳනය) දීම, පටිනිවාසනය පිළිගැනීම, කායබන්ධනය දීම, සගුණ කොට සඟල සිවුරු දීම, සෝදා දිය සහිත පාත්‍රය දීමාදි කළමනා වත් මෙයින් දක්වේ.

186 **ගමනාගමනෙ**

යෑම් ඒම් දෙක්හි කළමනා වත් මෙහි ලා ඇතුළති. ආචාර්‍යෝපාධ්‍යායයන් පච්ඡාසමණයකු කැමැති වන විට තෙමේ ද හැඳ පෙරෙවැ ඒ සමග යන්නේ ය. ගොස් උන්වහන්සේගේ පාත්‍රය බර හෝ උණු හෝ වේ නම් පාත්‍ර දෙක මාරු කැර ගන්නේ ය. ඒමෙහි දී තෙමේ පළමු ව අවුත් අසුන් පැණවීම් පැන් තැබීම් ආදිය කොට පෙරට ගොස් පා සිවුරු පිළිගන්නේ ය. මේ එහි ලා වති.

187 **උපාහන චීවරෙ**

උපාහනය සහ සිවුර පිළිබඳ වත් මෙයින් කීහ. උපාහනය වියළි රෙදිකඩකින් පිසදමුව මනා කල්හි එලෙස කිරීමත් තෙත් රෙදිකඩකින් පිසදමුව මනා කල්හි එසේ කිරීම ත් උපාහන වත් නමි. දහඩියෙන් තෙත් සිවුරු මොහොතක් උෂ්ණයෙහි තැබීම ත් ඉන්පසු සිවුර එක එක දිනට එක එක තැනින් නැමෙන සේ අකුලා සිවුරු නූල හෝ සිවුරු දණ්ඩ පිරිවැද සිවුර තැබීමත් සේදූකල දිය බින්දු වැටී අවසන් වන තුරු එතැනින් නො යාමත් සිවුර පිළිබඳ වති.

188 **වච්චපස්සාව ඨානිසු**

වැසිකිළි කෙසකිළි දෙක්හි හැමදීම් ශීතොෂ්ණ ජලය එළවා තැබීම් ආදිය එහි කළමනා වත් ය.

189 **නහානෙ ච**

හැඳ සිටි සිවුරු පිළිගැනීම්- අවශ්‍ය නහානමත්තිකාදි ද්‍රව්‍ය සැපයීම් ඇඟ ඉලීම් ආදිය යි.

190 **නහාතස්ස**

නා අවසන් වූ කලැ දිය පිස්නය දී අනතුරු ව නිවාසන පාරුපනාදිය දීම නැවහුව කරන වත් ය.

191 **ගාමං සුසානං නිසසීමං දිසං වා ගන්තුමිච්ඡතො- අනාපුච්ඡා න වට්ටති.**

මෙයින් ආචාර්‍යෝපාධ්‍යායයන් නො විචාරා කිසි තැනකට යෑම නො වටීය යි කියා තිබේ. එහෙත් මීට විරුඬාර්ථයක් සමන්තපාසාදිකායෙහි **738** වන පිටුවෙහි එයි. එනම්: න දිසාපක්කාමිතබ්බාති එත්ථ පක්කමිතුකාමෙන කම්මං ආචික්ඛිත්වා යාව තතියං යාචිතබ්බො, සචෙ අනුජානාති

සාධු. නො වෙ අනුජානාති තං තිස්සාය වසතො වස්ස උද්දෙසො වා පරිපුච්ඡා වා කම්මට්ඨානං වා න සම්පජ්ජති, උපජ්ඣායො බාලො හොති අව්‍යත්තො, කෙවලං අත්තනො සන්තිකෙ වසාපෙතු කාමතාය එව ගන්තුං න දෙති, එවරූපෙ නිවාරෙන්තො'පි ගන්තුං වට්ටති" කියා යි. යනු කැමැති කල්හි යන කරුණ කියා තෙවිටක් අවසර ඉල්විය යුතු ය. එසේත් අවසර නොදී ඒ උපාධ්‍යායයන් තමන් වෙතැ ම නවත්වා ගන්නට සූදනම් වේ නම් එසේ නතරවීමෙන් නාම දියුණුවත් පිරිහේ නම් යා යුතු ය, යනු එහි කෙටි අදහස යි.

---

## 16 වච්චපස්සාවට්ඨානිකං

164 න කරෙය්‍ය යථාවුඩ්ඪං-වච්චං යාතානුපුබ්බියා
වච්චපස්සාවකුටියො-නහානතිත්ථඤ්ච ලබ්භති

වැසිකිළි කිස මහලු පිළිවළින් නො කරන්නේ ය. වැසිකිළි කෙසකිළි ද නහනතොට ද ගිය පිළිවෙළින් ලැබේ.

**විස්තර**

31 වෘද්ධ පටිපාටිය බොහෝ තන්හි දී සැලැකුව මනා වුව ද වැසිකිළි කෙසකිළි කිස හා නෑම ද ආගතපටිපාටියෙන් කළයුතු බව මෙයින් උගන්වන ලදි.

165 පවිසෙය්‍යුබ්භජිත්වා නො-සහසා පවිසෙය්‍ය ච
උක්කාසිත්වා වුබ්භජෙය්‍ය-පාදුකාසෙව සණ්ඨිතො

පිටත දී ම අඳනය ඔසවාගෙන ද, ඉක්මන්ව ද, වැසිකිළි කෙසකිළි වලට නො වදින්නේ ය. බැහැර සිට කාරා ශබ්ද කොට ඇතුළට යන්නේ ය. පාදුකා මත සිටියේ ම අඳනය ඔසවන්නේ ය.

166 න කරෙ නිත්ථුනං වච්චං-දන්තකට්ඨං'ව ඛාදයං
වච්චපස්සාව දොණීනං-න කරෙය්‍යුභයං බහි

නතනමින් (තටමමින්) හෝ දැහැටි දඬු කමින් වැසිකිළි කිස නො කරන්නේ ය. වච් පස්සාව දෙණින් ගේ පිටත මළමූත්‍ර දෙකිසෙන් එකකුදු නො කරන්නේ ය.

167 කූපෙ කට්ඨං න පාතෙය්‍ය-බෙලං පස්සාව දොණියා
නාවලෙඛෙය්‍ය ඵරුසෙ-නූහතඤ්චාපි ධොවයෙ

අශුචි වළෙහි පුසන් දණ්ඩ නො දමන්නේ ය. කෙසකිළි පාදුකායෙහි කෙළ ද නො ගසන්නේ ය. ගොරෝසු පුසන් දණ්ඩෙන් නො පිස්නේ ය. කොලෙසුණු හැතුදු සෝදන්නේ ය.

168 න නික්ඛමෙය්‍ය සහසා-උබ්භජිත්වාන නික්ඛමෙ
චපු චපු නා'චමෙය්‍ය-උක්ලාපංච විසොධයෙ.

178 **මල්ලකෙනා'ඤකඤමඤකඤං වා- සරීරෙන න සංඝසෙ**
**කපාලිටඨක ඛණ්ඩානි-වණ්ණවට්ටි ච වට්ටති**

179 **සබ්බසං පුථුපාණී ච-ගිලානස්සා'කත මල්ලකං**
**පාසාණ ඵෙණ කඨලා-[1]කප්පියා පාදඝංසනෙ.**

මල්ලකයෙන් හෝ ඔවුනොවුන් සිරුරින් හෝ සිරුර නො ගටන්නේ ය. කබල්කඩ හා පතුලුකඩ ද පිළිවැටිය ද ඔවුනොවුන් අතින් ඉලීම ද ගිලන් නො ගිලන් සියල්ලන්හට ම වටී. ගිලන්හට දැති නො සුන් මල්ල කය වටී. පාෂාණය, මුදු පෙණ ය, කැබිලිති ය යන මොහු පා ගැටීමෙහි කැපයෝ ය.

193 **අට්ඨානෙ**

මෙයින් ස්නාන ස්ථානයෙහි සිටැ වූ පුවරු වෙසෙසක් පැවැසේ. "එත්ථ අට්ඨානං නාම රුක්ඛ ඵලකං විය තච්ඡෙත්වා අට්ඨපදකාරෙන රාජියො ඡින්දිත්වා නහානතිත්ථෙ නිඛණන්ති" සී **විනයට්ඨකථා 887** වන පිටුවෙහි තෝරා තිබේ. මෙහි අට්ඨාන නම් ගස් පුවරුවක් මෙන් සැස අට්ඨපද නම් වූ අට කොටස් කොට බෙදූ ද්‍යූත ඵලකයක් (සුදු ලෑල්ලක්) මෙන් පේළි වෙන් වෙන් කොට නානතොටැ සිටුවන්නකැයි පැවැසේ. එහි සිරුර ඇතිල්වීම සදෙසි.

194 **ගන්ධබ්බහත්ථෙන**

නහන තොට තිබෙන දඬුමුවා අතින් යනු යි. මනුෂ්‍යයෝ ඒ දඬුමුවා අත්හි සුවඳ සුණු ආදිය ආලේප කොට එයින් ඇඟ උලත්, භික්‍ෂූනට එය "න භික්ඛවෙ ගන්ධබ්බ හත්ථෙන නහායිතබ්බං, යො නහායෙය්‍ය ආපත්ති දුක්කටස්ස" සී නහනම් කළහ.

195 **කුරුවින්දකසුත්තියා**

කුරුවින්දක පාෂාණචූර්ණ ලාකඩ සමග මිශ්‍ර කොට සාදාගත් කැබැල්ල කැයි **විනයට්ඨකථාවේ** (888) පැවැසේ. **ඛුද්දසික්ඛා ටීකාවෙහි** "කුරුවින්ද කපාසාණ චුණ්ණානි ලාඛාය බන්ධිත්වා කත ගුලිකාවලියා සුතෙනාත ආවුණිත සුත්තියා" සී කුරුවින්දක පහණසුණු ලාකඩ දිය හා මිශ්‍ර කොට සවි වූ කල්හි එබඳු කිපයක් නූලකින් අමුණා සාදාගත් එකක් බව කිය යි. යට දක්වූ අදහස සපිරවීමට 'තං උභොසු අන්තෙසු ගහෙත්වා සරීරං සංඝසෙන්ති' යන **විනයට්ඨකථා** වාක්‍යය ද උදවු වේ.

196 **මල්ලකෙන**

මෝර දත් මෙන් කැටයම් කොට පියුම් කෙමියක් මෙන් කරන ලද් දකි. එය ගිලන් නො ගිලන් කිසිවකුට නො වටී. අකතමල්ලකය (දත් මෙන් කැටයම් නොකළ එක) ගිලනාට පමණක් වටී.

197 **වණ්ණවට්ටි**

රෙදි අඹරා හෝ එකට මසා හෝ ඇඟ ඉලීමට සාදාගත් යම්කිසිවක් මීට ඇතුළති.

---

[1] කප්පන්ති. බු. ඉං. ටීකා.

## 20 අවජ්ජියා

180 **උක්ඛිත්තො'නුපසම්පන්නො-නානාසංවාස භූමිපො**
**බාලො ච ගරුකට්ඨො ච-පණ්ඩකො ච අවජ්ජියා'ති.**

උක්ෂේපණීකම් ලද තැනැත්තා ද, අනුපසපන්නා ද, ලබ්ධිනානාසංවාසකයා හා සත්‍රිය ද, බාල මහණ ද, ගරුකස්ථයා ද, **පණ්ඩකයා** ද, යන මොහු අවර්ජ්‍යයෝ යි.

198 **උක්ඛිත්ත**

මෙසින් සංඝයා විසින් කරණ ලද උත්ක්ෂේපණීය කම් ලැබූ මහණ තෙමේ කියැ වේ. ඇවැත් පෙන්නා දෙන විට ද නො දැකීම, එවාට පිළියම් කැරැ නො ගැනීම, ලාමක දෘෂ්ටි බැහැර නො කිරීම යන ත්‍රිවිධ කරුණින් භික්ෂුවක්හට උත්ක්ෂේපණීයකම් කට හැකි ය. විස්තර දනු කැමැත්තන් විසින් **චූලවග්ග කම්මක්ඛන්ධකයේ 36** වන පිටුව සිට කියවා දන්නේ ය.

---

## 21 චම්ම'න්ති

181 **මිගා'ජේ'ළකා චම්මානි-කප්පන්ති පරිභුඤ්ජිතුං**
**රොහිතෙ'ණී පසාදා ච-කුරුඞ්ගා මිගජාතිකා.**

මුව- එළු- තිරළු යන සම් ඇඳ පුටු ආදියෙහි අතුරා පරිභොග කිරීමට කැප ය. රොහිත එණී පසද යන මොහු ද කුරුඞගයෝ ද මුව ජාතීහු යි. (එහෙයින් කැප යි.)

182 **අනුඤ්ඤාතත්තයා අඤ්ඤං-චම්මං දුක්කටවත්ථුකං**
**ථවිකො'පාහනෙ චම්මං-සබ්බං කප්ප'තමානුසන්ති.**

අනුදත් තුන් සම් මිස සෙසු සම් දුකුළා වති. මිනිස් සම් නොව සෙසු සම් සියල්ල ම ථවික (පසුම්බි) උපාහන දෙක්හි ලා කැප වේ.

**විස්තර**

32 මේ දෙ ගයින් සම් ඇතිරිලි ගැන සංක්ෂේපයෙන් සඳහන් කොට තිබේ. "අනුජානාමි භික්ඛවෙ සබ්බ පච්චන්තිමෙසු ජනපදෙසු චම්මානි අත්ථරණානි එළකචම්මං අජචම්මං මිගචම්මන්ති" **මහාවග්ග පාලි චම්මක්ඛන්ධකයෙහි** (232) අනුදැන වදාළ සම් ඇතිරිලි ත් **අට්ඨකථායෙහි** (809) ආ කීපයකු ත් මෙහි දක්වා තිබේ. "මිගචම්මෙ එණිමිගො වාතමිගො පසද මිගො කුරුඞ්ගමිගො මිගමාතුකො රොහිතමිගොති එතෙසං යෙව චම්මානි වට්ටන්ති" යි (**සමන්තපාසාදිකා** 809) ප්‍රකාශිත වාතම්ග මිගමාතුක යන මුවන් දෙවගය මෙහි සඳහන් වී තැන.

"මක්කටො කාළසීහො ච-සරභො කදලීමිගො
යෙ ච වාළමිගා කෙචි-තෙසං චම්මං න වට්ටති."

වාතර ය, කාළමූඛවාතර ය, සරභමිග ය, කදලීමිග ය යන මොහු හා සිංහාදි ව්‍යාළ මෘගයන් ගේ සම් ද නො වටින බව ප්‍රකාශිත යි. එබැවින්

යටත් පිරිසෙයින් ගව මහිෂ සස මිළාරාදීන් ගේ සම් ද අකැප වේ. ඔවුන් ද ව්‍යාළමෘග සංඛ්‍යාවට වැටෙන හෙයිනි. ව්‍යාළමෘගයන් ගේ සම් ද බුමු තුරුණු වශයෙන් පරිභොග කිරීමෙහි වරදක් නැති බව විමතිවිනොදනී ටීකායෙහි (430) පැවැසේ.

---

## 22 උපාහනාචෙවා'ති

183 මජ්ඣදෙසෙ න කප්පන්ති - ගණඞ්ගණූපාහනා නවා
සබ්බස්ස කප්පන්තා'රාමෙ - සබ්බත්ථා'ගිලානස්ස ච

නව ගණඞ්ගණූපාහනයෝ මධ්‍යදෙශයෙහි අකැප වෙති. (පැරණි ගණඞ්ගණූපාහනයෝ (=පටවල් සතරින් වැඩි වහන් මධ්‍යදෙශයෙහි ද කැපවෙති.) 'මධ්‍යදෙශයෙහි ද ප්‍රත්‍යන්තයෙහි ද ගිලන් නො ගිලන් සෑට ත් ආරාමයෙහි වටිත්. ගිලනාහට ග්‍රාමය විහාරය යන හැම තන්හි ම වටිත්.

184 සබ්බනීලක ඔදාත - පීත ලොහිත කණ්හකා
මහාරඞ්ග මහානාම - රඞ්ගරත්තා චු'පාහනා

හැම නිල් වූ, හැම සුදු වූ, හැම රන්වන් වූ, හැම රත් වූ, හැම කළු වූ වහන් ද, රත්වායන්පිට පැහැ සේ පැහැ ඇති වහන් ද, තුනු පියුම් පෙති පැහැ සේ රත් වූ වහන්ද,

185 සබ්බමඤ්ජට්ඨකා චිත්‍රා - නීල පීතාදි වද්ධිකා
තිත්තිර පත්තිකා මෙණ්ඩ - අජවිසාණ වද්ධිකා

හැම මදටවන් වහන් ද, මාලාකම් ලතාකම්මාදියෙන් විසිතුරු වහන්ද, නිල් රන් ඈ පැහැති පටි ඇති වහන් ද, තිත්තිර පත් බඳු පාට වූ වරැ'ති වහන් ද, මැඩෙළුවන් ගේ සහ තිරළුවන්ගේ අං වැනි වර ඇති වහන් ද,

186 ඛල්ලබද්ධා පුටබද්ධා - තූලපුණ්ණා චු'පාහනා
පාලිගුණ්ඨිමකා මොර - පිඤ්ඡෙන පරිසිබ්බිතා

විළුඹ වසා සිටිනා වහන් ද, කකුලෙහි පටන් මුළු පය වසා සිටුනා වහන් ද, පුළුන් පිරූ වහන් ද, පිටිපතුල් වසා සිටුනා වහන් ද, මොනර පිළින් මැසූ වහන් ද,

187 විච්ඡිකාළිකතා සීහ - බ්‍යග්ඝුද්දා ජිනදීපිනං
මජ්ජාරකාළ කොළූක - චම්මෙහි ච පරික්ඛටා
පාදුකා සංකමනීයා - කොචි ධාරෙය්‍ය දුක්කටං

ගෝණුසු තගුටු වැනි වර ඇති වහන් ද, සීහ ව්‍යග්ඝ උද්ද (දියබලු) අජින දිවි යන මොවුන් ගේ සමින් ද, බළල්, ලේන, බකමූණු යන මොවුන් ගේ සමින් ද, වටකොට මැහූ වහන් ද, පයැ ලා සක්මන් කටහැකි පාදුකා ද, ගිලන් නො ගිලන් කවරෙක් හෝ පරිභොග කෙරේ නම් දුකුළා වේ.

**188 නීලාදිවණ්ණං සකලං-පුඤ්ඡෙත්වෙ'ක දෙසකං
උපාහනා වලඤ්ජෙය්‍ය-හාරෙත්වා බල්ලකාදික'න්ති.**

නීලාදි වර්ණය සියල්ල ම හෝ කොටසක් හෝ පිසදමා ද, විලුම් වසා සිටින බල්ලකය ඈ සියල්ල ඉවත් කොට ද, වහන් පරිභොග කරන්නේ ය.

**විස්තර**

33 මේ ගාථා සයෙන් පා වහන් දැරිය හැකි තැන් ද කැප අකැප පා වහන් ද අනුදැන වදාළ සේක. ගිලනකුට මිස නො ගිලනකුට ආරාමයෙන් පිට පා වහන් දැරිය නො හැකි ය. ආරාමය තුළැ දී ගිලන් නො ගිලන් කාට ත් පා වහන් දැරිය හැකි ය. මධ්‍යදෙශයේ දී නව ගණඩගණ්ණුපාහන නො වටී. මුලින් ම සොණ කොලිවීස තෙරුන් අරබයා එකපලාසික උපාහනය අනුදත්හ, "අනුජානාමි භික්ඛවෙ එකපලාසිකං උපාහනං" යී (**මහාවග්ග 219**). ඒ ගැන සථාන නියමයක් නො කළ සේක. ඉන්පසු වැ එක් මහණෙක් පා පැළී ගිය හෙයින් කොර ගසමින් තථාගතයන් වහන්සේ පසු පසැ ගියේ ය. එවිට ගණඩගණ්ණුපාහන දරා පැමිණි උපාසකයෙක් එය ඒ මහණහට පිදී. එහෙත් ඒ භික්ෂුව එය තථාගතයන් විසින් ප්‍රතික්ෂිප්ත බැවින් නො පිළිගත්තේය. එය නිමිති කොට "අනුජානාමි භික්ඛවෙ ඔමුක්කං ගණඩගණ්ණුපාහනං" යී (මහාවග්ග 221) ගිහියකු මුදා හළ ගණඩගණ්ණුපාහනය අනුදත්හ. පසුව වැඩිසිටියන් අනුපාහනව සක්මන් කරද්දී ඡබ්බග්ගියයන් සඋපාහන වැ සක්මන් කළ හෙයින් "න භික්ඛවෙ අජ්ඣාරාමෙ උපාහනා ධාරෙතබ්බා" යී (මහාවග්ග 221) ආරාමය තුළ වහන් පාවිච්චිය තහනම් කළහ. ඉන්පසු එක් භික්ෂු කෙනකුන්හට පාදඛිලාබාධයක් තිබුණු හෙයින් "අනුජානාමි භික්ඛවෙ යස්ස පාදා වා දුක්ඛා පාදා වා ඵාලිතා පාදඛීලො වා ආබාධො උපාහනං ධාරෙතුං" (මහාවග්ගපාලි 222) ආබාධයක දී ආරාමය තුළ උපාහන දැරීමට ඉඩ දුන්සේක. ඉන්පසු නො සේදූ පයින් ඇඳ පුටු වලට නැගීමෙන් ඒවා කිලිටි වූ නිසා "අනුජානාමි භික්ඛවෙ ඉදානි මඤ්චං වා පීඨං වා අභිරුහිස්සාමී'ති උපාහනං ධාරෙතුං" යී (මහාවග්ගපාලි 222) ඇඳපුටුවලට නගින්නට මොහොතක් තබා වහන් පයැ ලන්නට ඉඩදුන්හ. ඉන්පසු අඳුරෙහි ගිය භික්ෂූන්හට කටු ආදිය ඇණීමෙන් උවදුරු පැමිණි කල්හි "අනුජානාමි භික්ඛවෙ අජ්ඣාරාමෙ උපාහනං ධාරෙතුං, උක්කං පදීපං කත්තරදණ්ඩකන්ති" (මහාවග්ගපාලි 222) ආරාමය තුළ ද උපාහන දැරීම අනුදත්හ.

පසුකලෙක්හැ ඡබ්බග්ගිය භික්ෂූහු වහන් දරා ගම් වන්හ. එවිට මිනිස්සු දෙස් කීහ. එය නිමිති කොට "න භික්ඛවෙ සඋපාහනෙන ගාමො පවිසිතබ්බො" යී සඋපාහන වැ ගම්වැදීම තහනම් කළහ. ඉන්පසු ගිලන් බැවින් වහන් නො දරා ගම් වදින්නට නො පිළිවන් භික්ෂුවක් අරබයා 'අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා සඋපාහනෙන ගාමං පවිසිතුං" (මහාවග්ග 228) යී ගිලන් වහන්දෑට උපාහන දරා ගම්වදින්නට අනුදත්හ.

පසු වැ මහසුප් තෙරුන් ගේ වචනයෙන් කුටිකණ්ණ සොණ ස්ථවිර යන් වහන්සේ කළ ඉල්ලීමක් නිසා "අනුජානාමි භික්ඛවෙ සබ්බපච්චන්ති

මේසු ජනපදෙසු ගණඞ්ගණූපාහනං'' (මහාවග්ගපාලි 232) යි සතරපටින් වැඩි පටි ඇති වහන් අනුදත වදාළසේක. උපාහන පිළිබඳ ප්‍රත්‍යන්තයෙහි විශෙෂ නිදහසක් වශයෙන් තිබෙන්නේ ආරාමය තුළ සහ නො ගම්හි නව ගණඞ්ගණූපාහන දැරිය හැකි බව යි. එය ද සෙනසුන් කිළිටිවීම නිසා ය. ප්‍රත්‍යන්තයෙහි දී මේ ගැන වෙන නිදහසක් නැත. නො ගිලන් වැ ආරාම යෙන් බැහැර වහන් පයැ ලැම නිදෙස්ය යි නො කියහැකි වුවත් ආරොග්‍ය ය රැකැගැනුමට මෙකලැ වහන් පයැ ලැම ඉතා ම අවශ්‍ය බැවින් නිදෙසැයි කිව යුතු ව තිබේ. මෙහි විස්තර පාළිමුත්තක විනය විනිශ්චයයේ 406 සිට බැලීම ප්‍රයෝජන ය.

199 **මජ්ඣදෙසෙ**

පෙරදිගින් කජඞ්ගල නම් නියම්ගම ත් පුරත්ථිම දක්ඛිණදිසායෙන් සලලවතී ගඟ ත් දකුණු දිශායෙන් සෙතකණ්ණික නම් නියම්ගම ත් බට හිරින් ථූණ නම් බමුණු ගම ත් උතුරින් උසීරද්ධජ නම් පර්වතය ත් සීමා කොට ඇති මැද පෙදෙස "මධ්‍යදෙශ'' නමින් ව්‍යවහාර විය. (මහාවග්ගපාලි 232)

200 **නවා**

මෙයට අළුත් වහන් ඇතුළති. එක වරක් වත් පයැ ලා මිදූ කල්හි පුරාණ ගණයට වැටේ. පැරැණි ගණඞ්ගණූපාහන (සතර පටට වැඩි පටි ඇති වහන්) මධ්‍යදෙශයට ද වටී.

201 **මහාරඞ්ග මහානාම රඞ්ගරත්තා**

මෙහි මහාරඞ්ග යනු "සතපද පිට්ඨික වණ්ණො''යි විනයට්ඨකථායෙහි (806) දැක්වෙන සේ පත්තෑ පිට මෙන් පැහැති වහන් ය. "මහානාම රඞ්ග රත්තා'' යි දැක්වෙන්නේ වර්ණ වශයෙන් නොයෙක් ලෙසින් මිශ්‍ර වර්ණ ඇති උපාහන යි.

202 **බලලබඩා**

විළඹ සම්පූර්ණයෙන් වැසෙන සේ මසා කළ උපාහනයෝ යි.

203 **පුටබඩා**

ජඞ්ඝායෙහි පටන් වැසෙන සේ කළ වහන් ගැනේ. "යොනක උපා හන'' යනු ද මීට ම නම්.

204 **පාදුකා**

පාදුකා වර්ග දෙකක් ඇත. සඞ්කමනීය පාදුකා (පයැ ලා ඇවිදියහැකි පාදුකා) අසඞ්කමනීය පාදුකා (පයැ ලා ඇවිදිය නො හැකි එහි ම තිබෙන පාදුකා) වශයෙනි. ඔවුනතර සඞ්කමනීය පාදුකා සැදූ ඡබ්බග්ගිය භික්ෂූනු ලී- තල්පත්- උණපත්- තණ- කිතුල්- කම්බිලි- රන් රිදී- මැණික්- වෛඩූර්‍ය- පලිඟු- කස්ලෝ- වීදුරු- ඊයම්- තඹලෝ- යනාදියෙන් සැදූහ·

මෙහි කී නොකී හැමෙකක් ම ත් භික්‍ෂූන් හට දැරිය නො හැකි බැව් "න භික්ඛවෙ කාචි සඞ්කමනීයා පාදුකා ධාරෙතබ්බා" යි තහනම් කළ සේක. "අනුජානාමි භික්ඛවෙ තිස්සො පාදුකායො ධුවට්ඨානියා අසඞ්කමනීයායො වච්චපාදුකං පස්සාවපාදුකං ආචමන පාදුකන්ති" (මහාවග්ගපාළි 225) යි වච්ච පස්සාව ආචමන යන පාදුකාත්‍රය අනුදත්හ. විස්තරාර්ථීන් විසින් පාළිමුත්තක විනය විනිශ්චයයෙහි 408 වන පිටුව කියවනු.

## 23 අනොලොකිය'න්ති
(නො බැලියයුතු තැන්)

189 සාරත්තො ඉත්ථියා යොනිං-මුඛං වා [1]භික්ඛුදායිකා
පරස්සපත්තං උජ්ඣාන-සඤ්ඤී වා අත්තනො මුඛං
ආදාසෙ උදපත්තෙ වා-ඔලොකෙන්තස්ස'ස්ස දුක්කටං.

රාග සිතින් (යටත් පිරිසෙන් එ දවස උපන් මාගමක ගේ යෝනිය හෝ, භික්‍ෂුව දෙන්නිය ගේ මුහුණ හෝ, කිපියා වූ සිතින් අනුන් ගේ පාත්‍ර ගත ආමිසය හෝ, (නො ගිලන් ව) ස්වකීය මුඛය කන්නාඩියෙහි හෝ, දිය පාත්‍රයෙහි (දිය බඳුනෙක්හි) හෝ බලන්නහුට දුකුළා වේ.

## 24 අඤ්ජනී'ති (අඳුන්තල)

190 වට්ටාවට්ඨ සොළසංසා වා-මට්ඨා වට්ටති අඤ්ජනී
තිස්සො'පි මූලෙ ගීවායං-ලෙඛා එකා'ව බන්ධිතුං.

වට හෝ අටැස් හෝ සොළොසැස් හෝ අඳුන් තළ මට ව (කැටයම් රහිත වැ) වටී. පතුලෙහි රේඛා තුනක් ද වටී. පියන බඳින පිණිස කරෙහි එක ම රේඛාවක් වටී.

191 යංකිඤ්චි රූපං මාලාදි-කම්මං මකරදන්තිකං
ගොමුත්තකද්ධචන්දාදි-විකාරං නෙත්ථ වට්ටති.

පක්‍ෂිරූපාදි යම්කිසි රූපයක් ද මාලාකම් ද මෝරදැති ද ගොමුත්‍රවංක ය අඩසඳ ය යනාදි නොයෙක් විකාර ද කිරීම මේ අඤ්ජනියෙහි ලා නො වටී.

192 ලබ්භන්ත වණ්ණ සුත්තෙන-සිබ්බිතුං ථවිකා තථා
සිපාටිකාඤ්චිකා කොසා-සලාකා'පි අචිත්තකා.

අඳුන් පසුම්බිය එක් පැහැති නූලින් මසන්නට වටී. කරබියලි (පිහි කොපුව) යතුරු පසුම්බිය යන දෙක සහ අඳුන් (ගාතා) කූර ද විසිතුරු නො කළා ම වටී.

193 සංඛනාභි විසාණට්ඨි-නළ දන්තමයා තථා
ඵලකට්ඨමයා වෙළු-ලාඛා ලොහමයා'පි ච

1. "දායිකියා"ති වත්තබ්බා.

සක් තැබ මුවා වූ අං මුවා වූ ඇට මුවා වූ රණ හුණ (බට) මුවා වූ දළ මුවා වූ ඵල මුවා වූ දඬු මුවා වූ හුණ මුවා වූ ලගමුවා වූ සහ ලොහොමුවා වූද,

194 **අඤ්ජනියො සලාකායො-ධූමනෙත්තා ච ලබ්භරෙ**
**තථා සඞ්ඛ දණ්ඩානි-නත්ථුදානා ච තම්මයා'ති**

අඳුන් කළ ද, අඳුන් කූරු ද, දුම් නළ (දුම් පයිප්ප) යන මේවා වටින්. සැත් මිටි ද (කුඩ මිටි) නැහැඹරු (නශ්‍යද්‍රොණී) ද ඒ සංඛනාභි විසාණාදි මය වූවාහු වටින්.

**විස්තර**

34 මෙයින් අඳුන් කුලා ත් යතුරු පසුම්බි ත් අඳුන් ගානා කූරුත් දුම් පයිප්පත්, කුඩ මිටිත්, නැහැඹරු ත් සඳහන් කරමින් ඒවා කළයුතු ආකාරය ත්, ඊට යොදගතයුතු දෑය ත් සංක්ෂෙපයෙන් ප්‍රකාශිත යි. අඳුන් ජාති මෙහි සඳහන් වී නැත ද කාලඤ්ජන- රසඤ්ජන- (නොයෙක් දෙයින් කළ අඳුන්) සොතඤ්ජන (ගං හෝ වල ලැබෙන්නක්) ගෙරුක (සුවණ්ණ ගෙරුක) කපල්ලක (පාන් සිලින් ගන්නා දෑයක්) යන මේවා ගතයුතු. **මහාවග්ග භෙසජ්ජක්ඛන්ධකයෙහි** (237) පිටුවේ සිට සවිස්තර වැ එයි.

205 **අඤ්ජනි**

අඤ්ජනී යනු අඳුන් කුලාව යි. භික්ෂූන් නොයෙක් බඳුන් වල අඳුන් බහා තැබූ නිසා අඳුන් කුලාවක් අනුදත්හ. ඡබ්බග්ගියයන් රන් රිදී මය අඳුන් කුලා ද දරූ නිසා "අනුජානාමි භික්ඛවෙ අට්ඨිමයං දන්තමයං විසාණමයං නළමයං වෙළුමයං කට්ඨමයං ජතුමයං ඵලමයං ලොහමයං සඞ්ඛනාභිමයන්ති" යි අඳුන් කුලා පිණිස ගතයුතු දෑ ප්‍රකාශ කළහ. කුද්‍රසික්ගාථාවන්හි එනුයේ මෙකී වගී යි.

206 **ධූමනෙත්තා ච**

දුම් පයිප්පය යි. ධූම පානයෙන් යම් රොගයක් සංසිඳේ නම් එබඳු රෙග ඇත්තහුට රොගය සංසිඳෙනතුරු දුම් ඉරීමට "අනුජානාමි භික්ඛවෙ ධූමං පාතුං" යි ඉඩ හැර තිබේ. එද බෙහෙත් දුම්ය, එබඳු රොග නැත්තවුනට නම් දුම්බීමට කිසි ඉඩයක් නැත. රෝග ඇත්තහට ද රෝගය සංහුන් කලැ ඒ බෙහෙත් දුම් ඉරීම පවා නො කට හැකි ය. ඒ බෙහෙත් දුම් ඉරීමට "අනුජානාමි භික්ඛවෙ ධූමනෙත්තන්ති" යි දුම් පයිප්පය නියම කොට වදළහ. (මහාවග්ගපාලි 238)

---

## 25 අකප්පියානි සයනානි

195 **ආසන්දිතූලි පල්ලඞ්කා-පටිකං ගොණ චිත්තකං**
**පටලි විකති උද්ද-ලොමි එකන්ත ලොමිකා**

පමණ ඉකුත් දික් හහලා පඩු ද, පුළුන් පුරවා කළ අසුන් ද පලඟ ද ලොම්මුවා ගෙළ ඇතිරිළි ද, සතරඟුලෙන් දික් ලොම් ඇති ඇතිරිළි ද, විචි

මෙන් විසිතුරු ඇතිරිළි ද, සත පුප් ඇතිරිළි ද, සිංහාදි රූපයෙන් විසිතුරු ඇතිරිළි ද, එක පිටෙක ලොම් ඇති ඇතිරිළි ද, දෙපිටෙහි ම ලොම් ඇති ඇතිරිළි ද,

196 **කුත්තං කොසෙය්‍ය ක ට්ඨිස්සං-හත්ථි අස්සරථත්ථර**
**ජිනප්පවෙණි කාදලි-මිගපවරත්ථ රත්ථතං**

මාගමුත් සොළොස් දෙනකුට නැටිය හැකි "කුත්ත" නම් මහ ඇතිරිය ද, රන්කසුකම් කළ තිහිරි හුමය "කොසෙය්‍ය" නම් පට ඇතිරිය ද, රන් රුවන් කම් කළ "කට්ඨිස්ස" නම් පට ඇතිරිය ද, ඇත්- අස්- රිය පිට අතු රන ඇතිරි ද, ඇඳ පමණ කොට මසන ලද අඳුන් දිවිසමින් කළ පසතුරුණු ද, උතුම් කෙසෙල්මුව සමින් කළ ඇතිරිළි ද,

197 **සලොහිත විතානඤ්ච-හතොරත්තූ පධානකං**
**අකප්පියානි එතානි-දුක්කටං පරිභුඤ්ජතො.**

රත් වියන් ඇත්තේ ද, හිස සහ පාමුල යන දෙතන්හි තැබූ රත් පැහැති කොට්ට ඇත්තේ ද, මේ සයනාසනයෝ අකැපයහ. පරිභොග කරන්නහුට දුකුළා වේ.

198 **ආසන්දාදිත්තයා සෙසෙ-ලබ්භතෙ ගිහි සන්තකෙ**
**ධම්මාසනෙ ච භත්තග්ගෙ-ඝරෙ චා'පි නිසීදිතුං**
**භුම්මත්ථරණ සංඛෙපෙ-සයිතුඤ්චා'පි කප්පති.**

ආසන්දි ආදි තුනින් අන්‍ය වූ ගිහින් සතු සෙනස්නෙහි ද, ධර්මාසනයෙහි ද, දන ශාලායෙහි ද, ගිහි ගෙහි ද, පනවන ලද කල්හි හිඳිනට වටනේය. බුමුතුරුණු කොට පනවනලද කල්හි (තමා ගේ කැප ඇතිරියක් ඊ මතැ එළා) සයනය කරන්නට ද වටී.

199 **චතුරංස පීඨා සත්තඞ්ගා-පඤ්චඞ්ගා උච්චපාදකා**
**තූලොනද්ධා ඝරෙයෙව-මඤ්චපීඨා නිසීදිතුං.**

වඩුරියනින් උස් පා ඇති සතරැස් පුටු ද, සප්තාඞ්ග ද, පඤ්චාඞ්ග ද වටී. පුළුන් බහා කළ මඤ්චපීඨයෝ ගිහිගෙහි ම හිඳිනට වටිත්.

200 **චොලවාකුණ්ණ පණ්ණානං-තිණානඤ්ච පූරිතා**
**චිවරචම්මියො පඤ්ච-භිසි සබ්බත්ථ කප්පියා.**

වස්ත්‍රයෙන් ද, වැහැරින් ද, ලෝමයෙන් ද, පතින් ද, තණයෙන් ද, පුරවන ලද සිවුරු කඩක් ම ඡවිකොට ඇති පඤ්ච භිසිහු හැම තන්හි දී ම කැප වෙති.

201 **තූලත්තයං භිසි ගබ්භා-ලොමානි මිගපක්ඛිනං**
**බිම්බොහනෙ අනුඤ්ඤාතං-තූලවජ්ජා මසූරකෙ.**

රුක්ඛතූල ලතාතූල පොටකීතූල- සී ගස් ලිය තණ පෙවගින් ගන්නා තුන් පුලුන් ද, පඤ්චවිධ භිසි ගර්භද, සිංහාදි සිවුපාවුන් හා මයුරාදි පක්ෂීන් ගේ ලොම් ද බිම්බොහනයෙහි අනුදන්නා ලදී. සම්න් කළ භිසි ආදියෙහි තූලය හැර සෙස්ස අනුදන්නා ලදී.

202 **මනුස්සලොම මූණ්ණායං-පණ්ණ පුප්ඵං තමාලකං**
**සුඛං න ආසන්දෙසැවව-ලබ්භමප්පතිවෙක්ඛිතං**

(උණ්ණායං) ලොම් කිස්සෙහි මිනිස් ලොම් ද, කොළ කිස්සෙහි පුවගු මල් මුහුණ මල් ආදී වූ මල් ද, අමිශ්‍ර වූ තමලු පත් ද, නො පිරික්සු අසුන ද නො වටී.

**විස්තර**

35 මෙයින් කැප නො කැප අසුන් ප්‍රකාශිත යි. ඔවුනතර 195– 196– 197 ගාථාවලින් ප්‍රකාශිත සෙතසුන් අකැප බව ත් පරිභොගයෙන් දුකුළා බව ත් කියැ වේ. එහෙත් ඒවා අතර ආසන්දි ආදී තුන හැර සෙසු සෙතසුන් කැප වන සැටි ත් ඉන් මතු ගාථාවන් ගෙන් පැහැදිලි වන්නේ ය. ආසන්දි තුලි පලලඞ්ක යන තුන සම්පූර්ණයෙන් ම අකැප ය. ඡබ්බග් ගිය භික්ෂූහු මේ උසසුන් මහසුන් දරූහ. විහාර චාරිකායෙහි හැසිරුණු මහ ජනයා ගේ දෙස් කිම අරබයා උසසුන් මහසුන් තහනම් කළහ. (**මහා වග්ගපාලි** 226)

207 **ආසන්දිං**

සුගත් අඟුලින් අටඟුලකට වඩා දික් පා ඇති ඇඳ පුටු දෙවග ම ආසන්දි නම්. එය "සුගතඞ්ගුලෙන අතිරෙකට්ඨඞ්ගුල පාදකානි මඤ්චපීඨානි" යන ටීකා පාඨයෙන් පැහැදිලි වේ. "දික්හගලා පුටුව" සී කුදුසික සන්න යෙහි ත් සෙසු පැරණි සන්න වල ත් පෙනේ. "දික්හගලා පුටුව" නම් හාන්සි වීමට සාදන දික් පුටු වෙසෙසකි. මෙහි දී ආසන්දි යන්නට අටඟුලින් දික් පා ඇති ඇඳ පුටු දෙක ම ගැනේ. "ආසන්දිකොති චතුරස්සපීඨං වුච්චති" (**පාලිමුත්තක විනය විනිශ්චය ටීකා** 114 සහ **සමන්තපාසාදිකා** 899)

208 **තූලි**

තුලි යනු පුළුන් පිරූ වූ හිසි යි. තුලිකා යන්න **සමන්තපාසාදිකා යෙහි** (807) "තූලිකාති පකතිතූලිකා" යී දක් වේ. එය තවත් පහදා ලන **විමතිවිනොදනී** ටීකාකාරයෝ "පකති තූලිකාති තූලපුණ්ණා භිසි" යී දක්වූහ. එබැවින් මෙහි ලා පුළුන් පුරවා කළ හිසි අන්තර්ගත ය. පුළුන් වර්ග නම් ඉඹුල් ආදී ගසින් ගන්නා රුක්ඛතුල ය, කිරිවැල් ඈ යම් ඒ වැලින් ගන්නා ලතා තුල ය, පොටකි ආදී තෘණයෙන් ගන්නා හෙයින් පොටකිතුලය යන තුන් වර්ගය ගැනේ. කිසියෙහි දී මේ තුන්වර්ගය ම නො වටී. බිබ්බොහනයට නම් වටී. "තසමා යස්ස කස්සචි භූතගාමස්ස තූලං බිබ්බොහනෙ වට්ටති. භිසිං පන පාපුණිත්වා සබ්බමෙතං අකප්පිය තූලනති වුච්චති. (**විනයාලඞ්කාර** 384)

209 **පලලඞ්කා**

පාවලැ සිංහාදී ව්‍යාළ රූප තබා කළ අසුන යි. මේ ආසන්දි තුලි පල් ලඞ්කා තුන පරිභොග කිරීමක් පාසා දුකුළා වේ.

### 210 ආසන්ද්‍යාදිකාය ලබ්භමාන ගිහිසයනානි

"අනුජානාමි භික්ඛවෙ ඨපෙත්වා තීනි ආසන්දිං පල්ලඞ්කං තූලිකං ගිහි විකටං අභිනිසීදිතුං නත්වෙව අභිනිපජ්ජිතුං" (චූලවග්ගපාලි 260) යි පැණ වූ හෙයින් මෙකී ආසන්දි ආදි තුන කිසිසේ ත් පරිභෝග කට නො හැකි ය. "අනුජානාමි භික්ඛවෙ ආසන්දියා පාදෙ ඡින්දිත්වා පරිභුඤ්ජිතුං, තූලිකං විජටෙත්වා බිම්බොහනං කාතුං, අවසෙසං භුම්මත්ථරණං කාතුං" (චුල්ලවග්ගපාලි 266) යී අකැප උසසුන් මහසුන් ප්‍රයෝජනයට ගන්නා සැටි ප්‍රකාශ කොට වදාළ පරිදි යි.

### 211 භුම්මත්ථරණ සංඛෙපෙ සයිතුඤ්චාපි කප්පති

මෙහි සඳහන් පටිකාදි ඇතිරිලි භුම්මත්ථරණ වශයෙන් පණවා තිබේ නම් එහි තමා සතු කැප ඇතිරියක් අතුරා සයනයට ද වටී. ඒ බව "අනුජානාමි භික්ඛවෙ පච්චත්ථරිත්වා නිපජ්ජිතුන්ති වුත්තත්තා පරිභණ්ඩකතං භූමිං වා භුම්මත්ථරණ සෙනාසනං වා, සංඝිකං මඤ්චපීඨං වා අත්තනො සන්තකෙන පච්චත්ථරණෙන පච්චත්ථරිත්වා'ව නිපජ්ජිතබ්බන්ති" යී වදාළ හෙයින් බුමුතුරුණු වශයෙන් පණවා ඇති ඇතිරිලි මතැ පමණක් නොව පිරිබඩ කළ බිමෙහි හෝ සඟසතු ඇඳ පුටු වලැ හෝ තමා සතු ඇතිරියක් අතුරා හෝනට වටී.

### 212 සත්තපඤ්චඞ්ගා

සත්තඞ්ග- පඤ්චඞ්ග දෙවගය ගැනේ. පා සතරක් හා දෙ පසට ත් පිටිපසට ත් ඇඳි තුනක් ඇති හෙයින් සත්තඞ්ග නම් පුටුව ද, පා සතරක් හා පිටිපසට ඇඳි එකක් ඇති හෙයින් පඤ්චඞ්ග නම් පුටුව දැ යි යන පුටු දෙක "සත්ත පඤ්චඞ්ගා" යී කියැ වේ.

### 213 උච්චපාදකා

වඩුරියනින් රියනට වඩා උස් පා ඇති අසුන යි. ඇඳ විට්ටම හෝ පාවිට්ටම හැර යි. "මෙහි උසසුන් නම් වඩුරියනින් ඉකුත් වලින් යට පා ඇති හැඳ පුටු යි." (සිඛවළඳවිනිස 62 පිටුව)

### 214 තූලොනද්ධා සරෙයෙව

පුළුන් එවැ තැනූ අසුන් ගිහිගෙහි දී පරිභෝග කළ වරද නැත. එය "තෙන ඛො පන සමයෙන මනුස්සා භත්තග්ගෙ අන්තරඝරෙ තූලොනද්ධං මඤ්චම්පි පීඨම්පි පඤ්ඤපෙන්ති, භික්ඛූ කුක්කුච්චායන්තා නාභිනිසීදන්ති භගවතො එතමත්ථං අරොචෙසුං අනුජානාමි භික්ඛවෙ ගිහි විකටං අභිනිසීදිතුං නත්වෙව අභිනිපජ්ජිතුං" (චුල්ලවග්ගපාලි 260) යී පණවා වදාළහ.

### 215 පඤ්චභිසි

1 උණ්ණා භිසි, 2 චොල භිසි, 3 වාක භිසි, 4 තිණ භිසි, 5 පණ්ණ භිසි යි භිසි (බුදිරි) පසකි, එයින් ඛොම කප්පාස කොසෙය්‍ය කම්බල සාණ භඞ්ග යන සිවුරු වලින් එකකින් හෝ දුකුල පත්තුණ්ණ චීනපට්ට සෝමාර පට්ට ඉඬිජ දෙවදින්න යන අනුලොම් සිවුරු අතුරින් එකකින් හෝ උරය

සඳ පක්ෂි පිහාටු හෝ මස් නො සැප මනුෂ්‍යාදීන් ගේ ලොම් හැර සෙසු සතුන් ගේ ලොම් හෝ බහා කරන ලද බිස්ස (බුදිරිය) "උණ්ණා භිසි" නම්. අළුත් වස්ත්‍රයක් හකුළා හෝ රෙදි කැලි බහා හෝ කරන බිස්ස "චොල භිසි" නම්. වැහැරි බහා කළ බිස්ස "වාක භිසි" නම්. යම් කිසි තෘණ යෙකින් කළ බිස්ස "තිණ භිසි" නම්. තමලු පත් හැර සෙසු පත්‍ර යෙන් හෝ තමලු පත් වලට සෙසු පත් මිශ්‍ර කොට හෝ තැනූ බිස්ස "පණ්ණ භිසි" නම්.

216 **තූලනනයං**

රුක්ඛ තූල- ලතා තූල- පොට්කී තූල යන තුන යි. 208 වන විපප ණිය බලනු.

217 **බිම්බොහනෙ**

යනු හිඳ ගන්නා කොට්ට යි. එහි සිංහාදි සතුන් ගේ ලොම් සහ හැම පක්ෂීන් ගේ පිහාටු ද කැප යි.

218 **මසූරකෙ**

මසූරක යනු සම්වුවා වැස්මෙන් කළ භිසිය බව "මසූරකං නාම චම්ම ඡවිකා භිසි" යි ටීකායෙහි කිය යි. එහි පුළුන් හැර සෙසු දෑ එවැ කිරීම සුදුසු ය.

219 **අප්පච්චෙක්ඛිතං**

තමා සෝදිසි නො කළ අසුන්හි හිඳ ගැනුම මෙයින් වාරිත යි. ඇතිරිළි අතුරා තිබෙන අසුන්හි හිඳින්නහු හෝ හෝන්නහු විසින් පළමුව අත තබා එය පරීක්ෂා කොට බලා පරිභොග කිරීමට අනුදන්නා ලදි. තමන් බලා සිටිය දී ඇතිරිළි අතුළේ නම් පිරික්සීමෙක් අනවශ්‍ය ය. මෙය ඇතිරිළි අතුරා තිබුණු අසුනෙක්හි පරීක්ෂා නො කොට හිඳ ගැනීමෙන් ළදරු වකු ගේ දිවි නොරැකීම් නිමිත්තෙන් පණවා වදාළහ.

---

## 26 සමානාසනිකො'පි ච

203 **තිවස්සන්තර'නුඤ්ඤාතං-භික්ඛූනමෙක මාසනං**
**සත්තවස්සතිවසෙහි-පඤ්චවසො** [1]**නිසීදති.**

තුන් වසක් අතර ඇති භික්ෂූන්හට ඒකාසනය අනුදන්නා ලදි. පස් වස් ඇත්තේ සත් වස් තෙවස් ඇත්තහු හා සමග එක අසුන්හි හිඳී.

204 **ඨපෙත්වා පණ්ඩකං ඉත්ථිං-උභතො බ්‍යඤ්ජනං මුනි**
**දීඝාසනෙ අනුඤ්ඤාසි-සබ්බෙහෙ'ව නිසීදිතුං.**

පණ්ඩකයා ද, ස්ත්‍රිය ද, උභතොව්‍යඤ්ජනකයා ද හැර අන් හැම දෙනා විසින් ම දීර්ඝාසනයෙක්හි හිඳිනට මුනීන්ද්‍රයන් වහන්සේ අනුදත් සේක.

---

[1] නිසීදිතුං. බු. ඉං.

205 **අනන්තං දීඝාසනං තිණ්ණං-යං පහොති නිසීදිතුං**
**මඤ්චකො වා'පි පීඨෙවා-මිතනං ලබ්භං නිසීදිතුං.**

යම් අස්නක් තිදෙනකුන්හට පලක් බැඳ හිඳිනට සෑහේ ද, එය කුඩා ම දීඝාසනය වේ. ඇඳෙහි හෝ පුටුවෙහි හෝ සමානාසනික ව දෙදෙන කුන් හට හිඳිනට වටී.

---

## 27 අසංවාසිකො'ති

206 **උක්ඛිත්තො'නුපසම්පන්නො-භික්ඛුණී ඡින්නමූලකො**
**නානා සංවාස නිස්සීම-ට්ඨිත වෙහාස සණ්ඨිතො**
**එකාදස අභබ්බා ච-අසංවාසා'ති දීපිතා'ති**

උක්ෂේපනීකර්ම කරණ ලද්දේ ද, උපසපන් නො වූයේ ද, මෙහෙණ ද පාරාජිකාපන්න තැනැත්තේ ද, ලබ්ධි නානාසංවාසකයා ද, සීමායෙන් බැහැර සිටින්නා ද, අහසෙහි සිටින්නා ද, එකොළොස් අභව්‍ය පුද්ගලයෝ ද "අසංවාසක"යි දක්වන ලදහු. **උක්ඛිත්තො** අඞ්ක 198 දරණ ටිප්පණියෙන් බලා දත්නේ ය.

220 **නානාසංවාස**

නානාසංවාසිකයෝ දෙදෙනෙකි. කම්ම නානාසංවාසික ලද්ධි නානා සංවාසික කියා යි. මෙහි දී ලබ්ධි නානාසංවාසිකයා ගැනේ.

**එකාදස අභබ්බා** අඞ්ක 45 දරණ ටිප්පණියෙන් බලා දත්නේ ය.

---

## 28 කම්ම'න්ති

207 **වග්ගෙන අධම්මකම්මං-සමග්ගෙන අධම්මිකං**
**වග්ගෙන ධම්මකම්මඤ්ච-සමග්ගෙන ච ධම්මිකං**
**චතුත්ථං යෙව'නුඤ්ඤාතං-සෙසකම්මෙසු දුක්කටං.**

වර්ගී සඞ්ඝයා විසින් කරන අධර්ම කර්මය ද, සමගි සඞ්ඝයා විසින් කරන අධර්ම කර්මය ද, වර්ගී සඞ්ඝයා විසින් කරන ධර්ම කර්මය ද, සමගි සඞ්ඝයා විසින් කරන ධර්ම කර්මය ද කියා කර්ම සතරක් වේ. (එයින්) සතර වැනි වූ සමගි සංඝයා විසින් කරන ධර්ම කර්මය ම තථාගතයන් වහන්සේ විසින් අනුදන්නා ලදී. සෙසු කර්මයන්හි දුකුළා වේ.

221 **වග්ගෙන**

කර්ම ප්‍රාප්තයන් අත්පසට නො පැමිණීම, ඡන්දාරහයන් ගේ ඡන්දය නො ගැනීම, සම්මුඛී භූතයන්ගේ ත් එකඟ නො වීම, යන මේ තුනෙන් එකක් හෝ ඇති කල්හි "වර්ගී වූ සඞ්ඝයා ය"යි කියනු ලැබේ. මින් විරහිත කල්හි "සමගි සංඝයා ය" යි කියනු ලැබේ.

222 අධම්මිකා

කුදුනාහි දුතිය කර්මයන්හි දී කුදුනාතිය තබා කර්මවාක්‍යය නො කියා හල කල්හි අධර්ම කර්මයෙකි. මේ ආදි වශයෙන් තථාගත ප්‍රඥප්ත ක්‍රමොල්ලංඝනය කොට කිරීම "අධර්ම කර්ම" නම්. තථාගත ප්‍රඥප්ත ක්‍රමය වෙනස් නො කොට එසේ ම කිරීම "ධර්ම කර්ම" නම්.

208 **චතුවග්ගො පඤ්චවග්ගො-දස විසති වග්ගිකො**
**තිරෙක විසති වග්ගො-සඞ්ඝො පඤ්ච විභාවිතා**

චතු වර්ගය, **පඤ්ච** වර්ගය, දශ වර්ගය, විංශති වර්ගය, අතිරෙක විංශති වර්ගය කියා සඟහු **පස්** දෙනෙක් විභාග කොට දක්වන ලද්දාහු ය.

223 **චතුවග්ගො**

උපසපන් භික්ෂූන් සිවු දෙනකුන් වහන්සේ ගේ එක් රැස් වීම "චතු වර්ග නම්. මෙසේ ම පස් නමක් වූ කල "පඤ්චවග්ග" කියා ද දශ නමක් වූ කල "දශවර්ග" කියා ද විසි නමක් වූ කල "විංශති වර්ග" කියා ද, විසිනමට වැඩි කල්හි "අතිරෙක විංශති වර්ග" කියා ද කියනු ලැබේ.

209 **චතුවග්ගො ච අබ්භානු-පසම්පද [1]පවාරණං**
**පඤ්චවග්ගො ච අබ්භානං-මජ්ඣදෙසූපසම්පදං**

චතුවර්ග සංඝතෙමේ අබ්භාන උපසම්පදා පවාරණ ද, පඤ්චවර්ග සංඝ තෙමේ අබ්භානය ත් මධ්‍යදෙශයෙහි උපසම්පදාව ත් හැර සෙසු කර්ම ද කරන්නට පොහොසත් වේ.

210 **දසවග්ගො ච අබ්භානං-ඨපෙත්වා සබ්බකම්මිකො**
**ඉතරො සබ්බකම්මෙසු-කම්මප්පත්තො'ති දීපිතො**

දශවර්ග සංඝතෙමේ අබ්භානය හැර අන් හැම කර්මයන්හි ම කර්මප්‍රාප්ත ය. (පොහොසත් ය.) අනෙක් විසති- අතිරෙක විසති සංඝතෙමේ හැම කර්මයන්හි ම කර්මප්‍රාප්තය යි දක්වන ලදි.

211 **චතුවග්ගෙන කත්තබ්බෙ-චත්තාරො පකතත්තකා**
**කම්මප්පත්තා පරෙ ඡන්ද-රහා සෙසෙප්‍ය'යන්නයො**

චතුර්වර්ග සංඝයා විසින් කටයුතු වූ කර්මයෙහි පකතත්ත වූ සිවු නමක් කර්මයට යොග්‍ය ය. එම සීමායෙහි සිටිනා අනෙක් පකතත්තයෝ ඡන්දය දෙන්නට නිස්සෝ ය. පඤ්චවර්ගාදි සංඝයා විසින් කටයුතු වූ සෙසු කර්මයෙහි ද මේ ක්‍රමය යි.

**විස්තර**

36 චතුර්වර්ග සංඝයා ගෙන් කටහැකි විනය කර්මයකට අතිරෙක විංශති ප්‍රමාණ භික්ෂු පිරිසක් පැමිණ අත්පස්හි සිටිය ද ඒ කර්මයට සිවු නමක් සෑහේ. එහි සිටිනා සෙසු හැමදෙනා වහන්සේ ම ඊට ඡන්දය දෙන්නෝ ය යනු පැවැසූ පරිදි යි.

---

[1] පවාරණ බු. ඉ. ටීකා

224 **පකතත්තකා**

**පරිජි** නො වූ, සංඝයා විසින් උත්ක්ෂෙපණීය කර්ම නො කළ, නා නා සංවාසික නො වන භික්ෂුහු පකතත්තයෝ යි. "පාරාජික උක්ඛිත්තක ලද්ධිනානාසංවාසකෙහි අසෙද්ද" යනු එය **ටීකායෙහි** ආ සැටි යි.

212 **චතුවග්ගාදි කත්තබ්බං-අසංවාස කම්මාරහ**
**ගරුකට්ඨ සඤ්ඤතරං-කත්වාන ගණපූරකං**
**පරිවාසාදිකං කම්මං-කතං කුප්පඤ්ච දුක්කටං**

චතුර්වර්ගාදි සංඝයා විසින් කටයුතු කර්මය අසංවාසිකයකු හෝ කර්ම ලබන්නට නිස්සා හෝ, ගණපූරණය කොට ද, පරිවාසාදි කර්මය ගරුකාපත්තියා ගණපූරණය කොට ද (මෙසේ) අසංවාස කම්මාරහ ගරුකට්ඨ යන තිදෙනා අතුරෙන් යම්කිසිවකු ගණපූරණය කොට කරන ලද ද ඒ කර්ම කොප්‍ය වේ. කාරක භික්ෂූනට දුකුළා ද වේ.

**විස්තර**

37 මෙයින් අසංවාසිකයා හෝ කර්මය ලබන්නා හෝ ගණපූරණයට තබා ගෙන හෝ පරිවාසාදි කර්මවල දී පිරිවෙස් ඈ සමාදන් වන ගරුකාපත්තියා ගණපූරණයට තබා ගෙන හෝ කර්ම කිරීම නුසුදුසු බව ප්‍රකාශ කරන ලදී.

213 **අධම්මකම්මං වාරෙය්‍ය-අන්තරායෙ දුවෙ තයො**
**දිට්ඨාවිමෙකො ධිට්ඨානං-වාරෙනෙනව තතොධි'කා.**

ජීවිත බ්‍රහ්මචර්‍ය්‍ය අන්තරා නැති කල්හි යටත් පිරිසෙන් එක් නමක් වත් අධර්මකර්මය වළක්වන්නේ ය. දෙ තුන් දෙන ("අධම්මකම්මං ඉදං න මෙතං ඛමති" යි) ඔවුනොවුනට තමන් ගේ ලබ්ධිය ප්‍රකාශ කරන්නාහු ය. තනි මහණ තෙමේ "න මෙතං ඛමති" යි සිතින් ඉටන්නේ ය. ඒ තුන් දෙනා ගෙන් වැඩි පිරිසක් මෙසේ සිතන්නේ නම් ඒ අධර්ම කර්මය වළකා ලත් ම ය. (සංඝයා හෙයිනි )

214 **කම්මාරහ අසංවාස-ඛිත්ත චිත්ත දුඛද්දිතා**
**එතෙසං සඞ්ඝමජ්ඣම්හි-පටික්ඛෙපො න රූහති.**

කර්ම ලබන්නට නිස්සා ය, සංවාසාර්හ නො වන්නා ය, උම්මත්තකයා ය, වේදනායෙන් පෙළෙන්නා ය යන මොවුන් ගේ ප්‍රතික්ෂේපය සංඝයා මධ්‍යයෙහි දී නො නැගේ. (ගණන් නො ගැනේ)

215 **පකතත්තෙන'කසීමට්ඨ-සමසංවාස භික්ඛුනො**
**ආරොචෙන්තස්ස'නන්තමෙසා-'නන්තරස්සාපි රූහති.**

යටත් පිරිසෙයින් (අනන්තරස්සපි ආරොචෙන්තස්ස) ළඟ හුන්නහුට වත් කියන පකතත්ත වූ, එක සීමායෙහි සිටි, සමාන සංවාස ඇති භික්ෂූහු ගේ ප්‍රතික්ෂේපයක් වේ නම් එය ගණන් ගැනේ.

216 **කොපෙතුං ධම්මිකං කම්මං–පටික්කොසෙය්‍ය සම්මුඛා**
**තිරොක්ඛා කාය සාමග්ගිං–ඡන්දං නො දෙය්‍ය දුක්කටන්ති.**

දැහැමි සඟකම් කොප්‍ය කරන්නට ඉදිරියෙහි වළකා නම් හෝ, නො හමුයෙහි කායසාමග්‍රිය ත් ඡන්දය ත් නො දේ නම් හෝ දුකුළා වේ.

---

## 29 මිච්ඡාජීවවිවජ්ජනා

217 **දාරුං වෙළුං ඵලං පුප්ඵං–චුණ්ණං න්හාන මුඛොදකං**
**මත්තිකා දන්ත කට්ඨාදිං–න දදෙ කුලසඞ්ගහං**

දැව ද, හුණ ද, ඵල ද, මල් ද, සුණු ද, නහන දිය හා මුව සෝදන දිය ද, මැටි ද, දැහැටි දඬු ආදිය ද, කුල සඞ්ග්‍රහ පිණිස නො දෙන්නේ ය.

218 **පාරිභට්ට තා මුග්ග–සූප්‍යතා වත්ථු විජ්ජයා**
**පහෙන දූතකම්මෙන–ජඞ්ඝපෙසනියෙන වා**

ලාභාසාවෙන් කුල දරුවන් වැඩීමෙන් හෝ, මුගනසුපය මෙන් අසත්‍ය ය අධිකවන සේ සත්‍යාසත්‍යය මිශ්‍ර කොට කීමෙන් හෝ වාස්තු විද්‍යායෙන් හෝ කෙත් වත් ආදියෙහි මෙහෙවර කිරීමෙන් හෝ, පණිවුඩ පණත් ගෙන යන දූත කමින් හෝ පා ගමනින් ගිහියන්ගේ හසුන් ගෙන යෑමෙන් හෝ;

219 **අනුප්පදාන පතිපිණ්ඩ–වෙජ්ජකම්මෙන වා පුන**
**නාසෙක්ඛනවා'පි සම්බුද්ධ–පටික්කුට්ඨෙන ජීවයෙ.**

අත්ලස් ආදිය දීමෙන් හෝ පිළිපිඬු දීමෙන් හෝ පිළියම් කිරීමෙන් හෝ බුදුන් වහන්සේ විසින් පිළිකුල් කොට හරණ ලද සෙසු ත් අඞ්ගවිද්‍යා නක්‍ෂත්‍ර විද්‍යාදි අනෙකකින් හෝ ජීවත් නො වන්නේ ය.

220 **විඤ්ඤත්ති නෙසනාකුතුල්–ලපනා කුහනාදිහි**
**කුලදූසාදිනුප්පන්න–පච්චයෙ පරිවජ්ජයෙ**

නො තැ නො පැවැරුවන් ගෙන් ඉල්ලීමෙන් ද, නුසුදුසු ප්‍රයොගයෙන් ප්‍රත්‍යය සෙවීමෙන් ද, තමා කෙරෙහි නැති උතුරු මිනිස්දම් ප්‍රකාශ කිරීමෙන් ද, කුහනා ලපනාදියෙන් ද, කුලදූසනාදියෙන් ද උපන් සිවුපසය විෂමිශ්‍රයක් සේ දුරු කරන්නේ ය.

**විස්තර**

38 මෙයින් කුල සංග්‍රහය සඳහා මල්– ගෙඩි– දර ආදිය දීම ත් පාරිභටටකතාදි අශ්‍රාමණික කථා සහ (කුහක) ක්‍රියා ත් වෙදකම් ආදි වැරැදි ක්‍රියා ත් යන මේවා නුසුදුසු බව සහ එයින් ලත් සිවුපසය අකැප බව ත් ප්‍රකාශ කරන ලදි. කුල සංග්‍රහය පිණිස මල් දීමාදි මේ හැමෙකකින් ම ඒ කුලයන් ගේ ශ්‍රද්ධා විනාශය වන්නේ ය. එබැවින් ඒවා කුල දූෂණය යි කියනලදි. යම් හෙයකින් නෙළා තිබෙන මල් බුදු පුද කොට නවත් අධිකව

තිබේ නම්, බුදු පුද සඳහා ආරාමයට පැමිණි දායක කුලයනට ඒවා බුදු පුද කිරීමට දීම සුදුසු ය. ඵලයෙහි දී තමා සතු ඵල මවුපියාදීනට සහ සෙසු නෑයනට ත් දීම වරී. කුල සංග්‍රහ පිණිස දුන් කල වරද ය. තමා සතු ඵල ගිලනුන් හට ත් එහි පැමිණි අධිපතීන් හට ත් ආගන්තුකයන ට ත් දීම වරී. එය 'අත්තනො සන්තකං යෙව ගිලානමනුස්සානං වා සම්පත්තානං ඉස්සරානං වා ඛීණපරිබ්බයානං වා දාතුං වට්ටති. ඵලදානං න හොති" **(පාලිමුත්තක විනය විනිශ්චය 22)** සෙසු වේලු ආදියෙහි ද මෙසේ ය. මේ ගාථාහි ආ හැමෙකක් ම පාහේ **සමන්තපාසාදිකා විනය අටුවාවෙහි** කුලදූසක ශික්ෂාපද විස්තරයෙහි එයි. **විශුද්ධිමාර්ග ශීලනිර්දෙශය** ද බලන්නේ මැනැවි.

225 **පාරිභට්ටකතා**

කිරිමවුන් මෙන් කුල දරුවන් ඇකයෙන් හෝ කරින් හෝ වඩා ගැනු ම "පාරිභට්ටකතා" නම්. කුලයන් තුටු කිරීම පිණිස ළමයින් ගේ හිස පිරිමැදීමාදිය ද මීට ම ඇතුළත්. එවැනි දූසින් පැහැද දුන් සිවුපසය අකැප ය.

226 **මුග්ගසූපතා**

මුං සූපයෙක්හි කිසියම් ඇට නො තැම්බී තිබෙන්නා සේ ස්වල්ප වශයෙන් සත්‍යය ත් වැඩි වශයෙන් අසත්‍යය ත් ගැබ් වන සේ කතා කරන ස්වභාවය යි. හැබෑ බොරු දෙකින් මිශ්‍ර ව කතා කොට සිවුපසය ලැබෑ ගැනුමේ පරමාර්ථයෙන් මෙසේ කොට ඉන්පසු යම් සිවුපසයක් ලද ද එය අකැප ය.

227 **වත්ථුවිජ්ජා**

වාස්තු විද්‍යායෙන් යනු යි. ඇතැමෙක් ගෙබිම් ශාස්ත්‍ර උගෙන අසුවල් ගොඩැ නැගිල්ලට යොග්‍ය අසුවල් නැත ය. මේ බිමෙහි ඒ ගොඩැනැගිල්ලට සුදුසු වෙන තැනක් නැත. අන් තැනෙක තැනූ කල්හි මෙබඳු අපල ඇති වියැ හැකි ය. යනාදි වශයෙන් කියමින් එයින් දිවි ගෙවීම යි. එය අකැප ජීවිකාවෙකි.

228 **පහෙණ**

කෙත් වත් පුෂ්පාරාම ඵලාරාමයන්හි මෙහෙවර කිරීමෙන් දිවි පැවැත්ම යි. එය භික්ෂු ජීවිතයට නො ගැලපෙන්නක් හෙයින් අකැප ය.

229 **දූතකම්මන**

දූත ක්‍රියායෙන් යනු යි. මෙහි දී "දූතයා" යි ගැණෙන්නේ මෙරමා ගේ කාර්‍ය්‍ය සඳහා ව්‍යාපෘත වන්නා ය. යම් කිසිවකු කී ලෙස යම් තැනකට ගොස් ඒ කටයුත්ත පිරිමසන්නා දූතයා යී ගණන් ගත නිවරද ය. ගිහියන් ගේ දූත මෙහෙවර කිරීමට භික්ෂුවට ඉඩ නැත.

230 ජඞ්ඝපෙසනිගෙන

මෙය අ ගිහියන් ගේ කටයුතු සඳහා ලියුම්- පණිවුඩ ගෙන යෑම් ඊම් වශයෙන් කැරෙන දූත මෙහෙවර බව අට්ඨකථායෙහි දක් වේ. පෙර සඳ හන් ජඞ්ඝපෙසනිකා නම් දූත ක්‍රියාවට කෙනකුන් ගේ නියමය පිණිස ගොස් ඒ කටයුත්ත කිරීම ත් පයින් යමින් ලියුම්- පණිවිඩ ගෙන යෑම් ඊම් කිරීම ත් ගැනේ. මේ සියල්ල අකැප ය. එය "ජඞ්ඝපෙසනියන්ති ගිහීනං දූතෙය්‍යං සාසනාහරණ කම්මං වුච්චති, තං න කාතබ්බං. ගිහීනං හි සාසනං ගහෙත්වා ගච්ඡන්තස්ස පදෙ පදෙ දුක්කටං. තං කම්මං නිස්සාය ලද්ධං භොජනං භුඤ්ජන්තස්සාපි අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ දුක්කටං පඨමං සාසනං අගහෙත්වාපි පච්ඡා "අයං'දානි සො ගාමො හන්ද තං සාසනං ආරොචෙමී"ති මග්ගා උක්කමන්තස්සා'පි පදෙ පදෙ දුක්කටං. සාසනං ආරොචෙත්වා ලද්ධං භොජනං භුඤ්ජතො පුරිමනයෙනෙව දුක්කටං. සාසනං අග හෙත්වා ආගතෙන පන "භන්තෙ තස්මිං ගාමෙ ඉත්ථන්නාමස්ස නාම කා පවත්තී"ති පුච්ඡියමානෙන කථෙතුං වට්ටති. පුච්ඡිත පඤ්හෙ දොසො නත්ථි, පඤ්චන්නං පන සහධම්මිකානං මාතාපිතුන්නං පණ්ඩුපලාසස්ස අත්තනො වෙය්‍යාවච්ච කරස්ස ච සාසනං හරිතුං වට්ටති; ගිහීනං ච පුබ්බෙ වුත්තප්පකාරකප්පිය සාසනං. ඉදං හි ජඞ්ඝ පෙසනියකම්මං නාම න හොති. ඉමෙහි පන අට්ඨහි කුලදූසක කම්මෙහි උප්පන්නපච්චයා පඤ්චන්නම්පි සහධම්මිකානං න කප්පති. අභූතාරොචන රූපිය සංවොහාරෙහි උප්පන්නපච්චය සදිසාව හොන්ති" (විනයට්ඨකථා 453-454) අදහස සුගම යි.

231 වෙජ්ජකම්මෙන වා

වෙදකම් කිරීමෙන් දිවි ගෙවීම යි. යම් මහණෙක් වෙදකම් දනී නම් දසතැයන් විෂයයෙහි කළ කල්හි ආපත්ති නො වේ. දස තැයෝ නම්: ජෙට්ඨභාතු- කනිට්ඨභාතු- ජෙට්ඨභගිණී- කනිට්ඨභගිණී- චූලමාතු- මහා මාතු- චූලපිතු- මහාපිතු- පිතුච්ඡා- මාතුල- යන දස දෙනා යි.

232 සම්බුද්ධ පතිකුට්ඨෙන නා'ඤ්ඤේනවා'පි

බුදුරජාණන් වහන්සේ විසින් නිඥා කරන ලද අන් කිසිවකින් හෝ සිවුපසය නො සපයා ලියැ යුතු බව මේ ප්‍රකාශ කළ සැටි යි. අඞ්ගවිජ්ජා (ශරීරාවයව බලා ගුණාගුණ කියන්නට උගන්වන ශාස්ත්‍රය) නක්ඛත්ත විජ්ජා (ජ්‍යොතිශ්ශාස්ත්‍රය) සුපිනවිජ්ජා (ස්වප්න ඵලාඵල කියන්නට උගන් වන ශාස්ත්‍රය) භූතවිජ්ජා (භූතයන් පිළිබඳ තොරතුරු කියන්නට උගන් වන ශාස්ත්‍රය) යනාදි අශ්‍රාමණික දේ කිරීමෙන් දිවි පැවැත්වීම භික්ෂූනට තහනම් කරන ලදි.

233 විඤ්ඤත්ති

නො නෑ නො පැවැරූවන් ගෙන් ඉල්ලීම යි. මෙහි නො නෑයෝ නම් "මාතිතො වා පිතිතො වා යාව සත්තමා යුගං, තාව කෙනචි ආකාරෙන අසං

බද්ධා (**මාතිකාට්ඨකථා** 62) මවු පසින් හෝ පියපසින් හෝ සත්වන පරපුර දක්වා ම කවරකාරයකින් හෝ නෑ සබඳකම් නැත්තෝ යි. නො පැවැරූවෝ නම් ''ස්වාමීනි ඔබ නෑ යමක් මට කියනු මැන, මා කැපකරු දායකයකු වශයෙන් සැලැකුව මැන'' යනාදි වශයෙන් සිය කැපකරු බව ප්‍රකාශ නො කළ අය නො පැවැරුවෝ නම් වෙත්. මෙකී නො නෑ නො පැවැරූවන්ගෙන් කිසිවක් ඉල්ලන්නට නො වටී.

234 **අනෙසනා**

බුදුන් වහන්සේ විසින් නිෂද්ධ කළ යම් කවරකාරයකින් හෝ ප්‍රත්‍යය සෙවීම 'අනෙසනා'' නමි. මොවුහු විසිඑකකි. ''වෙජ්ජකම්මං කරොති, දූතකම්මං, පහිණකම්මං, ගණ්ඩං ඵාලෙති, අරුමක්ඛණං දෙති, උද්ධවිරෙචනං දෙති, අධොවිරෙචනං දෙති, නත්‍ථු තෙලං පචති, පිවනතෙලං, වෙළුදානං දෙති, පත්තදානං, පුප්ඵදානං, ඵලදානං, සිනාන- දන්තකට්ඨ- මුඛොදක- චුණ්ණ- මත්තිකා, චාටුකම්මං කරොති, මුග්ග සූප්පියං, පාරිභට්ටං, ජඞ්ඝපෙසනිකං'' (**මජ්ඣිමනිකාය කන්දරක සු**ත්ත) මේ විසිඑකට යටැ සඳහන් කළ සියල්ලක් ම ගැනේ.

235 **අභූතුල්ලපනා**

සිය සතන්හි නො මැති උතුරු මිනිස්දම් ප්‍රකාශ කිරීමෙන් යනු යි. මෙහි විස්තර 35- 36- 37 ටිප්පණී වලින් බලා දතයුතු.

236 **කුහනාදීහි**

මෙහි ආදි ශබ්දයෙන් ලපනා නෙමිත්තකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතා යන මේවා අන්තර්ගත වේ. එහි ''කුහනා'' යනු ලාභ සත්කාර කීර්ති ප්‍රාර්ථනය කරන මහණක්හු නැතිගුණ ප්‍රකාශ කිරීම් වශයෙන් මුහුණ හැකුළුම් ආදි යම් ඒ කුහකගති පහළ කිරීම යි. ''ලපනා'' නම් වෙහෙරට වන් දායකයන් දැකැ ''කිම භික්ෂූන් නිමන්ත්‍රණය සඳහා පැමිණියහු ද?'' කියා හෝ ''රජ මා කෙරෙහි පහන් ය, අසුවල් අසුවල් අය මා කෙරෙහි පහන් ය'' යනාදි වශයෙන් හෝ කීම යි. ''නෙමිත්තකතා'' කෑයුතු දැය රැගෙන යන්නක්හු දැක ''කිම කෑයුත්තක් ලද ද?'' යනාදි වශයෙන් නිමිත්තකරණාදිය යි. නිප්පෙසිකතා යනු ''ඔබ අශ්‍රද්ධයෙහි, අප්‍රසන්නයෙහි'' යනාදි වශයෙන් කීම හෝ නො දෙන්නකු ගැන ''මහා දානපතියෙක'' යනාදි වශයෙන් කවටකම් කිරීම යි.

237 **කුලදූසාදීනුප්පන්නපච්චයෙ**

''කුලදූසාදි'' යන මෙහි ආදි ශබ්දයෙන් රූපිය පටිග්ගහණ රූපිය සංවොහාරාදිය ගැනේ.

## 30 වත්ත'නති

**221 ආගන්තුකො න ආරාමං-පවිසෙ ස උපාහනො**
**සඡතො'ගුණ්ඨිතො සීසෙ-කත්වා වා'ප්ප චීවරං.**

ආගන්තුක මහණ තෙමේ පයැ ලූ වහන් ඇති ව හෝ හිසැ ලූ කුඩ ඇති ව හෝ හිස් වසා පෙරවැ හෝ සිවුරු හිසැ තබා හෝ වෙහෙරට නො පිවිසෙන්නේ ය.

**222 පානීයෙන න ධොවෙය්‍ය-පාදෙ බුඩ්ඪතරෙ පි ච**
**ආවාසිකෙ'භිවාදෙය්‍ය-පුච්ඡෙය්‍ය සයනා'සනං.**

පැනින් (පානය කරන දියෙන්) පා නො සෝදන්නේ ය. තමහට වැඩි මහලු ආවාසික භික්‍ෂූන් වඳින්නේ ය. ලගිනා සෙනසුන් ගැන අසන්නේය.

**විස්තර**

39 මෙයින් වෙහෙරට වදනා ආගන්තුකයන් විසින් පිළිපැදියයුතු වත් ප්‍රකාශ කරන ලදි. ආරාම සීමාවේ දී වහන් මුදා කුඩය හකුළා හිස විවෘත ව තබා ගෙන සිවුර කරෙහි බහා සංසුන්ව පැමිණ ආවාසික භික්‍ෂූන් ගෙන් පානීය පරිභොජනීය ජලය ත් සෙනසුන් ඈ සියල්ල ත් විචාරා දත යුතු ය. වැඩිසිටි ආවාසික භික්‍ෂූහු වැන්ද යුතු ය. මේ ආදි ආගන්තුක වත් 72 ක් පමණ චූලවග්ගපාළියෙහි 315-16-17 පිටුවලැ දක්වා තිබේ. විස්තරාර්ථීන් විසින් එයත් පාලිමුත්තක විනය විනිශ්චයයෙහි 212 වන පිටුව ත් බැලිය යුතු යි.

මෙහි ආරාමයට ඇතුළු වන විට පා වහන් මුදා කුඩය හකුළා ගත යුතු බව පැවැසේ. ගම්වදිනවිටැ පා වහන් සහ කුඩ පාවිච්චිය තහනම් කොට තිබිය දී "ආගන්තුක වශයෙන් ආරාමයට පැමිණෙන්නන් විසින් පයැ ලූ කුඩය වසා පැමිණිය යුතුය යි කීයේ කවරහෙයින් ද" යි ප්‍රශ්නයක් මතු වැ එන්නේ ය. එය නිරාකරණය කැරැ ගත හැක්කේ "ගම" නම් කුමක්දැයි දැනැ ගැනීමෙනි. වෙසෙසින් ම දඹදිවැ "ගම" යි හැඳින්වූයේ එකිනෙකට ලං වැ පැවැති ගෙවල් සමූහයකට යි. සැතැපුමකින් දෙකකින් මෙබඳු ගම් තිබේ. වත්මන්හි ත් දඹදිවැ මේ ගම් මෙසේ ම දැකිය හැකි ය. ගම් සීමාවට ගොස් පා වහන් ගලවා උපාහනත්ථවිකායෙහි බහා ගෙන ගම්වැදීම භික්‍ෂූන් ගේ සිරිත යි. ගමට ත් ආරාමයට ත් අතර වහන් පයැ ලැම නිවරද ය. වන ගත පෙදෙසකින් පැමිණෙන්නකු විසින් ද වහන් පයැ ලැමට තහනමක් නැත. ආරාමයකට පැමිණෙන්නන් විසින් පා වහන් මුදා ගන්නට ත් කුඩය හකුළා ගන්නට ත් කීයේ පෙරැ කී පරිදි වහන් පයැ ලා පැමිණීම භික්‍ෂූන් ගේ සිරිත බැවිනි.

**223 ගමිකො පටිසාමෙත්වා-දාරුමත්තිකභණ්ඩකං**
**විහාරස්ස එකොත්වාන-ආපුච්ඡ සඞ්ඝනා'සනං.**

බැහැර යන මහණ තෙමේ ඇඳ පුටු ඈ දැව බඩු ත් රජත් බඳුන් ඈ මැටි බඩු ත් සකස් කොට තබා සෙනස්නද දෙරකවුළු පියා "මඤ්චපීඪාදිය රකිවු"ය යි ආරාමික සාමණේරාදීන්හට කියා (පක්කමෙය්‍ය යන්නේය.)

224 **ආපුච්ඡිතබ්බෙ අසති-සඞ්ඝාපෙත්වාන සාධුකං**
**පක්කමෙය්‍යඤ්ඤථා තස්ස-පක්කන්තුං න ච කප්පති.**

කියන්නට තිසි යම් කෙනකුන් නැති කල්හි හොඳින් සඟවා තබා යන්නේ ය. එසේ නො කොට ගමන් යෑම නො ම වටී.

**විස්තර**

40 ගමික භික්ෂුව විසින් බඩු සකස් කොට තබා දෙර කවුළු වසා යා යුතු ය. සෙනසුන් නො තෙමෙන සේ රැකීම පිණිස යමකුට දන්විය යුතුය. කිසිවකු නැති විට නො තෙමෙන තැනෙක්හි ගල්සතරක් මතැ ඇඳ තබා පුටුමතැ පුටු තබා සෙසු භාණ්ඩ ත් සුරැකි කොට යා යුත්තේ ය. මුළු ගෙය ම තෙමෙන කලැ ඇඳ ගමට ගෙන යා නො හැකි නම් අභ්‍යවකාශයෙහි ගල් සතරක් මතැ ඇඳ ත් ඊ මතැ පුටු ත් තබා තල්පත් ආදියෙන් වසා "එහි අවයව පමණක් ඉතුරු වුවත් පමණැ" යි සිතා යා යුතු. මේ සංක්ෂෙපයෙනි. විස්තර **චුල්ලවග්ග**පාලි 319 පිටුව බැලීමෙන් දත හැකිය. ගමික වත් දශයකි.

225 **ආවාසිකො පච්චුදෙය්‍ය-වුඩ්ඪා'ගන්තුස්ස ආසනං**
**උපනික්ඛිපෙ පාදෙ දජ්-පතුනිං පත්තචීවරං**

226 **පච්චුග්ගන්ත්වාන ගණ්හෙය්‍ය-පානීයෙන ච පුච්ඡයෙ**
**ආගන්තුකො'පි වාදෙය්‍ය-පඤ්ඤපෙ සයනාසනං.**

ආවාසික මහණ තෙමේ වැඩි මහලු ආගන්තුකයාහට හිඳිනා අසුන් පනවන්නේ ය. පාදෙදක පාදකඨලිකාදීන් එළවා තබන්නේ ය.

පෙරගමන් කොට පාසිවුරු ගන්නේ ය, පැනින් ද පුළුවුස්නේ ය, වෘඩ ආගන්තුකයන් වඳින්නේ ය; සෙනසුන් පනවන්නේ ය.

227 **අජ්ඣාවුත්ථං මවුත්ථං වා-ගොචරා'ගොචරං වදෙ**
**වච්චපස්සාව ඨානානි-කතිකං සෙඛ සම්මුතිං,**

පෙර භික්ෂූන් විසූ නො විසූ බව ද, සිඟිය යුතු නො සිඟිය යුතු ගම ද වැසිකිළි කෙසකිළි කිස සිදුකරන තැන් ද, කතිකාවත් ද සේඛසම්මුති ලද කුලද,

228 **පවෙස නික්ඛමෙ කාලං-පරිභොජනීය පානියං**
**නිසින්නකො'ව නවකස්ස-එතං සබ්බං සමාචිකෙ.**

වෙහෙරට වැදීමේ හා නික්මීමේ කාලය ද, නහන පැන්- බොන පැන් ද කියන්නේ ය. මේ සියල්ල නවක (බාල) ආගන්තුක භික්ෂුවට (නම්) වැඩි මහල් ආවාසික භික්ෂු තෙමේ) අසුන්හි හුන්නේ ම කියන්නේ ය.

**විස්තර**

41 ආවාසික භික්ෂුව විසින් පැවැත්විය යුතු වත් වැඩිහරියක් ම මෙහි සංග්‍රහ විය. ආගන්තුකව පැමිණි වැඩිමහල් භික්ෂුව ගේ පා තෙල්

ගැල්වීම්- එහන් පිසදූම්මාදි ඝිපයක් මෙහි ඇඳාළත් නො විණි. තවද ආගන්තුක භික්ෂුවට නම් "මෙහි පාංසිවුරු තබව" යනාදීන් කිය යුතු ය. විස්තරාර්ථීන් චුල්ලවග්ගපාලි 318 පිටුව සහ පාලිමුත්තක විනය විනිශ්චය 213 පිටුව ද- බලා දතමනා ය. ආවාසික වත් 35 ක් පෙළේ සහ එම අටුවාවේ ත් විස්තර වෙයි.

238 **ගොචරා'ගොචරං**

මෙයින් හැසිරිය යුතු තැන් හා නො හැසිරිය යුතු තැන් මේවාය යි ආගන්තුක භික්ෂූනට ආවාසික භික්ෂූන් විසින් කියාදිය යුතු බව දක්විණි. වත් දන්නා ආගන්තුක භික්ෂුව ද ගොචරා'ගොචරාදිය විචාරිය යුතු ය. යම් හෙයකින් නො විචාළ ත් කියාදීම ආවාසිකයන් අයත් යුතුකම යි. ගොදුරුගම මෙතෙක් දුර ය, පිඬුසිහා යා යුත්තේ මෙපමණ වේලාවට ය, යනාදි වශයෙන් ගොචරය ද, අසුවල් ගම මිසදිටු ගමකි, යනාදි වශයෙන් අගොචරය ද කියා දීම මෙහි ලා ගැනේ.

239 **කතිකං**

කතිකා යනු එ වෙහෙර භික්ෂූන් විසින් පිළිපැදිය යුතු සැටි දක්වෙන ව්‍යවස්ථා පඬක්තිය යි.

240 **සෙඛසම්මුතිං**

යම් කුලයක් ශ්‍රද්ධායෙන් වැඩේ ද භොගයෙන් පිරිහේ ද එවැනි කුල යට සංඝයා කැනති ද්‍රතිය කම්යෙන් "සෙඛසම්මුතිය" දෙයි. යම් භික්ෂුවක් අනාරාධිත වැ සෙඛ සම්මත ලද තැනෙකින් අහර පිළිගෙන වළඳ කෙරේ නම් "පාටිදෙසනියාපත්තියක්" වේ. යම් හෙයකින් එබඳු සෙඛසම්මතකුල තිබේ නම්, ආගන්තුක භික්ෂුවට ඒවා ගැන කියා දිය යුතු ය.

241 **පවෙසනික්ඛමෙ කාලං**

වෙහෙරට පැමිණීම් වෙහෙරින් නික්මීම් කළයුතු වෙලාව කියා දීම යි. "මේ අඩවියෙහි අසුවල් වේලාවේ චණ්ඩ සතුන් ගැවැසෙන බැවින් කිය සහිතය. අසුවල් වෙලාවේ එබඳු උවදුරු නැත" යනාදි වශයෙන් කියා දුන් කල්හි ආගන්තුකයනට උවදුරක් නැත.

---

### 31 විකප්පනාවෙ'වාති

229 **සම්මුඛා පරම්මුඛා හෙදා-දුවෙ වුත්තා විකප්පනා**
**සම්මුඛාය විකප්පෙනෙනා-බ්‍යත්තස්සෙ'කස්ස සන්තිකෙ**
**"ඉමං චීවරං තුය්හං විකප්පෙමි"ති භාසයෙ.**

විකප්පනාවෝ සම්මුඛය පරම්මුඛය යන භෙද විසින් දෙදෙනෙක් කියන ලදහ. හමුවෙහි සිටියහුට විකප්පනය කරන්නේ (විකප්පන පවබුද්ධරණියන් දන්නා) ව්‍යක්තයකු සමීපයෙහි "ඉමං චීවරං තුය්හං විකප්පෙමි" (මේ සිවුර යුෂ්මත්හට විකප්පනය කරමි) යි කියන්නේ ය.

230 **ඵත්තාවතා නිබෙතුං ච-කප්පති න ච කප්පති**
**පරිභොගාදිකං තෙන-අපච්චුද්ධට භාවතො.**

(1) **"මය්හං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහී"ති.**

මෙ පමණකින් තගා තබන්නට ම කැප යි. (එසේ තගා තැබූ කල්හි නිසගි නො වේ.) ඒ වියත් මහණ විසින් මා අයත් දෙය පරිභොග කරව කියා හෝ විසඳුව කියා හෝ කැමැත්තක් කරව කියා හෝ නො පසු දුළ බැවින් පරිභොගාදිය නොම වටී. (ආදි ශබ්දයෙන් විසජ්ජන අධිට්ඨාන යන් ගන්නේ ය.)

231 **තෙන පච්චුද්ධටෙ යෙව-පරිභොගාදි කප්පති**
**අපරා සම්මුඛා චෙකා-භික්ඛුස්සේ'කස්ස සන්තිකෙ**
**ගහෙත්වා නාමමෙකස්ස-පඤ්චන්නං සහධම්මිනං**

ඔහු විසින් පසුදුළ කල්හි ම පරිභොග විසජ්ජනාදිය කැප යි. අනෙක් එක් සම්මුඛා විකප්පනාවක් ම කියනු ලැබේ. එක් උපසපතක්හු සමීපයෙහි පස්සහ දැමියන් අතුරින් එකකු ගේ නම ගෙන-

(2) **ඉමං චීවරං තිස්සස්ස භික්ඛුනො, තිස්සාය භික්ඛුණියා තිස්සාය සික්ඛමානාය, තිස්සස්ස සාමණෙරස්ස, තිස්සාය සාමණෙරියා, විකප්පෙමී'ති වත්තබ්බං.**

"මේ සිවුර තිස්ස නම් භික්ෂුවට, තිස්සා නම් භික්ෂුණියට, තිස්සා නම් ශික්ෂමානාවට, තිස්ස නම් හෙරණාට, තිස්සා නම් සාමණෙරියට, විකපමි"යි කිය යුතු යි.

(3) **තෙන භික්ඛුනා තිස්සස්ස භික්ඛුනො, තිස්සාය භික්ඛුණියා, තිස්සාය සික්ඛමානාය, තිස්සස්ස සාමණෙරස්ස, තිස්සාය සාමණෙරියා, සන්තකං පරිභුඤ්ජ වා, විස්සජ්ජෙහි වා, යථාපච්චයං වා, කරොහී'ති වත්තබ්බං.**

ඒ මහණ විසින් තිස්ස භික්ෂුව සතු -පෙ- තිස්සා සාමණෙරිය සතු සිවුර පරිභොග කරව යි හෝ අන්හට දෙව යි හෝ කැමැත්තක් කරව යි හෝ කිය යුතු.

232 **පරම්මුඛා විකප්පනෙකස්සසන්තිකෙව චීරයෙ**
**"ඉමං චීවරං තුය්හං-විකප්පනත්ථාය දම්මී'ති.**

පරම්මුඛා විකප්පනා තොමෝ කියනු ලැබේ. මේ සිවුර විකප්පනය පිණිස තට දෙමැයි මෙසේ එක් මහණක්හු කෙරෙහි කියන්නේ ය.

(4) **තෙන වත්තබ්බො "කො තෙ මිත්තො වා සන්දිට්ඨො වා"ති ඉතරෙන චෙවං වත්තබ්බං "තිස්සො භික්ඛූති වා, තිස්සා භික්ඛුණීති වා, තිස්සා සික්ඛමානාති වා, තිස්සො සාමණෙරොති වා, තිස්සා සාමණෙරීති වා.**

නාගේ ඇසුරු කරන මිත්‍රයෙක් හෝ දක පුරුදු මිතුරෙක් හෝ කවු ද යි විකප්පනය ලබන මහණ විසින් ඇසිය යුත්තේ ය. සිවුරු හිමි මහණහු විසින් තිස්ස භික්ෂුව ය, කියා හෝ -පෙ- තිස්සා සාමණේරිය ය, කියා හෝ කිය යුතු යි.

(5) **පුන තෙනා'හං තිස්සස්ස වා භික්ඛුනො, තිස්සාය වා භික්ඛුණියා, තිස්සාය වා සික්ඛමානාය තිස්සස්ස වා සාමණෙරස්ස, තිස්සාය වා සාමණෙරියා, තිස්සාය වා සාමණෙරියා, දම්මී'ති විකප්පෙතබ්බං තෙනෙව තිස්සස්ස භික්ඛුනො, තිස්සාය භික්ඛුණියා, තිස්සාය සික්ඛමානාය තිස්සස්ස සාමණෙරස්ස, තිස්සාය සාමණෙරියා, සන්තකං පරිභුඤ්ජ වා, විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහීති වත්තබ්බං.**

නැවැත සිවුර විකප්පනය කරන මහණ විසින් මම මෙය තිස්ස භික්ෂුවට හෝ, -පෙ- තිස්සා සාමණේරියට හෝ දෙමැ යි විකප්පනය කොට ඔහු විසින් ම තිස්ස නම් භික්ෂුව සතු -පෙ- තිස්සා නම් සාමණේරිය සතු සිවුර පරිභොග කරව කියා හෝ අන්හට දෙව කියා හෝ රිස්සක් කරව කියා හෝ කිය යුතු යි.

**විස්තර**

42 සම්මුඛා විකප්පන පරම්මුඛා විකප්පන දෙක්හි වෙනස මෙසේ දත යුතු. "**එත්ථ පන** ද්වින්නං විකප්පනානං කිං නානාකරණන්ති? සම්මුඛා විකප්පනාය තාව සයං විකප්පෙත්වා පරෙන පච්චුද්ධරාපෙති, තෙනෙව සම්මුඛා විකප්පනා නාම ජාතා. පරම්මුඛා විකප්පනාය පරෙනෙව විකප්පාපෙත්වා පරෙනෙව පච්චුද්ධරාපෙති, තෙනෙව සා පරම්මුඛා විකප්පනා නාම ජාතා''යි **විභාගයෙහි** දැක්වූයෙන් සම්මුඛා විකප්පනායෙන් තමා විකපා අන්‍යයා ලවා පසුදිරිම කරවයි. පරම්මුඛා විකප්පනායෙන් අන්‍යයා ලවා විකපවා අන්‍යයා ලවා ම පසුදිරිම කරව යි. මේ වෙනසි. විකප්පනය පිළිබඳ කළමනා විස්තරය 87 වන ටිප්පණියේ දක්වා ඇත.

233 **දූරසන්තිකතෙකානං-බහුභාවං විජානිය**
**එතං ඉමන්ති එතානි-ඉමානීතෙත්ථ යොජයෙ.**

දුර බව හා සමීප බව ද එකක් බව හා බොහෝ බව ද දැන (එකක් වුව) එතං (එය) ඉමං (මෙය) යී හෝ බොහෝ වුව එතානි (ඒවා) ඉමානි (මේවා) යී හෝ යොදන්නේ ය.

234 **දසාහං මාසමෙකං වා-පඤ්ච වා කඨිනත්ථතෙ**
**පාරිපූරත්ථ මූනස්ස-පච්චාසා සති මාසකං**
**නුප්පාදයති නිස්සග්ගිං-නාධිට්ඨිත විකප්පිතන්ති.**

නො ඉටු නො විකපූ සිවුර දස දිනක් හෝ (කඨිනාස්තරණය නොකළ වෙහෙර) එක ම චීවර මාසය හෝ කඨිනාස්තරණය කළ කල්හි චීවර මාසය ත් සමග පස් මසක් හෝ, අඩුව පුරවා ගැනීම පිණිස රෙදි කඩෙක් ලැබේ ය යි බලාපොරොත්තුවක් ඇති කල්හි තවත් මසක් හෝ නිසගි පචිති නූපද ව යි.

**විසතර**

43 මේ ගාථායෙන් සිවුරු නිසඟි වීම ප්‍රකාශිත යි. යටත් පිරිසෙයින් දිගින් සුගත් අඟුලෙන් අට ඟුලක් දිගැති සතරඟුලක් පුළුලැති වස්ත්‍රයක් ලද කල්හි දස දිනක් අතර එය නො ඉටන්නේ නම්, විකප්පනය කොට තැබිය යුතු ය. භණ්ඩාගාරයට හෝ දිය යුතු ය. නො එසේ නම් නිසඟි වේ. මේ නිසඟිය කඨිනානිසංස නොමැති අයට ත්, මුලින් ලද රෙදි කඩ නො පොහොනේ නම්, ඊට පොහොනා රෙදි කඩක් ලැබේ ය යි බලාපොරොත්තු තැත්තාට ත් සිදු වේ. කඨිනානිසංස ඇත්තහුට කඨිනය ලැබීමෙන් හෝ අනුමෝදන් වීමෙන් පසු චීවර මාසයේ ඉතිරි හරිය ත් හේමන්ත ඍතුව ත් තුළ ලැබෙන සිවුරු අනධිට්ඨිත වැ අවිකප්පිත වැ තැබූව ද නිසඟි නොවේ. ලැබී තිබෙන වස්ත්‍රයට නො පොහොනා විටැ "ලැබේය"යි බලාපොරොත්තු වක් තිබේ නම්, අනධිට්ඨිත වැ අවිකප්පිත වැ මාසයක් තබා ගත හැකි ය. බලාපොරොත්තු ඇත ද මාසයකට වඩා තබා ගත නො හැකි ය. කඨිනානිසංස නැත ද චීවර මාසය තුළැ ලැබෙන්නක් නිසඟි නො වේ. මෙහි විස්තරර්ථීන් නිසඟි පචිති කොටසෙහි තෙවන ශික්ෂාපදය හා එම අටුවාදිය ත් මේ පොතේ 106 දරණ ටිප්පණිය ත් බැලිය යුතු.

---

### 32 නිස්සයො'ති

235 **ඛ්‍යත්තස්ස පඤ්චවස්සස්ස-නත්ථි නිස්සාය කාරියං**
**යාවජීවම්පි අබ්‍යත්තො-නිස්සිතොයෙව ජීවති.**

ව්‍යත් වූ පස්වස් ඇති භික්ෂුවට ඇදුරකු ඇසුරු කොට විසීමෙන් කට යුත්තෙක් නැති. නො ව්‍යත් මහණ තෙමේ දිවි කෙළවර තෙක් ඇදුරකු ඇසුරු කොට ම ජීවත් වෙයි.

236 **එකංසං චීවරං කත්වා-පග්ගණ්හිත්වාන අඤ්ජලිං**
**උක්කුටිකං නිසීදිත්වා-වදෙ යාව තතියකං.**

(6) **"ආචරියො මෙ භන්තෙ හොහි ආයස්මතො නිස්සාය වච්ඡාමි"ති.**

සිවුර එකස් කොට පොරවා ඇදිලි බැඳ උක්කුටික වැ හිඳ "ආචරියො මෙ භන්තෙ හොහි ආයස්මතො නිස්සාය වච්ඡාමි" යී තෙ වළක් කියන්නේ ය.

237 **පක්කන්තෙන පක්ඛ සඞ්කන්තෙන-විබ්භන්තෙනවා'පි නිස්සයො**
**මරණාණත්තුපජ්ඣාය-සමොධානෙහි සම්මති.**

බැහැර ගියකල්හි ද, තීර්ථක ලබ්ධි ගෙන උන් පසට වන් කල්හි ද, සිවුරු හළ කල්හි ද, කාලක්‍රියායෙන් ද, (ආණත්ති) මෙහි නො එව යනාදි ගුරුන් විසින් එළවා දැමීම් වශයෙන් අණකිරීමෙන් ද, උපාධ්‍යායයන් දැකීම් ශබ්ද ඇසීම් වශයෙන් ඔවුන් හා එක්වීමෙන් ද, යන මේ සයෙන් ඇදුරහු කෙරෙන් ගත් නිස මිදෙයි.

**238 නිස්සාය නවසෙ'ලජ්ජිං අපුබ්බට්ඨාන මාගතො**
**ආගමෙ චතුපඤ්චාහං-ඤාතුං භික්ඛු සභාගතං.**

අලජ්ජීන් නිසා නො වසන්නේ ය. පෙර නො විසූ විරූ තැනකට ආයේ විනය පිළිබඳ හැඟීම් ආදියෙන් සමාන බව හෙවත් නිස දෙන මහණ හුගේ ලජ්ජීභාවය දන්නා පිණිස සතර පස් දවසක් නො වසන්නේ ය.

239 **අද්ධිකස්ස ගිලානස්ස-ගිලානුපට්ඨාකස්ස ච**
**යාචිතස්ස අරඤ්ඤෙ වා-සල්ලක්ඛෙන්තෙන ඵාසුකං**
**සභාගෙ දායකෙ සන්තෙ-වසිතුං තාව ලබ්භති.**

ගමන් යන්නා හට ද ගිලනා හට ද ගිලනා විසින් ආරාධනා කළ ගිලන් උවැටැන් කරන්නා හට ද, අරණ්‍යයෙහි සමථ විදර්ශනා ලාභයෙන් සැපවිහරණය සලකන්නහු විසින් ද සභාග වූ නිඃශ්‍රය දායකයකු නැති කල්හි ද ඇසළ පෝය තෙක් නිස නො ගෙන වසන්නට වටී.

**විස්තර**

44 මෙයින් නිස සමාදන් විය යුතු සැටි ත් නිස සමාදන් ව විසුව මනා කාලය ත් නිඃස්සය පටිප්පස්සද්ධිය ත් නිස මිදීම ත් නිසැදුරු වශයෙන් නො සැලකුව මනා භික්ෂූන් ත් නිස සමාදන් නො වී විසිය හැකි පිළිවෙල ත් ප්‍රකාශිත යි. මෙහි විස්තර දනමනා පින්වතුන් විසින් මේ පොතෙහි ආචාර්‍ය්‍ය උපාධ්‍යාය වත් විස්තරයෙහි ද 178–179 ටිප්පණි වලින් ද බලා දත යුතු යි. උපාධ්‍යායයන් බැහැර යෑමෙන් හෝ සිවුරු හැරීමෙන් හෝ මරණයෙන් හෝ තීර්ථායතනයනට එක්වීමෙන් හෝ අවවාද නො ලැබූ භික්ෂූහු නොයෙක් ලෙසින් අශ්‍රාමණක පැවැතුම් ඇත්තෝ වූහ. එවිට "අනුජානාමි භික්ඛවෙ ආචරියං" යි ආචාර්‍ය්‍යයකු නියම කළහ. (**මහාවග්ග පාළි 57–58**)

242 **ව්‍යත්තස්ස පඤ්චවස්සස්ස නත්ථි නිස්සාය කාරියං**

පස් වස් වූ ව්‍යක්ත මහණහුට නිස සමාදන් වැ විසීමෙන් වැඩෙක් නැත. "පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං 1 ආපත්තිං ජානාති 2 අනාපත්තිං ජානාති 3 ලහුකං ආපත්තිං ජානාති 4 ගරුකං ආපත්තිං ජානාති 5 උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුපවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං. (**මහාවග්ග පාළි 89**) ආපත්ති අනාපත්තීන් පිළිබඳ සියල්ල දත් උභය ප්‍රාතිමොක්ෂය හොඳින් ප්‍රගුණ මහණහුට පස්වසින් පසුව අනිඃස්සිත ව විසිය හැකිය. **සිඛ වළඳ විනිසැඟි 66 පිටුවේ** මෙය දැක්වෙන්නේ මෙසේ ය. "පස්වස් වැ වියත් වුව නිස නො ගත වරජ නැති– මෙහි වියත් නම් යටත් පිරිසෙයින් අරුත් හා බැජුන් සහිත කොට දෙමා පිරිවහා පොහො බණ කියන්නට සුතතින් සතර බණවරකුදු, සපත්තානට බණ කියන්නට වතකුදු, මඟුලව මඟුලෙහි අනුමොවනාට රුවන් සුත්, මහමඟුල් සුත්, තිරොකුඩ්ඩ සුත් යන

මෙතුන් සූතඥ්, පොහො පවුරුණු ආදි දන්නාට කම්‍ාකම් විනිඝයිඥ්, මහණු වම් කරන්නට අරහත්ඵල දක්වා පැවැති කමටහනඥ් නම් රූ විනිඝයිඥ් උගත්තේ වියත් නම්" කියා යි.

243 **නිස්සයො සම්මති**

"ඡයිමා භික්ඛවෙ නිස්සය පටිප්පස්සද්ධියො ආචරියම්හා 1 ආචරියො පක්කන්තො වා හොති 2 විබ්භන්තො වා 3 කාලකතො වා 4 පක්ඛසඞ්කන්තො වා 5 ආණත්තියෙව පඤ්චමී 6 උපජ්ඣායෙන වා සමොධානගතො හොති. ඉමා ඛො භික්ඛවෙ ඡ නිස්සය පටිප්පස්සද්ධියො ආචරියම්හා" අද හස සුගම යි. උපාධ්‍යායයන් වහන්සේ කෙරෙන් පස් අයුරකින් නිස මිදේ. ඒ පස ගුරුවරයා කෙරෙන් නිස මිදීම සිදු වන කරුණු සයෙන් මුල් පසයි (**මහාවග්ගපාලි 69**)

244 **ආණත්ති**

යනු ඇණැවීම යි. නිස සමාදන් වැ වෙසෙන ගෝලයකුට "මා ඉධ පවිස" මෙහි නො එව යනාදීන් කීම යි. ගුරුවරයකු විසින් යම් ගෝල යකු බැහැර කළ හැක්කේ මෙසේ ය. "පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො අන්තෙවාසිකො අලං පණාමෙතුං; ආචරියම්හි නාධිමත්තං පෙමං හොති, නාධිමත්තො පසාදො හොති, නාධිමත්තා හිරි හොති, නාධිමත්තො ගාරවො හොති, නාධිමත්තා භාවනා හොති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතො අන්තෙවාසිකො අලං පණාමෙතුං" (**මහාවග්ග පාලි 68**) අඞ්ග පසකින් යුත් අතැවැස්සා බැහැර කිරීමට සුදුසු යි. ගුරුවරයා කෙරෙහි අධිමාත්‍ර ප්‍රෙමයක් නැද්ද, අධිමාත්‍ර ප්‍රසාදයක් නැද්ද, අධිමාත්‍ර ලජ්ජාවක් නැද් ද, අධිමාත්‍ර ගෞරවයක් නැද් ද, අධිමාත්‍ර මෛත්‍රී භාවනාවක් නැද් ද, මේ අඞ්ග පසින් යුත් අතැවැස්සා බැහැර කරන්නට සුදුසු ය. මේ අඞ්ගයන් ගෙන් යුත් අතැවැස්සා බැහැර නො කරන ගුරුවරයා (සාතිසාරෙ හොති) වරදකරු වේය යි ද දක්වා තිබේ.

245 **උපජ්ඣාය සමොධානෙකි**

උපාධ්‍යායයන් හා එක් ව විසීමට යාමෙන් ද යන මේ කරුණු වලින් යනු යි. නිස මිදීමට හේතුවන කාරණ අතුරින් සවැන්න උපාධ්‍යායයන් හා එක් ව විසීම යි. උපාධ්‍යායයන් දැකීම– ශබ්ද ශ්‍රවණය යන දෙක වුවත් ඊට පමණි. උපාධ්‍යායයන් වසන වෙහෙර ම වෙසෙන්නකුට චෛත්‍ය වන්දනාදියට ගිය විට උපාධ්‍යායයන් දක්නට ලැබේ ද, එයින් ද නිස්සය පටිප්පස්සද්ධිය වේ. උපාධ්‍යායයන් බණ කියන විට අපේ උපාධ්‍යායයන් වහන්සේ බණ දෙසති යි උන්වහන්සේ ගැන සිතා බණ අසා ද එපමණෙකින් නිස්සය පටිප්පස්සද්ධිය වේ. (**සමන්තපාසාදිකා 738**)

246 **නිස්සාය නවසෙ'ලජ්ජිං**

යම් ගුරුවරයකු වෙත නිස සමාදන් වැ වෙසේ නම් ඒ ගුරුවරයා අලජ්ජියකු නො විය යුතු බව මේ කී සැටි යි. අලජ්ජියා නම් දැන දැනම

ඇවැත් අවදින්නා ඇවැත් සඟවන්නා සහ සතර අගතියෙන් අගතියට යන්නාත් ය. ගුරුවරයා කෙබඳු දැ යි හැඳින, ඔහු වෙත නිස සමාදන් ව විසුවමනා බව "අපුබ්බං යාතමාගතො" යනාදි වශයෙන් ගාථායෙහි දැක්වෙන සෙසු කොටසින් පැවැසේ.

**247 වසිතුං නාව ලබ්භති**

නිස නො ගෙන විසිය හැකි පරිදි කීමට යෙදූ වචන යි. 239 වන ගාථායෙහි "අද්ධිකස්ස" යනාදීන් නිස නො ගෙන විසිය හැක්කන් සඳහන් කොට තිබේ. වෙසෙසින් ම සමථ විදර්ශනා වඩමින් අරණ්‍යයෙහි වසන්නකු විසින් නිස සමාදන් වීමට සභාග පුද්ගලයකු නැති කල්හි ඇසළ පොහොය තෙක් ගුරුවරයකු බලාපොරොත්තුව විසුව මනා ය. ඇසළ මාසයෙහි ත් ගුරුවරයා නො ඒ නම්, නිස සමාදන් ව විසිය හැකි තැනකට යා යුතු බව **ටීකායෙහි** සහ **අට්ඨකථායෙහි** දැක් වේ. "සචෙ ආසාළ්හිමාසෙ නිස්සයදායකං න ලභති, යත්ථ අත්ථි, තත්ථ ගන්තබ්බං, අනොතාවසෙස පන අතික්කමිතෙන වත්ථුං න වට්ටති" යනු **අටුවා යි**. මේ නිස්සය පිළිබඳ හැම විස්තරයක් ම **පාළිමුත්තක විනය විනිශ්චයෙහි 253** වන **පිටුවේ** සිට **265** වන **පිටුව තෙක්** එයි.

---

**33 කායබන්ධනානි**

240 **අකායබන්ධනො ගාමං-දුක්කටං පවිසෙය්‍ය චෙ**
**බන්ධෙය්‍ය යත්ථ සරති-තත්ථෙවා'සතියා ගතො.**

පටිය නො බැඳ ගමට පිවිසේ නම් දුකුළා වේ. සිහි නො කොට ගියේ යම් තැනෙක්හි සිහි කෙරේ ද එහි දී ම පටිය බඳින්නේ ය

241 **පට්ටිකා සූකරන්තන්ති-දුවිධං කායබන්ධනං**
**දුස්සපට්ටො ච රජ්ජු ච-එකා තදනුලොමිකා**

පට්ටිකා ය සූකරන්තක ය කියා කායබන්ධනය දෙආකාර ය. පිළිවැටිය (රෙදිකැල්ල-රෙදිපටිය) ද (එකා රජ්ජු ච) එක් වැලි (එක ම වෙළුවක් ඇති) රැහැණ ද යන දෙක යථාක්‍රමයෙන් ඒ දෙ පටියට අනුලොම්හු යි.

242 **මච්ඡකණ්ටක ඛජ්ජූරි-පත්තා මට්ඨා ච පට්ටිකා**
**ලබ්භා දසා චතස්සො'පි-අන්තෙ ද්විගුණ සුත්තකං.**

මස් කටු රටා හෝ ඉඳිපත් රටා ඇති පටිය මාලාකම්මාදි විකාර විරහිත වැ ම (තදනුලොම් වැ එහි ම ඇතුළත් වන බැවින්) වටී. පටියෙහි දවලුව (උඩතින්) සතරකුදු වටී. පටිය දෙ කෙළවර දවලු කොන ත් කුරුහුලා කොන ත් සවි වනු පිණිස දෙතුන් නූල් පොටක් වටී.

243 **මාලාදිං කක්කටච්ඡාදිං-දස්සෙත්වා ගුණසුත්තකං**
**කොට්ටිතා කුඤ්ජරච්ඡාදිං-පට්ටිකා න ච කප්පති.**

මාලාදි කම් ද කකුළු ඇස් ආදිය ද අතරතුරෙහි දෙගුණ කළ නූල් ද ඇත් අස් ආදි රූප ද පෙන්වා වියන ලද පටිය නො වටී.

244 **ඝටකං මකරමුඛාදිං-න කප්පන්ති දසාමුඛෙ**
**උභන්තෙ ඝටකා ලෙඛා-ඨපෙත්වා අඤ්ඤචිත්තකං.**

දහ කෙළවර කොතුරු පත් ද (කලසාකාර පේකඩ සටහන් ද) මකර මුඛ දෙඬුභකාසීසා දී යම්කිසි විකාර රූපයක් ද නො වටී. (දහ මූල සම්රත්‍ය පිණිස වෙළු දන්තාදියෙන් කළ) වීඨයෙහි (පටි ඇටයෙහි) දෙ කෙළවර කළවටු ද පරිච්ඡේද රේඛා ද හැර අන් විසිතුරු කම් නො වටී.

245 **දෙඩ්ඩුභකඤ්ච මුරජං-මද්දවීණං කලාබුකං**
**න කප්පන්ති දසාසු ද්වෙ-මජ්ඣිමායෙව කප්පරෙ.**

(දෙඩ්ඩුභකං) දියබරණ හිස් වැනි පුඩු ඇති පටිය ද (මුරජං) තන් හුයින් සිසාරු ගත් දෙණ්ඩිමයක් (මුරජ බෙරය) වැනි පටිය ද (මද්දවීණං) පමුවක් (හවඩියක්) සේ සිවුරුස් (කලාබුකං) බොහෝ පඩුවල් ඇති පටිය ද යන මේ සතර නො වටී. දහයෙහි මධ්‍යයෙහි මුරජ මද්දවීණ යන දෙ පටිය ම කැප යි.

246 **වෙළුදන්ත විසාණට්ඨි-කට්ඨලාඛා ඵලාමයා**
**සඞ්ඛනාභිමයා සුත්ත-නළ ලොහමයා'පි ච**
**වීඨා කප්පන්ති කප්පියා-ගණ්ඨියා'පි තිම්මයා.**

හුණ මුවා වූ දළ මුවා වූ අංමුවා වූ ඇට මුවා වූ දඬුමුවා වූ ලාමුවා වූ ඵල මුවා වූ සක්නැබ මුවා වූ හුමුවා වූ බණහුණ මුවා වූ ලෝහමුවා වූ වීඨයෝ වටිත්. එකී වෙළු ආදිමය වූ ගණ්ඨිහු වටිත්.

**විස්තර**

45 ඡබ්බග්ගිය භික්ෂූහු කලාබුක (බොහෝ පටවල් ඇති පටිය) දෙඩ්ඩු භක (දිය බරණ හිස් වැනි පුඩු ඇති පටිය) මුරජ (මුරජ නම් වාද්‍ය විශේෂයේ වැටිය මෙන් කළ පටිය) මද්දවීණ (හවඩි මෙන් සටහන් ඇති පටිය) යනාදි නොයෙක් ආකාර ඇති පටි දැරූහ. එය දත් තථාගතයන් වහන්සේ පට්ටිකා (රටා ඇති වැ හෝ නැති වැ හෝ වියූ පටිය ත්) සූකරන්තකා (හූරු බඩවැල් වැනි පටියත්) යන දෙක හා ඊට අනුලෝම් වන රෙදි පටිය ත් එක වෙළුවක් ඇති රැහැණ ත් හැර අනෙකක් පරිභොග නො කට හැකි සේ පැණැවූහ.

ගම් වදනා පැවිද්දන් විසින් පටිය බැඳ ගම්වැදිය යුතුය යි අනුදැන වදාළේ එක් පැවිද්දකු පටිය නො බැඳ ගම් වන් කල්හි වීථියෙහි දී අඳනය සාඬාවැටී ම නිසා ය. "න භික්ඛවේ අකායබන්ධනෙන ගාමො පවිසිතබ්බො, යො පවිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (**චුල්ලවග්ග 330**) යනු ඒ සඳහා විනය ප්‍රඥප්ති යි. අඳනය ඇඳ ඊමතැ පටිය බැඳිය යුතු බව බුද්ධ නියමය යි. එහෙත් අද ඇතැම් කෙනෙක් සිවුර පොරොවා ඊමතැ උදර මධ්‍යයෙන් ද පටියක් බඳිනු දක්නට ලැබෙති. එය අශාස්ත්‍රීය ය. පෙළෙහි වත් අටුවාහි වත් නො සඳහන් හෙයිනි මෙය බඳින්නෝ තම නිදහසට ඇද පානා පාඨයෙක් වේ. එය වූ කලි "හත්ථග්ගවතෙන අනෙනා ගාමො වා හොතු

විහාරෙ වා මනුස්සානං පරිවෙසනට්ඨානං ගච්ඡන්තෙන චීවරං පාරුපිත්වා කායබන්ධනං බන්ධමෙව වට්ටතීති අට්ඨකථාසු වුත්තං" (**සමන්තපාසාදිකා 947**) යන පාඨය යි. එහි "චීවරං පාරුපිත්වා කායබන්ධනං බන්ධමෙව වට්ටති" යන කොටසෙහි අර්ථ වශයෙන් පළමු කොට සිවුර පොරවා කායබන්ධනය බඳින ලද්දේ ම වටනේය යි ද ඔවුහු තේරුම් කරති. අර්ථකථා පාඨයෙහි අන්තරවාසකය සඳහන් කොට නැත්තේ හැම විට ම භික්ෂූන් අන්තරවාසකය හැඳ සිටිනා හෙයිනි. ආරාමය තුළ දී පටිය නො බැඳ සිටිය ද වරදෙක් නැත. එහෙත් ගම්වදනා කල්හි හෝ මිනිසුන් අවුත් දන් වළඳවන තැනට යන විට හෝ (සෙසු ත් යම් ඒ පිරිස් ගැවැසෙන තැනට යන කල්හි හෝ) අඳනය මතැ පටිය බැඳ ම යා යුතු බව මෙයින් ප්‍රකාශ කළා මිස සිවුර මත පටියක් බැඳිය යුතු බව ප්‍රකාශ කොට නැත. "චීවරං පාරුපිත්වා" යන්නට පසුව "කායබන්ධනං බන්ධමෙව වට්ටති" යන මෙය යොදා තිබෙන පමණින් ම සිවුර මතැ පටිය බැඳිය යුතුය යි ගන්නවුන් පද පිළිවෙළින් ම සෙසුතන්හි දක්වෙන කරුණු ත් තෝරන්නට ගිය හොත් කිසිවක යථාර්ථය වටහාගත නො හැකි වනු ඇත.

---

## 34 පඨවීවා'නි

247 **ජාතා'ජාතා'ති දුවිධා-සුද්ධමත්තිකපංසුකා**
**ජාතා'දඩ්ඪා ච පඨවී-බහුමත්තිකපංසුකා**
**චාතුමාසා'ධිකොවට්ට-පංසුමත්තිකරාසි ච.**

ජාත පඨවිය අජාත පඨවිය යි පඨවි තොමෝ දෙ වැදෑරුම් වේ. නො දැවුණු හුදු මැටි හුදු පස් ඇති භූමි ද වැසි වැස සිවුමසක් ගෙවීගිය පස් හා මැටි රැස් ද (ජාතා පඨවි) හටගත් පොළෝ නම් නොහොත් අකැප පොළොව යි.

248 **සුද්ධසක්ඛර පාසාණ-[1]මරුම්බකඨලවාලුකා**
**දඩ්ඪා ච භූමි යෙභුය්‍ය-සක්ඛරාදි මහී'පි ච**
**දුතියා වුත්තරාසි ච-චාතුමාසො මවට්ටකො.**

(හුදු) කැටගල් (හුදු) පහණ (හුදු) බොරළු (හුදු) කැබිලිති (හුදු) වැලි ඇති භූමි ද, දා ගිය භූමි ද, බොහෝ කැටගල් ආදිය ඇති භූමි ද වැසි වැස සිවු මසක් නො ඉකුත් කියන ලද පස්රැස් මැටි රැස් ඇති පොළෝ ද දෙ වැනි වූ කැප පොළෝ නම්.

249 **ද්වෙ භාගා තීසු භාගෙසු-මත්තිකා යාය භූමියා**
**යෙභුය්‍ය මත්තිකා එසා-සෙසෙසු'පි අයං නයො.**

යම් බිමෙකැ තෙ කොටසින් දෙ කොටසක් මැටි ද මෝතොමෝ බොහෝ මැටි ඇත්තී නමු. සෙසු යෙභුය්‍ය පංසු යෙභුය්‍ය සක්ඛරාදියෙහි ද මෙම නය යි.

---

1 මරුම්බකඨා වාලුකා. බු. ඉං.

250 **පාචිත්ති ඛණනෙ ජාතෙ-ජාතසඤ්ඤිස්ස දුක්කටං**
**විමතිස්සා'ජාත සඤ්ඤිස්ස-නාපත්තා'ණාපනෙ තථා.**

අකැප පොළෝහි අකැප පොළොව ය යන සංඥ ඇත්තාහට තමා ම කැණීමෙහි පචිති ඇවැත් වේ. විමති ඇත්තාහට දුකුළා වේ. කැපය යන සංඥ ඇත්තා හට ඇවැත් නැති. ඇණැවීමෙහි ද එසේ ම යි.

251 **පහාරෙ පහාරෙ පත්ති-ඛණමානස්ස අත්තනා**
**එකායා'ණත්තියා එකා-නානා'ණත්තීසු වාචසො.**

තමා විසින් කණින්නාහට පහරක් පහරක් පාසා ඇවැත් වේ. එක වරක් ඇණැවීමෙහි එක ඇවැතක් වෙයි. නොයෙක්වර ඇණැවීමෙහි තෙපුල් ගණනින් ඇවැත් වෙයි.

252 **ඉමං ඨානමිමං කන්ද-මිධවාපිං ඛණෙ'ත්ථ ච**
**ජාලෙහ'ග්ගින්ති වා වත්තුං-නියමෙත්වා න වට්ටති.**

මෙ තැන මේ අලය (ඛණ වා) කණයි හෝ මෙහි හෝ එහි වැවක් සාරව යී හෝ ගිනි දල්ව යි හෝ මෙසේ නියම කොට කීම නො වටි.

253 **ඉමස්සි'මස්සා'වාටං වා-මත්තිකං ජානමාහර**
**කරෙහි කප්පියං චෙ'ති-වචනං වට්ටතෙ'දිසං.**

මේ වැඹට වලක් දනු ව. මැටි ලැබෙන සේ දනුව කියා හෝ ගෙනෙ ව කියා හෝ කැප කරව කියා හෝ යන මෙබඳු වචන වටී.

254 **අසම්බද්ධං පඨවියා-සුක්ඛකද්දම ආදිකං**
**කොපෙතුං තනුකං ලබ්භ-මුස්සිඤ්චනිය කද්දමං.**

පොළොව හා සම්බන්ධ නැති වියළි මඩ ආදිය ද තුනී වූ ඉස්ස හැකි මඩ ද කැඩීම් ඈ විසින් කළකිරුවන්නට වටී.

255 **ගණ්ඩුප්පාද මූපචිකා-මත්තිකං මූසි කුක්කුරං**
**චතුමාසාධිකොවට්ටං-ලෙඩ්ඩාදිඤ්ච න කොපයෙ.**

වැසි වැස සාරමසක් ගිය ගැඩවුළුන් නැගූ මැටි ද, වේ පස් ද මීයන් නැගූ පස් ද සාණ තැන නගුලෙන් කැඩී නැගී මැටිකැටි ආදිය ද නො කඩන්නේ ය.

256 **පතිතෙ වාපි ආදීනං-කූලෙ උදක සන්තිකෙ**
**පාසාණෙ ච රජෙ ලග්ගෙ-පතිතෙ නවසොණ්ඩියා,**

දිය සමීපයෙහි හුණු වැව් ආදීන් ගේ ඉවුරෙහි ද, පහණ පිට ද ලැගි රජස්හි ද අලුත් ගල් පොකුණෙහි ද වැටුණු රජස්හි ද,

257 **වම්මිකෙ මත්තිකා කුඩෙ-අබ්භොකාසුට්ඨිතෙ තථා**
**යෙභුය්‍ය කථලට්ඨානෙ-තිට්ඨති'ට්ඨක කුඩ්ඩකො.**

අබවසැ නැගි තුඹස්හි ද, මැටි පවුරෙහි ද, එසේ ම වැසි වැස සාරමසක් ගිය කල්හි නො කළකිරුවන්නේ ය. අබවසැ නැගු ගඩොළු පවුර බොහෝ සේ කැබිලිති ඇති පොළෝතන්හි සිටී.

258 **එමහාදිං ගණ්හිතුං භූමිං-සඤ්ඤාමලඤ්ඩා විමොපයං**
**ධාරය භින්දිතුං භූමිං-කාතුං වා විසමං සමං.**

**අකැප පොළොව කඩමින්** ඔබිමොබ සොලවා වැම් ආදිය ගන්නට ද ධාරවේගයෙන් (අකැප) බිම බිඳින්නට ද නො සමතැන් සම කරන්නට ද

259 **සම්මජ්ජනිකි කංසිතුං-කණ්ටකාදිං පවෙසිතුං**
**දසෙසස්සාම්'ති භින්දමනතා-භූමිං චඞකම්තුං පදං.**

මුස්තෙන් ගසන්නට ද කටු ආදිය රුවන්නට ද "පියවරක් දක්වමි"යි අකැප බිම පත්ලෙන් බිඳිමින් සක්මන් කරන්නට ද

260 **කංසිතුං අඞගපච්චඞගං-කණ්ඩුරොගි තටාදිසු**
**ගසං වා ඝොට්ටිතුං භූමිං-කංසිතුං න ච කප්පති.**

කැසිම් රෝග ඇත්තහු ඉවුරු ආදියෙහි අඟපසඟ ගහන්නට ද අත සෝදනු පිණිස (අකැප) බිම ගසන්නට (උලන්නට) ද නොම වටී.

261 **එමහාදි මුජ්ඣාධාරෙ-පාසාණාදි පවට්ටනං**
**සාඛාදයා කඩ්ඪනං රුක්ඛ-ලතාවෙජ්දන ඵාලනං.**

වැම් ආදිය කෙළින් ඉදිරීම ද පහණ ඈ පෙරළා ගෙන යෑම ද අතු ආදිය බිම ගසා ඇදගෙන යෑම ද මල රුක් වැල් සිදීම් පැලීම් ද,

262 **සෙකො පස්සාව ආදීනං-සුඛවිණනස්ස වට්ටති**
**අල්ලහසං ඨපෙතඩාන-රජගහණෙ ච භූමියා.**

මූත්‍රාදිය වැගිර වීම ද තෙත් අත්ල බිම ඔබා රජස් ගැන්ම ද පොළො බිඳීම් යන සිත් නැත්තාහට වටී.

263 **අග්ගිස්ස අනුපාදනෙ-කපාලෙ ඉට්ඨකාය වා**
**පාතෙතුං ලභතෙ අග්ගිං-භූමියං වා'වසෙ සති'ති.**

ගින්නට ඉඩක නො වූ හෙවත් ගිනි ගෙන නො දැවිය හැකි කබලෙක හෝ උළුයෙක හෝ ගිනි දැල්වීම ද, (අවසෙ සති) තමාට වසඟ බවක් නැති කල්හි හෙවත් අත් දැවීමාදි ආපදාවක් ඇති කල්හි බිම හෙළීමට හෝ වටී.

**විස්තර**

46 මෙතෙක් "යො පන භික්ඛු පඨවිං ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය වා පාචිත්තියං" යන ශික්ෂාපදය පිළිබඳ **සමන්තපාසාදිකා, මාතිකාට්ඨකථා** යන අටුවාවන්හි ත් එම ටීකාවන්හි ත් ආ විස්තරය සංක්ෂිප්ත කොට ප්‍රකාශ කොට තිබේ. මෙහි තො වැටැහෙන්නක් නොමැති හෙයින් තවත් විස්තර අනවශ්‍ය ය. යමකු සමග සල්ලාපකරමින් සිටියේ පයැ'ඟිල්ලෙන් හෝ සැරයටියෙන් හෝ පොළොව කණී නම් මෙපොහි නො කොට කළ හෙයින් අනාපත්ති යි.

## 35 පරික්ඛාරෙ'ති

264 **පක්ඛවණ්ණානි සුත්තානි-අන්තො බහි ච සිබ්බිතුං
ගිරිකූට'ඩ්ඪචන්දාදිං-ඡත්තෙ පණ්ණෙ ච ඡින්දිතුං.**

තල් පත් කුඩයෙහි ඇතුළත සහ පිටත **පස්වණක් පැහැ'ති හුයින්** (රූ ඇති කොට) මසන්නට ද තල්පත්හි (ගිරිකූට) මෝරදැති අඩසඳ ආදිය කපන්නට ද නො වටී.

**විස්තර**

47 මෙයින් තල්පත් කුඩයෙහි ඇතුළත හෝ පිටත හෝ නොයෙක් නූලින් මසන්නට ත් තල් පත්හි මෝරදැති අඩසඳ ආදිය කපන්නට ත් නො වටිනා බව කීහ. මෙය දක්වන **පාළිමුත්තක විනය විනිශ්චයයෙහි (5)** "කෙචි තාලපණ්ණච්ඡත්තං අන්තො වා බහි වා පඤ්චවණ්ණෙන සුත්තෙන සිබ්බන්ති වණ්ණමට්ඨං කරොන්ති, තං න වට්ටති. එකවණ්ණෙන පන නීලෙන වා පීතකෙන වා යෙන කෙනචි සුත්තෙන අන්තො වා බහි වා සිබ්බිතුං, ඡත්ත දණ්ඩගාහකං සලාකපඤ්ජරං වා විනන්ධිතුං වට්ටති, තඤ්ච ඛො පිරකරණත්ථං, න වණ්ණමට්ඨත්ථාය. ඡත්තපණ්ණෙසු මකරදන්තකං වා අඩ්ඪචන්දකං වා ඡින්දිතුං න වට්ටති"යි සඳහන් වේ.

248 **ඡත්තෙ**

ඡත්‍රයෙහි යනු යි. ඡත්‍ර තුනක් අනුදත් සැටි. "තීනි ඡත්තානි සෙතච්ඡත්තං කිලඤ්ජච්ඡත්තං **පණ්ණච්ඡත්තං**" (**පාචිත්තියපාළි 364**) ප්‍රකාශ වේ. එයින් සෙතච්ඡත්ත යනු "ජිනකකුඩ යි" යනුයෙන් **කංඛාවිතරණී පිටපතෙහි (129 පිටුවෙහි) එයි.** එය නම් සුදු කුඩය යි. පෙර මේ කුඩ චීන දෙශයෙහි බහුලව සෑදූ හෙයින් මෙ නම් වී. **කිලඤ්ජච්ඡත්ත** යනු කඩරෙදි කලාල් ආදියෙන් කරන ලද්ද යි. "**පණ්ණච්ඡත්ත**" නම් තල් ආදි කොළ සත යි.

265 **සටකං වාළරූපං වා-දණ්ඩෙ ලෙඛා න වට්ටති
වට්ටති දණ්ඩබුන්දම්හි-අහිච්ඡත්තකසාදිසං.**

සත් දණ්ඩෙහි කොතුරුපක් ද (කලස් සටහනින් කළ පේකඩ ද) ව්‍යාලරූප ද ඉරි ද නො වටී. (**දණ්ඩබුන්දම්හි**) සත් දඬුමුල හෙවත් කුඩ පුඩුමුල පිපීගිය සත්තක් බඳු සටහන වටී.

266 **සිබ්බිතුං එකවණ්ණෙන-පඤ්ජරං වා විනන්ධිතුං
පිරත්ථං වට්ටති ඡත්තෙ-දණ්ඩෙ ලෙඛා'ව බන්ධිතුං.**

සැපිරවීම පිණිස එක් පැහැති හුයින් පත්කුඩය ඇතුළෙහි හා පිටත මසන්නට ද (පඤ්ජරං) කුඩතත වෙළන්නට **ද** වටී. **සැත් මැඞිල්ලෙහි** සුලඟින් නො සැලෙන සේ රැහැණින් දණ්ඩෙහි බඳනා පිණිස සැත් දණ්ඩෙහි රේඛාවක් වටී.

267 අනෙන පත්තම්බෙ වා'පි-වෙණිං සඞ්ඝලිකා'පි වා
සූච්චිකාර මක්කුදං වා-චීවරෙ න ච කප්පති
කප්පබින්දු විකාරම්පි-පාලිකණ්ණිකා ආදිකං.

නුවාසෙහි හෝ දෙ පත් අග ගැළපූ තැනැ හෝ අමු කරල් වැනි වෙණි ද, බලල්දම් වැනි දම් ද, මෙසින් අන්‍ය වූ තන් හුසින් සතපදි ආකාරාදීන් කරන යම්කිසි සූචිකම් විකාර ද, පෙළ කප් කන් කප් (කප්බිඳු පෙළට තැබීම ත් කොන්හි තැබීම ත් පෙළකප් කන්කප් නම්.) ආදි කප්බිඳු විකාර ද සිවුරෙහි නො වටී.

268 ගණ්ඨිපාසක පට්ටා'පි-චතුකොණා'ව අග්ඝිකං
මුගගරෙ කක්කටච්ඡාදි-විකාරං නෙ'ත්ථ වට්ටති.

ගැටපත් (ගණ්ඨිය අමුණන තන්හි තබා මසන රෙදි කෑල්ල) මලපත් (ගණ්ඨිපාසය අමුණන තැන අල්ලන රෙදි කෑල්ල) යන දෙක සිවුරස් ව ම වටී. ඇගෑ සටහන් ද මුගුරු සටහන් ද කකුළු ඇස් ඈ ආකාර ඇති සූචි විකාර ද මේ ගණ්ඨිපාස පත්‍රයන්හි නො ම වටී.

269 කොණසුත්තා ච පිළකා-දුච්චෙඤ්ඤෙය්‍යා'ව කප්පරෙ
ගන්ධං තෙලං ච ලාඛං වා-රජනෙ න ච පක්ඛිපෙ.

(කොණසුත්තා ච) ගණ්ඨිපාසපට්ටයන් ගේ කොනින් නිකුත් හූ ද (පිළකා) එම හූ නවතා පිළකාකාරයෙන් (බුබුලක් සේ) කළ නූල් ගුළි ද යන මොහු රැඳූ කල්හි නො දත හැක්කාහු ම වටි ත්. සුවඳ පිණිස ගඳ ද තෙල් ද ලා ද රජන් පඬුයෙහි නො ලන්නේ ය.

270 රත්තං සඞ්ඛන මණිනා-ඝට්ටෙය්‍ය'ඤ්ඤෙන වා න ච
සංසෙය්‍ය දොණියං කත්වා-පහරෙ න ච මුට්ඨිනා.

රැඳූ සිවුර හකින් හෝ මසාරගලලාදි පහණින් හෝ මුගුරු ඈ අනෙකකින් හෝ ඔප් නැඟීම පිණිස නො ගටන්නේ ය. රදන් දෙණ තබා අතින් නො ගසන්නේ ය.

**විස්තර**

48 සිවුරු පඬු පොවන්නහු විසින් එය කළ යුතු සැටි මෙසින් ලුහුඬින් ප්‍රකාශිත සි. සිවුර පඬු පොවා ඔප් නඟා ගැනුමට හක් ඈ කිසිවකින් නො ගැටිය යුතු බව ත් අතින් ගෙන පඬු ඔරුවෙහි වත් නො ගැසිය යුතු බව ත් උගන්වන ලදි. එපමණක් නො ව යටත් පිරිසෙයින් මිටිනුදු හසන්නට නො වටි. පැරණි තෙරුන් රඳන් දෙණෑ ද නො තබා එක් නමක් අතින් ගෙන සිටි ත් ම අනෙක් නම අතෙහි තබා අතින් ගසා පොඩි කළ සැටි පාලිමුත්තක විනයෙහි 6 පිටුවෙහි එන්නේ "චීවරං රජිත්වා සඞ්ඛෙන වා මණිනා වා යෙන කෙනචි න ඝට්ටෙතබ්බං, භූමියං ජානුකානි නිහන්ත්වා හත්ථෙහි ගහෙත්වා දොණියම්පි න ඝංසිතබ්බං, දොණියං වා ඵලකෙ වා ඨපෙත්වා අන්තෙ ගාහාපෙත්වා හත්ථෙන පහරිතුං පන වට්ටති. තම්පි මුට්ඨිනා න කාතබ්බං. පොරාණකත්ථෙරා පන දොණියම්පි න ඨපෙසුං. එකො ගහෙත්වා තිට්ඨති, අපරො හත්ථෙ කත්වා හත්ථෙන පහරති'' යනුවෙනි.

271 කණ්ණකොණකසුත්තානි-රත්තෙ ඡින්දෙය්‍ය චීවරෙ
ලෙඛා න වට්ටති ධම්ම-කරකෙ ඡත්තවට්ටියං.

272 ලෙඛං ඨපෙත්වා මණිකා-පිළකා කුඤ්චිකාය ච
පිප්ඵලෙ ච පරිච්ඡෙද-ලෙඛාදණ්ඩම්හි වට්ටති.

249 **කණ්ණකොණක සුත්තානි**

මේවා සිවුරු පඬු පෙවීම සඳහා සතර කොණින් කණු සතරක බැඳීම පිණිස ඇමුණු නූල් විය යුතු යි. එබැවින් පඬු පෙවූ පසු ඒවා කපා හළ යුතු බව ප්‍රකාශිත යි. "කණ්ණසංඛාතකොණා" යන වචනයෙන් මෙය එකක් බව පෙනේ.

(271–272) අථ.

සිවුරෙහි එල්බෙන නූල් ද රඳන කල එල්ලීමට තුවායෙහි බඳනා කණ්සූත්‍ර ද සිවුර රඳූ කල්හි කපන්නේ ය. සත්මුවවිට රේඛාවක් තබා ඩබරයෙහි අන්‍ය රේඛාවක් නො වටී. යතුරෙහි ද කතුරෙහි ද (මණිකා) මහත් බුබුළු හා කුඩා බුබුළු ද නො වටී. කතුරු දණ්ඩෙහි පරිච්ඡේද රේඛාවක් වටී.

273 මාලාද්‍යරණීයං පත්ත-මණ්ඩලෙ භත්තිකම්ම ච
හෙට්ඨා ලෙඛාද්වයං උද්ධ-මහිච්ඡත්තකසාදිසං

274 භිත්වා කත්තරයට්ඨිම්හි-සූචිසණ්ඩාසකෙ'පි ච
යංකිඤ්චි ගිරිකූටාදි-වණ්ණමට්ඨං න වට්ටති.

අරණී භාණ්ඩයෙහි (ගිනි ගානා දඬු ආදියෙහි) මාලාකර්මාදිය ද පා තබන තිපු සීසාදිමය පා මඬුල්ලෙහි මෝරුදැති මිස සෙසු විහත්ති කම් ද නො වටී. සැරයටියෙහි යට රේඛාද්වයක් ද මත්තෙහි හිස සතු කැකුලක් බඳු සටහන් ද හැර වතමටකමෙක් ද ඉදිකටු ගන්නා දඬුඅඬුවෙහි මෝරුදැති ඈ යම්කිසි රුවැති දෙයක් ද කිරීම නො වටී.

275 බිම්බොහනෙ භිසිමඤ්ච-පීඨාදි සයනා'සනෙ
සම්මුඤ්ජනිම්හි සඞ්කාර-ඡඩ්ඩනෙ රඞ්ගභාජනෙ

බිම්බෝහනයෙහි ද, බිසි ය හැඳ පුටු ය බුමුතුරුණු ය යනාදි හොත්නා හිඳනා දෑයෙහි ද, මුස්නෙහි ද කසළ භාජනයෙහි ද, පඬු ඔරු ඈ රජන් බඳුන්හි ද,

276 පානීය භාජනෙ පාද-පීඨෙ කඨලිකාය ච
පත්තාධාර පිධානෙසු-තාලවණ්ටෙ ච වීජනෙ
යංකිඤ්චිමාලාකම්මාදි-වණ්ණමට්ඨම'වාරිතං

පැන් බඳුනෙහි ද දෙවි පා තබන පුවරුවෙහි ද නො දෙවි පා තබන පුවරුවෙහි ද පාත්‍ර වළලු හා පියන්හි ද තල්වැටෙහි ද සිවුරැස් වීජනියෙහි ද (මාංගම්රුහැර) මාලාකර්මාදි වූ යම්කිසි රුවැති දෙයක් කිරීම නො වළක්වන ලදී.

277 **සෙනාසනෙ පනද්වාර-කවාටාදිප්පභෙදනෙ**
**සොවණ්ණමපි'නුඤ්ඤාතං-වණ්ණමට්ඨම්හි කා කථා.**

දොර කවුළු දොරබා ඈ ප්‍රභෙද ඇති ප්‍රාසාදදි සෙනසුන්හි රන්කමුදු අනුදන්නා ලදි. වණ්ණමට්ටයෙහි ලා කවර කථා ය.

278 **විසාණනාළි ලාබුවාදි-ප්පභෙදෙ තෙල භාජනෙ**
**පුමිත්ථිරූප රහිතං-වණ්ණමට්ඨමවාරිතං.**

තෙල් අං තෙල් නළ තෙල් ලබු ඈ ප්‍රභෙද ඇති තෙල් බඳුනෙහි පුං ඉතිරි රූ විරහිත වණ්ණමට්ටය නො වළකන ලදි.

## 36 භෙසජ්ජ'නති

279 **ජනස්ස කාතුං භෙසජ්ජං-දාතුං වත්තුං න ලබ්භති**
**භික්ඛාචරිය විඤ්ඤත්ති-සකෙහි සහධම්මිනං**

නො හැ ජනයාහට බෙහෙත් කරන්නට ත් දෙන්නට ත් කියන්න ට ත් නො වටි. සිඟා ලද බෙහෙත් ඉල්ලා ගත් බෙහෙත් තමා අයත් බෙහෙත් යන මෙයින් පස්සහදම්මියන් හට ත්,

280 **පිතුන්නං තදුපට්ඨාක-භික්ඛුනිස්සිත පණ්ඩුනං**
**ලබ්භං භෙසජ්ජකරණං-වෙය්‍යාවච්චකරස්ස ච.**

මවුපියන්හට ත් ඔවුන්ගේ සේවකයන්හට ත් භික්ෂූන් නිසා වසන්න වූනට ත් පණ්ඩු පලාසයනට ත් සිය මෙහෙකරුවාට ත් බෙහෙත් කිරීම සුදුසු යි.

281 **මහාචුල්ල පිතා මාතා-භාතා භගිනි ආදිනං**
**තෙසං සකෙන'සනනියෙ-දාතබ්බං තාවකාලිකං.**

(මහාචුල්ලපිතා) මහලුපිය සුලුපියයෝ ය (මාතා) මහලුමවු සුලුමවු ය, (භාතා) සහෝදරයා ය, (භගිනි ආදිනං) සොහොයුරිහු ය (ආදි ශබ්ද යෙන් නැදිමයිලෝ ගැනෙති. ඒ දශදෙනාට (සකෙ සති) ඔවුන් සතු බෙහෙත් ඇති කල්හි ඒ බෙහෙතින් බෙහෙත් කටයුතු ය. (න අසන නියෙ) උන්සතු බෙහෙත් නැති කල්හි (පසුව ගැනීමට) තාවකාලික වශ යෙන් මිස තමාසතු බෙහෙත් නො දිය යුතු යි. (එසේ දුන් කල්හි ආපසු දේ නම් ගත යුතු බව ත් නො දේ නම් චොදනා නො කටයුතු බව ත් "සචෙ පටිදෙනති ගහෙතබ්බං නො චෙ දෙනති න චොදෙතබ්බං" සී අට්ඨ කථාහි එයි.

282 **කුලදූසන විඤ්ඤත්ති-භෙසජ්ජකරණාදිහි**
**මාතා පිතූහි සම්බන්ධ-ඤාතකෙසු න රූහති.**

කුලදූෂණ ය, සිවුපස ය ඉල්ලීම ය, බෙහෙත් කිරීම ය යනාදියෙන් මවුපියන් හා සබඳ වූ සත්වන කුල පරපුර දක්වා එක්බැඳි වූ නෑයන් කෙරෙහි ආපත්තිජනක නො වේ.

283 **පිණ්ඩපාතො අනාමට්ඨො-මාතාදීනමථාරිතො**
**ජනනං දම්රිචොරස්ස-දාතුම්ස්සරියස්ස ච.**

ස්පශී නො කරන ලද පිණ්ඩපාතය මව්පියාදි සදෙනාට ද ගම් පහරණ සොරුනට ද ඉසුරු හට ද දීම ගැන නො වලක්වනලදි.

284 **තෙසං සුතොතාදකෙනෙව-පරිත්තං කරෙ න'ත්තනො**
**භණිතබ්බං භණාපෙනෙන-පරිත්තං සාසනොගධං.**

ඒ නො තැ ගිහි මිනිසුන් ගේ සූත්‍රොදකයෙන් ම පිරිත් කරන්නෝ ය. තමා අයත් සූත්‍රොදකයෙන් නො කරන්නෝ ය. පිරිත් බණවන විට ශාසන පයඁාපන්න වූ රතන සූත්‍රාදි පිරිත් කිය යුතු.

285 **සීලං ධම්මං පරිත්තං වා-ආගන්ත්වා දෙතු භාසතු**
**දාතුං වත්තුං ලභති-ගන්ත්වා කෙනචි පෙසිතො.**

අවුත් සිල් දෙත්වා යී හෝ බණ කියත්වා සී හෝ පිරිත් කියත්වා යී හෝ (රජ යුවරජ ආදි) කිසිවකු විසින් ආරාධනා කොට එවන ලද්දේ එහි ගොස් සිල් දෙන්නට ත් බණ කියන්නට ත් පිරිත් දෙසන්නට ත් වටී.

250 **ජනස්ස**

මෙයින් දස නැයන් හැර සෙස්සෝ ගැනෙති. ඔවුනට බෙහෙත් කිරීම්- දීම්- කීම් කිසිවක් කළ නො හැකි ය. මේ කිසිවක් කළ කල්හි දුකුළා අවදී.

251 **සහධම්මිනං**

මෙයින් භික්ෂු භික්ෂුණී සික්ෂමානා සාමණේර සාමණේරි යන පස්දෙන ගැනෙත්. යම් භික්ෂුවක් වෙදකම් දනී නම් ඔහු විසින් මේ පස්දෙනාහට බෙහෙත් කිරීම නිවරද ය. ඔවුන් ළඟ බෙහෙත් නො මැති නම් තමා සතු බෙහෙත් හෝ දිය යුතු ය. එසේ ත් නැත් නම් භික්ෂාචාර වතින් හෝ සපයා දිය යුතු ය. තමාහට පවරා ඇති තැනෙකින් හෝ නැයකුගෙන් හෝ ලබා ගෙන දිය යුතු ය. (**සමන්තපාසාදිකා** 335 පිටුව සහ **පාලි මුත්තක විනය විනිශ්චය** 8 පිටුවත් කියවනු.)

252 **පිතුන්නං**

මවුපියන්හට යනු යි. මාතා ච පිතා ච පිතරො. තෙසං පිතුන්නං යී එකාසෙස සමාස විෂයයෙහි සිටී. මවුපියනට බෙහෙත් කිරීමේ දී යම් ලෙසකින් මවුපියෝ ඉසුරෝ (පොහොසත්තු) වෙද් ද, භික්ෂුව ගෙන් බෙහෙත් කරවා ගැනීමට බලාපොරොත්තුවකුත් නැද් ද, එවිට නො කළාට වරදෙක් නැති. මවුපියන් රජව සිටිය ද භික්ෂුව ගෙන් උපස්ථානාදිය බලාපොරොත්තු වන විට කළ යුතු ය. මව වෙහෙරට ගෙනවුත් උපස්ථාන කරන කල්හි තෙමේ ආමසනය නො කොට අන් හැම කිස කටයුතු වේ. පියා උදෙසා නම් සාමණේරයකු හට මෙන් සියතින් නැවීම් ඈ සියල්ල

කළමනා ය. බෙහෙත් ආහාරාදිය ගැන පඤ්චසහධම්මිකාන් උදෙසා සෙවුව මනා පරිදි මවුපියනට ද සොයා දිය යුතු. මවුපියන් ගේ උපස්ථායකයන් උදෙසා ද මෙසේ ම කටයුතු ය.

### 253 භික්ඛුනිස්සිත භණ්ඩුනං

භි... න් ඇසුරෙන් වසන්නා සහ පණ්ඩුපලාසයා යි. වෙතනය පිණිස භික්ෂූන් ගේ කටයුතු කරන්නකු ලෙඩ වූ කල්හි ඔහු ගේ ඥාතීන් දකිනතුරු සියල්ල කටයුතු ය. භික්ෂූන් ඇසුරින් ම යැපීමින් භික්ෂූන් ගේ කුදු මහත් කටයුතු කරන්නකු උදෙසා නම් සියල්ල ම කළ යුතු ය. භණ්ඩු නම් පණ්ඩුපලාසයා යි. පැවිද්ද බලාපොරොත්තුවෙන් පා සිවුරු සම්පාදනය වනතුරු වෙහෙර වසන ප්‍රව්‍රජ්‍යා පෙක්ෂකයා යි.

### 254 තෙසං (දසන්නං)

ඒ දස නෑයන්ට යනු යි. "ජෙට්ඨභාතු කනිට්ඨභාතු ජෙට්ඨ භගිනියා කනිට්ඨ භගිනියා චූලමාතුයා මහාමාතුයා චූලපිතුනො මහාපිතුනො පිතුච්ඡාය මාතුලස්සාති" (**සමන්තපාසාදිකා 336**) මෙයින් වැඩිමහලු සහෝදරයා ය– බාල සහෝදරයා ය– අයියා– මල්ලී– අක්කා– නංගී– කුඩම්මා– බාප්පා– ලොකු අම්මා– ලොකු තාත්තා (මහප්පා) නැන්දා– මාමා යන දශ නෑයෝ ගැනෙත්. මේ දශ නෑයනට බෙහෙත් කිරීමේ දී ඔවුන් සතු බෙහෙත් ම ගෙන තමන් ඒවා යොදා දිය යුතු ය. ඔවුන් සතු බෙහෙත් නො පොහොනේ නම්, ඉල්ලූ විට තාවකාලික වශයෙන් දිය යුතු ය. පසු ව දුන් කල්හි ගත යුතු ය. නුදුන් විට චෝදනා නො කටයුතු ය.

### 255 මාතාපිතුහි සම්බන්ධ ඤාතකෙසු නාරූහති

කුලදූසනය වච්චිඤ්ඤත්තිය ය භෙසජ්ජකරණය යන මේ තුන ගැන මවුපියන් ගේ සත් වන කුල පරපුර දක්වා ආපත්ති ජනක නො වන බව මෙයින් කිහ. (විස්තරාර්ථීන් **සමන්තපාසාදිකා 336** යෙන්) බලා දතයුතු. නො නෑයකුට වුවත් ස්වාමීනි, අසුවල් රෝගයට කවර බෙහෙතක් සුදුසුදැයි ඇසූ විට "මේ මේ බෙහෙත් ය"යි කීම වටී.

### 256 පිණ්ඩපාතො අනාමට්ඨො

ආමසනය නො කළ පිණ්ඩපාතය යි. මෙය මවුපියන්හට සහ ඔවුනට උවැටැන් කරන්නනට ත් භික්ෂු නිඃශ්‍රිතයන් හට ත් පණ්ඩුපලාසයාට ත්, සිය වතාවත් කරන්නන්හට ත් යන සදෙනාට හා දමරික සොරුට ත් ඉසුරුට ත් දිය යුතු යි. දමරික සොරුට සහ ඉසුරුට නුදුන් කල්හි නුදුන්නේ ය යී කීජේ. ආමසනය කළ දැයක් දුන් කල්හි ඉඳුල් වූවක් දුන්නේය යි කීජේ. මේ නිසා අනාමට්ඨ පිණ්ඩපාතය දීමට අනුදත්හ. (**සමන්තපාසාදිකා 338 පාලිමුත්තක විනය විනිශ්චය 12**)

### 257 තෙසං සුත්තොදකෙහෙව

නො නෑ කිසිවකු පිරිත් පැන් පිරිත් නූල් කොට දෙන්නට ය යි කියා පැන් හෝ නූල් දුන් කල්හි පිරිත් කොට දිය යුතු යි. විහාරයෙන් දිය හෝ

නූල් හෝ දේ නම් දුකුළා සි. විස්තරාර්ථීන් විසින් පාළිමුත්තක විනය විනිශ්චයෙන් (11) හෝ සමන්තපාසාදිකාවෙන් (337) හෝ බලා දත මනා ය.

---

### 37 උග්ගහෙ ති

286 කම්මචෙතිය සඞ්ඝඤ්ඤ-පුග්ගලත්ථං ගණස්ස ච
දසභෙදම්පි රතනං-උග්ගණ්හන්තස්ස දුක්කටං.

නවකම් පිණිස ද දාගැබ් පිණිස ද සඞ්ඝයා පිණිස ද අන් පුද්ගලයකු පිණිස ද සුත්තන්තිකාදි ගණයක් පිණිස ද දශවිධ රත්න ගන්නාහට දුකුළා වේ.

258 දසභෙදම්පි රතනං

මුත්තං මණිං වෙළුරියඤ්ච සඞ්ඛං
සිලං පවාලං රජතං සුවණ්ණං
මසාරගල්ලම්පි ච ලොහිතඞ්කං
දසප්පකාරං රතනං වදන්ති."
(ක්‍ෂුද්‍රසික්‍ෂා පුරාණ සන්නය 113 පිටුව.)

287 නිස්සග්ගි තෙසු අත්තත්ථං-සීසු සෙසෙසු දුක්කටං
අනාමසිත්වා වුත්තෙන තු-ගණ සඞ්ඝඤ්ච පුග්ගලං

288 චෙත්‍යස්ස නවකම්මස්ස-දම්මී'ති න පටික්ඛිපෙ
වදෙ කප්පියකාරානං-වදගොන'වම් මෙ ඉති.

ඒ දශවිධ වූ රත්නයන් අතුරෙන් තමා උදෙසා ගන්නහුට ජාතරූප රජත දෙක්හි නිසගි වේ. සෙසු අටරුවන්හි දුකුළා සි. ගණයා හෝ සඞ්ඝයා හෝ පුද්ගලයකු හෝ සඳහන් නො කොට චෛත්‍යයට දෙමි. නවකම් පිණිස දෙමි යී මෙසේ කී කල්හි ප්‍රතික්‍ෂෙප නො කරන්නේ ය. (එවිට) මොහු මෙසේ කියතැ'යි කැපකරුවන්හට කියන්නේ ය.

259 නිස්සග්ගි

මෙකී දශවිධ රත්න අතුරෙන් ජාතරූප රජත (රන් රිදී) දෙක තමාගේ ප්‍රයෝජනය සඳහා පිළිගත් විට වස්තුව නිසගි වී පචිති ඇවැත් ද සිදුවන බව ප්‍රකාශිත සි. "යො පන භික්ඛු ජාතරූපරජතං උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං" යම් මහණෙක් රන් රිදී තමා පිණිස ගනී නම් හෝ, අනුන් ලවා ගන්වා නම් හෝ, තමා පිණිස තැබූ රන් රිදී ප්‍රතික්‍ෂෙප නො කොට ඉවසා නම් හෝ නිසගි පචිති වේ. මෙහි දැක්වෙන ජාතරූප රජත යන්නට ගනුදෙනු කරණ (වලංගු) හැම මුදල් වර්ග ම අයත් වේ. ඒ බව "අපි ච කහාපණෙන- ලොහමාසක දාරුමාසක ජතුමාසකාදයො'පි යෙ වොහාරං ගච්ඡන්ති, සබ්බෙ තෙ ඉධ රජතන්තෙ'ව වුත්තා" (මාතිකාට්ඨකථා 71) සී ප්‍රකාශිත සි. මේවා පිළිගත් වස්තු ගණනින් නිසගි පචිති වේ. එය නිසජන්නහු විසින් "අහං

**භන්තෙ රූපියං පටිග්ගහෙසිං ඉදං මෙ භන්තෙ නිස්සග්ගියං ඉමාහං නිස්සජ්ජාමි''** යි කියා සඟ මැද ම නිසජ්ය යුතු යි. යම් ගිහියෙක් යේ නම් මෙය දනුව'යි කිවමනා ය. එය දී යම් කැප දෑයක් ගෙනැත් දුන් විට එය පරිභොග කිරීමට රූපිය පටිග්ගාහකයා හැර සෙස්සනට වටී. රූපියපටිග්ගාහකයා හට ඒ මුදලින් වැවූ ගසෙක්හි සෙවණ ද අකැප ය.

එවැනි ගිහියකු නැති කල්හි පසඟින් යුත් රූපියඡඩ්ඩක භික්ෂුවක් සම්මත කටයුතු ය. ඔහු විසින් එහි නිමිති නො සිතා ම විසිකළ යුතු යි. නිමිති ගත් කල්හි ඒ රූපිය ඡඩ්ඩක භික්ෂුව ද දුකුළා අවදී. (**මාතිකාට්ඨකථා 71**) විස්තරාර්ථීන් **පාලිමුත්තක විනය විනිශ්චයයේ 53** පිටුවේ සිට **67** දක්වා කියවිය යුතු.

289 **ඛෙත්තං වත්ථුං තළාකං වා - දෙනෙත දාසපසවාදිකං**
**පටික්ඛිපිත්වා ගණ්හෙය්‍ය - කප්පියෙන කමෙන ච**
**ඛෙත්තාදීනි විහාරස්ස - වුත්තෙ දම්මීති වට්ටති.**

ක්ෂෙත්‍රයක් හෝ වත්තක් හෝ තඩාගයක් හෝ දෑසිදස් ගෙරි මීමුන් ආදිය හෝ (සඟහට ගණහට පුඟුල්හට දෙමැ යි) දෙන කල්හි අකැප ය යි ප්‍රතික්ෂෙප කොට (නැවත) කැප ක්‍රමයෙන් ගන්නේ ය. "ක්ෂෙත්‍රාදිය විහාරයට දෙමි'' යි කී කල්හි වටී.

**විස්තර**

49 කුඹුරු වතුපිටි තඩාග හෝ දෑසි දස් ගව මහිෂාදීන් හෝ සංඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයකුට හෝ දෙමැ යි කී විට එසේ දීම ශාසනානුලොම්‍ය නො වන නිසා ප්‍රතික්ෂෙප කොට "ඒවා විහාරයට දෙමි'' යනාදීන් කියා දුන් විට කැප බව මෙයින් ප්‍රකාශිත යි.

එය පැවැසෙන්නේ මෙසේ ය. "කප්පියෙන කමෙන ගහණං නාම ඛෙත්තං දම්මිං වත්ථුං දම්මි තළාකං දම්මි දාසං දම්මි ගොමහිසඅජෙළකා දයො දම්මී'ති වුත්තෙ න වට්ටතීති පටික්ඛිපිත්වා, ඉතො චත්තාරො පච්චයෙ පරිභුඤ්ජන්ති වා චතුපච්චය පරිභොගත්ථාය දම්මීති වා සඞ්ඝො උදකං පරිභුඤ්ජිස්සතු භණ්ඩකං ධොවිස්සතූති වා ආරාමිකං වෙය්‍යාවච්චකරං කප්පිය කාරකං දම්මීති වා පඤ්චගොරස පරිභොගත්ථාය දම්මීති වා වුත්තෙ අථා'පි මම තළාකං වා පොක්ඛරණිං වා සඞ්ඝස්ස දම්මීති වුත්තෙ සාධු උපාසක සංඝො පානීයං පිවිස්සති භණ්ඩකං ධොවිස්සති මිගපක්ඛිනො පිවිස්සන්තීති වත්වා වා සම්පටිච්ඡනං." (**පුරාණ සන්නය 109**) අදහස සුගම යි.

290 **නවමාතික කෙදාර-තළාක කිරියා'නවෙ**
**මත්තිකුද්ධරණං බන්ධා-පීරිකාරෙ ච ආළියා.**

අලුත් ඇළ, අලුත් කුඹුරු, අලුත් වැව් යන මේවා කැනීම් ද (අනවෙ) කලින් පිළිගත් පරණ වැව්හි මැටි ඉදිරීම් ද (බන්ධො) කැඩුණු වැකඩ බැඳීම් ද වැමියර පිඬු ගසා දුර්වල තැන් තරකිරීම් ද;

291 **අතිරෙකභාගා'දානං-කෙදාරෙ අනාව නවෙ**
**අපරිච්ඡින්නභාගෙ ච-සස්සෙ දෙසෙ'න්තකෙ ඉති**
**කහාපණුට්ඨාපනඤ්ච-සබ්බසම්පි අකප්පියං.**

(අනවෙ කෙදරෙ) පරණ කුඹුරෙහි පෙර සිරිත් සේ නො ගෙන වැඩි කොටස් ගැනුම ද, කොටස් නියමයක් නො කළ අලුත් කුඹුරෙහි කළ ගොයම්හි මෙපොක් කහවණු දෙව යි කහවණු නැගීම් ද, හැම දෙන හට ම අකැප යි.

292 **අවත්වා කස්සපි'ච්චා-දෙන්තිකාය ච භූමියා**
**පතිට්ඨාපෙති භූමිං වා-භාගො දෙය්‍යො'ති එත්තකො**

භාව චපුරව යනාදි අකැප තෙපුල් නො කියා මෙතෙක් කුඹුරෙහි මෙතෙක් කොටස් දිය යුත්තේ ය යි බිම් පමණ හෝ පිහිටුවා ද (නියම කෙරේ ද)

293 **භූමිභාගෙ කතං සස්සං-එත්තකං ගණ්හථෙ'ත්තකං**
**ගණ්හන්තං වදන්තෙ'වං-පමාණං දණ්ඩරජ්ජුහි**

මෙතෙක් භූමිභාගයෙහි කරනලද ගොයමට මෙතෙක් භාග ගනුව යි මෙසේ ගොයම් කළවුන් කියන කල්හි ඒ වචන නො අදහා තමා ම කුඹුරෙහි පමණ දන්නා පිණිස දණ්ඩන් හා රැහැණින්;

294 **මිනන්තෙ රක්ඛන්ත ඨත්වා-ඛලෙ තං නීහරාපනෙ**
**කොට්ඨාදි පටිසාමනෙ-තස්සෙ'වෙතමකප්පියං.**

මිනීමෙහි ද කළවිටැ සිට රැක්මෙහි ද ඒ ධාන්‍යය කළවිටින් ඇද්ද වීමෙහි ද කොටු ගේ ආදියෙහි ලවා සඟවා තැබුමෙහි ද යමෙක් යෙදුණේ නම් මේ ධාන්‍යය ඔහුට ම අකැප යි.

295 **පටිසාමෙය්‍ය පාචිත්ති-යං කිඤ්චි ගිහිසන්තකං**
**භණ්ඩාගාරික සීසෙන-සචෙ'පි පිතුසන්තකං.**

මවුපියන් සතු වූ ද ගිහි මිනිසුන් අයත් කැප අකැප යම්කිසි දෙයක් රැකැදෙම් යන සිතින් සඟවා තබා නම් පචිති වේ.

296 **පිතුන්නං කප්පියං වත්ථුං-අවස්සං පටිසාමියං**
**අත්තනො සන්තකං කත්වා-ලබ්භතෙ පටිසාමිතුං.**

මවුපියන් සතු වූ අවශ්‍යයෙන් ම සඟවා තැබිය යුතු වූ වස්ත්‍රාදි කැප වත් තමා සතු කොට සඟවා තබන්නට වටී.

297 **දෙහී'ති පටිසාමෙත්වා-වුත්තෙන වා'පි පක්ඛිපෙ**
**පාතෙත්වාන ගතෙ ලබ්භං-පලිබොධො'ති ගොපිතුං.**

සඟවා තබා දෙවයි කියන ලද්දේ ද නො වටනා බව කියා ප්‍රතික්ෂෙප කාරන්නේ ය. රැක දෙවයි එහි දමා මවුපියන් ගිය විට පළිබොධයකැයි සිතා රක්නට වටනේ ය.

298 කම්මං කරොන්තා ආරාමෙ-සඞ්ඝං වඩ්ඪකිආදයො
පරික්ඛාරං ච සයන-භණ්ඩං වා රාජවල්ලභා.

වෙහෙර වැඩ කරන වඩු ආදීහු වැ පොරෝ ආදි සිය බඩු හෝ රාජ වල්ලභයෝ තමන් ගේ සළලාදි හෝනා බඩු හෝ,

299 දෙහී'ති පට්ඨපෙත්වා-වදන්ති යදි ඡන්දසො
න කාරෙය්‍ය භයා ඨානං-ගුත්තං දස්සෙතු වට්ටති
බලක්කාරෙන පාතෙත්වා-ගතෙ තු පටිසාමිතුං.

සඟවා තබාපියා දෙව යි ඉදින් කියත් නම් (ඡන්දසො) වඩු ආදීන් කෙරෙහි ස්නෙහයෙන් ද (භයා) රාජවල්ලභයන් කෙරෙහි භයින් ද සඟවා නො තබන්නේ ය. රක්‍ෂාස්ථානයක් පෙන්වන්නට වටී. බලාත්කාරයෙන් තබා පියා ගියකල්හි සඟවා තබන්නට වටී.

300 භික්ඛුං මනුස්සා සඞ්කන්ති-නට්ඨෙ වත්ථුම්හි තාදිසෙ
විහාරාවසථස්සන්තො-රතනං රතනසම්මතං

රන් පිළී ඈ එබඳු වස්තුවක් නැති වූ කල්හි මිනිස්සු භික්‍ෂුව සැක කරත්. විහාරය තුළ හෝ තමා වසන කාමරය ඇතුළ මුතු මැණික් ඈ රුවනක් හෝ රුවනැ යි සලකන ලද පිළී ඈ කැපවතක් හෝ (වේ නම් එය)

301 නික්ඛිපෙය්‍ය ගහෙත්වාන-මහග්ඝ'රඤ්ඤෙපි තාදිසෙ
සාමිකානාගමං ඤත්වා-පතිරූපං කරිස්සති.

ගෙන බඩු හිමියන් දක්නා තැනෙක්හි තබන්නේ ය. මහැ ද අරණ්‍ය යෙහි ද තුබූ භාණ්ඩයක් දැක බඩු අයිතිකරුවන් ගේ නො පැමිණීම සලකා සුදුස්සක් කරන්නේ ය.

260 පතිරූපං කරිස්සති

මහැ හෝ කැලයෙහි හෝ තිබෙන රත්න හෝ රත්න සම්මත බඩුවක් හෝ දුටු කල්හි සුදුස්සක් කරන්නේය යි මෙයින් කීහ. ඊට කළ යුතු සුදුස් ස නම් රතනයක් දුටු කල්හි එය නුදුටුවන් වැ යැම ත් රතන සම්මත වූ වස්ත්‍රාදියෙහි පංශුකූල සංඥ ඇති කොට ගැනීමත් ය. "පතිරූපන්ති රතන සම්මතෙ පංසුකූල ගහණං, රතනෙ නිරුස්සුක ගමනං" යී එය ටීකා යෙහි කී සැටි යි.

---

## 38 දූසන'න්ති

302 පුප්ඵං වෙළුං ඵලං චුණ්ණං-දන්තකට්ඨං ච මත්තිකං
කුලසඞ්ගහණත්ථං දදතො-කුලදූසන දුක්කටං.

මල් හෝ උණ හෝ ගෙඩි හෝ (මහරිසුණු ඈ) සුණු හෝ දහැටි දඬු හෝ මැටි හෝ ප්‍රත්‍යය බලාපොරොත්තුවෙන් කුල සංග්‍රහ පිණිස දෙන්නා හට කුලදූෂණ දුකුළා වේ.

**303 ථුල්ලච්චයං ගරුභණ්ඩ-මිස්සරේනෙත්ථ සංඝිකං**
**දෙන්තස්ස දුක්කටාදීනි-ථෙය්‍යා සඞ්ඝස්ස සන්තකං.**

මේ මල් ආදියෙහි සඟසතු ගරු බඩු "තෙමේ අධිපතිය" යන ඉසුරු සිතින් දෙන්නහුට ථුලසි වේ. සඟසතු පුහුල් සතු මල් ආදිය සොරසිතින් කුලසඞ්ග්‍රහ සඳහා දෙන්නහුට වටිනා පමණ අනුව දුකුලාදිය වේ.

261 **ගරුභණ්ඩං**

ගරු බඩු යි. ගරුබඩු නම්: "සඟසතු අරම්, වත, යන මේ දෙක එක් ගුරුබඩෙක්. වෙහෙර වෙහෙරවත, යන මේ දෙක එක් ගුරු බඩෙක්. හැඳ, පුටු, බිසි, කන්වයින් යන මෙ සතර එක් ගුරුබඩෙක්. ලොහො සැළ, ලොහො පැණ, ලොහො පණ, ලොහො කටාර, වෑ, පොරෝ, කෙවේරි, හුදලු, නියන්, යන මෙ නවය එක් ගුරුබඩෙක්. වැල්, හුණු, මුදුතණ, බබුස්තණ, සෙසු ගේ සොයන තණ, මැටි, මැටිබජන, දරමුවා පිරිකර, යන මෙ අට එක් ගුරුබඩෙක්" යි **සිඛවලඳවිනිසේ** (**59**) කොටස් පසකට බෙද දක්වා තිබේ.

262 **ඉස්සරෙන**

අධිපති සිතින් යනු යි. මේ පස් ගුරුබඩින් එක්තරක් මා මිස කෙ දූ යි ඉසුරු පමුණුවා අන්නට දේ නම්, ථුලැසි වේ"යි **සිඛවලඳවිනිසේ 59** වන පිටුවේ දක්වෙන හෙයින් සඟසතු යම් ගරුභාණ්ඩයක් ස්වකීය අධිපතිකමින් දුපි දේ නම්, ථුලැයි වන බව ප්‍රකාශිත යි.

263 **දුක්කටාදීනි**

සඟසතු දෑ සොරසිතින් දෙන්නාට දෙන භාණ්ඩයේ වටිනාකම පරිදි දුකුලාදී ඇවැත් වන බව කි සැටි යි. එය **සිඛවලඳවිනිසේ 59** වන පිටුවේ එන්නේ මෙසේ ය: "සොර සිතින් පල් පොහොනා වතක් එවු වඩා අග නාක් එවු අන්නට දේ නම් තෙමේ ගනීනම් පරිජි වේ. පලින් උනු වියටින් වඩා ඉතිරි අගනාක් දේ නම් ගනී නම් ථුලැසි වේ. වියටක් එවු වියටින් උනු අගනාක් එවු ගනී නම් දේ නම් දුකුළා වේ" යනුවෙනි. පාදයක් වටිනා වස්තුවක් හෝ පාදයකට වඩා වටිනා වස්තුවක් හෝ සොර සිතින් අනිකකුට දේ නම් හෝ තෙමේ ගනී නම් හෝ පරිජි වේ. පාදයකට වඩා අඩු වියටකට වඩා වැඩි වටිනාකම ඇති වස්තුවක් අනිකකුට දේ නම් හෝ ගනී නම් හෝ ථුලැසි වේ. වියටක් වටිනා හෝ වියටකට වඩා අඩුව වටිනා හෝ වස්තුවක් දේ නම් හෝ ගනී නම් හෝ දුකුළා වේ. යනු එහි අදහස යි.

**304 කුලසඞ්ගහත්ථං රොපෙතුං-රොපාපෙතුඤ්ච සබ්බථා**
**ඵලපුප්ඵූපගං රුක්ඛං-ජග්ගිතුඤ්ච න වට්ටති.**

කුල සංග්‍රහය කරනු පිණිස මල් හා ගෙඩි හටගන්නා ගස් වවන්නට හෝ වවවන්නට හෝ සර්වප්‍රකාරයෙන් ම (කප්පියා කප්පිය කාවර ව්‍යවහාරයකින් වත්) නො වටී.

305 නිමිත්තො'භාසතො කප්ප-වොහාර පරියායතො
අත්තනො පරිභොගත්ථං-රොපනාදි ලබ්භරෙ.

නිමිත්ත,'භාස වශයෙන් ද කප්පිය ව්‍යවහාර වශයෙන් ද පරියාය වශයෙන් ද තමහට පරිභොගය පිණිස රොපනය කිරීමාදිය ලැබේ.

**264 නිමිත්තො'භාසතො**

නිමිත්තොභාස නම් වශයෙන් යනු යි. තමා ගේ පරිභොගය සඳහා ඵලවෘක්ෂාදිය වැවීමෙහි ලා මේ නිමිත්තො'භාසනම් වේ. එහි **නිමිත්ත** නම් උදලු දියබඳුන් ආදිය ගෙනැත් ළඟ තැබීම යි. **ඕභාස** නම් උදලු අලවංගු ආදිය සහ මල් පැළ ත් ගෙන සිටීම යි. එවිට රොපනය කරන්නට කැමැත්ත තිබේ යයි සලකා ගත් අනුපසපන්හු ඒවා රොපනය කරති.

**265 කප්පවොහාරපරියායතො**

කැප ව්‍යවහාරයෙන් සහ පයර්‍ය්‍යායයෙන් කිණීමෙන් යනු යි. මෙතැන මේ ගස දනුව; යනාදි කැප වචනයෙන් හැඟවීම කැප ව්‍යවහාරය යි. පයර්‍ය්‍යාය නම්: නොබෝ කලකින් උපකාර පිණිස පවතින හෙයින් මල් රුක් ආදිය නුවණැත්තන් විසින් රොපනය කරවිය යුතු ය; යනාදීන් කීම යි.

306 චුත්තා'ච වෙජ්ජකං ජංඝ-පෙසනෙ ගිහිකම්මසු
ඨපෙත්වා පිතරෙ භණ්ඩුං-වෙයාවච්චකරං සකං

පිළියම් යටැ කියනලදම ය. (ජඞ්ඝපෙසනෙ) ගිහියන් ගේ පණිවුඩ ගෙනයෑමෙහි (විනිශ්චය කියනු ලැබේ.) (ගිහිකම්මසු) මිනිසුන්ගේ කට යුත්තෙහි මවුපියන් ද පණ්ඩුපලාසයා ද සිය මෙහෙකරුවා ද හැර-

307 දුක්කටං පදවාරෙන-හරණෙ දූතසාසනං
සාසනං අග්ගහෙත්වා'පි-පඨමං වදතො පුන.

සෙසු ගිහියන් ගේ හසුන් ගෙනයෑමෙහි පියවර ගණනින් දුකුළා වේ. පළමු කොට හසුන් නො පිළිගෙන පසුව එය කියන්නාහට ද පියවර ගණනින් දුකුළා වේ.

308 උප්පන්නපච්චයා එවං-පඤ්චන්නම්පි අකප්පියා
අභූතාරොචනරූපිය-සංවොහාරුග්ගහා දිසා.

මෙසේ අෂ්ටවිධ කුලදූෂණ නම්යෙන් උපන් ප්‍රත්‍යයයෝ පස්සහදම් යනට ම අකැපයහ. උතුරු මිනිස්දම් ඇරෙජීමෙන් හා රන්රිදී ඈ පෙරෙළි කිරීමෙන් උපන් පසමෙන් අකැප ය.

**විස්තර**

50 මෙයින් ගිහියන් ගේ හසුන් ගෙන යෑම ගැන සංක්ෂෙපයෙන් ප්‍රකාශිත යි. මවුපිය- පණ්ඩුපලාස- සිය මෙහෙකරු යන අය ගේ පණිවුඩ ගෙන ගිය ද එය නිවැරැදි බව ත්, සෙසු කිසිවකු ගේ පණිවුඩ ගෙනයා නො හැකි බව ත්, යම් හෙයකින් නුසුදුස්සන් ගේ පණිවුඩ ගෙන ගොස් ලද පසයෙක් වේ නම්, එය ද අකැප බව ත්, මෙහි සඳහන් විය. ගිහියකු

පිළිබඳ යම් අවශ්‍ය කරුණක් සිය කැමැත්තෙන් ම කියා තම් තිදෙයි. එසේ ම "මම වචනෙන භගවතො පාදෙ වන්දථ" යනාදි විසින් පවසන පණිවුඩය ගෙන යෑම තිදෙස් ය. (පුරාණ සන්නය 116)

309 **හරාපෙත්වා හරිත්වා'පි-පිතුන්නං සෙසඤාතිනං**
**පත්තානං වත්ථුපූජත්ථං-දාතුං පුප්ඵානි ලබ්භති**
**මණ්ඩනත්ථඤ්ච ලිඞ්ගාදි-පූජත්ථඤ්ච න ලබ්භති.**

මවුපියනට අනුන් අත යවා ද තමා ගෙන හැර ද (පිදීම පිණිස මල් දෙන්නට වටී.) මල්පුදන තැනට සම්ප්‍රාප්ත වූ සෙසු නෑයන් හට ද, තුනුරුවන් පුදනු පිණිස තමා අයත් මල් දෙන්නට වටී. පළඳනා පිණිස ද සිවලිඞ්ගාදිය පුදනු පිණිස ද කිසිවකුට දෙන්නට නො වටී.

310 **තථා ඵලං ගිලානානං-සම්පත්තිස්සරියස්ස ච**
**පරිබ්බයවිහීනානං-දාතුං සපරසන්තකං.**

තාල පනසාදි තමා අයත් ඵල ද එසේ මැ යි. ගිලන් මිනිසුන්ට ද, තමා කරා සම්ප්‍රාප්ත ඉසුරු හට ද, මහවියදම පිණිස ද්‍රව්‍ය නැත්තාහට ද තමා අයත් හෝ විස්වසුන් අයත් හෝ ඵල දෙන්නට වටී.

311 **භාජෙන්තෙන ඵලපුප්ඵම්හි-දෙය්‍යං පත්තස්ස කස්සචි**
**සම්මතෙනා'පලොකෙත්වා-දාතබ්බ මිතරෙන තු.**

සඟසතු මල් ගෙඩි බෙදන කල්හි මල් ගෙඩි බෙදීමට සම්මත මහණහු විසින් ලැබිය යුතු කොටසින් භාගයක් එහි පත් කිසි මිනිසකුට දිය යුතුයි. සම්මත නො ලත් මල් ආදිය බෙදන අනෙක් මහණහු විසින් සියලු සඞ්ඝයාට දන්වා දිය යුතු යි.

266 **දෙය්‍යං පත්තස්ස කස්සචි**

මල් ගෙඩි බෙදන කල්හි එහි පැමිණි කිසියම් මිනිසකුහට දියයුතු බව මෙහි සඳහන් ය. එහෙත් දියයුතු පමණ දක්වා නැත. එය දක්වාලන බුද්දසික්ඛා ටීකායෙහි "චතුත්ථභාගං දාතබ්බං" යී යොදා තිබේ.

**විනය විනිශ්චයයෙහි ද**

"පුප්ඵාදිභාජනෙ කොචි-ආගච්ඡති සචෙ පන
සම්මතෙන'ස්ස දාතබ්බං-ඤාපෙත්වා ඉතරෙන තු,
උපඩ්ඪභාගං දාතබ්බ-මිති වුත්තං කුරුන්දියං
ථොක ථොකන්ති නිද්දිට්ඨං-මහාපච්චරියං පන"
(446-447 ගාථා)

312 **විහාරෙ වා පරිච්ඡිජ්ජ-කත්වාන කතිකං තතො**
**දෙය්‍යං යථා පරිච්ඡෙදං-ගිලානස්සෙ'තරස්ස වා**
**යාචමානස්ස කතිකං[1]-චත්වා රුක්ඛා'ව දස්සියා**

විහාරයෙහි මෙතෙක් ඵල දියයුතුය යි ඵල වශයෙන් හෝ මෙතෙක් ගසින් ඵල දියයුතුය යි ගස් වශයෙන් හෝ පිරිසිඳ කතිකා කරන ලද ද

1 කතරුක්ඛාව. බු. ඉං.

එසේ ඝාතිකා කොට පරිච්ඡෙද කරනලද පරදි ශිලතාට ත් අත්‍යයාට ත් එයින් සතර පස් ගෙඩියක් දිය යුතු යි. ඝාතිකා කියා එල නෙලාගැනුමට ගස් හෝ පෙන්විය යුතු ය.

313 සිරිස චුණ්ණකසාවාදි-චුණ්ණ සෙසෙසු නිච්ඡයො
යථාවුත්තනයො චෙව-පණ්ණමෙපත්‍ථ පවෙසයෙ.

මහරිසුණු කොළිඳ (කුටජ) සුණු ඈ සුත්තෙහි ද මැටි දැහැටුදඬු හුණු දඬු ආදි සෙසු දෑයෙහි ද විනිශ්චය කියනලද අයුරුම යි. හුණු පත් ඈ කෑ හැකි නො කෑ හැකි පත් ද මේ කුලදූෂණයෙහි ඇතුළත් කරන්නේය.

---

## 39 වස්සූපනායිකාචෙව

314 පුරිමිකා පච්ඡිමිකා-දුවෙ වස්සූපනායිකා
තත්‍ථා'ලය පරිග්ගාහො-වචීභෙදො'ව එදිසො.

පෙරවස් ය පසුවස්ය යි වස් එළැඹීම් දෙකෙකි. ඒ දෙක්හි වස්එළැඹීම් නම් මතු කියන ආලය පරිග්‍රහය හෝ වාක් භෙදය හෝ වන්නේ ය.

315 "ඉමස්මිං විහාරෙ ඉමං-තෙමාසං වස්සං උපෙමි"
ඉධ වස්සං උපෙමි"ති-චිත්තුප්පාදෙ'ත්‍ථ ආලයො.

මෙහි "ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමි" (මේ වෙහෙර මේ තෙමස වස් එළැඹෙමි) යී කිම වාක්භෙද නම්. "ඉධ වස්සං උපෙමි" (මෙහි වස් එළැඹෙමි.) යී සිත් ඉපදවීම ආලය පරිග්‍රහ නම්.

**විස්තර**

51 භික්ෂූහු තුන් ඍතුවෙහි ම චාරිකා කළහ. එයට මහජනයා "අන්‍ය තීර්ථකයෝ වස්වසති. පක්ෂීහු ද කුඩු සාදාගෙන එහි වෙසෙත්. මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ පමණක් නිල් තණ මඩිමින් එකිඳ්‍රිය ජීවය ත් සෙසු කුඩා පණුවනුත් වනසමින් තුන් ඍතු වෙහි ම චාරිකා කරති" යී දෙස් කිය. එය නිමිති කොට තථාගතයන් වහන්සේ "අනුජානාමි භික්ඛවෙ වස්සං උපගන්තුං" යී වස්සාවාසය අනුදත්සේක. ඉන්පසු "කවදා වස් එළැඹිය යුතුදැ" යි භික්ෂූනට මෙබඳු සිතෙක් පහළ විය. එවිට "අනුජානාමි භික්ඛවෙ වස්සානෙ වස්සං උපගන්තුන්ති" යී වස්සාන කාලයෙහි වස් එළැඹිය යුතු බව අනුදැන "ද්වෙ, මා භික්ඛවෙ වස්සූපනායිකා පුරිමිකා ච පච්ඡිමිකා ච; අපරජ්ජුගතාය ආසාළ්හියා පුරිමිකා උපගන්තබ්බා, මාසගතාය ආසාළ්හියා පච්ඡිමිකා උපගන්තබ්බා"යී පෙරවස් පසුවස් වශයෙන් වස්සූපනායිකා දෙකක් තිබෙන අතර ඇසළ පොහොයට පසු දා (පෑළවිය දා) පෙරවස් සමාදන්වීමට ත් ඇසළ පොහොය පසු වී මාසයක් ගියවිට පසුවස් සමාදන් වීමට ත් නියම කළ සේක.

වස් සමාදන් වන භික්ෂුව විසින් "විහාරං පටිජග්ගිත්වා පානීයං පරිභොජනීයං උපට්ඨපෙත්වා සබ්බං චෙතියවන්දනාදි සාමීචිකම්මං නිට්ඨාපෙත්වා

"ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමී''ති සකිං වා ද්වත්තික්ඛත්තුං වා වාචං නිච්ඡාරෙත්වා වස්සං උපගන්තබ්බං. සචෙ'පි ඉධ වසිස්සාමී'ති ආලයො අත්ථි, අසතියා පන වස්සං න උපෙති, ගහිත සෙනාසනං සුග්ගහිතං ඡින්නවස්සො න හොති; පවාරෙතුං ලභතියෙව. විනාපි හි වචීභෙදං ආලය කරණමත්තෙනා'පි වස්සං උපගතමෙව හොති. ඉධ වස්සං උපෙමි වසිස්සාමීති චිත්තුප්පාදෙ යෙවෙත්ථ ආලයො නාම'' (**පාලිමුත්තක** විනය විනිශ්චය **197**) යී කීහෙයින් වෙහෙර පිළිදූගුම් කොට පානීය පරිභොජනීය දිය එළවා තබා චෛත්‍ය වන්දනාදිය කොට නිමවා "ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමි'' යී වරක් හෝ දෙතුන් වරක් හෝ වාක්භෙද කොට කියා වස් එළැඹිය යුතු යි. ඉදින් "මෙහි වෙසෙමැ''යි ආලයෙක් වේ නම් අමතක වැ යැමෙන් වස් නො එළඹේද, ගත් සෙනසුන මනාව ගත්තේ වේ. සුන් වස් ඇත්තේ නොවේ. පවරන්නට ද ලබ යි. වාක්භෙදයෙන් තොරව ආලය කිරීම් මාත්‍රයෙන් ද වස්එළැඹියේ ම වෙයි. "මෙහි වස් එළැඹෙමි, වෙසෙමි''යි චිත්තොත්පාදය ම මෙහි ලා ආලය නම්. මේ ආලය යන්න පහදා ලන **පැරැණි සන්නයෙහි** "ආලය පරිග්‍රහ නම්: වජයෙහි සත්ථයෙහි නාවායෙහි සෙනසුන් නො ලබන්නාහට ය. ලැබුණි නම් "ඉධ වස්සං උපෙමි''යි වාක් හෙද ම කටයුතු යි'' කියා දක් වේ. සෙනසුන් නො ලබන්නාහට වස් සමාදන්වීම "න භික්ඛවෙ අසෙනාසනිකෙන වස්සං උපගන්තබ්බං''යි ප්‍රතික්ෂෙප කොට තිබෙන ත් එය "අසෙනාසනිකස්ස නාවාදිං විනා අඤ්ඤත්‍ර ආලයමත්තෙන උපගන්තුං න වට්ටතීති'' අම්හාකං ඛන්ති'' සෙනසුන් නැත්තාහට නාවාදියෙහි හැර අන් තැනක ආලය මාත්‍රයෙන් වස්එළැඹෙන්නට නුපුළුවන යනු තම මතය බව **විනයාලංකාරයේ** 273 වන පිටුවේ සහ **පාලිමුත්තක** විනය විනිශ්චය **සංග්‍රහ ටීකාවේ** 93 වන පිටුවේ ද දක්වේ.

316 **නොපෙතුකාමො ආවාසං–තදහු'ත්තික්කමෙය්‍ය වා**
**භවෙය්‍ය දුක්කටාපත්ති–ජානං වා'නුපගච්ඡතො.**

වස් නො එළඹෙනු කැමැති ව වස්වසන දවස්හි වස්වසන වෙහෙර ඉක්මවා නම් ඔහුට ද, එස්එළැඹෙන දවස බව දැන දැන වස් නො එළඹෙන්නාහට ද දුකුළා ඇවැත් වේ.

317 **දුතියං උපගච්ඡෙය්‍ය–ඡින්නවස්සො නුපාගතො**
**න පක්කමෙය්‍ය තෙමාසං–අවසිත්වාන චාරිකං.**

පෙරවස් එළඹ සුන්වස් ඇත්තේ ද යම්කිසි අනතුරයකින් පෙරවස් නො එළැඹියේ ද පසුවස් එළැඹෙන්නේ ය. වස් එළැඹ තුන්මස නො වැස චාරිකා නො කරන්නේ ය.

318 **මාතාපිතූනමත්ථාය–පඤ්චන්නං සහධම්මිනං**
**ගිලානතදුපට්ඨාක–භත්තමෙසිස්සමොසධං.**

මවුපියන් පිණිස ත් පස්සහදම්මියන් පිණිස ත් ගිලනුන් හා ගිලන් මෙහෙකරුවන්හට බත් බෙහෙත් සොයමි යි හෝ-

319 පුච්ඡිස්සාමි උපට්ඨිස්සං-ගන්ත්වා[1] නා'භිරතිං අහං
වූපකාසෙස්සං කුක්කුච්චං-දිට්ඨිං ගරුකමාදිකං.

320 කරිස්සං වා'පි කාරෙස්සං-නො දනබ්බ විවෙචනං
උට්ඨානං වාපි උස්සුක්කං-ගන්තුම්වෙච්ච මාදිනා
ලබ්භං සත්තාහ කිච්චෙන-පහිතෙ'පහිතෙ'පිවා.

සුවදුක් විචාරමි යි හෝ, ගිලනුන් හට මෙහෙකෙරෙමි යි හෝ, (ආරාධනා ඇත ත් නැත ත් සත්තාහ කරණයෙන් යන්නට වටී.) මම ගොස් උකටලී මහණනු සිත් සසුන්හි අලවමි යි හෝ, පස්සහ දූමියන් තුළ හට ගත් විනය පිළිබඳ සැක දුරුකරමි යි හෝ, ගත් මිසදිටුව වෙනස් කරමි යි හෝ, පරිවාස දානාදියෙන් සහවෙසෙස් ඇවැතින් නගා ලමි යි හෝ, තර්ජනීයාදිකම් සංසිඳුවන්නට උත්සාහ කෙරෙමි යි හෝ, කරවමි යි හෝ, සිනා කැඳවා එවූ කල්හි හෝ, නො එවූ කල්හි හෝ යන්නට වටී.

321 සඞ්ඝකම්මෙ වජෙ ධම්ම-සවණත්ථං නිමන්තිතො
ගරූහි පහිතො වා'පි-ගරූනං වා'පි පස්සිතුං.

තමා ගේ හෝ සෙසු සඟුන් ගේ හෝ සෙනසුන් මහසෑ පිළිබඳ නවකම් ඈ කුදුමහත් කටයුත්තක් ඇති කල්හි ද, (සත්තාහකරණයෙන් යන්නේ ය.) බණ ඇසීමට ආරාධනා ලැබූයේ ම (සත්තාහකරණයෙන් යන්නේ ය.) ගුරුන් විසින් යවන ලද්දේ ද, ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් දක්නට ද සත්තාහකරණයෙන් යන්නේ ය.

267 ධම්මසවණත්ථං නිමන්තිතො

වස්විසූවහු විසින් ධර්‍ම ශ්‍රවණයට ද අනාරාධිත ව යා නො හැකි ය. අසුවල් දිනට රැස්වුවමනාය යි කලින් කළ කතිකාවක් වේ නම්, යා හැකිය ඒ බව:-

"වස්සං උපගන්තෙ නෙත්ථ-අනිමන්තිත භික්ඛුනා
ධම්මස්ස සවණත්ථාය-ගන්තුං පන න වට්ටති
අසුකන්නාම දිවසං-සන්නිපාතො භවිස්සති
ඉච්චෙවං කතිකා පුබ්බං-කතා චෙ පන වට්ටති."යි
ප්‍රකාශ වේ.

"ධම්මසවණත්ථාය අනිමන්තිතෙන ගන්තුං න වට්ටති, සචෙ එකස්මිං මහාවාසෙ පඨමං යෙව කතිකා කතා හොති. අසුකදිවසෙ නාම සන්නිපතිතබ්බන්ති නිමන්තිතො නාම හොති ගන්තුං වට්ටති" (**පාලිමුත්තක විනය විනිශ්චය 201**)

322 න භණ්ඩධොවනුද්දෙස-ඤාතුපට්ඨාක දස්සනෙ
ලබ්භං න පාපුණෙය්‍යජ්ජ-වා ගමිස්සන්ති දූරගො.

සිය සිවුරු සේදීම පිණිස ද, බණ හැදෑරීම පිණිස ද, නෑයන් උපස්ථායකයන් දකිනු පිණිස ද සත්තාහකරණීයෙන් නො යන්නේ ය. "අද මැ එමැ"යි නුදුරු තැනට ගිය මහණ තෙමේ වෙහෙරට නො පැමිණියේ එහින් සිට අතරමග අරුණ නැංගේ නම් වස්සච්ඡේදය නො වේ.

---

[1] නභිරතං, සන්නය.

**323 සෙසඤාතීහි පහිතෙ-භික්ඛුනිස්සිතකෙන ච උපාසකෙනා'පාසිකාහි-නිද්දිසිත්වා'ව පෙසිතෙ.**

මවුපියන් හැර සෙසු නෑයන් විසින් හෝ භික්ෂූන් නිසා ජීවත් වන්නන් විසින් හෝ "හිමියන් ගේ ආගමනය බලාපොරොත්තු වෙමු"යි කියා එවූ කල්හි ද, නො නෑ උපාසක උපාසිකාවන් විසින් කිසිකරුණක් දක්වා ම ආරාධනා කොට එවූ කල්හි ද සත්තාහකරණයෙන් යන්නට වටී.

**268 පහිතෙ**

මවුපියන් හැර සෙසු නෑයන් උදෙසා නම් ආරාධනා ඇති කල්හි යා හැකි ය. ආරාධනා නැත ත් භික්ෂු- භික්ෂුණී- සික්ඛමානා- සාමණෙර-සාමණෙරී මවු- පිය යන සත්දෙනා උදෙසා යා හැකි ය. "අනුජානාමි භික්ඛවෙ සත්තන්නං සත්තාහකරණීයෙන අප්පහිතෙ'පි ගන්තුං; පගෙව පහිතෙ භික්ඛුස්ස- භික්ඛුණියා-සික්ඛමානාය- සාමණෙරස්ස-සාමණෙරියා- මාතුයා ච පිතුස්ස ච" (**මහාවග්ගපාළි 164**) යි එය ප්‍රකාශ වේ. කවරකු ගේ හෝ ආරාධනාවක් ඇති කල්හි සත්තාහකරණයෙන් යෑම නො වළක්වන ලදි. ආරාධනයක් නොමැති ව පෙරැ කී සත්දෙනා උදෙසා මිස අන් කවරකු උදෙසා වත් යා නො හැකි ය. ගිය විට වස්සච්ඡෙදය නොවතත් දුක්කටාපත්ති වේ. "යො පන සත්තාහකරණීයනිමිත්තා'ගාවෙපි "සත්තාහබ්භන්තරෙ ආගමිස්සාමීති" ආභොගං කත්වා ගන්ත්වා සත්තාහබ්භන්තරෙ ආගච්ඡති, තස්ස ආපත්තියෙව, වස්සච්ඡෙදො නත්ථි" (**විනයාලංකාරය 276- විමතිවිනොදනී 424**)

**324 වස්සච්ඡෙදෙ අනාපත්ති-අන්තරායෙ සති'න්තනො සඞ්ඝසාමග්ගියා වා නො-ජීනන්තවසෙසා පවාරයෙ.**

තමහට රාජචොරාදි අන්තරායක් ඇති කල්හි ද සඞ්ඝයා සමගි නොවැ බිඳෙන කල්හි ද වස්සච්ඡෙදයෙහි අනාපත්ති යි. සුන්වස් වූයේ නො පවරන්නේ ය.

**269 අන්තරායෙ සති**

මෙහි අන්තරාය යනු ව්‍යාළ-සිරිංසප-චොර-පිසාච-අග්ගි-උදක-ජීවිත-බ්‍රහ්මචරිය යනු යි. මේ අන්තරායන් ඇති කල්හි ඒ සෙනසුන අත්හැර වස් සිඳගෙන ගියේ ද අනාපත්ති යි. යටත් පිරිසෙන් යම් සෙනසුනෙක්හි වසන විට සවකීය ජීවිත යාත්‍රාව සඳහා සුදුසු ආහාර- බෙහෙත් ආදිය නො ලැබේ ද සුදුසු උපස්ථායකයෙක් හෝ නො ලැබේ ද, එම වෙහෙර භික්ෂූහු සඞ්ඝභෙදයට හෝ සූදානම් වෙද්ද, එබඳු සෙනසුන් අත්හැර යෑමෙන් වස්සච්ඡෙදයෙහි අනාපත්ති යි. (**මහාවපාළි165- 66- 67**)

**270 සංඝසාමග්ගියා වා**

සඞ්ඝයා සමඟ නොව බිඳෙන කල්හි ද යනු යි. සඞ්ඝභෙදය නම් එක සීමායෙහි යටත් පිරිසෙන් භික්ෂූන් සිවු නම බැගින් හෝ වෙන් ව විනය කම් කිරීමට සැලැසීම යි. සඞ්ඝභෙදය කළහැක්කේ භික්ෂුවකට මැ ය.

"භික්ඛු බො උපාලි පක්ඛතො භො සමානසංවාසකො සමානසීමායං ඨිතො සඞ්ඝං භින්දති (චූලව ග්ග 310) යි එය පැවැසේ. "අධම්මං ධම්මො ති දීපෙති" යනාදි අටළොස් වස්තුවකින් සඞ්ඝභෙදය කරත්.

325 අබ්භොකාසෙ ච රුක්ඛස්ස-සුසිරෙ විටපෙ'පි වා
ඡවකුටිඡත්තචාටිසු-උපගන්තුං න වට්ටති.

අබවස්හි ද, ගස් සිදුරෙහි ද, වෙළෙප්හි ද, සොහොන් කිළියෙහි ද, සත්හි ද, සැළියෙහි ද යන තන්හි වස් එළඹෙන්නට නො වටී. (මෙයින් වස් නො එළැඹිය යුතු තැන් ප්‍රකාශිත යි. (මහාවග්ගපාළි 170 වන පිටු වෙහි මේ තැන් සඳහන් ව ඇත.)

326 අසෙනාසනිකෙනාපි-උපගන්තුං න වට්ටති
පවාරෙතුඤ්ච ලභති-නාවාසත්ථ වජ්ජපගො.

සෙනසුන් නැත්තහු විසින් ද වස් එළඹෙන්නට නො වටී. නැවෙහි ද සත්‍ථයෙහි ද වජයෙහි ද වස් එළැඹියේ පවරන්නට ද වටනේ ය.

271 අසෙනාසනිකෙන

වස් තුන් මස ගත කිරීමට සපිර සෙනසුනක් නැත්තහු විසින් වස් සමාදන් විය නො හැකි ය. ඒ සෙනසුන ද "පඤ්චන්නං ඡදනානං අඤ්ඤතරෙන ඡන්නායෙව සද්වාර බන්ධෙ සෙනාසනෙ උපගන්තබ්බං" (විනයා ලංකාර 273– විනය විනිච්ඡය සංගහ ටීකා 95) යම් සෙනස්නක වස් සමාදන් වේ නම් එය ඉටඨක– සිලා– සුධා– තිණ–පණ්ණ යන පස්වැදෑරුම් ඡදනයෙන් එක්තාරුවකින් සෙවෙණි කළ දෙරගුළු සහිත සෙනසුනක් ම විය යුතු යි. එබඳු සෙනසුනක් නැත්තහුට වස් වැසිය නො හැකි ය. "න භික්ඛවෙ අසෙනාසනිකෙන වස්සං උපගන්තබ්බං, යො උපගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (මහාවග්ගපාළි 170) යි තහනම් කොට වදාළේ එබඳු සෙනසුනක් නැත්තාහට යි. ඉදින් සෙනසුනක් නො ලැබේ නම් තමන් විසින් හෝ ඒ ගැන උත්සුක වී සෙනසුනක් සොයාගත යුතු ය. එසේ ත් නො ලැබේ නම් තෙමේ අත්කම් සොයන්නේ ය. නො ලද කල්හි තෙමේ ම එය සකස් කරන්නේ ය. "තස්මා වස්සකාලෙ සචෙ සෙනාසනං ලභති, ඉච්චෙතං කුසලං, නො චෙ ලභති, හත්ථකම්මං පරියෙසිත්වා'පි කාතබ්බං, හත්ථකම්මං අලභන්තෙන සාමම්පි කාතබ්බං, නත්වෙව අසෙනාසනිකෙන වස්සං උපගන්තබ්බං"ති. දළ්හං කත්වා වුත්තත්තා" යි විනයාලංකාරයේ 273 පිටුවෙහි එය පැහැදිළි කොට තිබේ.

272 පවාරෙතුඤ්ච ලභති නාවාසත්ථ වජ්ජපගො

නැවෙහි ය, සත්වායෙහි ය, වජයෙහි ය යන තන්හි වස් එළැඹි නැනැත්තහුට පවාරණය කරන්නට ද හැකිය යි මෙයින් ප්‍රකාශිතයි. වස් වසන දවසේ දී නැවකැ ගමන් කරන මහණහු විසින්" ඒ නැවෙහි ම වස් ඉටා ගත යුතු ය. තෙ මස ගතවන තුරු ත් සිය ගමන කෙළවර නොවී නැවෙහි ම වසන්නට සිදු වේ නම්, නැවෙහි දී ම පවාරණය කටයුතු යි.

වස් තුන් මස ගතවන්නට පළමුව සිය ගමන අවසන් වූයේ නම් තැවෙත් ගොඩබට තැන අයත් ගමෙහි ම ඉතිරි කාලය වැස එහි භික්ෂූන් සමග පවාරණය කටයුතු ය යි **සමන්තපාසාදිකා 799** වන පිටුවෙහි දක් වේ. සත්වාංයෙහි හා වජයෙහි ද මේ ක්‍රමය මැ යි.

---

## 40 අවෙභඩ්ඩියං

327 **ආරාමා'රාමවත්ථූනි-විහාරො තස්ස වත්ථු ච**
**මඤ්චො පීඨං භිසි බිම්බො-හනාදි සයනාසනං**

පුෂ්පාරාම ඵලාරාම ද ආරාම භූමි ද ප්‍රාසාදාදි සෙනසුන් ද ඒ විහාර භූමි ද ඇඳ ද පුටු ද පඤ්චවිධ භිසි ද බිම්බොහනාදි හෝනා හිඳිනා දෑ ද,

328 **ලොහකුම්භී කටාහො ච-ලොහභාණක වාරකො**
**කුඨාරී වාසි ඵරසු-කුද්දාලො ච නිඛාදනං**

ලොහො සැළි ද, ලොහො කටාරම් ද, (ලොහභාණක) ලොහොයෙන් කළ විශාල දිය සැළි ද (වාරක) ලොහො කළ ද, කෙටේරි ද, වෑ ද, පොරෝ ද, හුදලු ද, නියන ද,

329 **වල්ලි වෙළු තිණං පණ්ණං-මුඤ්ජබබ්බජ මත්තිකා**
**දාරුමත්තික භණ්ඩානි-පඤ්ච'තෙ අවිභාජියා.**

වේවැල් ඈ වැල් ද, මහහුණ ඈ හුණ ද, ඉළුක් ඈ ගේසොයන තණ ද තල්පත් ඈ පත් ද, මුදුතණ ද, බබුස් තණ ද, මැටි ද, දරුභාණ්ඩ මත්තිකා භාණ්ඩ ද යන මේ පස්රැස සඞ්ඝ ගණ පුද්ගලයන් විසින් නො බෙදිය යුත්තාහු යි.

330 **ථුල්ලච්චයං භාජයතො-භාජිතා'පි අභාජිතා**
**ගරුභණ්ඩානි වුච්චන්ති-එතෙ'විස්සජ්ජියානි ච.**

බෙදන්නාහට ථුලසි වේ. බෙදන ලද්දාහු ද නො බෙදන ලද්දාහු වෙත්. මොහු ගරු භාණ්ඩයහයි ද නො බෙදිය යුත්තාහ යි ද කියනු ලැබෙත්.

331 **වල්ලිඩ්ඪබාහුමත්තා'පි-වෙළු අට්ඨඞ්ගුලායතා**
**තිණාදි මුට්ඨි මත්තම්පි-පණ්ණමෙකම්පි මත්තිකා**

332 **පාකතා පඤ්ච වණ්ණා වා-සුධා කඞ්කුට්ඨආදිකා**
**තාලපක්කප්පමාණා'පි-දින්නා වා තත්ථ ජාතකා**

333 **රක්ඛිතා සංඝිකා රජ්ජු-යොත්තාදි ච අභාජියා**
**භාජියා නිට්ඨිතෙ කම්මෙ-සඞ්ඝිකෙ චෙතියස්ස වා.**

අඩ බාහුවක් පමණ වැල් ද, අටඟුලක් පමණ හුණ ද, මිටක් පමණ තණ ද (ආදි ශබ්දයෙන් මුදු තණ බබුස් තණ ද) තල්පත් ඈ පතෙක් ද තල් ගෙඩියක් පමණ වූ පියවි පැහැති හෝ පස්වණක් පැහැයෙන් යුතු හෝ මැටි ද, සුණු ද, කොකටු සදෙලමලාදිය ද යන මොහු සඟහට දෙන ලද්දාහු

යෝ සඟසතු බිම්හි උපන්නාහු හෝ රක්නා ලද්දහු ම නො බෙදිය යුත්තාහු ය. සඟසතු රුහත ද (සමින් කළ) යොත් ආදිය ද නො බෙදිය යුත්තාහු ය. සඟසතු කටයුතු ද, චෛත්‍ය සන්තක කටයුතු ද නිමිකල්හි බෙදිය යුත්තාහු යි.

334 පත්තාදිං භික්ඛු සාරූප්පං–තථාවිප්පකතාකතං
භාජියං ලොහභණ්ඩෙසු–වාරකං පාදගණ්හකං.

ලොහොබඩු වල දී මහණුන්හට කැපසරුප් වූ පාත්‍රාදිය ද, එසේ ම කොට නො නිමි ලොහො බඩු ද, නො කළ ලොහොබඩු ද, මගධ නැළියෙන් පස් නැළියක් තෙල් ගන්නා කළය ද බෙදිය යුත්තේ ය.

335 වෙළුම්හි භාජියා තෙල–නාළිකත්තර දණ්ඩකො
ඡත්තදණ්ඩ සලාකායො–තථො'පාහනදණ්ඩකො.

වෙළුයෙහි තෙල් කුළාව ද බෙදිය යුතු ය. සැරයටිය ද සත්දණ්ඩ ද (කුඩ මිට ද) කුඩ තඹ ද, උපාහන දණ්ඩද එසේ ම බෙදිය යුතු.

336 අනුඤ්ඤාතවාසිදණ්ඩා–කරණ්ඩා පාදගණ්හකො
අරණඤ්ජනි සිඞ්ගාදි–භික්ඛුපකරණං තථා.

පිහි කොපුවෙහි දමා පාවිච්චි කළ හැකිය යි අනුදත් වැයේ (පිහියේ) මිට ද පාදයක් තෙල් ගන්නා කරඬුව ද අරණිභාණ්ඩ ද, අඳුන් කුළා තෙල් හං ආදි වූ මහණ පිරිකර ද එසේ ම බෙදිය යුත්තේ ය.

337 තච්ඡිතා'නිට්ඨිතං දාරු–භණ්ඩං දන්තඤ්ච භාජියං
භික්ඛූපකරණෙ පාද–ඝටකො මත්තිකාමයො.

සැස නිමි නො නිමි දරුභාණ්ඩ ද දළ ද බෙදිය යුත්තේ ය. මහණ පිරිකරෙහි පාදයක් තෙල් ගන්නා මැටිමය කළය බෙදිය යුත්තේ ය.

338 භාජියං කප්පියං චම්මං–තෙලචම්මමභාජියං
ගරුනා ගරු භණ්ඩඤ්ච–ථාවරං ථාවරෙන ච

339 ථාවරං පරිවත්තෙය්‍ය–තථා කත්වා ච භුඤ්ජතු
වල්ලාදිං ඵාතිකම්මෙන–ගණ්හෙ සෙසමභාජියං.

කැප සම් බෙදිය යුත්තේ ය. තෙල් සම් නො බෙදිය යුත්තේ ය. ඇඳ පුටු ඈ ගරු බඩුයෙන් ඇඳ පුටු ඈ ගරු බඩු හා ආරාමාදි ථාවරය ද, ආරාමාදි ථාවරයෙන් ආරාමාදි ථාවරය ද පෙරළි කරන්නේ ය. එසේ පෙරළි කොට ද ලද කැප පසය වළඳුවා. වැල් හුණ ආදිය ඵාතිකම්මයෙන් ගන්නේ ය. (ඵාතිකර්මය නම් ඒ වටිනා මිළ හෝ ඊට වැඩිය හෝ දීමය.) ආරාමාදි සෙස්ස නො බෙදිය යුත්තේ ය.

**විස්තර**

52 මේ ගාථාවන් ගෙන් අවිස්සජ්ජිය අවෙභඞ්ගිය පඤ්ච රාශිය ත් බෙදන්නහුට වන ඇවැත ත් බෙදිය හැකි කොටසුත් ප්‍රකාශිත යි. මෙහි පඤ්චරාස (1) ආරාම, (2) ආරාම වත්‍ථු, 2: (3) විහාර, (4) විහාරවත්‍ථු, 3:

(5) මඤ්ච, 6 පීඨ, 7 භිසි, 8 බිම්බොහන, 4 9 ලොහකුම්භි, 10 ලොහභාණක, 11 ලොහවාරක, 12 ලොහ කටාහ, 13 වාසි, 14 ඵරසු, 15 කුඨාරි, 16 කුද්දාල 17 නිඛාදන, 5· (18) වල්ලි, 19 වෙළු, 20 මුඤ්ජ, 21 බබ්බජ, 22 තිණ, 23 මත්තිකා, 24 දාරුභණ්ඩ, 25 මත්තිකා භණ්ඩ කියා යි. මේ පඤ්චරාශිය ස්වරූප වශයෙන් ගණින් ගත් කල්හි පස් විස්සෙකි. තථාගතයන් වහන් සේ මේවා අවිස්සජ්ජිය අවෙභඞ්ගිය ගණයෙහි බහා පැණ වූ සැටි **චුල්ල වග්ගපාලියේ 266-269** පිටුවල විස්තරව එයි. මේ පස්විස්ස ම **පාලිමුත්තක විනය විනිශ්චයයේ** 275 සිට ද **සමන්තපාසාදිකාවෙහි** 913 සිට ද, **මාතිකාට්ඨකථායෙහි** 137 සිට ද, **ගරුභණ්ඩ විනිශ්චයයෙහි** ද සවිස්තරව දක්වා තිබේ.

**273 ආරාම**

"තත්ථ ආරාමො නාම පුප්ඵාරාමො වා ඵලාරාමො; වා" (**පාලිමුත්තක විනයවිනිශ්චය 275- සමන්තපාසාදිකා 913**) එහි ආරාම නම් පුෂ්පාරාම ඵලාරාම යි. මල්වතු හා කුඩු මහත් පලතුරු වතු යි.

**274 ආරාමවත්ථු**

මෙය නම් ඒ ආරාමයන් පිණිස වෙන් කළ බිම් පෙදෙස යි. නොහොත් ඒ ආරාමයන් වැනසී ගිය ද එය පිහිටි පැරණි බිම් පෙදෙස යි. එය "ආරාම වත්ථු නාම තෙසං යෙව ආරාමානං අත්ථාය පරිච්ඡින්දිත්වා ඨපිතො'කාසො. තෙසු වා ආරාමෙසු විනට්ඨෙසු තෙසං පොරාණකභූමිභාගො"යි, **පාලිමුත්තක 263- සමන්තපාසාදිකා 913** පිටුවලැ එයි.

**275 විහාර**

"විහාරො නාම යංකිංචි පාසාදාදිසෙනාසනං" යි දැක්වෙන හෙයින් විහාර යන්නට ප්‍රාසාදාදි යම්කිසි සෙනසුනක් ගැනේ.

**276 විහාරවත්ථු**

"විහාරවත්ථු නාම තස්ස පතිට්ඨානොකාසො" විහාරවත්ථු නම් ඒ ප්‍රාසාදාදිය පිහිටි ඉඩම යි.

**277 මඤ්ච**

"මඤ්චො නාම මසාරකො බුන්දිකාබද්ධො කුලීරපාදකො ආහච්චපාදකොති ඉමෙසං චතුන්නං මඤ්චානං අඤ්ඤතරො" මඤ්ච (හැඳ) නම් මසාරකය බුන්දිකාබද්ධය කුලීරපාදකය ආහච්චපාදකය යන මේ සිවුවැදෑරුම් මඤ්චයන් අතුරෙන් එකකි.

මේ මඤ්ච විශෙෂ සතර **සමන්තපාසාදිකා** විනය අටුවාවේ **565** වන පිටුවෙහි හා **පාලිමුත්තක විනය ටීකාවෙහි 113** පිටුවෙහි විස්තර වන්නේ මෙසේ ය. "තත්ථ මසාරකොති මඤ්චපාදෙ විජ්ඣිත්වා තත්ථ අටනියො පවෙසෙත්වා කතො. බුන්දිකාබද්ධොති අටනීහි මඤ්චපාදෙ ඩංසාපෙත්වා පල්ලඞ්කසඞ්ඛෙපෙන කතො. කුලීරපාදකොති අස්සමෙණ්ඩකාදීනං පාදසදිසෙහි කතො වා යො පන කොචි වඞ්කපාදකො, අයං වුච්චති

කුළීරපාදකො. ආහච්ච පාදකොති අයං පන ආහච්චපාදකො නාම මඤ්චො අඞ්ගෙ විජ්ඣිත්වා කතො හොතීති එවං පුරතො පාලියං යෙව වුත්තො. තස්මා අටනියො විජ්ඣිත්වා තත්ථ පාදසිඛං පවෙසෙත්වා උපරි ආණිං දත්වා කතමඤ්චො ආහච්චපාදකොති වෙදිතබ්බො" කියා යි. එහි "මසාරකය" නම් මඤ්චපාදයන් විද එහි විට්ටම් සවිකොට කරන ලද්ද යි. බුන්දිකාබද්ධ යනු විට්ටම් වලින් ඇඳ පා සවිකොට සෝපා හෝ කවිච්චි ආකාරයෙන් කළ අසුන් වෙසෙසකි. කුළීරපාදක යනු අස් බැටළු ආදීන් ගේ පා වැනි වක් පා යොදා කළ අසුන් වෙසෙසකි. ආහච්චපාදක යනු විට්ටම් විද එහි ඇඳ පාමුදුන රුවා මතුවෙහි ඇණ ගසා කළ ඇඳ යි.

## 278 පීඨ

"පීඨං නාම මසාරකාදීනං යෙව චතුන්නං පීඨානං අඤ්ඤතරං" යි ප්‍රකාශිත හෙයින් පීඨ ද මසාරකාදීන් අතුරෙන් එක්තරා එකකි. මඤ්චය ගැන ලියූ විස්තරය මෙයට ත් හෙළා ගත යුතු යි.

## 279 ලොහකුම්භි කටාහො ච ලොහභාණක වාරකො

මෙයට ලොහොමය සැළි, ලොහොමය කටාරම්, ලොහොමය මහත් දිය සැළි, ලොහො කළ යන භාජන ගැනේ. "ලොහකුම්භි ලොහභාණකං ලොහකටාහන්ති ඉමානි තීනි මහන්තානි වා හොන්තු ඛුද්දකානි වා අන්තමසො පසතමත්තඋදකගණ්හනකානිපි ගරුභණ්ඩානියෙව. ලොහවාරකො පන කාළලොහ තම්බලොහ වට්ටලොහ කංසලොහානං යෙන කෙනචි කතො සීහළදීපෙ පාදගණ්හනකො භාජෙතබ්බො; පාදො ච නාම මගධනාළියා පඤ්ච නාළිමත්තං ගණ්හාති තතො අතිරෙකගණ්හනකො ගරුභණ්ඩං" (**සමන්තපාසාදිකා 915- පාලිමුත්තක විනය 270**) "ලොහකුම්භි නාම කාළලොහෙන වා තම්බලොහෙන වා යෙන කෙනචි ලොහෙන කත කුම්භි. භාණකන්ති අරඤ්ජරො වුච්චති" (**විනයත්ථමඤ්ජූසා**)

"අරඤ්ජරොති බහුඋදකගණ්හනකා මහාචාටි. ජලං ගණ්හිතුං අලන්ති= අරඤ්ජරො. වට්ටචාටි විය හුත්වා ථොකං දීඝමුඛො මජ්ඣෙ පරිච්ඡෙදං දස්සෙත්වා කතොති ගණ්ඨිපදෙසු වුත්තං" (**විනයාලඞ්කාරය 385**)

"කුම්භි සැළ; **අරඤ්ජරසණ්ඨානං**- බොහෝ දිය ගන්නා සැළ සටහන්, භාණකං පාති ද කටාර හෝ තාලි ද කිලියයි ද යෙත්. **පසතමත්තං** පතක් පමණ; **කාලලොහ** නම් යකඩ යි. **කංසලොහ** නම් තලි ආදී කරණ කස්ලෝ යි. **වට්ටලොහ** නම් වැට ආදී කැරූ විරුවා වත් කරණ ලෝ යි. "වට්ටලොහන්ති පීතවණ්ණං" යනු **විනය සන්න යි. සීහලදීපෙ පාදගණ්හනකො**- සිංහ ද්වීපයෙහි පස්නැලියක් දිය ගන්නා අතලය "පාද නම් මගධ රට ලාසුයෙහි ලහසුමත් ගණී යි" යනු **කඞ්ඛාවිතරණී සන්න** යි. තතො පස්නැලියක් දිය ගන්නා හෙයින් අඩපසතයකුදු වඩා දිය ගන්නා අතලය" (**කංඛාවිතරණී පිටපොත 106**)

තො බෙදිය යුතු ලොහො බඳුන් අතර මේ දක් වූ භාජන පමණක් නොවැ "ඉමානි තාව පාලියං ආගතානි ලොහභාජනානි, පාලියං පන අනා

ගතානිපි භිඞකාර පටිගගහ උළුඞක දබබි කටච්ඡු පාති තට්ටක සරක සමුගග අඞගාරකපල්ල ධූමකටච්ඡු ආදීනි ඛුද්දකානි වා මහන්තානි වා සබ්බානි ගරුභණ්ඩානි" (**සමන්තපාසාදිකා 915– මාතිකාට්ඨකථා 138**) යී දක්වෙන හැම ලොහ භාණ්ඩයක් ම ගරු බඩු සංඛ්‍යායෙහි වැටේ.

එමෙන් ම "ධූමනෙත්ත ඵාලක දීපරුක්ඛ දීපකපල්ලිකා ඔලම්බකදීප ඉත්ථිපුරිස තිරච්ඡාන රූපකානි පන අඤ්ඤානි වා භිත්තිච්ඡදන කවාටාදිසු උපනෙතබ්බානි, අන්තමසො ලොහඛීලකං උපාදාය සබ්බානි ලොහභණ්ඩානි ගරුභණ්ඩානි එව, අත්තනා ලද්ධානිපි පරිහරිතුං පුග්ගලික පරිභොගෙන න පරිභුඤ්ජිතබ්බානි, සංඝික පරිභොගෙන වා ගිහි විකටානි වා වට්ටන්ති. තිපුභණ්ඩෙපි එසෙවනයො" (**සමන්තපාසාදිකා 916– මාතිකාට්ඨකථා 138**) යී තවත් ගරු බඩු රැසක් දක් වේ.

280 **කුඨාරි**

කෙටේරිය යි. මෙය ආයුධ වශයෙන් සාදා තිබේ නම් අනාමාස වස්තු වකි. කෙටේරියක සටහනින් සෑදූ වෙන යම් කිසිවක් ය යි මෙහි ලා ගැනීම නිවරද ය. "යා පන ආවුධ සංඛෙපෙන කතා අයං අනාමාසා" (**කංඛා විතරණී 138**)

281 **වාසි**

වාසි යනු වෑය යි. යම් වෑයෙකින් දැහැටු දඬු කැපීම් උක් සැසීම් පමණට වැඩි යමක් කළ නො හැක්කේ නම් එබඳු වෑය බෙදිය යුතු යි. ඉන වැඩි යමක් කළ හැකි වෑය ගරු භණ්ඩයෙහි ඇතුළත් වේ. "වාසි ආදිසු යාය වාසියා දන්තකට්ඨච්ඡෙදන උච්ඡුතච්ඡන මත්තතො අඤ්ඤං මහාකම්මං කාතුං න සක්කා අයං පන භාජනීයා, සෙසා යෙන කෙනචි ආකාරෙන කතා ගරුභණ්ඩා" (**කංඛාවිතරණී 138**) මෙහි වෑය ය යි සඳහන් කෙළේ පිහියා විශෙෂ බව පැහැදිලි ය. කුඩා පිහියා බෙදා ගතහැකි වන අතර මහ පිහියා බෙදාගත නො හැකි ය. අටපිරිකරට අයත් "වාසි" යන්න මෙයම ද යි පිරික්සිය යුත්තකි.

282 **එරසු**

පොරොව යි. යටත් පිරිසෙයින් වෙදුන් ගේ නහර විදුනා කටුව ද මේ "එරසු" සදට ඇතුළත් ය. "එරසු පන අන්තමසො වෙජ්ජානං සිරාවෙධ කොපි ගරු භණ්ඩමෙව" (**කංඛාවිතරණී 138**)

283 **කුද්දාල**

හුදැල්ල යි. "කුද්දාලො අන්තමසො චතුරඞ්ගුල මත්තොපි ගරුභණ්ඩ මෙව" (**සමන්තපාසාදිකා 916**) යටත් පිරිසෙයින් සතරඟුල් පමණ වූයේද ගරුභණ්ඩයෙහි ඇතුළති.

284 **නිඛාදන**

නියන යි. හුදැල්ල සහ නියන ත් අතර ගරු භාණ්ඩයට ඇතුළත් නො වන්නක් නැත. මේවා හැර "අධිකරණී– මුට්ඨි– **සණ්ඩාස**– තුලාදීනි

සබ්බානි ලොහමය උපකරණානි සඞ්ඝස්ස දින්නාන කාලතො පට්ඨාය ගරුභණ්ඩානි" යී කිණිහිරි- මිටි- අඬු- තරාදි ආදි වූ සියලු ලොහොමය උපකරණ යෝ ගැනෙත්.

285 **වල්ලි**

යටත් පිරිසෙන් අඩ බාහු ප්‍රමාණ (රියන් පමණැති) වේවැල් ආදි වැල් "වල්ලි" සඳට ගැනේ. සංඝයාට දුන්නා වූ ත් සංඝික භූමියෙහි හටගත්තා වූ හෝ ආරක්ෂා කැරැ තබා ගත්තා වූ සියලු වැල් ගරුභණ්ඩ සංඛ්‍යාවට ගැනේ. එය "වල්ලි ආදිසු වෙත්තවල්ලි ආදිකා යා කාචි අඩ්ඪබාහුප්පමාණා වල්ලි සඞ්ඝස්ස දින්නා වා තත්‍ථ ජාතකා වා රක්ඛිත ගොපිතා ගරුභණ්ඩා" (**සමන්තපාසාදිකා 917- කඞ්ඛාවිතරණී 139**) යි දක්වා තිබේ. මේ වැලින් සංඝකම් චෛත්‍යකම් කොට ඉතිරි වූ කල්හි පෞද්ගලික වැඩට යොදා ගැනීම වටී. යම් වැලක් සඟසතු බිම්හි හට ගත්තේ ද ආරක්ෂා විර හිතව තිබේ නම් ගරුභණ්ඩ සංඛ්‍යාවට නො වැටේ. එය "සා සඞ්ඝකම්මෙ ච චෙතියකම්මෙ ච කතෙ සචෙ අතිරෙකා හොති පුග්ගලික කම්මෙපි උපනෙතුං වට්ටති. අරක්ඛිතා පන ගරු භණ්ඩමෙව න හොති" (**සමන්තපාසාදිකා 917- කංඛාවිතරණී 139**)

286 **වෙළු**

හුණ යි. "යො කොචි අන්තමසො අට්ඨඞ්ගුල සූචිදණ්ඩමත්තොපි වෙළු සඞ්ඝස්ස දින්නො වා තත්‍ථ ජාතකො වා රක්ඛිතගොපිතො ගරුභණ්ඩං. සොපි සඞ්ඝකම්මෙ ච චෙතියකම්මෙ ච කතෙ අතිරෙකො පුග්ගලික කම්මෙ කාතුං වට්ටති පාදගණ්ඨිකතෙලනාලි පන, කත්තරයට්ඨි, උපාහනදණ්ඩකො ඡත්තදණ්ඩො ඡත්තසලාකාති ඉදමෙත්‍ථ භාජනීය භණ්ඩං. දඩ්ඪගෙහමනුස්සා ගණ්හිත්වා ගච්ඡන්තා න වාරෙතබ්බා. රක්ඛිත ගොපිතං වෙළුං ගණ්හන්තෙන තත්‍ථ සමකං වා අතිරෙකං වා ඵාවරං අන්තමසො තං අග්ඝනකම්පි ඵාතිකම්මං කත්වා ගහෙතබ්බො. ඵාතිකම්මං අකත්වා ගණ්හන්තෙන තත්‍ථෙව වලඤ්ජෙතබ්බො. ගමනකාලෙ සංඝිකාවාසෙ ඨපෙත්වා ගන්තබ්බං; අසතියා ගහෙත්වා ගතෙන පහිණිත්වා දාතබ්බො. දෙසන්තරං ගතෙන සම්පත්තවිහාරෙ සංඝිකාවාසෙ ඨපෙතබ්බො" (**සමන්තපාසාදිකා 917- කංඛාවිතරණී 139**) අදහස සුගම යි.

287 **තිණං**

මුඤ්ජ බබ්බජ හැර සෙසු තෘණ වර්ග මීට ඇතුලති. මුඤ්ජ බබ්බජ දෙක අත්හලේ ඒ දෙක ඒ නමින් ම වෙන ම ඇතුලත් වන හෙයිනි. මේවා සෙවෙණි කිරීමාදිය සඳහා ප්‍රයෝජන ය.

288 **පණ්ණං**

තල් පත් ආදි කොළ යි. තල්පත්හි යම්කිසිවක් ලියූ කල්හි ගරුභණ්ඩ සංඛ්‍යාවට නො ගැනේ. නො ලියූ අටගුලින් වැඩි පොත ගරුභණ්ඩ යි. මේ **තිණ පණ්ණ** දෙක ගැන "තිණන්ති මුඤ්ජං බබ්බජං ච ඨපෙත්වා

අවසෙසං යං කිඤ්චි තිණං. යත්ථ පන තිණං නත්ථි, තත්ථ පණ්ණෙහි ඡාදෙන්ති. තස්මා පණ්ණම්පි තිණෙනෙව සඞ්ගහිතං. ඉති මුඤ්ජාදිසු යං කිඤ්චි මුට්ඨිප්පමාණම්පි තිණං, තාලපණ්ණාදිසු ච එකපණ්ණම්පි සඞ්ඝස්ස දින්නං වා තත්ථ ජාතකං වා බහාරාමෙ සඞ්ඝස්ස තිණවත්ථුම්හි ජාතතිණං වා රක්ඛිත ගොපිතං ගරුභණ්ඩං හොති. තත්ථ සඞ්ඝකම්මෙ ච චෙතියකම්මෙ ච කතෙ අතිරෙකං පුග්ගලිකකම්මෙ දාතුං වට්ටති. දඩ්ඪගෙහමනුස්සා ගහෙත්වා ගච්ඡන්තා න වාරෙතබ්බා. අට්ඨඞ්ගුලප්පමාණොපි රිත්තපොත්ථකො ගරුභණ්ඩමෙව." **(සමන්තපාසාදිකා 917– කංඛාවිතරණී 139)** යි දක්වා තිබේ. අදහස සුගමයි. "රිත්තපොත්ථක" යි මෙහි සඳහන්වන්නේ නො ලියූ තල් පත් ඈ සමූහය යි.

## 289 මත්තිකා

"මත්තිකා පකති මත්තිකා වා හොතු පඤ්චවණ්ණා වා සුධා වා සජ්ජුරසකඞ්කුට්ඨසිලෙසාදිසු වා යංකිඤ්චි දුල්ලභට්ඨානෙ ආනෙත්වා වා දින්නං; තත්ථ ජාතකං වා රක්ඛිත ගොපිතං තාලපක්කමත්තං ගරුභණ්ඩං හොති. තම්පි සඞ්ඝකම්මෙ ච චෙතියකම්මෙ ච කතෙ අතිරෙකං පුග්ගලික කම්මෙ දාතුං වට්ටති. හිඞ්ගු හිඞ්ගුල හරිතාල මනොසිලා අඤ්ජනානි පන භාජනීයානි." **(සමන්තපාසාදිකා 917– කංඛාවිතරණී 139)**

මැටි වනාහි පියෙවි මැටි හෝ මකුළු ගුරු ආදි පස්වණක් පැහැයෙන් යුතු මැටි හෝ සුණු හෝ සදෙලමල හෝ උල්පත් දිය සමග තිබෙන කඞ්කුට්ඨ නම් මැටි හෝ ගිවුළු පැණි ආදි ලහටු හෝ ආරාමයට ගෙනැත් දෙන ලද්දේ ද තල් ගෙඩියක් පමණ වූ ද ඒවා ගරුභණ්ඩයෙහි ඇතුළති. පෙරුම් කායම් සිරියෙල් රත්සිරියෙල් අඳුන් ආදිය බෙදිය යුතු යි. හිඞ්ගු ආදිය මැටිවලට අනුලෝම් ය.

## 290 දැරු

මෙයට මඤ්චපීඨ දෙක්හි සංග්‍රහ නො වූ යම්තාක් දැරුභණ්ඩයෝ වෙත් ද, ඒ හැමෙකක් ම ඇතුළත් ය. යටත් පිරිසෙයින් හුණ සම් ගල් ආදියෙන් කළ බඩු ද දැරුභණ්ඩයට අනන්තර්ගත වේ. එය "අපි ච සබ්බොපි දැරුවෙළු චම්ම පාසාණාදි විකති දැරුභණ්ඩෙන සඞ්ගහිතා. තත්ථ මඤ්චපීඨෙ අසඞ්ගහිතානි ආසන්දිකාදීනි අනාමසො චොළෙන වා පලාලෙහි වා පණ්ණෙහි වා කතපීඨං උපාදාය සබ්බානි ආසනානි චඞ්කඵලකං දීඝඵලකං චීවරධොවනඵලකං ඝට්ටනඵලකං ඝට්ටනමුග්ගරො දන්තකට්ඨච්ඡෙදන ගණ්ඨිකා දණ්ඩමුග්ගරො නාවා අම්බණං රජනදොණි උදකපටිච්ඡකො දැරුමයො වා දන්තමයො වා වෙළුමයො වා සපාදකොපි අපාදකොපි සමුග්ගො මඤ්ජූසා පාදගණ්ඨිකාතො අතිරෙකප්පමාණො කරණ්ඩො උදකදොණි උදකකටාහං උළුඞ්කො කටච්ඡු පානීයසරාවං පානීයසඞ්ඛො'ති එතෙසු යං කිඤ්චි සඞ්ඝස්ස දින්නං ගරුභණ්ඩං. සඞ්ඛථාලකං පන භාජීයං. තථා දැරුමයො උදකතුම්බො පාදකඨලිකමණ්ඩලං දැරුමයං වා හොතු. චොළපණ්ණාදිමයං වා සබ්බං ගරුභණ්ඩං. ආධාරකො පත්තපිධානං තාලවණ්ටං

විජනී චඞ්ගොටකං පච්ඡි යට්ඨිසම්මුඤ්ජනී මුට්ඨිසම්මුඤ්ජනී, එතෙසුපි යං කිඤ්චි ඛුද්දකං වා මහන්තං වා දාරුවේළු පණ්ණචම්මාදිසු යෙන කෙනචි කතං ගරුභණ්ඩමෙව. ථම්භතුලා සොපානඵලකාදිසු යංකිඤ්චි දාරුමයං වා පාසාණමයං වා ගෙහසම්භාරූපගං යො කොචි කටසාරකො යංකිඤ්චි භූම්මත්ථරණං වා යංකිඤ්චි අකප්පියචම්මං සබ්බං සංඝිකං ගරුභණ්ඩං. භූම්මත්ථරණං කාතුං වට්ටති. එළකචම්මං පන පච්චත්ථරණගතිකං හොති. තම්පි ගරුභණ්ඩමෙව, කප්පියචම්මානි භාජනීයානි. කුරුන්දියං පන සබ්බං මඤ්චප්පමාණං චම්මං ගරුභණ්ඩන්ති වුත්තං. උදුක්ඛලං මුසලං සුප්පං නිසදෙ නිසදපොතකො පාසාණදොණි පාසාණකටාහං සබ්බං කසිභණ්ඩං සබ්බං චක්කයුත්තයානං ගරුභණ්ඩමෙව, මඤ්චපීඨානං පාදා ච අටනියො ච වාසි ඵරසු ආදීනං දණ්ඩානිචෙති එතෙසු යංකිඤ්චි අනිට්ඨිතං භාජනීයං. තච්ඡිතමට්ඨං පන ගරුභණ්ඩං හොති. අනුඤ්ඤාතවාසියා දණ්ඩාජත්තං මුට්ඨිපණ්ණං කත්තරයට්ඨි උපාහනදණ්ඩකො අරණිසහිතං ධම්මකරකො පාදගණ්හනතො අතිරිත්තං ආමලකතුම්බං ආමලකඝටො ලාබුතුම්බං ලාබුඝටො විසාණකතුම්බන්ති සබ්බමෙතං භාජනීයං. තතො පරං ගරුභණ්ඩං. හත්ථිදන්තො වා යංකිඤ්චි විසාණං වා අතච්ඡිතං යථාගතමෙව භාජනීයං. තෙහි කතමඤ්ච පාදාදිසු පුරිමසදිසො ච විනිච්ඡයො. තච්ඡිතනිට්ඨිතොපි භිඞ්ගුකරණ්ඩකො අඤ්ජනීකරණ්ඩකො ගණ්ඨිකා විධො අඤ්ජනී අඤ්ජනීසලාකො උදකපුඤ්ඡනීති ඉදං සබ්බං භාජනීයං" (**සමන්තපාසාදිකා 917-918-, කංඛාවිතරණී 139-140-, පාළිමුත්තක විනය විනිශ්චය 281**) යි සවිස්තර වැ දක් වේ. මෙහි දුර්බෝධ වචනයන්හි අර්ථය පමණක් **කංඛාවිතරණී පිටපතෙන්** ගෙනැ පහත පළ වේ. **වඞ්කඵලකං**- වක් පොහොරුව. **ඝට්ටනඵලකං**- සිවුරුගටන පොහොරුව. **දන්තකට්ඨච්ඡෙදන ගණ්ඨිකා**- දැහැටු දඬු කපන කොළඹුව (කොටය) **දණ්ඩමුග්ගරො**- අතකොලුව. **අම්මණං**- පරිෂ්කාර තබන දෙණ. **රජනදොණි**- රදන් දෙණ (පඬු ඔරුව) **උදකපච්ඡකො**- දිය පැස. **ආධාරකො**- පාත්‍රාධාරය **තාලවණ්ටං**- රවුන් තල් අත්ත. **විජනී**- සිවුරුස් විජනිය. **යට්ඨිසම්මුඤ්ජනී**- හිරටා මුසුන් (ඉළපත) **මුට්ඨිසම්මුඤ්ජනී**- හිඳිකොළ මුසුන්. **ථම්භ**- ටැඹ. **තුලා**- තලාද. **උදුක්ඛලං**- වන (වංගෙඩිය) **මුසලං**- මොහොල. **සුප්පං**- කුල්ල. **නිසදෙ**- දගල. **නිසදපොතකො**- දපොය (අත් ගල) **පාසාණකටාහං**- ගලින් කපා කළ තාලි. **අරණිසහිතං**- මෝල සහිත වූ ගිනිදඬ ද **ධම්මකරකො**- ඩබරාව. **ආමලකතුම්බං**- ඇඹුල් කල්කයෙන් කරනලද පද්ද (නෙල්ලි යුෂට නොයෙක් දෑ මිශ්‍රකොට ගින්නෙන් කකාරු වත්කොට සැලැස්මක් අනුව සාදාගන්නා දියබඳුන් වෙසෙසකැයි හැඟේ.) **ලාබුතුම්බං**- ලබුපකින් කරනලද පද්ද. **විසාණතුම්බං**- ගවරහං ආදීන් කරනලද පද්ද ද. **ගණ්ඨිකා**- සඟළසිවුරෙ ඔබන ගැට යනු යි.

## 291 මත්තිකා භණ්ඩානි

මෙයින් මෘත්මය භාජන සියල්ල ත් මිනිසුන් ගේ ප්‍රයෝජනයට ගන්නා සෙසු මැටි බඩු ත් කියන ලදි. "**මත්තිකාභණ්ඩෙ** සබ්බං මනුස්සානං

උපභොග පරිභොගං ඝටපිඨරාදි කුලාලභාජනං පත්තකටාහං අඞ්ගාරකටාහං ධූමදානකං දීපරුක්ඛකො දීපකපල්ලිකා චයනිඝිකා ඡදනිඝිකා ථූපිකාති සබ්බං ගරුභණ්ඩං'' (**කංඛාවිතරණී 140- සමන්තපාසාදිකා 919**) මෑන්මය භාණ්ඩයෙහි දී මිනිසුන් ගේ උපභොග පරිභොග වස්තු වශයෙන් සලකන කළ සැළි ආදි කුඹල් බඳුන් හා පාත්‍රාපිසන කබල් හා අඟුරු කබල් ද, දුම් නළ ද, පහන් කඳ ද, පහන් කබල් ද, ගඩොළු ද, උළු ද, කොත් ද යන සියල්ල ම ගරුබඩුහි ලා ගැනේ.

---

## 41 පකිණ්ණකානි

**340 සද්වාර බන්ධනෙ ඨානෙ-සොදුක්ඛලකපාසකෙ**
**සයනෙනන දිවාද්වාරං-බන්ධිය පරිවත්තකං.**

දොර හා දොර උළුවස්සු ඇති (සොදුක්ඛලක පාසකෙ) දොරගුළු සහිත තැනෙක දවල් සයනය කරන්නහු විසින් ඇරීම් වැසීම් කළ හැකි දොර පියාලිය යුතු ය.

**341 විඤ්ඤුම්හි පුරිසෙ සන්තෙ-ආභොගො චාපි කප්පති**
**සවසෙ තං විනාඝාරං-සයන්තො දුක්කටං ඵුසෙ.**

නො නිදන ආරාමික සාමණේරාදි කිසියම් නුවණැත්තකු ඇති විට (ආභොගො) ''මොහු මා රකිතැ''යි යන හැඟීම ද වටී. (සවසෙ) තමා පමණක් සිටිනා තන්හි දොර වැසීම ය, තමා රක්නකු නැති බව ය යන ආකාර නැති ව හෝනේ දුකුළා අවදී.

**විස්තර**

53 දොර'ගුළු තිබෙන සෙනස්නක දිවා සයනය කරන මහණහු විසින් හොඳින් දොරගුළු දමා ගෙන නිදිය යුතු බව ත් සිය ආරක්‍ෂාව සල සන්නට අන් කෙනකුන් සිටිය දී දොරගුළු නො ලූව ද නිවරද බව ත් මෙයින් ප්‍රකාශිත යි. බුද්ධ කාලයෙහි සිටි එක් භික්‍ෂුවක් විසල්පුර කූටාගාර ශාලායෙහි දොර නො වසා දිවා සයනයට වන්නේ ය. එවිට විහාරය දක්නට පැමිණි සත්‍රීන් විසින් වාතොපස්තම්භනයෙන් කම්ණ්‍යවූ අඞ්ගජාත ඇති ව තදින් නිදිගත් ඒ භික්‍ෂුව දක්නා ලදින් එහි ළංව අනාචාරයෙහි යෙදෙන ලදි. ඒ නිමිත්තෙන් තථාගතයන් වහන්සේ විසින් ''අනුජානාමි භික්ඛවෙ දිවා පති සල්ලීයන්තෙන ද්වාරං සංවරිත්වා පතිසල්ලීයිතුං'' (**පාරාජිකාපාළි 42**) යී දහවල් නිදන්නහු විසින් දොර වසා ගෙන නිදියයුතු බව අනුදන්නා ලදි.

292 ද්වාරං

දොර යි. මෙහි කෙබඳු දොරෙක්දැ යි විදහා පාමින් **සමන්තපාසාදිකා 203 වන** පිටුවේ කැරෙන විස්තරයෙන් කොටසක් පහත පළ වේ. ලී පතුරු- උණ පතුරු- කළාල්- පැළැලි ආදි යමකින් සාදා අසවු සවිකරන ලද පරිවත්තක ද්වාරය සංවරණය කටයුතු ම ය. අන්‍ය වූ රුක්ඛ සූචිද්වාරය

(ඉදිකඩුල්ල) කණ්ටක ද්වාරය (කටුපැලැල්ල) චක්කලයුත්ත ද්වාරය (රෝද හෝ සරණේරු සවිකළ දොර) සංසරණකිටික ද්වාරය (උණ පතුරු කටු අතු ආදියෙන් කොට රෝද සවිකිරීමෙන් හෝ සරණේරු සවිකිරීමෙන් හෝ ඇරීම් වැසීම් කළ හැකි මහදොර) උග්ඝාටනකිටිකවාරය (උණ ලී පතුරු තබා කැමැත්තිවිටෙක ඔසවා අස්කළ හැකි සේ කළ දොර) සලාක හත්ථවාරය (සරසට ලී තුනක් තබා පැනැ යාගතහැකි සේ කළ කඩුල්ල) දුස්සසාණිවාරය (රෙදි තිරය) යන මෙකී දොර සංවරණය නො කළ ද වරදෙක් නැති. (පාත්‍රයක් අතේ ඇත්තහුට දුස්සසාණිවාරය පමණක් අනාපත්ති කර සි. මෙකලැ තිබෙන දොරවල් උළුවස්සට හොඳින් හේත්තුවන සේ වැසූ කල්හි ප්‍රමාණ වේ. "වාරබාහං එසෙත්වා පිහිතමත්තෙපි වට්ටති" යන **අටුවා පාඨයෙන්** එය ස්ඵුට වේ.

**342 රතනානිත්ථී රූපානි-ධඤ්ඤමිත්ථි පසාදනං**
**තූරියාවුධ භණ්ඩානි-ආමසන්තස්ස දුක්කටං.**

දශවිධ රත්න ද ස්ත්‍රී රූප ද ධාන්‍ය ද ස්ත්‍රී ආභරණ ද තූර්‍ය්‍යභාණ්ඩ හා ආයුධ භාණ්ඩ ද දුන දුන අල්ලන්නාහට දුකුළා වේ.

**293 රතනානි**

දශවිධ රත්න සි. දශවිධ රත්න අංක 258 දරණ ටිප්පණියේ සඳහන් කොට ඇත. සුවර්ණ චෛත්‍යයෙක්හි කසල ශුද්ධ කිරීමට පමණක් ආමර්ශනය කළ ද වරද නැතැ සි කියතුදු එහි ද කෝළායන බවක් පෙනෙන හෙයින් නුසුදුසු බව **විනයාලංකාරයේ 60 වන පිටුවේ** එයි.

**294 ඉත්ථිරූපානි**

ස්ත්‍රී සටහනින් කළ රූප සි කවර ද්‍රව්‍යයෙකින් හෝ ස්ත්‍රී රූපයක් කර තිබේ නම් එය අනාමාස සි. යටත් පිරිසෙන් පාරාජිකාවට වස්තුවන තිරිසන් ගිය මාගම් රූපයක් පවා අනාමාස බව දක්වා තිබේ. "සුධාදීහි කතං පාරාජිකාවත්ථුභූතානං තිරච්ඡානගතිත්ථීනං සණ්ඨානෙන කතම්පි අනාමාස මෙව." (**විනයාලංකාරය 57**) ස්ත්‍රී රූප සටහන් කොට ඇති වස්තු සහ භිත්ති ආදිය ත් පරිභොග කිරීමේදී ස්ත්‍රීරූප පරමර්ශනය නො කොට ම පරිභොග කටහැකි වේ.

**295 ධඤ්ඤං**

සප්තවිධ ධාන්‍යය සි. සාලි- වීහි- යව- ගොධූම- කඞ්ගු- වරක-කුද්‍රූසක යන සත සි. මේවා අනාමාස සි. එපමණක් නොව "තත්‍ර ජාතකානි මුග්ගමාසාදීනි අපරණ්ණානිපි තාලපනසාදීනි වා ඵලානි කීළන්තෙන න ආමසිතබ්බානි. මනුස්සෙහි රාසිකතෙසුපි එසෙව නයො." (**පාළිමුත්තක විනය විනිච්ඡය 28**) සි දක්වෙන හෙයින් හටගත් වණින් ම තිබෙන මුං මෑ ඈ අපරණ්ණ සහ තල් කොස් ඈ ගෙඩි ත් අනාමාස සි. මිනිසුන් විසින් රාශීකෘත මුද්ගමාසාදිය ගැන ත් තල් කොස් ආදිය ගැන ත් විනිශ්චය මෙය ම සි.

296 **ඉත්ථිපසාදනං**

ස්ත්‍රී පළඳනා යි. ස්ත්‍රීන් හඳනා පොරෝනා වස්ත්‍ර සහ යටත් පිරිසෙන් තණ මාලයක් හෝ තල්පත් මුද්දක් හෝ ස්ත්‍රී ආභරණ වශයෙන් තිබේ නම් එයත් අනාමාස යි. ස්ත්‍රීන් පරිභොග කළ වස්ත්‍රයක් පිදූවිට සිවුරු පිණිස ගන්නට වටී.

297 **තුරියාවුධභණ්ඩානි**

තූර්‍ය්‍ය සහ ආයුධ භාණ්ඩයෝ යි. මීට චර්‍මවිනද්ධ වූ වීණා බෙර ආදී සියලු තූර්‍ය්‍යභාණ්ඩ ගැනෙතැ යි කියත ත් චර්‍මවිනද්ධ නො වූ තූර්‍ය්‍යභාණ්ඩ වශයෙන් පාවිච්චි කළ හැකි වත්මන්හි තිබෙන තූර්‍ය්‍යභාණ්ඩ සියල්ල ම ත් ඇතුළත් වේ.

ආවුධ යන වචනයට සත්ත්වයනට හිංසා පිණිස කළ හැම ආයුධයක් ම ඇතුළති. දුනුදඬු දුනුදිය කෙවිට හෙණ්ඩුව තෝමරාදිය ත් යටත් පිරිසෙයින් ආයුධ වශයෙන් සෑදූ වැ පොරෝ ආදිය ත් අනාමාස යි. ඉදින් අඩයටියක් හෝ තෝමරයක් හෝ වෙහෙර තිබේ නම්, වෙහෙර පිළිදුගුම් සමයෙහි එය නොසොල්වා ම වෙහෙර පිළිදුගුම් කළමනා ය. මාළු දැල් කුරුලු දැල් ආදි දැල් ද මෙයට ම අන්තර්ගත ය. මේ අනාමාස වස්තූන් පිළිබඳ විස්තර **පාලිමුත්තක විනය විනිශ්චයයේ 27 වන** පිටුවේ සිට එයි.

343 **සිත්ථතෙලොද තෙලෙහි-ඵණහත්ථ ඵණෙහි වා**
**කොච්ඡෙනවා'පි යො කෙසෙ-ඔසණ්හෙය්‍යස්ස දුක්කටං.**

යමෙක් ඉටි මුසු තෙලින් හෝ දිය මුසු තෙලින් හෝ පණාවෙන් හෝ අත් පණාවෙන් (අත ම පණාව වශයෙන් පාවිච්චි කිරීමෙන්) හෝ සුවඳ හොට මුදුතණ බබුස්තණ යන යම්කිසිවකින් කළ කොස්සෙන් හෝ අලංකාර පිණිස මට කොට නමා නම් ඔහුට දුකුළා වේ.

344 **නෙක[1]පාවුරණා එක-ත්ථරණා වා තුවට්ටයුං**
**තථෙක මඤ්චෙ භුඤ්ජෙය්‍යුං-එකස්මිං වා'පි භාජනෙ.**

එකක් පෙර වැ හෝ එකක් අතුට හෝ එක ඇඳක හෝ දෙදෙනෙක් හොවිත් නම් නො වටී. එක භාජනයෙක්හි බුදිත් නම් එසේ ම නොවටී. (යටත් පිරිසෙන් සිවුරු පටියෙන් වත් වෙන් කරගත් කල්හි එක ඇඳක සයනය කළ ද වරද නැත.)

345 **චතුරඞ්ගුලතො ඌන-මධිකට්ඨඞ්ගුලං තථා**
**දන්තකට්ඨං න ඛාදෙය්‍ය-ලසුණං න අකල්ලකං.**

සතරඟුලින් අඩු අටඟුලින් වැඩි දැහැටිදඬු නො කන්නේ ය. නො ගිලන්වූයේ ලූණු ද එසේ ම නො කන්නේ ය.

298 **ලසුණං**

සුදුලූණු යි. “මගධරට්ඨෙ ජාතං ආමකභණ්ඩික ලසුණමෙව; න එක විති මිඤ්ජකං” (**මාතිකට්ඨකථා 173**) මගධරටෙහි හටගත් අමු සුදුලූණු

---

1 පාපුරණං සන්තය.

කැම මින් වලකන ලදි. එක් භික්ෂුවක්හු ගේ උදර වාතාබාධයක් නිමිත් තෙන් "අනුජානාමි භික්ඛවෙ ආබාධපච්චයා ලසුණං ඛාදිතුං" (**චූලවග්ග 235**) යි ගිලනාහට අනුදත් සේක. මෙහි තවත් විස්තර **සමන්තපාසාදිකා 685**) පිටුවේ අග සිට ප්‍රකාශ වේ. භික්ෂුණීන් හට ලූණු කැමෙන් පචිති වන බව "යා පන භික්ඛුණී ලසුණං ඛාදෙය්‍ය පාචිත්තියං" යි පැවැසේ.

346 **හීනුක්කට්ඨෙහි උක්කට්ඨං-හීනං වා ජාති ආදිහි**
**උජ්ඣං වා'ක්කොසපෙක්ඛෙන-වදෙ දුබ්භාසිතං දවා.**

උසස් වූ හෝ පහත් වූ හෝ යම්කිසිවකු හට හීන වූ හෝ උසස් වූ හෝ ජාති ආදියෙන් කෙළින් හෝ පයභිංගයෙන් හෝ කෙළි පිණිස කියානම් දුබ්භාසිත ආපත්ති වේ.

**විස්තර**

53 **ජාත්‍යාදියෙන්** හීනොත්කෘෂ්ට කා හට වුව ත් කෙළි පිණිස ජාත්‍යාදිය ගෙනහැර පා නම් දුබ්භාසිතයක් වේ. එය උත්කෘෂ්ට ජාති ඇත් තකුට විසුළු පිණිස ඒ ජාතිය ම ගෙනහැර පෑමෙන් හෝ අනෙකක් ගෙන හැර පෑමෙන් හෝ කළ හැකි ය. හීන ජාති ඇත්තකුට ඒ හීන ජාතිය ගෙන හැර පෑමෙන් හෝ කළ හැකි ය. හීන ජාතිකයකු හට උසස් ජාති යක් ආරොපනය කිරීමෙන් ද මේ දුර්භාෂිතය සිදු විය හැකි ය. ජාත්‍යාදි යෙන් ගටා කිණුමෙහි "ඔමසවාද පචිතිය" යි.

299 **ජාතිආදීහි**

මෙහි ආදි ශබ්දයට නාම ගොත්ත කම්ම සිප්ප ආබාධ ලිඞ්ග කිලෙස ආපත්ති යන මේවා ගැනෙ ත්.

300 **දුබ්භාසිතං**

> දුබ්භාසිතං භාසි යං වුත්තං-තං සුණොහි යථා තථං
> දුබ්භාසිතං දුරාභට්ඨං-සංකිලිට්ඨන්ති යං පදං
> යඤ්ච විඤ්ඤූ ගරහන්ති-තෙනෙතං ඉති වුච්චති.
>
> (**පරිවාරපාළි 216**)

දුබ්භාසිත යනු නපුරු කොට පැවැසූ වචන යි. නුවණැත්තන් පිළි කුල් කරන වෙන යම් අසභ්‍ය වචන හෝ මෙයට අන්තර්ගත විය හැකි ය.

347 **දීඝෙ නඛෙ ච කෙසෙ ච-නාසාලොමෙ න ධාරයෙ**
**න ලබ්භා වීසති මට්ඨං-සම්බාධෙ ලොමහාරණං.**

දික් නිය ද, දික් කෙස් ද, දික් නැහැ ලොම් ද නො දරන්නේ ය. විසි නිය පොතු ඔප්නගා මට කිරීම ද සම්බාධස්ථානයෙහි ලොම් හැරීම් ද නො වටී.

301 **දීඝෙ නඛෙ**

"න භික්ඛවෙ දීඝා නඛා ධාරෙතබ්බා, යො ධාරෙය්‍ය ආපත්ති දුක්ක ටස්ස" (**චූලවග්ග 227**) යි වදාළෙන් දික් නිය දැරීම දුක්කටාපත්ති ජන

කයි. "අනුජානාමි භික්ඛවෙ මංසප්පමාණෙන තබං ඡින්දිතුං" යි අනුදත් හෙයින් ණිය කපන කල්හි මංස ප්‍රමාණයෙන් කපන්නට වටී. මංසප්‍රමාණයෙන් දික් වූ ණිය නො දැරිය යුතු යි.

302 කෙසෙ ච

දෑඟුලට වඩා දික් කෙස් යනු යි. සවග මහණුන් දික් කෙස් දරූ හෙයින් "න භික්ඛවෙ දීඝා කෙසා ධාරෙතබ්බා, යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස, අනුජානාමි භික්ඛවෙ විමාසිකං වා වඩ්ලකං වා" (චුල්ලවග්ග 199) යි අනුදත්හ. මෙයින් දෑඟුලකට වඩා කෙස් දික් නො විය යුතු බව ත් කෙස් කපා දෙමසකට වඩා කල් ගත නො කොට නැවත කෙස් කැපිය යුතු බව ත් ප්‍රකාශ වේ. කෙස් කපා දෙ මසක් ගිය ද වත්මන්හි ගණන් ගන්නා දෑඟලක් තබා අඟලක් වත් නො වැඩෙන්නේ ය. බුඩ කාලයේ ත් වත්මානයේ ත් මිනුම් පමණ ඉතා ම වෙනස් බවට මෙය ත් සාධකයක් නො වේ ද?

303 නාසාලොමෙ

මෙයින් නැහැයෙන් පිටත නික්මුණු ලොම් ගැනේ. "න භික්ඛවෙ දීඝං නාසිකා ලොමං ධාරෙතබ්බං, යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (චුල්ලවග්ග 229) යි නාසයෙන් පිටත නික්මුණු ලොම් දැරීම වළකා ඒ නැහැලොම් ඉගිලීමට "අනුජානාමි භික්ඛවෙ සණ්ඩාසං" (චුල්ලවග්ග 229) යි අඬුවක් ද අනුදත් සේක.

304 වීසතිමට්ඨං

ණිය විස්ස මට්ටම් කිරීම යි. එය තහනම් කොට ණියෙහි රැඳී පවත්නා කුණු පමණක් ඉවත් කරන්නට "න භික්ඛවෙ වීසතිමට්ඨං කාරාපෙතබ්බං, යො කාරාපෙය්‍ය ආපත්ති දුක්කටස්ස, අනුජානාමි භික්ඛවෙ මලමත්තං අපකඩ්ඪිතුං" (චුල්ලවග්ග 228) අනුදත් සේක.

305 සම්බාධෙ ලොමහාරණං

සම්බාධස්ථානයෙහි ලොම් හැරීම යි. මෙහි සම්බාධස්ථාන නම් "සම්බාධො නාම උභො උපකච්ඡකා මුත්තකරණං" (පාචිත්තියපාලි 284) යි දැක්වෙන හෙයින් දෙ කිසිල්ල ත් නිමිත්ත ප්‍රදෙශයත් ය. ඒ තන්හි ආබාධයක් නොමැති ව ලොම් ඉවත් කිරීම දුකුළා ඇවැත් ඇති කරන්නකි. මෙය ම භික්ෂුණීන් හට පචිත්තියකි. කණ්ඩු කච්ඡු ආදි ආබාධ ඇති කල්හි "අනුජානාමි භික්ඛවෙ ආබාධ පච්චයා සම්බාධෙ ලොමං සංහරාපෙතුං" (චුල්ලවග්ග 228) යි සම්බාධස්ථානයෙහි ලොම් ඉවත් කිරීමට අනුදත් සේක.

348 යථාබුඩ්ඪං න බාධෙය්‍ය-සංඝුද්දිට්ඨං ච සංඝිකං
අධොත අල්ලපාදෙහි-නක්කමෙ සයනාසනං
සුධොතපාදකං වා'පි-තථෙව සඋපාහනො.

සඞ්ඝයා උදෙසා දෙන ලද සඟසතු හෝ (මණ්ඩප ආස්තරණ මඤ්ච පීඨාදි) සෙනසුන් (පරිභොගයෙහි) සඟ මහලු පිළිවෙළ නො වළක්වන්නේ ය. නො දෙවි පයින් හෝ තෙත පයින් සෙනසුන් නො ඇක්මෙන්නේ ය. මනා වැ දෙවි පයින් ම ඇක්මියයුතු තැනුදු වහන් සහිත වූයේ එසේ ම නො ඇක්මෙන්නේ යි (ඇක්මීම දුකුළා සිදුවන්නකි.)

306 යථා බුඩ්ඪං න බාධෙය්‍ය සංඝුද්දිට්ඨං ච සංඝිකං

සඞ්ඝයා උදෙසා පිළියෙළ කළ සෙනසුන් හෝ සංඝික සෙනසුන් හෝ පරිභොග කිරීමෙහි දී වැඩි සිටි පිළිවෙළ නො ඉක්මවාලිය යුතු බව මෙයින් ප්‍රකාශිත යි. එය චුල්ලවග්ග 259 වන පිටුවෙහි ප්‍රකාශ වන්නේ මෙසේ ය. "න ච භික්ඛවෙ සංඝිකං යථාවුඩ්ඪං පටිබාහිතබ්බං යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්ස" "න භික්ඛවෙ උද්දිස්සකතම්පි යථාවුඩ්ඪං පටිබාහෙතබ්බං, යො පටිබාහෙය්‍ය ආපත්ති දුක්කටස්ස" කියා යි.

307 අධොත අල්ලපාදෙහි නක්කමෙ සයනාසනං

නො සේදූ පයින් ද තෙත් පයින් ද සෙනසුන් නො පෑගියයුතු බව මෙයින් ප්‍රකාශිත යි. "පරිකම්මකතා වා භූමි න අක්කමිතබ්බා" යි **පාලි මුත්තක විනය විනිශ්චයයේ** 401 වන පිටුවේ දැක්වෙන හෙයින් පිරියම් කරනලද බිම ද නො සේදූ පයින් හෝ තෙත් පයින් නො ඇක්මිය යුතු බව පැවැසේ. "න භික්ඛවෙ අධොතෙහි පාදෙහි සෙනාසනං අක්කමිතබ්බං, යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්ස". "න භික්ඛවෙ අල්ලෙහි පාදෙහි සෙනාසනං අක්කමිතබ්බං, යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්ස." යනු විනය පාලි යි.

308 සඋපාහනො

උපාහන සහිතවූයේ දෙවි පයින් ඇක්මිය යුතු තැන් ඇක්මීමෙන් දුකුළා අවදීය යි මෙයින් හැඟැවිණ. 'න භික්ඛවෙ සඋපාහනෙන සෙනාසනං අක්කමිතබ්බං යො අක්කමෙය්‍ය ආපත්ති දුක්කටස්සාති වචනතො ධොතපාදෙහි අක්කමිතබ්බට්ඨානං ස උපාහනෙන අක්කමිතුං න වට්ටති." (**පාලිමුත්තක විනය 401**) යි එය විස්තර වේ.

349 සංඝාටියා න පල්ලත්ථෙ-භිත්තාදිං න අපස්සයෙ
පරිකම්මකතං සගොන-උදකො නො න ආචමෙ.

සඞ්ඝාටි නාමයෙන් ඉටු සිවුරෙන් අකාවටු නො අවුලුවන්නේ ය. සුණු පිරියම් කළ භිත්ති ආදිය සිවුරු ඈ කිසිවකින් නො වසා හේත්තු නො වන්නේ ය. දිය ඇති කල්හි සිරුරු කිස කොට දිය නො නැගීම ත් නො වටනේ ය. (මෙහි ප්‍රතික්ෂිප්ත දෑ කිරීමෙන් දුකුළා වේ.)

### 309 න පල්ලත්ථෝ

පල්ලත්ථිකායෙන් නො හිඳින්නේ ය. යනු යි. "පල්ලත්ථිකායාති ආයොගපල්ලත්ථිකාය වා හත්ථපල්ලත්ථිකාය වා දුස්සපල්ලත්ථිකාය වා යාය කායචි පල්ලත්ථිකාය" (**සමන්තපාසාදිකා 666**) යනුවෙන් පල්ලත්ථිකා තුනක් සඳහන් කොට තිබේ. මෙහි "සඞ්ඝාටියා" සී වෙසෙසින් කීඑත් හත්ථපල්ලත්ථිකාව ද ගත යුතු යි. ඒ දෙක ම සෙඛියාවට ත් අයත් වන බැවිනි. සහල සිවුරෙන් දෙ දණ හා ඉඟ ද අවුළුවා ගෙන හිඳීම මෙහි ලා ගැනෙන්න යි. වෙන යම්කිසි වස්ත්‍රයකින් හෝ දෙ අතින් හෝ එසේ අකවටු අවුළුවා සිටීම ද වරද ය. මෙය ඇතුළු ගම්හි ත් වෙහෙරෙහි ත් යන තන්හි නො වටී.

350 **අකප්පිය සමාදානෙ–දවා සිලාපවිජ්ඣනෙ**
**ඡදසනාය සභාගාය–ආවිකම්මෙ ච දුක්කටං.**

පස්සහ දූමියන් අකැපයෙහි සමාදන් කැරැවීමෙහි ද කෙළිපිණිස ගල් පෙරළීම් අතකුරු ගැසීම් ආදියෙහි ද සභාගාපත්ති දෙසීමෙහි ද ආරෙවනය කිරීමෙහි ද දුකුළා වේ.

**විස්තර**

54 භික්ෂු භික්ෂුණී ශික්ෂමානා ශ්‍රාමණේර ශ්‍රාමණේරී යන පස්සහදූමියන් අකැප දූයෙහි යෙදවීම ත් කෙළි පිණිස අතකුරු ගැසීම, ගල් ඈ විසිකිරීම ත් සභාගාපත්ති දෙශනාව ත් පිළිගැනීම ත් යන මේවා දුකුළා සිදුවීමට හේතුවන බව මෙයින් ප්‍රකාශිත යි.

351 **පටිස්සව විසංවාදෙ–සුද්ධචිත්තස්ස දුක්කටං**
**පටිස්සවක්ඛණෙයෙව–පාචිත්ති ඉතරස්ස තු.**

(සුද්ධචිත්තස්ස) කියනවිට "මෙය කරමි" යි සිත් ඇත්තහුට අනතුරක් නැති ව තිබිය දී පොරොන්දු කඩකිරීමෙහි දුකුළා වේ. (ඉතරස්ස තු) කියනකල්හි "කරමි" යන සිත් නැත්තාහට වනාහි පොරොන්දු වන කෙණෙහි ම මුසාවා නිමිත්තෙන් පචිති වේ.

352 **න රුක්ඛමභි රූහෙය්‍ය–සති කිච්චෙ'ව පොරිසං**
**ආපදාසු යථාකාමං–කප්පති අභිරූහිතුං.**

රුකට නො නඟින්නේ ය. දර බිඳුම් ඈ කිසක් ඇති කල්හි ම මිනිස් පමණක් නඟින්නේ ය. ව්‍යාල මෘගාදි ආපදාවක් ඇති කල්හි කැමැතිතාක් නඟින්නට වටී.

### 310 න රුක්ඛමභිරූහෙය්‍ය

සවග වහන්දෑ ගස් නැඟි හෙයින් "න භික්ඛවෙ රුක්ඛො අභිරූහිතබ්බො, යො අභිරූහෙය්‍ය ආපත්ති දුක්කටස්ස." (**චුල්ලවග්ග 232**) යි ගස් නැඟීම තහනම් කළහ. පසුව සැවැත්නුවර බලා යන එක්තරා මහණකු පස්සෙන් ඇතකු එළවා ගෙන ආවිට ඒ මහණ තෙමේ ගසක් ළඟට අවුත් කුකුස් උපදවා ගසට නො නැංගේ ය. ඇත්තෙමේ අන් මඟකින් ගියේය.

මෙ පුවත දත් බුදුරජාණන් වහන්සේ "අනුජානාමි භික්ඛවෙ සති කරණී යෙ පොරිසකං රුක්ඛං අභිරුහිතුං, ආපදාසු යාවදත්ථං" (**චුල්ලවග්ග 283**) දර කැඩීම් ආ කටයුත්තක් ඇති විට බඹයක් පමණ නගින්නට ත් ආපද වක දී කැමැත්තක් නගින්නට ත් අනුදත් සේක. එය තවත් විස්තර කරන **සමන්තපාසාදිකා** 897 වන පිටුවේ මෙසේ සඳහන් වෙයි. "**සති කරණීයෙ'ති** සුක්ඛකට්ඨාදි ගහණ කිච්චෙ සති. '**පොරිසියන්ති** පුරිසප්ප මාණං. **ආපදාසු'ති** වාළමිගාදයො වා දිස්වා, මග්ගමූළ්හො දිසා ඔලොකෙතු කාමො වා හුත්වා, දවඩාහං වා උදකොඝං වා ආගච්ඡන්තං දිස්වා, එවරූපාසු ආපදාසු අති උච්චම්පි රුක්ඛං ආරොහිතුං වට්ටති" කියා යි. අදහස සුගමයි.

353 **විනා'ද්ධානං වජ්ජනස්ස–දුක්කටං පරිස්සාවනං**
**යාචමානස්ස අද්ධානෙ–අදෙන්තස්සා'පි දුක්කටං.**

පෙරහන නො මැති ව දීර්ඝ මාර්ගයෙහි යන්නහුට දුකුළා වේ. දීර්ඝමාර්ග යේ දී පෙරහන ඉල්ලන්නහුට නො දෙන්නා හට ද දුකුළා වේ.

311 **අද්ධානං වජ්ජනස්ස**

දීර්ඝ මාර්ගයෙහි යන්නහුට යනු යි. යටත් පිරිසෙන් අඩයොදුනක් දුර ඇති මාර්ගය අද්ධානමාර්ග නම්. "අද්ධයොජනම්පි අද්ධානමග්ගො හොති." (**විනයත්ථමංජුසා 170**)

312 **පරිස්සාවනං**

පෙරහන යි. බුද්ධකාලයෙහි දෙනමක් කොසොල්රට අදන්මගට පිළි පන්නාහු ය. එක් නමක ගේ අනාචාරයක් දුටු අනිත් මහණ තෙමේ එය නො කරණලෙස අවවාද කෙළේ ය. හේ එය නො පිළිගෙන වෛර බැන් දේ ය. මග දී ඒ මහණ හට පිපාසයක් ඇතිවූයෙන් පෙරහන ඉල්ලුවේ ය. පෙරහන නො ලද බැවින් පිපාසායෙන් ම සිට හේ මළේ ය. මෙය නිමිති කොට පෙරහන ඉල්ලූ විට නො දෙන්නාට ත් පෙරහනක් නැති ව දීර්ඝ මාර්ගයේ යන්නාට ත් දුකුළා වන බව දෙශනා කළ සේක. "න භික්ඛවෙ අද්ධානමග්ගපටිපන්නෙන භික්ඛුනා පරිස්සාවනං යාචියමානෙන න ද තබ්බං. යො න දදෙය්‍ය ආපත්ති **දුක්කටස්ස**. න ච භික්ඛවෙ අපරිස්සාවන කෙන අද්ධානමග්ගො පටිපජ්ජිතබ්බො; යො පටිපජ්ජෙය්‍ය ආපත්ති දුක්ක ටස්ස. සචෙ න හොති, පරිස්සාවනං වා ධම්මකරකො වා සඞ්ඝාටිකණ්ණොපි අධිට්ඨාතබ්බො ඉමිනා පරිස්සාවෙත්වා පිවිස්සාමීති." (**චුල්ලවග්ග 211–212**) පෙරහනක් නො මැතිව අදන්මඟ යන්නහු විසින් "සඟළ සිවුරු කොණ වත් පෙරහන වශයෙන් පාවිච්චි කරමි"යි සිතා යායුතු බව මෙයින් කිහ. දිය පෙරීමට **පරිස්සාවන**– වස්ත්‍රයෙන් කළ සාමාන්‍ය පෙරහන, **කටච්ඡුපරිස්සාවන**– කිණිසි පෙරහන (කිණිස්සෙහි රෙදිකඩක් බැඳ සාද ගත් පෙරහන) **දණ්ඩපරිස්සාවන** දඬු පෙරහන (දඬු සතරක රෙද්දක් බැඳ සාදගන්නා පෙරහන යි.) ඔත්ථරක ළිඳ ඇතුළට ඔබා දිය ගන්නා පෙර හන යන පෙරහන් කීපයක් **සුළුවග 211–212 පිටුවල** එයි. ධම්මකර කය නම්– ඛබරුව යි. මුව රෙදිකඩක් බැඳ දියගන්නා කුඩා භාජනයෙකි.

354 ධූලච්චඝං ඡූපෙස අඞග-ජිනවෙජ්ජදනදුක්කටං
ආබාධපච්චයාසැඤුත්‍ර-සෙසඞග අනතයාතනෙ.

තමා නිමිත්ත කැපීමෙහි තුලැසි ඇවැත් අවදනේ ය. ආබාධ කරුණ කින් හැර කන් නාසාදි සෙසු අඞග කැපීමෙහි ද තමා මැරීමෙහි ද දුකුළා වේ.

355 චිත්තපොත්ථා රූපානි-න කරෙ න ච කාරයෙ
න වුට්ඨාපෙය්‍ය භුඤ්ජනත-මාරාමාරඤ්ඤගෙහසු.

සිතියම් රූ පෙතැළි රූ නො කරන්නේ ය. නොම කරවන්නේ ය. විහාරයෙහි ද අරණ්‍යයෙහි ද අනතරසරයෙහි ද වළඳන්නහු නො නැගිටු වන්නේ ය. (මෙහි ප්‍රතික්ෂිප්ත දෑ කිරීමෙන් දුකුළා අවදනේ ය.)

**විස්තර**

55 සිතියම් ඇඳීම පෙතළි රූ කිරීම යන දෙක තමා විසින් නො කළ යුතුවාක් මෙන් ම නො කැරැවිය යුතු බව ත්, වළඳන භික්ෂුව වළඳ අවසන් වන්නට කලින් නො නැගිටු විය යුතු බව ත් මෙයින් ප්‍රකාශිත යි. "න භික්ඛවෙ පටිභානචිත්තං කාතබ්බං, යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්ස" යී වදාළ හෙයින් හුදු ස්ත්‍රී පුරුෂ රූප පමණක් නොව යටත් පිරිසෙන් ගැඩිවිල් රූපයක් වත් තමන් විසින් කරන්නට හෝ අන්‍යයකු ලවා කරවන්නට හෝ නුසුදුසු ය. "ජාතකපකරණඅසදිසදනාදීනි පන පසාදනීයානි නිබ්බිදපටිසංයුත්තානි වා වත්ථූනි පරෙහි කාරාපෙතුං ලභති. මාලාකම්මාදීනි සයමපිකාතුං ලබ්භති." (**පාලිමුත්තක විනය විනිශ්චය 380**) අදහස සුගම යි.

256 යානානි පුමයුත්තානි-සිවිකං හත්ථවට්ටකං
පාටඞ්ගිඤ්ච ගිලානස්ස-කප්පතෙ අභිරූහිතුං.

ගිලනාට ගොන් ඈ පුරුෂයන් යෙදූ හෙවත් පුරුෂයන් උසුලන ගැල් ද සිවිගෙය (දෝලාව) ද අතින් අදින ගැල ද හිදෙළුව (පල්ලැක්කිය) ද නැඟෙන්නට කැප යි.

**විස්තර**

56 මෙයින් ගිලනකු විසින් යා හැකි යාන කිපයක් ප්‍රකාශ කරන ලදී. "සබ්බම්පි යානං උපාහනෙනපි ගන්තුං අසමත්ථස්ස ගිලානස්ස අනුඤ්ඤාතං" (**විමතිවිනොදනී 429**) යී පැවැසෙන හෙයින් නො ගිලන් සෙන කුත් හට යානයෙන් යෑම නුසුදුසු සේ පෙනේ. එහෙත් පා ගමනින් ගොස් සිය කායිකය පිරිමසා ගන්නට සමර්ථ කිසිවකු යානයෙන් නො යනු ඇත. පා ගමනින් යා නො හැකි නිසා ම යානයෙන් යෙත්. එබැවින් වාහන යෙන් යෑම නිවරද ය.

313 **යානානි**

"අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස යානං" (**මහාවග්ගපාළි 226**) යී ගිලනා හට යානය අනුදත් කල්හි ස්ත්‍රීන් (ගැහැණු සතුන්) යෙදූ යාන ද

නැතහොත් පුරුෂයන් (පිරිමි සතුන්) යෙදූ යාන දූයි භික්ෂූන් ඇසූ කල්හි "අනුජානාමි භික්ඛවෙ පුරිසයුත්තං හත්ථවට්ටකං" (**මහාවග්ග 226**) යි අනුදත්හ. මේ යානය (අතින් අදින රිය) "පුරිසයුත්තං ඉත්ථි සාරථි වා හොතු, පුරිස සාරථි වා වට්ටති. හත්ථවට්ටකං පන ඉත්ථියො වා වට්ටෙන්තු පුරිසා වා; වට්ටති යෙව" (**සමන්තපාසාදිකා 807**) පිරිමි සතකු යෙදූ විට සාරථියා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් කවරකු වුව ද වරදක් නැත. හත්ථවට්ට කය ගැහැණු පිරිමි දෙපසින් කවර කෙනකුන් ඇද්ද ත් වරදක් නැත.

357 **බුද්ධං ධම්මඤ්ච සඞ්ඝඤ්ච-ආරබ්භ කරණෙ දවං**
**දුක්කටං පරිසං වා'පි-අඤ්ඤස්ස උපලාළනෙ.**

බුදුන් ද ධර්මය ද සඞ්ඝයා ද අරබයා පරිහාස වචන කීමෙහි ද අනිකක් හු ගේ පිරිස්හි වූ සාමණේරාදි කිසිවකු තමහට උපස්ථාන කරවා ගැනීමට පොළඹූ ගැනීමෙහි ද දුකුළා වේ.

**විස්තර**

57 තෙරුවන් අරබයා "කිම්බුද්ධො? සිලාකබුද්ධො උදහු පටිබුද්ධො" "කිං ධම්මො? අජ ධම්මො ගොධම්මො" කිං සඞ්ඝො? අජසඞ්ඝො ගොසඞ්ඝො" යනාදීන් කොලොප්පම් පිණිස කීණීම සහ වෙන පිරිසක සාමණේරාදි කිසි වකු සිය උපස්ථානයට පොළඹවා ගැනීම ද දුකුළා ඇති කරන බව මෙයින් ප්‍රකාශිත යි.

358 **කායං ඌරුං නිමිත්තං වා-භික්ඛුණීනං න දස්සයෙ**
**විවරිත්වා න සිඤ්චෙය්‍ය-තා කද්දමුදකාදිනා.**

කය හෝ කලවය හෝ නිමිත්ත හෝ මෙහෙණන් හට විවර කොට නො දක්වන්නේ ය. ඒ මෙහෙණන් මඩදිය ආදියෙන් නො ඉස්නේ ය.

359 **අගණ්හන්තො ච ඔවාදං-න පච්චා හරන්තොපි ච**
**බාලං ගිලානං ගමිකං-වජ්ජයිත්වාන දුක්කටං.**

හසුන් නො ගත හෙත බාලයා ද ගිලනා ද ගමිකයා ද හැර මෙහෙ ණන් විසින් අයැජී අවවාද නො ගන්නා හට ද නැවැත අවුත් නො කියන්නා හට ද දුකුළා වේ.

360 **ලොකායතං න වාචෙය්‍ය-පලිතං න ච ගාහයෙ**
**පෙලාය'පි න භුඤ්ජෙය්‍ය-න කීළෙ කඤ්චි කීළනං.**

විතණ්ඩ ශාස්ත්‍රය නො හදාරන්නේ ය. තරකොස් නො උදුරු වන් නෝ ය. දූ කෙළි ඈ කිසි කෙළියකුදු නො කෙළින්නේ ය.

314 **ලොකායතං**

ක්‍රියා කල්ප විකල්පාදි විසින් පෙනෙන "විතණ්ඩ ශාස්ත්‍රය" ලොකායත නමි. මීට නිරර්ථක කාරණ ප්‍රතිසංයුක්ත තීර්ථක ශාස්ත්‍ර සියල්ල ම අන්තර් ගත වේ. වෙසෙසින් ම "ලොකායතං නාම" සබ්බං උච්ඡිට්ඨං, සබ්බං අනුච්ඡිට්ඨං; සෙතො කාකො, කාළො බකො; ඉමිනා ච ඉමිනා ච කාරණෙනා'ති

එවමාදි නිරත්ථක කාරණ සංයුත්තං තිරච්ඡාන සත්ථං" (**සමන්තපාසාදිකා** 897) යි දැක්වෙන හෙයින් මේ මේ කරුණු අනුව සියල්ල ඉඳුල් ය, සියල්ල නො ඉඳුල් ය; කවුඩා සුදු ය, කොකා කලු ය; මේ ආදි නිරර්ථක කාරණ යෙන් යුත් තීර්ථකයන් ගේ ශාස්ත්‍රයට "ලොකායතැ"යි කියන බව පෙනේ.

**315 පලිතං**

පැසුණු කෙස් යනු යි. සවග වහන්දෑ පැසුණු කෙස් උගුළුවන ලදින් "න භික්ඛවෙ පලිතං ගාහාපෙතබ්බං, යො ගාහාපෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (**චුල්ලවග්ග 229**) යි එය තහනම් කළ හ. බැමෙහි හෝ නළලෙහි හෝ උඩු රවුලෙහි හෝ උස් වී කැතට තිබෙන පැසුණු නො පැසුණු කවර ලොමයක් වුවත් ගැන්වීම සුදුසු බව "එත්ථ යං භමුකාය වා නලාටෙ වා දාඨිකාය වා උග්ගන්ත්වා බීභච්ඡං ඨිතං, තාදිසං ලොමං පලිතං වා අපලිතං වා ගාහාපෙතුං වට්ටති." (**සමන්තපාසාදිකා** 895) යන වාක්‍යයෙන් ප්‍රකාශ වේ.

**316 පෙළාය**

තඹයෙන් හෝ ලොහොයෙන් කළ පෙට්ටිය හෝ තැටිය "පෙළා" යන් නට ගැනේ. මෙහි දී තැටිය ගැනීම සුදුසු ය. මේ වචනය වෙනුවට පෙලෙහි එන්නේ "ආසිත්තකූපධානෙ" යන්න යි. "න භික්ඛවෙ ආසිත්තකූපධානෙ භුඤ්ජිතබ්බං, යො භුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (**චුල්ල වග්ග** 217) මේ ගැන **විමතිවිනොදනියේ 461 වන පිටුවේ** එන විස්තරය කියැවීම යෙහෙකි.

**361 පාරුපෙ න නිවාසෙය්‍ය-ගිහිපාරුත නිවාසනං**
**සංවෙල්ලියං නිවාසෙය්‍ය-දුයමලිම්පයෙය්‍ය වා**

ගිහියන් පොරෝනා හඳනා සේ නො පොරවන්නේ ය. නො හඳනේ ය. වල්හි දු ගිනි (නො ලන්නේ ය.) නො ලවන්නේ ය.

**317 ගිහිපාරුතනිවාසනං**

ගිහියන් පොරෝනා සැටි ත් හඳනා සැටි ත් ශ්‍රමණයනට නුසුදුසු ය. ශ්‍රමණයනට සුදුසු වනුයේ පරිමණ්ඩල පාරුපනය යි. එය "උභො කණ්ණෙ සමං කත්වා පාරුපනං පරිමණ්ඩල පාරුපනං නාම, තං පාරුපිතබ්බං. තත්ථ යං කිංචි සෙතපටපාරුතං පරිබ්බාජකපාරුතං එකසාටකපාරුතං සොණ්ඩපාරුතං අන්තෙපුරිකපාරුතං මහාජෙට්ඨකපාරුතං කුටිපවෙසකපාරුතං බ්‍රාහමණපාරුතං පාළිකාරකපාරුතන්ති එවමාදි පරිමණ්ඩල ලක්ඛණතො අඤ්ඤථා පාරුතං සබ්බමෙතං ගිහිපාරුතං නාම" (**සමන්ත පාසාදිකා** 896) යි දැක්වෙන පරිදි දෙකොන් සමකොට පෙරවීම පරිමණ්ඩල පාරුපන නම් වේ. සෙසු සෙතපට පාරුතාදි සියල්ල ගිහි පාරුත නම්.

ගිහි නිවාසන භගයෙන් (**සුළුවග 231**) දැක්වෙන හත්ථි සොණ්ඩකාය (නාභිය මුලින් ඇත් සොඬක් සේ එල්ලෙන ලෙස ඇඳීම) මච්ඡවාලකය (මත්ස්‍ය වලිගයක් සේ දහවලු කොන් හා පාසකොන් එල්වා ඇඳීම) චතු

ඍණණකය (උඩයට සිවුකොන් දක්වා ඇඳීම) තාලවණ්ටකය (තල්වැටක් මෙන් රැලිගස්වා ඇඳීම) සතවල්ලිකය (දික් සළු නොයෙක් වර නමා හැඳීම) යන මේ හැඳීම් ගිහියන් හඳිනා ක්‍රම යි.

318 සංවෙල්ලියං

මීට "කචජං බන්ධිත්වා" යි අටුවා කියා තිබේ. එයින් භගවත්නෝ පිට පටය හෝ කැසපටය යි. මෙසේ හඳින්නට ගිලනාට පවා අවසරයක් නැත. ඒ බව "එවං නිවාසෙන්තුං ගිලානස්සාපි මග්ගපටිපන්නස්සාපි න වට්ටති" යන අටුවා පාඨයෙන් පෙනේ.

319 දායං නාලිම්පෙය්‍ය

වනය ගිනි නො තබන්නේ ය යනු යි. සවග වහන්දෑ වනය ගිනි තැබූහ. ඒ නිමිත්තෙන් "න භික්ඛවෙ දායො ආලිම්පෙතබ්බො, යො ආලිම්පෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (චුල්ලවග්ග 232) යි එය තහනම් කළහ. විහාරය දැවේ නම්, එය වළකාලීමට "පටග්ගිදානය" (ඉදිරිපසින් වනයට ගිනි තැබීම) අනුදත්හ. එවැනි අවස්ථාවක් නො මැති ව වනයට ගිනි තැබිය නො හැකි ය.

362 වඩ්ඪිං පයොජයෙ ගාවෙ–නාඤ්ඤාතිකා පවාරිතෙ
අත්තනො පරිභොගත්ථං–දින්නමඤ්ඤස්ස නො දදෙ
අග්ගං ගහෙත්වා භුත්වා වා–කතිපාහං පුනො දදෙ.

පොළී නො වඩන්නේ ය. නො නෑ නො පැවැරූවන් නො ඉල්ලන්නේ ය. තමා ගේ ම පරිභොගයට දෙන ලද සිවුපසය අනෙක් සහධම්මිකයනට නො දෙන්නේ ය. මුල් කොටස ගෙන හෝ කීප දිනක් පරිභොග කොට හෝ අනතුරු ව දෙන්නේ ය.

320 අත්තනො පරිභොගත්ථං දින්නං

තමා ගේ පරිභොගයට දුන් දෙය යි. එකල සැදැහැත්තෝ භික්ෂූන් හට ආමිෂය දුන්හ. භික්ෂූහු ඒවා භික්ෂුණීන් හට දුන්හ. එය දත් සැදැහැත්තෝ දෙස් කීහ. එවිට තථාගතයන් වහන්සේ "න භික්ඛවෙ අත්තනො පරිභොගත්ථාය දින්නං අඤ්ඤස්ස දාතබ්බං, යො දදෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (සුළුවග 390) යි එය තහනම් කළහ. තමන් එයින් කොටසක් ගෙන හෝ කීප දිනක් පරිභොග කොට හෝ දීම නිවරද ය. අකැප දෙයක් නම් සියල්ල ඉවත් කළ මනා ය. එහ සමන්තපාසාදිකා 953 වන පිටුවෙහි "යං තුම්හෙ එව පරිභුඤ්ජථාති වත්වා දින්නං තං අඤ්ඤස්ස දදතො දුක්කටං. අග්ගං ගහෙත්වා පන දාතුං වට්ටති. සචෙ අසප්පායං සබ්බම්පි අපනෙතුං වට්ටති. චීවරං එකාහං වා ද්වීහං වා පරිභුඤ්ජිත්වා දාතුං වට්ටති" යි දැක් වේ.

363 උද්දිස්ස යාචනෙ රක්ඛං–කත්වා'කත්වාව දණ්ඩනං
ගීවා'ස්ස දණ්ඩිතෙ දණ්ඩො–සයං දණ්ඩාපනෙ පන
දණ්ඩස්ස අග්ගහෙ දෙන්තෙ–ථෙය්‍යා පාරාජිකාදිකා.

(දණ්ඩනං) දඩ ගන්නා බව දැන හෝ නො දැන හෝ එකක්හු උදෙසා ආරක්‍ෂාව අයදීමෙහි දී ඔහු අතින් දඩගත් කල්හි (දණ්ඩො) ගත් දඩය ඔහුට (ගීවා) ණය වෙයි. (භාණ්ඩදෙය්‍ය වෙයි.) ඔහු අතින් මෙතෙක් දඩ ගනුවයි තමා ම දඩ ගැන්වීමෙහි දී ගන්නා ලද දඩයෙහි වටිනාකම අනුව පරිජි ආදි ඇවැත් වෙත්.

364 හරන්තෙසු පරික්ඛාරං–චොරො චොරො'ති භාසිතෙ
අනත්ථා'යස්ස ගණ්හන්ත–දණ්ඩං ගීවා'ස්ස තත්තකං.

පිරිකර පැහැර ගෙන යන කල්හි ඒ සොරුට අවැඩ පිණිස සොරෙක සොරෙකැ යි කී කල්හි ඒ අසා සොරුගෙන් දඩ ගත් විට එපමණ ම ඔහුට ණය වේ. (භාණ්ඩදෙය්‍ය වේ.)

**විස්තර**

58 යම් කෙනකුන් ගෙන් පැමිණෙන උවදුරින් බේරී විසීමට සිතන මහණකු විසින් රැකවරණ බලාපොරොත්තුවෙන් ඔහුට දඩ ගසන නො ගසන බවක් ගැන නො සිතා පැමිණිලි කළ විට දඩ ගසා නම් එපමණ ම ඒ භික්‍ෂුව විසින් ඔහුට ගෙවිය යුතු ය. "මොහුගෙන් මෙතෙක් දඩ ගනුව"යි කියා ඒ දඩය ගත් විට ගත් දඩයෙහි වටිනා කම අනුව දුක්කට ථුල්ලච්චය පාරාජිකා යන ආපත්ති අතුරෙන් කිසිවකට පැමිණේ.

බඩු ගෙන යනු දැක සොරා කෙරෙහි අනර්ථ පමුණුවන අදහසින් සොරාය යි කී කල්හි ඒ වචනය අනුව සොරුට දඩ ගසා නම්, ඒ මහණ විසින් එපමණ ම සොරුහට භාණ්ඩදෙය්‍ය ය.

තමනට යම්කිසි රැක වරණක් බලාපොරොත්තුවෙන් තම් ගම් තියෝ නො කොට පැමිණෙන උවදුරු වළකා ලන්නට කිම තිදෙසි." කෙනා වුතෙන පන අසුකෙනාති වත්තුං අම්හාකං න වට්ටති. තුමෙහ යෙව ජාන ස්සථ. කෙවලං හි මයං රක්ඛං යාචාම. තං නො දෙථ. අවහට භණ්ඩඤ්ච ආහරාපෙථාති වත්තබ්බං" යනු ඒ පිණිස අටුවා සි.

365 විස්සාසු'ච්චාර සඞ්ඛාර–මුත්තානං ඡඩ්ඩෙය්‍ය දුක්කටං
බහි පාකාර කුඩ්ඩානං–වළඤ්ජෙ නාවලොකිය
හරිතෙ වා'පි වීහාදි–නාළිකෙරාදි රොපිමෙ.

(විස්සාස) උක්සප ඇ ඉඳුල් ද, අහර මළ ද, කසළ ද, මූත්‍ර ද යන මේ පවුරු හා භිත්තීන් ගේ පිටතට නො බලා දමා ද, (වළඤ්ජ) මිනිසුන් ගැවැසෙන තන්හි ද, වී හැල් ආදිය හෝ පොල් පුවක් ආදිය රොපනය කළ තිල්වන් කෙත් වත් අරම් ආදියෙහි හෝ දමා නම් දුකුළා වේ.

366 යොජෙතුං පයොජෙතුං-පසුතතානි ච පස්සිතුං
න ලබ්භං ධම්මයුත්තම්පි-නච්චං ගිතං ච වාදිතං
උපහාරං කරොමා'ති-වුත්තෙන වා සම්පටිච්ඡිතුං.

ධර්මයෙන් යුක්ත වූ නැටුම් හෝ ගී හෝ වැයුම් හෝ යොදවන්නට ත් යොදන්නට ත් අනුන් විසින් යෙදූ නැටුම් ඈ බලන්නට ත් පූජා කරම්හයි කී කල්හි මැනැවැ යි පිළිගන්නට ත් නො වටී. (බුදුහු පුදයට නිස්සහ කියා හෝ පූජා කටයුත්තේ ය කියා හෝ කිම වටී.)

321 ධම්මයුත්තම්පි නච්චං ගිතම්පි වාදිතං

මෙහි "ධම්මයුත්ත" නම් "අරියානං පරිනිබ්බානකාලෙ රතනත්තය ගුණූපසංහිතං සාධුකීළිත ගීතං වා, අසඤ්ඤත භික්ඛූනං ධම්මභාණකගීතං වා" යි ප්‍රකාශිත හෙයින් ආර්‍යයන් පිරිනිවෙන කල්හි රත්නත්‍රය ගුණාශ්‍රිත ව බැඳි ක්‍රීඩාගීත හෝ අසංවර භික්ෂූන් ගේ ධර්මභාණක ගී හෝ ධර්මයෙන් ද යුතු කොට ඇති හෙයින් ධම්මයුක්ත නම්. මෙහි ගී පමණක් දක්වුව ද වෙස්සන්තර නාට්‍යාදී නැටුම් සහ දහම් පද ගැප් කොට වයන වැයුමුත් මීට ම ඇතුළත් ය. මෙබඳු ධර්මයුක්ත නැටුම් ආදිය ත් යෙදීම් යෙදවීම් බැලීම් නුසුදුසු වේ.

පෙර ඡබ්බග්ගිය භික්ෂුහු රජගහනුවර ගිරග්ග සමජ්ජ නම් නෘත්‍යය දක්නට ගියහ. එවිට තථාගතයන් වහන්සේ "න භික්ඛවෙ නච්චං වා ගීතං වා වාදිතං වා දස්සනාය ගන්තබ්බං, යො ගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (චුල්ලවග්ග 200) යි නැටුම් ගැයුම් වැයුම් දක්නට යැම තහනම් කළ සේක. එහි නැටුම් අතර මොනර නැටුමක් දක්නට යන්නහුට ද දුකුළා වේ. "සබ්බං අන්තරාරාමෙ ඨිතස්ස පස්සතො අනාපත්ති, පස්සිස්සාමීති විහාරතො විහාරං ගච්ඡන්තස්ස ආපත්තියෙව, ආසනසාලාය නිසින්නො පස්සති අනාපත්ති. පස්සිස්සාමීති වුට්ඨහිත්වා ගච්ඡතො ආපත්ති. වීථියං ඨත්වා ගීවං පරිවත්තෙත්වා පස්සතොපි ආපත්තියෙව" (සමන්තපාසාදිකා 889)

ඡබ්බග්ගියයෝ ආයතක ගීතස්වරයෙන් (ඉතා දික් වූ ගීතස්වරයෙන්) ධර්මය ගායනය කළහ. එය නිමිති කොට "පංචිමෙ භික්ඛවෙ ආදීනවා ආයතකෙන ගීතස්සරෙන ධම්මං ගායන්තස්ස: අත්තනාපි තස්මිං සරෙ සාරජ්ජති, පරෙපි තස්මිං සරෙ සාරජ්ජන්ති, ගහපතිකාපි උජ්ඣායන්ති, සරකුත්තිම්පි නිකාමයමානස්ස සමාධිස්ස භඞ්ගො හොති, පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති. ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච ආදීනවා ආයතකෙන ගීතස්සරෙන ධම්මං ගායන්තස්ස. න භික්ඛවෙ ආයතකෙන ගීතස්සරෙන ධම්මො ගායිතබ්බො යො ගායෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (චූළවග්ග 201) මහණෙනි ඉතා දික් වූ ගීතස්වරයෙන් ධර්මය ගායනා කරන්නහුට මේ ආදීනව පසෙක් වේ. තෙමේ ද ඒ ස්වරයෙහි ඇලේ, අන්හු ද ඇලෙත්, ගැහැවියෝ ද එය ලාමක කොට සිතත්. හොඳින් ශබ්ද කිරීම කැමැති වන්නහු ගේ සමාධිය ද කැඩෙ යි. බාලපරම්පරාව දිට්ඨානුගතියට පැමිණෙයි. ඉතා

දික් වූ ගීත ස්වරයෙන් ගායනය කරන්නහුට මේ වැරැදි පස වේ. මහණෙනි, ඉතා දික් වූ ගීත ස්වරයෙන් ධර්මය ගායනා නො කට යුතු යි. යමෙක් ගායනය කෙරේ නම් දුකුලා වේ. යී වදාළ සේක.

භික්ෂූහු සරභඤ්ඤයෙහි ද (ස්වරයෙන් ශබ්ද නගා ධර්මය කීමෙහි ද) කුකුස් ඇති කළහ. "අනුජානාමි භික්ඛවෙ සරභඤ්ඤං" (චුළුවග්ග 201) යී සරභඤ්ඤය අනුදත් සේක. "සරභඤ්ඤෙ කිර තරඞ්ගවත්ත තරඞ්ගභෙද වත්ත ගලිතවත්තාදීනි ද්වත්තිංස වත්තානි අත්ථි, තෙසු යං ඉච්ඡති, තං කාතුං ලභති; සබ්බෙසං පදව්‍යඤ්ජනං අවිනාසෙත්වා විකාරං අකත්වා සමණසාරුප්පෙන චතුරස්සෙන නයෙන පවත්තනං යෙව ලක්ඛණං" (සමන්තපාසාදිකා 889– පාළිමුත්තක විනය 392) යී කියෙන් සරභඤ්ඤයෙහි දෙතිස් වත් ඇත්තේ නමුත් අකුරු නො නසා මහණ සරුප් පරිදි කිය යුතු බව මෙයින් ප්‍රකාශිත යි. සරභඤ්ඤය නම්: ස්වරයෙන් මිහිරි කොට කීමය යි ඇතැම් කෙනකුන් කියත ත් "සරභඤ්ඤනති සරෙන භණනං" යන අටුවා තේරුමෙන් එවැනි අර්ථයක් ගත නො හැකි ය.

367 **රාජාගාරං පොක්ඛරණිං–උය්‍යානං චිත්තාගාරකං**
**කීළත්ථං ගච්ඡතො දට්ඨුං–ආරාමං දුක්කටං කතං.**

රජ දරුවන් ගේ ක්‍රීඩා පිණිස කරන ලද රජ ගෙය ද පොකුණ ද උයන් ද චිත්‍රශාලා ද රජගේ අභියෙසැ කළ අරම් ද බලන්නට යන්නාහට පියවරක් පාසා දුකුලා වේ.

**විස්තර**

59 මේ රාජාගාරාදිය ආරාමය තුළ කරවා තිබේ නම් ඒවා දුටු විට ත් මග තිබෙන දේ අහම්බෙන් (බලාපොරොත්තු නැතිව) දුටුවිට ත් අනාපත්ති යි. එය සමන්තපාසාදිකාවෙහි 698 වන පිටුවෙහි විස්තර වන්නේ මෙසේ ය. "එත්ථ පන සචෙ එකසම්ංයෙව ඨානෙ ඨිතා පදං අනුද්ධරමානා පස්සුවාපි පස්සති, එකමෙව පාචිත්තියං. තං තං දිසාභාගං ඔලොකෙත්වා පස්සන්තියා පන පාටෙක්කා ආපත්තියො. භික්ඛුස්ස පන සබ්බත්ථ දුක්කටං. අජ්ඣාරාමෙ රාජාගාරාදීනි කරොන්ති, තානි පස්සන්තියා අනාපත්ති. පිණ්ඩපාතාදීනං අත්ථාය ගච්ඡන්තියා මග්ගෙ හොති, තානි පස්සන්තියා අනාපත්ති" කියා යි. මෙය භික්ෂුණී විභඞ්ගයෙහි ප්‍රකාශවන පාඨයක් වුවත් මෙතැනට සුදුසු ය.

368 **නාවෙ න පටිබාහෙය්‍ය–සඞ්ඝෙනු'ඤ්ඤො න චීවරං**
**නික්ඛිපෙය්‍ය ඛමාපෙය්‍ය–ගරූනා ච පණාමිතො.**

සඟ (බාල) මහණුන් ආසනයෙන් නො වළකන්නේ ය. අව්වෙහි සිවුරු නො දවන්නේ ය. ආචාර්ය උපාධ්‍යායන් විසින් බැහැර කරන ලද්දේ කමා කරවන්නේ ය.

322 **පණාමිතො**

ආචාර්ය උපාධ්‍යායයන් විසින් "මෙහි නො එව" යි බැහැර කරන ලද අතැවැසියා හෝ සද්ධිවිහාරිකයා මෙයට ගැනේ. අඞ්ග පසෙකින් යුත් සඞ්

විහාරිකයා බැහැර කළයුතු බව **මහාවග්ගපාළි 53** පිටුවේ "පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො සද්ධිවිහාරිකො පණාමෙතබ්බො: උපජ්ඣායම්හි නාධිමත්තං පෙමං හොති, නාධිමත්තො පසාදො හොති, නාධිමත්තා හිරි හොති, නාධිමත්තො ගාරවො හොති, නාධිමත්තා භාවනා හොති." යනුවෙන් දක්වා තිබේ. මෙබඳු ගති තිබෙන සද්ධිවිහාරිකයා බැහැර කිරීම ගුරුවරයාසතු යුතුකම යි. ඉන්පසු සද්ධිවිහාරිකයා විසින් ගුරුවරයා කමා කරවාගත යුත්තේ ය. එසේ නො කළවිට දුකුළා වේ. ඉදින් ගුරුවරයා කමා නො වූයේ නම් ගුරුවරයාට ද දුකුළා වේ.

369 **අක්කොසනෙ පරම්මුඛා-ආපත්තීහි ච සත්තහි**
**භික්ඛුමුපාසකං වා'පි-අක්කොසන්තෙව ච දුක්කටං.**

සප්තාපත්ති ස්කන්ධයෙන් භික්ෂුවට ත්, අශ්‍රද්ධ ය අප්‍රසන්න ය යනාදීන් උපාසකයාට ත් නො හමුවෙහි ආක්‍රොෂ කිරීමෙහි දුකුළා වේ. (හමුවෙහි ආක්‍රොෂ කිරීමෙන් පචිති වේ ය යි ටීකාවේ කිය යි.)

323 **සත්තහි ආපත්තීහි**

සප්ත ආපත්ති ස්කන්ධයෙන් යනු යි. "කතමෙ සත්ත ආපත්තික්ඛන්ධා? පාරාජිකාපත්තික්ඛන්ධො සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධො, ථුල්ලච්චයාපත්තික්ඛන්ධො, පාචිත්තියාපත්තික්ඛන්ධො, පාටිදෙසනියාපත්තික්ඛන්ධො, දුක්කටාපත්තික්ඛන්ධො, දුබ්භාසිතාපත්තික්ඛන්ධො, ඉමෙ සත්ත ආපත්තික්ඛන්ධා" (**පරිවාරපාළි 135**)

370 **න ලබ්භං විනිපාතෙතුං-සද්ධාදෙය්‍යඤ්ච චීවරං**
**ලබ්භං පිතූනං සෙසානං-ඤාතීනම්පි න ලබ්භති.**

සැදැහැයෙන් දුන් සිවුරු ද, (ච ශබ්දයෙන් පිණ්ඩපාතාදිය ද ගැනේ) පස්සහදැමියන් හා මවුපියන් ද හැර සෙස්සවුනට දෙන්නට නො වටී. සෙසු නෑයන් හට ද දෙන්නට නො වටී.

371 **වස්සං වුත්ථො'ඤ්ඤතො'ඤ්ඤත්ථ-භාගං ගණ්හෙය්‍ය දුක්කටං**
**පටිදෙය්‍ය නට්ඨෙ ජිණ්ණෙ-ගීවා නාදෙය්‍ය චොදිතො**
**ධුරනික්ඛෙපතො තෙසං-හොති භණ්ඩග්ඝකාරියො.**

අතික් වෙහෙරක වස්වුසූයේ අතික් වෙහෙරකින් වස්සාවාසික චීවර කොටසක් ගනී නම් දුකුළා වේ. නැවත ගත්තැනට දෙන්නේ ය. නැසුණු කල්හි ද දිරාගිය කල්හි ද ණය වේ. හිමියන් විසින් ඉල්වන ලද්දේ නො දේ නම් ඒ වෙහෙර සිවුරු ලැබිය යුතු මහණුන් ගේ ධුර නික්ෂෙපයෙන් පසු බඩුවෙහි අගය පරිද්දෙන් කටයුතු වේ. (මෙය උපනන්ද ශාක්‍යපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අරභයා චීවරක්ඛන්ධයෙහි (336) පැණවූවකි.)

372 **න සන්තරුත්තරෙ ගාමං-ඛලෙලා වා සවුපාහනො**
**පවිසෙය්‍ය න ධාරෙය්‍ය-චාමරීමකසවීජනී.**

සහළ සිවුර නො මැති ව අන්තරවාසකය සහ උත්තරාසඞ්ගය පමණක් හැඳ ගත්තේ ද. නො ගිලන් වැ පා වහන් සහිත වූයේ ද ගම් නො වදින්නේ ය. සෙමර වලිගයෙන් කළ මකස වීජනිය නො දරන්නේ ය.

324 න සන්තරුත්තරෙන ගාමං (පවිසෙය්‍ය)

අඳනය සහ තනිපොට සිවුර පමණක් ඇඳ පෙරෙ වැ ගම් නො වැදිය යුතුය යි මේ හි සැටි යි. බුඩකාලයෙහි විසූ භික්ෂුවක් අන්ධවනයේ සඟළ සිවුර තබා අඳනය ත් තනිපොට සිවුර ත් පමණක් හැඳ පෙරෙ වැ ගම් වන් කල්හි සොරු ඒ සිවුර පැහැර ගත්හ. එය නිමිති කොට "න භික්ඛවෙ සන්තරුත්තරෙන ගාමො පවිසිතබ්බො, යො පවිසෙය්‍ය, ආපත්ති දුක්කටස්ස." (මහාවග්ගපාළි 334) යි තහනම් කළහ. ඉන්පසු අනඳ මාහිමියන් මුළා වූ සිහි ඇති වැ සඟල සිවුරෙන් වෙන් වැ ගම් වන් හෙයින් එය නිමිති කොට "පංචිමෙ භික්ඛවෙ පච්චයා සඞ්ඝාටියා නික්ඛෙපාය, ගිලානො වා හොති, වස්සිකසඞ්කෙතං වා හොති, නදීපාරගතං වා හොති, අග්ගලගුත්ති විහාරො වා හොති, අත්ථතකඨිනං වා හොති, ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච පච්චයා සඞ්ඝාටියා නික්ඛෙපාය" (මහාවග්ග 334) යි සඞ්ඝාටිය තබා යා හැකි කරුණු පසක් ප්‍රකාශිත යි. මේ පසෙන් අග්ගලගුත්ති භාවය-අගුළු දමා යා හැකි බව ම ප්‍රමාණ යි. අගුළු නො දැමූ හෙයින් යම්තැනක නො රැකේ නම් එහි තබා යා නො හැකිය. ආරණ්‍යවාසීන් විසින් සිය වෙහෙර ආරක්ෂා රහිත නම් බඩු බහා තබන සැළියෙහි බහා ගල්-රුක් බෙණ- ගුහා අතුරෙන් යම්කිසිවක හොඳින් වසා තබා යා යුතු බව "ආරඤ්ඤකස්ස පන විහාරො න සුගුත්තො හොති. තෙන භණ්ඩුක්ඛලිකාය පක්ඛිපිත්වා පාසාණ සුසිර රුක්ඛසුසිරාදිසු සුප්පටිච්ඡන්නෙසු ඨපෙත්වා ගන්තබ්බං" (විනයට්ඨ කථා 837) යි ප්‍රකාශ කොට තිබේ.

325 ඛග්ගො වා සඋපාහනො

නො ගිලන් වැ පා වහන් සහිත වැ ගම් වැදීම යි. පා පහන් පාවිච්චි නො කිරීමෙන් යම් රෝගයක් හටගන්නට ඉඩ තිබේ නම්, එවිට පා වහන් සහිත වැ ගම් වැදීම නිවැරදි බව පෙනේ. යටැ ජන්ත යන්නට ලියැවෙන ටිප්පණිය බලනු.

326 චාමරීමකසවීජනි

වීජනී යනු පවන් අත්ත ය. මදුරුවන් එළවාලීම පිණිස කළ හෙයින් මකස වීජනී නම් වූ බව සිතිය හැකි ය. සෙමරින් කළ මකස වීජනිය චාමරීමකස වීජනී නම් වේ. එය අකැප ය, සාමාන්‍ය මකසවීජනිය කැප ය. දිනක් විසාඛාව විධූපනය ත් (වීජනිය) තාලවණ්ටය ත් (තල් අත්ත) දෙක ගෙනත් තථාගතයන් වහන්සේට පිදූහ. ඉන්පසු "අනුජානාමි භික්ඛවෙ විධූපනඤ්ච තාලවණ්ටඤ්ච" (චූළවග්ග 223) යි එය භික්ෂූන්හට අනුදත් සේක. චාමරීමකස වීජනිය ප්‍රතික්ෂෙප කරමින් "න භික්ඛවෙ චමරි වීජනී ධාරෙතබ්බා, යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ තිස්සො වීජනියො වාකමයං උසීරමයං මොරපිංඡමයං" (චූල්ල වග්ග 224) යි වැහැරිමය සුවඳහොටමය- මොනර පියාපත්මය වීජනී තුන අනුදත්හ.

. භික්ෂූන් විජනියක් (තල් අත්තක්) පාවිච්චි කරන්නේ පිරිස් මැද දම් දෙසන කල්හි හස්තකුක්කුච්චය (හස්තවිකාර) නැතිකිරීමට ත් මුඛවිකාර වසා ගැනීමට ත් ධර්මතා වශයෙන් පුරුදු කරගෙන ආ හයිනි. ඒ නිසා ම අභ්‍යන්තයෙන් සංයත වූ බුදුවරයෝ ද බුදු සව්වෝ ද විජනිය ගතිත්. එය "එතං විජනිං ගහණං පරිසාය ධම්මකථිකානං හත්ථකුක්කුච්චවිනොදන මුඛවිකාරපටිච්ඡාදනත්ථං ධම්මතා වසෙන ආචිණ්ණන්ති වෙදිතබ්බං. තෙනෙව හි අච්චන්ත සඤ්ඤතප්පත්තා බුද්ධාපි බුද්ධසාවකාපි ධම්මකථිකානං ධම්මතා දස්සනත්ථමෙව චිත්තවිජනිං ගණ්හන්ති" (**විමතිවිනොදනී 14**) සී දක්වා තිබේ.

**373 අගිලානො න ඡින්දෙය්‍ය-කෙසෙ කත්තරියා බහි**
**ආරාමතො න ධාරෙය්‍ය-ඡත්තං ලබ්භති ගුත්තියා.**

නො ගිලන්වූයේ කතුරෙන් කෙස් නො කපන්නේ ය. ආරාමයෙන් පිටත කුඩය නො දරන්නේ ය. චීවරාරක්ෂාවට ත් ආත්මාරක්ෂාවට ත් ඡත්‍ර ධාරණය වටී.

**විස්තර**

60 නො ගිලන් වැ, කතුරෙන් කෙස් කපන්නට ත් ආරාමයෙන් බැහැර කුඩ ඉසලෑම ත් නො කටයුතු බව පවසා යම් හෙයකින් චීවරාරක්ෂාව සහ ආත්මාරක්ෂාව ඡත්‍ර ධාරණයෙන් වෙත් ව සලසා ගත නො හේ නම්, ආරාමයෙන් බැහැර ද ඡත්‍ර ධාරණය නිදෙස් බව මේ ගාථායෙන් හෙළි කොට තිබේ.

**327 අගිලානො කෙසෙ කත්තරියා න ඡින්දෙය්‍ය**

නො ගිලන් ව කතුරෙන් කෙස් නො කැපිය යුතු ය, යනු යි. සවග වහන්දෑ කතුරෙන් කෙස් කැප්පවූහ. එය දත් තථාගතයන් වහන්සේ "න භික්ඛවෙ කත්තරිකාය කෙසා ඡෙදාපෙතබ්බා, යො ඡෙදාපෙය්‍ය, ආපත්ති දුක්කටස්ස" (**චුල්ලවග්ග 228**) සී තහනම් කළහ. ඉන්පසු හිසෙහි වණයක් හටගත් භික්ෂුවක් අරබයා "අනුජානාමි භික්ඛවෙ කත්තරිකාය කෙසෙ ඡෙදාපෙතුං" සී ගිලන් වූ කල්හි කතුරෙන් කෙස් කපන්නට අනුදත් සේක.

**328 ආරාමතො බහි ඡත්තං න ධාරෙය්‍ය ගුත්තියා ලබ්භති**

ආරාමයෙන් පිටත කුඩය නො දරන්නේ ය. එහෙත් ආත්මාරක්ෂාව සඳහා ත් චීවරාරක්ෂාව සඳහා ත් ආරාමයෙන් පිට ද ඡත්‍ර ධාරණය කට හැකි ය. යනු මෙහි සාමාන්‍ය අදහස යි. බුඩ කාලයේ දී සංඝයාට කුඩයක් ලැබුණු විට "අනුජානාමි භික්ඛවෙ ඡත්තං" (**චුල්ලවග්ග** 224) සී ඡත්‍රය අනුදත්හ. පසුව සවග වහන්දෑ කුඩ ඉසලාගෙන එනු දැක එක් උපාසකයකු විසින් දෙස් කියන ලදින් "න භික්ඛවෙ ඡත්තං ධාරෙතබ්බං, යො ධාරෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (**සුළුවග** 224) සී ඡත්‍ර ධාරණය සහමුලින් ම තහනම් කළ සේක. ඉන්පසු ඡත්‍රය නො දැරීමෙන් අපහසු වූ ගිලන් භික්ෂුවක් නිසා "අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස ඡත්තං" (**සුළුවග** 224) සී ගිලනාට

ඡත්‍රය අනුදත්හ. ඉන්පසු නො ගිලන් භික්‍ෂූහු ඡත්‍රය ගිලනාහට ම අනුදත්හ යි කියමින් ආරාමයේ ත් ආරාමූපචාරයේ ත් ඡත්‍ර ධාරණයට කුකුස් ඇති කළහ. එවිට "අනුජානාමි භික්ඛවෙ අගිලානෙනපි ආරාමෙ ආරාමූපචාරෙ ඡත්තං ධාරෙතුං" (චුල්ලවග්ග 224) යී නො ගිලනාහට ආරාමයේ ත් ආරාම උපචාරයේ ත් ඡත්‍ර ධාරණය අනුදත්හ. මේ ගැන "ගිලානස්ස ඡත්තන්ති එත්ථ යස්ස කායඩාහො වා පිත්තකොපො වා හොති, චක්ඛු වා දුබ්බලං, අඤ්ඤො වා කොචි ආබාධො විනා ඡත්තෙන උප්පජ්ජති, තස්ස ගාමෙ වා අරඤ්ඤෙ වා ඡත්තං වට්ටති. වස්සෙ පන චීවරගුත්තත්ථං වාළමිගචොරභයෙසු ච අත්තගුත්තත්ථම්පි වට්ටති. එකපණ්ණච්ඡත්තං පන සබ්බත්ථ වට්ටති." (සමන්තපාසාදිකා 894) යමකු ගේ කායදාහයක් හෝ පිත්කෝපයක් හෝ ඇස් දුබලකමක් හෝ වෙන යම්කිසි ආබාධයක් හෝ වේ ද, ඒවා ඡත්‍ර පාවිච්චිය නොමැති විට හටගනී ද, ඔහුට ගම්හි හෝ වනයෙහි හෝ ඡත්‍රය සුදුසු ය. වර්‍ෂා කාලයෙහි සිවුරු රැකීම පිණිස ත් ව්‍යාලසතුන් ගෙන් හා සොරුන් ගෙන් බිය ඇති කල්හි ත් ආත්මාරක්‍ෂාව සඳහා ත් ඡත්‍රය වටී. තල්පත් ආදි එකපණ්ණච්ඡත්‍රය හැම තැන ම වටී, යනු යි. මේ අටුවා පාඨයේ පරිදි කුඩ පාවිච්චි නො කිරීම නිසා කවර ආබාධයක් හෝ වැළැඳෙන්නට ඉඩ තිබේ නම්, එයම කරුණු කොට ගෙන හැමතන්හි ම කුඩ පාවිච්චිය විනය විරොධ නො වේ. මෙකලැ වහන් පයැලෑ ම ගැන ත් මේ නීති ය ම ගත් විට වහන් පයැ ලා ගම්වැදී ම විනය විරොධ නො වන්නේ ය. මෙකලැ මග තොට ගැන සිතනොත් වහන් පයැ නො ලෑම නොයෙක් රොග ඇතිවීමට පමණක් නො වැ එය ම ජීවිත විනාශය ට ත් හේතු විය හැකි ය.

**374 වාහෙය්‍ය නුභතො කාජං-එකන්තරිකකාජකං**
**සීසක්ඛන්ධකටිභාරො-හත්ථොලම්බො ච ලබ්භති.**

දෙ කෙළවර බැඳ එල් වූ බර ඇති කද නො උසුලන්නේ ය. එක් කෙළවරක බැඳ එල් වූ බර ඇති කද හා දෙදෙනා උසුලන අතුරු කද ත් හිසින් හා දසරුවෙන් ද උකුළෙන් ද ගන්නා බර ත් අතින් එල්වා ගන්නා බර ත් වටී.

**329 උභතො කාජං** -

දෙ පසින් බඩු එල්ලූ කද යි. සවග වහන්දෑ දෙපසැ බඩු එල්ලූ කද ගෙන ගියහ. එය දුටු මහජනයා දෙස් කීයෙන් "න භික්ඛවෙ උභතො කාජං හරිතබ්බං යො හරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ එකතො කාජං අන්තරා කාජං සීසභාරං ඛන්ධභාරං කටිභාරං ඔලම්බකන්ති". මහණෙනි දෙපැත්තෙහි කද ගෙන නො යා යුතු යි. යමෙක් ගෙන යේ නම් ඔහුට දුකුළා වේ. මහණෙනි එක් පැත්තෙහි කද– ඇතුළත කද– හිසෙන් ගෙන යන බර– කඳෙන් (දසරුවෙන්) ගෙන යන බර– කටියෙන් (උකුළෙන්) ගෙන යන බර– එල්ලා ගෙන යන බර– යන මේවා අනුදනිමි යි වදාළසේක.

375 ආපත්තියා අනොකාස-කතං චොදයතො දුක්කටං
සුඛස්ස ච අවකාසම්හි-තථා ඔකාස කාරණෙ.

චොදනාවට අවකාශ නො කළ භික්ෂුවට ඇවැතින් චොදනා කෙරේ නම් දුකුළා වේ. නිදෙස් වූවහුට චොදනා කරන්නට අවකාශ කැරැ වීමෙ හි ද එසේ ම දුකුළා වේ.

**විස්තර**

61 යම් භික්ෂු කෙනකුන් හට ඇවැතකින් චොදනාවක් කළ යුතු වේ නම්, පළමුකොට ඒ භික්ෂුවට "ඇවැත්නි, මෙබඳු චොදනාවක් කරන්නට තිබේ ය"යි කියා අවකාශ ලබා නො ගෙන චොදනා කරන්නා හට ත්, නිදෙස් කෙනකුන්හට "ඇවැත ඉඩදෙව මම ඔබට මේ චොදනාව කරනු කැමැත්තෙමි" යි චෝදනා කිරීමට ඉඩ ලබා ගැනීම ත් යන දෙක ම දුකුළා සිදුවන බව මෙයින් ප්‍රකාශිත යි. මේ ගැන විස්තර කැමැත්තන් විසින් **පාලිමුත්තක විනය විනිශ්චයයේ** 411– 412 පිටු කියැවීම යෙහෙකි.

376 අට්ඨංගුලා'ධිකං මඤ්ච-පටිපාදං න ධාරයෙ
පක්කංගුලෙන සත්ථානං-මඤ්චං වා උච්චපාදකං.

මිනිසුන් ගේ පියවි අඟලෙන් අටඟලට වැඩි ඇඳ පා අළු ද වඩුරියනින් උස් පා ඇති ඇඳ ද නො දරන්නේ ය.

330 මඤ්චපටිපාදකා

ඇඳෙහි පා තබන අවයවයෝ යි. සවග වහන්දෑ උස් ඇඳන්හි සයනය කළෙන් එය තහනම් කළ විට එක් භික්ෂුවක් පහත් ඇඳෙක්හි සැතැපී සිටියේ ය. හේ නාගයකු විසින් දෂ්ට කරන ලදි. එවිට තථාගතයන් වහන් සේ "අනුජානාමි භික්ඛවෙ මඤ්ච පටිපාදක නති" (**චුල්ලවග්ගපාලි** 245) යි මඤ්චපටිපාදකයන් අනුදත්හ.

377 මූගබ්බතාදිං ගණ්හය්‍ය-දුක්කටං තිත්ථි යබ්බතං
බුරභණ්ඩං පරිහරෙ-තථා නහාපිත පුබ්බකො.

මූග ව්‍රතාදි තීර්ථකයන් ගේ ව්‍රත ගනී නම් දුකුළා වේ. කරණවැමියකු වැ සිට මහණ වූ තැනැත්තේ කරණවැමි භාණ්ඩ පරිහරණය කෙරේ නම් එසේ ම දුකුළා වේ.

331 මූගබ්බතාදිං

මූග ව්‍රතාදිය යි. මූග යනු ගොළුවාට නම්. "ගොළුවකු මෙන් කතා නො කොට සිටිමැ" යි විසීම මූග ව්‍රතය යි. කොසොල් රටැ එක් ආවාස යෙක්හි වස් වසා මූග ව්‍රතයෙන් කල් යැවූ භික්ෂූන් සමූහයක් අරබයා "න භික්ඛවෙ මූගබ්බතං තිත්ථියසමාදානං සමාදියිතබ්බං,, යො සමාදියෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (**මහවග 179**) යි මූග ව්‍රතය තහනම් කළහ. ආදි **ශබ්දයෙන්** අජව්‍රත ගොව්‍රත කුක්කුර ව්‍රතාදි සෙසු තීර්ථය ව්‍රත ගැනේ.

**332 නහාපිත පුබ්බකො ඛුරභණ්ඩං (න) පරිහරෙ**

පෙර කරණවෑමියකු ව සිටි කෙනකුන් විසින් කරණවෑමි භාණ්ඩ පාවිච්චි නො කළ යුතු බව මෙයින් ප්‍රකාශිත යි. පෙර ආතුමායෙහි විසූ වෘද්ධ ප්‍රව්‍රජිත කරණවෑමි මහණෙක් භික්ෂූන් සමග තථාගතයන් වහන්සේ ආතුමාවට සැපත් වූ විට කැඳ දනයක් දෙන්නෙමු යි සිය පුත් හෙරණුන් දෙදෙනාට කරණවෑමි බඩු ත් රැගෙන ගෙන් ගෙට ගොස් කැඳට උප කරණ සපයා ගෙනෙන්නට කියා පිටත් කොට උපකරණ සපයා ගෙන බුදුන් ප්‍රමුඛ සංඝයාට කැඳ සූදනම් කොට පිදූ කල්හි තථාගතයන් වහන් සේ ඒ මහණුන් විචාරා දැන "න භික්ඛවෙ පබ්බජිතෙන අකප්පියෙ සමාදපෙ තබ්බං, යො සමාදපෙය්‍ය ආපත්ති දුක්කටස්ස. න ච භික්ඛවෙ නහාපිත පුබ්බෙන ඛුරභණ්ඩං පරිහරිතබ්බං. යො පරිහරෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (**මහාවග්ගපාළි 284**) යි කරණවෑමි කුලයෙන් පැවිදි වූවනට කරණවෑමි බඩු පාවිච්චිය තහනම් කළසේක. කරණවෑමි මහණුන් විසින් අනුන් අයත් දැළිපිහියා ආදියෙන් කෙස් කප්පවා ගතයුතු බව "අඤ්ඤස්ස සන්තකෙන පන කෙසෙ ඡෙදෙතුං වට්ටති" යන අටුවා පාඨයෙන් පැහැදිලි කරයි.

**378 යං කිඤ්චි යාචිතුං හත්ථ-කම්මං තදනුසාරතො**
**ලද්ධං ගහෙතුං නික්කම්ම-මයාචිත්වාපි කප්පති**
**ඛාරෙතු මාහරාපෙතුං-යංකිඤ්චි පරසන්තකං.**

යම්කිසි හස්තකර්මයක් ඉල්ලන්නට ත් ඒ ඉල්ලීම් අනුසාරයෙන් ලද කැප වතක් ගන්නට ත් කටයුත්තෙක නොයෙදුණු තැනැත්තකු අතින් හස්තකර්ම නො ඉල්ලා කැමැති මෙහෙයක් කරවන්නට ත් අනුන් අයත් නො වූ එලාඵලාදි යම්කිසිවක් අරණ්‍යයෙන් ගෙන්වන්නට ත් කැප යි.

**විස්තර**

62 වඩුකම් ආදි යම්කිසි කර්මාන්තයක් කරවාගනු කැමැති වූ විට ඒ කම්කරුවා වෙත ගොස් "ස්වාමීනි කුමක් සඳහා පැමිණියහුද"යි ඇසූ කල්හි ඔහුට කම කියන්නට වටනේ ය. නො ඇසුව ද කීම වරද නොවේ. එය "හත්ථකම්මත්‍ථාම කිංචි වත්‍ථු න හොති, තස්මා කිමහනෙන ආගතත්‍ථ කෙන කම්මන්ති පුච්ඡිතෙ වා අපුච්ඡිතෙ වා යාචිතුං වට්ටති. විඤ්ඤත්තිප්‍ පච්චයා දෙසො නත්‍ථි" දැක් වේ. මෙහි දැක් වූ අනෙක් කරුණු සුගම යි.

**379 ගිහීනං ගොපකෙ දෙන්තෙ-ගහෙතුං දෙති යත්තකං**
**ලබ්භං යථා පරිච්ඡෙදං-සඞ්ඝචෙතිය සන්තකං.**

ගිහියන් අයත් එලාඵලාදිය උයන් රක්නවුන් දෙන කල්හි යම් පමණ දේ ද, එපමණක් ගැනීම වටී. සඞ්ඝ සන්තක චෛත්‍ය සන්තකයෙහි පරිච් ඡෙද ප්‍රමාණය ගන්නට වටී. (සඟසතු බීජ පෞද්ගලික භූමියෙහි හෝ පෞද්ගලික බීජ සඟසතු බිම්හි හෝ වැවූ විට ඉඩම් හිමියනට දහයෙන් කොටසක් දියයුතු බව (**මහාවග්ගපාළියේ 285** වන පිටුවේ) එයි.

380 **විහා'පජ්ජෙය්‍ය ආපත්තිං-කායවාචාහි වා ඡහි**
**අලජ්ජ'ඤ්ඤාණ කුක්කුච්චා-පකතත්තා සතිප්ලවා**
**අකප්පියෙ කප්පියෙ වා-කප්පා'කප්පිය සඤ්ඤිතා.**

කාය වාචා යන දෙ පරිද්දෙන් ඇවැත් අවදනේ ය. එසේ ඇවැත් අව දන මහණතෙමේ අලජ්ජී බැවින් හෝ නො දන්නා බැවින් හෝ කුකුසින් මඩනාලද බැවින් හෝ සිහිමුළායෙන් හෝ අකැපයෙහි කැප සංඥයෙන් හෝ කැපයෙහි අකැප සංඥයෙන් හෝ යන ස ආකාරයෙන් ඇවැත් අවදී.

**විස්තර**

63 මෙයින් කාය වාචා දෙකින් ඇවැත් අවදනා බව ත් එසේ අවදනා මහණතෙමේ අලජ්ජීතාදි ස ආකාරයෙන් ඇවැත් අවදනා බව ත් ප්‍රකාශි ත යි. හුදු මනොද්‍වාරයෙන් පමණක් ඇවැත්වීමෙක් නැත. 1 කාය, 2 වාචා, 3 කායවාචා, 4 කායචිත්ත, 5 වාචාචිත්ත, 6 කායවාචාචිත්ත සී සමුට් ඨාන සයකි. විස්තර **මාතිකාට්ඨකථා** 21 පිටුවෙන් බලා දන්නේ ය.

333 **අලජ්ජී අඤ්ඤාණකුක්කුච්ච පකතත්තා**

දූත දූත ඇවැත් වලට පැමිණීම ඇවැත් සැඟවීම අගතිගමනය යන මේ ලක්‍ෂණ ඇත්තේ අලජ්ජියාය යි දක්වා තිබේ. "සංචිච්ච ආපත්තිං ආපජ්ජති ආපත්තිං පරිගූහති අගති ගමනඤ්ච ගච්ඡති එදිසො වුච්චති අලජ්ජිපුග්ගලො" සී (**මාතිකාට්ඨකථා 14**) සී අලජ්ජියා හඳුන්වා තිබේ.

334 **අඤ්ඤාණ**

යනු නො දැනුම යි. නො දන්නා තැනැත්තේ නො කටයුතු දේ කර යි, කටයුතු දෑ නො කර යි. එසේ හෙයින් නො දන්නා බැවින් ඇවැත් අවදී, කුකුස් ඇත්තේ ද යම් දෙයක් ගැන සැකයක් ඇති වූ විට විනයධර යකු අතින් නො විචාරා ම කර යි. එයත් ඇවැත් සිදුවන්නකි.

381 **අලජ්ජි'ඤ්ඤාණතාපත්තිං-කායවාචාහි ඡාදයෙ**
**ලිඞ්ග සඞ්ඝ ගණෙ'කස්මිං-චතුධාපත්ති වුට්ඨිති.**

මෙසේ අවන් ඇවැත් අලජ්ජී බැවින් හෝ අඤ්ඤාණ බැවින් හෝ කාය වාක් දෙකින් සඟවන්නේ ය. ලිඟු පෙරළීමෙහි ය, සඞ්ඝයා මධ්‍යයෙහි ය, ගණයා මධ්‍යයෙහි ය, එක් පුඟුලෙකු කෙරෙහි ය යන සතරාකාරයෙන් ඇවැතින් නැඟීම වේ.

**විස්තර**

64 ඇවැත් අවන් මහණහු ඒ ඇවැතින් නැඟී සිටින්නේ සතරාකා රයකින් බව මෙයින් කිහ. ඒ සතරාකාරයෙන් ලිඞ්ග පරිවර්තනය එකකි. උපසපන් පැවිදි බවෙන් වෙනස් වැ ගිහි ලිඞ්ගයට පෙරැළී ම හෝ පිරිමි බව වෙනස් වැ යැම හෝ ලිඞ්ග පරිවර්තනය යි ගැනීම නිවරද ය. උපසපන් බවෙන් හෙරණ බවට පෙරළුණු කල්හි ද ඇවැතින් නැඟීසිටීමක් වෙතත්

එය ශ්‍රමණ ලිඞ්ගය මාරු නො වන හෙයින් ලිඞ්ග පරිවර්තනය යි ගත නො හැකි ය. මෙහි ප්‍රධාන වශයෙන් පුරුෂ නිමිති පරිවර්තනය බව සිතිය හැකි ය. සඞ්ඝාදිසෙසාපත්තියෙන් නැගිටින්නේ සංඝයා මැද අබ්භානකම් කිරීමෙන් ය. එබැවින් සංඝයා කෙරෙහි ද ඇවැතින් නැගී සිටින්නේ ය. දෙසනාගාමික ඇවැත් සියල්ල ම සඞ්ඝ ගණ පුද්ගල යන තුන්තන්හි ම දෙසා පිරිසුදු බව ලබා ගත හැකි ය.

382 **පරිකථොභාස විඤ්ඤත්ති-න ලබ්භා පච්චයමෙ ව විඤ්ඤත්තියෙව තත්‍රෙ-සෙසෙ සබ්බම්පි ලබ්භති.**

චීවර පිණ්ඩපාත යන මුල් දෙපසෙහි පරියාය කථා ද කෙළින් ම නො කියා අදහස හැඟෙන සේ කීම් සංඛ්‍යාත ඔභාසය ද විනවීම් ද නො වටී. තුන්වන සෙනසුන් පසයෙහි විඤ්ඤත්තිය ම නො වටී. (සෙසෙ) ඉතිරි ගිලන්පසයෙහි පරිකථාදි සියල්ල ම වටී.

335 **පරිකථා**

"**පරිකථා**ති යථා තං ලභති තථා පරිවත්තෙත්වා පරිවත්තෙත්වා කථනන්ති" (**විසුද්ධිමග්ග** 22) පරිකථා යනු යම් අයුරකින් බලාපොරොත්තු වන දෙය ලැබේ නම්, එලෙස පෙරළ පෙරළා කීම යි.

336 **ඔභාස**

"ඔභාසො'**ති** පච්චය පටිසංයුත්තකථා, ඔභාස කම්මන්ති වච්ඡපාලකෙ දිස්වා කිං ඉමෙ වච්ඡා ඛීරගොවච්ඡා උදාහු තක්ක ගොවච්ඡාති පුච්ඡිත්වා ඛීරගොවච්ඡා භන්තෙති වුත්තෙ න ඛීරගොවච්ඡා, යදි ඛීරගොවච්ඡා සියුං; භික්ඛූපි ඛීරං ලභෙය්‍යුන්ති; එවමාදිනා නයෙන තෙසං දාරකානං මාතා පිතූනං නිවෙදෙත්වා ඛීරදාපනාදිකං ඔභාසකරණං" (**විසුද්ධිම**ග්ග 21) ඔභාස නම් ප්‍රත්‍යය ප්‍රතිසංයුක්ත කථා යි. ඔභාසකම්මං යනු වත්සපාලක යන් දැක කිම? මේ වස්සෝ කිරිදෙනුන් ගේ වස්සෝ ද? නැතහොත් මෝරු දෙනුන් ගේ වස්සෝ දැ? යි අසා "ස්වාමීනි කිරිදෙනුන් ගේ වස්සෝය යි කී කල්හි කිරිදෙනුන් ගේ වස්සෝ නො වෙති. ඉදින් කිරිදෙනුන් ගේ වස්සෝ වන්නාහු නම්, භික්ෂූහු ද කිරි ලබති යි මේ ආදි ක්‍රමයෙන් ඒ දරුවන් ගේ පිවුපියන්හට දන්වා කිරි දෙ වා ගැනීමාදි ඔභාස කරණ යි.

**ඛුද්දසික්ඛා ටීකායෙහි** "උජුකමෙව අවත්වා යථා අධිප්පායො විභූතො හොති එවං ඔභාසනං ඔභාසො" යි දක්වා ඇත. 264 **පරිකථාව** ද බැලිම යහපති.

**විඤ්ඤත්ති**

"විඤ්ඤත්ති නාම අඤ්ඤාතකඅප්පවාරිතට්ඨානෙ ආහාරං දෙහීති විඤ්ඤාපනං" යි දක්වෙන හෙයින් නො නෑ නො පැරූවන් ගෙන් ඉල්ලීම විඤ්ඤත්ති නම්. **233 වන** විපස්සණ ය බලනු.

383 **නරූහත'ච්චමෙය දාතං-පඤ්චන්නං සහධම්මිනං**
**සඞ්ඝස්සෙව ච තං හොති-ගිහීනං පන රූහති.**

**පස්සහ දූමියන් ගේ** "මා මළ කල්හි මගේ පිරිකර උපාධ්‍යායයන්ට දෙමි" යනාදි වශයෙන් තමන් ඇවෑමෙහි දීම ගණින් නො ගැනේ. ඒ චීව රාදි වස්තුව සඞ්ඝසන්තක ම වෙයි. ගිහි මිනිසුන් ගේ තමා ඇවෑමේ දීම ගණින් ගැනේ.

**විස්තර**

65 "භික්ඛුස්ස භික්ඛවෙ කාලකතෙ සඞ්ඝො සාමි පත්තචීවරෙ අපි ච ගිලානුපට්ඨාකා බහුකාරා. අනුජානාමි භික්ඛවෙ සඞ්ඝෙන තිචීවරඤ්ච පත්තඤ්ච ගිලානුපට්ඨාකානං දාතුං, යං තත්ථ ලහුභණ්ඩං ලහු පරික්ඛාරං තං සම්මුඛී භූතෙන සඞ්ඝෙන භාජෙතුං, යං තත්ථ ගරුභණ්ඩං ගරුපරික්ඛාරං තං ආගතානාගතස්ස චාතුද්දිසස්ස සඞ්ඝස්ස අවිස්සජ්ජිකං අවෙභඞ්ගිකන්ති" (**මහාවග්ගපාළි 340**) මේ දෙශනාවෙන් සහ එම **අටුවාවේ 840-841** පිටුවලින් ද දැක්වෙන විස්තරයෙන් භික්ෂුවක් කාලක්‍රියා කළ කල්හි කවරක් කළමනාදැයි හෙළි වේ. **පස්සහ දූමියන්** අතුරෙන් යම් කිසිවකු කළුරිය කරන්නට පළමු මගේ පරිෂ්කාර අසුවලුන්ට වේවා යි කියුව ද ඔවුනට එය අත් නො වේ. ඒ බව "සචෙ පඤ්චසු සහධම්මිකෙසු යො කොචි කාලං කරොන්තො මමච්චයෙන මය්හං පරික්ඛාරො උපජ්ඣායස්ස හොතු ආචරියස්ස හොතු සද්ධිවිහාරිකස්ස හොතු අන්තෙවාසිකස්ස හොතු මාතු හොතු පිතු හොතු අඤ්ඤස්ස වා කස්සචි හොන්තූති වදති, තෙසං න හොති, සඞ්ඝස්සෙව හොති. න හි පඤ්චන්නං සහධම්මිකානං අච්චයෙන දානං රූහති ගිහීනං පන රූහති" යන **අටුවා මතයෙන්** පැහැදිලි කරයි අදහස සුගම හෙයින් උපෙක්‍ෂක වම්හ. මේ අනුව සඟසතු ආරාමාදිය තමන් කැමැති කෙනකුන්ට පැවරීමට බලයක් කෙසේ ලැබේ ද? නො ලැබේ.

384 **භික්ඛු වා සාමණෙරො වා[1]-කාලං කයිරා'පස්සයෙ**
**භික්ඛු සඞ්ඝොව දායජ්ජො-තත්ථ සෙසෙස්ව'යන්නයො.**

භික්ෂුවක් හෝ සාමණෙරයෙක් හෝ මෙහෙණවරෙ කළුරිය කෙළේ නම් භික්ෂු සඞ්ඝයා ම ඒ දෙදෙනා සතු පිරිකරෙහි හිමි ය. (සෙසෙපි) භික්ෂුණී ශික්‍ෂමානා සාමණෙරීන් භික්ෂු ආශ්‍රමයෙහි කළුරිය කළ කල්හි ත් මෙම ක්‍රමය යි.

337 **සෙසෙ'පි අයන්නයො**

භික්ෂුණී ශික්‍ෂමානා සාමණෙරීන් අතුරෙන් යම් තැනැත්තියක භික්ෂු ආශ්‍රමයෙක්හි මළ කල්හි "මේ නීතිය මෙසේය"යි කීමෙන් ගැනෙන්නේ ඔවුන්සතු පිරිකරෙහි අයිතිය භික්ෂුණී සඞ්ඝයාට ම ලැබෙන බව යි.

385 **පුරිමස්සෙවිමං දින්නං-දෙහි නෙත්වා'සුකස්ස'ති**
**පච්ඡිමස්සෙ'ව දම්මී'ති-දින්නං ඤත්වා ඉමං විධිං**
**ගණ්හෙ විස්සාස ගාහා වා-'ධිට්ඨෙ මතකචීවරං.**

මෙය ගෙන ගොස් අසුවලාට දෙවයි දෙනලද චීවරාදිය (පුරිමස්සෙව) ලබන්නහු අතට නො ගියතාක් කල් දායකයා සන්තකම ය. මෙය අසුවලාට

[1] මරෙය්‍යුං යදුපස්සයෙ. බු. ඉං.

දේමැ යි දෙන ලද්දේ (පච්ඡිමසෙසව) දුන් තැන පටන් පිරිකර ලබන්නහු සන්තකමැ යි. මේ විධානය දැන (හෙවත් මෙසේ අයිති කරුවන් හැඳින) ජීවත් වන්නන් ගෙන් විස්සාසයෙන් ගැනීමෙන් හෝ ගන්නේ ය. මළ කල්හි මතක චීවර වශයෙන් සලකා හෝ ඉටන්නේ ය.

338 **මතකචීවරං**

මෙහි ''මතකචීවර'' යනු මළ තැනැත්තහු අයත් සිවුර යි. එය ගත හැක්කේ වෙත යම් භික්ෂු කෙනෙක් නො මැත්තාහු නම් "මෙය අයිති කිසි වෙක් නැත. එබැවින් මම මෙය ගනිමි" යි සිතීමෙනි. මළවුනට පින් පෙත් පිණිස දෙන දන මතක දන නම්. එය අනෙකකි.

386 **ලොහභණ්ඩ පහරණිං-දාරුභණ්ඩ ච දාරුජං**
**පත්තං පාදුකපල්ලඞ්කං-ආසන්දිං මත්තිකාමයෙ**
**ඨපෙත්වා කප්පති සබ්බං-කතකං කුම්භකාරිකං.**

ලොහො බඩු අතුරෙ ආයුධ ද ලී බඩු අතර දාරුමය පාත්‍රය ද පයැ ලා සක්මන් කළ හැකි පාදුකාව ද ව්‍යාළරූප ඇති පළඟ ද පමණ ඉකුත් දික් හඟලා පුටුව ද මැටි බඩු අතුරෙ කතක මල්ලකය ද සබ්බමත්තිකාමය කුටි ය ද හැර අන් සියල්ල කැප යි.

339 **කතකං**

''කතකං නාම පදුම කණ්ණිකාකාරං පාදඝංසනත්ථං කණ්ටකෙ උට්ඨාපෙත්වා කතං. තං වට්ටං වා හොතු චතුරස්සාදි භෙදං වා, බාහුලිකානුයොගත්තා පටික්ඛිත්තමෙව. නෙව පටිග්ගහෙතුං න පරිභුඤ්ජිතුං වට්ටති.'' (**සමන්තපාසාදිකා 894**) කතකය නම් පියුම් කෙමියක හැඩහුරින් පා ගටනු පිණිස කටු නගා කළ උපකරණයකි. එය වට වූයේ හෝ සිවුරැස් ඈ අන් ලෙසක් හෝ වේවා; ප්‍රත්‍යය බහුලතානුයොගයට හේතු බැවින් ප්‍රතික්ෂිප්තම ය. පිළි ගන්නට ත් පරිභොගයට ත් නො වටී.

---

## 42 දෙසනා'ති

337 **චාගො යො භික්ඛුභාවස්ස-සා පාරාජිකදෙසනා**
**යථාවුත්තෙන උට්ඨානං-ගරුකාපත්තිදෙසනා.**

ගිහි බවට පැමිණීමාදියෙන් භික්ෂුභාවයා ගේ යම් පරිත්‍යාගයෙක් ඇද් ද, ඕතොමෝ පාරාජිකා දෙශනා නම් වේ. යටකී පරිද්දෙන් ආපත්තියෙන් නැඟීම ගරුකාපත්ති දෙසනා නම් වෙයි. (මෙහි විස්තර යටැ සඳහන් කොට ඇත.)

388 **උක්කුටිකං නිසීදිත්වා-පග්ගණ්හිත්වාන අඤ්ජලිං**
**ථුල්ලච්චයාදිං දෙසෙය්‍ය-එවමෙ'කස්ස සන්තිකෙ.**

උක්කුටික ව හිඳ ඇඳිලි බැඳ එක් මහණක්හු සොරෙහි මෙසේ ථුල්ලච්චයාදිය දෙසන්නේ ය.

**(7) අහං භන්තෙ එකං දුල්ලච්චයාපත්තිං ආපජ්ජිං තං තුම්හ මූලෙ පටිදෙසෙමි"ති වත්වා තෙන "පස්සසි ආවුසො තං ආපත්ති"න්ති වුත්තෙන "ආම භන්තෙ පස්සාමි"ති වත්වා පුන තෙන "ආයතිං ආවුසො සංවරෙය්‍යාසි"ති වුත්තෙන "සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමි"ති වත්තබ්බං.**

(7) ස්වාමීනි මම එක් තුලැසි ඇවැතකට පැමිණියෙමි. ඒ ඇවැත ඔබ පාමුලැ දෙසමි යි කියා ඇවැත් පිළිගන්නා වූ ඒ මහණහු විසින් "ඇවැත්නි, ඒ ඇවත දක්නෙහිදැ"යි කී කලැ "එසේ ය ස්වාමීනි, දක්නෙමි" යි කියා නැවැත ඔහු විසින් "ඇවැත්නි, මත්තෙහි හික්මෙව"යි කී කලැ "යහපත ස්වාමීනි මනාකොට හික්මෙමි"යි කිය යුතු යි.

**(8) අහං භන්තෙ වේ දුල්ලච්චයාපත්තියො ආපජ්ජිං, -පෙ- අහම් භන්තෙ සම්බහුලා දුල්ලච්චයාපත්තියො ආපජ්ජිං තා තුම්හමූලෙ පටිදෙසෙමිති -පෙ- වත්තබ්බං-**

(8) ස්වාමීනි මම තුලයි ඇවැත් දෙකකට පැමිණියෙමි, -පෙ- ස්වාමීනි මම තුලසි ඇවැත් රැසකට පැමිණියෙමි. ඒ ඇවැත් ඔබ පාමුල දෙසමි" යි කියයුතු.

**(9) නිස්සග්ගියෙසු පන ඉදමෙම භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං ඉමා'හං ආයස්මතො නිස්සජ්ජාමීති, ඉමානි මෙ භන්තෙ චීවරානි දසාහාතික්කන්තානි -පෙ- එතමෙම භන්තෙ චීවරං -පෙ- එතානි මෙ භන්තෙ චීවරානි දසාහාතික්කන්තානි නිස්සග්ගියානි එතානා'හං ආයස්මතො නිස්සජ්ජාමීති-**

නිසගි ප්‍රවිතියෙහි වනාහි "ස්වාමීනි මේ මාගේ සිවුර පිළිගෙන දස දිනක් ඉක්මැ ගියේ නිසජිය යුතු වෙ යි. මම මෙය ආයුෂ්මත්හට නිසජමි" යි කියා ද (බොහෝ වුව) ස්වාමීනි මේ සිවුරු පිළිගෙන දස දින ඉක්ම ගියාහු -පෙ- ස්වාමීනි ඒ සිවුර -පෙ- ස්වාමීනි ඒ සිවුරු පිළිගෙන දස දින ඉක්ම ගියාහු නිසජිය යුතු වෙත්. ඒවා ආයුෂ්මත් හට නිසජමි කියා යි.

389 **නිස්සජ්ජිත්වාන දෙසෙය්‍ය-ආපත්තිං තෙන භික්ඛුනා පටිග්ගහෙත්වා ආපත්තිං-දෙය්‍යං නිස්සට්ඨ චීවරං:**

**"ඉමං ඉමානි එතං එතානි චීවරානි ආයස්මතො දම්මි"ති.**

නිසගි වූ වස්තුව මෙසේ නිස්සජ්ජනය කොට අවත් ඇවැත් දෙසත් නේ ය. ඒ සිවුරු නිස්සජනය ලැබූ මහණහු විසින් ඇවැත පිළිගෙන නිසජූ සිවුර එකක් වුව (ඉමං) මේ සිවුර බොහෝ වුව (ඉමානි) මේ සිවුරු දුරවුව එකක් නම් (එතං) ඒ සිවුර බොහෝ වුව (එතානි) ඒ සිවුරු ආයුෂ්මත් හට දෙමි යි කියා දිය යුත්තේ ය.

**(10) ඉදමෙම භන්තෙ චීවරං රත්තිවිප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං. ඉමා'හං ආයස්මතො නිස්සජ්ජාමීති.**

(10) ස්වාමීනි මගේ මේ සිවුර මහණ සම්මතයක් නැති ව රෑ වියොවැ වසන ලදින් නිසජිය යුතු වෙයි. මම මේ සිවුර ඇවැත්හට නිසජමි යි.

(11) **ඉදමෙම භන්තෙ අකාල චීවරං මාසාතික්කන්තං නිස්සග්ගියං.**

(11) ස්වාමීනි මගේ මේ අකාල චීවරය මාසයක් ඉක් මැ ගියේ නිස ජ්ය යුතු වෙයි.

340 **අකාලචීවරං**

චීවර කාලය නො වන කාලයෙහි ලැබුණු සිවුර හෝ චීවර කාලයෙහි වුව ත් "මේ අකාල චීවරයකැ" යි දුන් සිවුර ය. "අකාල චීවරන්ති අත්ථතෙ කඨිනෙ කඨිනමාසෙහි අනත්ථතෙ චීවර මාසතො අඤ්ඤස්මිං කාලෙ උප්පන්නං, යං වා පන කාලෙපි ආදිස්ස දින්නං, ආදිස්ස දින්නං නාම සම්පත්තා භාජෙන්තූති වත්වා වා "ඉදං ගණස්ස ඉදං තුම්හාකං දම්මීති වත්වා වා දතුකාමතාය පාදමූලෙ ඨපෙත්වා දින්නං ඉච්චෙතං අකාලචීවරං" (**මාතිකාට්ඨකථා 170**)

"යස්මිං කාලෙපි සඞ්ඝස්ස වා ඉදං අකාල චීවරන්ති පුග්ගලස්ස වා ඉදං තුය්හං දම්මීති ආදිනා නයෙන දින්නං එතං අකාල චීවරං නාම" (**මාතිකාට්ඨකථා 58**)

(12) **ඉදමෙම භන්තෙ පුරාණචීවරං අඤ්ඤාතිකාය භික්ඛුණියා ධොවාපිතං නිස්සග්ගියං–**

(12) ස්වාමීනි නො නෑ මෙහෙණක ලවා සෝදවන ලද මගේ මේ පරණ සිවුර නිසජ්ය යුතු වේ.

341 **පුරාණ චීවරං**

පඬු පොවා කප්බිඳු තබා එකවරක් වත් පාවිච්චිකළ සිවුර යි. යටත් පිරිසෙන් "පරිභොග කරමැ" යි සිතා උරහිසෙහි හෝ හිසෙහි හෝ බහා ගෙන මඟ ගියේ වේ ද; හිස යටැ තබා හොත්තේ හෝ වේ ද එපමණකින් පුරාණ චීවර නම් වේය යි **මාතිකාට්ඨකථා** 62 වන පිටුවේ එයි.

(13) **ඉදමෙම භන්තෙ චීවරං අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො පටිග්ගහිතං අඤ්ඤත්‍ර පාරිවත්තකා නිස්සග්ගියං–**

(13) ස්වාමීනි නො නෑ මෙහෙණක අතින් මාරුකිරීමක් නැතිව පිළි ගන්නාලද මගේ මේ සිවුර නිසජ්ය යුතු වෙ යි.

(14) **ඉදමෙම භන්තෙ චීවරං අඤ්ඤාතිකං ගහපතිකං අඤ්ඤත්‍ර සමයා විඤ්ඤාපිතං නිස්සග්ගියං–**

ස්වාමීනි විතවා ගතයුතු කාලය හැර අන් කාලයක නො නෑ ගැහැවියකු විතවා ගන්නා ලද මගේ මේ සිවුර නිසජ්ය යුතුවෙයි.

342 **අඤ්ඤත්‍ර සමයා**

සමය තබා යනු යි. නො නෑ කෙනකුන් ගෙන් සිවුරු ඉල්විය හැකි වනුයේ සොරුන් විසින් සිවුරු පැහැරගත් කල්හි හෝ දහදියෙන් නැසුණු කල්හි හෝ යන කාලයකදී ය.

(15) **ඉදං මෙම භන්තෙ චීවරං අඤ්ඤාතකං ගහපතිකං තදුත්තරිං අඤ්ඤත්‍ර සමයා විඤ්ඤාපිතං නිස්සග්ගියං**–

(15) ස්වාමීනි නො නෑ ගැහැවියකු ගෙන් කී පමණට වඩා හෙවත් අඳනා පොරෝනා පමණකින් වැඩියක් විනවනලද මගේ මේ සිවුර නිසජියයුතු වෙ යි.

(16) **ඉදං මෙම භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතං අඤ්ඤාතිකං ගහපතිකං උපසංකමිත්වා විකප්පං ආපන්නං** නිස්සග්ගියං–

(16) ස්වාමීනි පෙර නො පැවරූ නො නෑ ගැහැවියකු වෙත එළඹ මෙසේ කර දෙවයි අධික විධානයට පමුණුවනලද මගේ මේ සිවුර නිසජිය යුතු වෙයි.

(17) **ඉදං මෙම භන්තෙ චීවරං පුබ්බෙ අප්පවාරිතෙ අඤ්ඤාතිකෙ ගහපතිකෙ උපසංකමිත්වා විකප්පං ආපන්නං** නිස්සග්ගියං–

(17) ස්වාමීනි පෙර නො පැවරූ නො නෑ ගැහැවියන් වෙත එළඹ අධික විධානයට පමුණුවනලද මගේ මේ සිවුර නිසජිය යුතු වෙයි.

(18) **ඉදං මෙම භන්තෙ චීවරං අතිරෙක තික්ඛත්තුං චොදනාය අතිරෙක ඡක්ඛත්තුං ඨානෙන අභිනිප්ඵාදිතං** නිස්සග්ගියං–

(18) ස්වාමීනි තෙවිටකට වඩා (මට සිවුරින් වැඩ ඇත ඈ විසින්) චොදනා කිරීමෙන් ද සවරකට අධික කොට නිශ්ශබ්දව සිටීමෙන් ද නිපද වන ලද මගේ මේ සිවුර නිසජිය යුතු වෙයි.

(19) **ඉදං මෙම භන්තෙ සන්ථතං කොසියමිස්සකං කාරාපිතං නිස් සග්ගියං**–

(19) ස්වාමීනි මගේ තිහිරි හූ මුසු කොට කරවන ලද මේ ඇතිරිය නිසජිය යුතු වෙයි.

(20) **ඉදං මෙම භන්තෙ සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපිතං නිස්සග්ගියං**–

(20) ස්වාමීනි හුදු කළු එළුලොමින් කරවනලද මගේ මේ ඇතිරිය නිසජිය යුතු වෙයි.

(21) **ඉදං මෙම භන්තෙ සන්ථතං අනාදිසිත්වා තුලං ඔදාතානං තුලං ගොචරියානං කාරාපිතං නිස්සග්ගියං**–

(21) ස්වාමීනි සුදු එළුලොමින් භාගයක් ද කිඹුල්වත් එළුලොමින් භාගයක් ද නො ගෙන කරවන ලද මගේ මේ ඇතිරිය නිසජිය යුතු වෙයි.

(22) **ඉදං මෙම භන්තෙ සන්ථතං ඌනඡබ්බස්සානි කාරාපිතං අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං**–

(22) ස්වාමීනි මහණ සම්මුති නැතියා වැ කළ දා සිට සවසක් නො පිරෙන තෙක් කරවන ලද මගේ මේ ඇතිරිය නිසජිය යුතු වෙයි.

(23) **ඉදං මෙ භන්තෙ නිසීදන සන්ථතං අනාදියිත්වා පුරාණ සන්ථතස්ස සාමන්තා සුගත විදත්ථිං කාරාපිතං නිස්සග්ගියං–**

(23) ස්වාමීනි පරණ ඇතිරියෙන් සුගත් වියත් පමණ තැන් වටේට නො ගෙන කරවන ලද මගේ මේ හිඳිනා ඇතිරිය නිසජිය යුතු වෙයි.

(24) **ඉමානි මෙ භන්තෙ එළකලොමානි තියොජන පරමං අතික්කාමිතානි නිස්සග්ගියානි–**

(24) ස්වාමීනි මේ එළලොම් තුන් යොදුන් පමණ තැන් ඉක්මවන ලද්දාහු නිසජිය යුතු වෙයි.

(25) **ඉමානි මෙ භන්තෙ එළකලොමානි අඤ්ඤාතිකාය භික්ඛුනියා ධොවාපිතානි නිස්සග්ගියානි–**

(25) ස්වාමීනි නො නෑ මෙහෙණක ලවා සෝදවන ලද මගේ මේ එළලොම් නිසජිය යුත්තාහ–

(26) **අහං භන්තෙ රූපියං පටිග්ගහෙසිං ඉදං මෙ භන්තෙ නිස්සග්ගියං ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති–**

(26) ස්වාමීනි මම රන් රිදී මසු කහවණු පිළිගතිමි. ස්වාමීනි මගේ මෙය නිසජිය යුතු වෙයි. මම මෙය සඞ්ඝයාට නිස්සජනය කරමි.

(27) **අහං භන්තෙ නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජිං ඉදං මෙ භන්තෙ නිස්සග්ගියං ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමීති–**

(27) ස්වාමීනි මම නොයෙක් ප්‍රකාර වූ රන් රිදී මසු කහවණු පෙරළි කිරීමට පැමිණියෙමි. ස්වාමීනි මගේ මෙය නිසජිය යුතු වෙයි. මම මෙය සඞ්ඝයාට නිස්සජනය කරමි යි (කියා නිසජන්නේ ය)

390 **නිස්සජ්ජිත්වාන ආපත්තිං–දෙසෙය්‍යා'ථ ගිහිං වදෙ**
**ජානාහි'ම'න්ති ඉමිනා–සො වදෙය්‍ය හරාමි කිං**

වස්තුව නිසජා ඇවැත් දෙසන්නේ ය. නැවත එහි සැපත් ගිහි මිනිසකුට මේ දනුව යි කියන්නේ ය. ඒ ගිහිතෙම මෙයින් කුමක් ගෙන එන් නෙම්ද යි කියා නම්–

391 **අවත්වා'මන්ති තෙලාදි–වදෙ භික්ඛුන කප්පියං**
**යං ආහරති සො තෙන–පරිවත්තෙත්ව'කප්පියං**

මෙය ගෙනෙවයි නො කියා තෙල් ආදිය භික්ෂූනට කැපය යි කියන්නේ ය. හෙතෙමේ ඒ නිසජ්‍ජ වතින් පෙරළි කොට යම් කැපවතක් ගෙනේ ද ඒ කැපවත–

392 **ලබ්භං ඨපෙත්වා ද්වෙ පෙතෙ–සෙසෙහි පරිභුඤ්ජිතුං**
**තථා අඤ්ඤෙන ලද්ධා'පි–භාගො තෙසං න කප්පති.**

(එතෙ ද්වෙපි ඨපෙත්වා) රූපිය පටිග්ගාහක රූපිය සංවොහාරක යන ඒ දෙදෙන ම හැර සෙසු මහණුන් විසින් වළඳන්නට වටී. ඒ නිසජ්‍ජවත් පෙරළි කොට ගෙනා කැපවතින් අනිකකු ලද කොටසක දූ ඒ දෙදෙනාහට නො කැප යි.

393 **රූපකඛඡ්ජාගා පෘනනමසො-තතනිබබනනා න කපපතී**
**නිසසටඨ පවිලද්ධමපි-ආදිතො සතතනනතගං.**

යටත් පිරිසෙයින් ඒ වස්තුවෙන් හටගත් ගස් සෙවණකුදු (ඒ දෙදෙනාට) නුසුදුසු යි. නිසඳ නැවැත ලද්ද වූ ආදියෙහි කී (කොසිය ය සුද්ධ කාලක ය ද්වෙ භාගය යන) සත්‍ත තුන ද හැමදෙන හට ම නො වටී.

394 **නො චෙ ලහෙථ එවං සො-ඉමං ඡඩ්ඩෙහි සංඝියො**
**එවමපි ගිකබු ඡඩ්ඩෙයා-නො චෙ ලබෙහයා සමමතො.**

රූපිය පෙන්වා ''මෙය දනුව''යි කී කල්හි බස තේරෙන ගිහියකු නො ලැබේ නම්, ''මෙය දමව''යි ඒ ගිහි තෙමේ සංඝයා විසින් (සංඝියො) කිය යුත්තේ ය. එසේ ත් නො ලැබේ නම් සම්මත කරන ලද මහණ තෙමේ දමන්නේ ය.

343 **සමමතො**

සඞ්ඝයා විසින් සම්මත කරන ලද භික්ෂුව යි. රූපිය ඡඩ්ඩනයට ගිහි යකු නො මැති කල්හි අංගපසකින් යුත් රූපිය ඡඩ්ඩක භික්ෂුවක් සංඝයා විසින් සම්මත කටයුතු ය. ඡන්‍ද- දෙස- භය- මොහ යන සතර අගති යෙන් අගතිගාමී නො වන ඡඩ්ඩිතාඡඩ්ඩිතභාවය දන්නා භික්ෂුව පඤ්චඞ්ග සමන්නාගත යි.

395 **එතානි දුතියං පතතං-සඞෙඝ සෙසානි ලබ්භරෙ**
**සඞෙඝකසමිං ගණෙවනතුං-ලබ්භං භාසනතරෙනා'පි.**

(එතානි) පිළිගන්නා ලද රූපිය ය පෙරළි කරනලද රූපිය ය යන නිස්සග්ගි වස්තූන් ද ඌන පඤ්චබන්ධන පාත්‍රයක් තිබිය දී විනවන ලද පාත්‍රය ද සඟමැද නිසජන්නේ ය. සෙසු නිසගිවත් සඟ මැද ද ගණයා මැද ද එක පුග්ගලකු කෙරෙහි ද නිසජන්නට වටනේ ය. (භාසන්තරෙනාපි) පෙළ කියන්නට නො තිස්සහු විසින්) අන් බසකිනි දු නිසජත් වටී.

(28) **අහං භනෙත නානපපකාරකං කයවිකකයං සමාපජ්ජිං ඉදමෙම භනෙත නිස්සග්ගියං-**

(28) සවාමීනි මම නොයෙක් ප්‍රකාර ගනු දෙනු කොළෙමි, සවාමීනි මගේ මෙය නිසජිය යුතු වෙයි.

(29) **අයමෙම භනෙත පතෙතා දසාහාතිකකනෙතා නිස්සග්ගියො-**

(29) සවාමීනි දසදින ඉක්ම ගිය මගේ මේ පාත්‍රය නිසජිය යුතු වෙයි.

(30) **අයමෙම භනෙත පතෙතා ඌනපඤ්චබන්ධනෙන පතෙතන චෙතාපිතො නිස්සග්ගියො ඉමාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමි-**

(30) සවාමීනි උණු පස් බැන් පා ඇතියාව ඉල්වා ගන්නා ලද මගේ මේ පත්‍රය නිසජිය යුතු වෙයි. මම මෙය සඞ්ඝයාට නිසජමි.

396 නිස්සජ්ජිත්වාන දෙසෙය්‍ය-ආපත්තිං පත්‍
සම්මන්නිත්වාන සඞ්ඝස්ස-පත්තන්තං තස්ස දාපයෙ.

මෙසේ පාත්‍රය නිසජ අවත් ඇවැත් දෙසන්නේ ය. පාත්‍ර ගන්වන මහණක්හු සම්මත කොට සංඝයා ගේ පයඝීනන පාත්‍රය ඔහුට දෙවන්නේය.

344 ඌනපඤ්චබන්ධනෙන පත්තෙන

බන්ධන- පිළියම් පසකින් අඩු පාත්‍රයකින් යුක්තව යනු යි. අනෙක් පාත්‍රයක් ලබා ගත හැක්කේ පිළියම් පසක් පිරුණු කල්හි ය. යම් පාත්‍ර යක මුවවිටෙන් යට දෑඟුල් පමණ ඉරක් තිබේ නම්, කටුවකින් විද නූල් ආදියෙන් බැඳ ආමිෂ නො රැඳීම සඳහා එය ඉටි වැනි යමකින් වසාදැමිය යුතු යි. එසේ තැත් නම් පිළියම් කළ යුතු යි මේ ක්‍රමයෙන් අටඟුලක ඉරක් වුව ත් බැමි සතරක් ගසා පාවිච්චි කට හැකි ය. දසඟුල් ඉරක් ගිය විට බැමි ගසා ද පරිභොග නො කට හැකි ය. මේ ක්‍රමය මැටි පාත්‍රය ගැන යි. යකඩ පාත්‍රය හිල් පසකට වැඩිවුවත් පිළියම් කොට පරිභොග කටහැකි නම්, එසේ කළ මනා ය. මෙබඳු බැමි පසකට අඩු පාත්‍රයක් තිබිය දී අන් පාත්‍රයක් ඉල්ලා ගත් විට එය නිසඟි වේ. නිසඟි වූ ඒ පාත්‍රය සංඝයා මැද දී නිස්සජනය කටයුතු වේ. එවිට ඒ පාත්‍රය මහතෙරුන් ගෙන මහතෙරුන් ගේ පාත්‍රය ඊළඟ මහණා විසින් ද මේ ක්‍රමයෙන් පාත්‍රා මාරුකරමින් ආවිට අවසන් මහණහු ගේ පාත්‍රය ඉතිරි වේ. එය "පත්ත පරියාපන්න" නම්. එය මේ භික්ෂුවට දිය යුත්තේ ය. (මාතිකාට්ඨකථා **74-75**)

(31) ඉදමෙම භන්තෙ භෙසජ්ජං සත්තාහාතික්කන්තං නිස්සග්ගියං-

(31) ස්වාමීනි සත්දින ඉකුත් වූ මගේ මේ බෙහෙත නිසජිය යුතු වෙයි.

(32) ඉදමෙම භන්තෙ වස්සිකසාටික චීවරං අතිරෙක මාසෙ සෙසෙ ගිම්හානෙ පරියිට්ඨං අතිරෙකද්ධමාසෙ සෙසෙ ගිම්හානෙ කත්වා පරිදහිතං නිස්සග්ගියං-

(32) ස්වාමීනි ග්‍රීෂ්ම ඍතුයෙහි මසකට වැඩිය තිබිය දී සොයන ලද ග්‍රීෂ්ම ඍතුයෙහි අඩමසකට වැඩිපුර තිබිය දී වැළඳ ගන්නා ලද මේ වස්සිකසාටික චීවරය නිසජිය යුතු වෙයි.

(33) ඉදමෙම භන්තෙ චීවරං භික්ඛුස්ස සාමං දත්වා පුන අච්ඡින්නං නිස්සග්ගියං-

(33) ස්වාමීනි (වතාවත් ඈ කැමැත්තෙන්) මහණහට තමා විසින්ම දී නැවත (වතාවත් ඈ නො කරන හෙයින්) සක සංඥයෙන් අසිඳගත් මගේ මේ සිවුරු නිසජිය යුතු වෙයි.

(34) ඉදමෙම භන්තෙ චීවරං සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි වායාපිතං නිස්සග්ගියං-

(34) [illegible]ධුමා විසින් නූල් ඉල්වා ගෙන පෙහෙරුන් (රෙදිවියන් තන්) ලවා වියවන ලද මේ මගේ සිවුර නිසජිය යුතු වෙයි.

(35) **ඉදමෙම භන්තෙ චීවරං පුබ්බෙ [1]අප්පවාරිතො අඤ්ඤාතකස්ස ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා විකප්පං ආපන්නං නිස්සග්ගියං–**

(35) සවාමීනි පෙර නො පවරන ලදුව නො නෑ ගිහි මිනිසක්හුගේ පෙහෙරන් වෙත එළඹ අධික විධානයට පමුණුවන ලද මගේ මේ සිවුර නිසජිය යුත්තේ ය.

(36) **ඉදමෙම භන්තෙ අච්චෙකචීවරං චීවරකාලසමයං අතික්කාමිතං නිස්සග්ගියං–**

(36) සවාමීනි චීවර කාලසමය ඉක්මවන ලද මගේ මේ අච්චෙක චීවරය නිසජිය යුතු වෙයි.

345 **අච්චෙකචීවරං**

"අච්චෙක චීවරන්ති ගමිකගිලාන ගබ්භිනී අභිනවුප්පන්නසද්ධානං පුග්ගලානං අඤ්ඤතරෙන විස්සාවාසිකං දස්සාමීති එවං ආරොචෙත්වා දින්නං (**මාතිකාට්ඨකථා 80**) යි දක්වෙන පරිදි යුදපිණිස යන්නකු විදෙශ ගත වන්නකු ගිලනකු ගැබිණියක හෝ අලුතෙන් උපන් සැදැහැත්තකු යන මොවුන් අතුරෙන් යම්කිසිවකු විසින් චීවර සමයට කලින් තමා ම පැමිණ හෝ අනිකකු අත යවා හෝ පිළිගන්වන සිවුර යි.

(37) **ඉදමෙම භන්තෙ චීවරං අතිරෙක ඡාරත්තං විප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා නිස්සග්ගියං–**

(37)සවාමීනි, මහණ සම්මතයක් නැතිව සරයකට වඩා වෙන්ව වසන ලද මගේ මේ සිවුර නිසජිය යුතු වෙයි.

(38) **ඉදමෙම භන්තෙ ඤාතං සංඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමිතං නිස්සග්ගියං ඉමාහං ආයස්මතො නිස්සජාමි–**

(38) සවාමීනි, සඞසයාට පිරිනමන ලද බව දැන දැන තමහට පිරිනමා ගන්නා ලද මගේ මේ ලාභය නිසජිය යුතු වෙයි. මම මෙය ආයුෂ්මත් හට නිසජමි.

397 **සෙසං සබ්බං යථායොගං–ආදිම්හි විය යොජයෙ**

සෙසු සියල්ල ආදියෙහි සේ යෙදෙන යෙදෙන පරිද්දෙන් යොදන්නේ ය.

(39) **අහං භන්තෙ එකං පාචිත්තියාපත්තිං ආපජ්ජිං ද්වෙ –පෙ– සම්බහුලා පාචිත්තියාපත්තියො ආපජ්ජිං–**

(39) සවාමීනි, මම එක් පචිති ඇවැතකට පැමිණියෙමි, දෙකකට –පෙ– බොහෝ පාචිත්තියාපත්තීන්ට පැමිණියෙමි.

---

[1] අප්පවාරිතස්ස. බු. ඉං.

(40) **"ගාරය්හං භන්තෙ ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති. "පස්සසි ආවුසො තං ධම්මන්ති" වත්තබ්බං.**

(40) ස්වාමීනි තිඝු කටයුතු වූ සැප නො වන්නා වූ පාටිදෙසනීයා පත්තියකට පැමිණියෙමි. එය දෙසමි යි (කියයුත්තේ ය.) ඒ පිළිගන්නහු විසින් ඇවැත්නි ඒ ධර්මය දක්නෙහිද යි කිය යුතු යි.

(41) **අහං භන්තෙ එකං දුක්කටාපත්තිං ආපජ්ජිං, ද්වෙ -පෙ- සම්බහුලා දුක්කටාපත්තියො ආපජ්ජිං.**

(41) ස්වාමීනි මම එක් දුකුළා ඇවැතකට පැමිණියෙමි. දෙකකට -පෙ- බොහෝ දුකුළා ඇවැත්වලට පැමිණියෙමි.

(42) **අහං භන්තෙ එකං දුබ්භාසිතාපත්තිං ආපජ්ජිං ද්වෙ -පෙ- සම්බහුලා දුබ්භාසිතාපත්තියො ආපජ්ජිං, තා තුම්හමූලෙ පටිදෙසෙමිති.**

(42) ස්වාමීනි මම එක් දුබැසි ඇවැතකට පැමිණියෙමි. දෙකකට -පෙ- බොහෝ දුබැසි ඇවැත්වලට පැමිණියෙමි. ඒවා ඔබ කෙරෙහි දෙසමි.

(43) **"අහම්භන්තෙ ද්වෙ නානාවත්ථුකා ථුල්ලච්චයාපත්තියො ආපජ්ජිං, සම්බහුලා නානාවත්ථුකා ථුල්ලච්චයාපත්තියො ආපජ්ජිං, තා තුම්හමූලෙ පටිදෙසෙමී"ති වත්වා තෙන "පස්සසි ආවුසො තා ආපත්තියො"ති වුත්තෙන "ආමභන්තෙ පස්සාමී"ති වත්වා පුන තෙන "ආයතිං ආවුසො සංවරෙය්‍යාසී"ති වුත්තෙන "සාධු සුට්ඨු භන්තෙ සංවරිස්සාමී"ති වත්තබ්බං.**

(43) "ස්වාමීනි මම නානාවස්තුක වූ තුලසි ඇවැත් දෙකකට පැමිණියෙමි, නානාවස්තුක වූ තුලසි ඇවැත් රැසකට පැමිණියෙමි, ඒ ඇවැත් ඔබ පාමුල දෙසමි"යි කියා, ඔහු "විසින් ඇවැත්නි, ඒ ඇවැත් දක්නෙහි දැ"යි කී කල "එසේ ය ස්වාමීනි දකිමි"යි කියා නැවැත ඔහු විසින් "ඇවැත්නි මතු හික්මෙන්නෙහිය"යි කී කල්හි "යහපත ස්වාමීනි, හොඳින් හික්මෙන්නෙමි"යි කිය යුතු යි.

346 **පාචිත්ති**

"පාචිත්තියන්ති යං වුත්තං තං සුණොහි යථා තථා
පාතෙති කුසලං ධම්මං අරියමග්ගං මපරජ්ඣති
චිත්තසම්මොහනට්ඨානං තෙනෙතං ඉති වුච්චති."

**(පරිවාර 217)**

යී දක්වූ පරිදි කුසල් දහම් හෙළාලන ආර්‍ය්‍යමාර්ගය වළකන සිත මුළා කිරීමට කරුණු වන ආපත්ති සමූහයකට පාචිත්තිය යි කියනු ලැබේ. සෙසු ඇවැත් අතර ද මේ ලක්‍ෂණ නැත්තේ නොවේ. මේ ආදි වශයෙන් පරිවාර පාලියේ 217 වන පිටුවෙහි සෙසු හැම ඇවැත් ගැනව සඳහන් කොට තිබේ.

347 නානාවත්ථුකා

වස්තු වශයෙන් නොයෙක් වස්තු ඇති යනු යි. ආපත්ති වශයෙන් එක වුව ද ආපත්තියට පැමිණෙන කරුණු වශයෙන් නොයෙක් වස්තු ඇති බව යි. සම්පජාන මුසාවාදය ද– ඔමසවාදය ද යන දෙක ම පචිති ඇවැත් අවදින වැරැදි දෙකකි. එහෙත් ඒ දෙක වස්තු ද්වයක් ඉක්මවාලීමෙන් අවදින ඇවැත් බැවින් නානාවත්ථුක නම්. සෙසු සියල්ල ත් මෙසේ ම යි. නානාවත්ථුක ඇවැත් අවන් දෙනමකට ඒ ඇවැත් දෙසිය හැකි නමුත් එක වස්තුවකින් ඇවැත් අවන් දෙනමකට එක් ව ඇවැත් දෙසිය නො හැකි ය. එසේ දෙසූ විට දෙසූ භික්ෂුවට දෙසීම නිසා දුකුලාවක් ද ඒ පිළි ගත් භික්ෂුවට පිළිගැනීම නිසා දුකුලාවක් ද සිදු වේ. ඒ දෙන ම ඒ අවන් දුකුලා දෙක නානාවස්තුක බැවින් නැවැත දෙසූ විට පිරිසුදු බව ලැබේ. වත්මන්හි දෙවරක් ආපත්ති ආරෝපනය කරන්නේ මේ නිසා ය.

398 අදෙසනාගාමිනියං–අනාපත්තිඤ්ච දෙසිතං
නානාසංවාස නිස්සීම–ඨිතානං චතුපඤ්චහි
මනසා පකතත්තානං–නානෙකා'ති න දෙසයෙ'ති.

දෙසනාගාමි නො වන පරිජි හා සඟවෙසෙස් ද අනාපත්ති ද දෙසූ ඇවැත් ද නානාසංවාසයන් හා සමග ද සීමායෙන් පිටත සිටියන් සමග ද සතර පස් දෙනකුන් සමග ද හුදෙක් සිතින් ද පකතත්ත නොවූවන්ගේ ළඟ ද බොහෝ ඇවැත් එක ඇවැතක් සී ද නො දෙසන්නේ ය.

විස්තර

66 මෙයින් ඇවැත් දෙසීමෙන් ප්‍රයෝජනයක් නො සැලසෙන අවස්ථා ප්‍රකාශ කරන ලදි. දෙසනාගාමී නො වන ඇවත් වූ පාරාජිකා සඞ්ඝාදිසෙස දෙක දෙසීමෙන් පිරිසුදු නො වන්නේ ය. සඞ්ඝාදිසෙසය අබ්භානකර්ම යෙන් පිරිසුදු බව ලබාගත හැකි වුව ත් පරිජි අවන්විට එම ජීවිතයෙහි නැවැත උපසපන් බවක් නො ලැබෙන්නේ ය. සංඝාදිසෙසාපත්තියකට පැමිණි කල්හි එය පටිච්ඡන්න නො වූ තරමට පිරිවෙස් කාලය අඩුවන්නේ ය. එය දෙසීමෙන් පමණක් පිරිසුදු බවක් නො ලැබෙන්නේ ය.

ඇවැත් නො වන්නක් දෙසීමෙන් වැඩක් නැති බැවින් අනාපත්ති යන්න ත් මීට ගත්හ. දෙසූ ඇවැත් නැවැත දෙසීමෙන් වැඩෙක් නැත. නානාසංවාසිකයන් හා සීමාවෙන් පිටත සිටියන් සමග දෙසීම ද ප්‍රයෝජන රහිත ය. සතර පස් දෙනකුන් සමග හෝ සිතින් සිතීමෙන් පමණක් ද, පකතත්ත නො වන්නන් සමග ද ඇවැත් දෙසීමෙන් ප්‍රයෝජනයක් නැත.

348 අපකතත්තානං

පකතත්ත නො වන්නන් ගේ යනු යි. "පකතත්ත" යනු උක්ෂේපනිය කර්ම නො ලැබූ පරිජි නො වූ භික්ෂුව යි. "පකතත්තස්සාති අවිපන්නස්ස පාරාජිකං අනජ්ඣාපන්නස්ස". (සමන්තපාසාදිකා 851) "පකතත්තො

තිවිධං උක්ඛෙපනීය කම්මං අකතො'' (සමන්තපාසාදිකා 870) පිරිවෙස් මානත් රක්නා කාලය අතර ද පකතත්ත භාවයෙන් තොර ය. එය පාරිවාසකක්ඛන්ධකයෙන් බලා දත්තේ ය.

---

## 43 ඡන්දදානාදිනි

(ඡන්දදානාදීනි යත්තෙහි සැඳ පිරිසුදු පවුරුණු දීම් කියෑ වේ.)

399 **භෙරිං ඝණ්ඩිං ච තාලෙත්වා–කම්මප්පත්තෙ සමාගතෙ**
**සඞ්ඝෙ හරෙය්‍ය ඡන්දං වා–පාරිසුද්ධිං පවාරණං.**

බෙරය හෝ ගෙඩිය හෝ ගසා සංඝකර්මයට තිසි වූ සඞ්ඝයා රැස් වූ කල්හි ඡන්දය හෝ පාරිශුද්ධිය හෝ පවාරණය හෝ ගෙන යන්නේ ය.

**විස්තර**

67 ඡන්දය හෝ පාරිසුද්ධිය හෝ පවාරණය හෝ ගෙන යන භික්ෂුව විසින් සඞ්ඝයා සීමාවට රැස් ව කර්මප්‍රාප්ත ව හුන් කල්හි ගෙන යා යුතු බව මෙයින් ප්‍රකාශිත යි. මේ ඡන්ද පාරිසුද්ධි පවාරණ දූතයන් අනුදත්තේ සීමාව තුළ ම ගිලන් වැ වෙසෙන භික්ෂූන් නිසා ය. දිනක් තථාගතයන් වහන්සේ උපොසථකරණයට රැස්වන්නටය යි භික්ෂූන් වහන්සේට නියම කළ විට එක් භික්ෂුවක් ''ස්වාමීනි ගිලන් භික්ෂුවක් ඇත. හේ මෙහි නො පැමිණියේය''යි කී කල්හි ''අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා පාරිසුද්ධිං දාතුං''යි ගිලන් භික්ඛුව විසින් පාරිසුද්ධිය දෙන්නට අනුදත් සේක. ඉන්පසු ''සන්නිපතථ භික්ඛවෙ සඞ්ඝො කම්මං කරිස්සතීති''යි කම් කරන්නට සංඝයා රැස් වන්නේය යි වදාළ විට පෙරසේ ම එක් භික්ෂුවක් ''ස්වාමීනි මෙහි නො පැමිණි ගිලන් භික්ෂුවක් ඇත''යි කී විට ''අනුජානාමි භික්ඛවෙ ඡන්දං දාතුං''යි ඡන්දය දෙන්නට අනුදත් සේක. උපොසථකරණයට නම් ඡන්දය ත් පාරිසුද්ධිය ත් දෙක ම දියයුතු බව ''අනුජානාමි භික්ඛවෙ තදහු පොසථෙ පාරිසුද්ධිං දෙන්තෙන ඡන්දම්පි දාතුං, සන්ති සංඝස්ස කරණීයන්ති'' (මහාවග්ගපාළි 131) යන නියමයෙන් පෙනේ. ඡන්දය පමණක් දිය යුත්තේ උපොසථය හැර සෙසු විනයකර්ම ගැන ය. ඡන්දපාරිසුද්ධි ගෙන යන්නහු සඟපිරිසට අවුත් අමතක වීමෙන් නො කිවේ නමුත් ඡන්දය ගෙනාවේ වන්නේ ය. නො කීව ද ගිලන් භික්ෂුව ගේ පාරිශුද්ධියට හෝ සඞ්ඝයා ගේ උපොසථ කර්මයට හෝ බාධාවක් නැත. ගිලන් භික්ෂුව ගෙන් පවා ඡන්දය ලබාගෙන සංඝකර්ම කිරීමේ අදහස නම් වර්ගී නොවී සංඝ සාමග්‍රිය ඇතිවීම බව පෙනේ. සාමග්ගි උපොසථයෙහි දී ඡන්දය ගැනීමක් නැත. ගිලන් නො ගිලන් කවුරුත් රැස්විය යුතු ය. ඒ බව ''සබ්බෙහෙව එකජ්ඣං සන්නිපතිතබ්බං ගිලානෙහි ච අගිලානෙහි ච, න කෙනචි ඡන්දො දාතබ්බො'' (මහාවග්ග 413) යී පැවැසේ.

400 **එකං භික්ඛුමුපාගම්ම–නිසීදිත්වාන උක්කුටිං**
**අඤ්ජලිං පග්ගහෙත්වාන–දදෙ ඡන්දං විචක්ඛණො.**

එක් මහණක්හු වෙත එළඹ උක්කුටික ව හිඳ ඇඳිලි බැඳ නුවණැත්තේ ඡන්දය දෙන්නේ ය.

(44) ඡන්දං දම්මි, ඡන්දං මෙ හර, ඡන්දං මෙ අරොචෙහී’ති වත්තබ්බං.

(44) ඡන්දය- අදහස- කැමැත්ත දෙමි, මගේ ඡන්දය ගෙන යව, මගේ ඡන්දය සංඝයාට කියව යි කිය යුතු යි.

(45) පාරිසුද්ධිං දෙන්තෙන පාරිසුද්ධිං දම්මි, පාරිසුද්ධිං මෙ හර, පාරිසුද්ධිං මෙ ආරොචෙහී’ති වත්තබ්බං.

(45) පාරිශුද්ධිය දෙන්නහු විසින් පාරිශුද්ධිය දෙමි, මගේ පාරිශුද්ධිය ගෙන යව, මගේ පාරිශුද්ධිය සංඝයාට දන්වව යි කිය යුතු යි.

401 පාරිසුද්ධිපදානෙන-සම්පාදෙති උපොසථං
සඞ්ඝස්ස අත්තනො චා’පි-සෙසකම්මං විබාධති.

පාරිශුද්ධිය දීමෙන් සඟහට ත් තමහට ත් උපොසථය සපය යි. අප ලෝකනාදි සෙසු කම් කොප්‍ය කෙරේ. (ඒවාට පාරිශුද්ධිදානයෙන් ප්‍රයෝජනයක් නො මැති හෙයිනි.)

402 ඡන්දදානෙන සඞ්ඝස්ස-ඡවගං සාධෙති නා’ත්තනො
තස්මා ඡන්දං දදන්තෙන-දාතබ්බා පාරිසුද්ධි’පි.

ඡන්ද දානයෙන් සංඝයාට පොහොය හා සෙසු සංඝකම් යන දෙක සපය යි. තමහට පොහොය නො සපය යි. ඒ නිසා (තමා පොහෝ නොකළා නම් වන නිසා) ඡන්දය දෙන්නහු විසින් පාරිශුද්ධිය ද දිය යුත්තී ය.

403 හරෙය්‍යෙකො බහුන්නම්පි [1]නො හරෙය්‍ය පරම්පරං
පරම්පරාහටා ඡන්ද-පාරිසුද්ධි න ගච්ඡති.

එක් මහණෙක් බොහෝ දෙනකුන්ගේ ද ඡන්ද- පාරිශුද්ධීන් ගෙන යන්නේ ය. පරම්පරාවෙන් (කෙනෙකුන් කට) නො ගෙන යන්නේ ය. කවින් කට ගෙනෙන ලද ඡන්ද පාරිශුද්ධිහු සඟ මැදට නො යත්. (ඡන්දපාරිශුද්ධීන් කවින් කට සඟමැදට ගෙන ගිය ද වැඩක් නැති බව මේ කී සැටි යි.)

404 සබ්බූපචාරං කත්වාන-එවං දෙය්‍යා පවාරණා

සිවුරු එකස් කොට පෙරැවීමාදි සියලු උපචාර කොට මෙසේ පවුරුණු දෙන්නේ ය.

(46) පවාරණං දම්මි, පවාරණං මෙ හර පවාරණං මෙ ආරොචෙහි මමත්ථාය පවාරෙහී’’ති වත්තබ්බං-

(46) පවුරුණු දෙමි. මගේ පවාරණය ගෙන යව. මගේ පවාරණය සංඝයාට කියව. මා පිණිස පවරව යි (මෙසේ) කිය යුතු යි.

404 ආරොචෙත්වා’ථ සො සඞ්ඝං-පවාරෙය්‍යා’ව මාගතො

පවාරණය ගෙණ ආ මහණ තෙමේ “මෙනම් මහණහු විසින් පවුරුණු දෙන ලදැ යි සංඝයාට ආරොචනය කොට නැවත (“ඉත්ථන්නාමො භන්තෙ” යනාදීන් යටැ දැක්වෙන පරිදි) පවරන්නේ ය.

1 පරම්පර න හාරයෙ. බු. ඉං. ටීකා.

(47) **ඉත්ථන්නාමො භන්තෙ සඞ්ඝං පවාරෙති, දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදන්තු තං ආයස්මන්තො අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සතී''ති.**

(47) ස්වාමීනි මෙනම් මහණ තෙමේ සංඝයා පවර යි. ඇවැත්හු දුටු දෙයකින් හෝ ඇසූ දෙයකින් හෝ සැකයකින් හෝ අනුකම්පා කොට ඔහුට කියත් වා. දක්නේ පහළ කරන්නේ ය කියා යි.

406 **ගහෙත්වා පාරිසුද්ධිං වා-ඡන්දං වා'පි පවාරණං**
**හාරකො සඞ්ඝමප්පත්වා-විබ්භමෙය්‍ය මරෙය්‍ය වා**

පාරිශුද්ධිය හෝ ඡන්දය හෝ පවාරණය හෝ ලබාගෙන සඟමැදට යන මහණ තෙමේ සඟමැදට නො පැමිණ ගිහි වී නම් හෝ මැරේ නම් හෝ–

407 **සාමණෙරාදි භාවං වා-පටිජානෙය්‍ය නාහටා**
**පත්වා සඞ්ඝං තථා හෙය්‍ය-ආහටා හොති හාරකො.**

සාමණේරාදි භාවයක් පිළිදන්නේ නම් හෝ ගෙන යන ලද්දී නොවේ. ඡන්දපාරිසුද්ධි ගෙනයන්නේ සඞ්ඝයාගේ අත්පසට පැමිණ එසේ ගෘහස්ථාදි භාවයට පැමිණියේ නම් ගෙනෙන ලද්දේ වෙයි.

408 **සඞ්ඝප්පත්තො පමත්තො වා-සුත්තො නාරොචයෙය්‍ය වා**
**අනාපත්ති ච සංචිච්ච-නාරොචෙන්තස්ස දුක්කටං.**

සඟුන් වෙත එළැඹියේ පමාවූයේ හෝ නිදන්නේ හෝ ''මෙනම් මහණ විසින් සඳ පිරිසුදු පවුරුණු දෙන ලදැ''යි නො කියා නම් ඇවැත් නැත. දැන දැන නො කියන්නාහට දුකුළා වේ.

---

## 44 උපොසථොති

409 **ද්වෙ උපොසථා චාතුද්දසො පණ්ණරසො ඉති**
**සුත්තුද්දෙස මධිට්ඨාන-පාරිසුද්ධි වසා තයො.**

තුදුස්වක් පොහොය පසළොස්වක් පොහොය යි උපොසථයෝ දෙදෙනෙකි. පාමොක් උදෙසීම් විසින් ඉටත් විසින් පිරිසුදු පොහො විසින් තුන් දෙනෙකි.

**විස්තර**

68 මෙයින් දින වශයෙන් හා කත්තබ්බාකාර වශයෙන් උපොසථ හඳුන්වන ලදි. දින වශයෙන් හැඳින්වීමේ දී චාතුද්දස පණ්ණරස–සාමග්ගි යී තෙ දිනක් දැක්විය යුතු බව ද සාමග්ගි උපෝසථය මෙහි නො දක්වා හැරියේ බිඳුණු සඞ්ඝයා සමගි වූ විට දින වශයෙන් නියම නො කොට කැමති ඕනෑම දවස්හ කළහැකි හෙයින් ය යි සිතේ. **මහාවග්ගපාළියෙහි (120)** ද ''ද්වෙ මෙ භික්ඛවෙ උපොසථා චාතුද්දසිකො ච පණ්ණරසිකො ච'' යී දක්වා තිබේ. අටුවාවන්හි ත් **සිඛවලඳ විනිසාදි** සෙසු පොත් වලත්

චාතුද්දස පණ්ණරස සාමග්ගී යන තුනම අන්තර්ගත ය. මහාවග්ගපාලි යේ කොසම්බක්ඛන්ධකයෙහි 414– 415 පිටුවල සාමග්ගී උපොසථය පහදා තිබේ. ඉතාම අවශ්‍යයෙන් දැක්වුවමනා කොටස පමණක් දැක්වීම මේ පොතේ සිරිත බැවින් උපොසථක්ඛන්ධකයෙහි සඳහන් වන දෙක පමණක් ගෙන මෙසේ දෙකක් දක්වන්නට ඇත.

කාරක වශයෙන් සඞ්ඝ උපොසථ– ගණ උපොසථ– පුග්ගල උපොසථ යන තුන ද මෙහි නම් වශයෙන් දක්වා නැතත් සුත්තුද්දෙසාදි උපොසථ සඳහන් වන විට සංඝ උපොසථාදිය ද ගණන් ගැනේ.

349 චාතුද්දසො

හෙමන්ත ගිම්හ වස්සාන යන තුන් සෘතුන්හි තුන් වන සත් වන පොහෝ දෙක චාතුද්දස නම්. මේ චාතුද්දසිය ලැබෙන්නේ පණ්ණරසී පොහෝ අතර දෙවන සවන පොහෝ කිරීමෙන් පසු තුදුස් දිනකින් පසු වයි. වර්ෂයකට චාතුද්දසුපොසථ සයකි.

350 පණ්ණරසො

පසළොස් දිනකින් පැමිණෙන පොහොය යි. ඊට කලින් පොහොය කොට පසළොස් දිනකින් එන පොහොය පණ්ණරසී නම් වේ. හේමන්ත ගිම්හ වස්සාන යන තුන් සෘතුවෙහි තුන් වන සත් වන පොහෝ දෙක හැර සෙසු පොහෝ සය ම පණ්ණරසීහුයි. කලාතුරකින් පැමිණෙන පොහෝ දසයක් තිබෙන සෘතුවක දී නම් පණ්ණරසී පොහෝ අටකි.

**410 සුත්තුද්දෙසො'ව සංඝස්ස–අධිට්ඨාන උපොසථො**
**පුග්ගලස්ස'ව සෙසානං–පාරිසුද්ධි උපොසථො.**

පාමොක් උසුරුවන පොහොය සඟහට මැ යි. ඉටන් පොහොය පුගුලාට ට යි. දෙදෙන තුන්දෙන යන සෙස්සවුනට පිරිසුදු පොහොය යි.

**411 පුබ්බකිච්චෙ පුබ්බකරණෙ–පත්තකල්ලෙ සමාහිතෙ**
**සුත්තං උද්දිස්සති සඞ්ඝො–පඤ්චධා සො විභාවිතො.**

පූර්ව කෘත්‍ය ද පූර්ව කරණ ද ප්‍රාප්ත කාලය ද පිළියෙළ කළ කල්හි සඞ්ඝ යා පාමොක් උදෙසන්නේ ය. ඒ පාතිමොක්ඛුද්දෙසය පස් ආකාරයකින් බෙදන ලදි.

351 පුබ්බකිච්ච

"ඡන්දපාරිසුද්ධි උතුක්ඛානං–භික්ඛුගණනා ච ඔවාදෙ
උපොසථස්ස එතානි–පුබ්බකිච්චන්ති වුච්චති."

සී දැක්වෙන පරිදි ඡන්දය හා පාරිසුද්ධිය ගෙන ඊම ද සෘතු පිළිවෙළින් පැමිණි උපොසථය කීම ද භික්ෂූන් ගණන් කිරීම ද මෙහෙණින්හට අවවාද දීම ගැන සම්මත මහණුන් විචාරීම ද යන මේ පස පුබ්බකිච්ච නම්. සංඝයා සීමාවට රැස් වැ පාමොක් දෙසන්නට කලින් කටයුතු හෙයින් මේ පස "පුබ්බකිච්ච" නමින් දක්වා තිබේ.

352 පුබ්බකරණෙ

සම්මජ්ජනී පදීපො ච-උදකං ආසනෙන ච
උපොසථස්ස එතානි-පුබ්බකරණන්ති වුච්චති."

උපොසථාගාරය ඇමදීම ද (රෑ නම්) පහන් දැල්වීම ද පානීය පරිභො ජනීය පැන් තැබීම ද අසුන් පැනවීම ද යන මේ පස උපොසථයා ගේ පුබ්බකරණ නම්. සංඝයා ගේ රැස්වීමට පළමුව මහතෙරුන් විසින් අණ වන ලද නවකාදි අඤ්ඤතරයකු විසින් මේ පස කළමනා හෙයින් පුබ්බ කරණ නම්.

353 . පත්තකල්ල

"උපොසථො යාවතිකා ච භික්ඛූ
කම්මප්පත්තා සභාගාපත්තියො ච
න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා
තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති"යි

දැක්වූ පරිදි තුන් උපොසථයෙන් එකක් වීම, උපොසථ කර්මයට පොහෝනා පමණ භික්ෂූන් පැමිණීම, වස්තු සභාගාපත්ති විරහිත බව, වජ්ජ නීය පුද්ගලයන් එහි අත්පස තුළැ නැතිබව යන මේ අංග සම්පූර්ණ වූ විට උපොසථ කර්මයට කල් පැමිණියේ නම් වේ.

354 සුත්තං උද්දිස්සති සඞ්ඝො පඤ්චධා සො විභාවිතො

මෙහි "සුත්තං" යනු ප්‍රාතිමෝක්ෂය යි. ඒ ප්‍රාතිමෝක්ෂයෙහි උද්දෙස පසකි. නිදානුද්දෙස- පාරාජිකුද්දෙස- සංඝාදිසෙසුද්දෙස- අනියතුද්දෙස- විත්ථාරුද්දෙස කියා යි. පාරාජිකුද්දෙසාදීන් අතුරෙන් යමක් අවසන් වූ කල්හි අනතුරක් ඇති වූ කල සෙසු කොටස් ශ්‍රැතියෙන් (ඇසූ විරූ බැවින් එලෙස මෙනෙහි කරන්නට යි) ඇස්වූවැමනා ය. නිදාන කොටස නිදානුද්දෙ සය යි. මෙසේ සෙසු උද්දෙස ද දත්තේ ය. තිස් තිසහි පවිතියේ සිට විත්ථාරුද්දෙසය යි.

412 විනා'න්තරායං සඞ්ඛෙපෙ-නුද්දෙසො විනිවාරිතො
ථේරෙ'ව ඉස්සරෙ භික්ඛූ-උද්දෙසෙසෙව'ත්ථ තිසු වා,
විසදෙසු'ති වුත්තත්තා-අවත්තනෙන'පි වට්ටති.

අනතුරක් නැති ව ලුහුඬින් පාමොක් උදෙසීම වළක්වන ලද්දේ ය. මේ පස්වැදෑරුම් උදෙසීම් අතුරෙහි දෙකක් හෝ තුනක් හෝ (විසදෙසු) වනපොත් (පාඩම්) කල්හි තෙරුන් වහන්සේ ම පාමොක් උදෙසීමට හිමි වෙති යි වදාළ හෙයින් තෙරුනට සියල්ල නුපුහුණු කල්හිදු අනතුරක් නැතිව ම ලුහුඬින් පාමොක් දෙසීම වටී.

විස්තර

69 අනතුරක් ඇති කල්හි ත් ප්‍රාතිමෝක්ෂය ප්‍රගුණ නැති කල්හි ත් සංක්ෂෙපයෙන් දේශනා කළාට වරදක් නැති බව මෙයින් ප්‍රකාශිත යි.

**355 අන්තරායං**

අනතුරක් ඇති කල්හි යනු යි. රාජ- චොර- අග්ගි- උදක- මනුස්ස- අමනුස්ස- වාළ- සිරිංසප- ජීවිත- බ්‍රහ්මචරිය යන දශවිධ අන්තරායෙන් එකක් හෝ වැඩියක් ඇති කල්හි සංක්ෂෙපයෙන් පාමොක් දෙසීම අනුදත්හ. "අනුජානාමි භික්ඛවෙ සති අන්තරායෙ සංඛිත්තෙන පාතිමොක්ඛං උද්දිසිතුං" (මහාවග්ග 121)

**413 ආගච්ඡෙය්‍යුං යදි සමා-උද්දිසන්තෙ'ථ ථොකිකා**
**උද්දිට්ඨං තං සුඋද්දිට්ඨං-සොතබ්බමවසෙසකං.**

පාමොක් උදෙසන විට ආවාසිකයන් හා සම ගණනක් හෝ ආවාසිකයන්ට අඩු ගණනක් හෝ ආගන්තුක භික්ෂූහු එත් නම්, ඔවුන් විසින් ආවාසිකයන් හා එක්ව හිඳ නො උදෙසූ තැන් ඇසිය යුතු යි. උදෙසූ කොටස මනාකොට උදෙසන ලද්දේ ය.

**414 උද්දිට්ඨමත්තෙ සකලා-යෙකච්චාවුට්ඨිතාය වා**
**පාරිසුද්ධිං කරෙය්‍යුං-සන්තිකෙ බහුකා'ථ චෙ**
**කත්වා සබ්බවිකප්පෙසු-පුබ්බකිච්චං පුනු'ද්දිසෙ.**

පාමොක් උදෙසා හුන් කෙණෙහි හෝ සියල්ලන් ම හෝ සමහරුන් හෝ නැඟී සිටිය කල්හි (සම හෝ මඳ හෝ ආගන්තුක සංඝයා ආ නම්) ඒ පොහෝ කළවුන් සමීපයෙහි පිරිසුදු පොහොය කරන්නේ ය. නැවත ආගන්තුක මහණුන් බොහෝ වූහු නම් (සබ්බවිකප්පෙසු) උදෙසන කල්හි ද උදෙසූ කල්හි ද සියලු විධානයන්හි පූර්වකෘත්‍යය කොට නැවත ආදියෙහි පටන් පාමොක් දෙසන්නේ ය.

**415 ආවාසිකානං පණ්ණරසො-ඉතරෙසං සචෙ'තරෙ**
**සමොනෙතරෙ'නුවත්තන්තු-පුරිමානං සචෙ'ධිකා**
**පුරිමා අනුවත්තන්තු-තෙසං සෙසෙස්ව'යං නයො.**

ආවාසිකයන්හට පණ්ණරසී පොහොය ආගන්තුකයන්හට තුදුස්වක් පොහෝ වී නම් සම හෝ මඳ හෝ ආගන්තුකයෝ ආවාසිකයන්හට එකඟ වෙත්වා. ඉදින් ආගන්තුකයෝ වැඩිවෙත් නම්, ඒ ආගන්තුකයන්හට ආවාසිකයෝ එකඟ වෙත්වා. ආවාසිකයන් හට තුදුස්වක් පොහොය ආගන්තුකයන්හට පණුරසි පොහොය වූ කල්හි ද මේ ක්‍රමය මෙසේම යි.

**විස්තර**

70 කලින් පොහෝ කළ දිනයේ සිට පසළොස් දිනක් ගිය විට පණ්ණරසිය ද තුදුස් දවසක් ගිය විට චාතුද්දසිය ද ගණන් ගැනීම සිරිතයි. ඇතැම් විට ඒ ඒ අය ගේ මතානුකූල ව මේ චාතුද්දසී පණ්ණරසී පොහෝ දවස් වෙනස් විය හැකි ය. එබඳු වෙනස් මතයක් ආවාසික හා ආගන්තුක භික්ෂූන් අතර තිබේ නම් ආගන්තුකයන් පිරිස වශයෙන් ආවාසිකයනට වඩා අඩු නම් හෝ ආවාසිකයන් හා සම ගණනක් හෝ වේ නම් ආගන්තුක

යන් විසින් ආවාසිකයන් ගේ අදහසට එකඟ විය යුතු බව ත් යම් හෙයකින් ආගන්තුක පිරිස වැඩි නම් ආගන්තුකයන් ගේ මතයට ආවාසිකයන් එකඟ විය යුතු බව ත් මෙයින් කියනලදි.

416 ආවාසිකානං පාටිපදෙ-ඉතරෙසං උපොසථො
සමථොකානං සාමග්ගිං-මූලට්ඨා දෙන්තු කාමතො
බහි ගන්ත්වාන කාතබ්බො-නො චෙ දෙන්ති උපොසථො.

ආවාසිකයන් හට පැලවිය දිනය ආගන්තුකයන්හට පොහෝ දිනය වී නම් ආවාසිකයෝ (සමථොකානං) තමන් හා සම වූ හෝ මඳ වූ හෝ ආගන්තුකයන් හට කායසාමග්‍රිය කැමැත්තෙන් දෙත් වා. ඉදින් නො දෙත් නම් ආගන්තුකයන් විසින් බැහැර ගොස් පොහොය කටයුතු යි.

417 දෙය්‍යා නිච්ඡාය සාමග්ගි-බහූසු බහි වා වජෙ
ආගන්තුකානං පාටිපදෙ-එවමෙව නයං නයෙ.

ආගන්තුකයන් බොහෝ වූ කල්හි ආවාසිකයන් විසින් නො කැමැත්තෙන් හෝ කායසාමග්‍රිය දියයුත්තේ ය. සීමාවෙන් පිටතට හෝ යන්නේ ය. ආගන්තුකයන්හට පොහෝ දවස ආවාසිකයන් හට පැලවිය වූ කල්හි ද මේ ක්‍රමය (නයෙ) දන්නේ ය. (මෙහි අදහස සුගම බැවින් විස්තර අනවශ්‍ය ය. මේ ගැන **මහාවග්ගපාලියේ 148** වන පිටුවෙහි දක්වෙන කොටස ද මෙය ම බැවින් එය මෙහි බහා නො ලම්හ.)

418 සාවෙය්‍ය සුත්තං සංවිච්ච-අසාවෙන්තස්ස දුක්කටං
සම්මජ්ජිතුං පදීපෙතුං-පඤ්ඤපෙතුං දකාසනං
න කරෙය්‍ය තථා කල්ලො-මහාථෙරෙන පෙසිතො.

පාමොක් අස්වන්නේ ය. දැන දැන නො අස්වන්නා හට දුකුළා වේ. පොහෝ ගෙය හමදනට ද පහන් දල්වන්නට ද නහන පැන් බොන පැන් හා අසුන් පනවන්නට ද මහතෙරුන් විසින් මෙහෙයන ලද නො ගිලන් මහණ නො කෙරේ නම් එසේ ම දුකුළා වේ.

356 සාවෙය්‍ය සුත්තං

පිරිස ලවා ප්‍රාතිමොක්ෂය අස්වන්නේ ය යනු මෙහි අදහස යි. සවග මහණහු පාමොක් දෙසමින් ඕනැකමින් ම පිරිසට නො ඇස්වූහ. ඒ නිමිති කොට "න භික්ඛවෙ පාතිමොක්ඛුද්දෙසකෙන සංවිච්ච න සාවෙතබ්බං, යො නසාවෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (**මහාවග්ගපාලි 124**) යී මෙය පණවා වදාළසේක. පාමොක් දෙසන්නහු විසින් අසන්නන් ගේ රුචිය ඇති වන පරිදි දෙසිය යුතු බව "අනුජානාමි භික්ඛවෙ පාතිමොක්ඛුද්දෙසකෙන වායමිතුං කථං සාවෙය්‍යන්ති, වායමන්තස්ස අනාපත්ති" (**මහාවග්ගපාලි 124**) යන්නෙන් පහද වදාළ සේක. යමෙක් දැන දැන ම අස්වන්නේ නැත්නම්, අසන්නට හැකි පරිදි හඬ නගා නො කියා නම් හෝ රුචි නො වන පරිදි කියා නම් හෝ "අසාවෙන්තස්ස දුක්කටං" යී කී පරිදි දුකුළා වේ.

357 **මහාථෙරෙන පෙසිතො අගිලානො න කරෙය්‍ය**

මහතෙරුන් විසින් හැමදීමාදිය කිරීමට මෙහෙයන ලද නො ගිලන් මහණෙක් එය නො කෙරේ නම් (ඔහුට දුකුළා වන්නේ ය) යනු මෙහි අදහස යි. "න භික්ඛවෙ ථෙරෙන ආණත්තෙන අගිලානෙන න සම්මජ්ජිතබ්බං යො න සම්මජ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස" (**මහාවග්ගපාළි 127**) යි සීමාව හැමදීම් කරන්නට තෙරුන් විසින් අණකරනලද නො ගිලන් මහණකු එය නො කළ විට දුකුළා අවදිත බව ප්‍රකාශිත යි. "ථෙරෙනපි පතිරූපං ඤත්වා ආණාපෙතබ්බං" (**කඞ්ඛාවිතරණී 10**) යි තෙරුන් විසින් ද සුදුස්සකු දැන ඇණැවිය යුතු බව ප්‍රකාශිත යි. "ආණාපෙන්තෙන ච කිඤ්චි කම්මං කරොන්තො වා සදාකාලමෙව එකො වා භාරනිත්ථරකො වා සරභාණක ධම්මකථිකාදීසු අඤ්ඤතරො වා න ආණාපෙතබ්බො" (**විනයත්ථමඤ්ජූසා 32**) යන වාක්‍යයෙන් එය තව දුරට ත් විස්තර කොට දක්ව යි.

## පාරිසුද්ධි උපොසථය

419 **සම්මජ්ජිත්වා පදීපෙත්වා-'පට්ඨපෙත්වා දකාසනං**
**ගණඤත්තිං ඨපෙත්වා'වං-කත්තබ්බො තිහු පොසථො.**

තුන්දෙනා විසින් පොහෝගෙය හැමද පහන් දල්වා තහතපැන් බොන පැන් හා අසුන් එළවා තබා මෙසේ ගණඤත්තිය තබා පොහොය කටයුතු යි.

(48) **සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො පණ්ණරසො යදා'යස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධි උපොසථං කරෙය්‍යාමාති.**

(48) (**පණ්ණරසිය** වීනම්) ඇවැත්හු මා කියන්නක් අසත්වා, අද පණ්ණරසී උපොසථ දවස ය. ඉදින් ආයුෂ්මතුන්හට උපොසථ කාලය සැපත් වීනම් අපි ඔවුනොවුන් පිරිසුදු පොහෝ කරමූ (කියා ඤත්තිය තැබිය යුතු.)

420 **එකංසං උත්තරාසඞ්ගං-කත්වා ථෙරෙන උක්කුටිං**
**නිසීදිත්වා'ඤ්ජලිං තෙනවං-පග්ගය්හ සමුදීරියා**

**පරිසුද්ධො අහං ආවුසො පරිසුද්ධොති මං ධාරෙථාති වදෙ යාවතතියකං.**

තෙරුන් විසින් පොරෝණය එකස් කොට බහා උක්කුටිකයෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුත්තාහු යි.

"ඇවැත්නි මම පිරිසුදු වෙමි, පිරිසුදුය යි සලකාවු" යී තුන්යළ දක්වා කියන්නේ ය.

421 **සමත්තපුබ්බාරම්භෙන-නවෙනෙ'ව මීරියා**

**පරිසුද්ධො අහං භන්තෙ පරිසුද්ධොති මං ධාරෙථා'ති වදෙ යාවතතියකං.**

සිවුරු එකස්කිරීමාදී විසින් නිමි පූර්වකෘත්‍ය ඇති සඟ මහණහු විසින් ඒ දෙදෙන මෙසේ කිය යුත්තාහු යි. "ස්වාමීනි මම පිරිසුදු වෙමි. මා පිරිසුදුය යි සලකවූ" යී තුන්යල දක්වා කියන්නේ ය.

422 **මීසු ථෙරෙන ඛත්තබබං-ඛතෙව්'ව මීරියො නචො.**

**"පරිසුඬො අහං ආවුසො පරිසුඬො'ති මං ධාරෙහි" ති තිකඛත්තුං වත්තබබා.**

දෙදෙනා අතුරෙහි පූර්වකරණාදී කටයුතු කොට තෙරුන් විසින් සඟ මහණතෙමේ මෙසේ කිය යුත්තේ ය. ඇවැත්නි මම පිරිසුදු වෙමි. මා පිරිසුදුය යි දරව" කියා තුන් යලක් කිය යුතු යි.

423 **නචෙන ථෙරෙ තිකඛත්තුං-එවමසස උදීරයො.**

**"පරිසුඬො අහං භනෙත පරිසුඬො'ති මං ධාරෙථාති.**

සඟ මහණ විසින් ස්ථවිර තෙමේ මෙසේ තෙයලක් කිය යුත්තේ ය. "ස්වාමීනි මම පිරිසුදු වෙමි. මා පිරිසුදුය යි සලකවු කියා යි.

## අධිඨාන උපොසථය

424 **පුබබකිචචං සමාපෙත්වා-අධිටෙඨයො'ව මෙකකො.**

**"අජ්ජ මෙ උපොසථො පණ්ණරසො'ති වා චාතුදදසො'ති වා අධිට්ඨාමි'ති වත්තබබං නො චෙ අධිටෙඨය්‍ය දුකකටං-**

හුදකලා මහණ තෙමේ හැමදීමාදී පූර්වකෘත්‍ය නිමවා මෙසේ ඉටත්තේ ය. (පසළොස්වක් වුව) "අද මට පුණ්ණරසී පොහොය යි ඉටමි" කියා ද (තුදුස්වක් වුව) "අද මට තුදුස්වක් පොහොය යි ඉටමි" කියා ද, කියයුතු. නොම ඉටා නම් දුකුළා වේ.

**විස්තර**

71 මෙතෙක් විස්තර කළ උපොසථ අතුරෙන් සතර පිරිසෙන් සිවු නමක් සිටිත විට සංඝ උපොසථය ද තෙනමක් සිටිත විට ගණ උපොසථ ය ද, දෙනමක් සිටිත විට පුද්ගල උපොසථය ද, එක් නමක් පමණක් සිටිත විට අධිට්ඨාන උපොසථය ද කළ යුතු බව මෙතෙක් ප්‍රකාශිත යි. "අනුජානාමි භිකඛවෙ චතුන්නං පාතිමොකඛං උද්දිසිතුං", අනුජානාමි භිකඛවෙ තිණ්ණං පාරිසුඬි උපොසථං කාතුං" "අනුජානාමි භිකඛවෙ චින්නං පාරිසුඬි උපොසථං කාතුං" (**මහාවගගපාළි 133**) යී මුල් උපොසථතුන අනුදත් සැටි යි. තෙ නම සිටිත විට ත් දෙ නම සිටිත විට ත් පාරිශුඬි උපොසථය කළ යුතු බව මෙහි දී වදාළෙන් ඒ දෙකෙහි වෙනස මඳක් දත මනා ය. තුන් නමක් සිටිත විට කරන ගණ උපොසථය යි නම් ලත් පාරිසුඬි උපොසථය "සුණාතු මෙ ආයස්මන්තා" යනාදි වශයෙන් ඤත්තිය තබා කිරීම වෙනසි.

අධිට්ඨාන උපොසථය කටහැක්කේ පොහෝ ගෙය හැමදීමාදී කිස කොට නිමවා පසුදුව අරුණ නගින්නට ආසනත වත තුරු ත් අන් උප

සපන් සොතසුන් නො එන බව හැගේ නම් පසළොස්වක් වූව "අජ්ජ මෙ උපොසථො පණ්ණරසො" කියා ද තුදුස්වක් වූව "අජ්ජ මෙ උපොසථො චාතුද්දසො" කියා ද ඉටාගත යුතු යි.

425 **යත්ථ වසන්ති චත්තාරො-තයො වා යදි වා දුවෙ**
**පාරිසුද්ධිං හරිත්වාන-එකෙකස්සිතරීතරෙ**
**තං තං උපොසථං කයිරුං-සියා ආපත්ති දුක්කටං.**

යම් වෙහෙරෙක්හි සතර දෙනෙක් හෝ තුන් දෙනෙක් හෝ දෙදෙනෙක් හෝ වසත් ද, ඒ විහාරයෙහි එකක් එකක්හු ගේ පාරිසුද්ධිය ගෙන (ඉතරීතරෙ) තුන් දෙනෙක දෙදෙනෙක එක් කෙනෙක යන අතික් අතික් මහණහු සඟ පොහොය ගණ පොහොය පුගුල් පොහොය යන ඒ ඒ පොහෝ ඉදින් කළෝ වූහු නම් දුකුළා ඇවැත් වන්නී ය. (මෙහි පුගුල් පොහෝය යි ගත්තේ අධිට්ඨාන උපොසථය යි.)

**විස්තර**

72 මේ ගාථායෙන් ප්‍රකාශිත කරුණ හොඳින් පැහැදිළිකර ගැනීමට නම් මේ කරුණ **මහාවග්ගපාලියෙහි** දක්වෙන්නේ කෙසේදැයි සලකා බැලුව මනා ය. තත්‍ර භික්ඛවෙ යත්ථ චත්තාරො භික්ඛූ විහරන්ති න එකස්ස පාරිසුද්ධිං ආහරිත්වා තීහි පාතිමොක්ඛං උද්දිසිතබ්බං, උද්දිසෙය්‍යුං චෙ ආපත්ති දුක්කටස්ස. තත්‍ර භික්ඛවෙ යත්ථ තයො භික්ඛූ විහරන්ති, න එකස්ස පාරිසුද්ධිං ආහරිත්වා ද්වීහි පාරිසුද්ධි උපොසථො කාතබ්බො, කරෙය්‍යුං චෙ ආපත්ති දුක්කටස්ස. තත්‍ර භික්ඛවෙ යත්ථ ද්වෙ භික්ඛූ විහරන්ති, න එකස්ස පාරිසුද්ධිං ආහරිත්වා එකෙන අධිට්ඨාතබ්බො, අධිට්ඨහෙය්‍ය චෙ ආපත්ති දුක්කටස්සාති" (**මහාවග්ගපාලි 134**) මෙයින් ඒ ඒ උපොසථකර්ම යන් කිරීමට හැකි අඩු ගණන ම සිටින විට පාරිශුද්ධිය ගෙන ඒ ඒ උපොසථකර්ම නො කටයුතු බව වදාළ සේක. දෙ නමක් සිටින විට පුද්ගල උපොසථය යි දක්වෙන පාරිශුද්ධි උපොසථය කළ යුතුව තිබිය දී එක නමක ගේ පාරිශුද්ධිය ගෙන අධිට්ඨාන උපොසථය නො කළ යුතු බව ද මෙහි ප්‍රකාශිත යි. (කුදුසික ටීකායෙහි දක්වෙන්නේ මීට වෙනස් මතයකි.)

426 **වග්ගෙ සමග්ගෙ වග්ගො'ති-සඤ්ඤිනො විමතිස්ස වා**
**දුක්කටං කරතො හෙද-ධිප්පායෙන ථුල්ලච්චයං**
**වග්ගෙ සමග්ගෙනා'පත්ති-සමග්ගො ඉති සඤ්ඤිනො.**

වර්ගී සංඝයා කෙරෙහි හා සමගි සංඝයා කෙරෙහි වර්ගීය යන හැඟීම ඇත්තාහට ද සමගි සංඝයා කෙරෙහි විමති ඇත්තා හට ද දුකුළා වේ. නො ආ භික්ෂූන් ඇති බව දැන දැන "නස්සන්තෙ'තෙ විනස්සන්තෙ'තෙ කො තෙහි අත්ථො" යනාදීන් සිතා හෙද සිතින් කරන්නහුට තුලැසි වේ. වර්ගී සංඝයා කෙරෙහි සමගිය යන හැඟීම ඇත්තාහට ත් සමගි සංඝයා කෙරෙහි සමගිය යන හැඟීම ඇත්තා හට ත් අනාපත්ති යි.

427 **උක්ඛිත්තස්ස ගහට්ඨස්ස-සෙසානං සහධම්මිනං**
**පාරාජිකස්ස'භබ්බස්ස-සික්ඛා නික්ඛිත්තකස්ස ච**

### 428 නිසින්න පරිසායඤ්ච-සභාගාපත්තිකො තථා ඡන්දෙන පරිවුත්ථෙන-පාතිමොක්ඛං න උද්දිසෙ.

උක්ෂේපනී කම් කරන ලද අයත්, ගිහියා ත්, භික්ෂූන් හැර සෙසු සහ ධම්මිකයනු ත්, පරිජි අවන් මහණ ත්, පණ්ඩකාදි අභව්‍යයනු ත් ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය කළහු ත්, (යන මොවුන්) හුන් පිරිසෙහි ද, එසේ ම වස්තු සභාග ඇවැත් ඇති සංඝයා ද, පරිවුත්ථ ඡන්ද ඇතිව ද (කලින් ගෙන මූද හළ ඡන්දයෙන්) පාමොක් නො උදෙසන්නේ ය.

**විස්තර**

73 පාමොක් නො දෙසිය යුතු අවස්ථා මෙයින් ප්‍රකාශ කරන ලදි. මේ ප්‍රකාශයට ආශ්‍රය කැරුගත් දෙශනා පාළිය පහත පළ වේ. "න භික්ඛවෙ භික්ඛුනියා නිසින්නපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං යො උද්දිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස. න සික්ඛමානාය- න සාමණෙරස්ස- න සාමණෙරියා- න සික්ඛං පච්චක්ඛාතකස්ස- න අන්තිමවත්ථුං අජ්ඣාපන්නකස්ස- න ආපත්තියා අදස්සනෙ උක්ඛිත්තකස්ස නිසින්නපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං, යො උද්දිසෙය්‍ය යථාධම්මො කාරෙතබ්බො. න පණ්ඩකස්ස නිසින්නපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං යො උද්දිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස. න ථෙය්‍ය සංවාසකස්ස- න තිත්ථියපක්කන්තකස්ස- න තිරච්ඡානගතස්ස- න මාතුඝාතකස්ස- න පිතුඝාතකස්ස- න අරහන්තඝාතකස්ස- න භික්ඛුනිදූසකස්ස- න සඞ්ඝභෙදකස්ස- න ලොහිතුප්පාදකස්ස- න උභතොබ්‍යඤ්ජනකස්ස- නිසින්නපරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං යො උද්දිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස. න භික්ඛවෙ පාරිවාසිකපාරිසුද්ධිදානෙන උපොසථො කාතබ්බො අඤ්ඤත්‍ර අවුට්ඨිතාය පරිසාය. න ච භික්ඛවෙ අනුපොසථෙ උපොසථො කාතබ්බො අඤ්ඤත්‍ර සඞ්ඝසාමග්ගියා'ති." (**මහාවග්ගපාළි 152**) මෙහි දක් වූ පාරිවාසික පාරිසුද්ධ දානය නම් "**ඡන්දෙන පරිවුත්ථෙන**" යි ප්‍රකාශිත පරිවුත්ථ ඡන්ද (පාරිසුද්ධි) ය යි. එය "චතුබ්බිධං පාරිවාසියං: පරිස පාරිවාසියං රත්ති පාරිවාසියං ඡන්දපාරිවාසියං අජ්ඣාසය පාරිවාසියන්ති. පරිස පාරිවාසියං නාම භික්ඛූ කෙනචි දෙව කරණීයෙන සන්නිපතිතා හොන්ති, අථ මෙඝො වා උට්ඨහති උස්සාරණා වා කයිරති මනුස්සා වා අජ්ඣොත්ථරන්තා ආගච්ඡන්ති, භික්ඛූ අනොකාසො මයං අඤ්ඤත්‍ර ගච්ඡාමාති ඡන්දං අවිස්සජ්ජෙත්වා'ව උට්ඨහන්ති, ඉදං පරිසපාරිවාසියං, කිඤ්චාපි පරිස පාරිවාසියං ඡන්දස්ස පන අවිස්සට්ඨත්තා කම්මං කාතුං වට්ටති, පුන භික්ඛූ උපොසථාදීනි කරිස්සාමාති රත්තියං සන්නිපතිත්වා යාව සබ්බෙ සන්නිපතන්ති, තාව ධම්මං පුණිස්සාමාති එකං අජ්ඣෙසන්ති. තස්මිං ධම්මකථං කථෙන්තෙයෙව අරුණො උග්ගච්ඡති, සචෙ චාතුද්දසිකං උපොසථං කරිස්සාමාති නිසින්නා පණ්ණරසොති කාතුං වට්ටති. සචෙ පණ්ණරසිකං කාතුං නිසින්නා පාටිපදෙ අනුපොසථෙ උපොසථං කාතුං න වට්ටති, අඤ්ඤං පන සඞ්ඝකිච්චං කාතුං වට්ටති. ඉදං රත්ති පාරිවාසියං නාම. පුන භික්ඛූ කිඤ්චිදෙව අබ්භානාදිසංඝකම්මං කරිස්සාමාති නිසින්නා හොන්ති, තත්‍රෙ'කො නක්ඛත්තපාඨකො භික්ඛු

එවං වදති: අජ්ජ නක්ඛත්තං දරුණං; මා ඉමං කම්මං කරොථාති, තෙ තස්ස වචනෙන ඡන්දං විස්සජ්ජෙත්වා තත්ථෙව නිසින්නා හොන්ති, අථ'ඤ්ඤො ආගන්ත්වා "නක්ඛත්තං පතිමානෙන්තං අත්ථො බාලං උපච්චගා'ති" කිං නක්ඛත්තෙන කරොථාති වදති, ඉදං ඡන්දං පරිවාසියඤ්චෙව අජ්ඣාසය පාරිවාසියඤ්ච; එතස්මිං පාරිවාසියෙ පුන ඡන්දපාරිසුද්ධිං අනානෙත්වා කම්මං කාතුං න වට්ටති" (**සමන්තපාසාදිකා 707**)

මේ විස්තරයෙන් මෙහි ලා ගතයුත්තේ ඡන්දපාරිවාසිය පමණකි. භික්ෂූන් අබ්භානාදි කර්මයක් කිරීමට සූදානම් ව හුන් කලැ එක් නැකැත් පාඨක භික්ෂුවක් "අද දරුණු ය එබැවින් මේ කර්මය නො කරවූය" යි කී කල්හි ඒ භික්ෂූහු ඔහු ගේ වචනයෙන් ඡන්දයත් අත්හැරදමා එහි ම සිටිත්. එවිට අනෙකෙක් අවුත් "නැකැස් ගරුකිරීමෙන් යහපත ඉක්මයන්නේ ය"යි එහි නිසරුකම පෙන්වා දෙයි. මේ ඡන්දය "පාරිවාසිය" නමි. නැවැත ඡන්දය නො ගෙන්වා විනයකර්ම කරන්නට නො වටී. මෙහි දක්වූ "ඡන්දෙන පරිවුත්ථෙන" යන දෙ පදයට කලින් ගෙන වුත් මූද හැරී ඡන්දයෙන් සී ගත නිවරද ය. ඒ පරිවුත්ථ ඡන්දයෙන් උපොසථ කරණය වළක් වන ලදි. "**පාරිවාසියෙන ඡන්ද දානෙනාති** පරිවුත්ථෙන න විකප්ප වුත්ථෙන විගතෙන ඡන්දදානෙනාති අත්ථො, ඡන්දවිස්සජ්ජන මත්තෙන වා" (**විමතිවිනොදනී 352**)

429 **අදෙසයිත්වානා'පත්තිං–නාවිකත්වාන වෙමතිං**
**අනුපොසථෙ'පි වා කාතුං–'පොසථො න ච කප්පති.**

අවන් ඇවැත් නො දෙසා ද, විමති ඇති ඇවැත් පහළ නො කොට ද, පොහෝ නො වන දිනයෙහි ද පොහෝ කිරීම අකැප යි.

430 **අට්ඨිතො පොසථා වාසා–න වජෙ තදහු විනා**
**අන්තරායං ච සඞ්ඝං වා–'ධිට්ඨාතුං සීමමෙව වාති.**

නො සිදී පවත්වන සංඝුපොසථ ඇති වෙහෙරින් රජාදි අන්තරායක් හෝ සඞ්ඝපහෝනක මහණුන් හෝ නැති ව නො යන්නේ ය. ඉටන් පොහෝ කිරීම පිණිස අන් උපසපනුන් සිටින සීමාවකට ද නොයන්නේය.

---

## 45 පවාරණා'ති

431 **ද්වින්නං තිණ්ණං චතුන්නං වා–අඤ්ඤමඤ්ඤපවාරණා**
**එකස්ස ච අධිට්ඨානං–සෙසා සංඝ පවාරණා.**

දෙදෙනා හට ත් තිදෙනා හට ත් සිවුදෙනා හට ත් අන්‍යොන්‍ය පවුරුණු ය. එකක්හට වනාහි ඉටන් පවුරුණු ය. පස්දෙනා පටන් කරන සෙසු පවුරුණු සඟ පවුරුණු යි.

**විස්තර**

**74** මෙයින් දෙදෙන- තිදෙන- සිවුදෙන සිටිත් විට අඤ්ඤමඤ්ඤ පවාරණය ද එක්කෙනකුන් හට අධිෂ්ඨාන පවාරණය ද පස්දෙනා ගේ සිට වැඩිදෙනෙකුන් කරණ පවාරණය සඞ්ඝ පවාරණය යි ද කියන ලදි.

පෙරළ කොසොල් දනව්වෙහි එක් ආවාසයක මිත්‍ර භික්ෂු සමූහයක් වි
වැස "වස් කාලය තුළ ඔවුනොවුන් කතා නො කොට සිටිමින් යම් කෙ
කුන් පිඬු සිඟා කලින් පැමිණි විට අසුන් පැණවීමාදිය ඔහු විසින් ස
යුතු ය" යනාදි කළමනා සියල්ල ගැන කතිකා කොට එලෙස ම වස්කාල
ගෙවා සැවැත්නුවරට ගොස් භාග්‍යවතුන් වහන්සේ දක්නට ගියහ. ඒ භි
ක්ෂූන් දුටු බුදුරජාණන් වහන්සේ වස්කාලය ගෙවූ සැටි ඔවුන් ගෙන් දැ
ගෙන ඊට නින්දා කොට "මහණෙනි මූගව්‍රතය සමාදන් නො විය යුතු
යමෙක් සමාදන් වේ නම් දුකුළා ඇවැත් වේය යි වදාරා "අනුජානාමි භික්
වෙ වස්සං වුත්ථානං භික්ඛූනං තීහි ඨානෙහි පවාරෙතුං, දිට්ඨෙන වා සුතෙ
වා පරිසඞ්කාය වා, සා වො භවිස්සති අඤ්ඤමඤ්ඤානුලොමතා ආපත
වුට්ඨානතා විනයපුරෙක්ඛාරතා" (මහාවග්ග 179) යී වස් විසූ භික්ෂූන්
පවාරණය අනුදත් සේක.

432 පුබ්බකිච්චෙ පුබ්බකරණෙ-පත්තකල්ලෙ සමානිතෙ
ඨපෙත්වා ඤත්තිං සඞ්ඝෙන-කාතබ්බෙ'වං පවාරණා.

පූර්වකෘත්‍යය ද පූර්වකරණය ද ප්‍රාප්තකාලය ද පිළියෙළ කළ කල
ඥප්තිය තබා සඞ්ඝයා විසින් මෙසේ පවාරණය කටයුතු යි.

ඥප්තිස්ථාපනය

(49) සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අජ්ජපවාරණා (පණ්ණර
යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො (තෙවාචිකං) පවාරෙය්‍ය-

(49) ස්වාමීනි සංඝතෙමේ මා කියන්නක් අසාවා, අද පසළොස්
රුණු දිනය යි. ඉදින් සඞ්ඝයාහට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝතෙ
(තෙවරක් කියා) පවරන්නේ ය. (කියා යි.)

(චාතුද්දසී- සාමග්ගී- පවාරණ දිනයන්හි අජ්ජපවාරණා චාතුද
කියා ද- අජ්ජපවාරණා සාමග්ගී කියා ද වෙනස් කර ගත යුතු යි. එසෙ
ද්වෙවාචිකා- එකවාචිකා- සමානවස්සිකා පවාරණයන්හි දී තෙවාචිකං
වචනය වෙනුවට ද්වෙවාචිකං- එකවාචිකං- සමානවස්සිකං යී යොදා
යුතු යි.

433 එකංසං චීවරං කත්වා-නිසීදිත්වාන උක්කුටිං
අඤ්ජලිං පග්ගහෙත්වාන-සඞ්ඝො-පග්ගය්හ සමුදීරියො.

තෙරුන් විසින් සිවුර එකස් කොට උක්කුටිකයෙන් හිඳ ඇඳිලි
සඞ්ඝතෙමේ (සඞ්ඝයාට) කිය යුත්තේ ය.

(50) "සඞ්ඝං ආවුසො පවාරෙමි, දිට්ඨෙන වා සුතෙන වා
සඞ්කාය වා; වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය පස්සන්
පටිකරිස්සාමි, දුතියම්පි ආවුසො සඞ්ඝං පවාරෙමි -පෙ- තතිය
ආවුසො සඞ්ඝං පවාරෙමි -පෙ- පටිකරිස්සාමි"ති

(50) ඇවැත්නි සඞ්ඝයා පවරමි, ආයුෂ්මත්හු දුටුදෙයකින් හෝ
දෙයකින් හෝ සැක කළ දෙයකින් හෝ මට අනුකම්පා උපදවා කියන

අවන් ඇවැත් දක්නෙම් පහළ කෙරෙමි– දෙවනවට ද ඇවැත්හි සඞ්ඝයාට පවරමි –පෙ– තුන්වනවට ද ඇවැත්හි සඞ්ඝයාට පවරමි –පෙ– පහළ කෙරෙමි.

434 **පවාරෙන්තෙසු ථෙරෙසු–නිසජ්ජුක්කුටිකං නවො**
**පවාරෙති සයං යාව–උක්කුටිකො'ව අච්ඡතු**
**පුබ්බාරම්භං සමාපන්නා–නවො සංඝමුදීරයෙ.**

**“සංඝං භන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා, –පෙ– දුතියම්පි භන්තෙ සංඝං පවාරෙමි –පෙ– තතියම්පි භන්තෙ සංඝං පවාරෙමි –පෙ– පටිකරිස්සාමී”ති.**

සථවිර භික්ෂූන් උක්කුටිකයෙන් හිඳ පවරණ කල්හි සඟ මහණතෙමේ යම්තාක් පවරුද ඒතාක් උක්කුටිකයෙන් ම හිඳීවා. සඟ මහණ තෙමේ පූර්වකෘත්‍යය නිමවා සඞ්ඝයාට මෙසේ කියන්නේ ය.

ස්වාමීනි මම සඞ්ඝයාට පවරමි. –පෙ–.

**විස්තර**

**75** වැඩි මහලු තෙරුන් පවරා අවසන් වූ පසු සිය පවාරණය ත් අවසන් කොට අසුන්හි හිඳ ගතයුතු බව මෙයින් ප්‍රකාශිත යි. “න භික්ඛවෙ ථෙරෙසු භික්ඛූසු උක්කුටිකං නිසින්නෙසු පවාරයමානෙසු ආසනෙසු අච්ඡිතබ්බං, යො අච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ සබ්බෙහෙව උක්කුටිකං නිසින්නෙහි පවාරෙතුං” යි තෙරුන් පවරද්දී හිඳ ගැනීම ත් හැමදෙන ම පවරා අවසන් වනතුරු උක්කුටිකයෙන් හිඳීමට ත් අනුදත් සේක. ඉන්පසු මහලු තෙර කෙනෙක් සියල්ලන් පවරා අවසන් වනතුරු උක්කුටිකයෙන් සිටි හෙයින් මූර්ඡා වී වැටුණහ. ඒ කරුණ නිමිති කොට “අනුජානාමි භික්ඛවෙ තදනන්තරා උක්කුටිකං නිසීදිතුං යාව පවාරෙති පවාරෙත්වා ආසනෙ නිසීදිතුං” (මහාවග්ගපාළි **180**) යි තමන් පවරා අවසන් වනතුරු උක්කුටිකයෙන් හිඳින්නට නියම කළ සේක.

435 **දානෙන ධම්මසාකච්ඡා–කලහෙහි ච රත්තියා**
**තෙවාචිකාය ඔකාසෙ–'සති ඛෙපිත භාවතො**
**අන්තරායෙ දසවිධෙ–ඤත්තිං වත්වා'නුරූපතො.**

ගිහි මිනිසුන්ගේ දන්දීමෙන් ද භික්ෂූන් ගේ ධර්මසාකච්ඡායෙන් ද කලහයෙන් ද රෑ ගෙවීගිය හෙයින් ද තෙවාචික පවාරණයට (තෙවරක් කීමට) අවකාශයක් නැති කල්හි ද දශවිධ අන්තරාය ඇති කල්හි ද සුදුසු පරිද්දෙන් ඤත්තිය තබා පවරන්නේ ය.

(51) **සුණාතු මෙ භන්තෙ සඞ්ඝො මනුස්සෙහි දානං දෙන්තෙහි භික්ඛූහි ධම්මං සාකච්ඡන්තෙහි කලහං කරොන්තෙහි යෙභුය්‍යෙන රත්ති ඛෙපිතා; සචෙ සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති අප්පවාරිතොව සඞ්ඝො භවිස්සති අථායං රත්ති විභායිස්සති”ති වා– අයං රාජන්තරා**

**යො -පෙ- අයං බ්‍රහ්මචරියන්තරායො, සබ්බො සඞ්ඝො තෙවාචිකං පවාරෙස්සති, අප්පවාරිතො'ව සඞ්ඝො භවිස්සති අථායං බ්‍රහ්මචරියන්තරායො භවිස්සති යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ද්වෙවාචිකං- එකවාචිකං සමානවස්සිකං පවාරෙය්‍යා''ති.**

(51) ස්වාමීනි සඞ්ඝතෙමේ මා කියන්නක් අසාවා; දන්දෙන මිනිසුන් විසින් ද ධර්මසාකච්ඡා කරන, කෝලාහල කරන භික්ෂූන් විසින් ද බොහෝ සෙයින් රාත්‍රිය ගෙවන ලදි. ඉදින් සඞ්ඝයා තෙවාචික ව පවරා නම් සඞ්ඝ තෙමේ නො පවරණ ලද්දේ ම වන්නේ ය. තැවත මේ රාත්‍රි තොමෝ එළි වන්නේය යි හෝ- මේ රාජන්තරාය ය -පෙ- මේ බ්‍රහ්මචර්යාන්තරාය ය, ඉදින් සඞ්ඝ තෙමේ තෙවාචික ව පවරා නම් සඞ්ඝතෙමේ නො පවරණ ලද් දේ ම වන්නේ ය. තැවැත මේ බ්‍රහ්මචර්යාන්තරාය වන්නේ ය; ඉදින් සඞ්ඝයාට පවාරණ කර්මයට කාලය පැමිණියේ නම් සඞ්ඝතෙමේ ද්වෙවාචික ව (දෙවරක් කියා) එකවාචික ව (එකවරක් කියා) සමානවස්සික ව (වස් වශයෙන් එක ගණන් ඇතියන් එකතුව) පවරන්නේ ය.

**විස්තර**

76 මෙහි පෙළෙහි කී කරුණු නිසා පවාරණ දින රාත්‍රිය ගත වන්නට යේ නම් ද්වෙවාචික එකවාචික පවාරණ සහ සමානවස්සික පවාරණය ද කටහැකි බව මෙයින් කියන ලදි. තෙවාචිකව පවරණ බව පවසමින් ඤත්තිය තබා ද්වෙවාචික- එකවාචික- සමානවස්සික පවාරණ ද නො වටී. ''ද්වෙවාචිකං'' යී කීකල එකවාචිකය ද සමානවස්සිකය ද නො වටී. ''එකවාචිකං'' යී කීකල සමානවස්සිකය පමණක් නො වටී. ''සමානවස්සිකං''යී කීකල සියල්ල වටී. (**සමන්තපාසාදිකා 800**)

436 **පවාරෙය්‍යානුරූපෙන-යථාඨපිත ඤත්තියා**
**ආගච්ඡෙය්‍යුං යදි සමා-ආදිකා චෙත්ථ ආහරෙ**
**එවං තිචතු වග්ගො සො-ඤත්තිං ඨපා පවාරයෙ.**

**සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජපවාරණා (පණ්ණරසී) යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පවාරෙය්‍යාමා'ති.**

ඤත්තිය තැබූ සැටියෙන් සුදුසු සේ පවරන්නේ ය. යට උපොසථයෙහි කියන ලද ''ආගච්ඡෙය්‍යුං යදි සමා'' ආදි වශයෙන් කී ගාථාවන් ද මේ පවාරණයට ත් ගෙනෙන්නේ ය. තුන්දෙනකුන් හා සතර දෙනකුන් සම්බන්ධ තිවග්ග චතුවග්ග වූ ගණයා ද ඤත්තිය තබා මෙසේ පවරන්නේ ය.

''ආයුෂ්මත්නි, මා කියන්නක් අසත් වා. අද (පණ්ණරසී) පවාරණ දිනය යි. ඉදින් ආයුෂ්මත්වරුන්හට පැමිණි කල් ඇත්තේ නම් අපි ඔවුනොවුන්හට පවරමු'' කියා යි.

437 **එකංසං උත්තරාසඞ්ගං-කත්වා ථෙරෙන උක්කුටිං**
**නිසීදිත්වාඤ්ජලිං තෙ'වං-පග්ගය්හ සමුදීරියා.**

**අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා, වදන්තු මං ආයස්මන්තා අනුකම්පං උපාදාය පස්සන්තො පටි**

කරිස්සාමි, දුතියම්පි- තතියම්පි අහං ආවුසො ආයස්මන්තෙ පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා, වදන්තු මං ආයස්මන්තො අනුකම්පං උපාදාය, පස්සන්තො පටිකරිස්සාමී''ති. නවෙනපි ''අහම්භන්තෙ ආයස්මන්තෙ පවාරෙමි -පෙ- පටිකරිස්සාමි. දුතියම්පි -පෙ- පටිකරිස්සාමි- තතියම්පි අහං භන්තෙ ආයස්මන්තෙ පවාරෙමි -පෙ- පටිකරිස්සාමී''ති.

438 භික්ඛු ථෙරෙන කතබ්බං නවො කතෙව භීරියො

''අහං ආවුසො ආයස්මන්තං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසංකාය වා වදතු මං ආයස්මා අනුකම්පං උපාදාය පස්සන්තො පටිකරිස්සාමි. දුතියම්පි -පෙ- තතියම්පි ආවුසො අහං ආයස්මන්තං -පෙ- පටිකරිස්සාමීති. නවෙනා'පි අහං භන්තෙ ආයස්මන්තං පවාරෙමි -පෙ- පටිකරිස්සාමි. දුතියම්පි -පෙ- තතියම්පි -පෙ- පටිකරිස්සාමී''ති.

439 පුබ්බකිච්චං සමාපෙත්වා-අධිට්ඨෙය්‍යෙ'ව මෙකකො.

(52) අජ්ජ මෙ පවාරණා චාතුද්දසීති වා පණ්ණරසීති වා අධිට්ඨාමීති වත්තබ්බං-

437- 438-439 ගාථා 420- 422- 424 වැනි ගාථා මෙනි. වාක්‍යයන්ගේ වෙනස ''සංඝං'' යන වචනය වෙනුවට ආයසමන්තෙ- ආයසමන්තං යන වචන යෙදීම පමණී.

440 යස්මිං වසන්ති වා පඤ්ච-චත්තාරො වා තයො දුවෙ
පවාරණං හරිත්වාන-එකෙකස්සි'තරීතරෙ

441 තං තං පවාරණං කයිරුං-සියා ආපත්ති දුක්කටං
සෙසා උපොසථෙ වුත්තා-ගාථායො චෙත්ථ ආහරෙ.

යම් වෙහෙරෙක පස්දෙනෙක් හෝ සිව්දෙනෙක් හෝ තිදෙනෙක් හෝ දෙදෙනෙක් හෝ වසද්ද, ඒ එකක් එකක්හු ගේ පවුරුණු ගෙන හැර (ඉතරීතරෙ- සතර දෙනෙක, තුන්දෙනෙක, දෙදෙනෙක යන) අනික් අනික් මහණහු (තං තං පවාරණං- සඟ පවුරුණු ය ගණ පවුරුණු ය පුගුල් පවුරුණු ය යන) ඒ ඒ පවුරුණු කළාහු නම් දුකුළා ඇවැත් වන්නී ය. උපොසථයෙහි කියන ලද සෙසු (වග්ගෙ සමග්ගසඤ්ඤිනො යනාදි) ගාථාවන් මේ පවුරුණට ද ගෙනෙන්නේ ය. (මේ 440 වැනි ගාථාව 425 වැනි ගාථාවට සම සි.)

442 පවාරිතෙ ච සඞ්ඝම්හි-පාරිසුද්ධිං උපොසථං
කරෙය්‍ය ජීනනවසෙසා ච-අවුත්ථොවා'නු පාගතො.

පෙර වස්විසූ සඞ්ඝයා පැවැරූ කල්හි පෙරවස් එළඹ වස් සුන් තැනැත්තේ ද පසුවස් එළඹ වස් වෙසෙමින් හුන් තැනැත්තේ ද, සිහි නැති ව වස් නො එළැඹි තැනැත්තේ ද (ඒ සඞ්ඝයා අතර සිටියේ නම්) පිරිසුදු පොහෝ කරන්නේ ය.

443 චාතුමාසිනියා වා'පි-කතෙ සඞ්ඝෙනු'පොසථෙ
වුත්ථවස්සා පවාරෙය්‍යුං-සචෙ අප්පතරා සියුං.

සාරමසින් වන ඉල් මස පවුරුණුහි ද පෙරවස්හි වස් විසූ සඟහු විසින් පොහෝ කළ කල්හි පසුවස් වැසූ භික්ෂූහු මඳ වූහු නම් පවරන්නාහු යි.

**විස්තර**

77 පසුවස් පවාරණ කරන ද පෙරවස් පවාරණය කළ භික්ෂූන් ද ඒ සීමායෙහි සිටින විට කළයුතු සැටි මේ ගාථායෙන් ප්‍රකාශිත ය.(පළමු ගාථා යෙන් පෙරවස් පවාරණ ද පසුවස් විසූවන් සිටින කල්හි කළ යුතු සැටි පහදා දෙන ලදි.) එය පහදා ලන අටුවාවේ "කත්තික චාතුමාසිනියා පවාරණාය පන සචෙ පඨමං වස්සූපගතෙහි මහා පවාරණාය පවාරිතෙහි පච්ඡා උපගතා අධිකතරා වා සමසමා වා හොන්ති, පවාරණ ඤත්තිං ඨපෙත්වා පවාරෙතබ්බං; තෙහි පවාරිතා පච්ඡා ඉතරෙහි පාරිසුද්ධි උපොසථො කාතබ්බො. අථ මහාපවාරණාය පවාරිතා බහූ භික්ඛූ හොන්ති, පච්ඡා වස්සූපගතා ථොකතරා වා එකො වා පාතිමොක්ඛෙ උද්දිට්ඨෙ පච්ඡා තෙසං සන්තිකෙ තෙන පවාරෙතබ්බං." (**සමන්තපාසාදිකා 802**) යි පසුවස් පවාරණ දිනයෙහි පෙරවස් පවාරණය කළ භික්ෂූන්ට වඩා වැඩි සංඛ්‍යාවක් හෝ සම ගණනක් පසුවස් පවාරණයට සිටින විට පසුවස් පවාරණය කොට ඒ ඒ පැවැරූ භික්ෂූන් වෙත පෙරවස් පැවැරූවන් පිරිසුදු පොහොය කළමනා ය. පෙරවස් පැවැරූවන් වැඩි සංඛ්‍යාවක් සිටින විට පළමු කොට පාමොක් දෙසූ කල්හි පසුව පවාරණය කළමනා ය. යනු එහි කෙටි භාවය යි.

---

## 46 සංවරෝ'ති

444 චක්ඛුසොතාදිභෙදෙහි-රූපසද්දාදිගොචරෙ
අභිජ්ඣා දොමනස්සාදි-පවත්තිං විනිවාරයෙ.

චක්ෂුඃ ශ්‍රොත්‍රාදි භෙද ඇති සඳෙරින් රූපශබ්දාදි ඉෂ්ටානිෂ්ට ආර මුණෙහි අභිධ්‍යාදෞර්මනස්‍යාදි කෙලශයන් ගේ හටගැනීම වළකන්නේ ය.

445 නිග්ගණ්හෙය්‍ය සකං චිත්තං-කිට්ඨාදිං විය දුප්පසුං
සතිමා සම්පජානො'ව-චරෙ සබ්බිරියාපථෙ'ති.

(කිට්ඨාදිං දුප්පසුං විය) නොයෙක් තැනින් වැද ගොයම් කන කුළු ගොනකු මෙන්, නොයෙක් අරමුණු කරා දුව යන තමා ගේ කුළුසිත වළකන්නේ ය. ඒ සඳෙරැ එළැ වූ සිහි ඇතිවැ ම නුවණැතිවැ ම සියලු ඉරියව්වෙහි හැසිරෙන්නේ ය.

**විස්තර**

78 කොතරම් විනය දනිතත් චක්ෂුරාදි සඳෙර සංවර කැරැ ගැනුමට පුරුදු වී නැත්නම් ඒ විනය දැනුම එතරම් ප්‍රයෝජන පිණිස නො පවතී. මෙ කරුණ සැලැකූ කුදුසික ඇදුරුතුමෝ තථාගත ප්‍රඥප්ත ශික්ෂාපදයන්

සංක්‍ෂෙපයෙන් හඳුන්වා අනතුරු ව ඉන්‍ද්‍රිය සංවරය ඇතිකර ගතයුතු බව ත්, ඒ ඇතිකරගන්නා සැටි ත් ඉහතින් දක්වූ ගාථා ඇයයෙන් ප්‍රකාශිත යි. ඒ ගාථාදෙකින් දක්වෙන අවවාදය ම සියලු සිකපද රැකැ ගැනුමට ත් ඇතිකැරැ ගෙන නිවන් දක්නට ත් අතිශයොපකාරී වෙයි.

**358 චක්‍ඛුසොතාදි භෙදෙසු**

මෙහි ආදි ශබ්දයෙන් ඝ්‍රාණ ජිව්හා කාය මන යන ඉන්‍ද්‍රිය ගැනේ. මේ ඉන්‍ද්‍රියයන් සංවර වූ තරමට ම විනය ශික්‍ෂා ත් සම්පූර්ණ වන්නේ ය. ශික්‍ෂා ව්‍යතික්‍රමණය කරන්නේ ඉන්‍ද්‍රිය සංවරය නො මැති බැවිනි.

**359 රූපසද්දාදිගොචරෙ**

මෙහි ආදි ශබ්දයෙන් ගන්ධ- රස- ඵොට්ඨබ්බ- ධම්ම යන අරමුණු ගැනේ. රූපාදි ගොචරයන් චක්‍ෂුරාදි ඉන්‍ද්‍රියයනට ආපාථගතවීම නො වැළැක්විය හැක්කකි. කොතෙක් විසභාග අරමුණු හමු වුව ත් මැනැවින් ඉන්‍ද්‍රියසංවරය ඇතිකැරැගත් උතුමෝ ඒ අරමුණු ඔස්සේ ගොස් නොමඟට නො වැටෙති. ඒ අරමුණ ම ඇතැම්විට කෙලෙස් සංසිඳුවා ගෙන නිවන් දක්මට ද කාරණ කරගනිත්.

**360 අභිජ්ඣාදොමනස්සාදිප්පවත්තිං**

මෙහි ආදි ශබ්දයෙන් මිථ්‍යාදෘෂ්ටි ආදි නොයෙක් අකුශලයෝ ගැනෙත් චක්‍ෂුරාදි සදොරට හමුවන රූපාදි අරමුණ කෙරෙහි එල්බ අභිධ්‍යාදි අකුශල යෝ හටගනිත්. ඉන්‍ද්‍රිය සංවරය ඇති කැරැ ගත් කෙනකුන්හට එසේ අකුශල හටගැනුමෙක් නැත.

**361 සබ්බිරියාපථෙ**

යෑම් ඊම් ඉඳීම් හිටීම් කෑම් බීම් නිදීම් ආදි හැම ඉරියව්වක් ම මෙයට අයත් ය. ඒ හැම ඉරියව්වෙහි ම සිහි- නුවණ එළවා ගත යුතු බව ප්‍රකාශිත යි.

---

## 47 සුද්ධි

**446 දෙසනා සංවරෙ එට්ඨි-පච්චවෙක්ඛණ භෙදතො**
**සුද්ධි චතුබ්බිධා පාති-මොක්ඛසංවර සම්මතා**
**දෙසනාය විසුද්ධත්තා-දෙසනා සුද්ධි වුච්චති.**

දෙශනා ශුද්ධිය සංවර ශුද්ධිය එසනා ශුද්ධිය ප්‍රත්‍යවෙක්‍ෂා ශුද්ධිය යන මොවුන් ගේ ප්‍රභෙද වශයෙන් ශුද්ධිතොමෝ සතරාකාර වේ. ප්‍රාතිමොක්‍ෂ සංවරය යි සලකනලද ශීලය අවත් ඇවැත් දෙසීමෙන් පිරිසුදු වන බැවින් දෙශනා ශුද්ධිය යි කියනු ලැබේ.

**විස්තර**

79 මෙයින් චතුර්විධ ශුද්ධි දක්වා ඒ සතරෙන් ''දෙශනා ශුද්ධි'' යනු ප්‍රාතිමොක්‍ෂසංවරශීලය බව මෙහි ම සඳහන් කොට තිබේ. ප්‍රාතිමොක්‍ෂ

සංවරශීලය නම් උපසපන් පැවිද්දන් විසින් හික්මිය යුතුය යි බුද්ධප්‍රඥප්ත ශික්ෂාපද රැකීම යි. **විශුද්ධිමාර්ගයෙහි ද** "තත්‍ථ දෙසනාසුද්ධි නාම- පාතිමොක්ඛසංවරසීලං තං හි දෙසනාය සුජ්ඣනතො දෙසනා සුද්ධීති වුච්චති" (**33** පිටුව) යී මෙය ම සඳහන් කොට තිබේ. **බුද්දසික්ඛා ටීකාවෙහි** "වුට්ඨානස්සාපි වෙත්‍ථ දෙසනාය එව සංගහො දට්ඨබ්බො, මූලාපත්තීනං පන අභික්ඛුතා පටිඤ්ඤාව දෙසනා"ති හෙට්ඨා වුත්තා සාවසස පාරාජිකාපන්නස්ස විසුද්ධි නාම හොති" යී ප්‍රකාශිත හෙයින් පරිජි අවන් තැනැත්තකු සවකීය අනුපසම්පන්නභාවය ප්‍රතිඥා කිරීම ද දෙශනා ශුද්ධියෙහි ම ලා අන්තර්ගත වේ. යම්හෙයකින් පරිජි අවන් තැනැත්තකු ගිහි වැ දන් දීමාදිය කිරීමෙන් සවර්ග මොක්ෂයන් ලබාගත හැක්කේ ද එහෙයින් පරිජි අවන්නහු ගේ ගිහි භාවය ද දෙශනා සුද්ධිය බව කියනලදි. දෙශනා කිරීමෙන් (ප්‍රකාශ කිරීමෙන්) ගිහිභාවය සිද්ධවන හෙයිනි.

447 **න පුනෙවං කරිස්සන්ති-චිත්තාධිට්ඨාන සංවරා**
**වුත්තො සංවරසුද්ධීති-සුජ්ඣතින්ද්‍රිය සංවරො.**

නැවැත මෙසේ නො කරමි යි සිතින් ඉටන සංවරය හේතුකොටගෙන පිරිසුදු වේනු යි ඉන්ද්‍රියසංවරය සංවරසුද්ධි නමින් කියන ලදි.

**විස්තර**

80 සංවර ශුද්ධිය යනු කවරක්ද යි මෙයින් ප්‍රකාශිත යි. "සංවරසුද්ධි නාම- ඉන්ද්‍රියසංවරසීලං, තං හි න පුන එවං කරිස්සාමීති චිත්තාධිට්ඨාන සංවරෙනෙව සුජ්ඣනතො සංවර සුද්ධීති වුච්චති" (**විසුද්ධිමග්ග 33**) සංවර ශුද්ධි යනු ඉන්ද්‍රිය සංවර ශීලය බව ත් ඒ ඉන්ද්‍රියසංවර ශීලය නම් මෙබන් දක් නැවැත කිසිකලෙකැ නො කරමි යි ඉටාගැනීම බව ත් මෙහි ප්‍රකාශිත යි. එය චක්ෂුරාදියට රූපාදි අරමුණු ආපාථගත වීමෙන් නිමිත්තාදි වශයෙන් නො ගෙන සංවර කැරැ ගැනුම යි.

448 **පහායානෙසනං ධම්ම-නුප්පාදෙන්තස්ස එට්ඨියා**
**සුද්ධත්තා එට්ඨිසුද්ධී'ති-වුත්තමාජීව නිස්සිතං.**

නො නිසි ලෙස ප්‍රත්‍යය සෙවීම හැරපියා පිඬු සිඟීමාදී දැහැමින් සිවුපසය උපදවන්නහු ගේ ආජීවනිඃශ්‍රිත ශීලය සිවුපසය සෙවීමෙන් පිරිසුදු වන බැවින් එසනාසුද්ධිය යි කියන ලදි.

**විස්තර**

81 එසනාසුද්ධිය නම් ආජීවපාරිසුද්ධි සීලය බව මෙයින් ප්‍රකාශිත යි. **විසුද්ධිමාර්ගයෙහි** දැක්වෙන කුහනා- ලපනා- නෙමිත්තිකතා- නිප්පෙසිකතා- ලාභෙන ලාභං නිජිගිංසනතා- යන මේවායින් සහ **බ්‍රහ්මජාල සූත්‍රයෙහි** ප්‍රකාශ වන අඞ්ගං- නිමිත්තං- උප්පාතං- සුපිනං- යනාදිය පිළිබඳ ශාස්ත්‍ර කීමාදියෙන් සිවුපසය සැපැයීමද යන මේ මිථ්‍යාජීවයෙන් වෙන් ව සම්‍යගාජීවයෙහි පිහිටීම ආජීවපාරිසුද්ධිසීලය යි.

448 යොනිසො පටිසංඛාය-චීවරං පටිසෙවති
එවමාදි යථාවුත්ත-පච්චවෙක්ඛණ සුජ්ඣනා
පච්චවෙක්ඛණ සුද්ධි-වුත්තං පච්චය නිස්සිතං.

නුවණින් සලකා සිවුරු වැළැඳ ගනිය යන මේ ආදීන් කියූ පරිදි ඒ ඒ ප්‍රත්‍යයට වදළ ප්‍රත්‍යවෙක්ෂායෙන් පිරිසුදු වන බැවින් ප්‍රත්‍යය සන්නිඃශ්‍රිත ශීලය ප්‍රත්‍යවෙක්ෂා ශුද්ධිය යි කියන ලදි.

**විස්තර**

82 ප්‍රත්‍යවෙක්ෂා ශුද්ධිය නම් ප්‍රත්‍යය සන්නිඃශ්‍රිත ශීලය බව මෙයින් කියන ලදි. චීවර- පිණ්ඩපාත- සෙනාසන- ගිලානප්‍රත්‍යය යන සිව්පස පරිභොගයේ දී එකිනෙකව ප්‍රයෝජන සලකා පරිභොග කිරීම යි. "පටිසංඛා යොනිසො චීවරං පටිසෙවාමි" යනාදීන් විසුද්ධිමාර්ගයෙහි 23 වන පිටුවේ විස්තර කොට තිබෙන පරිදි ප්‍රත්‍යවේක්ෂා කොට පරිභොග කිරීමයි.

---

### 48 සන්තොසො

(සන්තොසො යන්නෙහි ප්‍රත්‍යය සන්තොෂ නම්)

450 අප්පෙන අනවජ්ජෙන-සන්තුට්ඨො සුලභෙන ච
මත්තඤ්ඤූ සුභරො හුත්වා-චරෙ සද්ධම්මගාරවො.

මදක් වටිනා බැවින් සවල්ප වූ නිරවද්‍ය වූ ගිය ගිය දිසායෙහි ලැබෙන හෙයින් සුලභ වූ පාංශුකූල චීවරාදියෙන් සන්තුෂ්ට ව පමණ දන සුවසේ පොෂ්‍ය කටහැක්කෙක් වැ සද්ධර්මය ගරුකොට ඇත්තේ දවස් යවන්නේ ය.

451 අතීතං නානුසොචන්තො-නප්පජප්පමනාගතං
පච්චුප්පන්නෙන යාපෙන්තො සන්තුට්ඨො'ති පවුච්චති.

ඉකුත් වැ ගිය මනාපසය ගැන ශොක නො කරමින් අනාගත පසය ගැන ත් නො පතමින් වත්මන්හි ලද හොඳ හෝ නොහොඳ හෝ පසයෙන් යැපෙමින් සිටින්නේ සන්තුෂ්ටය යි කියනු ලැබේ.

**362 සන්තුට්ඨො**

ත්‍රිවිධ සන්තෝෂයෙන් සන්තොෂවූයේ යනු යි. යථාලාභ සන්තොස යථාබල සන්තොස යථාසාරුප්ප සන්තොස යි සන්තොස තුනකි. චීවරාදි සිවුපසයෙහි ම මේ තුන වෙන වෙන ම ලැබේ. යම් භික්ෂු කෙනකුන්හට හොඳ හෝ නොහොඳ හෝ සිවුරක් ලැබුණු විට අන් සිවුරක් බලාපොරොත්තු නොවී එයින් ම තුටුවෙ යි. අන් සිවුරක් ලැබුණ ද නො ගනී. මෙය චීවරයෙහි යථාලාභ සන්තෝෂය නම්. පිණ්ඩපාතාදිය ගැන ත් මෙසේම යි. ප්‍රකෘතියෙන් දුර්වලයකු හෝ රොගාදියෙන් දුර්වල වූ හෝ යම් භික්ෂු කෙනකුන්හට බර සිවුරක් ලැබේ ද එය සභාග භික්ෂුකෙනකුන් ගේ සැහැල්ලු සිවුරකට මාරුකරගෙන යැපේ ද එය චීවරයෙහි යථාබල සන්තොෂය යි. තවත් කෙනෙක් ප්‍රණීත චීවර ලබත්. ඒවා වැඩිමහල්ලන්

හව ත් බහුශ්‍රැතයනට ත් ගිලනුන්හට ත් සුදුසුය යි වෙන්කොට දී තෙමේ පරණ සිවුරක් හෝ කසළ ගොඩින් රැස්කැරගත් රෙදි කඩින් මසාගත් සිවුරක් හෝ පරිභොග කරයි. මෙය චීවරයෙහි යථාසාරුප්ප සන්තොෂ ය යි. සෙසු පසය ගැන ද මෙය මෙසේම යි. විස්තරාර්ථීන් විසින් සංයුත් අටුවාවේ දෙවැනි කාණ්ඩයේ 121– 122 පිටු කියවීම යෙහෙකි.

**363 මත්තඤ්ඤූ**

සිවුපසෙහි පමණ දන්නේ යනු යි. පරියෙසන– පටිග්ගහණ– පරිභොග විස්සජ්ජන යන සිවුවැදෑරුම් කරුණෙහි පමණ දන්නා තැනැත්තා යනු "මත්තඤ්ඤූ" යන්නෙහි අදහස යි.

**364 සුභරො**

අනුන් විසින් පහසුවෙන් පොෂණය කට හැක්කේ යනු යි. ලැබෙන සිවුපසය හොඳ වුවත් නරක් වුවත් ලැබෙන ලෙස සතුටු වන හෙයින් සුභර නම්.

---

## 49 චතුරාරක්ඛා'ති

**452 බුද්ධානුස්සති මෙත්තා ච–අසුභං මරණස්සති**
**ආරක්ඛත්තාදිනා'රහං–සම්මා සාමං ච බුද්ධතො**

**453 සම්මාසම්බුද්ධ ඉති වා–'නුස්සති සා පුනප්පුනං**
**නවභෙදෙ භගවතො–බුද්ධානුස්සති සා ගුණෙ.**

බුද්ධානුස්මෘතිය ද මෛත්‍රිය ද අසුභය ද මරණානුස්මෘතිය ද යන මොහු සිවුඅරක් නම්හු. "කෙලෙසුන් කෙරෙන් දුරින් ම දුරු හෙයින්නැ"යි යනාදි ගුණයෙන් "අරහං" (රහතැ) යි ද, මනාකොට තමන් ම සර්වධර්මයන් දත් හෙයින් සම්මාසම්බුද්ධය යි ද, මේ ආදි වශයෙන් භාග්‍යවතුන් වහන්සේ ගේ නව ප්‍රභෙද ගුණයන් ගැන යම්බඳු නැවැත නැවැත සිහිකිරීමෙක් වේද, ඕතොමෝ බුද්ධානුස්සති නමු.

**විස්තර**

83 මේ ගාථා දෙකින් චතුරාරක්‍ෂාවන් නොහොත් සතරකමටහන් නම් කොට බුද්ධානුස්සතිය ද හඳුන්වා තිබේ. බුද්ධානුස්සති භාවනායෙන් අපමණ අනුසස් ඇති වේ. "ඉමඤ්ච පන බුද්ධානුස්සති මනුයුත්තො භික්ඛු සත්ථරි සගාරවො හොති සප්පතිස්සො, සද්ධාවෙපුල්ලං සතිවෙපුල්ලං පඤ්ඤාවෙපුල්ලං පුඤ්ඤවෙපුල්ලං ච අධිගච්ඡති, පීතිපාමොජ්ජබහුලො හොති, භයභෙරවසහො දුක්ඛාධිවාසන සමත්ථො, සත්ථාරා සංවාසසඤ්ඤං පටිලභති, බුද්ධගුණානුස්සතියා අජ්ඣාවුත්ථඤ්චස්ස සරීරම්පි චෙතියඝරමිව පූජාරහං හොති, බුද්ධභූමියං චිත්තං නමති, වීතික්කමිතබ්බවත්ථුසමායොගෙ චස්ස සම්මුඛා සත්ථාරං පස්සතො විය හිරොත්තප්පං පච්චුපට්ඨාති, උත්තරිං අප්පටිවිජ්ඣන්තො පන සුගතිපරායනො හොති" (**විසුද්ධිමග්ග 157**) මේ බුද්ධානුස්සතියෙහි යෙදුණු යොගාවචරයා බුදුරජාණන් වහන්සේ කෙරෙහි

ගෞරව ඇත්තේ වේ. යටත් පැවැතුම් ඇත්තේ වේ. ශ්‍රද්ධායෙන් ද සමෘති යෙන් ද ප්‍රඥයෙන් ද පුණ්‍යයෙන් ද මහත් බවට පැමිණියේ වෙයි. නිතර ප්‍රීතිප්‍රමොද්‍යයෙන් වසන්නෝ වේ. කුදු මහත් බිය ඉවසන්නෝ වෙයි. දුක් ඉවැසීමට සමර්ථ වේ. "බුදුන් වහන්සේ හා එක් වැ වසමි" යන අදහස් ඇතියේ වෙයි. බුද්ධානුස්මෘතිය රඳා තිබෙන ඔහු ගේ ශරීරය ද චෛත්‍යයක් මෙන් පිදිය යුතු වේ. ඔහු ගේ සිත බුද්ධ භූමියට නැමුණේ වෙයි. "පාප යක් කරමි" සිතෙන්නා හා ම බුදුන් අභිමුඛයෙහි සිටින්නා සේ පෙනී යන බැවින් පව් කිරීමෙහි ලජ්ජා භය ඇත්තේ වේ. ඉදින් මාර්ග ඵල නො ලද් දේ නම් මරණින් මතු ඒකාන්තයෙන් ම සුගතිගාමී වේ ය"යි ප්‍රකාශ වන හෙයින් වෙසෙසින් ම භික්ෂූන් විසින් නිතොර බුද්ධානුස්මෘතියෙහි යෙදිය යුතු බව පෙනේ.

454 සීමට්ඨසඞ්ඝෙ සීමට්ඨ-දෙවතාසු ච ඉස්සරෙ
ජනෙ ගොචරගාමම්හි-තත්ථුපාදාය මානුසෙ

455 සබ්බසත්තෙසු භොනතා වෙරා‘ති ආදිනා
පරිච්ඡිජ්ජ පරිච්ඡිජ්ජ-භාවනා මෙත්තා භාවනා.

තමා හා එක ඉමෙ වසන සඞ්ඝයා කෙරෙහි ද එක ඉමෙ වසන දෙවි යන් කෙරෙහි ද ගොදුරු ගම්හි ඉසුරු ජනයා කෙරෙහි ද ඒ ගොදුරුගම්හි මිනිසුන් ආදි කොට සියලු සතුන් කෙරෙහි ද (මා හා එක් ඉමෙ වසන සබ්‍රම් සරහු සුවපත් වෙත්වා වෛර නැති වෙත්වා යන මේ ආදියෙන් වෙන් කොට කරන භාවනා තොමෝ "මෛත්‍රාභාවනා" නමු.

විස්තර

84 මෛත්‍රී භාවනාව ගැන මෙහි සංක්ෂෙපයෙන් දක්වා තිබේ. පළමු කොට තමන් ගෙන් පටන් ගෙන මෛත්‍රිය පතුරුවාලිය යුතු සැටි ත් එහි අනුසසු ත් **විසුද්ධිමාර්ගයෙහි 218** වන පිටුවේ සිට විස්තර කර තිබෙන හෙයින් විස්තර කැමැත්තන් එයින් බලා දත්තේ ය.

456 වණ්ණසණ්ඨාන ඔකාස-දිසතො පරිච්ඡෙදතො
වවත්ථපෙත්වා කෙසාදි-කොට්ඨාසෙ අනුපුබ්බතො

වර්ණ විසින් ද සටහන් විසින් ද පිහිටි අවකාශ විසින් ද දිසා විසින් ද පරිච්ඡෙද විසින් ද කෙස් ලොම් ඈ කොටස් නිශ්චය කොට පිළිවෙළින්-

457 නාතිසීඝං නාතිසණිකං-වික්ඛෙපං පටිබාහයං
පණ්ණත්තිං සමතික්කම්ම-මුඤ්චන්තස්සා‘නුපුබ්බතො

ඉතා ඉක්මන් නො කොට ඉතා පමා ත් නො කොට චිත්තවික්ෂෙපය වළකමින් කෙස් ලොම් ආදි ප්‍රඥප්තිය ඉක්මවා පිළිකුල් වශයෙන් සිත පිහිටුවා ක්‍රමයෙන් පිළිකුල් වශයෙන් නො වැටහෙන ඒ ඒ කොටස් හරින් නහු ගේ-

**වණ්ණාසය සණ්ඨාන-ගන්ධාකාසෙහි භාවනා**
**පටික්කූලාති කොට්ඨාසෙ-උද්ධුමාතාදි වත්ථුසු**
**ගහෙත්වා අසුභාකාරං-පවත්තා භාවනා'සුභං.**

වර්ණ වශයෙන් ද ආසය වශයෙන් ද සටහන් වශයෙන් ද ගන්ධ වශයෙන් ද පිහිටි අවකාශ වශයෙන් ද කෙසාදි දෙතිස් කොටස් පිළිකුලැයි කරන භාවනා ද උද්ධුමාතක විනීලකාදි වූ දශ අශුභ වස්තුයෙහි පිළිකුල් ආකාරය ගෙන ප්‍රවෘත්ත වූ භාවනා ද අසුභ නම්.

**විස්තර**

85 සවිඤ්ඤාණක අවිඤ්ඤාණක යන දෙ වැදෑරුම් අශුභය ම මේ ගාථා තුනට අන්තර්ගත කොට තිබේ. **විශුද්ධිමාර්ගයෙහි** සවිඤ්ඤාණක අශුභය අනුස්සතිකම්මට්ඨානනිද්දෙසයෙහි කායගතාසති කොටසට ත් අවිඤ්ඤාණක අශුභය අසුභකම්මට්ඨාන නිද්දෙසයට ත් ඇතුළත් ය. එහි දෙ තැනක වෙන් වෙන් ව දක්වා තිබෙත ත් "අශුභය"යි කී කල ඒ දෙකම ගැනෙන බව "යථෙව හි මතසරීරං එවං ජීවමානකම්පි අසුභමෙවා අසුභ ලක්ඛණං පනෙත්ථ ආගන්තුකෙන අලඞ්කාරෙන පටිච්ඡන්නත්තා න පඤ්ඤායති" (**විසුද්ධිමග්ග 143**) කියා සඳහන් ය. කුදුසිකෙහි මේ දෙක ම සඳහන් කොට තිබෙතත් සවිඤ්ඤාණක අශුභය ගැන වැඩි විස්තරයක් පෙනේ. සවිඤ්ඤාණක අසුභය වඩන්නහු විසින් පළමු කොට සප්තප්‍රකාර, උද්ග්‍රහ කෞශල්‍යය දශප්‍රකාර මනසිකාර කෞශල්‍යය ත් යන දෙක ඇති කැර ගෙන වර්ණ-සණ්ඨාන-ගන්ධ-ආසය-ඔකාස- යන පස්අයුරින් වැඩිය යුතු යි. විශුද්ධිමාර්ගයේ පෙන්වා තිබෙන සියල්ල ම මෙහි නැත ත් බොහොම යක් ඇතුළත් කොට තිබේ. අවිඤ්ඤාණක අශුභය ගැන එහි සඳහන් එබඳු විස්තර කිසිවක් මෙහි නැත. දශ අශුභය ගැනෙන්නට "උද්ධුමාතාදිවත්ථුසු" යී යොදා තිබේ.

**සප්තවිධ උද්ග්‍රහ කෞශල්‍යය**

"තත්ථ වචසා මනසා වණ්ණතො සණ්ඨානතො දිසතො ඔකාසතො පරිච්ඡෙදතොති එවං සත්තධා උග්ගහකොසල්ලං ආචික්ඛිතබ්බං" (**විසුද්ධිමග්ග 177**) යී පැවැසෙන සප්තප්‍රකාර උද්ග්‍රහ කෞශල්‍යය මෙහි දක්වා තිබෙන්නේ වචසා- මනසා යන අංග දෙක නො මැතිව සෙසු පස යි. එහෙත් කුදුසික සන්නයට ත් ටීකාවට ත් ඒ දෙක ද ඇතුළත් කොට තිබේ. වචනයෙන් සජ්ඣායනා කිරීම මනසින් සජ්ඣායනයට ත් මනසින් සජ්ඣායනා කිරීම ලක්ඛණ පටිවෙධයට ත් කාරණ වන බව" වචසා සජ්ඣායො හි මනසා සජ්ඣායස්ස පච්චයො, සො පන ලක්ඛණ පටිවෙධස්ස පච්චයො" යී **කුදුසික ටීකායෙහි** එයි. එබැවින් කුදුසික පෙළෙහි එන වණ්ණ සණ්ඨාන ඔකාස දිසතො පරිච්ඡෙදතො" යන ගාථා පාදයට වචසා- මනසා දෙක ත් ඇතුළත් වන බව සැලැකුව මනා ය. මෙහි ඒ දෙක නො මැත් තේ වැඩිපුර ම ත් "එවං නිමිත්තං ගහෙත්වා සබ්බකොට්ඨාසෙසු වණ්ණ සණ්ඨාන දිසොකාස පරිච්ඡෙද වසෙන වවත්ථපෙත්වා (**විසුද්ධිමග්ග 183**)යී දැක්වෙන පඤ්චප්‍රකාර ව්‍යවස්ථා කරණය ත් ඇතුළත් වීමට සිතාගෙන විය යුතු යි.

**දශවිධ මනස්කාර කෞශල්‍යය**

"එවං සත්තධා උග්ගහකොසල්ලං ආචික්ඛිත්වා අනුපුබ්බතො නාතිසීඝතො නාතිසණිකතො වික්ඛෙපපටිබාහනතො පණ්ණත්තිසමතික්කමනතො අනුපුබ්බමුඤ්චනතො අප්පනාතො තයො ච සුත්තන්තාති එවං දසධා මනසිකාරකොසල්ලං ආචික්ඛිතබ්බං" (**විසුද්ධිමග්ග 179**) යන වශයෙන් ප්‍රකාශිත දශවිධ මනස්කාර කෞශල්‍යයෙන් මෙහි **අප්පනාතො තයො ච** සුත්තන්තා යන්න නැත. අප්පනාතො යන්නෙන් අදහස් කෙළේ කෙසාදි කොටස් වශයෙන් මෙනෙහි කිරීම බව **විසුද්ධිමාර්ගයෙහි** දැක්වේ. කෙසාදි එක් එක් කොටසෙක ම අර්පණා වන හෙයිනි. තයො ච සුත්තන්තා යන මෙයට අධිචිත්ත සූත්‍ර-සීතිභාව සූත්‍ර-බොජ්ඣඞ්ග කොසල්ල සූත්‍ර-යන තුන ගැනේ. **විස්තර කැමැත්තෝ විශුද්ධිමාර්ගය බලත්වා.** දෙතිස්කුණපය එකින් එක ගෙන "වණ්ණ සණ්ඨාන ගන්ධාසයොකාස වසෙන පඤ්චධා පටික්කූලතා වවත්ථපෙතබ්බං" (**විසුද්ධිමග්ග 183**) යනුයෙන් දැක්වෙන කොටස කුඩුසිකෙහි ද "වණ්ණආසය සණ්ඨාන ගන්ධොකාසෙහි භාවනා" යන වශයෙන් එයි.

365 **උද්ධුමාතාදිවණ්ණසු**

මෙහි ආදි ශබ්දයෙන් අනික් නව අශුභය ගැනේ. උද්ධුමාතකං විනීලකං විපුබ්බකං විච්ඡිද්දකං වික්ඛායිතකං වික්ඛිත්තකං හතවික්ඛිත්තකං ලොහිතකං පුලවකං අට්ඨිකන්ති දසසු අවිඤ්ඤාණක අසුභෙසු" (**විසුද්ධිමග්ග 131**) කියා දශ අශුභය නම් කොට තිබේ. මේ දශ අශුභය පිළිබඳ විස්තර විශුද්ධිමාර්ගයෙහි අශුභකර්මස්ථාන නිර්දේශයෙන් බලා දත්තේ ය.

මෙසේ ජීවමාන කයෙහි ද්වත්‍රිංශාකාර වශයෙන් පවත්වන කායගතාසතිය ද අනුන් ගේ මළසිරුර දක තමන් ගේ දිවමන් කයට ත් වන සැටි සලකා බැලීමෙන් පහළ කැරැ ගන්නා අශුභ භාවනා ද යන මේ දෙකින් ගැණෙන අජ්ඣත්තික බාහිර වූ කායගතාසතිය වැඩීම මහ අනුසස් ඇත්තකි. ඒ බව බුදුන් වහන්සේ විසින් "අමතං තෙ භික්ඛවෙ න පරිභුඤ්ජන්ති; යෙ කායගතාසතිං න පරිභුඤ්ජන්ති" (=මහණෙනි යම් කෙනෙක් කායගතාසති භාවනාව පරිහරණය නො කෙරෙත් නම්, ඔව්හු අමාමහ නිවන් සුව නො විඳිත්ය") යි වදාළසේක. සැරියුත් මාහිමියන් වහන්සේ ත් බුදුරජාණන් වහන්සේ ත් පිරිනිවි කල්හි අනඳ මාහිමියන් විසින්-

"අබ්භතීත සහායස්ස-අතීතගත සත්ථුනො
නත්ථි එතාදිසං මිත්තං-යථාකාය ගතාසති"

පිරිනිවන් පෑ සැරියුත් මාහිමියන් වැනි යහපත් යහළුවන් ඇති, ඉනුදු පසු පිරිනිවි ශාස්තෘන් වහන්සේ ඇති මා වැනි අනාථයකුහට මේ කායගතාසති භාවනාව මෙන් පිහිට වන වෙන මිතුරෙක් නම් නැතැ යි කායගතාසතියෙහි ගුණ වණන ලදි. මේ කුඩුසිකට ත් එය ඇතුල්කළේ පැවිද්දන් විසින් දිනපතා මෙනෙහි කටයුතු සතර කර්මටහනින් එකක්වන හෙයිනි. විස්තරාර්ථීන් විශුද්ධිමාර්ගයෙහි අශුභ භාවනා නිර්දෙශය හා කායගතාසති කොටසත් බැලිය යුතු.

459 **මරණමෙම භවිස්සති-ජීවිතං උපරුජ්ඣති**
**මරණං මරණං වා'ති-භාවයිත්වාන යොනිසො**

මට මරණය වන්නේය යි හෝ ජීවිතෙන්ද්‍රිය බිඳෙයි හෝ මරණය මරණය යි හෝ නුවණින් මරණානුස්මෘති භාවනාව වඩා (උපචාර ධ්‍යාන නො උපදුත් හොත්)

460 **වධකස්සෙවුපට්ඨානා-සම්පත්තීනං විපත්තිතො**
**උපසංහරතො කාය-බහුසාධාරණා තථා**

මරණය වධකයකු සේ එළඹසිටි හෙයින් ද, ආරොග්‍ය යෞවන ජීවිතාදි සම්පත් විපත්තියට පැමිණෙන හෙයින් ද, උපසංහරණ වශයෙන් ද ශරීරය අජ්ඣත්තික බාහිර බොහෝ උපද්‍රවයනට සාධාරණ හෙයින් ද එසේ ම–

461 **ආයුදුබ්බලතො කාල-වවත්ථානස්ස'භාවතො**
**අද්ධානස්ස පරිච්ඡෙදා-භාවනා මරණස්සති.**

ආයුෂ දුර්වල හෙයින් ද පෙරවරු කාලය යනාදි මැරෙණ කාලය නියම යක් නැති හෙයින් ද ජීවිත කාලය නියම හෙයින් ද කරන්නා වූ භාවනාව මරණානුස්මෘති නම්.

**විස්තර**

86 මරණානුස්මෘති කර්මස්ථානය ගෙන සාමාන්‍යයෙන් මැරෙණ බව නිතොර සිහිකරත් ම උපචාරධ්‍යානය නො ලැබේ නම් වධකපච්චුපට්ඨාන තො යනාදි වශයෙන් විශුද්ධිමාර්‍ගයෙහි සඳහන් ලෙස මරණානුස්මෘතිය වැඩිය යුතු බව මෙයින් ප්‍රකාශිත යි. විස්තරාර්ථීන් **විශුද්ධිමාර්‍ගයෙහි 168 වැනි පිටුවේ සිට 176 දක්වා කියවිය යුතු.**

366 **මරණං**

මරණය නම් එක් භවයකට අයත් ජීවිතෙන්ද්‍රිය සිඳීයෑම යි. ඒ හැර රහතන් ගේ සසර දුක් සිඳලීම් සංඛ්‍යාත සමුච්ඡේද මරණය ත් සංස්කාර යන් ගේ ක්‍ෂණ භඞ්ගය යි කියන ලද ක්‍ෂණික මරණය ත් ගස මැරුණේය යනාදීන් කියන ලොකසම්මත මරණය ත් යන ත්‍රිවිධ මරණ මෙහි අයත් නොවේ. මෙහි ගැණෙන්නේ ජීවිතෙන්ද්‍රියොපච්ඡේද සංඛ්‍යාත මරණය යි.

367 **වධකස්සෙවුපට්ඨානං**

වධකයකු එළැඹැ සිටි සේ මරණය එළැඹැ සිටියේය යි සිහි කිරීම යි. කඩුව අමෝරා ගත් වධකයෙක් දිවි පැහැරැ නො ගෙන නො නවත්නාක් මෙන් ම උත්පත්තිය සමග ගෙනා මේ මරණය ද දිවි පැහැර නො ගෙන නො නවත්නේය යි සිතීම "වධකස්සෙවුපට්ඨානං" යී කියා තිබේ.

368 **උපසංහරණතො**

අනුන් හා සමග තමන් යොමුකොට බැලීමෙන් මරණය සිහි කිරීම යි. එය 1 යශස්මහත්ව, 2 පුණ්‍යමහත්ව, 3 ස්ථාමමහත්ව, 4 සෘද්ධිමහත්ව, 5 ප්‍රඥ

මහත්ව, 6 ප්‍රත්‍යෙකබුද්ධ, 7 සම්‍යක් සම්බුද්ධ යන මේවා සහ බැලීම යි. මහා යශස් ඇති මහාසම්මත ආදීහු පවා මරණයට පත්වූහ. එවැනි යශස් නැති මා වැන්නකු ගැන මරණය පැමිණේය යනු කියනුම කිම? යි මෙසේ සිතීම යශස්මහත්ව වශයෙන් තමා කරා මරණය එළවා බැලීම යි. මේ ආදි වශයෙන් එකිනෙකා එළවා බැලීම උපසංහරණ යි දතයුතු.

### 369 කායබහුසාධාරණා

සිය සිරුර අන්‍ය බොහෝ සත්වයනට සාධාරණ බව සිතීම් වශයෙන් මරණය සිහිකිරීම යි. මේ සිරිරෙහි අසූකුලයෙක පණුවෝ වෙසෙති. උන්ගේ කෝපයෙන් ද මරණයට පත් වේ. එසේම අපමණ රෝගයනට ත්, බාහිර වශයෙන් හැම සත්වයනට ත් සාධාරණ ය. ඒ හැමෙකොකින් ම මරණය සිදු විය හැකි බව සිතීම යි.

### 370 ආයුදුබ්බලතො

ආයු දුර්වල වශයෙන් සලකා මරණය සිහිකිරීම යි. සත්ත්වයන් ගේ ආයුෂ ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳ ය, ශීත උෂ්ණ පිළිබඳය, මහාභූත පිළිබඳය, ආහාර පිළිබඳ ය, මේ හැමෙකක් ම සමව තිබෙන තාක් ජීවත් විය හැකි ය. විෂම වූ විට එකැතියෙන් ම මැරෙන්නේ ය යනාදීන් සිතීම යි.

### 371 කාලවවත්ථානස්ස අභාවතො

පෙරවරු ය පස්වරු ය යනාදි කාල නියමයක් නැති බැවින් ඒ අනුව සිතීම යි. සත්ත්වයන් ගේ ජීවිත ය ව්‍යාධි ය කාලය දෙහනික්ෂෙපය යන මේ පස ව්‍යවච්ඡේද රහිත බව දක්වා තිබේ. කාලය පමණක් මෙහි ගත ද ඒ පස ම ගත යුතු ය.

### 372 අද්ධානස්ස පරිච්ඡෙද

ජීවත්වන කාලය වශයෙන් සලකා මරණය ගැන සිහි කිරීම යි. "අප්පමිදං භික්ඛවෙ මනුස්සානං ආයු, ගමනීයො සම්පරායො, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්ථි ජාතස්ස අමරණං, යො භික්ඛවෙ චිරං ජීවති, සො වස්සසතං අප්පං වා භීයෝ" යි දෙශනා කළෙන් යමෙක් බොහෝකල් ජීවත් වූයේ ද, හේ වර්ෂ සියයක් හෝ ඉන් ස්වල්පයක් අඩුව හෝ වැඩිය ජීවත් වන්නේය යි දෙශනා කොට තිබේ.

---

## 50 විපස්සනා'ති

**462 නාමරූපං පරිග්ගය්හ-තතො තස්ස ච පච්චයං**
**ඤත්වා අභාවතො'නිච්චා-උදයබ්බය පීළනා.**

**463 දුක්ඛා අවසවත්තිත්තා-අනත්තා'ති තිලක්ඛණං**
**ආරොපෙත්වාන සඞ්ඛාරෙ-සම්මසන්තො පුනප්පුනං**
**පාපුණෙය්‍යානුපුබ්බෙන-සබ්බසංයොජනක්ඛය'න්ති·**

නාමය හා රූපය චතුධාතු වවත්ථානාදි වශයෙන් පරිග්‍රහ කොට අනතුරුව ඒ නාමරූපයනට ප්‍රත්‍යය ද සලකා ඇති වැ නැතිවන බැවින්

අනිත්‍යයහ. උදයව්‍යයයෙන් පෙළෙන බැවින් දුඃඛයහ. තමා වසයෙහි නො පවත්නා බැවින් අනාත්මයහ යි තිලකුණට නඟා ත්‍රෛභූමක සංස්කාරයන් නැවැත නැවැත විදර්ශනා කරන යොගාවචරතෙම පිළිවෙළින් හෙවත් ශීලවිශුද්ධ්‍යාදි සප්තවිශුද්ධි පරම්පරයෙන් සියලු සංයොජනක්‍ෂය ය යි කියනලද රහත්බව පැමිණෙන්නේ ය.

විස්තර

87 මේ ගාථා දෙකින් විදර්ශනාව ත් ඒ විදර්ශනාවෙන් ලැබෙන උසස් ම මාර්ගය ත් දෙක ප්‍රකාශ වේ. මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි- පටිපදාඤාණදස්සනවිසුද්ධි- ඤාණදස්සනවිසුද්ධි යන විශුද්ධිත්‍රය ය මීට අන්තර්ගත වේ. **විස්තර කැමැත්තන් විසින් විශුද්ධිමාර්ගයෙහි එක් නිර්දේශත්‍රය බැලිය යුතු යි.** මේ ගාථා දෙකින් කියැවෙන අදහස කාටවුවත් වටහා ගැනීම අපහසු නොවන හෙයින් විදර්ශනාව පිළිබඳ ව ඉතා සංක්ෂෙපයෙන් හඳුන්වා තිබෙන තැනක් ගෙනහැර පෑම උචිතය යි සිතමි. මෙහි යටැ දක්වෙන පාඨය ආනාපානසති භාවනානුයොගී යොගාවචරයකු විදර්ශනා කරන සැටි **මජ්ඣිම නිකායටඨකථාවේ 224 වැනි පිටුවෙහි** තිබෙන්නකි.

"සො ඣානා උට්ඨහිත්වා අස්සාසපස්සාසෙ වා පරිගණ්හාති, ඣානඞ්ගානි වා. තත්‍ථ අස්සාසපස්සාස කම්මිකො අස්සාසපස්සාසා කිං නිස්සිතා? වත්‍ථු නිස්සිතා. වත්‍ථුනාම කරජකායො; කරජකායො නාම චත්තාරි මහාභූතානි උපාදාරූපඤ්චාති; එවං රූපං පරිගණ්හාති, තතො තදාරම්මණා ඵස්ස පඤ්චකෙ නාමන්ති එවං නාමරූපං පරිග්ගහෙත්වා තස්ස පච්චයං පරියෙසන්තො අවිජ්ජාදි පටිච්චසමුප්පාදං දිස්වා පච්චය පච්චයුප්පන්නධම්මමත්තමෙවෙතං අඤ්ඤො සත්තො වා පුග්ගලො වා නත්‍ථීති විතිණ්ණකඞ්ඛො සප්පච්චය නාමරූපෙ තිලක්ඛණං ආරොපෙත්වා විපස්සනං වඩ්ඪෙන්තො අනුක්කමෙන අරහත්තං පාපුණාති."

හෙතෙම ධ්‍යානයෙන් නැගී ආශ්වාස ප්‍රශ්වාස හෝ ධ්‍යානාඞ්ග හෝ පරීක්‍ෂා කරයි. එහි ආශ්වාස ප්‍රශ්වාස පරීක්‍ෂා කරන්නෙක් මෙසේ සිත යි. "ආශ්වාස ප්‍රශ්වාසයෝ කවරක් ඇසුරු කොට ඇත්තාහු ද? වස්තු නිඃශ්‍රිතයහ. වස්තු නම් කරජකායය යි. කරජකාය නම් සතර මහා භූතයෝ ත් උපාදාරූපයෝ ත් ය. මෙසේ රූපය පරීක්‍ෂා කරයි, අනතුරු ව ඵස්ස පඤ්චකයෙහි නාමයද යි මෙසේ නාමරූප පරීක්‍ෂා කොට ඒ නාමරූපයනට ප්‍රත්‍යය සොයන්නේ අවිද්‍යාදි ප්‍රතීත්‍ය සමුත්පාදය දැක මේ පඤ්චස්කන්ධය නම් ප්‍රත්‍යය හා ප්‍රත්‍යයොත්පන්න ධර්මමාත්‍රයක්ම ය. අන්‍ය වූ සත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැතැයි පහ වූ සැක ඇත්තේ ප්‍රත්‍යය සහිත නාම රූපයන් තිලකුණට නඟා විදර්ශනා වඩන්නේ මග පිළිවෙළින් රහත්බවට පැමිණේ. යනු මෙහි අදහස යි.

373 **නාමරූපං,**

නාමයට එකුන්අනූ සිත ත් දෙපණස් චෛතසික ත් නිවන ත් යන මේ සියල්ල ම ගැනෙතත් විදර්ශනා කථායෙහි දී ගැනෙන්නේ ලෞකිකසිත්

අසූඑක ත් දෙපණස් චෛතසිකය ත් පමණි. රූපය නම් අටවිසි රූප යි. මෙකී නාම රූපයනට ම පඤ්චස්කන්ධ යනු ද නමි. විදර්ශනා වඩන යෝගාවචරයා මේ පඤ්චස්කන්ධය ඉපිද නැති වන හෙයින් අනිත්‍යයයි ද උදය ව්‍යයයෙන් පෙළෙන බැවින් දුක්යයි ද තමා වසයෙහි නො සිටුනා බැවින් අනාත්මයයි ද මෙසේ තිලකුණට නගා බල යි.

**374 සඞ්ඛාරෙ**

පටිච්චසමුප්පාදයේ දී සංඛාර යනු කුශලා'කුශල කර්මයනට කියන් නකි. විදර්ශනා කථායෙහි දී හේතු ප්‍රත්‍යයෙන් හටගත් සවිඥනක වූ ත් අවිඥනක වූ ත් සියල්ල ගැනේ.

**375 සබ්බසංයොජනක්ඛයං**

සංයොජනයන් ක්‍ෂය කරන්නේ රහත් මගිනි. එබැවින් මෙයට රහත් මඟ ගැනේ. සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස යන සංයොජන තුන සෝවාන් මගින් ප්‍රහීණ වේ. කාමරාග පටිඝ දෙක සකදාගාමි මගින් තුනී වැ අනාගාමි මගින් ප්‍රහීණ වේ. ඉතිරි වූ රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යන පස රහත්මගින් ප්‍රහීණ වේ. මෙසේ රහත් මගින් සියලු සංයොජනයන් ම ප්‍රහීණ වන හෙයින් රහත්මඟට සබ්බසංයොජනක්ඛය යනු නමි.

**464 අධිසීලාධිචිත්තානං-මධිපඤ්ඤාය සික්ඛනා**
**භික්ඛු කිච්චමතො බුද්ධ-සික්ඛා'යං සමුදාහටා.**

අධිශීල අධිචිත්ත අධිප්‍රඥා යන මොවුන් ගේ වශයෙන් හික්මීම යම් හෙයකින් භික්‍ෂූන් අයත් කෘත්‍යය වේ ද, එහෙයින් මේ ක්‍ෂුද්‍ර ශික්‍ෂා තොමෝ කියන ලද්.

**විස්තර**

88 භික්‍ෂූන් විසින් හික්මිය යුතු අධිශීල අධිචිත්ත අධිප්‍රඥාවන් ප්‍රකාශ කිරීම මේ කුදුසිකෙහි ප්‍රධාන බලාපොරොත්තුව බව ත් එය සම්පූර්ණ කරන ලද බව ත් මෙයින් ප්‍රකාශ කරන ලදි.. මෙහි අදහස් කරන අධිශීලය නම් උපසම්පදා ශීලය යි. උපසම්පදා භික්‍ෂූන් විසින් හික්මිය යුතු සැටි මෙහි මාතෘකා අටසාළිසකින් සංක්‍ෂෙපයෙන් ප්‍රකාශ කරන ලදි. අනතුරුව පැවිද්දන් විසින් වෙසෙසින් ම මෙනෙහි කටයුතු සතර කමටහන් දක්වාලීමෙන් අධිචිත්තය යි හඳුන්වනු ලබන කාමාවචරාදි චිත්තයනට වඩා අධික වූ රූපාවචරධ්‍යානාදි චිත්තයන් ලැබැගත හැකිවන මඟ පෙන්වා තිබේ. අනතුරු වැ විදර්ශනාව දක්වීමෙන් අධිප්‍රඥාවය යි උගන්වන මාර්ගඵල ප්‍රඥාව නැතහොත් සංස්කාර මිස මැරෙන අත්තකක් නැතැ යි ශූන්‍යත්වය මුල්කොට පවත්නා විදර්ශනා ඥනය ලැබැගන්නා මඟ හෙළි කරන ලදි.

465 මහතො කිත්තිසද්දස්ස-යස්ස ලොකවිචාරිනො
පරිස්සමො න සම්භාති-මාළුතෙනෙව නිච්චසො

ලෙව්හි නිතොර හැසිරෙන මාරුතයට මෙන් යම් තෙරකුන් ගේ මහත් කීර්තිරාවයට පරිශ්‍රමයෙක්- පැකිළීමෙක් නැද්ද,

466 තෙන ධම්මසිරිනාමෙන-තම්බපණ්ණියකෙතුනා
ථෙරෙන රචිතා ධම්ම-විනයඤ්ඤූ පසංසිතා.

ලංකාද්වීපයට ධ්වජයක් බඳු වූ ධර්ම ශ්‍රී නම් වූ ඒ තෙරුන් විසින් රචිත වූ ධර්ම විනය දන්නවුන් විසින් පසස්නා ලද-

467 එත්තාවතා'යං නිට්ඨානං-ඛුද්දසික්ඛා උපාගතා
පඤ්චමත්තෙහි ගාථානං-සතෙහි පරිමාණතො.

මේ ක්ෂුද්‍ර ශික්ෂා තොමෝ ප්‍රමාණ හෙයින් ගාථාවන් සම්බන්ධ වූ පඤ්ච ශත ප්‍රමාණයෙන් මෙතෙක් කී කරුණින් නිමාවට එළැඹියා ය.

**පණ්ඩිත වැලිගම ඤාණරතන ස්ථවිරයන් විසින් නිවන් පතා ලියන ලද ඛුද්දසික්ඛා විවරණය මෙතෙකින් නිමියේය.**

සාධු!

# සංවණ්ණිතපද සූචිය


| | පිටුව |
|---|---|
| අකාල චීවරං | 165 |
| අගිලානො කොසෙ කත්තරිකාය න ඡින්දෙය්‍ය | 156 |
| අචෙලක | 43 |
| අච්චෙක චීවරං | 170 |
| අඤ්ජනී | 88 |
| අඤ්ඤත්‍ර සමයා | 165 |
| අඤ්ඤත්‍ර සුපිනන්තා | 20 |
| අඤ්ඤවාද විහෙස | 69 |
| අඤ්ඤාණ | 160 |
| අඤ්ඤූපදෙසරහිතං | 15 |
| අට්ට | 34 |
| අට්ඨානෙ | 82 |
| අත්තකාමූපට්ඨානවණ්ණං | 21 |
| අත්තනො පරිභොගත්ථං දින්නං | 150 |
| අතිරෙක පත්තො | 40 |
| අත්තුපනායිකං | 15 |
| අදින්නං | 5 |
| අදෙසිතවත්ථුකං | 22 |
| අද්ධානස්ස පරිච්ඡෙද | 198 |
| අද්ධානං වජන්තස්ස | 146 |
| අධම්මිකං | 94 |
| අධිට්ඨෙ | 30 |
| අධොත අල්ලපාදෙහි නක්කමෙ සයනාසනං | 144 |
| අනතිරිත්තකං | 46 |
| අනධිමානිකො | 15 |
| අනාදර | 67 |
| අනික්ඛිත්තසික්ඛො | 3 |
| අනෙසනා | 99 |
| අන්තරායං | 178 |
| අන්තරායෙ සති | 129 |
| අන්තිමෙන වත්ථුනා | 24 |

| | පිටුව |
|---|---|
| අනොත්තාපකො | 61 |
| අන්තො වුත්ථෙ | 61 |
| අන්තො වුත්ථං | 56 |
| අන්වාධිං | 34 |
| අපකතත්තානං | 172 |
| අප්පටිවෙක්ඛිතං | 92 |
| අප්පටිවෙක්ඛිතං (මංසං) | 63 |
| අබ්භෙය්‍ය | 27 |
| අභබ්බකා එකාදස | 18 |
| අභිජ්ඣාදොමනස්සාදි පවත්තං | 190 |
| අභිහාරෙ | 47 |
| අභූතුල්ලපනා | 99 |
| අලජ්ජී අඤ්ඤාණ කුක්කුච්ච පකතත්තා | 160 |
| අලොලාකාසෙ | 4 |
| අවහරෙය්‍ය | 5 |
| අසනං | 47 |
| අසාධාරණා ච චත්තාරො | 18 |
| අසෙනාසනිකෙන | 130 |
| අසංවාසා | 16 |
| අහත්ථපාසං | 32 |
| ආකොටෙන්තෙ | 68 |
| ආචරිය | 77 |
| ආණත්ති | 13 |
| ආණත්ති | 107 |
| ආදියෙය්‍ය | 5 |
| ආයුදුබ්බලතො | 198 |
| ආරාම | 133 |
| ආරාමවත්ථු | 133 |
| ආරාමතො බහි ඡත්තං න ධාරයෙ ගුත්තියා ලබ්භති | 156 |
| ආසන්දිං | 90 |

ආසඤ්ඤදින්නායා සෙසෙ ලබ්භන්තෙ ගිහිසන්තකෙ 91
ආවුධ 13
ඉත්ථිපසාදනං 141
ඉත්ථියා 22
ඉත්ථියාධාන ගමනෙ 68
ඉත්ථිරූපානි 140
ඉද්ධි 13
ඉද්ධිජං 29
ඉරියාපථ 14
ඉරියාපථං විකොපෙය්‍ය 6
ඉස්සරෙන 123
උක්ඛිත්ත 83
උග්ගහපටිග්ගහෙ 61
උච්චපාදකා 91
උච්චිට්ඨොදකං 43
උජ්ඣාපනක 66
උද්දිස්සකට මංසං ච 62
උද්ධූසිත 35
උද්ධුමාතාදි වත්ථුසු 196
උපජ්ඣාචරියෙ 76
උපජ්ඣාය සමොධානෙන 107
උපසංහරතො 197
උපාදින්නං 4
උපාහන චීවරෙ 78
උභතො කාජං 157
උභතපක්ඛුවබන්ධනෙන පතෙන්තෙන 169
එකෙකාය නිසීදනෙ 68
එරණකම්මං 59
ඔකාසො 14
ඔදනො 48
ඔමසවාදෙ 65
ඔභාසො 161
කටඨා 80
කණ්ඩූපටිච්ඡාදිං 31
කණ්ණකොණක සුත්තානි 115
කතකං 163
කතකප්පියං 70
කත්තිකං 102
කප්පවොහාර පරියායතො 124
කප්පාස 28
කප්පියං 50
කප්පො 40
කම්බලං 29
කයවික්කයෙ 64
කලෙලාවා සවුපාහනො 155
කායබහුසාධාරණා 198
කායසංසග්ගරාගවා 20
කායෙන 15
කාල 13
කාලවවත්ථානස්ස අභාවතො 198
කුක්කුච්චුප්පාදනෙසු 67
කුටිං 23
කුඨාරි 135
කුද්දාල 136
කුම්මාසො 48
කුරුවින්දක සුත්තියා 82
කුලදූසාදිනුප්පන්නපච්චයෙ 99
කුසාවහාරෙ 8
කුහනාදීහි 99
කොසෙ ච 143
කොසෙය්‍යං 28
ක්‍රියාවිසෙසො 14
ඛල්ලබද්ධා 86
ඛීරනක 66
ඛුද්දසික්ඛං 1
ඛොමං 28
ගන්ධබ්බහත්ථෙන 82
ගමනාගමනෙ 78
ගරුකං 20
ගරුභණ්ඩං 123
ගාමප්පවෙසනා පුච්ඡා 67
ගාමප්පවෙසෙ 78
ගාමං සුසානං නිස්සීමං දිසං වා ගන්තුමිච්ඡතො 78
ගාහෙය්‍ය මරණූපායං 12
ගිහිපාරුත නිවාසනං 149

| | පිටුව |
|---|---|
| ගොචරාගොචරං | 102 |
| ගොරසො | 49 |
| චක්ඛුසොතාදි භෙදෙහි | 190 |
| චතුබ්බීස | 19 |
| චතුවග්ගො | 94 |
| චලකටච්ඡිකං | 43 |
| චාතුද්දසො | 176 |
| චාමරීමකසබීජනී | 155 |
| චීවරං | 28 |
| චුතො | 4 |
| චොදෙන්තා | 24 |
| ඡත්තෙන | 113 |
| ඡෙදන පාචිත්ති | 33 |
| ජඞ්ඝපෙසනියෙන | 98 |
| ජනස්ස | 117 |
| ජාතිආදීනි | 142 |
| ජීවිතා වා වියොජයෙ | 12 |
| ඣානාදිභෙදං | 15 |
| ඤත්තෙ | 16 |
| ඨානාචාවෙය්‍ය | 6 |
| තත්ථෙවාභි නිසීදන්තා | 19 |
| තරච්ඡ | 62 |
| තලසත්ති | 66 |
| තස්සත්තුහත්ථානි | 49 |
| තිණං | 136 |
| තිධා දෙන්තෙන | 59 |
| තුරියායුධ භණ්ඩානි | 141 |
| තුලත්තයං | 92 |
| තූලි | 90 |
| තුලොනඩා සරෙයෙව | 91 |
| තෙන ලෙසෙන | 24 |
| තෙසං (දසන්නං) | 118 |
| තෙසං සුත්තොතාදකොහෙව | 118 |
| තොයං | 77 |
| ථාවරා | 13 |
| ථුල්ලච්චයං | 63 |
| ථෙය්‍යාවහාරො | 7 |

| | පිටුව |
|---|---|
| දාරං | 139 |
| ද්විධා ගාහො | 59 |
| දන්තකට්ඨං | 77 |
| දසභෙදම්පි රතනං | 119 |
| දායං නාලිම්පයෙය්‍ය | 150 |
| දාරු | 137 |
| දීඝෙ නඛෙ | 142 |
| දුක්කටාදීනි | 123 |
| දුකූලං | 29 |
| දුට්ඨුල්ලපකාසඡාදනෙ | 69 |
| දුට්ඨුල්ලවාචාරාගෙන | 21 |
| දුබ්භාසිතං | 142 |
| දුරූපචිණ්ණෙ | 60 |
| දූතකම්මෙන | 97 |
| දෙය්‍යං පත්තස්ස කස්සචි | 125 |
| දෙවදින්නං | 29 |
| ධඤ්ඤං | 140 |
| ධම්මයුත්තම්පි නච්චං ගීතම්පි වාදිතං | 152 |
| ධම්මසවණත්ථං නිමන්තිතො | 125 |
| ධූමනෙත්තා ච | 88 |
| න ච ඔතපෙ | 42 |
| න පල්ලත්ථෙ | 145 |
| න රුක්ඛමභිරූහෙය්‍ය | 145 |
| නවා | 86 |
| න විකප්පෙය්‍ය | 30 |
| න සන්තරුත්තරො ගාමං (පවිසෙය්‍ය) | 155 |
| නහාපිත පුබ්බකො ඛුරභණ්ඩං පරිහරෙ | 159 |
| නහානස්ස | 78 |
| නහානෙ ච | 78 |
| නානාවත්ථුකා | 172 |
| නානා සංවාසා | 93 |
| නාමරූපං | 199 |
| නාසාලොමො | 143 |
| නිඛාදනං | 135 |

| | පිටුව |
|---|---|
| නිච්ඡයො | 8 |
| නිච්ඡුභතෙ විහාරා | 69 |
| නිමිත්තොභාසතො | 124 |
| නිස්සග්ගි | 12—119 |
| නිස්සග්ගියො | 40 |
| නිස්සයො සම්මති | 107 |
| නිස්සාය න වසෙ ලජ්ජිං | 107 |
| නිසීදනං | 31 |
| නො ච ලඞ්ඝයෙ | 42 |
| පකතත්තකො | 95 |
| පච්චත්ථරණකං | 31 |
| පඤ්චභෙදා | 59 |
| පඤ්චභිසි | 91 |
| පටිච්ඡන්නාවහාරො | 8 |
| පටික්ඛෙපො | 47 |
| පණ්ණං | 136 |
| පණ්ණරසො | 176 |
| පණාමිතො | 153 |
| පත්තකල්ල | 177 |
| පත්තහත්ථො කවාටං න පණාමයෙ | 44 |
| පතිරූපං කරිස්සති | 122 |
| පත්තෙ වත්තං | 77 |
| පදසොධම්ම | 66 |
| පමාණාතික්කන්තං | 23 |
| පයොගා | 12 |
| පරස්ස අංගජාතං මුඛෙන ගණ්හාති | 19 |
| පරිකථා | 161 |
| පරික්ඛාරචොළං | 30 |
| පරිභණ්ඩනෙන | 43 |
| පරිවාසො | 25 |
| පරිස්සාවනං | 146 |
| පල්ලඞ්කො | 90 |
| පලිතං | 149 |
| පවාරිතො | 46 |

| | පිටුව |
|---|---|
| පවාරෙතුඤ්ච ලභති නාවාසත්ථ වස්සූපගො | 130 |
| පවෙසනික්ඛමෙ කාලං | 102 |
| පහිතෙ | 129 |
| පහෙණ | 87 |
| පංසුකූලෙ | 34 |
| පාචිත්ති | 171 |
| පාදුකා | 85 |
| පාරිහට්ටකථා | 97 |
| පිණ්ඩපාතො අනාමට්ඨො | 118 |
| පිතුන්නං | 117 |
| පීඨ | 134 |
| පුටබද්ධා | 86 |
| පුබ්බකරණෙ | 177 |
| පුබ්බකිච්ච | 176 |
| පුරාණචීවරං | 165 |
| පෙසුඤ්ඤහරණෙ | 66 |
| පෙළාය | 149 |
| ඵරසු | 135 |
| බලාවහාරො | 8 |
| බිම්බොහනෙ | 92 |
| බ්‍යත්තස්ස පඤ්චවස්සස්ස | 106 |
| භඞ්ග | 29 |
| භික්ඛුනිස්සිත භණ්ඩූනං | 118 |
| භික්ඛුසම්මුතියාඤ්ඤත්‍ර | 35 |
| භිංසාපනෙ | 68 |
| භුඤ්ජමානො | 46 |
| භුම්මත්ථරණසංඛෙපෙ සයිතුඤ්චාපි කප්පති | 91 |
| භූමිආධාරකො | 44 |
| භූම්‍යා න ඨපෙ | 42 |
| භොජනං | 47 |
| භොජනෙ ච පරම්පරා | 67 |
| භොජ්ජයාගු | 48 |
| මග්ගත්තයෙ | 3 |
| මග්ගෙ මග්ගප්පවෙසන | 19 |
| මජ්ඣදෙසෙ | 86 |

| | පිටුව |
|---|---|
| මඤ්ච | 133 |
| මඤ්චපටිපාදකා | 158 |
| මතකචීවරං | 163 |
| මත්ථලුඞ්ගු | 193 |
| මත්තිකා | 137 |
| මත්තිකාභණ්ඩානි | 138 |
| මනුස්ස විග්ගහං | 11 |
| මරණං | 197 |
| මල්ලකෙන | 82 |
| මසූරකෙ | 92 |
| මහල්ලකං විහාරං | 23 |
| මහාථෙරෙන පෙසිතො අකල්ලො න කරෙය්‍ය | 180 |
| මහාරඞ්ග මහානාම රඞ්ගරත්තා | 86 |
| මාතාපිතූහි සම්බන්ධ ඤාතකෙසු න රුහති | 118 |
| මානත්තං | 27 |
| මාල | 35 |
| මීස්නෙන | 43 |
| මුඛපුඤ්ඡනචොලං | 31 |
| මුග්ගසූපපතා | 97 |
| මුදුපිට්ඨිකො | 19 |
| මුසාවාද | 65 |
| මූගබ්බතාදිං | 158 |
| මෙථුනයුත්තෙන | 22 |
| මොචෙතුකාමතා | 20 |
| යථාබුඩ්ඪං න බාධෙය්‍ය සංඝුද්දිට්ඨං ච සංඝිකං | 144 |
| යානානි | 147 |
| රජොකිණ්ණෙණ | 60 |
| රතනානි | 140 |
| රූපසද්දාදිගොචරෙ | 190 |
| ලම්බී | 19 |
| ලසුණං | 141 |
| ලාජා | 49 |
| ලොකායතං | 148 |

| | පිටුව |
|---|---|
| ලොහකුම්භිකටාහො ච- ලොහභාණකවාරකො | 134 |
| වග්ගෙන | 93 |
| වච්චපස්සාව ඨානිසු | 78 |
| වත්ථුමුත්තාදි | 63 |
| වත්ථවට්ටි | 82 |
| වත්ථු | 13 |
| වත්ථුවිජ්ජා | 97 |
| වදෙය්‍ය මරණෙ ගුණං | 12 |
| වධකස්සෙවුපට්ඨානං | 197 |
| වල්ලි | 136 |
| වසා | 53 |
| වසිතුං නාව ලබ්භති | 108 |
| වස්සිකසාටිකං | 30 |
| වාචාය | 16 |
| වාසි | 135 |
| විකටාදිප්පභෙදඤ්ච | 55 |
| විඤ්ඤත්ති | 98 |
| විඤ්ඤත්තිපථෙ | 161 |
| විජ්ජාමය | 16 |
| විබ්භන්තා භික්ඛුණී | 13 |
| විනිවිඩ්ඪඅඤ්ච | 19 |
| විහාර | 37 |
| විහාරවත්ථු | 133 |
| වීසතිමට්ටං | 133 |
| වෙජ්ජකම්මෙන වා | 143 |
| වෙළු | 98 |
| වෙළු ආදිනං | 136 |
| සඞ්ඛො | 50 |
| ව්‍යන්තස්ස පඤ්චවස්සස්ස | 106 |
| සංඛාරෙ | 200 |
| සංඝසාමග්ගියාච | 129 |
| සංවෙල්ලියං | 150 |
| සඤ්ඤාචිත පරික්ඛාරා | 22 |
| සත්තපඤ්චඞ්ගා | 212 |
| සත්තාහි ආපත්තීහි | 154 |
| සතිපච්චයෙ | 55 |

| | පිටුව |
|---|---|
| සත්තු | 48 |
| සඳෙසං | 22 |
| සන්තුට්ඨො | 192 |
| සන්නිධිං | 57 |
| සබ්බසංයොජනක්ඛයං | 200 |
| සබ්බිරියාපථෙ | 190 |
| සම්බාධෙ ලොමහාරණං | 143 |
| සම්මතො | 168 |
| සම්පතා | 47 |
| සයං පක්කො | 61 |
| සවුපාදානො | 144 |
| සහධම්මිකං | 117 |
| සහසෙය්‍යප්පහොනකෙ | 72 |
| සාගාර | 66 |
| සානුලොමි | 52 |
| සාණං | 28 |

| | පිටුව |
|---|---|
| සාවෙය්‍යසුත්තං | 179 |
| සාහත්ථි | 12 |
| සුක්කාසස | 20 |
| සුඛාපිතං | 54 |
| සුත්තං උද්දිසති සංඝො පසද්ධා සො විභාවිතො | 177 |
| සුභරො | 193 |
| සෙඛසම්මතිං | 102 |
| සෙය්‍යං සෙනාසනානි ච අනුද්ධරිත්වා ගමනෙ | 67 |
| සෙස චීවර පඤ්චකං | 36 |
| සෙසෙපි අයතනයො | 162 |
| හත්ථපාසො | 59 |
| හම්මියෙ | 35 |
| හරෙය්‍ය | 5 |
| හාසොදකො | 69 |

# ආශ්‍රිත පොත්.

1 ඛුද්දසික පුරාණ සන්නය (හරුමල්ගොඩ ශ්‍රී සුමඞ්ගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ සංස්කරණය බු: ව: 2471)
2 සටීකා ඛුද්දසික්ඛා (දන්ගෙදර සුමනජෝති ස්වාමීන්ද්‍රයන්ගේ සංස්කරණය බු: ව: 2441)
3 පාරාජිකාපාළි (හේවාවිතාරණ සංස්කරණය)
4 පාචිත්තියපාළි (නියම්ගම්දෙර පඤ්ඤාවාස, බෙන්තොට සද්ධාතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ සංස්කරණය 2454)
5 මහාවග්ගපාළි (බෙන්තර සද්ධාතිස්ස ස්වාමීන්ද්‍රයන් ගේ සංස්කරණය බු: ව: 2455)
6 චුල්ලවග්ගපාළි (බෙන්තර සද්ධාතිස්ස ස්වාමීන්ද්‍ර සංස්කරණය බු: ව: 2455)
7 පරිවාරපාළි (බෙන්තර සද්ධාතිස්ස ස්වාමීන්ද්‍ර සංස්කරණය 2472)
8 සමන්තපාසාදිකා විනය අටුවාව (හේවාවිතාරණ ප්‍රථම සංස්කරණය)
9 විමතිවිනෝදනී (බේරතුඩුවේ ධම්මාධාර තිස්ස ස්වාමීන්ද්‍රයන්ගේ සංස්කරණය 2478)
10 සාරත්ථදීපනී (ප්‍රථම භාගය: ශ්‍රී දේවරක්ඛිත ස්වාමීන්ද්‍ර සංස්කරණය බු: ව: 2458
(ද්විතීය භාගය: මාබෝපිටියේ පණ්ඩිත මේධංකර ස්වාමීන්ද්‍ර සංස්කරණය බු: ව: 2477)
11 ප්‍රාතිමෝක්ෂය
12 කංඛාවිතරණී නම් මාතිකාට්ඨකථාව (හේවාවිතාරණ ප්‍රථම සංස්කරණය)
13 විනයත්ථමඤ්ජූසා (යූ. පී. ඒකනායක සංස්කරණය 1912)
14 කංඛාවිතරණී පිටපොත (කලුකොඳයාවේ ශ්‍රී ප්‍රඥාශේඛර නායක ස්වාමීන්ද්‍ර සංස්කරණය 1936)
15 පාලිමුත්තක විනය විනිශ්චය (පාතදුරේ රත්කොත්විහාරවාසි සිරි ඤාණවිමල තිස්ස ස්වාමීන්ද්‍ර සංස්කරණය බු: ව: 2442)
16 පාලිමුත්තක විනය විනිශ්චය සංගහ ටීකා (කහඳමෝදර පඤ්ඤාසාර ස්වාමීන්ද්‍රයන්ගේ සංස්කරණය බු: ව: 2451)
17 විනයාලංකාරය (පාතදුරේ ශ්‍රී ඤාණවිමල තිස්ස ස්වාමීන්ද්‍ර සංස්කරණය බු: ව: 2444)
18 විනය විනිශ්චය (තලල්ලේ ඉහලවෙල ශ්‍රී ධීරානන්ද ධර්මරක්ෂිත නායක ස්වාමීන්ද්‍ර සංස්කරණය ක්‍රි: ව: 1937)
19 මූලසික (සීනාවත්තේ ගුණාලංකාර තිස්ස ස්වාමීන්ද්‍රයන්ගේ සංස්කරණය ක්‍රි: ව: 1937)
20 සිඛවලඳ විනිස (ශ්‍රීමත් ඩී. බී. ජයතිලක සංස්කරණය ක්‍රි: ව: 1924)
21 ගරුභණ්ඩ විනිශ්චය (කලුකොඳයාවේ ශ්‍රී ප්‍රඥාශේඛර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ)
22 විශුද්ධිමාර්ගය (හේවාවිතාරණ ප්‍රථම සංස්කරණය)
23 දීඝනිකාය
24 මජ්ඣිමනිකාය
25 මජ්ඣිමනිකායට්ඨකථා (හේවාවිතාරණ ප්‍රථම සංස්කරණය)
26 සංයුත්තනිකායට්ඨකථා (හේවාවිතාරණ ප්‍රථම සංස්කරණය)

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු